අට්ඨකථාචාර්‍ය බුද්ධඝෝෂ ස්ථවිරපාදයන් විසින් විරචිත

සාරත්ථපකාසිනී නම් වූ

සංයුත්ත නිකායට්ඨ කථා

II

(සිංහල පරිවර්තනය)



ප්‍රකාශනය

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

Vol XXII

අර්ථකථාචාර්ය බුද්ධඝෝෂ ස්ථවිර පාදයන් විසින් විරචිත

සාරත්ථපපකාසිනී නම් වූ

සංයුත්ත නිකායට්ඨ කථාව-II

(සිංහල පරිවර්තනය)

අර්ථකථාචාර්ය බුද්ධඝෝෂ ස්ථවිර පාදයන් විසින් විරචිත

සාරත්ථපපකාසිනී නම් වූ

සංයුත්ත නිකායට්ඨ කථාව-II

(සිංහල පරිවර්තනය)

සිංහල පරිවර්තනය

රාජකීය පණ්ඩිත හත්තොටුවේ ඉන්දරතන හිමි

බී.ඒ. පේරාදෙණිය (පාලි) / එම්.ඒ. කැලණිය (බෞද්ධ විද්‍යාව)

අධීක්ෂණය

රාජකීය පණ්ඩිත මැදගම්පිටියේ විජිතධම්ම හිමි

බී.ඒ. පාලි ගෞරව / එම්.ඒ. බෞද්ධ විද්‍යා

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය

ප්‍රකාශනය

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.

අර්ථකථාචාර්ය බුද්ධඝෝෂ ස්ථවිර පාදයන් විසින් විරචිත

සාරත්ථපකාසිනී නම් වූ
සංයුත්ත නිකායට්ඨ කථාව-II
(සිංහල පරිවර්තනය)

ප්‍රථම මුද්‍රණය 2007

ISBN - 978 - 955 - 1604 - 33 - 2

පරිගණක අකුරුකරණය
උපමාලි කුලසේකර - කටුගස්තොට

පිටකවරය
සුසිල් ජයශාන්ත පෙරේරා - මහරගම.-

මුද්‍රණය:
අපිත් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
342, පරණ කැස්බෑව පාර, රත්තනපිටිය,
බොරලැස්ගමුව.
දුරකථනය: 0112517269

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.
දුරකථන: 2734256, 2728468, 2726234 ෆැක්ස්: 2736737
විද්‍යුත් තැපෑල: bcc456@sltnet.lk
www.buddhistcc.com

ප්‍රස්තාවනා (අට්ඨකථා)

පාළි භාෂාව මධ්‍යතන ඉන්දු ආර්ය පූර්ව අවධියට අයත් ප්‍රාකෘත විශේෂයක් බවත්, එම ප්‍රාකෘතය වූ කලී එකල උත්තර භාරතයේ ඒ ඒ ප්‍රදේශවල පැවති පොදු ජනයාගේ කථා ව්‍යවහාරය බවත්, පිළිගත් විද්වත් මතයයි. ප්‍රාකෘත ව්‍යවහාරය පොදු ජනතාවගේ හා ශ්‍රමණ සම්ප්‍රදාය ගරු කළ චින්තකයන්ගේද භාෂා මාධ්‍යය විය. එය උත්තර භාරතයේ පැතිරී ගිය ඉන්දු යුරෝපීය භාෂා ව්‍යවහාරයෙන් ජනිත වූවක් සේ සැලකිය යුතුය. මෙම ප්‍රාකෘත ව්‍යවහාරයේ ලිඛිත සාධක අනුව මූල අවස්ථාවක් සේ පෙනෙන පාළි භාෂාව උත්තර භාරතයේ කිසියම් විශේෂ ප්‍රදේශයක කතා ව්‍යවහාරයේ මාධ්‍යයක් විය.

1. පාළි භාෂාව ක්‍රි.පූ. 6 වැනි 7 වැනි සියවස්වල කොසොල් රට පැවති කථා ව්‍යවහාරය පදනම් කොට ඇති වූවෙකැයි ද එය නොයෙක් ජනපදවල ජනයාගේ පොදු භාෂා මාධ්‍යය වී යැයි ද මහාචාර්ය රීස් ඩේවිඩ්ස් තුමා පවසයි.

2. පාළිය උජ්ජයිනි ප්‍රදේශයේ භාෂාව යැයි වෙස්ටර් ගාඩ් ඊ කුක් සහ ඔටෝ ප්‍රොන්කේ වැනි විචාරකයෝ පවසති.

3. පාළිය මගධයේ කථා ව්‍යවහාර යයි බුද්ධඝෝෂ හිමියන්ගේ මතය මහාචාර්ය ගෙගර් තුමා අනුමත කරයි.

4. බුදුරජාණන් වහන්සේ මුලදී කොසොල් රට බසින් දහම් දෙසන්නට ඇතැයි සළකන වින්ටර්නිස් පාළි ත්‍රිපිටකයේ භාෂාව පැරණි මගධ ව්‍යවහාරය බව පදනම් කොට වෙනත් ප්‍රදේශ ව්‍යවහාරයන්ගේ සම්මිශ්‍රනයද ඇතිව ගොඩනැගුණු බෞද්ධයන්ගේ සාහිත්‍යයීක භාෂාවකැයි මහාචාර්ය වින්ටනිස් තුමා පවසයි.

5. බුදුන් වහන්සේ ධර්ම ප්‍රචාරයේ යෙදුනු පන්සාළිස් වසින් වැඩි කොටසක් කොසොල් මගධ ප්‍රදේශවල සැරිසැරූ බව බෞද්ධ සාහිත්‍යයේ පෙනෙන බැවින් පාළි භාෂාව කොසොල් මගධ දෙරට

කථා ව්‍යවහාරය පදනම් කොටගෙන බිහි වූවාක් සේ සැලකීමට පුළුවන් බව ඊ කුක් නම් විචාරකයා පෙන්වා දෙයි.

මෙම විග්‍රහයන් ශාස්ත්‍රීය වශයෙන් වැදගත් වන අතර විශේෂයෙන් සැලකිය යුත්තේ බුදුන් වහන්සේගේ මතයයි. බුදුරජාණන් වහන්සේ දක්වා වදාල ආකල්ප විග්‍රහ වන්නේ මජ්ඣිම නිකායේ අරණ විභංග සූත්‍රයෙනි. මෙම සූත්‍රයෙන් පෙන්වන්නේ උන්වහන්සේ භාෂා මාධ්‍යයේහි අනවශ්‍යය ලෙස දැඩිව එල්බ ගත් ශාස්තෘවරයෙකු නොවන බවයි. එකම දෙය විවිධ ජනපදවල නාම කීපයකින් හඳුන්වනු ලබන කළ ඒ එක නාමයක් දැඩිව අල්වා නොගෙන ඒ ඒ ලෙසට ව්‍යවහාර කළ යුතු බවත් ලෝක ව්‍යවහාරය නොඉක්මවිය යුතු බවත් අරණ විභංග සූත්‍රයෙහි උගැන්වෙයි.

බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ත්‍රිපිටකය සංගීත වූ භාෂාව වන පාළි භාෂාව ථේරවාදීන්ගේ ආගමික භාෂාව විය. එය සමස්ත ත්‍රිපිටකය පුරා රැඳී ගියේය. ථේරවාදීන්ගෙන් බිඳී ගිය මහායානිකයෝ බුද්ධ ධර්මය සංස්කෘතයට පෙරලා ගත්හ. ඔවුන්ගේ සංස්කෘත සාහිත්‍යය දියුණුවීමත් මුස්ලිම් ආක්‍රමණ වැනි ආක්‍රමණත් මහායානික දර්ශනය විශ්ව විද්‍යාල මගින් රට මුළුල්ලෙහි බෙදා හැරීමත්, මහායානිකයන් ආමිස පූජා යන්ත්‍ර, මන්ත්‍ර ආදියෙන් පෘථග්ජන ජනතා ප්‍රසාදය දිනාගැනීමත්, භික්ෂු විනය නීති ලිහිල් ලෙස මහායානිකයන් විසින් සකස් කිරීමත් ආදිය නිසා බුද්ධ ධර්මයත් පාළි භාෂාවත් බුද්ධ ජන්ම භූමියෙන් අතුරුදහන් විය. එය ශ්‍රී ලංකාදීපයේ තහවුරු විය.

හෙළඅටුවා

සම්බුද්ධ පරිනිර්වාණයෙන් දෙසිය පන්තිස් වැන්නෙහි අශෝක අධිරාජයාගේ දායකත්වයෙන් පැලලුප් නුවරදී තුන්වන සංගායනාව පැවැත්විය. මොග්ගලීපුත්ත තිස්ස මහා රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් රහතන් වහන්සේලා දාහක් සම්බන්ධ වෙමින් මෙම සංගායනාව පවත්වා ඇත. සාහස්සිකා නමින් හඳුන්වන මෙම සංගායනාව නව මසකින් සම්පූර්ණ විය.

තෘතිය සංගායනාවසානයේ දඹදිව ථේරවාදාචරිය පරම්පරාවේ අවසන් පුරුෂයා වූ මොග්ගලීපුත්තතිස්ස මහා රහතන් වහන්සේගේ

ශ්‍රේෂ්ඨ මිහිඳු මහා රහතන් වහන්සේ විසින් තෘතීය සංගායනාවේදී තෝරා බේරා ගෙන සංග්‍රහ කළ, ථේරවාදී ත්‍රිපිටකය ශ්‍රී ලංකාවට ගෙන එන ලදි. මිහිඳු හිමියන් විසින් ලක්දිවට ගෙන එන ලද පාළි ත්‍රිපිටකය මහා අරිට්ඨ රහතන් වහන්සේ ප්‍රමුඛ කොට ඇති සිංහල භික්ෂූන් වහන්සේලා උගත්හ. පාළියෙන් තිබූ ත්‍රිපිටකය ගැටලු තැන් සිංහල ජනතාවට පැහැදිළි කර දීම අවශ්‍යය විය. බුද්ධ කාලයේ සිට වාචනා මාර්ගයෙන්, ආචාර්ය පරම්පරා වලින් පැවත ආ අර්ථ විවරණ ක්‍රම මිහිඳු හිමියන්ගෙන් සිංහල භික්ෂූන් වහන්සේලා උගෙන සිංහල භික්ෂූන් විසින් පාළි ත්‍රිපිටකයේ ගැටලු තැන් හෙළ බසින් අරුත් විවරණය කළහ. හෙළටුවා නමින් මේවා හඳුන්වයි.

අටුවා වනාහි ත්‍රිපිටකයට අයත් පොත් වලට ලියා ඇති ව්‍යාඛ්‍යාන සංග්‍රහ සමූහයයි. අටුවාවල පරමාර්ථය පෙළෙහි ඇති දුරවබෝධ වචන සහ ධර්මයේ ගැඹුරු තැන් විස්තර කිරීමත් අවශ්‍ය තැන්වලදී විස්තරාර්ථ සැපයීමත්ය. මෙම පරමාර්ථයෙන් ලියන ලද හෙළටුවා නම්,

මහා අට්ඨකථා
කුරුන්දිය අට්ඨකථා
පච්චරිය අට්ඨකථා නම් වේ.

හෙළ අටුවා අතුරින් ප්‍රමුඛ ස්ථානය දරුවේ මහා අට්ඨකථාව හෙවත් මූල අට්ඨ කථාවයි. බුද්ධඝෝෂ හිමියන්ගේ අට්ඨ කථා සියල්ලටම පාහේ ශරීරය කරගෙන ඇත්තේ මෙම අටුවාවයි. තුන් පිටකයටම අයත් අට්ඨ කථාවන්හි මහා අට්ඨකථාව ගැන සඳහන් වන බැවින් එය තුන්පිටකයම අළලා සකස් වුනු හෙළටුවාවක් වශයෙන් සැලකිය හැකිය. වස්තු විෂය අතින් සෙසු හෙලටුවාවන්ට වඩා පරිපූර්ණ වී තිබුණ ලක්දිව සිදුවූ දේ පිළිබඳව බොහෝ වෘත්තාන්ත ද මහා අට්ඨකථාවේ සඳහන්ව තිබුණ බව සිතා ගත හැකිය.

මහා පච්චරිය අට්ඨකථාවට එම නම ලැබුනේ පච්චරියක් හෙවත් පහුරක් උඩදී එය ලියන ලද බැවිනි. කුරුන්දිවේලු විහාරයේදී ලියන ලද හෙයින් කුරුන්දි අටුවා නම් විය.

මෙම ප්‍රධාන හෙළටුවාවන්ට අමතරව තවත් අටුවා කීපයක් දක්නට ඇත. අන්ධ අට්ඨකථාව එයින් එකකි. දකුණු ඉන්දියාවේ සාඤ්චිපුර

(කොන්ජිවරම්) යෙහි පැවති අටුවාවයි. එය ආන්ධ්‍රා භාෂාවෙන් ලියා ඇතැයි සැලකේ.

බුද්ධඝෝෂ හිමි

දඹදිව බෝමැඩට නුදුරු ඝෝෂ නම් ග්‍රාමයේ බමුණු කුලයක උපත ලද බුද්ධඝෝෂ වාදයෙහි දක්ෂ වූ රේවත නම් මහා තෙරපාණන් වෙත පැවිදි වූ බව ප්‍රචලිත මතයයි. බුද්ධඝෝෂ මහාබෝධී මණ්ඩපයට දකුණුදිග බමුණුගම උපන් බව සද්ධම්ම සංගහ නම් පොතෙහි සඳහන් වේ. බෝමැඩට නුදුරෙහි ඝෝෂ නම් වූ ගමේ උපන් බව බුද්ධඝෝසුප්පත්ති නම් කථාවේ ද සඳහන් වේ. මෙවැනි විවිධ කරුණු විමංශනයෙන් පසුව බුද්ධඝෝෂ ජන්ම භූමිය මොරණ්ඩබෙටක නම් ගම බව පිළිගෙන ඇත. ආන්ධ්‍ර දේශයේ ගුන්ටූර් දිස්ත්‍රික්කයේ පාල්නාඩ් තලුන් පෙදෙසේ කෝටනේමලි පුරිගුත් වල පල්ලි යන ලඟ පිහිටි ගම් දෙක මොරන්ඩබෙටක යැයි පැවසේ. උන්වහන්සේ උපන් පෙදෙස මොරන්ඩබෙටක යැයි විසුද්ධ මග්ගයෙන් පෙනේ. මජ්ඣිමනිකායට්ඨ කථාවේ කර්තෘ සංදර්ශක ගාථාවක මයුර සුත්ත පට්ඨන හෝ මයුර රූප පට්ඨන සඳහන් වන බැවින් එතුමා එහි විසූ බව ද සිතිය හැකිය.

ව්‍යාකරණ විෂයෙහි ද දර්ශන ශාස්ත්‍රයෙහි ද වෛදික ග්‍රන්ථ විෂයෙහි ද ඉතිහාස පුරාවිද්‍යා විෂයෙහිද කාය ව්‍යවච්ඡේද විද්‍යාවන් හීද ලක්ෂණ ශාස්ත්‍රයේහිද පැතිරී ගිය බුද්ධි ප්‍රභාවයක් ඒ තුමා කෙරෙහි පැවති බව පැහැදිලිය. බුද්ධඝෝෂ හිමියන් ලංකාවට පැමිණීමට පෙර ඤාණෝදය නම් ධර්ම ප්‍රකරණයක් අත්ථසාලිනී අටුවාවක් දඹදිව දී කළ බවද සඳහන්ය. බුද්ධෝඝෝෂ හිමියන් කලින් සර්වාස්ති වාදියෙකුව සිට පසුව ථේරවාදී වූ බව ඇතැම් විචාරකයන්ගේ පිළිගැනීමයි.

බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට පැමිණියේ අනුරාධපුරය රාජධානිය කරගත් මහානාම රජ දවසය. බුද්ධවර්ෂ 953-975 අතර කාලයේය. උන්වහන්සේ ලංකාවට වඩින විට අට්ඨකථා සංහිතා කීපයක්ම මේ දිවයිනේ පැවති බවත් ඒවා හෙල බසින්ම උගත් බවත් මෙයින් සමහරක් ග්‍රන්ථ ස්වරූපයෙන්ද සමහරක් පූර්වාචාරීන්ගේ මතවාද ඇතුලත් වුන සාහිත්‍යය වශයෙන්ද පැවති බවත් ආචාර්ය අදිකාරම් මහතා පවසයි.

මිහිඳු හිමියන් දවසම ආරම්භ වූ සිංහල අටුවා කථා වසර 700ක පමණ කාලයක් සිංහල ත්‍රිපිටකය හෙළි පෙහෙළි කරමින් පැවතියහ. ත්‍රිපිටක පාළියට සිංහල අටුවා ලියා ඇති බව දඹදිව විසූ රේවත හිමියන්ද දැන ගැනීමෙන් සිංහල අටුවා පාළියට පරිවර්තනය කිරීම, බුදුදහම චිරස්ථායී වීමට හේතුවක් යැයි උන්වහන්සේ ද සලකා හෙළටුවා පාළියට පරිවර්තනය කිරීම සඳහා බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට එවන්න ඇතැයි සැලකිය හැකිය.

බුද්ධඝෝෂ හිමියන් මෙහි පැමිණ බුදුන් වදාල දෙලක්ෂ පන්සැත්තෑ දහස් දෙසියපනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් ඇති ආගමයට තුන්ලක්ෂ එක්සැට්දහස් සත්සියපනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් පමණ අටුවා කථා පියපහත් නැගූ සේකැයි දත යුතු යැයි පූජාවලියේ සඳහන්ව තිබේ.

සංස්කාරයෙකු හා අනුවාදයකු වශයෙන් බුද්ධඝෝෂ හිමියන්ගේ කාර්යය වූයේ තමන් ඉදිරියෙහි වූ හෙළටුවාවන්හි අන්තර්ගත වූ විවරණ වෙනස් කිරීම නොව, ඒවා සකස් කිරීම නොව, ඒවා සකස් කිරීම සහ අවශ්‍ය ස්ථාන පිඬු කරමින්, අවශ්‍ය ස්ථාන විස්තරාර්ථ දක්වමින්, විධිමත්ව සුගමව පාළි භාෂාවට නැගීමයි. බුද්ධඝෝෂ හිමියන්ට අට්ඨකථා සකස් කරන්නට මහාවිහාරයෙන් ඉඩ ලැබී ඇත්තේ මහාවිහාර වාචනා 'මාර්ගයට විරුද්ධ මත ඒවායේ ඇතුලත් නොවිය යුතුය' යන කොන්දේසිය ද සහිතවය. මහා අට්ඨකථාව ශරීරය කොටගෙන මහාපච්චරිය කුරුන්දි ආදී විශ්‍රැතඅර්ථ කථාවන්හි යම් විනිශ්චයක් වේද එහි යුක්තාර්ත සහ ඇතුලත් වන්නා වූ ස්ථවිර වාදයද අත්නොහරිමින් සංවර්ධනය හොඳින් ආරම්භ කරන්නෙමු.

තවද එම අර්ථ කථාවලින් භාෂාන්තරය පමණක් අත්හැර විස්තර තැන් පිඬුකොට සියලුම විනිශ්චයන් ඇතුලත් කොට කිසිම තන්හි පනිප්ත නොඉක්මවා සංවර්ණනය කරන්නෙමු.

බුද්ධඝෝෂ හිමියන් විසින් කරන ලද අට්ඨකථා සියල්ලම මිහිඳු මාහිමියන් විසින් ලක්දිවට ගෙන එන ලදුව මහා විහාරිකයන් විසින් ආරක්ෂා කරනු ලැබූ හෙළටුවාවන්හි පාළි අනුවාද බවත් මහා අට්ඨකථාවේ සාරය ගෙන පාළි අට්ඨකථා රචිත බවත් මෙම අට්ඨකථාවල සඳහන් වේ.

මේ අනුව බුදුගොස් හිමියන්ගේ කාර්යය වූයේ බුදුසමය පිළිබඳව අමුතුවෙන් පොත් ලිවීම නොව එතෙක් හෙළටුවාවන්හි ආ කරුණු විධිමත්ව හා සුගමව පාළි භාෂාවට නැගීම වෙයි. පාළි අටුවා පොත්වලින් අඩකටත් වඩා සපයා ඇත්තේ බුදුගොස් හිමියන් විසිනි. බෞද්ධ අට්ඨකථාචාරීන් අතුරෙන් එතුමා ශ්‍රේෂ්ඨතමයායි. එතුමාගේ ජීවන චරිතය වටා විවිධ ජනප්‍රවාද ගෙතී ඇත්තේ ඒ නිසාමය. එතුමා මෙලොව පහළ වූයේ බුදුන්ගේ පර්යාප්ති ශාසනය දීර්ඝ කාලයක් නිර්මලව පවත්වාගෙන යාම සඳහා පාළි අට්ඨකථා ලිවීමටමය ජන ජනප්‍රවාදයක් ද ඇත.

විනය පිටකය

	පෙළ	අටුවාව	කතෘ	කාලය
උභය විභංග	1 පාරාජිකා පාලි 1 ආණා දෙසනා 2 පාචිත්තිය පාළි 2 යථාපරාධ ශාසන	සමන්තපාසාදිකා විනය අට්ඨකථා	බුද්ධඝෝෂ හිමි	5වන ශ.වි.
ඛන්ධක	3 චුල්ල වග්ග පාළි 3 සංවරාසංවර කථා			
	4 මහාවග්ග පාළි			
පරිවාර	5 පරිවාර පාළි			
	භික්ඛුපාතිමොක්ඛ භික්ඛුණී පාතිමොක්ඛ (මාතිකංග කථා)	කඞ්ඛා විතරණී	බුද්ධඝෝෂ හිමි	5වන ශ.වි.

අභිධර්ම පිටකය

1 ධම්මසංගණිප්පකරණ	1 පරමත්ථ දේසනා	අත්ථසාලිනී	බුද්ධඝෝෂ හිමි	5වන ශ.වි.
2 විභංගප්පකරණ	2 යථාධම්ම සාසන 3 නාමරූප පරිච්ඡේද කථා	සම්මොහ විනොදනී	බුද්ධඝෝෂ හිමි	5වන ශ.වි.
3 කථාවත්තුප්පකරණ	පරමති දේශනා		බුද්ධඝෝෂ හිමි	5වන ශ.වි.
4 පුද්ගලපඤ්ඤත්තිප්පකරණ	යථාධම්මසාසනා			
5 ධාතුකථාප්පකරණ	නාමරූපපරිච්ඡේද කථා	පරමත්ථදීපනී		
6 යමකප්පකරණ		පඤ්චප්පකරණට්ඨකථා		
7 පට්ඨානප්පකරණ				

සූත්‍ර පිටකය

1 දීඝනිකාය	1 වොහාරා දේශනා	සුමංගල විලාසිනී	බුද්ධඝෝෂ හිමි	5වන ශ.වි.

2 මජ්ඣිමනිකාය	2 යථානුලෝමසාසන		පපඤ්ච සූදනී	බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
3 සංයුක්තනිකාය	3 දීඝිධි විනිවෙඨන කථා		සාරත්ථප්පකාසිනි	බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
4 අංගුත්තරනිකාය			මනෝරථපූරණී	බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
5 බුද්දක නිකාය					
1 බුද්දකපාඨ	පරමත්ථ ජෝතිකා			බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
2 ධම්මපද	පරමත්ථ ජෝතිකා			බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
3 උදාන	පරමත්ථ දීපනී			ධම්මපාල ආචාර්ය	5වන ශ.ව.
4 ඉතිවුත්තක	පරමත්ථ දීපනී			ධම්මපාල ආචාර්ය	5වන ශ.ව.
5 සුත්තනිපාත	පරමත්ථ ජෝතිකා			බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
6 විමානවත්තු	පරමත්ථ දීපනී			ධම්මපාල ආචාර්ය	5වන ශ.ව.
7 පේත වත්තු	පරමත්ථ දීපනී			ධම්මපාල ආචාර්ය	5වන ශ.ව.
8 ථේර ගාථා	පරමත්ථ දීපනී			ධම්මපාල ආචාර්ය	5වන ශ.ව.
9 ථෙරී ගාථා	පරමත්ථ දීපනී			ධම්මපාල ආචාර්ය	5වන ශ.ව.
10 ජාතක	පරමත්ථ ජෝතිකා			බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
11 නිද්දේස (චුල්ල-මහා)		සද්ධම්ම ජෝතිකා		උපසේන ආචාර්ය	6වන ශ.ව.
12 අපදාන (ථේර-ථෙරී)		විසුද්ධ ජන විලාසනී		මහානාම ආචාර්ය	7වන ශ.ව.
13 පටිසම්භිදා මග්ග		සද්ධම්මප්පකාසිනී		ධම්මපාල ආචාර්ය	5වන ශ.ව.
14 බුද්ධවංස		මධුත්ථප්පකාසිනි		බුද්ධදත්ත හිමි	5වන ශ.ව.
15 චරියාපිටක		පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය	5වන ශ.ව.
		විසුද්ධි මග්ග		බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.

නෙත්තිප්පකරණ	නෙත්ති අට්ඨකථා	ධර්මපාල ආචාර්ය	5වන ශ.ව.
චතුභාණවාරපාළි	චතුභාණවාර අට්ඨකථා	ආහත්ථ මහාතන	8වන ශ.ව.

බුද්ධඝෝෂ හිමියන් විසින් පාළියට නොනගන ලද අට්ඨ කථා පාලියට නගන ලද්දේ බුද්ධදත්ත ධම්මපාල උපසේන සහ මහානාම තෙරණුන් විසිනි.

බුද්ධදත්ත හිමි

බුද්ධඝෝෂ හිමියන්ගේ සමකාලීනයෙකි. මධුරත්ථ විලාසිනි කම් බුද්ධ වංශ අටුවාව උන්වහන්සේ ලියා ඇත.

උපසේන හිමි

සද්ධම්මජෝතිකා නම් නිද්දේශ අට්ඨකථාව මහාපරිවේනවාසී උපසේන හිමියන් විසින් කරන ලදි.

මහානාම හිමි

පටිසම්භිදා මග්ග අට්ඨකථාව වන සද්ධම්මප්පකාසනීය මුන්වහන්සේ විසින් ලියා ඇත.

ධම්මපාල හිමි

පරමත්ථදීපනී අට්ඨකථා - උදාන - ඉතිවුත්තක - විමානවත්තු - ප්‍රේතවත්තු - ථෙර ථෙරී ගාථා අට්ඨකථා මුන්වහන්සේ ලියා ඇත.

මෙම අට්ඨකථාවන් උගෙන ඒවා ආරක්ෂා කළ ය අට්ඨකතිකා නමින් හඳුන්වා ඇත. අට්ඨකථා චරියා යනු අට්ඨකථා සම්පාදනය කළ ආචාර්යවරයෝය. ආචරිය වාද, ආචරිය මත, ආචරියා වාද යන නම්වලින් කියවෙන්නේ අට්ඨකථාවන් මැයි.

අට්ඨකථාවන් පිළිබඳ විවිධ විවේචන හා මතවාද උගතුන් අතර පවතී. මෑතකාලීන වියතුන් අතුරින් අග්ගමහා පණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත හිමියෝ එවැනි විවේචකයෙකි. උන්වහන්සේගේ අටුවා පරීක්ෂණ නම් පොතෙන් එවැනි විවේචන ඉදිරිපත් කර ඇත. අටුවාකථා බුදුන් වහන්සේගේ දේශනා නොවන බව කවුරුත් පිළිගනිති. අටුවාචාරීන් වහන්සේලා අතරද විවිධ මතභේද තිබූ බව දක්නට ඇත. වසර හත්අට සියයක් ගෙන ආ ලිඛිතව නොතිබූ අර්ථ කථා සාහිත්‍යයට එවැනි දේ ඇතුලත් වන්නට පහසුකම් තිබේ. මිහිඳු හිමියන් විසින් ගෙන එන ලද පාළි විවරණ මහාවිහාරික භික්ෂූන් විසින් සිංහලට පරිවර්තනය කොට එම හෙලටුවා පස්වන සියවසේ බුද්ධඝෝෂ හිමියන් විසින් නැවත පාළි භාෂාවට පරිවර්තනය කළ බව පිළිගත් සම්ප්‍රදායයි. මේ තැන්වලදී එම මතිමතාන්තර ඇතුලත් වන්නට ඇති බව සිතිය යුතුය.

මහාවිහාරීය සම්ප්‍රදාය එකකි. අභයගිරි ජේතවන පරම්පරා හිද එවැනි සම්ප්‍රදායන් පැවතුන බවට සැකයක් නැත. ස්වකීය පාරම්පරික මතවලට පටහැනි සූත්‍ර ධර්මයන් පෙළෙහි ඇති බව දැන දැනත් සිය මතය

තහවුරු කරනු සඳහා ඒවා මදකිනිදු වෙනස් නොකර, ඉවත් නොකර, සංගායනාවලදී පැවති තත්ත්වයෙන්ම ත්‍රිපිටකය රැකගෙන ඒම ගැන මහාවිහාරීය පරම්පරාවට බෞද්ධයාගේ ප්‍රණාම පූර්වක ගෞරවය හිමිවිය යුතුය.

මේ අන්දමින් පැවතගෙන ආ අට්ඨකථා අපේ හාමුදුරුවරු තවත් වර්ෂ සිය ගණනක් තම ආරාමවල පොත්ගුල්වල තබා පුස්තකාලවල තැන්පත්කොට උදේ සවස සුවඳ දුම් අල්ලා ධර්ම ගෞරවයෙන් ධර්ම රත්නය රැකගෙන ආහ. අනගාරික ධර්මපාලතුමාගේ ජාතික ආගමික වැඩපිළිවෙල ආරම්භ වීමෙන් පසුව එතුමාගේම පවුලේ නෑයන් විසින් අට්ඨකථා මුද්‍රණය කිරීමේ වැඩපිළිවෙල ආරම්භ කර ඇත. ඒ ධර්මපාලතුමා විසින් ඇතිකරන ලද ආගමික ප්‍රබෝධයේ එක් ආභාෂයකි. 1916 ජූලි 05 දින **ත්‍රිපිටක මුද්‍රණ සභා** නම් ආයතනයක් සයිමන් ඇලෙක්සැන්ඩර් හේවාවිතාරණ මහතුන්ගේ මැදහත්වීමෙන් කොල්ලුපිටියේ ප්ලාමිස් හවුස්හි පිහිටුවා ඇත. 1929 ජූනි 29 දින මෙම ත්‍රිපිටක සභාවේ රැස්වීමක් කොළඹ ඩික්මන් පාරේ තක්සලාහිදී පවත්වා තිබේ. මෙම රැස්වීමට අති පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල මහා නාහිමියන්ද, රත්මලානේ ශ්‍රී ධම්මානන්ද ධර්මාලෝක නායක හිමියන්ද ප්‍රධාන පණ්ඩිත ධර්මධර භික්ෂූන් වහන්සේලා 25 නමක් සභාගී වූ බව සඳහන් වේ. අනගාරික ධර්මපාලතුමා ප්‍රධාන සාසනමාමක පිරිස්ද මෙම රැස්වීමට සභාගී වී ඇත. මෙම නායක පණ්ඩිත ස්වාමීන් වහන්සේලා එක් එක් අටුවා ග්‍රන්ථ සංස්කරණය භාරගත් බවද සඳහන් වේ.

සවිමන් හේවාවිතාරණ මහතාගේ අභාවයෙන් පසුව සෝමලතා හේවාවිතාරණ ළමාතැනී විසින් ත්‍රිපිටක මුද්‍රණය සඳහා අරමුදල පිහිටුවීය. එම අරමුදල මගින් හේවාවිතාරණ අට්ඨකථා ග්‍රන්ථ සමූහය මුද්‍රණය කර ඇත. ආගම ධර්මය, ඉතිහාසය, පුරාවිද්‍යාව, සාහිත්‍යය ආදී ශ්‍රී ලංකා සංස්කරණ විවිධ ක්ෂේත්‍රයන් පර්යේෂණාත්මක අධ්‍යයනවලට යොමු කරමින් ශාස්ත්‍රීය පොතපත සපයා සංස්කෘතිය පිළිබඳව අවබෝධයක් ජනතාවට ලබාදීමේ අරමුණින් 1845 දී ආරම්භ කළ ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ සිංහල අට්ඨකථා සිංහලට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය මගින් පොත් දහයක් මුද්‍රණය කිරීමේ මහඟු කාර්යයකි.

අභාවයට යන පැරණි බෞද්ධ පොත්පත් හා අලුතින් ලියැවෙන බෞද්ධ පොත්පත් මුද්‍රණය කරවීමත් ඉංග්‍රීසි බෞද්ධ පොත්පත් සිංහලට

පරිවර්තනය කර මුද්‍රණය කිරීමත් පරපුරෙන් පරපුරට බුද්ධ ධර්මය ගෙන යාමත් බෞද්ධ සංස්කෘතියේ ආරක්ෂාවත් සඳහා පිහිටුවා ඇති අප ආයතනය වන බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය මගින් බුද්ධ ජයන්ති ත්‍රිපිටකයේ පුනර් මුද්‍රණය නිමවීමෙන් පසු අට්ඨකථා සිංහලට පරිවර්තනය කොට මුද්‍රණය කිරීමට ප්‍රතිපත්ති සකස් කළහ. සිංහලෙන් මුද්‍රණය අවසන් කොට අටුවා කථා ඉංග්‍රීසියට පරිවර්තනය කර මුද්‍රණය කිරීම අපේ අදහසයි.

"කථා පවත්තිනී" නම් පාඨයක් ත්‍රිපිටකයේ අංගුත්තර නිකායේ සඳහන් වෙයි. ධර්මදේශකයා පෙළත් අටුවාවත් දනී නම් දහම් අසන්නා පෙළත් අටුවාවත් දනී නම් දහම් දෙසන්නාත් අසන්නාත් දෙදෙනාම පෙළත් අටුවාවත් දනිනම් එම ධර්ම දේශනාව සාර්ථක දේශනාවක් වන බව මෙහි සාමාන්‍ය අදහසයි. තථාගත ධර්මය වඩාත් ප්‍රකට වීම විවෘත වීම එහි පැවැත්මට හා උත්තරිතර භාවයට හේතුවන බව සඳහන්ය. මෙම කරුණු පිළිබඳ විමසිලිමත් වනවිට අට්ඨකථා පරිවර්තනයේ හා මුද්‍රණයේ අවශ්‍යතාවය වඩාත් පැහැදිලි වන්නේය. එයට අමතරව විශ්ව විද්‍යාලවල පාළි හා බෞද්ධ අධ්‍යයනාංශවල උසස් අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන්ට විෂය නිර්දේශානුකූල අට්ඨකථාවල සිංහල පරිවර්තන නොමැතිකමේ බාධාවද, එම ගුරු ශිෂ්‍ය දෙපිරිසටම මේ මගින් දුරු කිරීමද අපේ පරමාර්ථයකි.

අපගේ ඉල්ලීමද පූජ්‍ය රාජකීය පණ්ඩිත වැළමිටියාවේ කුසලධම්ම නාහිමියන්ගේ අනුශාසනාවද අනුව අටුවා කථා සිංහලට පරිවර්තනය කර මුද්‍රණය කරවීමේ භාරදූර කර්තව්‍යය ශ්‍රී ලංකා ජනරජයේ වර්තමාන ආගමික අමාත්‍යාංශය මගින් ඉතාම කෙටි කාලයක් තුළ අවසන් කිරීම සඳහා අපට පවරන ලදි. බුද්ධ ජයන්ති ත්‍රිපිටක පුනර් මුද්‍රණය මගින් අප දක්වූ ආදර්ශයත් ගොඩනැගූ විශ්වාසයත් මෙයට හේතු වූ බව නිසැකය. මෙම කාර්යය අපට පැවරීම පිළිබඳව ශ්‍රී ලංකා ජනරජයේ ගරු ජනාධිපතිතුමන්ට, ගරු අගමැතිතුමන්ට, ගරු බුද්ධශාසන නියෝජ්‍ය ඇමතිතුමන්ට, අමාත්‍යාංශයේ ලේකම් බී.ඇන්. ජිනසේන මහතාට අපේ කෘතඥතාවය, පුණ්‍යානුමෝදනාපූර්වකව පළකරමු.

අටුවා පරිවර්තනයේදී ආමිෂ ලාභයම නොව ශාසනික සේවයම සලකා එක් එක් පොත භාරගෙන මැනවින් සිංහලට පරිවර්තනය කරදුන්

පණ්ඩිත ස්වාමීන් වහන්සේලාට ද උගත් ගිහි මහතුන්ට ද අපගේ කෘතඥතාවය හිමිවේ. සිංහල අටුවා පරිවර්තන සමීක්ෂණය කළ උගත් ගිහි පැවිදි දෙපිරිසටම අපගේ කෘතඥතාව හිමිවේ.

අටුවා කථා පරිවර්තන කාර්යය සම්බන්ධ කරමින් කටයුතු කළේ විජිතනන්ද සරත්චන්ද්‍ර මහතාය. එම ග්‍රන්ථාවලිය මුද්‍රණය කරවීමේ කාර්යය භාරවූයේ අප ආයතනයේ මුද්‍රණ කටයුතු අධ්‍යක්ෂ පාලිත ලියනගේ මහතාටය. මෙම මහත්වරු දෙපලම ඉතා උනන්දුවෙන් මෙම කටයුතුවල නියැලීම පිළිබඳව එම මහත්වරුන්ටද මාගේ කෘතඥතාවය පළවේ. මෙයට අමතරව මෙම කාර්යයට හොඳහිතින් අවංකව සහාය දුන් සියලු දෙනාටම පින් පුරවමින් ආසිරි පතමිහ.

මෙයට,

ශාසනස්තිථිකාමී,

කිරම විමලජෝති ස්ථවිර,
අධ්‍යක්ෂ, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය,
නැදිමාල, දෙහිවල.

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අට්ඨකථා පරිවර්තක මණ්ඩලය

පූජ්‍ය රාජකීය පණ්ඩිත අම්බලන්ගොඩ ශ්‍රී සුමංගල නායක මාහිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත යටගම ධම්මපාල අනුනායක මාහිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත ආදාවල දේවසිරි නායක මාහිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත යාලේගම චන්දකිත්ති හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදඋයන්ගොඩ විජයකිත්ති හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත වටගෙදර විමලබුද්ධි හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත බලංගොඩ සෝභිත හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත විදුරුපොල ආනන්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැස්ටියේ උපනන්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත හත්තොටුවේ ඉන්දරතන හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත පල්ලේගම සමිත හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මාවනානේ සෝමින්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මාවතගම පේමානන්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත පඬිවෙල සෝරත හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත ඉලුම්පිටියේ සරණධම්ම හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත බලපිටියේ සිරිසීවලී හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත පැපිලියානේ සුමිත්ත හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත බමුණුගම ධම්මවංස හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදගම විජිතධම්ම හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත ධම්මොදය හිමිපාණන් වහන්සේ

පණ්ඩිත	කීර්ති නාරම්පනාව මහතා
ශාස්ත්‍රවේදී	ඇන්.එච්. පෙරේරා මහතා
පණ්ඩිත	ජේ.වී. නිමල්ලාල් රංජිත් මහතා
පණ්ඩිත	ටී.ජී. ජයතිලක මහතා
පණ්ඩිත	ඒ.ඇම්.ඩී.වයි. සරත්චන්ද්‍ර අමරතුංග මහතා

පණ්ඩිත	එච්.පී.ඇස්. නිශ්ශංක මහතා
පණ්ඩිත	බී.ඇම්.පී. බාලසූරිය මහතා
පණ්ඩිත	අරුණ කේ. ගමගේ මහතා
පණ්ඩිත	සෝමරත්න ගම්ලත් වෙලගෙදර
පණ්ඩිත	ජේ.එච්.එම්. විමලදාස මහතා
පණ්ඩිත	දයා ගුණසේකර මහතා
පණ්ඩිත	ඒ. නිශාන්ත පීරිස් මහතා
පණ්ඩිත	ඩබ්ලිව්. ඇල්.පී. ධර්මදාස මහතා
පණ්ඩිත	ජිනදාස ගොඩකන්ද මහතා
පණ්ඩිත	ලසිත් නලන්ත මහතා
පණ්ඩිත	එච්.එල්.එස්. අබේසිංහ මහතා
පණ්ඩිත	පී.ඇල්.කේ. පෙරේරා මහතා

සම්බන්ධීකරණය:- විජිතනන්ද සරත්චන්ද්‍ර මහතා

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අට්ඨකථා පරිවර්තක සමීක්ෂණ මණ්ඩලය

1. පූජ්‍ය මැදගම්පිටියේ විජිතධම්ම හිමිපාණන් වහන්සේ
(පේරාදෙණිය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය)
2. පූජ්‍ය කොටියාගල උපරතන හිමිපාණන් වහන්සේ
(කැලණිය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය)
3. පූජ්‍ය මැදඋයන්ගොඩ විජයකිත්ති හිමිපාණන් වහන්සේ. (ශාස්ත්‍රපති)
4. පූජ්‍ය ඇස්වත්තේ රේවත හිමිපාණන් වහන්සේ. (ශාස්ත්‍රපති)
5. පූජ්‍ය අම්පාරේ ධම්මොදය හිමිපාණන් වහන්සේ. (දර්ශනපති)
6. හේමචන්ද්‍ර දිසානායක මහතා. (ශ්‍රාස්තවේදී)
7. පණ්ඩිත දයා ගුණසේකර මහතා (සිංහල ශබ්දකෝෂය)
8. පණ්ඩිත ඒ ලසිත් නලන්ත මහතා (සිංහල ශබ්දකෝෂය)
9. පණ්ඩිත සිරිමෙවන් සේනක මහතා (ශාස්ත්‍රවේදී)
10. අභිධර්මාචාර්ය බුද්ධික විජේසිංහ මහතා

පටුන

		පිටුව
12. අභිසමය සංයුත්තය	1	139
බුද්ධ වර්ගය	1	
ආහාර වර්ගය	24	
දසබල වර්ගය	46	
කාළාර ඛත්තිය වර්ගය	64	
ගහපති වර්ගය	78	
දුක්ඛ වර්ගය	83	
මහාවර්ගය	106	
ශ්‍රමණ බ්‍රාහ්මණ වර්ගය	136	
අන්තර පෙය්‍යාල වර්ගය.	137	
අභිසමය වර්ගය.	137	
13. ධාතු සංයුත්තය	139	166
නානත්ත වර්ගය	139	
පතතධාතු වර්ගය	144	
කර්මපථ වර්ගය	153	
චතුධාතු වර්ගය	162	
14. අනමතග්ග සංයුත්තය	166	172
තිණකට්ඨ වර්ගය	166	
දුග්ගත වර්ගය	169	
15. කසසප සංයුත්තය	172	216
ප්‍රථම වර්ගය	172	
16. ලාභ සත්කාර සංයුත්තය	217	224
දාරුණ වර්ගය	217	
මාපතිම වර්ගය	220	
මාතුගාම වර්ගය	223	
සංසඥේද වර්ගය	224	

17. රාහුල සංයුත්තය	225	227
පළමුවන වර්ගය	225	
දෙවන වර්ගය	227	
18. ලක්ඛණ සංයුත්තය	228	233
පළමුවන වර්ගය	228	
දෙවන වර්ගය	231	
19. ඔපම්ම සංයුත්තය	234	243
පළමුවන වර්ගය	234	
20. භික්ඛු සංයුත්තය	243	258
පළමුවන වර්ගය	243	
21. බන්ධ සංයුත්තය		
මූල පණ්ණාසක වර්ගය	259	283
නකුල පිතු වර්ගය	259	
අනිච්ච වර්ගය	274	
භාර වර්ගය	276	
නතුම්හාත වර්ගය	279	
අත්තදීප වර්ගය	283	
මජ්ඣිම පණ්ණාසක වර්ගය	284	346
උපය වර්ගය	293	
අරහත්ත වර්ගය	295	
ඛජ්ජනීය වර්ගය	322	
පුප්ඵ වර්ගය	333	
චූල පණ්ණාසක වර්ගය	347	350
අත්ත වර්ගය	347	
ධම්මකථික වර්ගය	348	
අවිජ්ජා වර්ගය	349	
කුක්කුළ වර්ගය	350	
දිට්ඨි වර්ගය	350	

22. රාධ සංයුත්තය 350
පළමුවන වර්ගය 350
දෙවන වර්ගය 351

23. දිට්ඨි සංයුත්තය 353
24. ඔක්කන්ති සංයුත්තය 361
25. උප්පාදසංයුත්තය 361
26. කිලෙස සංයුත්තය 361
27. සාරිපුත්ත සංයුත්තය 362
28. නාග සංයුත්තය 363
29. සුපණ්ණ සංයුත්තය 364
30. ගන්ධබ්බ සංයුත්තය 365
31. වලාහක සංයුත්තය 366
32. වච්ඡගොත්ත සංයුත්තය 366
33. ඣාන සංයුත්තය 367

සංඥාපනය

සූත්‍ර පිටකයේ තෙවැනි නිකාය ග්‍රන්ථය වනුයේ සංයුත්ත නිකායයි. 'සංයුත්ත නිකාය', 'සංයුත් සඟිය' හා 'සංයුත්තාගම' යනාදී නම්වලින් මෙම කෘතිය හැඳින්වේ. 'සංයුත්ත' යනු එකට එකතුකළ, එකට බැඳුණු යන අර්ථ දෙන පදයකි. 'නිකාය' යනු සමූහයයි. අර්ථ හෝ ධර්ම කරුණු අනුවත් පුද්ගලනාම හා විෂය අනුවත් කරුණු එකතුකර දැක්වීමක් මෙහිදී සිදුවේ.

නිදසුනක් ලෙස දෙවියන්ගේ එකම මාදිලියේ ප්‍රශ්න හා බුදුරදුන් දුන් පිළිතුරු දේවතා සංයුත්තයේ අන්තර්ගතය. කොසොල් රජු සම්බන්ධ විස්තර සියල්ලම කෝසල සංයුත්තයේ ඇතුලත්ය. ඕපම්ම සංයුත්තය උපමාවලින් පිරුණකි. ධාතු වර්ගීකරණයන් රැසක් හෙවත් ක්‍රම කිහිපයකට ධාතු වර්ග කිරීම ධාතු සංයුත්තයේ දී දක්නට ලැබේ.

මෙවැනි විසිතුරු පුද්ගල හා ධර්ම කරුණුවල එක්රැස් කිරීමක් ඇති සංයුත්ත නිකාය, උද්ග්‍රහණ-ධාරණ හා සංරක්ෂණ වගකීම පැවරුණේ පළමු මහා ධර්ම සංගීතියේ ප්‍රධානත්වය ඉසිලූ මහාකාශ්‍යප මහරහතන් වහන්සේටය.[1] උන්වහන්සේ අංගලක්ෂණ අතින් බුදුරදුන්ගේ බාහිර ස්වරූපයට සමාන වූහ. ධුතාංගධාරීන් අතරින් අග්‍රවූහ. සිවුරු හුවමාරු කිරීම් හා ඕවාද පටිග්ගණ උපසම්පදාව දීමෙන් බුදුපියාණන් වහන්සේගෙන් පසුව ශාසනභාරධාරී මහතෙරුන් වීමට අවශ්‍ය සුදුසුකම් උන්වහන්සේ ලබාගත්හ.

සංයුත්ත නිකාය ප්‍රධාන වශයෙන් වග්ග පහකට බෙදා දක්වේ. සගාථ වග්ග, නිදාන වග්ග, ඛන්ධ වග්ග, සළායතන වග්ග හා මහාවග්ග යනුවෙනි. මේ එක් එක් වග්ගය නැවත 'සංයුත්ත' නමැති කොටස්වලට බෙදා දක්වයි. ඒ අනුව සගාථ වග්ගයේ සංයුත්ත එකොළොසකි. නිදාන වග්ගයේ සංයුත්ත දහයකි. ඛන්ධ වග්ගයේ සංයුත්ත දහතුනකි. සළායතන වග්ගයේ සංයුත්ත දහයකි. අවසාන වූ මහාවග්ගයේ සංයුත්ත දොළොසකි. එවිට සමස්ත සංයුත්ත සංඛ්‍යාව පනස්හයකි. (56)

තවත් ක්‍රමයකට අනුව සංයුත්ත නිකායේ කොටස් තුනකි. මූල පණ්ණාසකය, මජ්ඣිම පණ්ණාසකය හා උපරි පණ්ණාසකය යනුවෙන් සූත්‍ර පනහ බැගින් ගෙන සෑම සංයුත්තයක්ම වර්ග කර ඇත. බණවර නම් තවත් බෙදීමක් මෙහි ඇත. ඒ අනුව සංයුත්ත නිකායේ බණවර 100කි. 'සූත්‍ර' නාමයෙන් කරන බෙදීම මේ සැමට ම වඩා කුඩා වූ වර්ගීකරණයයි. සංයුත්ත නිකායේ සූත්‍ර 7762 ක් ඇති බව අටුවාවේ පැවසේ.

"සත්ත සුත්ත සහස්සානි - සත්ත සුත්ත සතානිච
ද්වාසට්ඨි චෙව සුත්තානි - එසො සංයුත්ත සංගහො"[2]
(සාරත්ථප්පකාසිනී සං.නි. අට්ඨ කථා)

සංයුත්ත නිකාය සඳහා ලියවුණු හෙළටුවා ලංකාවේ පැවතුණි. මහාට්ඨකථාවට අමතරව හෙළ සංයුත්ත අටුවාවක් ද මහාවිහාරය සතුව පැවතුණි. මහාවිහාරික නොවන අභයගිරික හා ජේතවනික විද්‍යාස්ථානයන්හි ද 'හෙළ සංයුත්තාගම අටුවා' පැවති බවට තොරතුරු ඇත.[3]

එසේ ක්‍රි.පූ. තෙවැනි සියවසේ සිට ලක්දිව පැවති හෙළටුවා ඇසුරින්, ක්‍රි.ව. පස්වන සියවසේදී මහා අට්ඨකථාචාර්ය බුද්ධඝෝෂ මාහිමියෝ 'සාරත්ථප්පකාසිනී නාම සංයුත්තනිකායට්ඨකථාව' සම්පාදනය කළහ. පාලි බසින් ලියවුණු බුද්ධඝෝෂ මාහිමියන්ගේ අට්ඨකථා ග්‍රන්ථ දාහතරින් (14) සයවන ග්‍රන්ථය ලෙස සාරත්ථප්පකාසිනිය හැඳින්විය හැකිය.

උන්වහන්සේ සංයුත්ත අටුවාව ඇරඹූ අයුරු, පිළිවෙල කථාව, නිකාය අටුවා සතරෙහිම එන එක සමාන ගාථා පන්තියෙන් මුලදීම දැක්වේ. සංයුත්ත නිකාය පිළිබඳව පවසන ගාථාව පමණක් වෙනස් වී ඇත. මෙම සංයුත්ත නිකායට්ඨකථාව, සෙසු නිකායට්ඨකථා හා සසඳා බලනවිට අලුත් බවක් දිස්වේ. අසම්පූර්ණ බවක් - වැදගත් පද පවා අර්ථකථනය නොවූ බවක් මෙම අට්ඨකථාවෙන් පැහැදිලි වන බව තෙරිපැහැ සෝමානන්ද නාහිමියෝ පෙන්වති.[4] වෙනත් පොත්වලට වඩා අතිසංකීර්ණ විෂය පථයක් සංයුත්ත නිකායේ අන්තර්ගතය. එනිසා සර්ව සම්පූර්ණ විස්තර විවරණයක් සැපයීම ඉතා දුෂ්කර කාර්යයකි.

සංයුත්ත නිකායේ එන ගාථා ද්වයක් සඳහා ලියූ අර්ථ විවරණයක් ලෙස බුද්ධඝෝෂාචාර්යයන් වහන්සේගේ මුල්ම කෘතිය වන 'විසුද්ධිමග්ගය' ඉතා ප්‍රකටය. පොත් ගණනාවක් ලිවිය හැකි වස්තුබීජ රැසක් සංයුත්ත නිකායේ ඇතුලත් බව මේ අනුව පැහැදිලි වේ. එනිසා එබඳු නිකාය ග්‍රන්ථයකට සර්ව සම්පූර්ණ අර්ථ විවරණයක් එක් ග්‍රන්ථයකින් සිදුකිරීම ඉතා දුෂ්කර බව මැනවින් පැහැදිලි වේ.

සද්ධර්ම ගාම්භීරත්වය අතින් සංයුත්ත නිකායට්ඨකථාවට සුවිශේෂී ස්ථානයක් හිමිවේ. බුරුම හා සියම් රටවල ධර්මශාස්ත්‍රෝත්ග්‍රහණයේ දී භාවිත ප්‍රාමාණික ග්‍රන්ථයකි මෙම අටුවාව. සෙසු අටුවා ග්‍රන්ථ අතර සංයුත්ත නිකාය අටුවාවට හිමිවනුයේ ද ප්‍රධාන තැනකි. ඡට්ඨ සංගායනාවෙන් පසුව මහත් පරිශ්‍රමයකින් සංස්කරණය කළ කෘතියක් ලෙසට නම සඳහන් වන, 'සාරත්ථප්පකාසිනී සංයුත්ත නිකායට්ඨකථාව' එංගලන්තයේ පාලිපොත් සමාගම (P.T.S.) මගින් ප්‍රකාශයට පත්කර ඇත. මෙය 1903 දී ලංකාවේ ප්‍රථමයෙන් මුද්‍රණය විය. පුස්කොළ පොතින්, කඩදාසි පොතට පිවිසි මේ පළමු පියවරේදී එම අටුවාව පිටු තිස්දෙකක් සහිත කුඩා පොත් වශයෙන් මුද්‍රණය විය. ඒ සෑම කලාපයක්ම එකතුකර 1927 දී නැවත පළකෙරුණි.

හේවාවිතාරණ අටුවා ග්‍රන්ථ මාලාවට මෙම ග්‍රන්ථය සකස් කිරීමේදී ප්‍රාමාණික උගතෙකු සොයාගැනීම දුෂ්කර විය. බොහෝ අපපාඨවලින් පිරී දූෂිත කෘතියක් ලෙස මෙම අටුවාව පැවතීම නිසා බොහෝ උගත්නු මෙය ප්‍රතික්ෂේප කළහ. අවසන සාර්වභෞම පණ්ඩිත විදුරුපොළ පියතිස්ස මාහිමියෝ කාණ්ඩ තුනකින් සමන්විත සංයුත්ත නිකායට්ඨකථාව සංස්කරණය කරන ලදි. එම කාණ්ඩ තුන 1924, 1927, 1930 යන වර්ෂවලදී පිළිවෙලින් මුද්‍රණය විය.

සංයුත්ත අට්ඨකථාවේ දුෂ්කර පද විවරණ දැනගැනීමට ඇති ටීකාචාර්ය භදන්ත ධම්මපාල මාහිමියන් විසින් රචිත 'සංයුත්ත නිකාය ටීකාව' තවම ලංකාවේ පළවී නැත. එම ටීකාව බලංගොඩ ආනන්ද මෛත්‍රිය මහ නාහිමි මගින් බුද්ධශාසන අමාත්‍යාංශයට ලැබී මුද්‍රණය වන බව දැනගැනීමට ඇත.

උක්ත විදුරුපොළ පියතිස්ස මහනාහිමියන් සංස්කරණය කළ 'පාලි සංයුත්ත නිකායට්ඨකථාව' සිංහලට පරිවර්තනය කිරීම නැදිමාල බෞද්ධ

මධ්‍යස්ථානාධිපති පූජ්‍ය කිරම විමලජෝති නාහිමියෝ වියතුන්ගෙන් ඉල්ලා සිටියහ. ඒ අනුව එම අට්ඨකථාවේ 'භාග තුන'- උගතුන් තිදෙනකු විසින් සිංහලයට පරිවර්තනය කිරීම සිදුවිය.

මේ පළවනුයේ දෙවැනි භාගයේ සිංහල පරිවර්තනයයි. දෙදහස් පන්සිය පනහ සම්බුද්ධ ජයන්තිය වෙනුවෙන් ත්‍රිපිටක අටුවා සිංහල බසට නැගීමේ අතිඋදාර කර්තව්‍යය සඳහා දායකවීමට ලැබීම සතුටට කරුණකි.

1. "සමන්තපාසාදිකාව"-හේවාවිතාරණ-1945-බාහිර නිදාන වණ්ණනා, P. 3-17
2. "සාරත්ථප්පකාසිනිය"-I, හේවා.-1924-P. 01
3. ඉන්දරතන හිමි, හත්තොටුවේ-"පාලි අට්ඨකථා සාහිත්‍යයෙන් හෙළිවන අවිද්‍යමාන වූ සීහලට්ඨකථා සාහිත්‍යය"-චිත්‍රා ප්‍රින්ටර්ස්-මාතර-2006,P. 19-20, P 137-8
4. "ධර්ම ශාස්ත්‍රීය ලිපි සරණිය"- සම්. ශ්‍රියන්ති කුමාරගේ-සංස්කෘතික කටයුතු දෙපා.-2005-P. 46-55

රාජකීය පණ්ඩිත
හත්තොටුවේ ඉන්දරතන හිමි
බී.ඒ. (පේරා.) එම්.ඒ. (කැලණි.)

සාරත්ථප්පකාසිනී නම් වූ
සංයුත්ත නිකාය අට්ඨකථාව-II

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

ඒ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට
නමස්කාරය වේවා !

12. 1. 1.

"**එවං මෙ සුතං**" යනු නිදාන වර්ගයේ පළමුවැනි පටිච්ච සමුප්පාද සූත්‍රයයි. එහි මේ අනුපූර්ව පද වර්ණනාවයි. "තත්‍ර බොා භගවා භික්ඛූ ආමන්තෙසි" යනුයි. (එවිට භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් වහන්සේලා ඇමතූ සේක.) මෙහි "**තත්‍ර**" යනු දේශකාලාදිය දක්වීමයි. එහි යම් කාලයක වැඩවාසය කරයිද එය "**තස්මිං සමයෙ**" (එසමයේ) යනුවෙන්ද යම් ඒ ජේතවන විහාරයෙහි වැඩවසයි ද "**තත්‍ර ජේතවනෙ**" (ඒ ජේතවනාරාමයේ) යනුවෙන් ද දක්වයි. නැතිනම් දේශනා කළයුත්තෙහි දේශකාලාදිය දක්වයි. භාග්‍යවතුන් වහන්සේ නුසුදුසු වූ අයෝග්‍ය වූ දේශයෙහිත් කාලයෙහිත් ධර්මදේශනා නොකරන සේක. "බාහිය, දැන් අවේලාවයි"a යනාදිය මීට සාධක වේ. "බොා" යනු පද පූරණ මාත්‍රයෙහි හෝ අවධාරණාර්ථයෙහි හෝ ආදිකාලාර්ථයේ හෝ යෙදුණු නිපාතයකි. "භගවා" යනු ලොව ගරුකටයුතු පුද්ගලයා දැක්වීමකි. "**භිකඛු**" යනු දේශනාව ඇසියයුතු පුද්ගලයන් හැඟවූ වචන යි. තවද මෙහි "පිඬුසිගා යනුයේ භික්ෂුවයි. භික්ෂා චර්යාවට පැමිණියේ භික්ෂුවයි."b ආදී වශයෙන් භික්ෂු යන්නෙහි වචනාර්ථ දතයුතුයි. "**ආමන්තෙසි**" යනු ඇමතූසේක. දේශනා කළ සේක.

---

a. බාහිය සූත්‍රය b. පාරාජිකා පාලි

මැනවින් අවබෝධ කරවූ සේක යන අර්ථයි. මෙහි අර්ථ මෙසේය. ඇතැම්තැනෙක දී දැන්වීමේ අර්ථය ගෙනදෙයි. බුදුරජාණෝ මෙසේ වදාළහ. "මහණෙනි! මම තොප අමතමි. (**ආමන්තයාමි**) මම තොපට දැනුම්දෙමි."c යනුවෙනි. කැඳවීම් අර්ථයෙහි ද මෙය යෙදේ. මෙසේ වදාළහ. "මහණ! නුඹ මෙහි එව. මගේ වචනයෙන් ආයුෂ්මත් සැරියුත් තෙරුන් අමතන්න" (ආමනෙතහි) යනුවෙනි.d **"භික්ඛවො"** යනු ආමන්ත්‍රණය ලැබූ පිරිස දක්වීමකි. එය ද සිගායෑම ස්වභාවය කරගත් ගුණයන්ගෙන් පිරිපුන් බැවින් කියන ලදී. අහර සිගායෑමේ ස්වභාව ඇති ගුණයන්ගෙන් යුක්ත තැනැත්තා ද සිගායෑම ධර්මතාව කරගත් තැනැත්තා ද පිඬුසිඟීම මැනවින් කරන ලද තැනැත්තා ද **"භික්ඛු"**(භික්ෂු) ශබ්දයෙන් අර්ථවත් වේ යැයි ශබ්දවේදීහු සිතති. ඒ පිඬුසිගායෑම ස්වභාවය කරගත් ගුණයන්ගෙන් යුක්තවූ යන වචනයෙන් උස්පහත් ගති ඇති ජනයා විසින් සෙවුනා ලද දිවිපැවැත්ම ප්‍රකාශකරමින් උඩඟු-දීනාදී ගතිවලට නිග්‍රහ කරයි. කරුණාව පැතිර ගිය මුදුමොළොක් නෙත් සිත් ඇති, පළමුව ප්‍රකාශිත "මහණෙනි" යන මේ වචනයෙන්, ඒ භික්ෂූහු තමන්වහන්සේ ඉදිරියට පමුණුවන සේක්; ඔවුන් සමග කථාකිරීමට කැමති බව හඟවන මේ වචනයෙන් ඔවුන් තුළ ඇසීමේ කැමැත්ත උපදවයි. එම ආමන්ත්‍රණ අර්ථයෙන් ම 'මැනවින් මෙනෙහි කිරීමෙහි' ද ඔවුන්ව යොදවයි. මැනවින් සිහිපත් කරන්නවුන්ට ශාසන සම්පත්ති හිමිවේ.

වෙනත් දෙව්මිනිසුන් ඇතිකල්හි කුමක් හෙයින් භික්ෂූන් වහන්සේලාට පමණක් ආමන්ත්‍රණය කළසේක් ද? භාග්‍යවතුන් වහන්සේගේ ධර්මදේශනාව ජෙටය, සෙටය, ආසන්න, සන්නිහිත වශයෙන් සියලුම පිරිස්වලට සාධාරණ වූවකි. සිවුපිරිසෙන් ජෙටය නම් වනුයේ භික්ෂූන් වහන්සේම ය. පළමුව පහළවූ බැවිනි. සෙටය යනු අනගාරික බව මුල්කරගෙන ශාස්තෘ චර්යාව අනුගමනය කරන්නෝ ද සියලු ආකාරයෙන් සසුනට පිහිටාධාර වන්නෝ ද වෙති. ආසන්නයෝ නම් ශාස්තෘන් වහන්සේ සමීපයේ ම හුන් පිරිසයි. සදා සන්නිහිත යනු ද ශාස්තෘන් වහන්සේ සමීපයේම හැසිරෙන්නෝ ය. තවද අනුශාසනා පරිදි ප්‍රතිපත්ති සද්භාවයෙන් යුක්ත බැවින් ඔවුහු ධර්ම දේශනාවට භාජනය වෙති. මේ ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මදේශනාව විශේෂ වශයෙන් ම ඇතැම් භික්ෂූන් වහන්සේ සඳහා ම යෝග්‍ය වන බැවින් මෙසේ අමතන ලද සේක් යැයි දතයුතුය. භාග්‍යවතුන් වහන්සේ ධර්මදේශනා කරන සේක්, ධර්මය ම

---

c. අග්ගික්ඛන්ධොපම සූත්‍රය d. සංයුත්ත නිකාය

දේශනා නොකර - පළමුව භික්ෂූන් වහන්සේට අමතනුයේ කවර හෙයින් ද? සිහිය ඉපිදවීම පිණිසයි. භික්ෂූන් වහන්සේලා අතර ඇතමෙක් අනිකක් සිතමින් විසිරුණු සිත් ඇතිව ද ඇතැමෙක් ධර්මය මෙනෙහි කරමින් ද කමටහන් මෙනෙහි කරමින් ද වැඩහිඳිති. උන්වහන්සේලාට ආමන්ත්‍රණය නොකර ධර්මදේශනා කරන කල්හි "මේ දේශනාවේ නිදානය කුමක්ද?" "ප්‍රත්‍ය කුමක්ද?" "කවර අර්ථයක් ඉපිදවීමට දේශනා කළසේක්ද?"යි සලකාගත නොහැකිව, ඒම දේශනාව වැරදි ලෙස වටහාගනිති. නැතිනම් කිසිසේත් වටහා නොගනිති. මෙනිසා උන්වහන්සේලාට සිහිය ඉපිදවීම පිණිස භාග්‍යවතුන් වහන්සේ පළමුව ආමන්ත්‍රණය කර, පසුව දහම් දෙසන සේක. "භදන්තෙ" යන මෙය ගරු කටයුතු වදනකි. නැතහොත් ශාස්තෘන් වහන්සේට පිළිතුරු දීමකි. මෙහිදී බුදුරජාණන් වහන්සේ "මහණෙනි !"යි කියමින් භික්ෂූන් අමතන සේක. ඒ භික්ෂූහු "ස්වාමීනි !"යි (භදන්තෙ) පවසමින් බුදුරජාණන් වහන්සේට පිළිතුරු දෙති. "**භික්ඛවො**" (මහණෙනි !) යි බුදුහු වදාරති. "භදන්ත !" (ස්වාමීනි !) යි පිළිවදන් දෙති. "**භික්ඛවො**"යි පිළිතුරු දෙති. "**තෙ භික්ඛු**" යනු යමෙකුට බුදුහු ඇමතුසේක්ද ඔවුහුය. "**භගවතො පචචසෙසාසුං**" යනු භාග්‍යවතුන් වහන්සේගේ ආමන්ත්‍රණයට පිළිතුරු දුන්හ යනුයි. උන්වහන්සේට අභිමුඛව දේශනාව ඇසූහ. මැනවින් පිළිගත්හ. බාරගත්හ යන අර්ථයි. "භගවා එතදවොච" යනු භාග්‍යවතුන් වහන්සේ මෙහි දැන් වදාළයුතු සියලු සූත්‍රය දේශනා කළ සේක. ආයුෂ්මත් ආනන්ද තෙරුන් වහන්සේ විසින් අර්ථ ව්‍යඤ්ජන සහිත වූ ලොවුතුරු බුදුවරුන්ගේ දේශනාවේ ඣාණ ගාම්භීර බව හඟවන්නා වූ මේ සූත්‍රයේ අර්ථය අදහස සුවසේ ගැනීම සඳහා, කාලය - දේශය - දේශක පිරිස - ආදියෙන් යුක්ත වූ (අලංකෘත) යම් සූත්‍ර නිදානයක් දෙසූ සේක් ද එහි අර්ථ වර්ණනාව මෙතෙකින් සමාප්තය.

දැන් "**පටිච්ච සමුපපාදං වො**" ආදී වශයෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් දේශිත සූත්‍රයේ අර්ථ වර්ණනා කිරීමට අවස්ථාව පැමිණියේය. ඒ සූත්‍ර වර්ණනාවට පෙරාතුවම සූත්‍රය දෙසීමේ හේතුව (නික්ෂේපය) විමසා, පසුව අර්ථ පවසන්නේ නම් - අර්ථ ප්‍රකට වන බැවින් පළමුව සූත්‍ර නික්ෂේපය විමසන්නෙමු.

සූත්‍ර නික්ෂේප සතරකි. අතතජ්ඣාසය, පරජ්ඣාසය, පුච්ඡාවාසික හා අට්ඨුප්පත්තික යනුවෙනි. එහි යම් සූත්‍ර භාග්‍යවතුන් වහන්සේ අනුන්ගේ ආරාධනාවක් නොමැතිව, හුදෙක් තමන් වහන්සේගේම අදහස අනුව දේශනාකළ සේක් ද එබඳු සූත්‍ර; එනම්:- සියලුම සූත්‍රාන්ත හරහා චන්ද්‍රොපම,

වීණෝපම, සම්මප්පධාන, ඉද්ධිපාද, ඉන්ද්‍රියබල, බොජ්ඣංගමග්ග සූත්‍රාන්තගාරක යනාදී මෙම සූත්‍ර අතතජඣායය නික්ඛේපයට අයත් වේ.

යම් සූත්‍රයක් "රාහුල තෙරුන්ගේ විමුක්තිය මුහුකුරායෑමට හිතවූ-යෝග්‍ය වූ ධර්ම අභිවෘද්ධියට පැමිණ සිටී. මම රාහුලයන් අනාගත ආස්‍රවක්ෂය කිරීම සඳහා හික්මවන්නෙමි නම් මැනවි"යි යනුවෙන් අනුන්ගේ අදහස්, කැමැත්ත, වැටහීම්, සිත, ප්‍රාර්ථනාව, අවබෝධ කරගන්නා බව යනාදී කරුණු අපේක්ෂාවෙන් - අනුන්ගේ අදහස් අනුව දෙසූ - චූළ රාහුලෝවාද සූත්‍රය, මහා රාහුලෝවාද සූත්‍රය, ධර්මචක්කප්පවත්තන සූත්‍රය, අනන්තලක්ඛණ සූත්‍රය, ආසිවිසෝපම සූත්‍රය, ධාතුවිභංග සූත්‍රය යන මේ ආදී සූත්‍ර ධර්ම පරජඣායය නික්ඛේපයට අයත් වේ.

සිවුවනක් පිරිස, ක්ෂත්‍රියාදී චතුර්වර්ණ පිරිස, නාග, සුපර්ණ ගාන්ධර්ව, අසුර, යක්ෂ, සිවුමහා රජදරුවෝ, තාවතිංසාදී දෙවියෝ, මහා බ්‍රහ්මයෝ යනාදීහු භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ "ස්වාමීනි! බොජ්ඣංග ධර්මයෝ බොජ්ඣංග ධර්මයෝයැයි කියනු ලැබෙත්. ස්වාමීනි! නීවරණ ධර්මයෝ නීවරණ ධර්මයෝයැ යි කියනු ලැබෙත්. ස්වාමීනි! මේවා පඤ්ච උපාදානස්කන්ධ ද? මෙලොව මිනිසාට ඇති ශ්‍රේෂ්ඨම ධනය කුමක්ද" ආදී වශයෙන් ප්‍රශ්න විචාරති. මෙසේ විමසූවන්ට භාග්‍යවතුන් වහන්සේ විසින් බොජ්ඣංග, සංයුත්තාදී යම් සූත්‍රයක් දේශනා කළසේක්ද, අනෙකුත් දේවතා සංයුත්ත, මාර සංයුත්ත, බ්‍රහ්ම සංයුත්ත, සක්ක පඤ්හ, චූළවේදල්ල, මහාවේදල්ල, සාමඤ්ඤඵල, ආලවක-සුචිලෝම-චරලෝමාදී සූත්‍රයන් ද යන මේ සියල්ල පුචඡාවසික නික්ඛේපයට අයත් වේ.

හටගත් යම් කරුණක් හේතුකරගෙන දෙසූ- එනම්; චූළසීහනාද සූත්‍රය, පුත්තමංසූපම සූත්‍රය, අග්ගිකඛන්ධෝපම සූත්‍රය, ඵෙණපිණ්ඩූපම සූත්‍රය, පාරිජත්ත කූපම සූත්‍රය යනාදී සූත්‍ර ධර්ම අට්ඨුප්පත්තික නික්ඛේප නම් වේ. මේ ආදී වශයෙන් විස්තර කළ, සතර සූත්‍ර නික්ඛේපයන් අතරින් මේ පටිච්ච සමුප්පාද සූත්‍ර දේශනාව පරජඣායය නික්ඛේපයට අයත් වේ. වෙනත් පුද්ගලයන්ගේ අදහස් අනුවම භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සූත්‍රය දේශනා කළ සේක. කවර පුද්ගලයන්ගේ අදහසක් අනුව ද? උගසටිතඤ්ඤා පුද්ගලයන්ගේ අදහස් අනුවය.

---

a. චූළරාහුලෝවාද සූත්‍රය

පුද්ගලයෝ සතර දෙනෙකි. එනම්; උග්ඝටිතඤ්ඤූ, විපචිතඤ්ඤූ, නෙය්‍ය, පදපරම යනුවෙනි. එහි යම් පුද්ගලයෙකුට සූත්‍රය දේශනා කළ අවස්ථාවේදී ම ධර්මාවබෝධය වේනම් ඔහු "උග්ඝටිතඤ්ඤූ" පුද්ගලයා නම් වේ.

යම් පුද්ගලයෙකුට සංක්ෂිප්තව දෙසූ ධර්මයෙහි අර්ථ විවරණ සවිස්තරව බෙදා දක්වන විට ධර්මාවබෝධය ලැබෙනම් ඔහු "විපචිතඤ්ඤූ" නම් පුද්ගලයායි.

යම් පුද්ගලයෙකුට උදෙසීමෙන්, විචාරීමෙන්, නුවණ මෙහෙයවා විමසා බැලීමෙන් හා කල්‍යාණ මිත්‍ර ආශ්‍රයෙන් - භජනයෙන් - පයිරුපාසනයෙන් හෙවත් ඇසුරු කිරීමෙන් අනුපිළිවෙලින් ධර්මාවබෝධය වේනම් ඔහු "නෙය්‍ය" නමැති පුද්ගලයා වේ.

යම් පුද්ගලයෙකුට බොහෝ සූත්‍ර ධර්ම ඇසීමෙනුත්, බොහෝ ධර්ම කරුණු හැදෑරීමෙනුත්, බොහෝ ධර්මදේශනා පැවැත්වූවත් ඒ භවයේදී නම් ධර්මාවබෝධය නොලැබේ. මේ පුද්ගලයා "පදපරම" නම් වේ.

මෙසේ දක්වූ මේ සතර පුද්ගලයන් අතුරින් උග්ඝටිතඤ්ඤූ පුද්ගලයන්ගේ අදහස් අනුව මෙම සූත්‍රය දේශනා කරන ලදි.

එකල්හි දනවුවැසි පන්සියයක් භික්ෂූහු, සියලුදෙනාම සමාන වූ පැවැතුම් ඇතිව, ධුතාංගධාරීව, ඇරඹූ වීර්යය ඇතිව, විඳසුන් භාවනාවෙහි නියැලුණාහු; ඇතැමෙක් තනිවම ද, දෙදෙනා බැගින් ද තිදෙනා බැගින් ද සිවුදෙනා හා පස්දෙනා බැගින් ද හැසිරෙන්නාහු; මෘදු සියුම්-ශූන්‍ය වූ ප්‍රත්‍යාකාර දැක්වෙන සූත්‍ර දේශනාවක් අසනු කැමතිව, සවස් කාලයේ භාග්‍යවතුන් වහන්සේ සමීපයට වැඩම කොට. භාග්‍යවතුන් වහන්සේට වැඳ, රතුකම්බිලි තිරයකින් උන්වහන්සේ වසන්නාක් මෙන් ධර්මදේශනාව අපේක්ෂා කරමින් භාග්‍යවතුන් වහන්සේ පිරිවරා වැඩහුන්හ. එම භික්ෂූන් වහන්සේලාගේ අදහස වශයෙන් බුදුපියාණන් වහන්සේ මේ සූත්‍ර දේශනාව ඇරඹූ සේක.

යම්සේ ඉතා දක්ෂ වූ සිත්තරෙක් පිරියම් නොකළ බිත්තියක් ලැබ, මුලින් ම එහි රූප නො ඇඳ; එම බිත්තිය අනර්ඝ මැටි-බදාම ආදියෙන් පිරියම් කොට, පසුව එම සුණු පිරියම් කළ බිත්තියෙහි රූප අඳින්නේ ද, ඉඳින් ඔහුට මුලදී පිරියම් කරන ලද බිත්තියක් ලැබුනේ නම්

ඔහු කිසිදු පිරියමක් නොකර, එහි සායම් ආදිය යොදා වැටියකින්, තෙලිකුරකින් සිතුවම් පමණක් අඳින්නේ ද එලෙසින් ම භාග්‍යවතුන් වහන්සේ කම්සැපෙහි කළකිරුණු - ආදිකම්මික (යමෙක් පළමුවෙන් ම කළ) කුල පුත්‍රයෙකු ලැබ, පළමුව අර්හත් මාර්ගයට ළංවන මෘදුමොළොක් - ශූන්‍ය වූ විදර්ශනා ලක්‍ෂණ සහිත දේශනාවක් ඔහුට නො පවත්වන සේක. සීලසමාධි කම්මස්සකත සම්මාදිට්ඨි යන සම්පතීන් යොදමින් (සම්මා දිට්ඨි) පූර්වභාග ප්‍රතිපදාව මුලින්ම ඔහුට දේශනා කරන සේක. ඒ සඳහා මෙය කියන ලදී. "එබැවින් මහණ! නුඹ මෙහිදී පළමුව කුසල ධර්මයන්ගෙන් සිත පිරිසිදු කරව. කුසල ධර්මයන්ට කුමක් මුල්වේද? ඉතා පිරිසිදු වූ ශීලයත් සෘජුවූ යහපත් දෘෂ්ටියත්ය. මහණ! යම්හෙයකින් ඉතා පිරිසිදු වූ ශීලයත් සෘජුවූ දෘෂ්ටියත් ඇත්නම් එවිට, මහණ! නුඹ, ශීලය නිසා - සීලයෙහි පිහිටා, සතර සතිපට්ඨානයත් ත්‍රිවිධාකාරයෙන් නුවණින් මෙනෙහි කරන්නෙහිය. කවර සතරක් ද? මහණ! මෙහි නුඹ අධ්‍යාත්මික වූ කයෙහි කය අනුව බලමින් වසන්නෙහිය. කෙලෙස් තවන වීර්යයෙන්, විමංසනශීලී නුවණින්, සිහි ඇතිව - ලෝකය පිළිබඳව දැඩි ලෝභ - දෝමනස්සයන් දුරු කරන්නේ ය. බාහිර වූ කයෙහි කය අනුව බලමින් -පෙ- අධ්‍යාත්මික වූ හා බාහිර වූ කයෙහි කය අනුව බලමින් -පෙ- ධර්මයන්හි ධර්මය අනුව බලමින් කෙලෙස් තවන වීර්යය ඇතිව, විමසනශීලී නුවණින් යුක්තව, සිහි ඇතිව - ලෝකය පිළිබඳ දැඩි ලෝභ - දෝමනස්සයන් දුරු කරන්නෙහිය. මහණ! මෙසේ නුඹ, සීලය නිසා, සීලයෙහි පිහිටා මේ සතර සතිපට්ඨාන ධර්මයන් මෙසේ වඩන්නෙහි නම් එනිසා මහණ! නුඹවහන්සේට දිවාරාත්‍රී සැමකල්හිම කුසල දහම් වැඩෙන්නේම ය. පිරිහීමක් නොවන්නේය." මෙසේ ආදිකම්මික කුල පුතුට ශීල කථාවෙන් මුලදී සූදානම් කර, පසුව අර්හත් ඵලයට ළංවන මෘදුමොළොක් වූ ශූන්‍ය වූ විදර්ශනා ලක්‍ෂණ ඇතුළත් ධර්මදේශනාවක් පවත්වන සේක. පිරිසිදු සිල් සහිත ඇරඹූ වීර්යය ඇතිව භාවනාවේ යෙදීමෙන් ලබන ලද විදසුන් ඇති පුද්ගලයාට බුදුපියාණන් වහන්සේ මුලින් කී පූර්වභාග ප්‍රතිපදාව නොදෙසන සේක. ඔහුට සෘජු වූ අර්හත්ඵලයට ළංවන - මෘදු මොළොක් ශූන්‍ය වූ විදසුන් ලක්‍ෂණයම දේශනා කරන සේක.

මේ පන්සීයක් භික්‍ෂූණ් වහන්සේලා, මැනවින් පිරිසිදුකළ රන් හා සමාන - මැනවින් පිරිමදින ලද මැණික් කඳක් හා සමාන වූ පූර්වභාග ප්‍රතිපදාව මැනවින් පුරුදුකර - පිරිසිදු කර සිටියහ. එනමුත් ඔවුහු ලෝකෝත්තර මාර්ගයට නොපැමිණියාහුමය. උන්වහන්සේලා ඒ ලෝකෝත්තර මාර්ගයට පැමිණවීම පිණිස, ශාස්තෘන් වහන්සේ ඔවුන්ගේ අදහස් අනුව මෙම සූත්‍ර දේශනාව ඇරඹූ සේක.

එහි **"පටිච්ච සමුප්පාදං"** යනු පටිච්ච සමුප්පාදයයි. පටිච්ච සමුප්පාදය වනාහි අන්‍යොන්‍ය හේතු-ඵල ධර්මයන් නිසා උපදින ධර්ම වශයෙන් ප්‍රතීත්‍ය සමුත්පාදය යැයි කියනු ලැබේ. මේ දක්වන ලද්දේ ඉතා සංක්ෂිප්ත වශයෙනි. විස්තර වශයෙන් දැනගනු කැමති නම් විසුද්ධි මාර්ගය බැලිය යුතුයි. "වො" යනු මේ වෝ ශබ්දය පඨමා, දුතියා, කරණ, චතුර්ථී, ඡට්ඨී යන විභක්තිවල පද පූරණාර්ථයෙහිද යෙදේ. "කච්චි පන වො අනුරුද්ධා! සමගඟා සමෙමාදමානා"a යන තැන පඨමා විභක්තියෙහි යෙදේ. "ගච්ඡථ! භික්ඛවෙ! පණාමෙමි වො"a යන තැන දුතියා විභක්තියෙහි යෙදේ. "න වො මම සන්තිකෙ වත්ථබ්බං"a යන තැන කරණ විභක්තියෙහි යෙදේ. "වනපත්ථ පරියායං වො භික්ඛවෙ දෙසිස්සාමි"a යන තැන චතුත්ථී විභක්තියෙහි යෙදේ. "සබ්බසං වො සාරිපුත්තා! සුභාසිතං"a යන තැන්හි ඡට්ඨී විභක්තියෙහි යෙදේ. "යෙහි වො අරියා පරිසුද්ධකම්මනත්තා"a යන තැන්හි පදපූරණාර්ථයේ යෙදී ඇත. මෙම සූත්‍රයේ වෝ ශබ්දය චතුත්ථී විභක්ති අර්ථයේ යෙදී ඇතැයි දත යුතුය. **"භික්ඛවෙ"** යනු කීකරු භාවයෙන් අභිමුඛ වූ භික්ෂූහු නැවත ඇමතීමකි. ආලපන විභක්ති වචනයකි. **"දෙසිස්සාමි"** යනු දේශනා කරන බව දැනුම් දීමයි. දෙසන්නෙමි. **"තං සුණාථ"** යනු මවිසින් දෙසනු ලබන ඒ ප්‍රතීත්‍ය සමුත්පාද දේශනාව මැනවින් අසවු යන අර්ථයයි. **"සාධුකං මනසිකරොථ"** යන මෙහි 'සාධුකං' යන්න මැනවි-මනාව යන එකම තේරුමක් දෙයි. මෙම "සාධු" ශබ්දය ආයාචන, සම්පටිච්ඡන, සම්පහංසන හා සුන්දර හා දළහීකම්ම යන අර්ථයන්හි යෙදේ. "සාධු මෙ භන්තෙ! භගවා සංචිත්තෙතන ධම්මං දෙසෙතු"b යනාදී තැන්වල ආයාචනය දිස්වේ. "සාධු භන්තෙ!ති ඛො සො භික්ඛු භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමෝදිත්වා"b යනාදියෙහි සම්පටිච්ඡන අර්ථයේ යෙදේ. "සාධු සාධු සාරිපුත්තා"b යනාදියෙහි සම්පහංසනයෙහි යෙදේ.

සාධු ධම්ම රුචි රාජා - සාධු පඤ්ඤාණවා නරෝ
සාධුමිත්තානා මද්දුබ්භා - පාපස්ස අකරණං සුඛං

("රජ්ජුදහම රුචිකිරීම යහපති. ප්‍රඥාවන්ත මිනිසා යහපති. මිතුරන්ට ද්වේෂ නොකිරීම යහපති. පවු නොකිරීමෙන් සැප ලැබේ.")c යන මේ ගාථාවේ "සාධු" ශබ්දය සුන්දර-යහපත් අර්ථයේ යෙදේ.

"තෙන හි බ්‍රාහ්මණ! සාධුකං සුණාහි"d යනාදියෙහි 'සාධුක'

a. මජ්ඣිම නිකාය b. සංයුත්ත නිකාය c. ජාතක පාළි d. සංයුත්ත නිකාය

ශබ්දය ම දළහීකම්මයෙහිත් අණකිරීමෙහිත් යෙදී ඇත. මෙම සූත්‍රයේ ද 'සාධුක' ශබ්දය දළහීකම්මයෙහිත් අණකිරීමෙහිත් යෙදී ඇති බව දතයුතුය. සුන්දර අර්ථයෙහි ගැනීම ද සුදුසුය. දළහීකරණාර්ථයේ - "මනාව සිතට ගෙන දැඩිව මේ ධර්මය අසවු" අණකිරීම් අර්ථයේ - "මගේ අණින් මේ ධර්මය අසවු" සුන්දර අර්ථයෙහි - "මේ සුන්දර වූ යහපත් වූ ධර්මය අසව්." මෙය දක්වන ලද්දේ වේ. "මනසිකරොථ" යනු "ආවර්ජනය කරවු. සිත එක්තැන් කරවු." යන අර්ථයි. "නොවිසිරුණු සිත් ඇතිව අසවු. සිතේ තබා ගනිවු." යන අදහසයි. දැන් මෙහි "තං සුනාථ" යනු සෝතින්ද්‍රියෙහි අවුල්බව කලබල බව දුරුකිරීමකි. "සාධුකං මනසිකරොථ" යනුවෙන් සිහිපත් කිරීමෙහි දැඩිව යෙදීමෙන් මනින්ද්‍රිය අවුල්වීම වැලකේ. මෙහි පළමු වැන්නෙන් ව්‍යඤ්ජන විපර්යාස අල්ලාගැනීම වලක්වන ලදි. පසුපදයෙන් අර්ථ විපර්යාස අල්ලාගැනීම වලකන ලදි. මුල්පදයෙන් ධර්මශ්‍රවණයෙහි යොදවයි. පසුපදයෙන් ඇසූ සූත්‍රධර්ම දරීම - මතක තබාගැනීම - පරීක්ෂා කිරීම ආදියේ යොදවයි. පළමු පදයෙන් ව්‍යඤ්ජන සහිත බැවින් මේ ධර්මය ඇසිය යුතුයැයි දක්වයි. පසුපදයෙන් අර්ථ සහිත බැවින් මේ ධර්මය සිතින් මෙනෙහි කළයුතු බව දක්වයි. "සාධුකං" යන පදය මේ පද දෙකෙහිම හෝ යොදා "මේ ධර්මය ධර්ම ගාම්භීරත්වයෙන් ද දේශනා ගාම්භීරත්වයෙන් ද යුතු බැවින් මැනවින් අසවු. අර්ථ ගම්භීරත්වය කරවු." ප්‍රතිවේධ ගම්භීරත්වයෙන් ද යුතු බැවින් මැනවින් සිහිපත් කරවු." මෙසේ අර්ථ යෝජනාව දක්විය යුතුයි. "භාසිසසාමී" යනු "දේශනා කරන්නෙමි යනුයි. එය අසවු" මෙහි ප්‍රතිඥා කරන ලද දේශනාව සංක්ෂිප්ත වශයෙන් නොව, සවිස්තර වශයෙන් ම දේශනා කරන්නෙමි" යන අදහස ගෙනදෙයි. මේ පද සංක්ෂිප්ත බව හා විස්තරාත්මක බව ප්‍රකාශ කරන ඒවාය. වංගීස තෙරණුවෝ මෙසේ වදාළහ.

"සංඛිත්තෙනපි දෙසෙති විත්ථාරෙනපි භාසති
සාළිකායිව නිග්ඝාසො පටිභාණං උදීරයි" ති

"සංක්ෂිප්තව ද දේශනා කරයි. විස්තර වශයෙන් ද දේශනා කරයි. සැළලිහිණියකට බඳු මියුරු හඬින් කියනු කැමති වූ විට මුහුදේ රළ මෙන් ප්‍රතිභානය නැග එයි."a

මෙසේ වදාළ විට ශ්‍රාවක භික්ෂූහු උත්සාහවන්ත වූවාහු "එවං භනෙතති චො තෙ භික්ඛු භගවතො පච්චසෙසාසුං" යනුවෙන් "ශාස්තෘන්

a. වංගීස සංයුත්තය

වහන්සේගේ වචනය මැනවින් පිළිගත්හ. බාරගත්හ"යි කියන ලදි. ඉක්බිති ඔවුන්ට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ. "දැන් මෙය කිවයුතුයි. මහණෙනි! ප්‍රතීත්‍ය සමුත්පාදය කවරේද?" යනාදී සියලුම සූත්‍ර දේශනාව මෙතැනදී දේශනා කළ සේක.

එහි "**කතමොච භික්ඛවෙ! පටිච්ච සමුපපාදො**"යි තමන්වහන්සේ ම පිළිතුරු දෙනු කැමති විමසීමකි.

ප්‍රශ්න විචාරීම් ක්‍රම පහකි. එනම්; අදිට්ඨජෝතනා පුච්ඡාව, දිට්ඨ සංසඳනා පුච්ඡාව, විමතිච්ඡේදනා පුච්ඡාව, අනුමති පුච්ඡාව සහ කථෙකුකම්‍යතා පුච්ඡාව යන පසයි. මේ ඔවුන්ගේ නානාවිධත්වයයි.

"අදිට්ඨජෝතන පුච්ඡාව" යනු කුමක්ද? ස්වභාවයෙන්ම නොදත්, නොදුටු, අසමාන වූ, තීරණය නොකළ, විස්තර නොකළ, අප්‍රකට ලක්‍ෂණ සහිත යම් කාරණයක් ඔහුට දැනගැනීමට, දැකගැනීමට, සමාන කිරීමට, තීරණය කිරීමට, විස්තර කිරීමට හා ප්‍රකට කිරීමට ප්‍රශ්න විචාරයි. මේ ප්‍රශ්නය "අදිට්ඨ ජෝතනා පුච්ඡාව" නම් වේ.

"දිට්ඨ සංසඳනා පුච්ඡාව" නම් කවරේද? ස්වභාවයෙන්ම දැනගත්, දැකගත්, සමාන කළ, තීරණය කළ, විස්තර කළ හා ප්‍රකට වූ ලක්‍ෂණ සහිත කාරණයක්, අනෙකුත් පඬිවරුන්ගේ දර්ශන සමග සැසඳීම සඳහා ප්‍රශ්න විචාරයි. මෙය 'දිට්ඨ සංසඳනා පුච්ඡාව' නම් වේ.

"විමතිචෙඡ්දනා පුච්ඡාව" කවරේද? ස්වභාවයෙන් ම සැක සහිත වූ විමති සහිත වූ සැක උපදවන්නා වූ යම් කාරණයක් වේද එය "එසේද?" "එසේ නොවේද?" "කවරාකාරද?" ආදී වශයෙන් සැක සංකා සහිතවේද- එහි සැක දුරුකරගැනීම සඳහා ප්‍රශ්නයක් විමසයි. මේ ප්‍රශ්නය "විමතිච්ඡේදනා පුච්ඡාව" නම් වේ.

"අනුමති පුච්ඡාව" කවරේද? භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් වහන්සේලාගේ අනුමැතිය ලබාගනිමින් ප්‍රශ්න විමසන සේක. "මහණෙනි! නුඹලා කුමක් සිතන්නෙහුද? "රූපය නිත්‍යය ද? අනිත්‍යය ද?" "ස්වාමීනි! රූපය අනිත්‍යයයි." "යමක් අනිත්‍ය නම් එය දුක ද? සැපද?" "ස්වාමීනි! යමක් අනිත්‍යය නම් එය දුකකි." "යමක් අනිත්‍යනම්, දුක නම්, පරිණාමයට පත්වේ නම්, "මෙය මගේය. මේ මම වෙමි. මේ මගේ ආත්මයයි." යනුවෙන් සැළකිය හැකිද?" "ස්වාමීනි! එසේ සැලකිය නොහැක."a මෙය අනුමත පුච්ඡාව නම් වේ.

---

a. අනන්ත ලක්ඛණ සූත්‍රය

"කථෙතු කම්‍යතා පුච්ඡාව" යනු කුමක්ද? භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් වහන්සේට ධර්මකාරණයක් විග්‍රහ කරනු කැමතිව ප්‍රශ්න විමසන සේක. "මහණෙනි! මෙහි සතිපට්ඨාන ධර්ම සතරකි. කවර සතරක් ද? යනුවෙනි. මෙය කථෙතුකම්‍යතා පුච්ඡාව නම් වේ.

මෙහි බුදුවරුන්ට මුලින් පැවසූ ප්‍රශ්න ක්‍රම තුන නැත. කුමක් නිසා ද? බුදුවරුන්ගේ දේශනාවෙහි, ඒකාන්තයෙන් මිදීමට හේතුවන සංඛත වූ හෝ අසංඛත වූ හෝ නොදක්නා ලද, බැබලීමට නොපත් වූ, අසමාන වූ, තීරණය කළ නොහැකි, අප්‍රකට, විස්තර කළ නොහැකි ධර්ම කරුණක් තුන්කල්හිම නැත. එනිසා බුදුවරුන්ට අදිට්ඨජෝතනා පුච්ඡාව නැත. භාග්‍යවතුන් වහන්සේ විසින්, තමන් වහන්සේගේ ඤාණයෙන් අවබෝධ කරගෙන දෙසන ලද ධර්මයෙහි; අන්‍ය වූ ශ්‍රමණ-බ්‍රාහ්මණ-දේව-මාර-බ්‍රහ්ම යනාදී කවර සත්ත්වයකු සමගවත් කිසිදු ආකාරයක සැසඳීමක්-සන්සන්දනයක් නම් නැත. මෙනිසා බුද්ධ දේශනාවෙහි දිට්ඨ සංසන්දනා පුච්ඡාව ද නැත. බුදුරජාණන් වහන්සේ කිසිදු සැකයක් නැති උතුමෙකි. සැක ඉක්මවා, තරණය කළ - සියලු ධර්ම පිළිබඳ පහවූ සැක ඇති උතුමෙකි. එනිසා උන්වහන්සේට විමතිච්ඡේදනා පුච්ඡාව නැත. ඉතිරි ප්‍රශ්න ක්‍රම දෙක භාග්‍යවතුන් වහන්සේට ඇත. එම දෙක අතුරින් මෙම සූත්‍රයේ "කථෙතු කම්‍යතා පුච්ඡාව" යෙදුණු බව දතයුතුයි.

දැන් ඒ ප්‍රශ්නයෙන් විමසන ලද ප්‍රත්‍යාකාරයත් බෙදා දක්වන සේක් "අවිජ්ජා පචචයා භික්ඛවෙ! සංඛාරා" යනාදිය දෙසූහ. මෙහිදී - යම්සේ "පියාට කථාකරන්නෙමි"යි අදහස් කළ තැනැත්තෙක්, "සෝණගේ පියා", "තිස්සගේ පියා" ආදී ලෙස පළමුව පුතු ගැන සඳහන් කරන්නේ ද එලෙසින් ම භාග්‍යවතුන් වහන්සේ ප්‍රත්‍ය දේශනා කිරීමට අරඹන ලද සේක්. "අවිද්‍යාව හේතුවෙන් සංස්කාර ධර්ම හටගනී" යනාදී ලෙස සංස්කාරාදී ප්‍රත්‍යයන්ට හේතුවූ අවිද්‍යාදී ධර්ම පිළිබඳව දේශනා කරන සේක් ප්‍රත්‍යෝත්පන්න ධර්ම දේශනා කළ සේක. ආහාර වර්ගය අවසානයේ "මහණෙනි! නුඹලාට ප්‍රතීත්‍ය සමුත්පාදය දේශනා කරමි. ප්‍රතීත්‍යසමුත්පාද ධර්මයන් ද දේශනා කරන්නෙමි"c යි මෙසේ දෙකම ආරම්භ කළසේක් එම දේශනා දෙකම පැවැත්වූහ. මෙහි "අවිජ්ජා පචචයා සංඛාරා" යන තැන්හි අවිද්‍යාවත් ප්‍රත්‍යයත් වූයේ එකම බැවින් එය "අවිජ්ජා පචචය" වේ. "අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාර හටගනිය." යන මේ ක්‍රමයෙන් අර්ථ දතයුතුයි. මේ දැක්වූයේ සංක්ෂිප්ත වශයෙනි. විස්තර වශයෙන් සියලු ආකාරයෙන් සම්පූර්ණ වූ අනුලෝම වූ ප්‍රතීත්‍ය සමුත්පාද කථාව විසුද්ධි

c. අභිසමය සංයුත්තය

මාර්ග ප්‍රතිලෝම වූ ප්‍රතීත්‍ය සමුත්පාද කථාව වනාහී "අවිජ්ජායත්වේ"යි අවිද්‍යාවෙහි ම වේ. "අසෙස විරාග නිරොධා" යනු විරාග සංඛ්‍යාත වූ ලෝකෝත්තර මාර්ගයෙන් ඉතිරි නොකර තණ්හාව සිඳලීමයි. "සංඛාර නිරොධා" යනු සංස්කාරයන් නූපදීමෙන් නිරෝධය වේ.

මෙසේ නිරෝධයන්ගේ වශයෙන් සංස්කාර ධර්මයෝ නිරුද්ධ වීමෙන් විඤ්ඤාණාදිය ද නිරුද්ධ වේ. නාමරූපාදියේ නැසියාම ද එනිසා ම වේයැයි දැක්වීමට "සංඛාර නිරොධා විඤ්ඤාණ නිරොධො" ආදිය කියා "එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති"යි දෙසූහ. එහි "කෙවලස්ස" යනු සියලු ආකාරයෙන්ම පිරිසිදු වූ - ඇලීම් විරහිත වූ යන අර්ථයයි. "දුක්ඛක්ඛන්ධස්ස" යනු දුක් රැසයි. "නිරොධො හොති" යනු නො ඉපදීම වේ.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ අනුලෝම වශයෙන් දොළොස් පදයකින් සංසාරික පැවැත්ම පිළිබඳ දේශනාව පවත්වා, ඒ වෘත්තය ම නැවත පෙරළා ප්‍රතිලෝම වශයෙන් දොළොස් පදයකින් සසර නැවැත්ම පිළිබඳ වෘත්තය දේශනා කරන සේක්, දේශනාවේ ප්‍රධාන අරමුණ රහත්බවට යොමුකළහ. දේශනාව අවසානයේ ඇරඹූ විදර්ශනා වැඩීම් ඇති ඒ පන්සීයක් උග්ඝටිතඤ්ඤූ පුද්ගලයෝ වූ භික්ෂූහු, සූර්ය රශ්මිය මනාව ස්පර්ශ කළ මේරු පියුම් මෙන් සත්‍යය අවබෝධ කළාහු ඵලයෙහි පිහිටියහ.

"ඉදමවොච භගවා" මෙසේ සසර පැවැත්ම හා නැවැත්ම පිළිබඳ චක්‍රයක් වශයෙන් සියලු සූත්‍රය, බුදුරජාණන් වහන්සේ විසින් ම දේශනා කළ සේක. "අත්තමනා තෙ භික්ඛු" යනු සතුටු සිත් ඇති ඒ පන්සීයයක් ක්ෂීණාස්‍රව භික්ෂූහු "භගවතො භාසිතං අභිනන්දුනනී" - සිත් පිනවන කන්කලු කොවුල් නදින්, පණ්ඩිත ජන හදවත්වලට අමාදිය ඉසින්නාක් මෙන් බ්‍රහ්ම ස්වරයෙන් දේශනා කරන්නා වූ භාග්‍යවතුන් වහන්සේගේ වචනයට ඉතා සතුටුවූහ. අනුමෝදන් වූහ. එසේම මැනවින් පිළිගත්හ. යන අර්ථයි. එනිසා මෙය කියන ලදී.

"සුභාසිතං සුලසිතං සාධු සාධුති තාදිනො
අනුමොදමානා සිරසා සම්පටිච්ඡිංසු භික්ඛවො"

"කෙලෙස් සිඳලූ භික්ෂූහු මැනවින් දෙසූ - මැනවින් වදහළ බුදුදෙසුම ඇසුවාහු, "මැනවැ"යි කියා සතුටුවෙමින් මැනවින් එය පිළිගත්හ.

පළමු පටිච්ච සමුප්පාද සූත්‍ර වර්ණනාව නිමාවිය.

12. 1. 2.

දෙවැනි සූත්‍රයෙහිද ඉහත කියන ලද පරිදි සූත්‍ර නික්ෂේපය දතයුතුය. මෙම සූත්‍රයේ ඇති විශේෂත්වය මෙයයි. - පළමු සූත්‍රය උග්ඝටිතඤ්ඤූ පුද්ගලයන්ගේ අදහස් වශයෙන් සංක්ෂිප්තව දක්වන ලදී. මෙම සූත්‍රය විපචිතඤ්ඤූ පුද්ගල අදහස් වශයෙන් සවිස්තරව දක්වන ලදී. මේ සූත්‍රයේ දී වනාහී වැල් රැගෙන යන පුද්ගලයින් සතර දෙනාගේ උපමාව කිව යුතුයි. එය විසුද්ධිමාර්ගයේ කියන ලද්දේම ය. යම්සේ වැල් රැගෙන යන පුරුෂයකු වැලේ අග දැක, ඒ අනුසාරයෙන් වැලේ මුල සොයා ගොස්, එය දැක මුලින් ම වැල සිඳගෙන කටයුත්තෙහි යොදන්නාක් මෙන් භාග්‍යවතුන් වහන්සේ ද විස්තරාත්මකව සූත්‍ර දේශනාව පවත්වන සේක්, ප්‍රතීත්‍ය සමුත්පාදයේ කෙළවර වූ ජරා-මරණ දෙකේ පටන් මුලින් ම ඇති අවිද්‍යාව දක්වා දේශනාව ගෙනහැර දක්වමින් නැවත සසර පැවැත්ම හා නැවැත්ම දැක්වීම් වශයෙන් දෙසුම පවත්වා නිමාකළ සේක.

එහි මේ ජරාමරණාදී විස්තර දේශනාවෙහි අර්ථ විනිශ්චයයි. පළමුකොට ජරාමරණ නිර්දේශයේ **"යා තෙසං තෙසං"** යන මෙය සංක්ෂිප්ත වශයෙන් නානාවිධ සත්ත්වයන්ට සාධාරණ වූ නිර්දේශයකැයි දැනගත යුතුයි. "දේවදත්තගේ ජරාවට පත්වීම - සෝමදත්තගේ ජරාවට පත්වීම ආදී ලෙස මේ අයුරින් දවසක්ම කියූවත් සත්ත්වයෝ සම්පූර්ණ වශයෙන් අදහස් නොවෙති. මෙම පද දෙකින් වනාහී කිසිම සත්ත්වයෙක් අත් නොහරින ලදී. සෑම සත්ත්වයෙක්ම අන්තර්ගත කරගන්නා ලදී. එනිසා - "මේ සංක්ෂිප්ත වශයෙන් නානාවිධ සත්ත්වයන්ට සාධාරණ වූ නිර්දේශයකැ"යි කියන ලදී. **"තමහි තමහි"** යනු මේ ගතිජාති වශයෙන් නානාවිධ සත්ත්ව සමූහයාට සාධාරණ වූ නිර්දේශයකි. **"සතත නිකායෙ"** යන පොදු සාධාරණ නිර්දේශයෙන් දක්වන ලද ස්වරූපය දැක්වීමකි. ජරාව-දිරායෑම ආදියෙහි **"ජරා"** යනු ස්වභාවය දැක්වීමකි. (ස්වභාව නිර්දේශයයි.) **"ජීරණතා"** යනු ආකාරය දැක්වීමකි. (ආකාරය නිර්දේශයයි.) **"ඛණ්ඩිච්චං"** යනාදියේ මුල් කාලත්‍රය ඉක්මවීමෙන් ඇතිවන කටයුතු දැක්වීමකි. (කිච්ච නිද්දෙසො) පසුව පැවසූ දෙක ස්වභාවයෙන් වන දැක්වීමකි. (ප්‍රකෘති නිර්දේශයකි.) මෙහි වනාහි **"ජරා"** යන මේ පදයෙන් ඔහුගේ මේ ස්වභාවයෑ"යි දක්වන ලද බැවින් මේ එහි ස්වභාව නිර්දේශයයි. **"ජීරණතා"** යනු ඔහුගේ මේ ආකාරය" යැයි දක්වන ආකාර නිර්දේශයයි. **"ඛණ්ඩිච්චං"** යනු "මේ කාලයන්ගේ ඉක්මයෑමෙන් වන දත් නිය කැඩෙන-බිඳෙන බවට කටඹුතු කිරීමයි. **"පාලිච්චං"** යනු මේ කේශලෝමාදියේ ඉදෙන

බවයි. ඊට කටයුතු කරන බවයි. "**චලිතනවතා**" යනු මේ මස් මැලවී සම රැලි වැටෙන බවට කටයුතු කිරීමයි." ආදී වශයෙන් දක්වන ලද මේ බණ්ඩිච්චාදිය තුන්කල් ඉක්මයෑමෙන් ඇතිවන කෘත්‍ය නිර්දේශයයි. (කටයුතු දැක්වීමයි.) ඒවා අතුරින් මේ විකාරයන්ගේ දැක්වීම් වශයෙන් ප්‍රකට වූ - ප්‍රකට දිරා යෑම දක්වන ලදී. ජලයේ හෝ සුලඟේ හෝ ගින්නේ හෝ තණ-රුක් ආදියේ කැඩී-බිඳී යෑම හෝ දවීම හෝ ගියමග ඉතා ප්‍රකටය. ඒ දිය ආදී ද්‍රව්‍යයන්හි වෙනස්වීම එම ද්‍රව්‍යයේ දක්නට නැත. මෙලෙසින්ම ජරාවට පත්වීමෙන්, දත් ආදියෙහි කැඩීම්-බිඳීම් ආදී වශයෙන් පැමිණි ආකාරය පියවි ඇසින් දකිය හැකිය. ඉතා ප්‍රකටය. එනමුත් දිරායෑම කැඩී-බිඳීම් ආදියෙහි නැත්තේමය. ජරා ලක්ෂණය ඇසින් දැනගත නොහැක්කේමය. "**ආයුතො සංහානි ඉන්‍ද්‍රියානං පරිපාකො**" යන මේ පදවලින් කාලතික්‍රමණය ම මැඩපැවැත්වීම පිණිස, ආයුෂ ගෙවී යාමෙන් චක්ෂු ආදී ඉන්‍ද්‍රියයන්හි මෝරායෑම හඳුන්වාදීම පිණිස ඒවායේ ස්වභාවය-ප්‍රකෘතිය දක්වන ලදී. එහෙයින් මේ අවසන් ප්‍රකෘති ස්වභාව දෙන දක්වන ලදුයි දත යුතුයි.

එහි යම්හෙයකින් ජරාවට පත්වූවහුගේ ආයුෂ පිරිහේද එහෙයින් "ජරාව ආයුෂ පැහැර ගනියි" යනුවෙන් එලුපචාර වශයෙන් කියන ලදී. යම් හෙයකින් තරුණ කාලයේ අතිප්‍රසන්න වූ සියුම් වූ තමාගේ අරමුණ සුවසේම ගැනීම සමත් වූ ඇස් ආදී ඉන්‍ද්‍රියයන්, ජරාවට පත්වූවහුට, මුහුකුරා ගිය-කළඹන ලද-අප්‍රකට වූ-ඕළාරික වූ සිය අරමුණ ගැනීමට අසමත් වේ. එනිසා ඉන්‍ද්‍රියයන්ගේ මුහුකුරා යෑම එලුපචාර වශයෙන් කියන ලදී. මෙසේ විස්තර කරන ලද ඒ සියලුම ජරාවට පත්වීම් "ප්‍රකට ජරාව" හා "සැඟවුණු ජරාව" වශයෙන් දෙකොටසකි. දත් ආදියේ කැඩී-බිඳීයෑම, රූපධර්මයන්හි ඇති දිරායෑම ප්‍රකට ජරාව නම් වේ. අරූප ධර්මයන්හි දිරායෑම මගින් එබඳු වෙනස්වීමක් නොපෙන්වන බැවින් පටිච්ඡන්න ජරාව හෙවත් සැඟවුණු ජරාව නම් වේ. නැවත ද ජරාව "අවීචි ජරාව" හා "සවීචි ජරාව" වශයෙන් කොටස් දෙකකට බෙදේ. මැණික්, රන්, රිදී, පබළු, සඳ, හිරු ආදියේ මෙන් ද මන්දඳසකයේ පසුවන සත්ත්වයන්ගේ මෙන් ද මල්, ගෙඩි, දලු ආදී අජීවී වස්තූන්ගේ මෙන් ද නිරන්තරයෙන් සිදුවන වර්ණ විශේෂාදීන්ගේ දිරායෑම - අසීරුවෙන් දතයුතු බැවින් "අවීචි ජරාව" නම් වේ. එහි "නිරන්තර දිරායෑම" යන අර්ථය ඇත. සෙසු ජීව-අජීව වස්තූන්ගේ ඉහත පැවසූ පරිදි නිරන්තරව වර්ණ විශේෂාදියේ වෙනස්වීම පහසුවෙන් දැනගත හැකි බැවින් - එම දිරායෑම "සවීචි ජරා" නම් වේ යැයි දතයුතුයි.

ඉන් අනතුරුව "**තෙසං තෙසං**" යනාදිය ද ඉහත කියන ලද පරිදිම දතයුතුය. චුති චවන තා ආදියෙහි වනාහී "**චුති**" යනු චුතිවීම් වශයෙන් කියයි. මෙය ඒකස්කන්ධයට, සතරස්කන්ධයට හා පංචස්කන්ධයට භාවිත සමාන වදනකි. "**වචනතා**" යනු භාව තද්ධිත වචනයකින් ස්වභාව-ලක්ෂණ දැක්වීමකි. "**භෙදො**" යනු චුතිවන ස්කන්ධයන්ගේ බිඳීම-ඉපදීම් ප්‍රකටව දැක්වීමකි. "**අන්තරධානං**" යනු බිඳුණු කළයක් මෙන් බිඳිගිය චුති ස්කන්ධයන්ගේ යම්කිසි ක්‍රමයකින් සිටින බව දැක්වීමකි. "**මචවුමරණං**" යනු මෘත්‍යු සංඛ්‍යාත වූ මරණයයි. එයින් සමුච්ඡේද මරණාදිය වළක්වයි. "**කාළ**" යනු මාරයාට නමකි. කාළයාගේ ක්‍රියාව හෙවත් කාළයා විසින් කරනු ලබන ක්‍රියාව "**කාළකිරියා**" නම් වේ. මෙසේ මෙම වචනයෙන් ලෝක සම්මුතික වූ "මරණය" හඟවයි. දැන් පරමාර්ථ වශයෙන් දැක්වීමට "ඛන්ධානං භෙදො" යනාදිය වදාළහ. පරමාර්ථයේ දී ස්කන්ධයන් ම බිඳේ. "සත්ත්ව" නම් ඇති කිසිවකු නොමැරේ. ස්කන්ධයන්ගේ බිඳියාමේදී ම "සත්ත්වයා මැරුණේය. බිඳුනේය." යනුවෙන් ව්‍යවහාර ඇති වේ. මෙහිදී ද පඤ්ච-චතු වොකාර වශයෙන් ස්කන්ධයන්ගේ බිඳියාමත් ඒකවෝකාර වශයෙන් ශරීරයේ බහාතැබීම අදහස් වේ. චතුවොකාර වශයෙන් ස්කන්ධයන්ගේ බිඳියාමත්-සෙසු ද්වායාකාර (එක-පංච) වශයෙන් ශරීරය හැරදැමීමක් දතයුතුයි. කුමක් නිසාද? දිව්‍ය මනුෂ්‍යාදී භව දෙකෙහිම රූප කාය නම් වූ ශරීරයේ පහළවීම සිදුවේ. එහෙත් චතුර්මහාරාජිකාදි දිව්‍යලෝකයන්හිදී ස්කන්ධ බිඳියෑමේදී කිසිවක් ඉතිරි නොවේ. එනිසා එම දිව්‍යලෝක අදහස් කිරීම් වශයෙන් "ස්කන්ධයන්ගේ බිඳියෑම" (ඛන්ධානං භෙදො) යන්නත් මනුෂ්‍යාදී ආත්මභාවවල ශරීරය හැරදැමීම අදහස් කිරීමට "ශරීරය හැරදැමීම" (කළෙබරසස නිකෙඛ්‍යා) යන්නත් යෙදුණි. මිනිස්ලොව ශරීරය හැරදමන (ඉතිරිවන) බැවින් මරණය යනු "ශරීරයේ හැරදැමීම" යැයි කියන ලදයි මෙහි අර්ථ දතයුතුයි. "**ඉති අයඤ්චඅ ජරා ඉදඤ්චඅ මරණං ඉදං වුච්චති භික්ඛවෙ**" යනුවෙන් මේ වචන දෙකම එකතුකර "ජරාමරණ" යැයි කියනු ලැබේ.

ජාති නිර්දේශයේ - උපදී, හටගනියි ආදියෙහි ඉපදීම් අර්ථයෙන් "**ජාති**" නම් වේ. එය පරිපූර්ණ නොවූ ආයතන වශයෙන් කියන ලදී. හටගනියි යන අර්ථයෙන් "**සඤ්ජාති**" නම් වේ. පරිපූර්ණ වූ ආයතන වශයෙන් කියන ලදී. බැසගැනීම - ඇතුල්වීම යන අර්ථයෙන් "**ඔකකනති**" නම් වේ. එය අණ්ඩජ, ජලාබුජ වශයෙන් කියන ලදී. ඔවුහු අණ්ඩකෝෂයට ද ගර්භාෂයට ද බැසගන්නාක් මෙන් පිළිසිඳ ගනිති. ඉපදීම් අර්ථයෙන් "**අභිනිබබතති**" නම් වේ. එය 'සංසේදජ' හා ඕපපාතික වශයෙන් කියන

ලදී. ඔවුහු ප්‍රකටව ම පෙනෙමින් උපදිති. පහළවෙති. මේ දක්වා කරන ලද්දේ වෝහාර දේශනාවයි. දැන් පරමාර්ථ දේශනාව අරඹනු ලැබේ. පරමාර්ථ වශයෙන් ස්කන්ධ මිස සත්ත්වයකු පහළ නොවේ. එහි ද "ඛන්ධානං" යනු එකවෝහාර භවයේ එක් ස්කන්ධයකි. චතුවෝකාර භවයේ ස්කන්ධ සතරකි. පඤ්චවෝකාර භවයේ ස්කන්ධ පහකි. මේ අයුරින් දතයුතුයි. "පාතුභාවො" යනු උපතයි. පහළවීමයි. "ආයතනානං" යනු ඒ ඒ තැන උපදින ආයතන වශයෙන් සංග්‍රහ කරන ලදුයි දතයුතුයි. "පටිලාභො" යනු නොකඩවා පැවැත්ම පහළවීමකි. පහළවන්නා වූ අවස්ථාවේ ලද ආත්මභාවයේ නාමය ම යෙදේ. "අයං වුච්චති භික්ඛවෙ! ජාති" යනු මේ පදයෙන් ව්‍යවහාර වශයෙන් ද පරමාර්ථ වශයෙන් ද දෙසන ල ද බැවින් "ජාති"-ඉපදීම නිගමනය කරයි.

භව නිර්දේශයේ - "කාමභවො" යනු කර්ම භවය හා උත්පත්ති භවයයි. එහි 'කර්ම භවය' නම් කාම භවයට පමුණුවන කර්මයයි. එය-ඒ උප්පත්ති භවයට හේතුවන බැවින් "බුදුවරුන්ගේ උපත සැපයකි. පවු රැස්වීම දුකට හේතුවකි" ආදියේ මෙන් ඵල (විපාක) ව්‍යවහාර වශයෙන් "භව"යැයි කියන ලදී. උත්පත්ති භවය නම් ඒ කර්මයෙන් උපන් තමාගේ යැයි ගන්නා ලද ස්කන්ධ පංචකයයි. එය "එහි වන්නේයැ"යි (භවතීති) "භව" නම් වේ. සෑම අයුරින් ම මේ කර්මය ද උත්පත්තිය ද යන මේ දෙකම "කාමභව"යැයි කියන ලදි. රූපාරූප භවයන් හිද මේ ක්‍රමය ම දතයුතුයි.

උපාදාන නිර්දේශයේ - කාමුපාදානාදියෙහි, වස්තු කාමයෙන් දැඩිව අල්ලා ගනියි. ඉන් තමා ම හෝ එහි උපාදාන කරගනියි යනු "කාමූපාදානං" වේ. කාමය ද උපාදානය ද වූයේ එකම බැවින් "කාමූපාදානං" පදය ලැබේ. උපාදාන යනු දැඩිව අල්ලා ගැනීමයි. මෙහි "උප" ශබ්දය උපායාස, උපකුට්ඨාදියෙහි මෙන් "දැඩිව ගැනීම" අර්ථය දෙයි. මෙය පංචකාම ගුණයක් වූ රාගයට තවත් සමාන වදනකි. මේ දැක්වූයේ සංක්ෂිප්ත විස්තරයයි. සවිස්තරාත්මකව වනාහී "එහි කාමූපාදානය කවරේද? යමෙක් කාමයන්හි කාමාශාවෙන් පසුවීමයි."a යනාදී ලෙස කියූ පරිදි දතයුතුයි. එසේම "දිට්ඨිය වූයේත් එම උපාදානය වූයේත් එම" යන විග්‍රහයට අනුව "දිට්ඨූපාදානං" වේ. නැතහොත් දෘෂ්ටිය උපාදාන කර ගනියි. මෙයින් දෘෂ්ටිය දැඩිව අල්ලාගනියි යනු දිට්ඨුපාදාන නම් වේ. පළමු දෘෂ්ටිය

---

a. විභංග පාළි

උපාදාන කරගනියි. ශ්‍රේෂ්ඨ දෘෂ්ටිය යැයි එම මුල් දෘෂ්ටිය දඩිව ගනියි. මෙසේ කියන ලදී. - "ආත්මය ද ලෝකය ද ශාස්වතය. (සදාකාලිකය). යන මේ අදහසම සත්‍ය වේ. සෙසු අදහස් වැරදිය."a යනාදී ලෙසයි. සීලවෘත දැඩිව ගත්, ආත්මය දැඩිව ගත් වැරදි සියලු දෘෂ්ටිගතයන්ට මේ සමාන වදනකි. මේ දැක්වූයේ සංක්ෂිප්ත වශයෙනි. විස්තර වශයෙන් "එහි දෘෂ්ටි උපාදානය කවරේද? දුන් දෙයෙහි විපාක නැත....."b ආදී වශයෙන් පැවසෙන දසවස්තුක මිත්‍යා දෘෂ්ටිය කියූ පරිදි දත යුතුය. එසේම වැරදි සිල්ව්‍රත ම උපාදාන වශයෙන් ගැනීම "**සීලබබතුපාදානං**" වේ. ගෝ සීල, ගෝ ව්‍රත ආදියෙන් ශුද්ධිය ලැබෙයැයි ආශාවෙන් තමාම එය දැඩිව ගැනීමයි. මේ දැක්වූයේ සංක්ෂිප්ත වශයෙනි. විස්තර වශයෙන් වනාහී "එහි සීලබ්බත උපාදානය නම් කවරේද? මේ බුදුසසුනින් පිටත, මහණ බමුණන්ගේ වැරදි සීල සමාදානාදියෙන් මෝක්ෂය-ශුද්ධිය වේයැයි සිතීමයි."b මෙසේ දැක්වූ පරිදි දතයුතුයි. දුන් "මොවුහු විසින් කියති" (වදනති එතෙන) යන විග්‍රහයෙන් "වාදෝ" නම් වේ. "මොවුන් විසින් දැඩිව ගනියි" (උපාදියනති එතෙන) යනු "උපාදානං" වේ. කුමක් මෙසේ කියත් ද? උපාදාන කරගනිද්ද? ආත්මයයි. ආත්මය පිළිබඳ වාදය, උපාදානය "**අනතවාදූපාදානං**" නම් වේ. ආත්මවාදය පමණක් ම ගෙන මේ ආත්මය යැයි උපාදානය කරගනියි නුයි 'අතතවාදූපාදානං' නම් වේ. විසි ආකාර වූ සක්කාය දෘෂ්ටියට මේ තවත් සමාන වදනකි. මේ දක්වූයේ සංක්ෂිප්ත වශයෙනි. විස්තර වශයෙන් වනාහී "මෙහි ආත්මවාද උපාදානය නම් කවරේද? මෙහි අශ්‍රැතවත් පුහුදුන් පුද්ගලයා ආර්යයන් නොදක්නේ.....b" ආදී වශයෙන් කියනලද පරිදිම දතයුතුයි.

තණ්හා නිර්දේශයේ- "**රූපතණ්හා -පෙ- ධම්ම තණ්හා**" යනුවෙන් චක්ඛුද්වාරාදියෙහි පවතින ජවන වීථියේ තණ්හාවට, සිටුපුතා - බමුණු පුතා ආදී වශයෙන් පියාගේ නමින් දරුවන් හඳුන්වන්නාක් මෙන් ඊට සමාන වූ අරමුණුවල නම යෙදේ. මෙහි රූපාරම්මණයේ පවතින තණ්හාවට - රූපයේ වූ තණ්හාව අරුතින් "**රූපතණ්හා**" යන්න යෙදේ. එය "**කාමරාග**" වශයෙන් රූපය ආශ්වාදනය කරමින් පවතිනුයේ කාම තණ්හාවයි. ශාස්වත දෘෂ්ටියෙන් යුතු රාග වශයෙන් "රූපය නිත්‍යයය, ස්ථිරය, ශාස්වතය" යනුවෙන් ආශ්වාදනය කරමින් පවතිනුයේ භව තණ්හාවයි. උච්ඡේද දෘෂ්ටියෙන් යුතු රාග වශයෙන් "රූපය සිඳදමයි. විනාශ වේ. පරලොවට නොයයි." යනුවෙන් ආශ්වාදනය කරමින්

a. අංගුත්තර නිකාය b. විභංග පාළි

පවතිනුයේ විභව තණ්හාවයි. රූප තණ්හාව මෙසේ ත්‍රිවිධාකාර වේ. රූප තණ්හාව ප්‍රභේද වන්නාක් මෙන් ම ශබ්දා දී සෙසු අරමුණු පිළිබඳ තණ්හාව ද එසේම ප්‍රභේද වේ. ඒ අනුව අරමුණු සය (6) තණ්හා තුනකට (3) ප්‍රභේද වීමෙන්, තණ්හාව දහඅට වැදෑරුම් වේ. එම අටලොස අධ්‍යාත්මික හා බාහිර වශයෙන් බෙදීයෑමෙන් තණ්හාව තිස්හය (36) වැදෑරුම් වේ. එම තිස්හය අතීත-අනාගත-වර්තමාන වශයෙන් බෙදී යාමෙන් එකසිය අටවැදෑරුම් වේ.

අධ්‍යාත්මික වූ රූපාදී අරමුණු දැඩිව අල්ලාගෙන "මම වෙමි"යි, "මෙසේ වෙමි"යි මේ ආදී වශයෙන් මමායතනයෙන් ගත් අධ්‍යාත්මික වූ රූපාදිය ආශ්‍රිත දහඅට තණ්හාවත්, බාහිර උපාදාන වශයෙන් ගත් "මෙයින් මම වෙමි", "මෙයින් මෙසේ මම වෙමි" යනාදී ලෙස බාහිර රූපාදිය ආශ්‍රිත දහඅට තණ්හාවත් යන තිස්හයයි. මෙසේ අතීත වූ තිස්හයත්, අනාගත වූ තිස්හයත්, පච්චුප්පන්න (වර්තමානයේ ඇති) තිස්හයත් යනුවෙන් එකසිය අටක් තණ්හාව දක්නට ලැබේ. නැවත සංග්‍රහ කරනවිට රූපාදී අරමුණුවල තණ්හා කායයෝ සවැදෑරුම් වෙති. කාම තණ්හාදිය තුන් වැදෑරුම් වේ. මෙසේ

නිද්දෙසපෙඨන නිද්දෙස - විත්ථාරා විත්ථාරසසච
පුන සංගහතො තණහා - විඤ්ඤාතබ්බා විභාවිනා

"නුවණැත්තන් විසින් තණ්හා නිර්දේශය, සංග්‍රහ කිරීමෙන්, විස්තර කිරීමෙන්, බෙදා දැක්වීමෙන් හා නැවත සංග්‍රහ කිරීමෙන් මැනවින් දතයුතුය."

වේදනා නිර්දේශයේ - "වෙදනාකායා" යනු වේදනා සමූහයයි. "චකඛු සම්ඵස්සජා වෙදනා -පෙ- මනො සම්පස්සජා වෙදනා" යනු මෙහි "ඇස අරමුණ ස්පර්ශ කිරීමෙන් (ගැටීමෙන්) උපදින කුසල් වේදනා ඇත. අකුසල් වේදනා ඇත. අබ්‍යාකත වේදනා ඇත." මෙසේ විභංගයෙහි විස්තර වූ බැවින් චක්ඛුද්වාරාදියේ පවතින කුසලාකුසල හා අබ්‍යාකත වේදනාවන්ට; සාරිපුත්ත, මත්තාණිපුත්ත යන නම්වලට මව මූලික වූවාක් මෙන් මව හා සමාන වූ වේදනාව උපදින වස්තුවෙහි නාමය, එම වේදනාවන්ට යෙදේ. මෙහි වචනාර්ථය මෙසේය. "ඇස ස්පර්ශ වීම නිසා උපදින වේදනාව 'චකඛු සම්පස්සජා වේදනා" නම් වේ. සෙසු ඉන්ද්‍රිය පිළිබඳව ද මේ ක්‍රමය ම යෙදේ. මෙතෙක් කරන ලද්දේ සර්ව සංග්‍රාහික

කථාවයි. - චක්ඛු ද්වාරයේ විපාක වශයෙන් චක්ඛු විඤාන දෙකකි. මනෝ ධාතු දෙකකි. මනෝවිඤ්ඤාණ ධාතු තුනකි. මේවායේ එකට යෙදීම් වශයෙන් වේදනාව දැනගත යුතුයි. සෙසු ශ්‍රෝතාදී ද්වාරයන් හි ද මනෝද්වාරයේ ද මනෝ විඤ්ඤාණධාතු එක්ව යෙදුණු බව ද මේ ක්‍රමයෙන් දත යුතුයි.

ඵස්ස නිර්දේශයේ - "**චක්ඛු සම්ඵස්සෝ**" යනු ඇසෙහි අරමුණ ස්පර්ශ වීමයි. සෙසු තැන්හිද මේ ක්‍රමය ම යි. "**චක්ඛු සම්ඵස්සෝ -පෙ- කායසම්ඵස්සෝ**" යන මෙපමණකින් කුසලාකුසල විපාකයෝ ඵස්තු පහකින් උපදී. එහි ස්පර්ශ දහයක් ඇතැයි කියන ලදී. "**මනෝ සම්ඵස්සෝ**" මේ විසිදෙකක් වූ ලෞකික විපාකයන් හා එක්ව යෙදුණු ස්පර්ශයයි.

සළායතන නිර්දේශයේ -"**චක්ඛායතනං**" යනාදියේ යමක් කිවයුතු නම් එය විසුද්ධිමාර්ග බඤ නිර්දේශයේ මෙන් ම ආයතන නිර්දේශයේ ද කියන ලද්දේමය.

නාමරූප නිර්දේශයේ - නැමෙන ලක්ෂණය "**නාමං**" වේ. වෙනස්වන -විකෘති වන ලක්ෂණය "**රූපං**" වේ. බෙදා දැක්වීමේදී වනාහි "වේදනා" යනු වේදනා ස්කන්ධයයි. "සඤ්ඤා" යනු සංඥා ස්කන්ධයයි. "**චෙතනා එසෙසා මනසිකාරෝ**" යනුවෙන් සංස්කාර ස්කන්ධය දතයුතුයි. කැමැත්ත ද අනිකු සංස්කාර ස්කන්ධයේ සංග්‍රහ කරන ලද ධර්ම ඇත්තේ ද මේ ත්‍රිවිධ ධර්මය, සියලු දුර්වල සිත්වල යෙදේ. එනිසා මේ ධර්මකරුණු දක්වීම් වශයෙන් මෙහිදී සංස්කාර ස්කන්ධය දක්වන ලදී. "**චතතාරෝ ච මහාභූතා**" යන මෙහි "චතතාරෝ" යනු සංඛ්‍යාව දක්වීමකි. "මහාභූත" යනු පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන මේ සතරට භාවිත නාමයකි. කවර කරුණකින් මේ සතරට "මහාභූත" යැයි කියනු ලැබේද? මේ ආදී මහාභූත පිළිබඳ සියලු විනිශ්චයන් විසුද්ධිමාර්ගයේ රූපස්කන්ධ නිර්දේශයේ දක්වන ලදී. "**චතුන්නඤ්ච මහාභූතානං උපාදාය**" මෙහි වනාහි "චතුන්නං" යනු දුතියා අර්ථයේ ඡට්ඨී විභක්ති වචනයකි. "සතර මහා භූතයන්" යැයි මෙහිදී අදහස් වේ. "උපාදාය" යනු දඩිව අල්ලා ගනියි. දඩිව ගෙන යන අර්ථයයි. ඇතැම්හු "ආශ්‍රයකර" යැයි කියති. මෙහි පැවතිය යුතුයැයි ගත් පාඨ ශේෂයකි. මේ සමූහාර්ථයේ ඡට්ඨී විභක්ති වචනයකි. "සිවුමහාභූත සමූහයම අල්ලාගෙන පවතින රූපය" යනුවෙන් මෙහිදී අර්ථ ගතයුතුයි. මෙසේ සියලු ආකාරයෙන් පඨවි ආදී යම් සතර මහාභූත කෙනෙක්

වේද, ඒ සතරමහා භූතයන්ගේ අල්ලා ගැනීමෙන් පවතින, චක්ෂු ආයතනාදී භේදයෙන් අභිධර්ම පාළියෙහි ම කියන ලදි. ක්‍රමයෙන් ම විසිතුන් වැදෑරුම් රූපය ම "ඒ සියලු රූපය"යැයි දතයුතුයි.

විඤ්ඤාණ නිර්දේශයේ - "චකඛු විඤඤාණං" යනු ඇසෙහි පවතින අරමුණ ගැන දැනගැනීමයි. ඇසෙන් හටගත් විඤ්ඤාණය චක්ෂු විඤ්ඤාණයයි. මෙලෙසින් ම සෝත විඤ්ඤාණ, ඝාන විඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ හා කාය විඤ්ඤාණ පිළිබඳව දතයුතුයි. අනික වනාහී මනසින් ම දැනගත්තේ "මනො විඤඤාණං" මනෝ විඤ්ඤාණයයි. දෙපස් විඤ්ඤාණ වර්ජිත වූ තෙහුමික විපාක චිත්තයට මේ තවත් වචනයකි.

සංස්කාර නිර්දේශයේ - ප්‍රතිසංස්කරණ ලක්ෂණය "සංඛාරො" නම් වේ. බෙදා දක්වීමේදී වනාහී - "කායසංඛාරො" යනු කයෙහි පවතින සංස්කාරයයි. කායද්වාරයේ සෙළවීම් වශයෙන් පවතින කාමාවචර කුසල සිත්වලින් අටක් ද අකුසල සිත් දොළොස ද යන විස්සක් වූ කාය **සංචේතනාවන්ට** ම යෙදෙන තවත් නමකි. "**වචී සංඛාරො**" යනු වචනයේ පවතින සංස්කාරයයි. (රැස් කිරීමයි.) වාග් ද්වාරයෙන් වචනභේද ලෙස පවතින විස්සක් වූ වාග් සංචේතනාවන්ට ම යෙදෙන තවත් නමකි. "**චිත්ත සංඛාරො**" යනු සිතෙහි පවතින සංස්කාරයයි. (රැස් කිරීමයි.) කාය-වාග් ද්වාර දෙකෙහි සෙළවීමක් නොකර, රහසිගතව හිඳ සිතන්නහුට, ලෞකික කුසලාකුසල වශයෙන් ඇතිවන විසිනවයක් වූ මනෝ **සංචේතනාවන්ටම** යෙදෙන තවත් නමකි.

අවිද්‍යා නිර්දේශයේ "**දුකෙඛ අඤඤාණං**" යනු දුක්ඛ සත්‍ය පිළිබඳව නො දනීමයි. "මෝහය" යනු මීට යෙදෙන තවත් නමකි. මේ ක්‍රමයම "**දුකඛ සමුදයෙ අඤඤාණං**" යනාදියෙහි ද යෙදිය යුතුයි. මෙහි සතර කරුණකින් දුකෙහි නොදැනීම දතයුතුයි. අන්තර්ගත වශයෙන් (අන්තෝගධතෝ) වස්තු වශයෙන් (වත්ථුතො) අරමුණු වශයෙන් (ආරම්මණතෝ) සහ වැසීම්-සැඟවීම් (පටිච්ඡාදනතො) වශයෙනි. එසේම ඒ දුක්ඛ සත්‍යයෙහි ඇතුලත් වූ බැවින් දුකෙහි අන්තර්ගත වේ. දුක්ඛ සත්‍යයේ ආශ්‍රය ප්‍රත්‍යභාවයෙන් "වත්ථු" නම් වේ. අරමුණු ප්‍රත්‍ය වශයෙන් "ආරම්මණ" නම් වේ. දුක්ඛ සත්‍යය මෙයින් වසයි - සඟවයි යන අරුතින් "පටිච්ඡාදන" නම් වේ. එහි සත්‍යය වූ ලක්ෂණ, ප්‍රතිවේධ, නිවාරණයෙන් ඤාණය පැවතීම පිණිස ඉඩනොදීමෙන් "දුක්ඛ සමුදයෙහි නොදැනීම්" තුන් කරුණකින් දතයුතුය. වස්තු වශයෙන්, ආරම්මණ වශයෙන් හා

පටිවිඡාදන වශයෙනි. නිරෝධ ප්‍රතිපදාවෙහි නොදැනීම එක් කරුණකින් ම දතයුතුයි. එනම් පටිවිඡාදන (සැඟවීම්) වශයෙනි. නිරෝධ ප්‍රතිපදාව ද පටිවිවාදකයක්මය. නොදැනීමත් ඒ සත්‍ය වූ ලක්ෂණ ප්‍රතිවේධ නිවාරණයෙන්ද එහි ඤාණය පැවතීමට ඉඩ නොදීමෙන් නොදැනීම වේ. ඒහි සත්‍යද්වයෙහි ඇතුලත් නොවූ බැවින්, එහි එම ඥානය අන්තර්ගත නොවේ. ඒ සත්‍ය දෙක සහජාත නොවූ බැවින් වස්තු නාමය නොයෙදේ. එය අරබයා නොපැවතීම් වශයෙන් අරමුණු නොවේ. පසුව දක්වූ සත්‍ය දෙක අතිශය ගැඹුරු බැවින් දැකීම අපහසුය. එහි අන්ධභූත වූ නොදැනීම නොපවතියි. මුලින් දක්වූ සත්‍ය දෙක කිවයුතු බැවින් හා ස්වභාව ලක්ෂණයන්ගේ අවබෝධය අපහසු බැවින් ගැඹුරුය. එහි වෙනස්වීම්-විපර්යාසයන් ගැනීම් වශයෙන් පවතියි. තව ද "**දුක්ඛ**" යනුවෙන් මෙපමණකින් සංග්‍රහ වශයෙන්, වස්තු වශයෙන්, ආරම්මණ වශයෙන්, කෘත්‍ය (කටයුතු) වශයෙන් අවිද්‍යාව දක්වන ලදී. "**දුක්ඛ සමුදයෙ**" යන මෙයින් වස්තු වශයෙන් ද, ආරම්මණ වශයෙන් ද කෘත්‍ය වශයෙන් ද "දුක්ඛනිරොධෙ දුක්ඛනිරොධගාමිණියා පටිපදාය" යන මෙයින් කෘත්‍ය වශයෙන් ද අවිද්‍යාව දක්විණි. අවිශේෂයෙන් "අඤ්ඤාණං" යන මෙයින් ස්වභාව වශයෙන් දක්වන ලදුයි දතයුතුයි.

"ඉති ඛො භික්ඛවෙ" යනු මහණෙනි! මෙසේ "**නිරොධො හොති**" යනු නූපදීම හෙවත් නිරෝධය වේ. තවද මෙහි ඒ සියලුම තැන්හි එන "නිරෝධ" පදවලින් නිර්වාණය දක්වන ලදී. නිවනට පැමිණීම ඒ ඒ ධර්මයෝ නිරුද්ධ වන බැවින් ඒ ඒ ධර්මයන්ගේ නිරෝධය වේයැයි පවසන ලදී. මෙසේ භාග්‍යවතුන් වහන්සේ දොළොස් පදයකින් සසර පැවැත්ම හා නැවැත්ම පිළිබඳ ප්‍රතීත්‍ය සමුත්පාද දේශනාව පවත්වන සේක් - අර්හත්බව නමැති කඳු මුදුනින් ම දේශනාව නිමාකළ සේක. එම සූත්‍ර දේශනාව අවසානයේ සූත්‍රයේ පැවසූ ලෙස ම පන්සීයක් භික්ෂූහු රහත් බවෙහි පිහිටි සේක.

දෙවැනි විභංග සූත්‍රයයි.

12. 1. 3

තෙවැනි සූත්‍රයේ "**මිච්ඡා පටිපදං**" යනු මේ සසරින් මිදීම ගෙන දෙන ප්‍රතිපදාවක් නොවේ. නිර්වාණ ප්‍රතිපදාවක් නොවේ. අවිද්‍යා ප්‍රත්‍යයයෙහි පින් රැස්කිරීමක් ද (පුඤ්ඤාභි සංචාරයක්ද) ආනෙඤ්ජාභි සංස්කාරයක් ද ඇත්තේය. එය කෙසේ නම් මිත්‍යා ප්‍රතිපදාවක් වේද? සසර පැවැත්මට ශීර්ෂයක් බැවිනි. යම්කිසිවක් භවත්‍රය සංඛ්‍යාත වූ සසර පැවැත්මට පැමිණ පවතිනුයේ, යටත් පිරිසෙන් පඤ්චාභිඤ්ඤා සහ අෂ්ට සමාපත්තීහු ද යන මේ සියල්ල සසර පැවැත්මට පක්‍ෂවේ, සසර පැවැත්මට ශීර්ෂයක් වේ. එනිසා ම මිත්‍යා පිළිවෙතක් ද වේ. යම් කිසිවෙක් සසර පැවැත්මට විරුද්ධ වූ නිවණ ප්‍රාර්ථනා කරගෙන, කැඳහැන්දක් පමණ හෝ කොළමිටක් පමණ හෝ දීම යන මේ සියල්ල සසර පැවැත්මට විරුද්ධ වූ බැවින් සම්‍යක් ප්‍රතිපදාවක් වේ. රහත්බවට නොපැමිණ එම කාර්යය කෙළවර නොවේ. මෙසේ අනුලෝම වශයෙන් මිත්‍යා පිළිවෙතත් ප්‍රතිලෝම වශයෙන් සම්‍යයක් ප්‍රතිපදාවත් දේශනා කරන ලදුයි දතයුතුයි. මේ ප්‍රතිපදාව විමසා නිවණට යොමු වූවහුට එය පවරා දීමෙන් ම ප්‍රතිපදාව ද පවරාදෙන ලද්දේ නොවේද? මෙයට 'නිවන් ප්‍රතිපදාව' යන නම පමණක් නොව 'විඳසුන් සහිත සතර මාර්ගයන්ට ම' මේ නම යෙදේ. එනිසා ප්‍රශ්නයෙන් පැවරූ පද භාජනය නොගැලපේ. නොගැලපෙන්නේද නොවේ. කුමක් නිසාද? ඵලයෙන් ප්‍රතිපදාව දක්වන ලද බැවිනි. මෙහි ඵලයෙන් ම ප්‍රතිපදාව දක්වන ලදී. "**අවිජ්ජායත්වෙව අසෙස විරාගනිරොධා සංඛාර නිරොධො**" යනු මෙසේ නිරෝධ සංඛ්‍යාත වූ නිවණ, යම් ප්‍රතිපදාවක ඵලය වී ද, "**අයං වුච්චති භික්ඛවෙ! සම්මා පටිපදා**" යනු මෙහි මේ අර්ථයයි. මේ අර්ථයෙහි "**අසෙසවිරාග නිරොධා**" යන මෙහි "විරාගය" යනු නිරෝධයට ම සමාන වදනකි. "ඉතිරි නොවූ විරාගය", "ඉතිරි නොවූ නිරෝධය" යනු මෙහි ඇති අදහසයි. යම් ඒ, විරාග සංඛ්‍යාත වූ මාර්ගයකින් අශේෂ වූ නිරෝධය වේ නම් එය දැක්වීමට මේ පද බෙදීම පවසන ලදි. මෙසේ ඇති කල්හි ආනුභාව සහිත ප්‍රතිපදාව බෙදා දැක්වූයේ වේ. මෙසේ මෙම සූත්‍රයෙහිද සසර පැවැත්මම කියන ලදී.

තෙවැනි සූත්‍රයයි.

12. 1. 4.

සිවුවැනි සූත්‍රයෙහි "විපස්සිස්ස" යනු ඒ බෝධිසත්වයන්ගේ නේත්‍රයෝ, යම්සේ කිසියම් දෙයක් බලන ලෞකික මිනිසුන්ගේ අල්ප කර්මයකින් හටගත් ඇස්වල කර්මජ ප්‍රසාදයේ දුර්වල බැවින් අධිකව සැලෙන්ද එලෙසින් නොසැලෙති. ප්‍රබල කර්මයකින් හටගත් කර්මජ ප්‍රසාදයේ බලවත්කම නිසා තාවතිංස දෙවියන්ගේ මෙන් නොසැලෙන, ඇසිපිය හෙළීම් නැති ඇස් ඇතිවිය. එනිසා කියන ලදී. "මහණෙනි! ඇසිපිය හෙලීම් නැතුව කුමරු බලා සිටී යි කියා විපස්සි මේ එහි අදහසයි. - ඇසිපිය හෙළීමක් අතර දී ඇතිවන අඳුරුවීමක් පවා නොමැතිව "ඉතා පිරිසිදුව දකියි", "විවෘත වූ ඇස්වලින් බලයි" යන අර්ථයෙන් විපස්සී නම් වේ. ඒ කෙසේ වෙතත් ප්‍රබල කර්මයකින් උපන්, කර්මජ ප්‍රසාදයේ බලවත්කමින් පශ්චිම භවික වූ සියලු බෝධිසත්ත්වයන්ගේ ඇස් නොසැලේ. එනිසා ඒ බෝසත්හු "විපස්සී" නාමය ලැබූහ. තවද "විමසුම් සහගතව බලයි" යන අර්ථයෙන් විපස්සී නම් වේ. "විමසා බලයි" යන අර්ථයයි. එක් දිනක් විනිශ්චාසනයේ හිඳ නඩු විසඳන රජුගේ ඇකයේ අලංකාරව සැරසූ බෝධිසත්වයෝ වඩාගෙනවුත් තබන ලදී. රජු බෝසත් කුමරු ඇකයේ තබාගෙන නලවමින් සිටියදී ම ඇමතියෝ වස්තු හිමියාට වස්තු අහිමි කළහ. බෝසත් ළදරුවා කෙළවරක් නොමැතිව ශබ්ද නිකුත් කිරීම ඇරඹුවේය. රජු "මේ කිමෙක්ද? සොයා බලවු"යි කීවේය. සොයා බලනුයේ ඊට හේතු කිසිවක් නොදක, රිදීමක් ඇති වූ හෙයින් මෙසේ අඬන ලදැයි සිතා, වස්තු හිමියාට ම වස්තුව හිමිකර දෙන ලදී. "මේ කුමරු දැන දැන ම මෙසේ ශබ්ද පිට කරත් ද?"යි විමසනු පිණිස නැවතත් වස්තු හිමියාට වස්තු අහිමි කළහ. එවිට බෝසත් කුමරු පෙර සේම ශබ්ද නිකුත් කිරීමට පටන් ගත්තේය. ඉක්බිති රජතුමා "මේ මහා පුරුෂයෙකි"යි දැන එතැන් පටන් අප්‍රමාදී වූයේය. එනිසා කියන ලදී. "මහණෙනි! විමසමින් - පිරික්සමින් කුමරු නිවැරදි දේ දැනගනියි යන අරුතින් පමණට වැඩියෙන් එසේ කිරීම නිසා "විපස්සී", "විපස්සී" යන නම ඇතිවිය."a

"භගවතො" යනු භාග්‍ය සම්පන්න පුද්ගලයාට යනුයි. **"අරහතො"** යනු රාගාදී සතුරන් නැසූ බැවින්, සංසාරය නම් චක්‍රයේ අර සිඳලූ බැවින්, සිවුපසය ලැබීමට සුදුසු වූ හෙයින් "අරහ" නම් ගුණයෙන් යුක්ත වූ බැවින් හටගත් නම් ඇත්තහුට යනුයි **"සම්මා සම්බුද්ධස්ස"** යනු යහපත්

a. දීඝනිකාය - මහාපදාන සූත්‍රය

නය හේතුවෙන්. තමන් වහන්සේ විසින් ම වෙන් වෙන්ව සිදුකළ පුරුෂ කාර්ය වශයෙන් සිවු සත්‍යය අවබෝධ කළ පුද්ගලයාට යනුයි "පුබෙබව සමෙබාධා" යන්නෙහි සම්බෝධ යනු සතර මාර්ගයේ පවතින ඤාණයයි. ඒ "ඤාණය ලැබීමට පෙර" යන අර්ථයයි. "බොධිසතතසෙසව සතතා" යන මෙහි බෝධි යනු ඤාණයයි. ඒ බෝධියේ ඇලුණු පුද්ගලයා බෝධිසත්ත නම් වේ. නැණවතා, ප්‍රඥාවන්තයා, පණ්ඩිතයා යන අර්ථ එහි ඇත. මුල්ම බුදුවරුන්ගේ පාදමූලයේදී නියත විවරණ ලැබූ තැන් පටන්, ඒ මහා සත්වයා පණ්ඩිතයෙක් වේ. අදබාලයෙක් නොවේ. යම්සේ ජලයෙන් නැගී අවුත් දියමත සිටි මෝරාගිය පියුමක්, හිරු රැස් ගැටීමෙන් ඒකාන්තයෙන් "මැනවින් ප්‍රබෝධමත් වන්නේයැ"යි, "ප්‍රබෝධමත් වූ පියුමකැ"යි කියනු ලැබේ දෑ එලෙසින් ම බුදුවරුන්ගේ සමීපයේදී විවරණ ලද බැවින් ඒකාන්තයෙන් නිරතුරුව පාරමී පුරා "අවබෝධ කරගන්නේයැ"යි, "අවබෝධ කරගත් සත්ත්වයෙකැ"යි යන අරුතින් බෝධිසත්ව නම් වේ. යම් ඒ සතර මාර්ග සංඛ්‍යාත වූ 'බෝධිය', ප්‍රාර්ථනා කරමින් පවතිනුයේ ද බෝධියෙහි ඇලුණු - එල්බුණු අරුතින් ද බෝධිසත්ව නම් වේ. මෙසේ ගුණයන්ගෙන් උපන් - හටගත් නාමයක් වන බෝධිසත්ව වූම. **"කිචඡං"** යනු දුකයි. "ආපනෙනා" යනු පැමිණියේය යනුයි. මෙය කියන ලදී. "යම් හෙයකින් මේ සත්ත්ව ලෝකයා දුකට පැමිණියේය" යනුවෙනි. **"චවති ච උපජජති ච"** යන මෙය භවයෙන් භවයට නොසිදී යන චුති-ප්‍රතිසන්ධි වශයෙන් කියන ලදී. "නිසසරණං" යනු නිවණයි. නිවීමයි. එහි වනාහි ජරාමරණ දුකින් නික්මුණු බැවින් ඊට නිස්සරණ යැයි කියනු ලැබේ. **"කුදාසසු නාමා"** යනු කවර නම් කාලයක යන අරුත් දේ. **"යොනිසොමනසිකාරා"** යන උපාය සිහිකිරීමෙන්, මාර්ගය නුවණින් මෙනෙහි කිරීමෙන්. **"අහු පඤඤාය අභිසමයො"** යනු ප්‍රඥාව ඇති කල්හි ජරාමරණ කාරණයන්ට හේතුවන කරුණුවල අවබෝධය, රැස්වීම හා එක්වීම වේ. **"ජාති"** ප්‍රත්‍ය හේතුවෙන් ජරාමරණ දෙක ඇතිවේය යන මෙය, මෙතැනදී දැනගන්නා ලදී යන අර්ථයි. නැතිනම් **"යොනිසො මනසිකාරා අහු පඤඤාය"** යන නුවණින් මෙනෙහි කිරීමෙන්ද ප්‍රඥාවෙන්ද අවබෝධය ඇතිවේ. ඉපදීම ඇතිකල්හි "ජරාමරණ" දෙක ඇතිවේ යැයි මෙසේ ජරාමරණ දෙක පිළිබඳ සත්‍යාවබෝධ වේ යන අර්ථයි. මේ ක්‍රමය අනික් සියලු තැන්හිද මෙපරිදිම වේ. **"ඉතිහිදං"** යනු මේ අයුරින් යනුයි. **"සමුදයො"** යනු එකොළොස් තැනෙක්හි ආ සංස්කාරාදීන්ගේ ඇතිවීම-හටගැනීම සම්පිණ්ඩනය කර දැක්වීමයි. **"පුබෙබ අනනුසසුතෙසු"** යනු අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරාදියේ ඇතිවීම පිළිබඳව මීට පෙර නොඇසූ විරූ චතුරාර්ය සත්‍ය ධර්මයන් හිය. "චකඛු" ආදිය ඤාණයට ම

යෙදුණු සමාන වදන්ය. මෙහිදී ඤාණය දැක්වීම සඳහා ම "චකඛු" යන්න දක්වන ලදී. ඤාණය යන අර්ථයෙන් "ඤාණං" වේ. විශේෂ දැනීම අර්ථයෙන් "පඤ්ඤා" වේ. සත්‍යාවබෝධ කිරීම අර්ථයෙන් "විජ්ජා" නම් වේ. ආලෝකය (ඤාණාලෝකය) යන අරුතින් "ආලොකො" යනුවෙන් කියන ලදී. මෙහිදී චතුරාර්ය සත්‍යයයන්හි ලෞකික ලෝකෝත්තර මිශ්‍ර වූ ආකාරය විස්තර කරන ලදයි දතයුතුය. නිරුද්ධ වන වාරයේ දී ද මෙලෙසින්ම අර්ථ දතයුතුය.

සිවුවන සූත්‍රයයි.

12. 1. 5-10

පස්වන සූත්‍රාදියෙහි "**සිබිස්ස භික්ඛවෙ**" යනාදී පදයන්ගේ "මහණෙනි! සිබී බුදුරදුන් ද" යනුවෙන් යොදා අර්ථ නොගත යුතුයි. කුමක් නිසාද? මේ සූත්‍ර සියල්ල එකම අසුනක හිඳ (එකම අවස්ථාවක) නොදෙසූ බැවිනි. නොයෙක් නොයෙක් තැන්වල හිඳ, බුදුපියාණන් වහන්සේ විසින් මේ සූත්‍ර දේශනා කළ සේක. නමුත් අර්ථය සෑම සූත්‍රයකම එක හා සමානය. බෝධිපල්ලංකයේ වැඩසිටියා වූ සියලුම බෝසත්වරුන්ට අන්‍ය වූ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ "අතීතයේ වැඩසිටි බෝසත්වරු ප්‍රතීත්‍ය සමුත්පාදය විමසා බලා බුද්ධත්වයට පත්වූහ"යි නොපවසයි. යම්සේ ප්‍රථම කල්පික කාලයේ වැටුණු වැස්සේ දිය ගිය මාර්ගයෙන් ම, එම කල්පයේ ඊට පසුව වැටෙන වැසි දිය ද ගලායන්නාක් මෙන් ඒ ඒ පෙර බුදුවරු ගමන් කළ මාර්ගයේ ම පසුව පහළ වන බුදුවරු ගමන් කරති. "සියලු ම බෝසත්වරු ආනාපාන චතුර්ත්‍ථ ධ්‍යානයෙන් නැගී සිට ප්‍රතීත්‍ය සමුත්පාදයෙහි ඤාණය පිහිටුවා, එය අනුලෝම-ප්‍රතිලෝම වශයෙන් විමසා බලා බුද්ධත්වයට පත්වෙති"යි යන පිළිවෙල මේ සූත්‍ර හතෙහිම "බුද්ධ විදර්ශනාව" නාමයෙන් දක්වන ලදී.

පළමු බුද්ධ වර්ගයයි.

12. 2. 1.

ආහාර වර්ගයේ පළමු සූත්‍රයේ "ආහාරා" යනු ප්‍රත්‍යයයි. හේතුප්‍රත්‍යයෙන් තමඵලය ගෙනයන්නේ යන අරුතින් (ආහාරනතීති) "ආහාරා" නම් වේ. "භූතානං වා සත්තානං" යනාදියෙහි "භූතා" යනු උපන්නා වූ, ඉපදුනා වූ යන අර්ථයි. "සම්භවෙසිනො" යනු යමෙක් උපතක්, ජාතියක්, ඉපදීමක් සොයත් ද ගවේෂණය කරත් ද ඔවුහුය. එහි සතර යෝනිවල අණ්ඩජ හා ජලාබුජ සත්ත්වයෝ යම්තාක් කල් බිත්තර කටුව හෝ ගර්භාෂය නොබිඳින්ද ඒ තාක් 'සම්භවේසී' නම් වෙති. බිත්තරයත් ගර්භාෂයත් බිඳ පිටත නික්මෙත් ද එවිට ඔවුහු "භූත" නම් වේ. සංසේදජයෝ ද ඕපපාතිකයෝ ද පළමු චිත්තක්ෂණයෙහි "සම්භවේසී" නම් වෙති. දෙවන චිත්ත ක්ෂණයේ සිට ඔවුහු ද භූත නම් වෙති. යම් ඉරියවුවකින් පහල වී, එම ඉරියවුව වෙනස් නොකරන තාක් කල් ඔවුහු සම්භවේසී නම් වෙති. ඉරියවු වෙනස් කළ පසුව 'භූත' නම් වෙති. නැතිනම් භූත යනු උපන්-හටගත් සත්ත්වයෝය. එබඳු භූත වූ සත්ත්වයෙක් නැවත නූපදින සංඛ්‍යාවට පැමිණියේ එනම් ක්ෂීණාස්‍රවයන් වහන්සේලාට භාවිත මේ තවත් නමකි. නැවත උපතක් සොයන්නෝ සම්භවේසී නම් වෙති. ප්‍රහීණ නොකල භව සංයෝජන ඇති බැවින් අනාගතයෙහි ද උපතක් සොයන - සේවයන්ට හා පුහුදුන් පුද්ගලයන්ට භාවිත වේ තවත් නාමයකි. මෙසේ සියලුම ආකාරයෙන් මේ පද දෙකින් සෑම සත්ත්වයෙක්ම අදහස් කරනු ලැබේ. (හාත්පසින් ගනු ලැබේ.) "වා" ශබ්දය මෙහිදී සම්පිණ්ඩනය කිරීම අර්ථයෙන් යෙදී ඇත. එනිසා භූතයෝ ද සම්භවේසියෝ ද යනුවෙන් මෙහි අර්ථ දතයුතුයි. "ඨිතියා" යනු සසර සිටී බවයි. "අනුගගහායා" - 'අනුග්‍රහ කිරීම පිණිස' යනුයි. මෙය වචන භේදයක්මය. පද දෙකෙහිම අර්ථය එක සමානය. නැතහොත් "ඨිතියා" යනු ඒ ඒ සත්ත්වයන් තුළ උපන් ධර්මයන්ගේ අනුප්‍රබන්ධ වශයෙන් නොසිඳී පැවැත්වීම පිණිස යනුයි. "අනුගගහායා" යනු "නූපන් ධර්මයන්ගේ ඉපදීම පිණිස උපකාර කිරීමයි." මේ දෙපදයේදී භූතයන්ගේ පැවැත්ම මෙන්ම අනුග්‍රහ පිණිස ද සම්භවේසීන්ගේ පැවැත්ම මෙන් ම අනුග්‍රහ පිණිසද යනුවෙන් උභය අර්ථ දතයුතුය. "කබළිංකාරෝ ආහාරෝ" පිඬුකර ගිලදමිය යුතු ආහාරය. බත්, පිට්ටු ආදී ආහාර ද්‍රව්‍යයන්ගේ ඕජාවට භාවිත මේ තවත් වදනකි. "ඔළාරිකො වා සුඛුමො වා" ආහාර ද්‍රව්‍යයන්ගේ දැවී වූ බැවින් ඕළාරික වූ, සියුම් වූ, සූක්ෂම රූප ඇතුලත් බැවින් කබලිංකාර ආහාරය සූක්ෂම වේ. එයද ඒ වස්තූන්ගේ ඕළාරික බව හා සූක්ෂම බව උපමාකොට හෝ සමානකොට දතයුතුය.

කිඹුලන්ගේ ආහාරයට වඩා මොණරුන්ගේ ආහාරය සියුම් වේ. කිඹුල්ලු වනාහී ගල් ගිලති. එම ගල් ඔවුන්ගේ කුසට පැමිණ දියවේ. මොණරු සර්ප, ගෝනුසු ආදී ප්‍රාණීන් ආහාරයට ගනිති. මොණරුන්ගේ ආහාරයට වඩා කළු වලසුන්ගේ ආහාරය සියුම් වේ. කළු වලස්සු වසර තුනක් අත්හැර දැමූ "අං" හා "ඇට" ආහාරයට ගනිති. ඒවා එම වළසුන්ගේ කෙළවලින් තෙමුණු පමණින් ම කදමුල් මෙන් ඉතා සියුම් වේ. කළු වලසුන්ගේ ආහාරයට වඩා ඇතුන්ගේ ආහාරය සියුම් වේ. ඇත්තු වනාහී නොයෙක් ගස්-අතු ආදිය ආහාරයට ගනිති. ඇතුන්ගේ ආහාරයට වඩා ගවර-ගෝණ-මුව ආදීන්ගේ ආහාරය ඉතා සියුම් වේ. ඔවුහු නිස්සාර වූ නොයෙක් ගස්-කොළ-දළු ආදිය ආහාරයට ගනිති. මොවුන්ගේ ආහාරයට වඩා ගවයන්ගේ ආහාරය සියුම් වේ. ගොනුන් අමු හා වේලුණු තණ ම ආහාරයට ගනිති. ගවාහාරයට වඩා හාවුන්ගේ ආහාරය සියුම් වේ. හාවුන්ගේ ආහාරයට වඩා පක්ෂීන්ගේ ආහාරය සියුම් වේ. කුරුල්ලන්ගේ ආහාරයට වඩා පිටිසර වැසි මිනිසුන්ගේ ආහාරය සියුම් වේ. පිටිසර වැසියන්ගේ ආහාරයට වඩා ග්‍රාමභෝජකයන්ගේ ආහාරය සියුම් වේ. ග්‍රාමභෝජකයන්ගේ ආහාරයට වඩා රාජරාජ මහාමාත්‍යාදීන්ගේ භෝජනය සියුම් වේ. ඔවුන්ගේ ආහාරයට වඩා සක්විති රජුගේ ආහාරය සියුම් වේ. සක්විති රජුගේ ආහාරයට වඩා භූමිවැසි දෙවියන්ගේ ආහාරය සියුම් වේ. භූමිවැසි දෙවියන්ගේ ආහාරයට වඩා චාතුර්මහාරාජික දෙවියන්ගේ ආහාරය සියුම් වේ. මෙසේ පරනිම්මිත වසවත් දෙවියන් දක්වා විස්තර කළ යුතුයි. පරනිම්මිත වසවත් දෙවියන්ගේ ආහාරය ම ඉතා සියුම් වේ. එතැනින් කබලිංකාර ආහාර විස්තරය නිමාවේ. මෙහි ද දළ ආහාරයේ පෝෂ්‍ය ගුණය ඉතා අල්පය. ඉතා දුබලය. සූක්ෂම ආහාරයේ පෝෂ්‍ය ගුණය ඉතා බහුලය. ප්‍රබලය. ඒ එසේමැයි. එක පාත්‍රයක් පුරවා කැඳ බිවූ විට මොහොතකින් ම කුසගිනි ඇතිවේ. යම් කිසිවක් කනු කැමති වේ. ගිතෙල් වනාහී අල්ලක් පමණ ප්‍රමාණයක් වුව පානය කර, දවසක් ම ආහාර නොගෙන සිටිය හැකිය. ඒ ආහාර වස්තුවේ කර්මජ, තෙජස් සංඛ්‍යාත වූ සූක්ෂමතාවය අනතුරු දුරුකරයි. නමුත් එය ශරීර පාලනයට සමත් නොවේ. පෝෂ්‍ය ගුණය වනාහී ශරීර පාලනයට සමත් වේ. එනමුත් අතුරු ආබාධ දුරුකිරීමට එය සමත් නොවේ. මෙනිසා ආහාරයේ ඇති ඕළාරික බවත් සූක්ෂම බවත් එක්වීමෙන් ශරීරයේ ඇති අතුරු ආබාධාදී උවදුරු ද දුරුකරයි. ශරීරය මැනවින් පාලනය කරයි.

"එසෙසා දුතියෝ" යනු චක්ෂු ස්පර්ශාදී වශයෙන් එස්සාහාරය සය වැදෑරුම් වේ. මේ සිවු ආහාර අතුරින් දෙවන ආහාරය ස්පර්ශයයි. මේ

දේශනා නය ක්‍රමයයි. එනිසා මේ නම් කිරීමේ හේතුවෙන් දෙවන-තෙවන ආදී වශයෙන් මෙහි අර්ථ නොසෙවිය යුතුය. "මනොසඤ්චෙතනා" යනුවෙන් චේතනාව ම කියන ලදී. "විඤ්ඤාණං" යනු සිතයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ මෙතැනදී "තණ්හාවෙන් ගන්නා ලද" සහ "තණ්හාවෙන් නොගන්නා ලද" වශයෙන් ඒකරාශී කර - සතර ආහාරයන් දක්වන ලදී. කබලිංකාර ආහාරය උපාදිණ්ණක (තෘෂ්ණාවෙන් ගත්) හා අනුපාදිණ්ණක (තෘෂ්ණාවෙන් නොගත්) යනුවෙන් දෙකොටසකි. එස්සා දී ආහාරවල ද එසේමය. එහි සර්පාදීන් විසින් ගිලින ලද මැඩියන්ගේ වශයෙන් උපාදිණ්ණක කබලිංකාර ආහාරය දත යුතුයි. මැඩි ආදී සත්තු, සර්පයන් විසින් ගිලින ලදුව - කුස ඇතුලට ගියත් සුළු කාලයක් ජීවත් වන්නේ ම ය. ඒ මැඩි ආදීහු, "උපාදිණ්ණක" කොටසට අයත්ව පවතින තාක් ආහාරය පිණිස හේතු නොවෙති. ඔවුහු ඉන් බිඳී - මරණයට පත්ව- "අනුපාදිණ්ණක" කොටසට අයත් වේද එවිට ආහාරය පිණිස හේතුවෙති. "ඇතැම්හු මෙයට ද උපාදිණ්ණක ආහාරය ම යැයි කියති" යන මේ කාරණය - පුරාණ ආචාර්න්ට රුචි නොවන බව පවසා අටුවාවේදී (හෙළටුවා) මේ අදහස ප්‍රතික්ෂේප කර මෙසේ කියන ලදී. "මේ සත්ත්වයන්ගේ ආහාර ගැනීම සිදුවුවත් - නැතත්, අනුභව කළත් නොකළත් ප්‍රතිසන්ධි සිතින් ම එක්ව උපන් (සහජාත වූ) කර්මජ ධාතුව "ඕජා" නම් වේ. එය සත්වන දිනය දක්වා (සතියක්ම) සිරුර පාලනය කරයි. මෙයම "උපාදිණ්ණක කබලිංකාර ආහාරය" යැයි දතයුතුයි. තෙහුමික විපාක වශයෙන් උපාදිණ්ණක එස්සාදී ආහාර දතයුතුයි. තෙහුමික කුසලාකුසල ක්‍රියා වශයෙන් අනුපාදිණ්ණක ලෝකෝත්තර සිත් වැඩීම් වශයෙන් කියන ලදී. මෙසේ පැවසේ. - "ඉදින් දිවිපැවැත්මට හේතුවන ප්‍රත්‍යාර්ථයේ 'ආහාර' අර්ථය වේ නම් කුමක් නිසා අන්‍ය සත්ත්වයන් අතර දිවිපැවැත්මට හේතුවන ප්‍රත්‍යයන් විද්‍යමාන වන කල්හි මේ සතර ආහාර පිළිබඳව කියන ලද්දේ ද? අධ්‍යාත්මික සන්තතියේ පැවැත්මට උපකාර වන බැවින් මේ සතර දක්වන ලදී. විශේෂ ප්‍රත්‍ය වශයෙන් - කබලිංකාහාර අනුභව කරන සත්ත්වයන්ගේ රූපකායේ පැවැත්මට කබළිංකාහාරය උපකාර වේ. නාම කායේ පැවැත්මට, වේදනාව නම් වූ විඳීනය සඳහා එස්සාහාරය ද විඤ්ඤාණයට මනෝසඤ්චේතනා ආහාරය ද නාම-රූප දෙක සඳහාම විඤ්ඤාණාහාරය ද උපකාර වේ. එනිසා කියන ලදී. "මහණෙනි! යම්සේ ආහාරය නිසා පවතින මේ කය ආහාරය නිසාම පවතියි. ආහාර නොමැතිව නොසිටියිද එසේම එස්ස ප්‍රත්‍යයෙන් වේදනාවද සංස්කාර ප්‍රත්‍යයෙන් විඤ්ඤාණය ද විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාමරූප දෙක ද පවතී."

මෙහි ආහාරය යනු කුමක් ද? කුමක් ගෙනෙයි ද? කබළිංකාර ආහාරය ඕජාෂ්ඨමක රූප උපදවයි. එස්සාහාරය ත්‍රිවිධ වේදනා උපදවයි. මනෝසඤ්චේතනාහාරය ත්‍රිවිධ භවයන් උපදවයි. විඤ්ඤාණාහාරය ප්‍රතිසන්ධි නාමරූප උපදවයි. ඒ කෙසේද? කබළිංකාර ආහාරය මුවෙහි තැබූ පමණින් ම රූප අටක් උපදියි. දත්වලින් කුඩු කරමින් ගෙනයනු ලබන්නේ එක් එක් බත් ඇටයක් පාසා රූප අට බැගින් උපදින්නේය. මෙසේ කබළිංකාර ආහාරය ඕජාෂ්ඨමක රූප උපදවයි. එස්සාහාරය වනාහී සැප වේදනාවක් ගෙනදෙන ස්පර්ශයක් හා ගැටුණුවිට සැප වේදනාවක් උපදියි. දුක් වේදනාවක් ගෙනදෙන ස්පර්ශයෙන් දුක් වේදනාවක්ද, මැදහත් වේදනාවක් ගෙන දෙන ස්පර්ශයෙන් සැප-දුක් අතර වූ මැදහත් වේදනාවක් ද යනුවෙන් මෙලෙස සෑම අයුරකින්ම එස්සාහාරයෙන් ත්‍රිවිධ වේදනාවක් උපදියි. මනෝසඤ්චේතනාහාරය වනාහී කාමභවයට එළඹි කර්මය අනුව කාමභවය උපදවයි. රූප-අරූප භවයන්ට එළඹි කර්ම ඒ ඒ භවයන් උපදවයි. මෙසේ සියලු ආකාරයෙන් මනෝසඤ්චේතනා ආහාරය ත්‍රිවිධ භවයන් උපදවයි. විඤ්ඤාණාහාරය වනාහී ප්‍රතිසන්ධි ක්ෂණයෙහි එය හා සම්ප්‍රයුක්ත වූ ත්‍රිවිධ ස්කන්ධයෝ ද ත්‍රිවිධ භවයේ පැවතීම් වශයෙන් තිසක් වූ රූපයෝ ද උපදිති. සහජාතාදී ප්‍රත්‍ය න්‍යාය අනුව මේ ස්කන්ධ-රූපාදිය උපදවන්නේ යැයි කියනු ලැබේ. මෙසේ විඤ්ඤාණාහාරය ප්‍රතිසන්ධි නාම-රූප උපදවයි. මෙහිද "මනෝ සඤ්චේතනාව කියන ලදී. "විඤ්ඤාණය ප්‍රතිසන්ධි නාමරූප උපදවයි." යන්නෙන් ප්‍රතිසන්ධි විඤ්ඤාණය ම කියන ලදී. අවිශේෂයෙන් වනාහී ඒ ඒ සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ ඒ ඒ හටගන්නා වූ ධර්මයන්ගේ ගෙන ඒමෙන් එම ධර්මයෝ "ආහාර" යැයි පවසති. මේ සතර ආහාරයන් අතර කබලිංකාර ආහාරය උපස්ථම්භනයෙන් අහර කිස සිදුකරයි. එස්සාහාරය ස්පර්ශ කිරීමෙන් ද මනෝසඤ්චෙතනාහාරය රැස්කරමින් ද විඤ්ඤාණාහාරය දැනගැනීමෙන් ද අහර කිස සිදුකරයි. ඒ කෙසේද? කබළිංකාර ආහාරය උපකාර කිරීමෙන් ම කය පැවැත්වීමෙන් සත්ත්වයන්ගේ පැවැත්ම වේ. කර්මයෙන් ජනිත වූවත් මේ කය, කබලිංකාරාහාරයෙන් උපස්ථම්භනය ලබා වර්ෂ දහයක්, වර්ෂ සීයක් පමණක් නොව ආයු අවසානය දක්වාම පවතියි. යම්සේ මෑණියන්ට බිහිවූ දරුවා කිරිමවගේ තනයෙන් කිරි බී පෝෂණය වනුයේ බොහෝ කලක් සිටී ද එසේමය. යම්සේ කණු ආදියෙන් පිහිටාධාර හා උපස්ථම්භක ලැබූ ගෙය මෙනි. මෙය කියන ලදී. "මහරජතුමනි! යම් සේ ගෙයක් වැටෙන කල්හි අන්‍ය වූ දැව ආදියෙන් උපස්ථම්භනයක සපයන ලද විට, එම ගෙය නොවැටෙන්නාක් මෙන් ආහාරයෙන් පවතින මේ කය ආහාර නිසා

නොවැටී පවතින්නේයැ"යි නාගසේන හිමියෝ වදාළහ. මෙසේ කබළිංකාර ආහාරය උපස්ථම්භන ලැබ, අහර කිස සිදුකරයි. එලෙස අහර කිස සිදුකරමින් ම කබලිංකාර ආහාරය, ආහාරයේ ම හටගැනීම ද තෘෂ්ණාවෙන් තදින් ගැනීම ද යන ද්විධ රූප සන්තතීන්ගේ පැවැත්මට ප්‍රත්‍ය වේ. කර්මජයන්ගේ පාලකයෙක් වී ඊට හේතු වන්නේය. ආහාරය හටගැනීම්වල උපදවන්නා වී. ඵස්සාහාරය වනාහී සැප ආදීයට හේතුවූ අරමුණක් ස්පර්ශ කරමින් ම සැප ආදී වේදනාවන් පැවතීම් වශයෙන් සත්ත්වයන්ගේ පැවැත්ම සිදුකරයි. මනෝසඤ්චේතනාහාරය, කුශලාකුශල කර්ම වශයෙන් රැස්කරමින් ම භව මූලය නිපදවීම් වශයෙන් සත්ත්වයන්ගේ පැවැත්ම සිදුකරයි.

මෙසේ උපස්ථම්භනය වීම් වශයෙන් අහර කිස සිදුකරන කල්හි ඒ ආහාර සතරෙහි, සතර භයක් දකිය යුතුයි. ඒ කෙසේද? කබළිංකාර ආහාරයේ තෘෂ්ණා භය ඇත. ඵස්සාහාරයේ පැමිණීම් භය ඇත. මනෝ සඤ්චේතනාහාරයේ රැස්කිරීම් භය ඇත. විඤ්ඤාණාහාරයේ අභිමුඛ වැටීම් භය ඇත. කවර කරුණකින්ද? කබළිංකාර ආහාරයේ ආශාව කොට, සීතාදියේ පෙරටුවීම් වශයෙන් සත්ත්වයෝ ආහාර පිණිස මුදුා, ගණන් කිරීම් ආදී ක්‍රියා කරමින් අනල්ප වූ දුක් විඳිති. ඇතැම්හු මේ සසුනේ පැවිදිවිත් වෙදකම් ආදී වූ අයෝග්‍ය වෘත්තීන්ගෙන් ආහාර සොයමින් මෙලොවදීම ගැරහුමට බඳුන් වෙති. පරලොව දී ද "ඔහුගේ දෙපට සිවුර ගිනිදැල්වලින් ඇවිලගන්නේය." ආදී වශයෙන් ලක්ඛණ සූත්‍රයේ පැවසූ අයුරින්ම ශ්‍රමණ ප්‍රේතයෝ වෙති. මේ කාරණාවලින් කබළිංකාර ආහාරයේ ආශාවීම ම බියෙකැයි දතයුතුයි. පහස හෙවත් ස්පර්ශ හේතුවෙන් ලඟට (සමීපයට) එයි. පහස නිසා අන්‍යයන් විසින් ආරක්ෂා කරන ලද අඹුවන් ආදී වස්තු කෙරෙහි අපරාධ කරති. බඩු අයිතිකරුවෝ ඒ සොරාගත් බඩු සහිතවම සොරු අල්ලාගෙන කඩ කඩ කරමින් සිඳ දමති. කුණුගොඩට ඇද දමති. රජුට හෝ පවරා දෙති. රජතුමා, ඔවුන්ට විවිධාකාර දඬුවම් කරවයි. මරණින් පසු ඔවුන් විසින් දුගතිය කැමති විය යුතුයි. මෙසේ ස්පර්ශය මූලිකව මෙලොවදීත්-පරලොවදීත් සියලු භය පැමිණෙන්නේමය. මෙකරුණින් ඵස්සාහාරයෙහි සම්පවීමට භයකැයි දතයුතුයි. කුශලාකුශල කර්ම රැස්කිරීමෙහිදී ද ඒවාට මුල් වූ ත්‍රිවිධ භවයෙහි සියලුම භය පැමිණියේ වේ. මෙකරුණින් මනෝඤ්චේතනාහාරයෙහි රැස්කිරීමට භයකැයි දතයුතුයි. ප්‍රතිසන්ධි විඤ්ඤාණය යම් යම් තැනෙක්හි වැටේද ඒ ඒ තැන්හිම ප්‍රතිසන්ධිය නාමරූප රැගෙනම උපදියි. එහි උපන් කල්හි සියලු භය

හටගත්තා වේ. ඊට මූලික වූ බැවින් මේ කාරණයෙන් විඤ්ඤාණාහාරයේ ඉදිරියේ වැටීමට භයකැයි දතයුතුයි.

"කිං නිදානා" යනාදියෙහි නිදානාදිය සියලුම හේතූන්ට සමාන වදනකි. කරුණ-හේතුව යනු යමකින් විපාකයක් නිධන් කරයි. ඒකාන්තයෙන් එය ගනිවු යි පමුණුවන්නාක් මෙනි. එනිසා ඊට 'නිදානය' යැයි කියනු ලැබේ. යම් හෙයකින් ඉන් හටගනියි, උපදියි, ප්‍රභවයට පත් වේ ද එහෙයින් "හටගැනුණි, ඉපදුණි, ප්‍රභවවිය" යනුවෙන් කියයි. මෙහි විනාහි මේ පදවල අර්ථයයි. "මේවායේ නිදානය කුමක්ද?" යනු **"කිං නිදානා"** නමි. මේවායේ හටගැනීම කවරේද? යනු **"කිං සමුදයා"** නමි. මේවායේ උපත කෙසේවේද? යනු **"කිඤ්ජාතිකා"** නමි. මේවායේ ප්‍රභවය කෙසේවේද? යනු **"කිං පභවා"** නමි. යම්හෙයකින් ඉහත කියන ලද ක්‍රමයෙන් තණ්හාවම එම ආහාරයන්ගේ නිදානය ද හටගැනීම් හේතුවද උත්පත්ති හේතුව ද ප්‍රභව හේතුව ද වනු බැවින් **"තණ්හා නිදානා"** යනාදිය කියන ලදී. මෙසේ සියලුම පදයන්හි අර්ථ දත යුතුයි. මෙහිද "ඉමෙ චතතාරෝ ආහාරා තණ්හා නිදානා"යි "මේ සතර ආහාරයෝම තණ්හාව නිදාන කරගෙන ඇත." යනුවෙන් ප්‍රතිසන්ධිය ආදී කොට ඇති ආත්මභාව සංඛ්‍යාත වූ ආහාරයන්ම පෙරටු වන තණ්හා වශයෙන් නිදානය දතයුතුයි. කෙසේද? ප්‍රතිසන්ධික්ෂණයෙහි පළමුකොට පරිපූර්ණ වූ ආයතන සහිත සත්ත්වයන්ට සත්ත්ව සන්තතික වශයෙන්ද, අනතුරුව සෙසු අඩු වූ ආයතන සහිත සත්ත්වයන්ට සත්ව සන්තති වශයෙන් ද උපන් අභ්‍යන්තර රූපයේ පහළ වූ ඕජාවක් ඇත. මෙය තණ්හාවේ නිදානයයි. උපාදිණ්ණක කබලිංකාර ආහාරයයි. ප්‍රතිසන්ධි සිත හා සම්ප්‍රයුක්ත වූ ඵස්ස චේතනාව වනාහී තමාට "සිත දැනගනියි" - මෙය තණ්හාවේ නිදානයයි. උපාදිණ්ණක ඵස්ස, මනෝසඤ්චේතනා, විඤ්ඤාණ යන ආහාරයන්ය. මෙසේ පළමුකොට මුල්ම ප්‍රතිසන්ධියට අයත තණ්හාවේ නිදාන වන ආහාරයෝ යම් සේ "ප්‍රතිසන්ධිකයෝ" වෙත් ද, එලෙස ඉන්පසුව ප්‍රථම භවාංග චිත්තක්ෂණාදියට පැමිණියේයැයි දතයුතුයි. යම්හෙයකින් භාග්‍යවතුන් වහන්සේ හුදෙක් ආහාරයන්ගේ නිදානය පමණක් ම දන්නාහු නොවෙති. ආහාරයන්ගේ නිදානය වූ තණ්හාවේ ද නිදාන වූ වේදනාදිය ද දන්නාහුමය. එහෙයින් "මහණෙනි! මේ තණ්හාවේ නිදානය කුමක්ද?" ආදී වශයෙන් තණ්හාව ඇතිවන ආකාරය ද දක්වා නැවත එය නැතිවන අයුරු (වටිට විවටිට) දක්වූ සේක. මෙහිදී භාග්‍යවතුන් වහන්සේ අතීතාභිමුඛ වූ දේශනාවක් පවත්වා, අතීතයෙන්ම තණ්හාවේ ඇතිවීම දක්වූහ. ඒ කෙසේද? මේ ආත්මභාවය ආහාර වශයෙන් තණ්හාව ගන්නා ලදී. මේ

ආත්මභවයේ ජනක කර්ම වූ වේදනාව, ස්පර්ශය, ෂඩායතනය, නාමරූප හා විඤ්ඤාණයෝ යම් ආත්මභාවයකට ඇතුළුව කර්ම රැස් කරනුයේ ද එය දැක්වීමට "අවිද්‍යා සංස්කාර දෙක ඒ ආත්මභවයාගේ ජනක කර්මය යැයිද දෙතැනක ආත්මභාව දෙකක විපාක කර්මය යැයි ද සංක්ෂිප්ත වශයෙන් "කර්මය" ද "කර්මවිපාක" ද යන ධර්ම දෙක දැක්වීම් වශයෙන් අතීතය අභිමුඛ වූ දේශනාවක් කර, අතීත කාලයෙන් දැක්වූ සේක.

එහිදී මේ දේශනාව අනාගත කාලයේ නොදක්වන ලද බැවින් අපරිපූර්ණයැයි නොසිතිය යුතුයි. න්‍යාය වශයෙන් පරිපූර්ණ යැයි දතයුතුයි. යම්සේ ඇස් ඇති පුරුෂයෙකු ජලය මතුයෙහි හොත්තා වූ කිඹුලෙකු දක - උගේ පසුකොට බලන්නේ බෙල්ල දකින්නේය. පිට උඩින්, අවසන ඇති නගුටේ මුල, යටිබඩ ආදිය බලනුයේ දියයට ඇති නගුටේ අග මෙන්ම සිවු පාදයෙන්ද නො දක්නේය. ඔහු මෙපමණකින් "සම්පූර්ණවම කිඹුලා නොදුටුවෙමි"යි නොසිතයි. න්‍යාය වශයෙන් ගත් කල, සම්පූර්ණවම කිඹුලා දක ඇත. මෙසේ ඉහත කී සියලු පදයන්ගේ අර්ථ දතයුතුයි. තිරයේ සිටි පුරුෂයා මෙන් යෝගාවචර භික්ෂුව සැලකිය යුතුයි. ඇස් ඇති පුරුෂයා ගං ඉවුරේ සිට දියමත සිටි කිඹුලා දුටුවාක් මෙන් ඒ යෝගියා විසින් ආහාර හේතුවෙන් පවතින මේ ආත්මභාවය දක්නා ලදී. එම පුරුෂයා කිඹුලාගේ බෙල්ල දුටුවාක් මෙන් මේ ආත්මභාවයේ ප්‍රභවයට හේතු වූ තණ්හාව දකින්නේය. පිට දුටුවාක් මෙන් යම් ආත්ම භාවයක තණ්හා සංඛ්‍යාත වූ කර්මය කරන ලද වේදනාදී හේතූන් දකින්නේය. නගුටේ මුල දුටුවාක් මෙන් ඒ ආත්මභාවයේ උපතට හේතු වූ අවිද්‍යා-සංස්කාරාදී හේතූන් දකින්නේය. යටිබඩ බලනවිට නගුටේ අගද සතර පාදයන් ද නොදක, එනමුත් කිඹුලා අසම්පූර්ණව දකින ලදයි නොගන්නාක් මෙන් ද න්‍යාය වශයෙන් සම්පූර්ණයෙන්ම දුටුසේ ගන්නාක් මෙන් ද - යම් තැනෙක ප්‍රත්‍යයන්ගේ පිළිවෙල - වෘත්තය ත්‍රිපිටකයේ නොපැමිණියත්, ඒ ඒ සූත්‍ර දේශනාවෝ - අසම්පූර්ණ යැයි නොගෙන න්‍යාය වශයෙන් පරිපූර්ණ වූ දේශනාවන් ලෙසට ගතයුතුයි. එහිද ආහාර-තණ්හා දෙක අතරෙහි එක් සන්ධියකි. තණ්හා-වේදනා දෙක අතරෙහි එක් සන්ධියකි. විඤ්ඤාණ-සංස්කාර දෙක අතරේ එක් සන්ධියකි. මෙසේ සන්ධි තුනකින් හා සතර සංක්ෂේපයන්ගෙන්; සසර පැවැත්ම දක්වන ලදී.

පළමු සූත්‍රයයි

12. 2. 2

දෙවන සූත්‍රයේ "**සමණබ්‍රාහ්මණානං වා අනුග්ගහාය**" යනු මෙතැනදී ම භාග්‍යවතුන් වහන්සේ දේශනාව නැවැත්වූ සේක. කුමක් හෙයින්ද? මිසදිටු ගත්තෙකු එම පිරිසේ හුන් බැවිනි. ඒ සග පිරිසේ මිසදිටුගත් මොළිය එග්ගුණ නම් භික්ෂුවක් හුන්නේය. ඉක්බිති බුදුරජාණන් වහන්සේ මෙසේ සිතූ සේක. "මොහු නැගිට මගෙන් ප්‍රශ්නයක් විචාරන්නේය. එවිට මම එය විසඳන්නෙමි"යි උන්වහන්සේට ප්‍රශ්නයක් ඇසීමට ඉඩදීම සඳහා දේශනාව නැවැත්වූ සේක. "මොළිය එගුණෝ" යනුවෙන් 'මොළී' යනු හිස මුදුනේ ඇති කෙස්රොදයි.
මෙසේ කියන ලද බැවිනි:-

ඡෙත්වාන මොළිං වර ගන්ධ වාසිතං
වෙහාසයං උකබිපි සක්‍ය පුංගවෝ
සහසස නෙතෙතා සිරසා පටිගහී
සුවණ්ණ චංගා චරෙන වාසවෝ

"ඒ ශ්‍රේෂ්ඨ ශාක්‍ය වංශිකයා, තම උතුම් වූ සුවඳ කවන ලද කේශ කලාපය සිඳ - අහසට දැමුවේය. 'වාසව' නම් වූ දහසක් නෙත් ඇති ශක්‍රයා එය රන් කරඬුවකින්, ශිරිෂ ප්‍රණාමයෙන් පිළිගත්තේය."

ඒ කේශකලාපය ඔහුගේ ගිහිකාලයේදී ඉතා විශාල විය. එනිසා ඔහුට "මොළිය එග්ගුණ" නාමය ඇතිවිය. පැවිදි වූ පසුවත් ඔහු එනමින් ම හැඳින්විණි. "**එතදවොච**" යනු දේශනාවේ ගැලපීම ඇතිකරමින් මේ "කොනු බො භන්තෙ! විඤ්ඤාණාහාරං ආහාරෙ" යන වචන කියන ලදී. එහ අර්ථ මෙසේය. "ස්වාමිනි! මේ විඤ්ඤාණාහාරය ආහාරයට ගනුයේ හෝ අනුභව කරනුයේ කවර තැනැත්තෙක් ද?" මෙහිදී සෙසු ආහාර තුන පිළිබඳව නොපවසා විඥානාහාරය පමණක් විවාළේ ඇයි? "එය දනිමි"යි යන පිළිගැනීම ඇති බැවිනි. ඔහු මහත් පිඬු වශයෙන් ගෙන කබළිංකාර ආහාරය අනුභව කරයි. එබැවින් එය ඔහුට මැනවින් පෙනේ. එනිසා ඒ පිළිබඳව "දනිමි"යි යන විශ්වාසය උන්වහන්සේට ඇත. වටු, මොණර, කුකුළු ආදී පැටවු මවුගේ ස්පර්ශයෙන් යැපෙනු දක - "මොවුහු එස්සාහාරයෙන් යැපෙන්නෝයැ"යි ඔහුට විශ්වාසයක් ඇතිවේ. කැසිබුවෝ තම ඍතු සමයන්හි මහමුහුදින් ගොඩබිමට පැමිණ, මුහුදුතෙර වැලිකතර බිත්තු දමා - එය වැලිවලින් වසා - නැවත මුහුදට යති. ඒ බිත්තු මවගේ සිහිකිරීම් හේතුවෙන් කුණු නොවේ. ඒ බිත්තර "මනෝසඤ්චේතනා-හාරයෙන් යැපෙන්නේය" යන ඇදහිම - පිළිගැනීම එවිට ඇතිවේ.

එග්ගුණ තෙරුන්ට මෙසේ මේ ආහාර තුන පිළිබඳව ම දැනීම (ප්‍රත්‍යක්ෂ) ඇති නමුත් විඤ්ඤාණාහාරය පිළිබඳව එවැනි ප්‍රත්‍යක්ෂ දැනුමක් නැති බැවින් මේ ප්‍රශ්නය අසන ලදී. දෘෂ්ටිගතිකයා හෙවත් යම් දෘෂ්ටියක් පිළිගත් තැනැත්තා - උම්මත්තකයකු වැනිය. යම්සේ උමතු මිනිසෙකු කුඩයක් රැගෙන වීථියට පැමිණ ගොම ද ගල් ද අඟුරු ද කැබලි ආදී ආහාර ද්‍රව්‍යය ද යනාදී තමාට අවශ්‍ය අනවශ්‍ය සෑමදෙයක්ම කුඩයට දාගනු ලබන්නේ ද, එමෙන්ම දෘෂ්ටිගතිකයාත් සුදුසු-නුසුදුසු සෑම දෙයම අසයි. ඔහුට "මම කුමක් නිසා මේ ප්‍රශ්න අසන්නෙමිද?" යන්න නිගමනය කළ නොහැක. ඇසූ ඇසූ ප්‍රශ්නයෙහි ඔහුගේ සිත අවුල් වේ. එනිසා ඉන් වැලකිය යුතුයි. මේ හේතුවෙන් එග්ගුණ හිමිගේ ප්‍රශ්නයේදී භාග්‍යවතුන් වහන්සේ "ඔබ කුමක් නිසා මේ ප්‍රශ්න ඇසීද?"යි නොවදාරා, දැඩිව ගත් දෘෂ්ටියෙන් ඔහු මිදවීමට කැමති සේක් - "නො කලෙලා පඤ්හා" යනුවෙන් දේශනා කළ සේක.

එහි "නොකලෙලා" යනු නුසුදුසුයි. අයුතුයි. "ආහාරෙතීති අහං **න වදාමි**" යනු මම කිසියම් සතෙක් හෝ පුද්ගලයෙක් හෝ අනුභව කරයි යනුවෙන් නොදෙසමි. "ආහාරෙතීති වාහං වදෙය්‍යං" ඉදින් මම "අනුභව කරයි" යනුවෙන් කියත්නම් "**තනුසස කලල පඤ්හා**" යනු එවිට මේ ප්‍රශ්නය සුදුසු වේ. "**කිසස්නු බො භනෙන! විඤ්ඤාණාහාරො**" යනු ස්වාමීනි! මේ විඤ්ඤාණාහාරය කවරකට ප්‍රත්‍ය වන්නේ ද? යන අර්ථයි. "**තනු කලලං වෙය්‍යාකරණං**" යනුවෙන් මෙසේ ප්‍රශ්නය විචාළවිට, "විඤ්ඤාණාහාරය අනාගතයේ නැවත ඉපදීමට, පහළවීමට හේතුවේ" යන ව්‍යාකරණය සුදුසුය. මෙහි ද "**විඤ්ඤාණාහාරො**" යනු ප්‍රතිසන්ධියයි. "**ආයතිං පුනබභවා භිනිබ්බතති**" යනු ඒ විඤ්ඤාණයෙන් ම හටගත් නාමරූප දෙකයි. "**තසමිං භූතෙ සති සළායතනං**" එහි නැවත ඉපදීම් පහළවීම් සංඛ්‍යාත වූ නාමරූපයන් පහළවූ කල්හි ආයතන සය ඇති වන්නේය යන අර්ථයි. "**සළායතන පච්චයා ඵසෙසා**" මෙහිදී ද භාග්‍යවතුන් වහන්සේ තවත් ප්‍රශ්නයකට ඉඩ සළසමින් දේශනාව නිමාකළ සේක. දෘෂ්ටි ගතිකයා වනාහී නැවත ප්‍රශ්නයක් ඉපිදවීමට සමත් නොවේ. විස්තර කළ ප්‍රශ්නය ම නැවතත් විචාරයි. මෙනිසා භාග්‍යවතුන් වහන්සේ ඔහුට ඒ අවසරය දුන් සේක. අර්ථ වනාහී සියලු පදවල කියූ ක්‍රමයෙන් ගතයුතුයි. "ස්වාමීනි! කවරෙක් නම් වන්නේද?" යනුවෙන් කුමක් නිසා විමසුවේද? දෘෂ්ටිගතිකයා හට **සත්ත්වයා** නම් සත්‍ය වශයෙන්ම ඇත්තෙකි. හටගත්තෙක්මයැ"යි යන පිළිගැනීම ඇත. එනිසා තම පිළිගැනීමට විරුද්ධ වන හෙයින් "මෙය"යැයි ද්‍රව්‍යාත්මකව නොවිචාළේය. තවද "මෙය තවත් ප්‍රත්‍යයක්

හේතුකොටගෙන වන්නේයැ"යි යන්න බොහෝ තැනෙක්හි දේශිත බැවින් ද තමා විසින් අවබෝධ කරගැනීමට පැමිණි හෙයින් ද ඔහු විසින් එසේ නොවිචාරයි. බුදුරජාණන් වහන්සේ ද මේ බොහෝ සෙයින් විමසන්නාගේ සෑහීමකට පත්වීමක් නැති බැවින් - "හිස් ප්‍රශ්නයම අසයි" සිතා එතැන් පටන් දේශනාව ඒකාබද්ධ කර දෙසූ සේක. "ඡනනතෙවා" යනුවෙන් යම්තැනක සිට දේශනාවට නංවන ලද අර්ථයම ගෙන දෙසුම නැවත සසර නැවැත්ම වශයෙන් දක්වන සේක මෙසේ වදාළහ. මේ සූත්‍රයේ වනාහී විඤ්ඤාණය හා නාමරූප දෙක අතර එක් සන්ධියකි. වේදනා හා තණ්හා ප්‍රත්‍ය දෙක අතර එක් සන්ධියකි. භව හා ජාති ප්‍රත්‍ය දෙක අතර එක් සන්ධියකි. මෙලෙස සන්ධි තුනකි.

දෙවන සූත්‍රයයි.

12. 2. 3.

තෙවන සූත්‍රයේ "**සමණා වා බ්‍රහ්මනා වා**" යනු සත්‍ය අවබෝධ කරගැනීමට අසමත් බැවින් බුදුසසුනින් බැහැර වූ මහණ බමුණෝ. "**ජරා මරණං නපජානනති**" ආදියේ ජරාමරණ දෙක දුක්ඛ සත්‍ය වශයෙන් නොදනිති. සමුදය සත්‍ය වශයෙන් ජරා මරණ දෙකේ ඇතිවීම නොදනති. තණ්හාවත් සමග ජාති-ජරා-මරණ ආදියේ ඇතිවීම වේයැයි නොදනිති. නිරෝධ සත්‍යය වශයෙන් ජරා මරණ දෙකේ නැතිවීම නොදනිති. මාර්ග සත්‍ය වශයෙන් දුක ජයගන්නා ප්‍රතිපදාව නොදනිති. දුක්ඛ සත්‍යය වශයෙන් ඉපදීම නොදනියි. සමුදය සත්‍ය වශයෙන් "තණ්හාවත් සමග භවය, ජාතිය හටගනියි" යන ඉපදීමේ හේතුව නොදනිති. මෙසේ තණ්හාවත් සමග හටගැනීමේ හේතුව සෑම පදයකම යොදා චතුරාර්ය සත්‍යය මූලිකව අර්ථය දතයුතුයි. "**සාමඤ්ඤඤ්ඤඤ්ඤං වා බ්‍රහ්මඤ්ඤඤ්ඤඤ්ඤං වා**" යනු මේ ආර්ය මාර්ගයෙහි ශ්‍රමණ බව, බ්‍රහ්ම බව යන වදන් දෙකෙහිම අර්ථය නම් "ආර්ය ඵලයම වන බව දතයුතුයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ මෙම සූත්‍රයෙහි එකොළොස් තැනක චතුරාර්ය සත්‍යය දක්වා ඇත.

තෙවන සූත්‍රයයි.

12. 2. 4

සිවුවන සූත්‍රයේ - "**ඉමෙ ධම්මෙ-කතමෙ ධම්මෙ**" යනු මේ දක්වා විස්තර කර, දේශනා කරන ලද, ධර්මය අවබෝධ කරගැනීමට සමත්

පුද්ගලයන්ගේ අදහස අනුව - "**ඉමෙ ධම්මා නපපජානනති**" ආදිය දක්වන ලදී. සෙසු පද විස්තර මුල් සූත්‍රයන්ට සමානය.

සිවුවන සූත්‍රයයි.

12. 2. 5

පස්වන සූත්‍රයේ - "**සම්මාදිට්ඨී**" යනු යම් පණ්ඩිත වූ දිව්‍ය මනුෂ්‍යයෝ, ඒ ඒ තැන්හි "සම්‍යක් දර්ශනය"යැයි යමකට කියත් ද ඒ සියල්ල ම මෙම දෙපදයෙන් හකුළුවා දක්වන ලද්දේ, විමසයි. "**ද්වයං නිසසිතො**" යනු දෙකොටසක් ඇසුරු කළයුතුය. "යෙභුය්‍යෙන" යනුවෙන් ආර්ය පුද්ගලයන් හැර - සෙසු මහජනයා අදහස් කරයි. "**අත්ථිතං**" යනු ශාස්වත වාදයයි. "**නත්ථිතං**" යනු උච්ඡේද වාදයයි. "**ලෝකසමුදයං**" යනු ලෝකය නම් සංස්කාරික ලෝකයයි. එහි ඉපදීමයි. "**සම්මපපඤ්ඤාය පසසතො**" යනු සම්‍යක් ප්‍රඥාව නම් විදර්ශනාව සහිත මාර්ග ප්‍රඥාවයි. එය දකින්නා යන අර්ථයයි. "**යා ලොකෙ නත්ථිතා**" යනු සංස්කාරමය ලෝකයෙහි හටගත් ධර්මයන් පිළිබඳව ප්‍රඥාවෙන්ම "යමක් නැතැ"යි යන උච්ඡේද දෘෂ්ටිය උපදින්නේ නම්, "එබඳු දෘෂ්ටියක් නැත" යන අර්ථයයි. "**ලොක නිරොධං**" යනු සංස්කාරයන්ගේ බිඳියාමයි. නැසියාමයි. "**යා ලොකෙ අත්ථිතා**" යනු සංස්කාර ලෝකයෙහි විද්‍යමාන වූ ධර්ම පිළිබඳව ප්‍රඥාවෙන් ම 'යමක් ඇත'යි යන ශාස්වත දෘෂ්ටිය උපදින්නේ නම්, "එබඳු දෘෂ්ටියක් නොමැත" යන අර්ථයි. තවද "**ලොක සමුදයං**" යනු ප්‍රතීත්‍ය සමුත්පාදය අනලෝම වශයෙන් දක්වීමයි. "**ලොකනිරොධං**" යනු ප්‍රතීත්‍ය සමුත්පාදය ප්‍රතිලෝම වශයෙන් දක්වීමයි. ලෝකය ආශ්‍රයෙන් දකින්නහුට, ප්‍රත්‍යයන්ගේ නොසිදීමෙන් ප්‍රත්‍යුත්පන්න ධර්මයන්ගේ නොසිදී පැවැත්ම දැකීමෙන්, 'යමක් නැත'යි යන උච්ඡේද දෘෂ්ටිය උපදින්නේ නම් එය නැත. ප්‍රත්‍යයන්ගේ නිරෝධය දකින්නහුට ද ප්‍රත්‍යයන්ගේ නැතිවීමෙන් ප්‍රත්‍යුත්පන්න ධර්මයන්ගේ නිරුද්ධවීම දැකීමෙන්, "යමක් ඇතැ"යි යන "ශාස්වත දෘෂ්ටිය නූපදින්නේය" යන අර්ථයි. "**උපායුපාදානා හි නිවෙස විනිබන්ධො**" යනු උපායෙහි ද උපාදානයෙහි ද අභිනිවේසනයෙහිද එකට බැඳී සම්බන්ධ වූ යන අර්ථයයි. එහි 'උපාය' යනු උපාය දෙකකි. තණ්හා උපායක, දිට්ඨී උපායත්ය. උපාදානයෙහි ද මේ ක්‍රමයම යෙදේ. තණ්හා දෘෂ්ටියෙහි යම් හෙයකින් "මම", "මගේ" යනාදී ආකාරයෙන් තෙභූමික ධර්මයන්ට පැමිණෙයි. ළඟට පැමිණෙයි.

යන අරුතින් 'උපාය' යැයි කියනු ලැබේ. යම්හෙයකින් ඒ ධර්මයන්හි අල්ලාගනියි ද එසේම ඇලීමට පැමිණෙයි ද එනිසා "උපාදාන" යැයි ද "අභිනිවෙස" යැයිද කියනු ලැබේ. මේවායින් සත්වයා ලෝකයට බැඳුණේය. එබැවින් "උපාය-උපාදාන-අභිනිවේසාදියෙන් බැඳුණේ"යැයි කියන ලදී. "නඤ්ඤාය" යනු ඒ උපාදාන ඇති මේ ආර්ය ශ්‍රාවකයායි. "**චෙතසො අධිට්ඨානං**" යනු සිතේ තදින් පිහිටියා වූ යනුයි. "**අභිනිවෙසානුසයං**" යනු නිවාස වූ ද සැඟවී පවතින්නා වූ ද තණ්හා, දෘෂ්ටි ආදී අකුසල සිත් පිහිටියේය. එහි තදින් ඇලී පවතිනුයේ ද අත්නොහැර පවතිනුයේ ද වේ. එනිසා ඒ දෙක සිතේ අධිෂ්ඨාන වශයෙන් තදින් ඇලී පවතිනුයේ යැයි කියන ලදී. "**න උපෙති**" යනු නොපැමිණෙයි. "**න උපාදියති**" යනු නොගනියි. "**නාධිට්ඨාති**" යනු අධිෂ්ඨාන නොකරයි. කුමක්ද? "**අත්තා මෙ**" යනු 'මගේ ආත්මය' යනුවෙනි. "**දුකඛමෙව**" යනු පංච උපාදානස්කන්ධය පමණක්ම. "**න කඬඛති**" යනු දුකම උපදියි. දුකම නිරුද්ධ වේ. මෙහි අනෙක් සත්ත්වයෙක් නම් ඇතැයි සැක නොකරයි. "**න විචිකිච්ඡති**" යනු සැකයක් නූපදවයි. "**අපරපච්චයා**" යනු අන්‍යයන්ගේ පිහිට නොසොයන, අන්‍යයකුගේ ප්‍රාර්ථනාවක් නොමැතිව, ආත්ම ප්‍රත්‍යක්ෂ ඤාණ වශයෙන් මෙහි වේ යනුයි. "**එත්තාවතා ඛො කච්චාන! සම්මා දිට්ඨි හොති**" මෙසේ 'සත්ව' සංඥාව ප්‍රහීණ කළ බැවින් මෙපමණකින් යහපත් දර්ශනය නම් වන්නේ යැයි මිශ්‍ර වූ සම්‍යක් දෘෂ්ටිය කියන ලදී. "**අයමෙකො අනෙතා**" මෙය එක්තරා පහත් වූ-ළාමක වූ අන්තයකි. පළමු ශාස්වතවාදයයි. "**අයං දුතියො**" මෙය දෙවැන්නයි. සියල්ල නැතැයි හටගත් දෘෂ්ටි සංඛ්‍යාත පහත් වූ-ළාමක වූ අන්තයකි. දෙවැනි උච්ඡේද වාදයයි යන අර්ථයි. මෙහි සෙසු පද විභාග ඉතා ප්‍රකටමය.

පස්වන සූත්‍රයයි.

12.2.6

සයවන සූත්‍රයේ - "**නිබබිදාය**" යනු කළකිරීම පිණිස. "**විරාගාය**" නොඇලීම පිණිස. "**නිරොධාය**" නිරුද්ධ කිරීම සඳහා. "**පටිපනෙනා හොති**" යන මෙහි සීලයේ පටන් රහත් බව දක්වා පිළිපත්තේ යැයි දතයුතුයි. "**ධම්මානුධම්ම පටිපනෙනා**" යනු ලෝකෝත්තර නිර්වාණ ධර්මයාගේ සුළු ශික්ෂාපද හා ප්‍රතිපත්ති සහිත පිළිවෙතට එළඹී, "**අනුධම්මභූත**"-එනම් ධර්මයට යෝග්‍ය වූ සුදුසු වූ යන අර්ථයි. "**නිබබිදා**

විරාගා නිරොධා" යනු කළකිරීමෙන්-විරාගයෙන් මෙන්ම නිරෝධයෙන් ද යනුයි. "අනුපාදා විමුත්තෙතා" යනු උපාදානයන් සතරින් කිසිවක් දඩිව නොගෙන ඉන් මිදුණු. "දිටය ධම්ම නිබබාණපපතෙතා" යනු මෙලොවදී ම නිවණට පැමිණියේ. "අලං වචනාය" යනු මෙසේ කිවයුතු බවට පැමිණේ. ඊට සුදුසු වේ. ඉතා යෝග්‍ය වේ. මෙලෙස මෙම සූත්‍රයේදී එක් ක්‍රමයකින් ධර්මකථිකයන් වහන්සේගේ ප්‍රශ්නයන් විමසන ලදී. ක්‍රම දෙකකින් එය විශේෂත්වයට ගෙන - සේඛ හා අසේඛ භූමිභූ නිර්දිෂ්ඨයහ.

සයවන සූත්‍රයයි.

12. 2. 7.

සත්වන සූත්‍රයේ "අචෙල කසසපො" යනු ආකාරයෙන් අචේලයෙකි වස්ත්‍ර නැත්තෙකි. නාමයෙන් කස්සප නමැයි. "ඔකාසං" යනු ප්‍රශ්න-ව්‍යාකරණයට ක්ෂණික කාලයක්. "අන්තරසරං" යන මෙහි "දෙඅත් බැඳගෙන අන්තරසරයෙහි නොහිදින්නෙමි"a යන මෙහි අන්තරසර යනු නිවසේ ඇතුලයි. "පහතට හෙලූ ඇතිව අන්තරසරයෙහි ඇවිදින්නෙමි"a යන මෙහි අන්තරසර යනු ඉඳුබිලයේ පටන් මුලු ඇතුළු ගම්මානය යි. මෙම සූත්‍රයේ ද මේ දෙවන අදහස ගත යුතුයි. "යදාකඞඛසි" යනු යමක් කැමති නම් එයයි. මේ සූත්‍රය වදාරනු කැමති වුවත් භාග්‍යවතුන් වහන්සේ තෙවනවර දක්වා ම ප්‍රතික්ෂේප කරන ලද්දේ කුමක් නිසාද? ගෞරවය දැන්වීම පිණිසය. දෘෂ්ටිගතිකයෝ වනාහී ප්‍රශ්නයට වඩා ම පිළිතුරු නොදෙන්නේ නම් ගෞරව නොකරති. "ශ්‍රමණ භවත් ගෞතමයන් වෙත පැමිණීමත්, ප්‍රශ්න ඇසීමත් පහසුය." ඇසූ ගමන් ම පිළිතුරු දෙන්නේ නම් ඒ එක් වදනකුදු නො අදහති. පිළිනොගනිති. දෙවරක්-තෙවරක් ප්‍රතික්ෂේප කළවිට "ශ්‍රමණ භවත් ගෞතමයන් වෙත එළඹීමත් ප්‍රශ්න ඇසීමත් ඉතා දුෂ්කර වූවකි"යි ඊට ගරුකරති. තෙවැනි වර දක්වා ඉල්ලීම් කර, පිළිතුරු දුන්කල්හි එය මැනවින් අසති. අදහති. පිළිගනිති. මෙනිසා භාග්‍යවතුන් වහන්සේ "මොහු මනාව අසන්නේය, පිළිගන්නේය" යනුවෙන් තෙවැනිවර දක්වා ඉල්ලීම් කළ කල්හි පිළිතුරු දුන් සේක. තවද වෛද්‍යවරයෙක් තෙල් හෝ පැණි හෝ පිසනුයේ මෘදු වූ පැසීම්, රළු වූ පැසීම් ආදී යෝග්‍ය පැසීම් අවස්ථාව මැනවින් බලනුයේ පැසෙන අවස්ථාව

a. භික්ෂු පාතිමෝක්ෂය - සේඛියා

නො ඉක්මවා ම ලිපෙන් එය බස්වයි. මේ අයුරින් ම භාග්‍යවතුන් වහන්සේ ද සත්ත්වයන්ගේ ඤාණය මුහුකුරා යෑම සිදුවන අවස්ථාව මනාව දන්නා සේක් - තෙවැනිවර දක්වා ඉල්ලන තෙක් ම සිටිසේක.

"මා හෙවං කස්සප" යනු කස්සපයා! එසේ නොකියන්න. දුක තමා විසින් කරන ලදැයි පැවසීම නුසුදුසුය. දුක කරන්නා වූ - කාරකයක් වූ "ආත්මය" නම් වූ කිසිවක් නැතැයි දක්වයි. සෙසු ප්‍රශ්නයන්හි අර්ථ ද මෙලෙසින්ම දතයුතුයි. "**අධිච්ච සමුප්පන්නං**" යනු කරුණක් - හේතුවක් නොමැතිව යමක් කැමැත්තෙන් - අහඹු ලෙස ඉපදීමයි. "**ඉති පුටෙඨා සමානො**" යන්න කුමක් නිසා කියන ලද්දේ ද? මෙලෙස වූ සිතක් පිළිබඳව කස්සට ඇති විය. මේ තැනැත්තා දුක තමා විසින් කරන ලදැයි ආදී වශයෙන් විමසනු ලැබූ විට 'එසේ නොකියව'යි පවසයි. 'දුකක් නැතිද?'යි විමසූවිට 'ඇතැ'යි කියයි. 'භාග්‍යවත්නු දුක නොදනියි. නොදකියි' යනුවෙන් විමසූවිට 'දුක මම දනිමි'යි කියයි. මෙලෙස පවසනුයේ ඇයි? මවිසින් වැරදි ලෙස ප්‍රශ්න අසන ලදද?"යි සිතා නැවත එම ප්‍රශ්නාවලිය දෙස මුලසිට පරීක්ෂා කර බලමින් පිරිසිදු කරමින් මෙලෙස පැවසීය.

"**ආචික්ඛතු මෙ භගෙන්ත ! භගවා**" යන මෙහි ශාස්තෘන් වහන්සේ කෙරෙහි හටගත් අසීමිත ගෞරවය නිසාම 'භවං' යනුවෙන් නොපවසා 'භගවා' යැයි පැවසීය. "**සො කරොති**" යනාදිය 'දුක තමා විසින් කරන ලද'යි යන පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීමට කියන ලදී. මෙහි "**සතො**" යනු සත්තමී අර්ථයේ ඡට්ඨී විභක්තිය යෙදුණු පදයකි. එබැවින් අර්ථ මෙසේ දතයුතුයි. "කස්සප! ඔහු කරයි. ඔහු විඳියි. ආදී වශයෙන් මූලදීම ගත්විට; පසුව දුක තමා විසින් ම කරන ලදී" යන පිළිගැනීමට පැමිණීමට සිදුවේ. "ඉතිවදං" මේ මුලින් ඇති 'ආදි' ශබ්දය අනන්තර වශයෙන් ශාස්වත ශබ්දයන් හා සම්බන්ධ වේ. දක්වයි. ගනියි යනු මෙහි සෙසු පාඨයන්ය. මෙය කියන ලදී. "මෙසේ දක්වමින් මුලින් ම ශාස්වතවාදය දක්වා, එම වාදය ගන්නා ලද්දේ කුමක් නිසාද? එහි මෙය දැක්වීමයි. "**එතං පරෙ**" යනු කාරකයාද විඳින්නා ද එකට ම ගෙන මේ ශාස්වත වාදයට පැමිණෙය යන අර්ථයි. "**අඤ්ඤො කරොති**" ආදිය වනාහි දුක අනුන් විසින් කරන ලදැයි එන පිළිගැනීම දුරුකිරීම සඳහා යොදන ලදී. "**ආදිතො සතො**" මෙය වනාහි මෙහිදීද පැමිණවිය යුතුය. මෙය මෙහි අර්ථයයි. "කස්සප! අනිකකු කරයි. අනිකකු විඳියි' යන්න මුලදීම ගත්විට කාරකයා පසුව සිඳ දමයි. ඔහු විසින් කළ දේ වෙනත් අයෙකු විසින් විඳියි යනුවෙන් එසේ

පිළිගත් උච්ඡේද දෘෂ්ටිය ඇතිවේ." උච්ඡේද දෘෂ්ටිය ඇති පහර ලබා වේදනාවෙන් පීඩා වූවන්ට "දුක අනුන් විසින් කරන ලදී" යන පිළිගැනීම ඇතිවේ. "**ඉතිවදං**" මුලදී කියන ලද ක්‍රමයෙන් ම යෙදිය යුතුයි. මේ එම අර්ථ යෝජනාවයි. මෙසේ දක්වමින් මුලින්ම උච්ඡේදවාදය දක්වයි, එම උච්ඡේදවාදය ම ගනියි. කුමක් නිසාද? එහි මේ දැක්වීමයි. "එතං පරේ" යනු මේ උච්ඡේදවාදය පිළිගැනීමට පැමිණේ යන අර්ථයයි. "**එතෙතෙ**" යනු **සම්බුදු** වූ ශාස්වත - උච්ඡේදවාද සංඛ්‍යාත වූ "**උභෝ අනෙත අනුපගම්ම**" යනු අන්ත දෙක ම අත්හැර - ඊට නොපැමිණ, "**මඡ්ඣන තථාගතෝ ධම්මං දෙසෙති**" යන මධ්‍යම ප්‍රතිපදාවෙහි පිහිටා තථාගතයන් වහන්සේ දහම් දෙසන සේක. ඉදින් කවර ධර්මයක්ද? "**යදිදං අවිජජා පචචයා සංඛාරා**" යනු හේතු වශයෙන් ඵලය ද හේතු නිරෝධ වශයෙන් **නිවණ** ද දක්වන ලදී. කිසියම් කරන්නෙක් හෝ විඳින්නෙක් මෙහිදී නොදක්වීනි. මෙපමණකින් ඉතිරි ප්‍රශ්න ප්‍රතික්ෂිප්තය. අන්ත දෙකට නොපැමිණ යන මෙහිදී "අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාර වේ" යන තෙවන ප්‍රශ්නය ප්‍රතික්ෂේප කරන ලදී. මෙයින්ම හේතුවක් නැතුව හටගත් බව ද නොදැනීම ද ප්‍රතික්ෂිප්ත බව දතයුතුයි.

"**ලභෙය්‍යාහං භනෙත! භගවතො සනතිකෙ පබබජ්ජං ලභෙය්‍යං උපසම්පදං**" යන මේ ප්‍රකාශය ඔහු විසින් භාග්‍යවතුන් වහන්සේ ඉදිරියේ භික්ෂුභාවය පතමින් පවසන ලදී.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ - බඤ්ඣක විනයේ දී තිත්ථීය පරිවාසය පනවන ලද සේක් ද - එනම්; පෙර අන්‍ය තීර්ථක වූවෙක් සාමණේර බවට පත්ව, "මම පෙර මෙනම් අන්‍යාගමිකයෙක් වූයෙමි. ස්වාමිනි! ඒ මම ධර්ම විනයෙහි උපසම්පදාව කැමැත්තෙමි. ඒ සඳහා සංඝයාගෙන් සිවුමසක පරිවාසය ඉල්ලමි." ආදී වශයෙන් පරිවාසය සමාදන්ව විසීමයි. ඒ සඳහා මෙය දක්වන ලදී. "**යෙ ඛො කසසප! අඤ්ඤතිත්ථිය පුබෙබා**" යනාදිය දේශනා කළ සේක. එහි "**පබබජ්ජං**" යන්න මෘදු වචන වශයෙන් කියන ලදී. පරිවාසයක් නැතිවම පැවිද්ද ලබයි. උපසම්පදාව කැමැත්තා විසින් 'කල් ඉක්මවා ගමට පිවිසීම්' ආදී අටවත් පුරමින් පිරිවෙස් විසිය යුතුයි. "**ආරද්ධ චිත්තා**" යනු අටවත් පිරීම වශයෙන් සතුටු සිත් ඇති. මේ අර්ථ ඉතා සංක්ෂිප්තව දක්වීණි. අන්‍ය තීර්ථ පරිවාසය පිළිබඳ සවිස්තරව දැනගනු කැමැත්තෝ, සමන්තපාසාදිකා විනය අටුවාවේ පබ්බජ්ජාකඛන්ධක වර්ණනාව බැලිය යතුයි. "**අපි ච මයා**" මෙහි මේ පාඨය විය යුතුයි. අනිකුත් තැන්හි "**අපි ච මෙත්‍ථා**" යන්නද යෙදේ. "**පුග්ගල වෙමන්තතා**

විදිනා" යනු පුද්ගලයන්ගේ විවිධත්වය දන්නා ලදී. "මේ පුද්ගලයා පරිවාසයට සුදුසුය. මොහු පරිවාසයට නුසුදුසුය යන මෙකරුණ මට ඉතා ප්‍රකටව වැටහේ" යැයි දක්වන ලදහ.

ඉක්බිති කස්සප මෙසේ සිතිය - "අනේ ! බුදුසසුනේ ආශ්චර්ය බව පුදුමයකි. යම්හෙයකින් මෙසේ ගටා, කළඹා සුදුසු දේම ගනියි. නුසුදුසු දේ නොගනියි. ඉක්බිති වහා ම ඔහු පැවිද්දට හටගත් ආශාව ඇත්තේ "සචෙ භනෙත" යනාදිය පැවසීය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ තියුණු ආශාව දැන, කස්සපට පරිවාසය අවශ්‍ය නැතැයි එක්තරා භික්ෂුවක් අමතා "යව, මහණ! කස්සප නහවා පැවිදි කරවා ගෙන එව"යි වදාළ සේක. උන්වහන්සේ කස්සප පැවිදි කරවා බුදුරදුන් ඉදිරියට පැමිණවූහ. භාග්‍යවතුන් වහන්සේ සඟමැද සිට කස්සප හිමි උපසම්පදා කළ සේක. එනිසා කියන ලදී - **"අලත්ථ ඛො අචෙලකසසපො භගවතො සනතිකෙ පබබජ්ජං. අලත්ථ උපසම්පදං"** - අචේලකස්සප භාග්‍යවතුන් වහන්සේ සමීපයේ පැවිද්ද ලැබුවේය. උපසම්පදාව ලැබුවේය යනුවෙන්.

"අචිරූප සම්පනෙනා" යනාදී ලෙස ඉතිරි විස්තර බ්‍රාහ්මණ සංයුත්තයේ කියන ලද්දේමය.

සත්වන සූත්‍රයයි.

12. 2. 8

අටවන සූත්‍රයේ - **"සා වෙදනා"** ආදියේ සැප-දුක් දෙක තමා විසින් කරන ලදයි යන පිළිගැනීම, ප්‍රතික්ෂේප කිරීම සඳහා කියන ලදි. මෙහිද "සතො" යනු සත්තමී අර්ථයේ ඡටියී විභක්ති වචනයකි. මේ එහි අර්ථ විස්තරයයි. "තිම්බරුක! ඒ වේදනාව ඔහු විඳියි' යනුවෙන් මුලදීම ගත්විට දුක තමා විසින් ම කරන ලද'යි යන මේ පිළිගැනීම ඇතිවේ. වේදනාව විසින් ම වේදනාව කරන ලදයි දේශනා කළවිට, මේ වේදනාව පෙරත් තිබූ අනුදන්නා ලදයි ශාස්වත වශයෙන් ගනියි. කුමක් නිසාද? මෙහිදී මෙකරුණ දැක්වීමට "මෙය අනිකකි" "මෙය ශාස්වත බවට පැමිණේ"

යන අර්ථ යෙදේ. මුල් අර්ථය සඳහා ම භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ වන්නේය. මෙනිසා අටුවාවෙහි (හෙළටුවාවේ) එය යොදාම මේ අර්ථය දක්වන ලදී. "එවමපහං න වදාමී" යනු මම "ඒ වේදනාව ඔහු විඳියි" යැයි නොකියමි. දුක තමා විසින් කරන ලදුයිද නොකියමි යන අර්ථයි. "වේදනාව අනිකකි." ආදී වශයෙන් සැප-දුක් දෙක අනුන් විසින් කරන ලදැයි යන පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීම සඳහා කියන ලදී. මෙහි ද මේ අර්ථ යෙදීමයි. "තිම්බරුක! වේදනාව අනිකකි. 'අනිකෙක් විඳියි" යනුවෙන් මුලදීම ගත්විට, පසුව ප්‍රථම පක්ෂයේ වූ කාරක-වේදනා-සඤ්ඤා යනාදිය සිඳ දමන ලදී. "තමා විසින් කළ දේ අනිකෙක් විඳී" යනුවෙන් උපන් උච්ඡේද දෘෂ්ටියත් සමග සම්ප්‍රයුක්ත වූ වේදනාව මැඩපැවැත්වූවහට වනාහී "සැපදුක් දෙක අනිකකු විසින් කරන ලදැ'යි යන මේ පිළිගැනීම ඇතිවේ. මෙසේ පවසන කල්හි - "කාරකයා සිඳින ලදී. අනිකකු විසින් ප්‍රතිසන්ධිය ගන්නා ලදී" යනුවෙන් උච්ඡේද දෘෂ්ටිය දක්වයි. කුමක් හෙයින් උච්ඡේද දෘෂ්ටිය ගන්නේ ද? එහිදී එකරුණ දැක්වීමට - 'මෙය අනිකකි'. 'මෙය උච්ඡේදයට පැමිණේ' යන අර්ථ යෙදේ. මෙහිදී ද මේ පදයන් හෙළටුවාවෙන් ගෙන යොදන ලද්දේමය.

මේ සූත්‍රයේ වනාහී සැප-දුක් වේදනා දෙක පවසන ලදී. එහිම සැප-දුක් විපාකය ද යෙදීම සුදුසුයැයි කියන ලදී.

අටවන සූත්‍රයයි

12. 2. 9.

නවවන සූත්‍රයේ - "අවිජ්ජා නීවරණසස" යනු අවිද්‍යාව වැළැක්වූවහටයි. "එවමයං කායො සමුදාගතො" යනු අවිද්‍යාවෙන් මිදුණු බැවින් තණ්හාවෙන් යුක්ත වූම මේ කය ඉපදුණි යනුයි. "අයඤ්ඤේව ච කායො" යනු තමාගේ සවිඤ්ඤාණක වූ මේ කයයි. "බහිද්ධාව නාමරූපං" යනු බාහිර වූ අන්‍යයන්ගේ සවිඤ්ඤාණක කයයි. තමාගේත් අනුන්ගේත් පංචස්කන්ධයෙන් හා ආයතන සයෙන් මේ අර්ථ දැක්විය යුතුයි. "ඉත්ථෙතං දවයං" යනු මෙසේ මේ නාමරූප දෙකයි. "දවයං පටිච්ච එසෙසා" - අන්‍ය වූ ඇස-රූප යන දෙක ගැටීමෙන් ස්පර්ශාදිය ඇතිවේ යැයි කියන ලදී. මෙහි වනාහී අධ්‍යාත්මික හා බාහිර ආයතන වශයෙනි. "මහාද්වය"

යනුවෙන් මේ දෙක හැඳින්වේ. **"සළෙවායතනානි"** යනු සයක් වූ ස්පර්ශායතන හා ස්පර්ශ කරණායතනයන්ය. **"යෙහි ඵුට්ඨො"** යනු යම් හේතු-භූත වූ ආයතනවලින් උපන් පහසින්, ස්පර්ශ කරන ලද්දේ යනුයි. "අඤ්ඤාතරෙන" යන මෙහි පරිපූර්ණ-අපරිපූර්ණ වශයෙන් එකකින් හෝ ඊට වැඩි ගණනකින් දතයුතුයි. **"තත්‍ර"** යනු ඒ බාල-පණ්ඩිත සැමදෙනාගේම කයින් පහළ වූ දෙයෙහිය. **"කො අධිපපායො"** කවර අධික ප්‍රයෝගයක් ද? එම ධර්මයන්ට භාග්‍යවතුන් වහන්සේ මූලික බැවින් **"භගවංමූලකා"**යැයි යෙදේ. මෙය කියන ලදී. - "ස්වාමීනි, අපගේ මේ ධර්මයෝ පෙර කාශ්‍යප බුදුරජාණන් වහන්සේ විසින් උපදවන ලදහ. උන්වහන්සේගේ **පිරිනිවණින්** පසුව එක් බුද්ධාන්තරයක් ගතවනතුරු වෙනත් කිසිදු ශ්‍රමණ-බ්‍රාහ්මණයෙක් මේ ධර්ම උපදවා ගැනීමට අසමත් වූහ. **දැන් භාග්‍යවතුන් වහන්සේ** විසින් මේ ධර්ම උපදවන ලද බැවින්; **ඔබවහන්සේ නිසාම අපි මේ දහම** දනිමු. මනාව අවබෝධ කරමු. **ස්වාමීනි!** මෙලෙසින් අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල්කොට පවතින්නෝය. **"භගවනෙත්තිකා"** යනු ධර්මයන්ගේ නායකයා, භික්මවන්නා, **සමාදන් කරවන්නා** භාග්‍යවතුන් වහන්සේමය. යථාස්වභාව වශයෙන් ධර්මය වෙන් වෙන් වශයෙන් ගෙනහැර දක්වන ලද බැවින් "භාග්‍යවතුන් වහන්සේම නායක කරගෙන ඇත" නම් වේ. **"භගවම්පටිසරණා"** යනු චාතුර්භූමික ධර්මයෝ **සර්වඥ** ඥානයාගේ දැකීමට පැමිණෙමින් භාග්‍යවතුන් වහන්සේම පිහිටකොට ඇතැයි, උන්වහන්සේ වෙතම එක්රැස් වීයැයි කියන ලදී. පටිසරති යනු එක්රැස් වේ. එක්තැන් වේ යන අර්ථයි. තවද - මහබෝ මැඩ හුන් භාග්‍යවතුන් වහන්සේ වෙත ප්‍රතිවේධ වශයෙන් ස්පර්ශය පැමිණෙයි. "භාග්‍යවතුන් වහන්ස! මගේ නම කුමක්ද? නුඹ ස්පර්ශ කිරීම් අර්ථයෙන් "එසස" නම් වේ. මෙලෙස වේදනා, සඤ්ඤා, සංඛාර, **විඤ්ඤාණ** ආදියද උන්වහන්සේගේ සිතට පැමිණෙයි. 'භාග්‍යවතුන් වහන්ස! මගේ නම කුමක්ද? නුඹ දනගැනීම් අර්ථයෙන් **'විඤ්ඤාණ නම් වේ.'** මෙසේ චාතුර්භූමික වූ යථාස්වභාවය වෙන්වෙන් වශයෙන් ගනිමින් භාග්‍යවතුන් වහන්සේ ධර්මයන් රාශිභූත කරයි. මේ අරුතින් - **"භගවම්පටිසරණා"** නම් වේ. **"භගවනතඤ්ඤූ ච පටිභානූ"** යනු භාග්‍යවතුන් වහන්සේට මේ දේශනයේ අර්ථ වැටහේවා. නුඹවහන්සේම අපට විස්තර වශයෙන් දේශනා කරන සේක්වා යන අර්ථයි. **"සා චෙව අවිජ්ජා"** යන මෙහි කෙසේ වුවත්, අවිද්‍යාවද තණ්හාව ද කර්මය වේගවත් කරවා ප්‍රතිසන්ධිය ඇද නිරුද්ධ කරන ලදී. යම්සේ යම් බෙහෙතක් අද හෝ ඊයේ පානය කරනවිටම "ආහාර අනුභව කරව"යි සමාන වූ ගැලපීම් අර්ථයෙන් **"එකෙණෙහි ම"**

යැයි කියත් ද එලෙසින් ම මෙහි ද ඒ අවිද්‍යාව ම "ඒ තණ්හාව"යැයි සමානාර්ථයෙන් කියන ලදී. "බ්‍රහ්මචරියං" යනු මාර්ග බ්‍රහ්ම චර්යාවයි. "දුකඛකඛයාය" සංසාරික පැවතීම් වශයෙන් ඇති දුකෙහි නැතිකිරීම පිණිස. "**කාසූපගො හොති**" අනික් ප්‍රතිසන්ධි කයකට පැමිණියේ වේ. "යදිදං බ්‍රහ්මචරිය වාසො" යමෙක් මේ මාර්ග බ්‍රහ්මචර්යාවේ යෙදී වාසය කිරීම. මෙහිදී බාලයාගෙන් පණ්ඩිතයා විශේෂ වේයැයි දක්වයි. මෙම සූත්‍රයේ සියලු ආකාර පිළිසිඳ ගැනීම් සහිත පුහුදුන් පුද්ගලයා, "බාලයා"යැයි ද පිළිසිඳ ගැනීම් රහිත ක්ෂීණාස්‍රව රහතන් වහන්සේ "පණ්ඩිතයා" යැයි ද කියන ලදී. සෝවාන්, සකෘදාගාමී, ආනාගාමී පුද්ගලයෝ වනාහි පණ්ඩිතයෝ ම ය. ඔවුහු බාලයෝ යැයි නොකිව යුතුයි. ඇසුරු කරන්නෝ වනාහි පණ්ඩිත පක්ෂයම ඇසුරු කරති.

නවවන සූත්‍රයයි.

12. 2. 10

දසවන සූත්‍රයේ - "**පටිච්ච සමුපපාදඤ්ච වො භික්ඛවෙ! දෙසිසසාමි පටිච්ච සමුපපන්නෙ ච ධම්මෙ**" යනුවෙන් ශාස්තෘන් වහන්සේ මේ සූත්‍රයේ ප්‍රත්‍යයන්හිද ප්‍රත්‍ය ඉපදීමෙහි ද යන දෙකෙහි ධර්ම ස්වභාවය දේශනා කරන්නෙමි"යි ද්විධ දේශනාව ඇරඹූ සේක. "**උපපාදාවා තථාගතානං**" යනු තථාගතවරු, බුදුවරු පහළ වූවත්-නොවූවත් ජාති ප්‍රත්‍යය නිසාම ජරාමරණ දෙක පවතී. ජාතියම (ඉපදීම ම) ජරාමරණ දෙකට හේතුව වේ යනුයි. "**ධීතාව සාධාතු**" යනු ඒ ප්‍රත්‍යයේ ස්වභාවය ඒ පරිදිමය. කිසිදිනෙකත් ජාතිය ජරාමරණ දෙකෙහි ප්‍රත්‍යය නොවන්නේ නොවේ යනුයි. (වන්නේමය) "**ධම්මට්ඨිතිතා ධම්මනියාමතා**" යනු මේ දෙපදයෙන් ප්‍රත්‍ය ගැනම පවසයි. ප්‍රත්‍යය නිසාම ප්‍රත්‍යුත්පන්න ධර්මයෝ පවතිති. එනිසා ප්‍රත්‍යයන්ට ම "ධම්මට්ඨිතිතා" යනුවෙන් කියයි. ප්‍රත්‍යයන් ම ධර්ම මෙහෙයවයි. එනිසා ප්‍රත්‍යයන්ට "ධම්මනියාමතා"යි කියනු ලැබේ. "**ඉදප්පච්චතා**" මේ ජරාමරණාදීන්ගේ හේතුව-ප්‍රත්‍යය ඉදප්පච්චයතාවයි. මෙය ප්‍රත්‍යකොට පැවතීමම ඉදප්පච්චයතාව යි. "**තං**" යනු ඒ ප්‍රත්‍යයයි. "**අභිසම්බුජ්ඣති**" යනු ඤාණයෙන් මනාව අවබෝධ කරගනියි. "**අභිසමෙති**" යනු ඤාණයෙන් දැනගනියි. "**ආචික්ඛති**" යනු කියයි. දේශනා කරයි. "**දෙසෙති**" යනු දක්වයි. "**පඤ්ඤාපෙති**" යනු දන්වයි. "**පට්ඨපෙති**" යනු ඤාණය නමැති මුවෙහි තබයි. "**විවරති**" යනු විවරණය කර දක්වයි. "**විභජති**" යනු බෙදීම් වශයෙන් දක්වයි. "**උත්තානී කරොති**" ප්‍රකට කරයි.

"පසසථාති චාහ" බලවූ යැයි කියයි. කුමක්ද? "මහණෙනි! ජාති ප්‍රත්‍ය නිසා ජරාමරණ පවතී ආදී වශයෙනි. **"ඉති බො භිකඛවෙ"** යනු "මහණෙනි! මෙසේ යනුයි. "යා තනු" යනු ඒ ජාතිප්‍රත්‍ය හේතුවෙන් ජරාමරණ වේ. යනාදියෙහිය. "තථතා" යනු ආදිය ප්‍රතීත්‍ය සමුත්පාදයට ම සමාන වදන් වේ. ඒ ඒ ප්‍රත්‍යයන් නිසා අඩුවැඩි වශයෙන් ඒ ඒ ධර්මයන්ගේ පහළවීම "තථතා" තථතාවයි. සාමග්‍රියට, එක්වීමට පැමිණි ප්‍රත්‍යයන්හි මොහොතක් හෝ ඒ ඉපදීම ගෙනදුන් ධර්මයන්ගේ විද්‍යමාන නොවීම **"අවිතථතා"** අවිතථතාවයි. අන්‍ය ධර්ම ප්‍රත්‍යයන්හි අන්‍ය ධර්ම පැමිණීමෙන් "අනඤඤතා" වේ. ජරාමරණාදීන්ගේ ප්‍රත්‍ය වශයෙන් හෝ ප්‍රත්‍ය සමූහ වශයෙන් හෝ **"ඉදපපචචයතා"**යි කියන ලදී. එහි මේ වචනාර්ථයයි. මේ ප්‍රත්‍යයන්ගේ හේතුවෙන් පැවතීම - ඉදප්පච්චයතාවයි. ඉදප්පච්චය ම ඉදප්පච්චයතාවයි. ඉදප්පච්චයන්ගේ සමූහය - ඉදප්පච්චයතාවයි. මෙහි ශබ්ද ශාස්ත්‍ර ලක්ෂණ මේ අයුරින් දත යුතුයි.

"අනිචචං" යනු පැවතී නැතිවීම් අර්ථයෙන් අනිත්‍යයයි. මෙහිද අනිත්‍ය යනුවෙන ජරාමරණ අනිත්‍ය නොවේ. අනිත්‍ය ස්වභාවය වනාහී ස්කන්ධයන්ගේ ජරාමරණ වශයෙන් පැවැත්ම අනිත්‍ය නම් වේ. සංඛත ද්‍රව්‍යයන්හි වනාහී මේ ක්‍රමයමයි. මෙහි **"සංඛතං"** යනු හේතුප්‍රත්‍ය සමවායෙන් කරන ලද යන්නයි. **"පටිචච සමුප්පනනං"** යනු ප්‍රත්‍යයන් නිසා උපන් යනුයි. **"ඛය ධමමං"** යනු ක්ෂය වන ස්වභාවයයි. **"වයධමමං"** යනු පහවන-නැතිවන ස්වභාවයයි. **"විරාග ධමමං"** යනු නො ඇලෙන ස්වභාවයයි. **"නිරොධ ධමමං"** යනු නිරුද්ධ වන-නැතිවන ස්වභාවයයි. උපත-ඉපදීම් ආදිය ද කියන ලද පරිදිම අනිත්‍යය යැයි දත යුතුයි. ජනක ප්‍රත්‍යයන්ගේ හෝ කෘත්‍යානුභාව ක්ෂණයෙහි නිර්දේශ කරන ලද බැවින් එක් පර්යායකින් මෙහි "අනිත්‍ය" යැයි ආදී වශයෙන් යෙදෙන්නේමය. භවාදිය අනිත්‍යාදී ස්වභාවයෙන් යුක්ත වේමය.

"පඤඤාය" යනු විදර්ශනා සහිත මාර්ග ප්‍රඥාවෙනි. **"පුබබනතං"** යනු පූර්ව අන්තය, අතීත කාලය යන අර්ථයි. **"අහොසිංනුඛො"** ආදියෙහි ද ඉක්මගිය කාලයයි. "අහොසිං නුඛො තනු ඛො" යනු ශාස්වත ආකාරයද අධිච්ච සමුප්පන්න ආකාරය ද නිසා අතීතයේ තමා විද්‍යමාන වීද? නොවීද? යනුවෙන් සැකකරන හෙයින් "කවර කරුණකින්ද?"යි නොකිව යුතුයි. උම්මත්තකයකු මෙන් බාල පුහුදුන් පුද්ගලයා යම්සේ සිතත් ද එසේ පවතියි. **"කිං නුඛො අහොසිං"** ජාති-ලිංග-උත්පත්ති ආදිය නිසා ක්ෂත්‍රියෙක් වීද? බමුණෙක්-වෛශ්‍යයෙක්-ශූද්‍රයෙක්-ගිහියෙක්-පැවිද්දෙක්-

දෙවියෙක්-මිනිසෙක් යනාදීන්ගෙන් කවරෙකු වීද?යි සැක කරයි. ඇතැමෙක් වනාහි ඊශ්වර නිර්මාණවාදී අදහස් නිසා කවර කරුණකින් වීද?යි හේතු වශයෙන් ද සැකකරන බව පවසති. "කිං නුඤා කිං අහොසි" ජාති ආදිය නිසා ක්‍ෂත්‍රියයෙක් වී බ්‍රාහ්මණයෙක් වීද? -පෙ- දෙවියෙක් වී මිනිසෙක් වීද? ආදී ලෙස තමාගේ බව පරපුර සැකකරයි. සැමතැනම වනාහි "අද්ධානං" යනු කාලය හඟවන පදයකි. "අපරනතං" යනු අනාගත අන්තයකි. "භවිසසාමිනුඛො නනුඛො" යනුවෙන් ශාස්වත ආකාරය ද උච්ඡේද ආකාරය ද නිසා අනාගතයේ තමා විද්‍යමාන වී ද? අවිද්‍යමාන වී ද?යි සැකකරයි. ඉතිරි පදයන්ගේ අර්ථ ද මෙලෙස දතයුතුයි.

"එතරහි වා පචචුපපනනං අද්ධානං" යනු දැන් ප්‍රතිසන්ධි ආදි කරගත් චුතියෙන් අවසන් වන සියලු කාලය, 'වර්තමානය' යැයි ගෙන යනුයි. "අජඣතතං කථංකථී භවිසසතී" තමාගේ ස්කන්ධයන්හි සැක ඇත්තේ වන්නේය. "අහං නු ඛොසමි" යනු තමාගේ ඇතිබව-පැවැත්ම සැකකරයි. මෙය පිළිගැනීම සුදුසු ද? "සුදුසු ද-නුසුදුසු ද යනු මේ කාගේ සිතුවිල්ලක්ද?" මෙහිදී මෙම කථාවස්තුව උදාහරණයකි.

චූලමාතාවගේ පුතා හිස මුඩුකර ඇත. මහාමාතාවගේ පුතා හිස මුඩුකර නැත. ඔහුගේ හිස මුඩුකළ කල්හි ඔහු නැගිට මම චූල මාතාවගේ පුතාද?යි සිතිය. මෙසේ "මම් වීමිද?"යි සැක කරයි. "නොනුඛොසමි"යි තමාගේ අවිද්‍යමානත්වය, නොපැවැත්ම සැකකරයි. එහි මේ උදාහරණ කථාවයි. එක් මසුන් මරන්නෙක් ජලයේ බොහෝ වේලාවක් තිබීමෙන් සීතල වූ තමාගේම කලවට මාළුවෙක් යැයි සිතා ගැසුවේය. තව අයෙක් සොහාන්බිම අසල කෙතක් රකිමින් සිටියදී තනිව සිටි නිසා බියෙන් හැකිලී නිදාගත්තේය. ඔහු නැගිට තමාගේම තමාගේම දණහිස් දෙකට යක්‍ෂයෝ දෙදෙනකැයි රැවටී පහර දුන්නේය. මේ අයුරින් "මම නොවීමිද"යි සැක කරයි. "කිං නු ඛො සමි" ක්‍ෂත්‍රියයෙක් වූයේ තමාගේ ක්‍ෂත්‍රියබව සැක කරයි. සෙසු ජාතිවලද මේ ක්‍රමයයි. දෙවියෙක් වූයේ දෙවි බව නොදෙන්නෙක් නම් නැත. දෙවියාද මම රූපවන්ද? අරූපවන්ද?යි ආදී වශයෙන් සැකකරයි. ක්‍ෂත්‍රියාදීහු කුමක් නිසා නොදන්නහුද? ඉන්‍ද්‍රිය ප්‍රත්‍යක්‍ෂ නොවූ බැවිනි. ගෘහස්ථ පෝතලිකාදීහු, ඒ ඒ කුලවල උපන්නාහු පැවිදිවීමේ සංඥාව ඇත. පැවිද්දෝ ද "මගෙ ක්‍රියා අස්ථිරයැ"යි ආදී වශයෙන් ගෘහස්ථ සංඥා ඇත. මිනිස්සු ද රජවරුන් මෙන් තමා පිළිබඳව දේව සංඥා ඇත්තෝ වෙති. "කථං නුඛො සමි" යන්න කියන ලද පරිදිමය. නුදෙක් මේ ශරීරාභ්‍යන්තරයේ ජීවියෙක් ඇතැයි ගෙන ඔහුගේ රූපාකාරය

දැක්වීම් වශයෙන් දික්වූයෙම් ද - කෙටිවී ද - චතුරස්‍රාකාරවී ද - පඤ්චස්‍රාකාර වීද - ෂඩස්‍රාකාර වීද - සප්තාකාරවීද - අෂ්ටාකාර වීද - දසාකාර වීද - සොළසාකාර වීද ආදී වශයෙන් අන්‍යාකාර වීදැයි සැක කරනුයේ "කිම නොවූයෙමිද?"යි සැකකරන බව දතයුතුයි. ශරීර සටහන් වශයෙන් වත්මන් ස්වභාවය නො දන්නෙක් නම් නැත.

"කුතො නු බො ආගතො සො කුහිං ගාමී භවිසසති" යනු ආත්ම-භාවයේ යෑම්-ඒම් වශයෙන් සැක කරනුයේ මෙසේ සැකකරයි. "අරියසාවකසස" යනු මෙහි සෝවාන් වූ පුද්ගලයායි. ඉතිරි ආර්ය පුද්ගලයන් නිදෙනාද මෙහිදී අදහස් කරන ලදී.

දසවන සූත්‍රයයි.

දෙවන ආහාර වර්ගය නිමියේය.

12. 3. 1-2

දසබල වර්ගයේ පළමු සූත්‍රය - දෙවන සූත්‍රයේ ම සංක්ෂිප්තයකි. සාරාංශයකි. දෙවන සූත්‍රය භාග්‍යවතුන් වහන්සේ විසින් තම අදහසක් වශයෙන් (අත්තජ්ඣාසය නික්ඛිප) දේශනා කරන ලදහ. එහි "දසබල සමනනාගතො" යනු බල දහයකින් යුක්ත වූ යනුයි. මෙහි ප්‍රධාන වශයෙන් බල දෙකකි. කාය බලය හා ඤාණ බලය වශයෙනි. මේ බල අතුරින් තථාගතයන් වහන්සේගේ කාය බලය ඇත් කුලය ඇසුරින් දත යුතුයි. පැරැන්නෝ මෙසේ කීහ.

"කාළාවකඤ්ච ගඩගෙය්‍යං පණ්ඩරං තම්බ පිඩගලං
ගන්ධ මඩගල හෙමඤ්ච උපොසථ ඡද්දනත මේ දසා"නි

"කාළාවකයෝ ද ගංගය්‍යයෝ ද - පණ්ඩරයෝ තම්බ පිංගලයෝ ගන්ධ-මංගල-හේමයෝ - උපෝසථයෝ ඡදන්තයෝ යි ඇත්කුල දහයකි."

මේ දස ඇත් කුලයන්ය. මෙහි "කාළාවක" යනු ස්වාභාවික ඇත් කුලයකියි දතයුතුයි. පුරුෂයෝ දසදෙනෙකුගේ කායබලය එක් කාළාවක ඇලෙහකට ඇත. කාලාවක කුල ඇතුන් දස දෙනකුගේ කාය බලය එක්

ගංගෙය්‍යයකුට ඇත. ගංගෙය්‍යයන් දස දෙනෙකුගේ කායබලය එක් පණ්ඩර නම් ඇතෙකුට ඇත. පණ්ඩරයෝ දසදෙනෙකුගේ කායබලය එක් තම්බ නම් ඇතෙකුට ඇත. තම්බයෝ දසදෙනෙකුගේ කායබලය එක් පිංගල නම් ඇතෙකුට ඇත. පිංගලයෝ දසදෙනෙකුගේ කායබලය එක් ගන්ධ හස්තියකුට ඇත. ගන්ධ හස්තීන් දසදෙනෙකුගේ කායබලය එක් මංගල නම් ඇතෙකුට ඇත. මංගල ඇත්තු දසදෙනෙකුගේ කායබලය හේම නම් එක් ඇතෙකුට ඇත. හේම ඇත්තු දසයකගේ කායබලය එක් උපෝසථ ඇත. උපෝසථ ඇත්තු දසදෙනෙකුගේ කායබලය එක් ඡද්දන්ත ඇතෙකුට ඇත. ඡද්දන්ත ඇත්තු දසදෙනෙකුගේ කායබලය තථාගතයන් වහන්සේට ඇත. "නාරායණ" නම් වූ බලය යැයි ද මෙයට ම කියති. එය මේ ස්වාභාවික ඇත් ගණයාගෙන් ඇතුන් කෙළදහස් ගණනකගේ ද පුරුෂයන් දසකෙළ දහසකගේ ද කාය ශක්තිය තථාගතයන්ට ඇති බැවින් - උන්වහන්සේ "දසබල සමන්නාගත" නම් වේ. මෙම සංග්‍රහ කිරීමට ඇතුන් හා මිනිසුන්ට පරිබාහිර වූ, ළාමක වූ සිංහාදී තිරිසන් ගනයෝ අයත් නොවෙති. මේ කාය බලය නිසා දුක පිරිසිඳ දැනීම හෝ තණ්හාව දුරුකිරීම හෝ අර්හත් මාර්ගය වැඩීම හෝ ඵල සාක්ෂාත් කිරීම හෝ කළ නොහැක.

එනිසා ම බුදුරජාණන් වහන්සේට දස ස්ථානයන්හි කම්පානොවෙන, උපස්ථම්භනය වන දැඟවිධ ඤාණබලයක් ද ඇත. ඒ සඳහා "දසබල සමන්නාගත" යන්න යොදන ලදී. එම දසය නම්; සුදුසු නුසුදුසු තැන් තත්වූ පරිද්දෙන් දන්නා බවයි. එනම්; සුදුසු තැන සුදුසු වශයෙනුත් නුසුදුසු තැන නුසුදුසු වශයෙනුත් දන්නා බව එක්ඥානයකි. අතීත-අනාගත-ප්‍රත්‍යුත්පන්න කර්ම සමාදානයන්ගේ ස්ථාන වශයෙන් ද හේතු වශයෙන්ද තත්වූ පරිද්දෙන් විපාක දන්නා බව එක් ඥානයකි. සෑම තැනකටම යාහැකි ප්‍රතිපදාව-පිළිවෙල දන්නා බව එකකි. අනේකවිධ වූ නොයෙක් ලෝකධාතූන් පිළිබඳව දන්නා බව තවත් ඥානයකි. අන්‍ය සත්වයන්ගේ නානාධිමුක්තිකතාව දන්නා බව තව ඥානයකි. ඔවුන් පිළිබඳව ම ඉන්ද්‍රිය පරෝපරියත්තිය දන්නා බව තවත් ඥානයකි. ධ්‍යාන-විමෝක්ෂ-සමාධි සමාපත්තීන්ගේ කිලිටිවීම්, පිරිසිදුවීම් හා කෙලෙස්වලින් නැගිටීම් ආදිය දන්නා බව තවත් ඥානයකි. සත්වයන්ගේ චුති උප්පත්ති දන්නා බව තවත් ඥානයකි. ආශ්‍රවයන් ක්ෂය කිරීම දන්නා බව තව ඥානයකි. අභිධර්මයේ වනාහි මෙසේ පැවසේ. - "මෙහි තථාගතයන් වහන්සේ සුදුසු තැන, සුදුසු වශයෙනුත්, නුසුදුසු තැන නුසුදුසු වශයෙනුත් තත්වූ පරිද්දෙන් දන්නා සේක. එසේ තත්වූ පරිදි සුදුසු-නුසුදුසු ස්ථාන දන්නා

බවම තථාගතයන් වහන්සේගේ "**තථාගත බලය**" වේ. යම් බලයකට පැමිණ තථාගතයන් වහන්සේ ශ්‍රේෂ්ඨතම ස්ථානය දැනගන්නා සේක් ද, පිරිස් මැද සීහනාද පවත්වන සේක් ද බ්‍රහ්මචක්‍රය පවත්වන සේක් ද ඒ තථාගත බලයෙන්ම වේ." මෙලෙස විස්තර වේ. මෙහි විස්තරාර්ථ වර්ණනාව විභංග අටුවාවේ ද පපංච සුදනී නම් මජ්ඣිමනිකාය අටුවාවේද සියලුම ආකාරයෙන් කියන ලදී. එම විස්තර එහි පැවසූ පරිදි දතයුතුය.

"චතූහි ච වෙසාරජ්ජේහි" යනු මෙහි කාමයෙන් බැඳීමට විරුද්ධ වූ විශාරද බවයි. සතර ස්ථානයන්හි පවත්නා විශාරද බවයි. එය "සිහි කරන්නහුට උපදින සෝමනස්සමය වූ ඤාණයට මේ තවත් සමාන වදනකි. කවර ස්ථාන සතරක ද? සම්මා සම්බුදුරජාණන් වහන්සේට "මේ ධර්මයෝ ඔබවහන්සේ අවබෝධ නොකළේයැ"යි චෝදනා කිරීමට නොහැකි වීමයි. ත්‍රිපිටක පාළියේ - "මහණෙනි! මෙහි චතුර් වෛශාරද්‍ය ඥානයක් තථාගතයන් වහන්සේට ඇත. කවර සතරක් ද? (1) මහණෙනි! මා හට "සම්මා සම්බුද්ධයැයි ප්‍රතිඥා දෙන නුඹවහන්සේ විසින් මේ ධර්මයෝ අවබෝධ නොකරන ලද සේකැ"යි පවසමින් කරුණු සහිතව චෝදනා කිරීමට සමත් පැවිද්දෙක් හෝ බමුණෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ ලොව අන් කිසිවෙක් හෝ මම නොදකිමි. මහණෙනි! මම මෙබඳු පුද්ගලයෙක් නොදක්නේ. නම් කෙෂ්මයට පැමිණියෙමි, අභයට පැමිණියෙමි, විශාරදත්වයට පැමිණියෙමි වාසය කරමි. (2) මහණෙනි! මාහට "ක්ෂීණාශ්‍රව වූහයි ප්‍රතිඥා කරන නුඹවහන්සේ විසින් මේ මේ ආශ්‍රවයෝ ප්‍රහීණ නොකරන ලදහ"යි කී කරුණු සහිතව -පෙ- (3) මහණෙන! මාහට "නුඹවහන්සේ විසින් අන්තරායකර යැයි දෙසූ ධර්මයන් ඇසුරු කරන්නාට අන්තරායක් නොවේ"යැයි කරුණු සහිතව -පෙ- (4) මහණෙනි! මාහට "නුඹවහන්සේ විසින් යම් අර්ථයක් සඳහා දහම් දෙසන ලද නම් ඒ ධර්මය සම්පූර්ණ කරන්නාගේ දුක් මැනවින් විනාශයට පත්නොවේ"යැයි පවසමින් කරුණු සහිතව -පෙ- මහණෙනි! මම මෙබඳු පුද්ගලයෙක් නොදක්නෙම් -පෙ- විශාරදත්වයට පැමිණියෙම් වාසය කරමි"a

"ආසභඤ්ඨානං" යනු ශ්‍රේෂ්ඨ ස්ථානයට, උත්තම ස්ථානයට යනුයි. ශ්‍රේෂ්ඨයෝ හෝ පූර්ව බුදුවරු පැමිණියා වූ ස්ථානයට යන අර්ථයි. තවද ගවයන් සීයකට ජ්‍යෙෂ්ඨයා 'උසභ'යායි. ගවයන් දහසකට

---

a. අඟුත්තර නිකාය - චතුක්ක නිපාතය

ජ්‍යෙෂ්ඨයා 'වසභ'යායි. ගාල් සීයකට ජ්‍යෙෂ්ඨයා 'උසභ'යායි. ගාල් දහසකට ජ්‍යෙෂ්ඨයා 'වසභ'යායි. සියලු ගවයන්ට ශ්‍රේෂ්ඨ වූ සියලු හිරිහැර ඉවසන්නා වූ සුදු වූ ප්‍රසාදාවහ වූ මහබර උසුලන්නා වූ හෙණ සීයක ශබ්දයකින් පවා කම්පා නොවන්නා වූ අතිශ්‍රේෂ්ඨ ම ගවයා මෙහිදී 'උසභ' යන්නෙන් අදහස් කරන ලදී. මෙය ඒ ගවයාට යෙදෙන තවත් නාමයකි. 'උසභසස ඉදං' යන විග්‍රහයෙන් "ආසභං" පදය සිද්ධ වේ. සතර පයින් බිම තදින් මිරිකාගෙන සිටීමට සමත් වේ. වෘෂභ ශ්‍රේෂ්ඨයා මෙන් යැයි "ආසභං" වේ. යම්සේ අතිශ්‍රේෂ්ඨ ගවයා වූ උසභයා, සිය වෘෂභ බලයෙන් යුක්ත වූයේ සතර පයින් බිම දැඩිව මිරිකාගෙන නොසෙල්වී සිටී ද එලෙසින් ම තථාගතයන් වහන්සේ ද දසවිධ තථාගත බලයෙන් යුතුවූයේ සතර වෛශාරද්‍ය නම් වූ පාද සතරින් අට පිරිස නම් වූ භූමිය මිරිකාගෙන දෙවියන් සහිත ලෝකයේ කිසිම සතුරෙකු-පස මිතුරෙකු විසින් කම්පා කල නොහැකි වූ සේක් නොසෙල්වී සිටින සේක. මෙසේ සිටිනුයේ ම ඒ "ආසභඤඨානං පටිජානාති"යි ශ්‍රේෂ්ඨ ස්ථානයට පැමිණෙන සේක. ප්‍රතික්ෂේප නොකරයි. තමා කෙරෙහි දොස් ආදිය නොනගයි. එනිසා "ශ්‍රේෂ්ඨ ම ස්ථානයට පැමිණේ"යැයි කියන ලදී.

"පරිසාසු" යනු "ශාරිපුත්‍රයනි! මේ සසුනෙහි පිරිස් අටකි. ක්ෂත්‍රිය පිරිස, බ්‍රාහ්මණ පිරිස, ගහපති පිරිස, ශ්‍රමණ පිරිස, චාතුර්මහාරාජික දේව පිරිස, තව්තිසා වැසිදේව පිරිස, මාර පිරිස හා බ්‍රහ්ම පිරිසයි." මේ අටපිරිස් මැද.

"සීහනාදං නදති" යනු ශ්‍රේෂ්ඨ නාදය, අභීත නාදය කරයි. සිංහ හඬක් සමාන වූ ශබ්දයක් හෝ පිටකරයි. මෙහි අර්ථ විස්තර සීහනාද සූත්‍රයේ දක්වන ලදී. යම්සේ සිංහයා ඉවසන විටත්, නසනවිටත් සිංහයාම යැයි කියත් ද එසේම තථාගතයන් වහන්සේ ලෝක ධර්මතාවයන් ඉවසන විට ද පරවාදයන් වනසා දමනවිට ද සිංහයෙක් යැයි කියයි. මෙහි කියූ ලෙසම සිංහයාගේ හඬ සිංහ හඬයි. (සීහසස නාදං-සීහනාදං) යම්සේ සිංහයා, සිංහ බලයෙන් යුක්තවූයේ සැමතන්හි විශාරදව දුරුකළ ලොමුදහම් ගැනීම් ඇතිව සිංහනාදය කරයි. එලෙසින්ම තථාගත නම් සිංහයාණෝ ද තථාගත බලයෙන් යුතුවූ සේක් අටපිරිස් හි විශාරදව, දුරුකළ ලොමුදහ ගැනීම් ඇතිසේක්, "මෙය රූපය"යැයි ආදී වශයෙන් නානාවිධ වූ දේශනා විලාසයන්ගෙන් යුක්තව සිංහනාද කරනසේක. එනිසා "අටපිරිස් මැද සිංහනාද කරයි" යනුවෙන් කියන ලදී.

"බ්‍රහමවකකං පවතෙතසි" යන මෙහි "බ්‍රහ්ම" යනු ශ්‍රේෂ්ඨ-උත්තම යනුයි. මෙය විශුද්ධ වූ ධර්ම චක්‍රයටම යෙදෙන තවත් සමාන වදනකි. ඒ ධර්මචක්‍රය දෙයාකාරය. ප්‍රතිවේධ ඤාණය සහ දේශනා ඤාණය යනුවෙනි. එහි ප්‍රඥාවෙන් වඩනාලදුව තමාට ආර්ය මාර්ග ඵල කැඳවනුයේ ප්‍රතිවේධ ඤාණයයි. කරුණාවෙන් වඩනා ලදුව ශ්‍රාවකයන්ගේ ආර්යඵල කැඳවනුයේ දේශනා ඤාණයයි. එහි ප්‍රතිවේධ ඤාණය "උප්පජ්ජමාන" හා "උප්පන්න" වශයෙන් දෙයාකාරය. අර්හත්ඵලය ලැබූ කෙනෙහි "උප්පන්න" නම් වේ. තුසිත භවනයේ පටන් මහබෝමැඩ අපරාජිත පර්යංකයෙන් සිට අර්හත් මාර්ගය ඉපදීම දක්වා "උප්පජ්ජමාන" ප්‍රතිවේධ ඤාණයයි. අර්හත්ඵලය ලැබූ ක්ෂණයෙහි "උප්පන්න ප්‍රතිවේධ ඤාණයයි. දීපංකර පාදමූලයේ පටන් අර්හත් මාර්ගය දක්වා උප්පජ්ජමාන ප්‍රතිවේධ ඤාණයයි. අර්හත්ඵලය ලැබූ කෙනෙහි උප්පන්න ප්‍රතිවේධ ඤාණයයි. දේශනා ඤාණය ද "පවත්තමාන" හා "පවත්ත" වශයෙන් දෙයාකාරය. එහි අඤ්ඤාකොණ්ඩඤ්ඤ තෙරුන් වහන්සේ ගේ සෝවාන් මාර්ගයට එළඹීම දක්වා "පවත්තමාන" දේශනා ඤාණයයි. අර්හත් මාර්ග ඵලය ලැබූ කෙණෙහි "පවත්ත" දේශනා ඤාණය ඇතිවිය. මේ ඤාණ දෙකින් ප්‍රතිවේධ ඤාණය ලෝකෝත්තරය. දේශනා ඤාණය ලෞකිකය. මේ ඤාණ දෙකම අන්‍යයන්ට අසාධාරණ වන බුදුවරුන්ටම පමණක් ඇතිවන ඔෞරස ඤාණයකි. (හදවතින්ම උපදින ඤාණයකි.) දැන් යමෙක් මේ ඤාණයන්ගෙන් සමන්විතව සීහනාද කරත් ද එය දැක්වීමට **"ඉතිරූපං"** යනාදිය දෙසූහ.

එහි **"ඉතිරූපං"** යනු මේ රූපයයි. මෙපමණ රූපයකි. මෙයින් වෙනත් වූ හෝ මෙයින් මතු රූපයක් නැත. වෙනස්වන ස්වභාවය ද සිවුමහාභූත දැඩිව ගත් භේදාදිය ද මුල් කරගත් ලක්ෂණ - රස - පච්චුපට්ඨාන - පදට්ඨාන ආදී වශයෙන් සියලු ආකාරයෙන් ම රූපය විමසීම කියන ලදි. **"ඉති රූපසස සමුදයො"** යනු දැන් මෙසේ විමසන ලද රූපයේ හටගැනීම කියන ලදී. එහි **"ඉති"** යනු මෙසේ "හටගැනීම වේ" යන අර්ථයි. එහි විස්තර වශයෙන් - "අවිද්‍යාව ඇතිවීමෙන් රූපය ඇතිවේ. තණ්හාව ඇතිවීමෙන් ක්‍රියා ඇතිවේ. ආහාර ඇතිවීමෙන් රූපය ඇතිවේ. මෙසේ ඉපදීම් ලක්ෂණ දකින්නා විසින් රූපස්කන්ධයේ ඇතිවීම දකින්නේයැ"ය මෙසේ දතයුතුයි. විනාශවීමෙහි ද - අවිද්‍යාව නැතිකිරීමෙන් රූපය නැතිවේ. -පෙ- විපරිණාමී ලක්ෂණ දකින්නා විසිනුදු රූපස්කන්ධයාගේ නැතිවීම දකින්නේ ය" යනු මේ විස්තරයයි. **"ඉති වේදනා"** ආදියෙහිද මේ වේදනාවයි. වේදනාව මෙපමණි. මින් මතු වේදනාවක් නැත. මේ

සංඥාවයි. මේ සංස්කාරයයි. මේ විඤ්ඤාණයයි. විඤ්ඤාණය මෙපමණි. මින්මතු විඤ්ඤාණයක් නැත. විඳින ලද, හැඳිනගත්, අභිසංස්කරණය කළ, දැනගන්නා ලද ස්වභාවයන් ද සැප-රූප සංඥා-ඵස්ස-චක්ඛු විඤ්ඤාණාදී භේදයන්ද මුල් කරගත් ලක්ඛණ-රස-පච්චුපට්ඨාන-පදට්ඨාන වශයෙන් සියලු ආකාර වේදනා-සංඥා-සංස්කාර-විඤ්ඤාණාදිය පිළිබඳ විමසා බැලීම කියන ලදී. **"ඉති වේදනාය සමුදයො"** ආදී වශයෙන් මෙසේ විමසූ වේදනා-සංඥා-සංස්කාර-විඤ්ඤාණයන්ගේ හටගැනීම කියන ලදී. එහි ද **"ඉති"** යනුවෙන් මෙසේ "හටගනී"යැයි කියන ලදී. මෙහි විස්තරාර්ථයන්ද "අවිද්‍යාව ඇතිවීමෙන් වේදනාව ඇතිවේ" යනාදී ලෙස රූප විස්තරයේදී පෙර කියූ පරිදිම දතයුතුයි. මෙහිදී ඇති විශේෂත්වය නම්; වේදනා, සංඥා, සංඛාර යන ත්‍රිවිධ ස්කන්ධයන්හි "ආහාරයෙන් හටගනියි" යන්න නොපවසා, "ස්පර්ශයෙන් හටගනියි" යනුවෙන් කිවයුතුයි. විඤ්ඤාණස්කන්ධයේ දී "නාමරූපයන්ගෙන් හටගනියි" යනුවෙන් කිව යුතුයි. විනාශවීමේදී ද මේ අයුරින්ම යෙදිය යුතුයි. මේ දැක්වූයේ සංක්ෂිප්ත විස්තරයකි. ඉපදීම්-නැතිවීම් ආදී සවිස්තරාත්මක විනිශ්චය සියලු ආකාරයෙන් පරිපූර්ණව විසුද්ධිමාර්ගයේ විස්තර වේ.

"ඉමස්මිං සති ඉදං හොති" මෙය ද තවත් සිංහ නාදයකි. එහි අර්ථය මෙසේය. මේ අවිද්‍යාදී ප්‍රත්‍යයන් ඇතිකල්හි මේ සංස්කාරාදී ඵලයන් වේ. **"ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති"**. මේ අවිද්‍යාදිය උපන් කල්හි මේ සංස්කාරාදී ඵලයන් හටගනියි. **"ඉමස්මිං අසති ඉදං නහොති"** යනු මේ අවිද්‍යාදී ප්‍රත්‍යයන් නැතිකල්හි මේ සංස්කාරාදී ඵලයෝ නැති වෙති. **"ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති"** මේ අවිද්‍යාදී ප්‍රත්‍යයන්ගේ නැතිවීමෙන් මේ සංස්කාරාදී ඵලයෝ නැතිවෙති. දැන් යම්සේ ඒ හේතු-ඵලයන්ගේ ඇතිවීමත්, නැතිවීමත් විස්තර කිරීම සඳහා **"යදිදං අවිජ්ජා පච්චයා සංඛාරා"** ආදිය දක්වන ලදී.

"එවං සවාකඛාතො" යනු මෙසේ රූපස්කන්ධය බෙදා දැක්වීම් වශයෙන් මැනවින් කියන ලද්දේ (සුටයු අකඛාතො)- සවාකඛාතො යි කියන ලදී. **"ධම්මො"** යනු පංචස්කන්ධ ප්‍රත්‍යාකාර ධර්මයයි. **"උත්තානො"** යනු උඩුකුරු කරන ලද්දේ යනුයි. **"විවටො"** විවෘත කර තබන ලද්දේ **"පකාසිතො"** යනු දක්වන ලද්දේ. ප්‍රකට කරන ලද්දේ යනුයි. **"ඤාණපිළොතිකො"** යන්නෙන් කඩමාලු-දිරූ රෙද්ද අදහස් වේ. ඒ ඒ තැන කැඩී-ඉරී ගිය හා මැසූ, ගැටගැසූ සිඳුණු වස්ත්‍රයක්, අටරියනක් හෝ නවරියනක් ලෙස නොනැසූ සලුවක් යමෙකුට නැතිද ඔහු "ඤාණ

පිළොතිකා" නම් වේ. මේ ධර්මය හා සමාන වූ වෙනත් කිසිදු දහමක් නැත. කුහක බව ආදී වශයෙන් සිදුණු-බිඳුණු-මැසූ-ගැට ගැසූ අපිරිසිදු දහමක් ඇත යන අරුතින් ද ඡින්න පිලෝතිකා නම් වේ. තවද කුඩා සලුවක් ඇත්තාට ද 'පිළොතිකා' යැයි කියනු ලැබේ. යම්කුට අට-නව රියන් මහා සලුවක් නොමැත්තේද ඔහුට ද "ඡින්නපිලෝතිකා" - පහවූ, දිරූ වස්ත්‍ර ඇත්තෙකැයි කියයි. මොහුගේ ධර්මයත් එසේමය. යම්සේ පුරුෂයෙක් සිවුරියන් සලුවක් ඇඳගෙන සිටිනුයේ එහෙ-මෙහෙ ඇදීම් වශයෙන් වෙහෙසේද එලෙසින්ම වෙනත් සසුන්වල පැවිදිවූවෝ, තම අල්ප වූ ධර්මය "මෙසේ ඇතිකල්හි මෙසේ වන්නේයැ"යි මෙනෙහි කරමින් වඩනුයේ වෙහෙසීමට පත්වෙති. යම්සේ අට-නවරියන් වූ වස්ත්‍රයක් හැඳගත් තැනැත්තා කැමති සේ-රිසි සේ එය පොරවා ද නොවෙහෙසේ ද එම වස්ත්‍රයේ එහෙ-මෙහෙ ඇඳ වැඩිය යුතු කිසිවක් නොමැතිද එලෙසින්ම මේ බුදුසසුනේ කල්පනා කර කර, බෙදා දැක්විය යුතු කිසිවක් නැත. ඒ ඒ කාරණාවලින් මවිසින් මේ ධර්මය මනාව බෙදන ලදී. මනාව විස්තර කරන ලදී. මේ නිසාද "ඡින්න පිළොතිකා" යැයි කියයි. තවද කසල ඇත්තාද "පිළොතිකා" නමින් හැඳින්වේ. මේ බුදුසසුනෙහි ශ්‍රමණ කසලයා නම් කිසිදු පිහිටක් නොලබන බව මෙසේ කියැවේ.

"කසළ ගොඩක් බඳු ඔහු බැහැර කරවු. කෙලෙස් කසට සහිත ඔහු නෙරපාලවු. මේ අයුරින් ශ්‍රමණයෙක් නොවී ශ්‍රමණයෙකැයි සිතන්නා වූ බොල් පුද්ගලයන් පිඹ හරිවු. ලාමක දේවල් කැමති පවිටු ඇවතුම්-පැවතුම් ඇති ඔවුනු බැහැර ලා කාය හැසිරීමාදියෙන් පිරිසිදුව ඔවුනොවුන් කෙරේ ගෞරවයෙන් පිරිසිදු පුද්ගලයන් හා වෙසෙවු. ඉන්පසු සමගිව-දක්ෂව දුක් කෙළවර කරවු."a

මෙසේ ශ්‍රමණ කසලයාගේ සිදීම ඇති බැවින් මේ ධර්මය "ඡින්න පිළෝතිකා" නම් වේ. "අලමෙව" යනු සුදුසුමය. "සද්ධාපබබජිතෙන" යනු ශ්‍රද්ධාවෙන් පැවිදි වූවහු විසින්ය. "කුලපුතෙතන" යන මෙහි කුල පුත්‍රයෝ දෙදෙනෙකි. ආචාර කුල පුත්‍රයා සහ ජාති කුල පුත්‍රයා වශයෙනි. එහි යම් අයෙක් කිසියම් කුසලයකින් පැවිදි වී සීලාදී පස්විධ ධර්ම ස්කන්ධයන් සම්පූර්ණ කරයි ද ඔහු "ආචාර කුලපුත්‍ර" නම් වේ. යමෙක් යසකුල පුත්‍රයෙන් උසස් කුලයක ඉපිද පැවිදි වූවෝ ද, ඔවුනු "ජාතිකුල පුත්‍රයා" නම් වේ. ඔවුන් දෙදෙනා අතුරින් මෙහිදී ආචාරය කුලපුත්‍රයා අදහස් කරන

a. සුත්තනිපාතය - ධම්මචරිය (කපිල) සූත්‍රය

ලදී. ඉදින් ජාති කුලපුත්‍රයා පැවිදි වීමෙන් ආචාර කුලපුත්‍රයෙක් බවටද පත්වේද ඔහු ඉතා උතුම්ය. මෙබඳු කුලපුත්‍රයා විසින් "විරියං ආරභිතුං" යනු චතුරංග සමන්නාගත වීර්යය කිරීමටයි. දැන් ඔහුට චතුරංගයන් දක්වමින් "**කාමං තචො ච**" යනාදිය දෙසූහ. මෙහි "සම" එකකි. "නහර" යනු දෙවන අංගයයි. තෙවන අංගය "ඇට" වේ. සිවුවන අගය "මස්-ලේ" දෙකයි. මෙහිදී චතුරංග සමන්නාගත වීර්යය අධිෂ්ඨාන කරන්නහු විසින් තව තැනෙක්හි එය සමාදන් විය යුතුයි. පෙරබත් කල, පසුබත් කල, පෙරයාමයේ, මැදුම් යාමයේ, පශ්චිම යාමයේ, ගමන් කිරීමේදී, සිටගෙන සිටීමේදී, හිඳීමේදී හා නිදීමේදී යන නව ස්ථානයේදී "දුකඛං භිකඛවෙ! **කුසිතො විහරති**" යනු මේ බුදුසසුනෙහි යම් කම්මැලි පුරුෂයෙක් වේද ඔහු දුකසේ වෙසෙයි යනුයි. අන්‍ය සමයන්හි වනාහී කම්මැලි පුද්ගලයෝ සුවසේ වෙසෙති. "වොකිණෙණා" යනු මිශ්‍රවූ යන අර්ථයයි. "සදත්ථං" යනු "ශෝභන වූ" හෝ "මහත් වූ" යන අර්ථයයි. මේ දෙකින්ම රහත් බවම අදහස් වේ. "**පාරිභාපෙති**" පිරිභවයි. නොපැමිණෙයි. කුසීත පුද්ගලයාගේ ඉන්ද්‍රිය සය ගෝපනය නොකරන ලද්දේ, ආරක්ෂා නොකරන ලද්දේ වේ. ඔහුගේ තිදොරින් කරන කර්මයෝ (ක්‍රියාවෝ) අතිශය අපිරිසිදු වෙති. ඔහුගේ ආජීවාෂ්ඨමක ශීලයද ඉතා අපිරිසිදුය. ඔහු බිඳුණු ආජීව ඇත්තෙකුව ගිහි කුලයන් වෙත නිතර එළඹින්නෙකු වේ. මෙනිසා එකට බඹසර පුරන සෙසු භික්ෂූන් වහන්සේලාගේ ඇසෙහි වැටුණු දූවිල්ලක් මෙන් නැසීම්-වැනසීම් කරන්නෙක්ව දුකින් වෙසේ. ශාන්ත වූ නිවණ විනාශ කරන්නෙක් මෙන් ම මැටි කැටයක් මෙන් වැටෙන්නෙක් ද වේ. ශාස්තෘන් වහන්සේගේ අදහස ගැනීමට ද අසමත් වේ. දුර්ලභ වූ ක්ෂණ සම්පත්තිය වරදවා ගනියි. ඔහු විසින් අනුභව කරන ලද දායකයන්ගේ ආහාරය පවා මහත්ඵල ගෙන නොදෙයි. "ආරද්ධවීරියො ච භිකඛවෙ" යනු "අරඹන ලද වීර්යය ඇති පුද්ගලයා මේ සසුනෙහිම සැපසේ වෙසේ" යන්නයි. අන්‍ය සමයන්හි වනාහී අරඹන ලද වීර්යය ඇත්තා දුකසේ වෙසෙයි. "**පවිවිතෙතා**" විවේකයෙන් යුතු බාහිර කරදරවලින් වියුක්ත වූවෙක් වී. "**සදත්ථං පරිපූරෙති**" යනු රහත්බවට පැමිණෙයි. අරඹන ලද වීර්යය ඇත්තාගේ ඉඳුරන් සය මනාව ආරක්ෂා කරන ලද්දේ වේ. ත්‍රිවිධ කර්මයෝ පිරිසිදුය. ආජීව අෂ්ටමක සීලය ඉතා පිරිසිදුය. එක්ව බඹසර හැසිරෙන්නවුන්ගේ ඇසෙහි ඉතා සිසිල් අඳුනක් ගාන්නාක් මෙන් ද අතට පත් සඳුනක් මෙන් ප්‍රිය මනාපව ද සුවසේ වෙසෙයි. ඔහු ශාස්තෘන් වහන්සේගේ අදහස ගැනීමට සමත් වේ. ශාස්තෘන් වහන්සේ වනාහී "මහාවීරයන් වහන්ස! බොහෝ කාලයක් ජීවත් වේවා! මහා මුනීන්ද්‍රයන් වහන්ස! කල්පයක් වැඩසිටින සේක්වා!" මෙසේ ගෞතමීය පවසමින්

වදින විට; බුදුරජාණන් වහන්සේ "ගෞතමයෙනි! මෙසේ තථාගතයන් වහන්සේ නොවැඳිය යුතුයි" යනුවෙන් පවසා ප්‍රතික්ෂේප කළ සේක. ඉන්පසු ඇය විසින් ආරාධිත වූ බුදුපියාණන් වහන්සේ තථාගතයන්ට වැඳිය යුතු ආකාරය දක්වමින් මෙසේ වදාළහ.

"ආරද්ධ විරියෙ පහිතතෙත නිච්චං දළහ පරක්කමෙ
සමගෙග සාවකෙ ෂසස එසා 'බුදධාන වඳනා" ති.

"ඇරඹූ වීර්ය ඇති, නිවණට මෙහෙයූ සිත් ඇති, නිතර දැඩි පරාක්‍රම ඇති සමගි ශ්‍රාවක සංඝයා සහිත බුදුරදුන්ට වන්දනා කරන්න"a යනුවෙනි.

මෙසේ ආරම්භ කළ වීර්යය ඇති තැනැත්තා ශාස්තෘන් වහන්සේගේ අදහස ඉටු කිරීමට සමත් වේ. දුර්ලභ වූ ක්ෂණ සම්පත්තිය විනාශ නොකරයි. ඔහු වනාහී බුද්ධෝත්පාදය ද ධර්මදේශනාව ද සංඝයාගේ මනාපිළිවෙත සඵල කරයි. ප්‍රතිඵල ගෙන දෙයි. ඔහු විසින් අනුභව කළ දායකයන්ගේ ආහාරයද මහත්ඵල ගෙනදේ. **"හීනෙන අගඝසස"** හීන වූ ශ්‍රද්ධාවෙන්, හීන වූ වීර්යයෙන්, හීනවූ සිහියෙන්, හීනවූ සමාධියෙන්, හීන වූ ප්‍රඥාවෙන් යුතු පුද්ගලයා "අග්‍ර" නම් වූ රහත්බවට පැමිණීම නම් සිදුනොවේමය. "අගෙහත ච බොා" අග්‍ර වූම ශ්‍රද්ධා-වීර්යාදියෙන්ම රහත් බවට පැමිණීම වේ. "මණඩපෙය්‍යං" යනු ප්‍රසන්න-පිරිසිදු වූ අරුතින් "මණ්ඩ" නම් වේ. පානය කළයුතු අර්ථයෙන් "පෙය්‍යං" නම් වේ. යමක් බීමෙන් අතරමග වැටී සිහිනැතිව, තමාගේ ඇඳි වස්ත්‍රාදියට ද හිමිකමක් නොමැති වීමට සිදුවේද, ඒ පානය ඉතා පිරිසිදු වුවත් නොම පානය කළයුතුයි. මගේ සසුන් වනාහී මෙසේ ප්‍රසන්න වූත් පානය කළයුතු වූත් එකකැයි දක්වමින් "මණඩපෙය්‍යං" යනුවෙන් වදාළහ. මෙහි පිරිසිදුවීම් හෙවත් මණ්ඩ තුනකි. දේශනා මණ්ඩය, ප්‍රතිග්‍රහණ මණ්ය හා බ්‍රහ්මචරිය මණ්ඩය යනුවෙනි. එහි දේශනා මණ්ඩය යනු කුමක්ද? සතර ආර්ය සත්‍යයන්ගේ දැක්වීම, දේශනා කිරීම, පැනවීම, පිහිටුවීම, විවරණය කිරීම, බෙදා දැක්වීම, පැහැදිලි කිරීම යි. සතර සතිපට්ඨාන ධර්මයන්ගේත් ආර්ය අෂ්ටාංගික මාර්ගයේත් දැන්වීම -පෙ- පැහැදිළි කිරීමයි. මේ විස්තර කරන ලද්දේ දේශනා මණ්ඩයයි. ප්‍රතිග්‍රහණ මණ්ඩය යනු කුමක්ද? භික්ෂු, භික්ෂුණී,. උපාසක, උපාසිකා දී හු ද දෙවියෝ ද මනුෂ්‍යයෝ ද යම් ඒ අවබෝධ කරවිය යුතු අනික් පිරිසක් වේද ඔවුහු ද "ප්‍රතිග්‍රහණ මණ්ඩ" නම් ෙව්. "බ්‍රහ්මචරිය මණ්ඩය" යනු කුමක්ද? මේ ආර්ය අෂ්ටාංගික

a. ථෙරීගාථා - මහාපජාපතී ගෝතමී

මාර්ගය මයි. එනම්; යහපත් දැකීම -පෙ- යහපත් සමාධිය යන මේ අට බ්‍රහ්මචරිය මණ්ඩයයි. තවද "පිරිසිදු අධිමෝක්ෂය, ශ්‍රද්ධා ඉන්ද්‍රිය, ශ්‍රද්ධාවක් නොමැති කසට යන තුනින් අශ්‍රද්ධාවන්ත කසට හැරදමා ශ්‍රද්ධින්ද්‍රියෙහි පිරිසිදු අධිමෝක්ෂය පොවයි" යන අරුතින් "පහන් මිහිරි පැනක් බඳු" යනාදී ක්‍රමයෙන් මෙහි අර්ථ දතයුතුයි. "**සත්‍ථා සම්මුචිභූතො**" යනුවෙන් මෙය හේතු වශයෙන් පැවසූ වදනකි. යම්හෙයකින් ශාස්තෘන් වහන්සේ සම්මුඛ වූ සේක්ද එහෙයින් එකරුණට වීර්යය ද එක්කර "මේ පිරිසිදු පානය වළඳවු" යන අර්ථයයි. අන්‍ය-පරිබාහිර බෙහෙතක් ඉතා පිරිසිදු වුවත් වෛද්‍යවරයාගේ අනභිමුඛයෙහි පානය කරන්නහුට "ප්‍රමාණය මතුවීම හෝ පිටවීම නොදනිමු"යි සැක ඇතිවේ. වෛද්‍යවරයා අභිමුඛයේ දී "වෙදතුමා මෙහි ප්‍රමාණ දන්නේය"යි සැක නැතිව පානය කරයි. මෙලෙසින්ම අපගේ ධර්මස්වාමී වූ ශාස්තෘන් වහන්සේ ඉදිරියේ සිටියේ යැයි සතුටුව වීර්යය වඩා පානය කරවු" යනුවෙන් මිහිරි වූ දහම් පැන් බීමෙහි ඒ භික්ෂූන් වහන්සේ යෙදවූ සේක. "**තසමාතිහ භිකඛවෙ**" යනාදිය වදාළහ. එහි "**සඵලා**" යනු ආනිසංස සහිතය. "**සඋදයා**" අභිවෘද්ධි සහිතය. "**අත්තඤ්ඤං**" යනු තමාගේ අභිවෘද්ධිය වූ රහත් බවයි. "**අප්පමාදෙන සම්පාදෙතුං**" යනු අප්‍රමාදීව සියලු කටයුතු කිරීමටයි. "**පරඤ්ඤං**" යනු ප්‍රත්‍යදායකයන්ට මහත්ඵල මහානිසංස වන බවයි. සෙසු වදන්වල අර්ථ ඉතා ප්‍රකටය.

දසබල සූත්‍ර වර්ණනාව නිමියේය.

12. 2. 3

තෙවැනි සූත්‍රයේ "**ජානතො අහං**" යනාදියෙහි "**ජානතො**" යනු දන්නා හටය. "**පසසතො**" යනු දකින්නා හටය. මේ දෙපදයෙහිම එකම අර්ථය වේ. ව්‍යඤ්ජන වශයෙන් නානාවිධ වේ. මෙසේ ඇතිකල්හි "ජානතො" යනුවෙන් ඤාණ ලක්ෂණය දැඩිසේ ගත් පුද්ගලයා දක්වයි. දැනගැනීම් ලක්ෂණය වනාහී ඤාණයමයි. "පසසතො" යනු ඤාණ ප්‍රභාවය දැඩිසේ ගත් දැක්ම-ප්‍රභාව වූ ඤාණයයි. ඤාණයෙන් යුක්ත වූ පුද්ගලයා ඇස් ඇති අයෙකු ඇසින් රූප දකින්නාක් මෙන් ඤාණයෙන් විවෘත වූ ධර්ම කරුණු දකියි. බලයි. "**ආසවානං ඛයං**" මෙහි ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීමයි. නුපදීමයි. ක්ෂයවීමයි. නැතිබවයි. මෙයම ආශ්‍රවයන් ක්ෂය කිරීම යැයි කියයි. එමෙන්ම භංග, මාර්ගඵල, නිවණ යන නම්ද මේ සඳහා ම යෙදේ. "ආශ්‍රවයන්ගේ ක්ෂයවීමෙන්, ආශ්‍රව වූ චෙතො විමුක්තිය" යන

තැන්හි "ක්ෂීණාකාර ආශ්‍රවක්ෂය" කියැවේ. "යමෙක් ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීමෙන්, ව්‍යය කිරීමෙන්, බිඳීයාමෙන් හාත්පසින් බිඳියෑමෙන්, අනිත්‍යතාවට-අතුරුදහන්වීමට පැමිණීම" යනාදියේදී ආශ්‍රවයන්ගේ භංගවීම අදහස් කෙරේ.

සෙඛස්ස සික්ඛමානස්ස උජුමග්ගානුසාරිනෝ
ඛයස්මිං පඨමං ඤාණං තතෝ අඤ්ඤා අනන්තරා

"ආර්ය මාර්ගය පිළිපදින්නා වූ හික්මෙන සේඛ පුද්ගලයාට පළමුව කෙලෙස් ක්ෂය කරන බැවින් ක්ෂය නම් වූ මාර්ග ඤාණය උපදී. ඒ චතුර්තථ මාර්ග ඤාණයෙන් අනතුරුව අර්හත්ඵලය උපදින්නේය."a

මෙහි මාර්ග ආශ්‍රවක්ෂය දක්වන ලදී. එය ආශ්‍රව ක්ෂයවීමෙන්, සංසිඳීමෙන් උපදියි. එනිසා ආශ්‍රවයන්ගේ ක්ෂයවීමයැයි කියන ලදී. "ආශ්‍රවයන්ගේ ක්ෂයවීමෙන් ශ්‍රමණයෙක් වේ" යනුවෙන් මෙහි 'ඵල ආසවක්ඛය' කියන ලදී. එහි වනාහී "ආශ්‍රවයන්ගේ ක්ෂීණවීමෙන් උපදියි" යන අර්ථයෙන් "ආශ්‍රවයන්ගේ ක්ෂයවීම"යැයි කියන ලදී. "ඔහුගේ ආශ්‍රව වැඩෙයි. ඔහු ආශ්‍රවක්ෂයෙන් දුරුවෙයි" යන තැන්හි "නිවණ" ආසවක්ඛය යන වදනින් අදහස් විය. නිවණ පැමිණීමෙන් ආශ්‍රවයන් ක්ෂය කරන බැවින් එම නාමය යෙදේ. මෙම සූත්‍රයේ දී මාර්ග ඵලයන් අදහස් කරන ලදී. "නො අජානතො නො අපස්සතො" යනු යමෙක් වනාහී නොදනියි. නොදකියි. ඔහුට නොපවසමි යන අර්ථයි. මෙයින් යමෙක් නොදැන-නොදැක සංසාරාදියේ ශුද්ධිය පවසත්ද ඔවුහු ප්‍රතික්ෂේප කරන ලදහ. මුල්පද දෙකින් දේශනාවේ යොමුවීම හෙවත් අදාළවන්නෝ අදහස් වෙති. මේ පද දෙකින් දේශනාවේ යොමුනොවීම හෙවත් දෙසුම අදාළ නොවන්නේ අදහස් කෙරෙති. දැන් යමකින් දැන දැනම ආශ්‍රවයන් ක්ෂය කරයි ද එය දක්වනු කැමතිව "**කිඤ්චරහි භික්ඛවෙ! ජානතො**" යනුවෙන් ප්‍රශ්න විචාරීම ඇරඹූ සේක. එහි "දැනගැනීම" බහුවිධය. පණ්ඩිත ස්වභාව ඇති යම්කිසි භික්ෂුවක් කුඩයක් සෑදීමට දනියි. තවත් භික්ෂුවක් සිවුරු ආදී වෙනත් මෙබඳු නිෂ්පාදන කිරීමට, සමත් වෙයි. මේ භික්ෂූන්ට වත්පිළිවෙත් හිසින් ගෙන සිදුකරනුයේ දැන දැනම මාර්ග ඵලාවබෝධය නොවේයැයි නොකිව යුතුයි. යමෙක් වනාහී සසුනේ පැවිදි වී වෙදකම් ආදිය කිරීමට දනියි ද ඔහුට එම ක්‍රියාව නිසා දැන දැනම ආශ්‍රව වැඩෙන්නේය. එනිසා යම් ක්‍රියාවක් දන්නේ - දකින්නේ එය ආශ්‍රවයන් ක්ෂය කරයිද එයම දක්වමින් **"ඉති රූපං"** යනාදිය දෙසූහ. **"එවං ඛො භික්ඛවෙ! ජානතො"** යනු මේ පංචස්කන්ධයේ ඇතිවීම හා නැතිවීම මැනවින් දන්නා

පුද්ගලයාටය. "**ආසවානං ඛයො හොති**" ආශ්‍රව නැති කරමින්ම උපන් බැවින් "ආසවක්ඛය" නම් වූ රහත්බව වේ. මෙලෙස රහත්බවට මූලික අභිමතාර්ථය වූ මෙම සූත්‍ර දේශනාව නිමවා, දැන් රහතන් වහන්සේගේ පැමිණීම් ඇති පූර්වභාග ප්‍රතිපදාව දැක්වීමට "**යමපිස්ස තං භික්ඛවෙ!**" යනාදිය දෙසූහ.

එහි "**ඛයසමිං ඛයෙ ඤාණං**" යනු ආශ්‍රවක්ෂය නම් වූ රහත්ඵලය ලැබූ කල්හි පවතින ප්‍රත්‍යවේක්ෂණ ඤාණයයි. එහි වනාහී "රහත්ඵලය" නම් වූ ආශ්‍රවයන් ක්ෂයවීමේදී, එය කෙලෙස් ක්ෂයවීමෙන් පසුව උපදින බැවින් මෙය "ඛය ඤාණ" නම යෙදේ. "**සඋපනිසං**" යනු කරුණු-හේතු සහිතව. ප්‍රත්‍යසහිතවයි. "**විමුතති**" යනු අර්හත් ඵල විමුක්තියයි. එය උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වේ. මෙසේ මීට වෙනස් වූ ප්‍රත්‍ය කෙරෙහිත් ලැබීම් වශයෙන් ප්‍රත්‍ය වන බව දතයුතුය. "**විරාගො**" යනු ආර්ය මාර්ගයයි. එය කෙලෙස් හි නො ඇලීමෙන්, ගතකිරීමෙන් උපන් බැවින් "විරාගො" යනු ආර්ග මාර්ගයයි. එය කෙලෙස් හි නො ඇලීමෙන්, ගත කිරීමෙන් උපන් බැවින් "විරාග"යැයි කියයි. "**නිබ්බිදා**" යනු සංවේගය පිළිබඳ ඤාණයයි. මෙයින් බලවත් විදර්ශනාව දක්වයි. බලවත් විදර්ශනාව යනු භයතුපට්ඨාන ඤාණය, ආදීනවානුපස්සනා ඤාණය, මුඤ්චිතුකාමපතා ඤාණය හා සංඛාරුපෙක්ඛාය ඤාණය යන සතර ඤාණයන්ට යෙදුණු තවත් වදනකි. "**යථාභූත ඤාණ දසසනං**" යනු යථාස්වභාවය දැනගැනීම නම් වූ දර්ශනයයි. මෙම වදනින් මෘදුවූ විදර්ශනාව දක්වන ලදී. මෘදුවූ විදර්ශනාව, බලවත් විදර්ශනාවට ප්‍රත්‍ය වේ. මෘදු වූ විදර්ශනාව යනු **සංස්කාර, පරිච්ඡේද ඤාණය, කංඛා විතරණ ඤාණය, සම්මසන ඤාණය** හා මග්ගාමග්ග ඤාණය යන ඤාණ සතරට යෙදෙන තවත් නාමයකි. "**සමාධි**" යනු අත්තිවාරම වූ ධ්‍යාන සමාධියයි. එය මෘදු වූ විදර්ශනාවට ප්‍රත්‍ය වේ. "**සුඛං**" යනු ධ්‍යානයේ පූර්වභාග සුවයයි. එය අත්තිවාරම වූ ධ්‍යානයට ප්‍රත්‍ය වේ. "**පසසද්ධි**" යනු මෙහිදී සිදුවන දැවිල්ල හා විඩාවේ සංසිඳීමයි. එය ධ්‍යානයාගේ පූර්වභාග වූ සැපයට ප්‍රත්‍ය වේ. "**පිති**" යනු බලවත් ප්‍රීතියයි. එය දැවිම්-විඩාව සංසිඳවීමට හේතු වේ. "**පාමුජ්ජං**" යනු දුර්වල (දුබල) ප්‍රීතියයි. එය බලවත් ප්‍රීතියට ප්‍රත්‍ය වේ. "**සද්ධා**" යනු භවයෙන් භවයට උපදින ශ්‍රද්ධාවයි. එය දුර්වල ප්‍රීතියට ප්‍රත්‍ය වේ. "**දුකඛං**" යනු සසර පැවැත්මට හේතුවන දුකයි. එය භවයෙන් භවයට උපදින ශ්‍රද්ධාවට ප්‍රත්‍ය වේ. "**ජාති**" යනු වෙනස්වීම් සහිත ස්කන්ධයන්ගේ පහළවීමයි. එය වනාහී සසර පැවැත්මට හේතුවන දුකට ප්‍රත්‍ය වේ. "**භවො**" යනු කර්ම භවයයි. එය වනාහී වෙනස්වීම් සහිත ස්කන්ධයන්ගේ ඉපදීමට ප්‍රත්‍ය වේ. මේ ක්‍රමයෙන් සෙසු පදයන්ගේ අර්ථ ද දත යුතුයි.

"පූලලපූසිතකෙ" යනු මහත් වූ දියබිඳු ඇති යනුයි. "පබබත කන්දර -පෙ- සාගරං පරිපූරෙනති" යන මෙහි "කන්දරං" කඳුර නම් වනුයේ "කන්" නම ලද ජලයෙන් බිඳි, ජලයෙන් බිඳින ලද පර්වත ප්‍රදේශයයි. යමෙක් ඊට "පර්වත පාර්ශ්වය" යැයිද "වැල් ආදියෙන් වැසුණු කුඩා නදිය" යැයිද පවසත්. ඒ කඳුබෑවුමයි. "පදරං" යනු අටමසක් වැසි නැති කල්හි පැලෙන බිම් පෙදෙසයි. "සාඛා" යනු ගමේ කුඩා වලවල්ය. කුඩා ජලමාර්ග ආදියයි. "කුසසුබහා" යනු කුඩා වලවල්ය. "මහා සුබහා" යනු විශාල වලවල්ය. "කුනනදියො" යනු කුඩා නදීහුය. "මහානදියො" යනු ගංගා, යමුනා ආදී මහා ගංගාවෝය. "එවමෙව බො භික්ඛවෙ! අවිජ්ජූපනිසා සංඛාරා" යනාදියෙහි අවිද්‍යාව පර්වතයකැයි දැකිය යුතුයි. අභිසංස්කාරයෝ නම් වර්ෂාවයි. විඤ්ඤාණය ප්‍රධාන සසර පැවැත්මට හේතුවන ධර්ම දියකඳුරු ලෙස දැකිය යුතුයි. විමුක්තිය සාගරයයි. යම්සේ පර්වතය මත, වැසිදිය වැටී පර්වත-දියකඳුරු ආදිය පුරවමින් අනුක්‍රමයෙන් පැමිණ මහමුහුද, සාගරය පුරවයිද එලෙසින්ම අවිද්‍යා පර්වතය මත අභිසංස්කාර නම් වැහි වලාකුළුවලින් වැසිවැටෙන බව දතයුතුයි. අශ්‍රැතවත් බාල පුහුදුන් පුද්ගලයෝ අවිද්‍යාවෙන් නුවණ නැත්තෙක් වී තණ්හාවෙන් සිය ආශාවන් ඉටුකර ගනිමින් කුශලාකුශල කර්ම රැස්කරයි. ඒ කුසලාකුසල කර්ම ප්‍රතිසන්ධි විඤ්ඤාණයට ප්‍රත්‍ය වේ. ප්‍රතිසන්ධි විඤ්ඤාණයෙන් නාමරූපාදීන්ටද වශයෙන් මෙලෙස ප්‍රත්‍ය වේ. මෙසේ පර්වතය මත වැටුණු වැසිදිය දියකඳුරු-ගංගාදිය පුරවා මහමුහුදට පැමිණි අවස්ථාව මෙන් අවිද්‍යා පර්වතය මත වැටුණු, අභිසංස්කාර නම් වැස්සේ ප්‍රත්‍ය පරපුර අනුපිළිවෙලින් පැමිණ විඤ්ඤාණාදී දිය කඳුරු පුරවා පැවති අවස්ථාව දතයුතුයි. මෙම බුද්ධ වචනය වනාහී මේ සූත්‍ර පෙළේ නො දක්වුනත්, "මේ ලෝකයේ තථාගතයන් වහන්සේ උපදින සේක. -පෙ- ගිහිගෙන් නික්ම පැවිදිවන සේක" යනුවෙන් ත්‍රිපිටක පාළියේ කියන ලද පරිදි අර්ථ ගලපා දතයුතුයි.

ඔහුගේ කුලයෙහි ඉපදීම ගෙනදුන් ඒ කර්මභව ප්‍රත්‍ය "වෙනස්වීම් සහිත ජාති" නම් වේ. ඔහු බුදුවරුන්ගේ හෝ බුද්ධ ශ්‍රාවකයන්ගේ හෝ ඉදිරියට පැමිණ සසර පැවැත්මේ දෝෂ දක්වමින් කරන ලද ධර්ම කථාව අසා දීර්ඝ සංසාරික දුක් මෙනෙහි කිරීම් වශයෙන් පීඩාවට-කළකිරීමට පැමිණේ. ඔහු මෙසේ වෙනස්වන ස්කන්ධාදියේ පැවැතීම් වශයෙන් දුක ඇතිවන බව වටහාගනියි. ඔහු සංසාරික පැවැත්ම නිසා දුක ඇතිවන බව වටහාගෙන, භවයෙන් භවයට උපදින ශ්‍රද්ධාව වැඩිදියුණු කරවා, ගිහිගෙන් නික්ම අනගාරී සසුනෙහි පැවිදි වේ. මෙසේ ඔහුගේ සසර පැවැතීම්

වශයෙන් උපදින දුකට, භවයෙන් භවයට යන ශ්‍රද්ධාව ප්‍රත්‍ය වේ. පැවිදි වීමෙන් නොනවතින ඔහු වස් පහක් ගතවීමට පෙර, නිස සමාදන්ව - වත් පිළිවෙත් මැනවින් සම්පූර්ණ කර - උභය ප්‍රාතිමෝක්ෂය මනාව ප්‍රගුණ කර - කළයුතු නොකළයුතු දේ ඉගෙන - රහත්බව දක්වා නිරවුල්ව කමටහන් ගෙන අරණ්‍යයෙහි වැඩවසන්නේ පඨවි ආදී කසිණ කර්ම භාවනාව ආරම්භ කරයි. ඔහුට එම කමටහන් නිසා දුර්වල ප්‍රීතිය උපදියි. එම දුර්වල ප්‍රීතිය නිසා ඔහුට ශ්‍රද්ධාවම මූලික වූ ප්‍රමෝදය - බලවත් ප්‍රීතිය උපදියි. බලවත් ප්‍රීතිය, විඩාව සංසිඳවීමට හේතුවේ. ඉන් ධ්‍යානයේ පූර්වභාග සුවය ඇතිවේ. එය සැප පාදක වූ ධ්‍යාන සමාධියට ප්‍රත්‍ය වේ. මෙම සමාධියෙන් සිතේ යෝග්‍ය බව උපදවා - මෘදු වූ විදර්ශනාවට අවශ්‍ය කටයුතු සම්පාදනය කරයි. මෙලෙස ඔහුගේ පාදක ධ්‍යාන සමාධිය මෘදුවූ විදර්ශනාවට උපකාර වේ. මෘදු වූ විදර්ශනාව නිසා බලවත් විදර්ශනාව ඇතිවේ. බලවත් විදර්ශනාව ආර්ය මාර්ගයටත්, ආර්ය මාර්ගය ඵල විමුක්තියටත්, ඵල විමුක්තිය ප්‍රත්‍යවේක්ෂණ ඤාණයටත් ප්‍රත්‍ය වේ. හේතුවේ. මෙසේ අනුක්‍රමයෙන් පැමිණි වැසිදිය, සාගරය පුරවා සිටියාක් මෙන් රහතන් වහන්සේ විමුක්ති සාගරය පුරවා ගෙන සිටින අවස්ථාව දත යුතුයි.

තෙවැනි සූත්‍රයයි.

12. 3. 4

සිවුවන සූත්‍රයේ **"පාචිසි"** යනු පිවිසීමයි. උන්වහන්සේ තවම නොපිවිසි සේක. **"පිවිසෙන්නෙමි"**යි නික්මුණු බැවින් මෙසේ කියන ලදී. **යම්සේ "ගමට යන්නෙමි"**යි නික්මුණු මිනිසෙක් ඒ ගමට තවම නොපැමිණියත්; **මෙනම් තැනැත්තා කොහිද?**"යි කෙනෙකු ඔහු පිළිබඳව විමසූ විට **"ඔහු ගමට ගියේය"** යනුවෙන් පවසන්නාක් මෙනි. **"අතිසඟො"** යනු එදින තෙරුන්වහන්සේ ඉතා උදෑසනින් නික්මුණු දවසක් විය. ඉතා උදෑසන නික්මුණු භික්ෂූහු බෝධි අංගණය, සිවුරු හඳින-පොරවන තැන යනාදී ස්ථානයක හිඳ, පිඬුපිණිස හැසිරෙන වේලාව එනතෙක් කල්ගෙවති. තෙරුන් වහන්සේ වනාහී **"පිඬු පිණිස හැසිරෙන වේලාව එනතෙක් පිරිවැජියන් සමඟ සාකච්ඡා එකක් හෝ දෙකක් කරන්නෙමි"**යි සිතමින්. **"යනනූනාහං"** යනුවෙන් කල්පනා කළ සේක. **"පරිබ්බාජකානං ආරාමො"** යනු ඒ ආරාමය වනාහී රජගහනුවර දකුණුවාසල් දොර හා වේළුවනය අතර පිහිටියේය.

"ඉධ" යනු මේ සතර වාදයන්හි. "**කිංවාදී කිමකථායී**" යනු කුමක් කියයිද? කුමක් දේශනා කරයිද? යනුයි. මේ පිළිබඳව ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ දර්ශනය කුමක්ද? යනුවෙන් විචාරති. "**ධම්මසභානුධම්මං බ්‍යාකරෙය්‍යාම**" යනු භාග්‍යවත් ගෞතමයන් වහන්සේ විසින් දෙසන ලද යම් කරුණක් වේද එයට ගැලපෙන තව කරුණක් කියන්නෙමු නම් මැනවි. "**සහධම්මිකො වාදානුපාතො**" යනු අන්‍යයන් විසින් කියන ලද කරුණකින්, කරුණු සහිතව ශ්‍රමණ භවත් ගෞතමයන් වාදයෙහි පවතින වැග් ප්‍රහාරයක් පිළිබඳව, අල්ප මාත්‍ර වශයෙන්වත් නුවණැත්තන් විසින් ගැරහිය යුතු කාරණයක් නොවන්නේ කෙසේද? මෙය කියන ලද්දේ "සියලුම ආකාරයෙන් භවත් ගෞතමයන්ගේ ඉගැන්වීමෙහි ගැරහිය යුතු කරුණක් කෙසේ නොවන්නේද?" යන අදහසිනි. "**ඉතිවදං**" යනු "ස්පර්ශය නිසා දුක ඇතිවේ" යනාදී ලෙස දේශනා කරමින් යන අර්ථයි.

"තත්‍ර" යනු ඒ සිවුවාදයන්හිය. "**තෙ වත අඤ්ඤත්‍ර එසසා**" මේ වාදයෙහි ස්පර්ශ ප්‍රත්‍යයයෙන් යනු ප්‍රතිඥාව දක්වන වචනයකි. අනිවාර්ය වූ අවධාරණ වදනකි. යම්හෙයකින්ද ස්පර්ශයෙන් තොරව දුක් අනුභව කිරීමක් නොමැති හෙයිනි. මෙලෙසින්ම මෙකරුණ දතයුතුයි. දුක ඇතිවනුයේ ස්පර්ශ ප්‍රත්‍යයෙනි.

"සාධු සාධු ආනන්ද" යනු මේ සාධුකාරය සැරියුත් තෙරුන්ට දෙන ලද්දකි. භාග්‍යවතුන් වහන්සේ මෙතැනදී ආනන්ද හිමියන් සමග කථා කරති.

"එකමිදාහං" යන මෙහි "ඉධ" යනු නිපාතයකි. "එක් සමයක" යන අර්ථයි. මේ ප්‍රකාශය "සැරියුත් හිමියන්ම පමණක් නොව මමත් රජගහ නුවරට පිවිසියෙමි. හුදෙක් උන්වහන්සේට පමණක් නොව මටද මේ විතර්කය ඇතිවිය. මෙම අන්‍ය තීර්ථකයන් සමඟ වූ සාකච්ඡාව උන්වහන්සේට මෙන්ම මටද පෙර එසේම විය" යන්න දැක්වීමට වදාළ සේක.

"**අච්ඡරියං අබ්භුතං**" යන මේ වචන දෙකම විශ්මය දක්වන වදන්මය. මෙහි වචනාර්ථ වනාහී අසුරක් ගැසීමට සුදුසු වූයේ ආශ්චර්යයකි. (අච්ඡරිය) පෙර නොවූ විරූවක් වීම අද්භූතය. (අබ්භූත) "**එකෙන පදෙන**" යනු "ස්පර්ශ ප්‍රත්‍යයෙන් දුක ඇතිවේ" යන මේ එක පදයෙන්ය. මෙහිදී සියලු වාදයන්හි ප්‍රතික්ෂේප කිරීම හඟවන ලදී. "**එසෙවත්‍ථො**" යනු "ඒ මේ

ස්පර්ශ ප්‍රත්‍යයෙන් ම දුක ඇතිවේ" යන ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මයේ එන අදහසයි. **"තඤ්ඤේවෙත්ථ පටිභාතු"** යනු එයම මෙහිදී වැටහේවා යනුයි.

දැන් තෙරුන්වහන්සේ ජරාමරණාදිය ප්‍රමුඛ වූ ප්‍රතීත්‍ය සමුත්පාද කථාවෙන් එහි අර්ථ ගම්භීරභාවයත්, ගම්භීරප්‍රභාවයත් දක්වමින් **"සචෙ මං හනෙත"** ආදී වශයෙන් යම් මූලික වූ කථාවක් උපන්නාහු ද ඒ කාරණයම ගෙන සසර නැවැත්ම දක්වනුයේ "ඡනනංචෙව" යනාදිය දෙසූහ. සෙසු පදයන්ගේ අර්ථ ඉහත පැවසූ පරිදි දත යුතුයි.

සිවුවන සූත්‍රයයි.

12. 3. 5.

පස්වන සූත්‍රයේ "භූමිජො" යනු ඒ තෙරුන්ගේ නාමයයි. මෙහි ද සෙසු විස්තර මුල් සූත්‍රයේ පැවසූ පරිදි දත යුතුයි. මේ සූත්‍රයේ ඇති විශේෂත්වය නම්; "යම්හෙයකින් මේ සැප-දුක් ආදී ධර්මයෝ හුදෙක් ස්පර්ශය (ගැටීම) හේතුවෙන් ම නූපදිති. කයින් ද කටයුතු කරයි. වචනයෙන් හා මනසින් ද කටයුතු කරයි. තමා විසින් ද අනුන් විසින් ද කළයුතු කටයුතු කරයි. දැන දනම කරයි. නොදැනද කරයි. එනිසා ස්පර්ශ ප්‍රත්‍යයෙන් වෙන් වූ දුකට හේතුවන හේතුප්‍රත්‍ය දක්වීම පිණිස "කායෙ වාභානන්ද! **සති**" යනාදිය දේශනා කළහ. **"කායසඤ්චෙතනා හෙතු"** යන කාය ද්වාරයෙහි උපන් චේතනා හේතුවයි. වාග් ද්වාරයෙහි හා මනෝද්වාරයෙහි උපන් චේතනා හේතු වාග් සඤ්චෙතනා, මනෝ සඤ්චෙතනා නම් වේ. මෙහිද කායද්වාරයෙහි කාමාවචර කුසල හා අකුසල වශයෙන් චේතනා විස්සක් ලැබේ. වචී ද්වාරයෙහි ද එලෙසම වේ. මනෝද්වාරයේ රූප-අරූප චේතනා නවයක් සමග චේතනා 29 කි. ද්වාරත්‍රයේ ම චේතනා සැට නවයකි (69). ඊට හේතු වශයෙන් සුව-දුක් විපාකයෝ දක්වන ලදහ. **"අවිජ්ජා පචචයා ච"** මෙහි වනාහි චේතනාව අවිද්‍යා ප්‍රත්‍යයෙන් වේයැයි දක්වීමට කියන ලදී. යම්සේ මෙලෙස දක්වූ චේතනා භේද ඇති කාය සංස්කාරය ද වාග් සංස්කාරය ද මනෝ සංස්කාරය ද අන්‍යයන්ගේ උත්සාහයක් නොමැතිව තමාම අසංඛාරික සිතින් කරයි. අන්‍යයන් විසින් කරවනු ලබන්නේ සසංඛාරික සිතින් කරයි. "මෙනම් ක්‍රියා කරන්නහුට මෙබඳු විපාක වන්නේයැ"යි මෙසේ කර්මය ද විපාකය ද දැන දැන ද සිදුකරයි. මාපියවරු චෛත්‍ය වැඳීම් ආදිය කරන කල්හි ඒ අනුව වඳින්නා

වූ දරුවන් මෙන් ක්‍රියාව දැන දැනම කළත් "මේ ක්‍රියාවේ විපාකය මෙය" යැයි විපාකය නොදැනත් ක්‍රියා කරයි. එනිසා එය දැක්වීමට "**සාමං වා තං ආනන්ද! කාය සංඛාරා අභිසංඛරොති**" යනාදිය කියන ලදී. "**ඉමෙසු ආනන්ද! ධම්මෙසු**" යනු ආනන්දය! යමෙක් මේ ධර්මයන්හි තමාම හෝ යනුයි. "කාය සංස්කාර" යනාදී සතර තැන්හි කියන ලද දෙසිය සැත්තෑසයක් (276) වූ චේතනා ධර්මයෝ. මේ ධර්මයන්හි අවිද්‍යාව මූලාධාර වූ කෙළවර ඇති - මත්තෙහි වැටුණු ඒ සියල්ල "අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති" යනාදී ලෙස මෙහි ම සංග්‍රහයට පැමිණෙති.

දැන් සසර පැවැත්ම දක්වන සේක් - "**අවිජ්ජායත්වෙව**" යනාදිය දෙසූහ. "**සො කායො න හොති**" යනු යම්බඳු කයක් ඇති කල්හි, කාය සංචේතනා ප්‍රත්‍යය වූ අධ්‍යාත්මික සුව-දුක් උපදියිද එබඳු කයක් නැත. වචනයෙහිත් මනසෙහිත් මෙසේමය. තවද "**කායො**" යනු කාය චේතනාවයි. "වාචා" යනු වාග් චේතනාවයි. "**මනෝ**" යනු මනෝ කර්මයයි. කායද්වාරය යනු කයයි. ශරීරයයි. වාග්-මනෝ ද්වාරයන්හිද මේ ක්‍රමය ම දතයුතුයි. රහතන් වහන්සේ චෛත්‍ය වන්දනා කරති. ධර්ම දේශනා කරති. කමටහන් මෙනෙහි කරති. නමුත් උන්වහන්සේගේ කය කෙතක් නොවනුයේ විපාකයක් නැති බැවිනි. රහතන් වහන්සේ විසින් කරන ලද ක්‍රියාවෝ (කර්ම) කුසල් හෝ අකුසල් නොවේ. විපාක නොමැතිව ම ක්‍රියා මාත්‍රය පමණක් සිටියි. මෙනිසා උන්වහන්සේගේ කය මෙහි "කාය" සංඛ්‍යාවෙහි ලා නොසැලකුනි. "**ඛෙත්තං තං න හොති**" යනාදියේ වැඩීම් අර්ථයෙන් එය කෙතක් නොවේ. පිහිටීම් අර්ථයෙන් එය වස්තුවක් නොවේ. ප්‍රත්‍යාර්ථයෙන් එය ආයතනයක් නොවේ. හේතු අර්ථයෙන් එය අධිකරණයක් නොවේ.

සංචේතනා මූලික වූ අධ්‍යාත්මික සුව-දුක් උපදින්නේ නම් ඒ සංචේතනාව - මේ වැඩීම් ආදියේ අභාවයෙන් ද උන්වහන්සේට සුඛදුක්ඛයන්ගේ කෙතක් නොවේ. වස්තුවක් නොවේ. ආයතනයක් නොවේ. අධිකරණයක් නොවේ.

මෙම සූත්‍රයෙහි වේදනාදී සුව දුක්ම "ඒවායේ විපාකයැ"යි කියන ලදී.

පස්වන සූත්‍රයයි.

12. 3. 6

සයවන උපවාණ සූත්‍රයේ අර්ථ ඉතා ප්‍රකටය. මෙහිදී සසර පැවතුම් දුකම පවසන ලදැයි දතයුතුයි.

සයවන සූත්‍රයයි.

12. 3. 7

සත්වන සූත්‍රයේ - පිළිවෙලින් කියන ලද සූත්‍රයෙහි අවසාන පදය ගෙන **"කතමඤ්ච භික්ඛවෙ! ජරාමරණං"** ආදිය කියන ලදී. **"එවං පච්චයං පජානාති"** යනු මෙසේ දුක්ඛ සත්‍ය වශයෙන් දනියි. ප්‍රත්‍යයන්ගේ හටගැනීම් ආදියද සමුදය සත්‍ය වශයෙන් දතයුතුයි. **"දිට්ඨි සම්පනෙනා"** යනු මාර්ග දෘෂ්ටියෙන් යුක්ත වූ යනුයි. **"දස්සන සම්පනෙනා"** යනු එයට ම තවත් සමාන වදනකි. **"ආගතො ඉමං සද්ධම්මං"** යනු මාර්ග සද්ධර්මයට පැමිණි යනුයි. **"පස්සති"** යනු මාර්ග සද්ධර්මයම බලයි. **"සෙඛෙන ඤාණෙන"** යනු මාර්ග ඤාණයෙන් ම යනුයි. **"සෙඛාය විජ්ජාය"** - මාර්ග විද්‍යාවෙන්ම යනුයි. **"ධම්මසොතං සමාපනෙනා"** යනු මාර්ග සංඛ්‍යාත වූ ධර්ම ශ්‍රෝතයෙන් යුක්ත වූ යනුයි. **"අරියො"** යනු පුහුදුන් භූමිය ඉක්මවූ යනුයි. **"නිබ්බේධික පඤ්ඤා"** යනු තියුණු අවබෝධ-ප්‍රඥාවෙන් යුක්ත වූ යනුයි. **"අමතදවාරං ආහච්ච තිට්ඨති"** යන මෙහි "අමත" යනු නිවණයි. නිවණේ දොරටුව, ආර්ය මාර්ගය හැපී සිටියි යන අර්ථයි.

සත්වන සූත්‍රයයි.

12. 3. 8

අටවන සූත්‍රයේ අර්ථ ඉතා ප්‍රකටය.

අටවන සූත්‍රයයි.

12. 3. 9.

නවවන සූත්‍රයේ - අක්ෂර භාණක භික්ෂූන්ගේ අදහස් වශයෙන් කියන ලදී. එහි **"පරි"** යන උපසර්ගය අත්හැර පවසන විට සම්පූර්ණයෙන්ම අර්ථ දැනගැනීමට හැකිවේ.

නවවන සූත්‍රයයි.

12. 3. 10

දසවන සූත්‍රයේ අර්ථ විස්තර සියල්ල ද ඉහත කී පරිදි දතයුතුය. මේ සූත්‍ර දෙකෙහිදී චතුරාර්ය සත්‍යාවබෝධයට ම දේශනා කරන ලදී.

දසවන සූත්‍රයයි.

තෙවැනි දසබල වර්ගය නිමියේය.

12. 4. 1

කළාරබත්තිය වර්ගයේ පළමු සූත්‍රයෙහි **"අජිත පඤ්හෙ"** යනු අජිත මානවකයා විසින් ඇසූ ප්‍රශ්නයෙහිය.

"සංඛාත ධම්මාසෙ" යනුවෙන් සංඛත ධර්ම ලෙස දනගත් ධර්මය, සමාන කළ ධර්මය, තීරණය කළ ධර්මය, අදහස් කරන ලදී. **"සෙඛ"** යනු සේඛ පුද්ගලයෝ සත් දෙනයි. "පුථූ" යනු එම සත්දෙනා සඳහාම "පුථූ" යැයිද කියන ලදී. "ඉධ" යනු මේ බුද්ධශාසනයෙහිය. **"නිපකො"** යනු නුවණැති බවයි. ඒ ප්‍රඥාවෙන් යුක්ත වූ බැවින් "නිපක" නම් වේ. නුවණැති වූ පණ්ඩිත වූ නුඹවහන්සේ මෙය දේශනා කරන සේක්වා!"යි ඉල්ලයි. "ඉරියං" යනු දිවිපැවැත්මයි. පිළිපැදීමයි. හැසිරීමයි. වාසය කිරීමයි. ප්‍රතිපත්තියයි. "මාරිස" යනුවෙන් භාග්‍යවතුන් වහන්සේට කථාකරයි. සේඛයන්ගේ ද සංඛත ධර්මයන්ගේද රහතන් වහන්සේලාගේ ද ක්‍රියාපිළිවෙල මවිසින් විචාරන ලදී. පණ්ඩිතයාණෙනි! නිදුකාණෙනි! එය මාහට වදාළ මැනවි. මේ මෙහි සංක්ෂිප්ත අර්ථයයි.

"තුණ්හී අහොසි" යනු කුමක් නිසා තෙවැනි වර දක්වාත් ප්‍රශ්න කරන ලදුව නිශ්ශබ්දව සිටියේක් ද? ප්‍රශ්නයෙහි ද නැතිනම් අදහසෙහි සැකකිරීමෙන්ද? අදහස පිළිබඳ සැක කිරීමෙනි. ප්‍රශ්නයේ සැකයක් නොවේ. මෙලෙස උන්වහන්සේට සිතුනි. "ශාස්තෘන් වහන්සේ මාහට සේඛ-අසේඛයන්ගේ පැමිණීම් ප්‍රතිපදාව දේශනා කරනු කැමතිවන සේක. එය ස්කන්ධ, ධාතු, ආයතන, ප්‍රත්‍යාකාර ආදී වශයෙන් බොහෝ කරුණුවලින් පැවසීමට පුළුවන. "ශාස්තෘන් වහන්සේගේ අදහස ගෙන පිළිතුරු දීමට

කෙසේනම් හැකිවන්නෙම් ද?" යනුවෙනි. ඉක්බිති ශාස්තෘන් වහන්සේ මෙසේ සිතූ සේක. "මා හැර පාත්‍රයක ගෙන, හැසිරෙන අන්‍ය ශ්‍රාවකයන් අතරින් ප්‍රඥාවෙන් සැරියුත් තෙරුන්ට සමවන්නෙක් නැත. මම මොහුගෙන් ප්‍රශ්නයක් විමසන ලදුයෙම්, ඔහු තෙවැනිවර දක්වා ප්‍රශ්නයෙහි හා අදහසෙහි දැයි සිතමින් නිශ්ශබ්දව ම සිටින්නේය." ඉක්බිති අදහසෙහි යැයි දැන ප්‍රශ්නයට පිළිතුරු දෙන න්‍යාය දක්වන සේක් **"භූත මිදනති සාරිපුත්ත! පසසසි"** යනුවෙන් දේශනා කළ සේක. එහි "භූතං" යනු උපන්, පහළ වූ ස්කන්ධ ස්කන්ධ පංචකයට යෙදෙන තවත් නාමයකි. මෙසේ ශාස්තෘන් වහන්සේ "සාරිපුත්‍රය! මේ ප්‍රශ්නය පංචස්කන්ධ වශයෙන් විසඳිය යුතුයැ"යි තෙරුන්ට න්‍යාය දැක්වූ සේක. න්‍යාය දැක්වීමත් සමගම තෙරුන් වහන්සේට "වෙරළේ සිටි පුරුෂයාට විවෘතව එකම අංගණයක් ලෙස මහ මුහුදු පෙනෙන්නාක් මෙන්" න්‍යාය සිය දහස් ගණනින් ප්‍රඥෝත්තර දෙක මැනවින් අවබෝධ විය. ඉක්බිති එය පැහැදිලි කරමින් **"භූතමිදං භනෙත"** යනාදිය දෙසූහ. එහි **"භූතමිදං"** යනු මෙහි උපන් ස්කන්ධ පඤ්චකයයි. **"සම්මපපඤ්ඤාය පසසතො"** යනු විදර්ශනා සහිත මාර්ග ප්‍රඥාවෙන් මැනවින් බලන තැනැත්තාට **"පටිපනෙනා හොති"** යනු සීලයේ පටන් අර්හත් මාර්ගය දක්වා කළකිරීම් ආදියේ අර්ථය පිණිස පිළිපන්නේ වේ. **"තදාහාරසමභවං"** යන මෙය කුමක් හෙයින් අරඹන ලද්දේද? මේ ස්කන්ධ පංචකය ආහාරය නිසා සිටියේය. එනිසා එය "ආහාර සම්භව"යැයි දැක්වීමට මෙය ඇරඹූ සේක. මෙසේ මේ අයුරින් සේඛ ප්‍රතිපදාව දේශනා කරන ලදී. **"තදාහාර නිරොධා"** යනු ඒ ආහාරයන්ගේ නැතිවී යාමෙන්. මෙය කුමක් නිසා ඇරඹූ සේක් ද? ඒ පංච ස්කන්ධය, ආහාරය නොමැති වීමෙන්, නිරුද්ධ වේ. එනිසා ඒ "ආහාර නිරොධ සම්භව" යන නම තබා දැක්වීමට මෙය ඇරඹූ සේක. මෙසේ මෙම සූත්‍රයේ දී ද සේඛයාගේ ප්‍රතිපදාවම කියන ලදී. "නිබබිදා" ආදී සියලු වචන තතියා විභක්ති වචනයැයි දතයුතුයි. "අනුපාදා විමුතෙතා" යනු සිවු උපාදානයන්ගෙන් කිසිදු ධර්මයක් නොගෙන මිදීමයි. "සාධු සාධු" යනු මේ තෙරුන් වහන්සේගේ පිළිතුරු දීම නිසා තමන් වහන්සේගේ සතුට ප්‍රකාශ කිරීමයි. තමන්වහන්සේ ද එළෙසින් ම පිළිතුරු දෙන සේක් නැවත "භූතමිදං" යනාදිය දෙසූහ.

පළමු සූත්‍රයයි.

12. 4. 2

දෙවන සූත්‍රයේ **"කළාර බත්තියෝ"** යනු ඒ තෙරුන් වහන්සේගේ නමයි. උන්වහන්සේගේ දත් කලුපාටය. විෂම වූ පිහිටීම් ඇත. එනිසා, "කළාරෝ"යි අමතයි. **"හීනායාවතනතා"** යනු හීනබවට, ගිහිබවට පත්වූ, යහපත නැවතුණු යනුයි. **"න අසසමලත්ථා"** යනු සැනසිල්ලක්, උපකාරයක්, පිහිටක් නොලැබුවේමය. ත්‍රිවිධ මාර්ගය ද ත්‍රිවිධ ඵලයන් ද ඒකාන්තයෙන් නොලැබුවේය යන්න දක්වයි. "ඉදින් ඒ මගඵල ලැබුවේ නම් උන්වහන්සේ ශික්ෂා ප්‍රතික්ෂේප කර, ගිහිබවට නො පැමිණෙන්නේ ය." මේ තෙරුන්ගේ අදහසයි. **"නඛ්වාහං ආවුසො"** යනු "ඇවැත්නි! මම සැනසිල්ලකට පත්වීමි. නොපත්වූයේ යැයි සැක නොකරමි" යන ලෙස තෙරුන් වහන්සේට ශ්‍රාවක පාරමී ඤාණය පිහිටාධාර වේ. එනිසා උන්වහන්සේ සැක නොකරති. **"ආයතිං පනාවුසො"** යනු අනාගත ප්‍රතිසන්ධියයි. නුඹවහන්සේගේ මතු පිළිසිඳ ගැනීම ගලවා දමූයේ ද? නොගැලවූයේ ද?යි යනුවෙන් රහත් බවට පත්වීම විචාරයි. **"නඛ්වාහං ආවුසො! විචිකිච්ඡාමි"** යන මෙයින් තෙරුන් වහන්සේ එහි සැක රහිත බව දක්වයි.

"යෙන භගවා තෙනුපසංකමි" යනු "මේ යහපත් කාරණය භාග්‍යවතුන් වහන්සේට දන්වන්නෙමි"යි සමීපයට පැමිණියේය. **"අඤ්ඤා බ්‍යාකතා"** යනු රහත්බව ප්‍රකාශ කරන ලදී. **"ඛීණා ජාති"** යනුවෙන් තෙරුන් වහන්සේ නොපැවසූහ. මොහු වනාහි තෙරුන්වහන්සේ වෙත සතුටු වූයේ, ප්‍රසන්න වූයේ, මෙසේ පදබ්‍යඤ්ජන ආරෝපණය කර පැවසීය. **"අඤ්ඤතරං භික්ඛුං ආමන්තෙසි"** - එය අසා ශාස්තෘන් වහන්සේ මෙසේ සිතූහ. සැරියුත් තෙරුන් වහන්සේ වනාහී නුවණැත්තාහ. ගැඹුරු ප්‍රඥා ඇතියහ. උන්වහන්සේ කිසිහේතුවක් නිසා මෙසේ පිළිතුරු නොදෙති. මේ ප්‍රශ්නය ඉතා සංක්ෂිප්ත පිළිතුරක් අපේක්ෂිත වූවක් විය යුතුයි. "කැඳවා උන්වහන්සේ ලවාම මේ ප්‍රශ්නය විමසන්නෙමි"යි එක්තරා භික්ෂුවක් ඇමතූ සේක.

"සචෙ තං සාරිපුත්ත!" මෙහි භාග්‍යවතුන් වහන්සේ, "මුන් වහන්සේ තමාගේ ධර්මතාවක් බැවින් රහත්ඵලය නොපවසන්නේය. මේ ප්‍රශ්නය විමසන්නෙමි. එයට පිළිතුරු දෙමින් ම රහත්ඵලය විස්තර කරන්නේය"යි යනුවෙන් සිතා රහත්ඵලය විස්තර කරවීමට ම මෙසේ විචාළ සේක. **"යනිදානාවුසො! ජාති"** යනු "ඇවැත්නි! මේ ජාතිය නම් යම් ප්‍රත්‍යයකින්, ඒ ප්‍රත්‍යයාගේ ගෙවීයාමෙන් ක්ෂය වූ කල්හි ජාති ප්‍රත්‍යයෙහි 'ජාති' නම්

වූ ඵලය ක්ෂීණවූයේ යැයි දන්නා ලදී. මෙහිදී ද සැරියුත් තෙරණුවෝ ප්‍රශ්නය පිළිබඳ සැකයක් නැතිමුත් අදහසෙහි සැක කරයි. උන්වහන්සේට මෙසේ සිතුණි. රහත්ඵලය නම් තණ්හාව ක්ෂය වීමයි. උපාදානය, භවය, ප්‍රත්‍යය යනාදිය ක්ෂය වීමයි. කෙලෙස් ක්ෂය වීමයි. මේ අයුරින් බොහෝ කරුණුවලින් රහත්ඵලය විස්තර කළ හැකිය. කෙසේ පිළිතුරු දුන්විට භාග්‍යවතුන් වහන්සේගේ අදහස ගැනීමට හැකිවේද? මේ අයුරින් පිළිතුරු දුන සිටියත් අදහසෙහි සැක කරන සේක්, ප්‍රශ්නය තබා ම ප්‍රත්‍යාකාර වශයෙන් පිළිතුර විස්තර කළ සේක. ශාස්තෘන් වහන්සේ ද ප්‍රත්‍යාකාර වශයෙන්ම විස්තර කරවනු කැමතිවූ සේක. එනිසා මෙසේ විස්තර කරන තෙරුන්ගේ අදහස ගත් සේක. එකෙණෙහිම තෙරුන් වහන්සේ "මවිසින් ශාස්තෘන් වහන්සේගේ අදහස ගන්නා ලදැ"යි දැනගත් සේක. ඉක්බිති උන්වහන්සේට න්‍යාය සිය දහස් ගණනින් පැන-විසඳුම් මැනවින් වැටහුණු සේක. යම්හෙයකින් භාග්‍යවතුන් වහන්සේ තවත් ප්‍රශ්නයක් විචාරන්නේ ද එනිසා මේ පිළිතුර පිළිබඳව සතුටුවීම නොකළ බව දතයුතුයි.

"**කථං ජානතො පන තෙ**" යන මේ ප්‍රශ්නය කුමක් නිසා ඇරඹූ සේක් ද? සිය විෂයෙහි සිංහනාද ඇතිකරවීම සඳහායි. තෙරුන් වහන්සේ වනාහී උඟුරන් හැරූ ලෙන් දොර හෙවත් සූකරඛත ලෙනේ දී දීඝනඛ නම් පිරිවැජියාට වේදනා පරිග්‍රහ සූත්‍රය දේශනා කරන ලබන භාග්‍යවතුන් වහන්සේට විජිනිපත ගෙන පවන් සළමින් සිටිසේක්, ත්‍රිවිධ වේදනාවන් සලකා බලා ශ්‍රාවක පාරමී ඤාණයෙන් අවබෝධ කළ සේක. එනිසා මෙය උන්වහන්සේට ගෝචර වූ විෂයකි. "මෙම තම විෂයෙහි සිට සිංහනාද කරන්නේය" යන මේ කාරණය සඳහා ශාස්තෘන් වහන්සේ මේ ප්‍රශ්නය විමසූ සේක. "අනිච්චා" යනු තිබී-නැතිවීම් අර්ථයෙන් අනිත්‍යය. "**යදනිච්චං තං දුක්ඛං**" යන මෙහි "කෙසේ වුවත් සැප වේදනාව පැවතීම් වශයෙන් සැපයකි. වෙනස්වීම් වශයෙන් දුකකි. දුක්වේදනාව පැවතීම් වශයෙන් දුකකි. වෙනස්වීම් වශයෙන් සැපයකි. අදුක්ඛමසුඛ වේදනාව දැනීම සුවයකි. නොදැනීම දුකකි." යනාදී ලෙස වෙනස්වීම කෙළවර කරගත් සියල්ල දුක්ඛ" නම් වේ. "විදිතං" යනු මේ වේදනාත්‍රයම "දුක" යැයි දන්නේ ද එහෙයින් මාහට ඒ තණ්හාව නැතැ"යි දක්වයි.

"**සාධු සාධූ**" යන තෙරුන්ගේ වේදනාව බෙදා දැක්වීමෙහි, එම ඥානයෙහි සතුටුවීමයි. තෙරුන්වහන්සේ වේදනා එකකි හෝ දෙකකි, තුනකි, සතරකි ආදී වශයෙන් නොපවසා කියන ලද ක්‍රමයෙන් වේදනා තුනකැයි බෙදා දැක්වීම දැනගත් සේක. එනිසා උන්වහන්සේට, භාග්‍යවතුන්

වහන්සේ සිය සතුට ප්‍රකාශකරන සේක් මෙසේ වදාළහ. "දුක්ඛසම්" මෙහි භාග්‍යවතුන් වහන්සේ මෙම අදහසින් මෙසේ වදාළහ. "සාරිපුත්‍රය! යම්හෙයකින් නුඹ විසින් මේ කාරණයෙන් වේදනා කෙරෙහි තණ්හාව නොවැටහේ යැයි පිළිතුරු දෙන ලද්දේ, ත්‍රිවිධ වේදනාව යැයි බෙදා දක්වන තැනැත්තා විසින් එය අධික ප්‍රමාණයෙන් කරන ලදී. "එය දුක" යැයි විස්තර කරන්නා විසින් එය මැනවින් විස්තර කරන ලද්දේ වේ. යම්කිසි විදීමක් වේ නම් එය දුක්කැයි දැනගත් පමණින් ම වේදනා කෙරෙහි තණ්හාව නොපිහිටයි. "කථං විමොක්ඛා" යනු "කවර විමෝක්ෂයක්ද?" "කවර විමෝක්ෂයකින් නුඹ විසින් රහත්බව ප්‍රකාශ කරන ලදද?. යන අර්ථයි. "අඤ්ඤතත විමොක්ඛා" යනු "ආධ්‍යාත්මික විමෝක්ෂයෙන්" - "ආධ්‍යාත්මික සංස්කාරයන් පරිග්‍රහණය කරගෙන පැමිණි රහත්බව ඇති" යන අර්ථයි.

එහි අධ්‍යාත්මික සුවය සතර වැදෑරුම්ව දතයුතුයි. අධ්‍යාත්මික ධර්මයන්හි අභිනිවේෂණයෙන් අධ්‍යාත්මික ධර්ම නැගී සිටීම, අධ්‍යාත්මික ධර්මයන්හි අභිනිවේෂණයෙන් බාහිර ධර්ම නැගීසිටීම, බාහිර ධර්මයන්හි අභිනිවේෂණයෙන් බාහිර ධර්ම නැගීසිටීම සහ බාහිර ධර්මයන්හි අභිනිවේෂණයෙන් අධ්‍යාත්මික ධර්ම නැගී සිටීම යනුවෙනි. ආධ්‍යාත්මික ධර්ම අභිනිවේෂණය කර බාහිර ධර්මයෝත් බාහිර ධර්ම අභිනිවේෂණය කර අධ්‍යාත්මික ධර්මයෝත් දැකිය යුතුයි. එනිසා ඇතැම් භික්ෂුවක් අධ්‍යාත්මික සංස්කාරයන්හි ප්‍රඥාව බස්වා ඒවා වෙන් වෙන් වශයෙන් දක්වා, බැහැරට බස්වයි. බාහිර වූ ධර්ම මැනවින් පරිග්‍රහණය කර නැවත අධ්‍යාත්මයෙහි බස්වයි. ඔහුට අධ්‍යාත්මික සංස්කාරයන් විමසා බලන කල්හි අර්හත් මාර්ගය නැගී සිටීම වේ. මෙසේ අධ්‍යාත්මික ධර්මයන්හි අභිනිවේෂණයෙන් අධ්‍යාත්මික ධර්ම නැගීසිටීම වේ. කිසිවෙක් අධ්‍යාත්මික සංස්කාරයන්හි ප්‍රඥාව බස්වා, ඒවා වෙන් වෙන් වශයෙන් දක්වා බැහැරට බස්වයි. ඔහුට බාහිර සංස්කාරයන් විමසා බලනවිට අර්හත් මාර්ගය නැගීසිටීම වේ. මෙසේ අධ්‍යාත්මික ධර්මයන්හි අභිනිවේෂණයෙන් බාහිර ධර්මයන්ගේ නැගීසිටීම නම් වේ. ඇතැමෙක් බාහිර සංස්කාර ධර්මයන්හි ප්‍රඥාව බස්වා ඒවා වෙන් වෙන් වශයෙන් දක්වා අධ්‍යාත්මික ධර්මයන්හි බස්වයි. අධ්‍යාත්මික ධර්මයන්ද පරිග්‍රහණය කර, නැවත බාහිර ධර්මයන්හි බස්වයි. ඔහුට බාහිර සංස්කාර ධර්මයන් විමසා බලනවිට අර්හත් මාර්ගය නැගීසිටීම වේ. මෙසේ බාහිර ධර්මයන්හි අභිනිවේෂණයෙන් බාහිර ධර්මයන්ගේ නැගීසිටීම වේ. ඇතැමෙක් බාහිර සංස්කාර ධර්මයන්හි

ප්‍රඥාව බස්වා ඒවා වෙන් වෙන් වශයෙන් දක්වා අධ්‍යාත්මයෙහි බස්වයි. ඔහුට අධ්‍යාත්මික සංස්කාර ධර්මයන් විමසන කල්හි අර්හත් මාර්ගය නැගීසිටීම වේ. මෙසේ බාහිර ධර්මයන්හි අභිනිවේෂණයෙන් අධ්‍යාත්මික ධර්මයන්ගේ නැගීසිටීම වේ. එහි තෙරුන්වහන්සේ අධ්‍යාත්මික සංස්කාරයන් පරිග්‍රහණය කර, ඒවා වෙන් වෙන් වශයෙන් දක්වන කල්හි, "අර්හත් මාර්ගය නැගිට සිටීමෙන් රහත් බවට පත්වූයෙමි"යි දක්වන සේක්,

"අජඤ්ඤතත විමොක්ඛාඛ්වාහං ආවුසො" යනාදිය දෙසූහ.

"සඛ්බූපාදානක්ඛයාති" යනු සියලු සිවුවැදෑරුම් වූ උපාදානයන්ගේ ක්ෂයවීමෙන්ය. "තථා සතො විහරාමි" යනු ඊට අනුගත වූ සිහියකින් යුක්තව වාසය කරමි යනුයි. "යථා සතං විහරන්තං" යනු යම් ආකාර වූ සිහියකින් වෙසෙන මාහටයි. "ආසවා නානුසංවන්ති" යනු ඇසින් රූපයෝ ගලාබසිති. වැගිරෙති. ගලායති. පවතිති. මෙසේ සදොරෙහිම ඹඩ ආරම්මණයන්හි ගලන ස්වභාව ඇති කාමාශ්‍රවාදී ආශ්‍රවයෝ ගලා නොබසිති. නොවැගිරෙති. නොවැඩෙති. යම්සේ මට ආශ්‍රවයෝ නූපදින්නාක් මෙන් යන අර්ථයයි. "අත්තානඤ්ච නාවජානාමි" යනු තමාට ද අවමන් නොකරමි. මෙයින් අවසාන ප්‍රහාණය කියන ලදී. මෙසේ ඇතිකල්හි විශේෂ දැනීම පැහැදුනේ වේ. "සමණෙන" යනු බුද්ධශ්‍රාවකයා විසින්ය. "තෙසාහං න කංඛාමි" යනු ඒ ආශ්‍රව අතර මම කවරක් කාමාශ්‍රව වේ ද කවරක් භවාශ්‍රව වේ ද කවරක් දිට්ඨාශ්‍රව වේ ද කවරක් අවිජ්ජාශ්‍රව වේ ද යනුවෙන් මෙසේ ස්වරූප භේද වශයෙන් ද සිවු ආශ්‍රව වශයෙන් ද මෙසේ ගණනය කිරීම් - කොටස් කිරීම් වශයෙන් සැක නොකරමි යනුයි. "තෙ මෙ පහීනානි ත විචිකිච්ඡාමි" යනු ඒ ආශ්‍රවයෝ මට ප්‍රහීන විය. සැකයක් නූපදවමි. මෙහි භාග්‍යවතුන් වහන්සේ, "සාරිපුත්‍රය! මෙලෙස විස්තර කරන්නා වූ නුඹ විසින් මැනවින් විවරණය කරන ලදී. "ඇවැත්නි, මම ආධ්‍යාත්මික විමෝක්ෂයෙන්....." ආදී වශයෙන් කියනු ලබන නුඹ විසින් අධික ප්‍රපංචයක් කරන ලද"යි දක්වනසේ මෙසේ වදාළහ.

"උට්ඨායාසනා විහාරං පාවිසි" යනු පණවන ලද උතුම් බුද්ධාසනයෙන් නැගිට අමිශ්‍ර වූ ම පිරිස ඇතිව විහාරයේ මහා ගඳකිළිය ඇතුලට වැඩිසේක යනුයි. කුමක් නිසාද? බුදුරජාණන් වහන්සේ වනාහී දේශනාව නිමනොවූ කල්හිම තනිවම අසුනින් නැගිටි සේක්, ගඳකිළියට වැඩම කරනුයේ පුද්ගල ස්තුති කිරීම හෝ ධර්මයට ස්තුති කිරීම අරමුණු

කරගෙනයි. එහි පුද්ගල ස්තුති කිරීම සඳහා පිවිසෙන ශාස්තෘන් වහන්සේ මෙසේ සිතන සේක. "මෙය මවිසින් සංක්ෂිප්තව දක්වන ලදී. උදෙසන ලදී. සවිස්තරව නොබෙදන ලදී. ධර්මය පිළිගන්නා භික්ෂූහු එය ඉගෙන ආනන්ද තෙරුන් වෙත හෝ මහාකච්චාන තෙරුන් වෙත එළඹ ප්‍රශ්න කරති. ඔවුහු මගේ ප්‍රඥාවෙන් සසඳා බලා ඒකාරණය සවිස්තරව දේශනා කරති. අනතුරුව එම ඉගැන්වීම පිළිගන්නා ධර්මකාමී භික්ෂූහු එම සවිස්තර දේශනාව මා වෙත ඉදිරිපත් කරති. එවිට මම ඔවුන්ට "මහණෙනි! ආනන්ද විසින් මැනවින් දේශනා කරන ලදී. කච්චායන විසින් මැනවින් දෙසන ලදී. නුඹලා මෙහි අර්ථ මාගෙන් විමසුවාහු නම් මම ද ඒ අයුරින් ම දේශනා කරන්නෙමි"යි යනුවෙන් ඒ මහතෙරවරු ස්තුතියට භාජනය කරන සේක. මෙය පුද්ගල ස්තුතියයි. මෙසේ ස්තුතිකළ පුද්ගලයන් කෙරෙහි ගෞරව උපදවා භික්ෂූන් වහන්සේලා ඔවුන් වෙත එළඹෙති. ඒ මහතෙරවරු ද තමා වෙත එන එම භික්ෂූන් වහන්සේලා අර්ථයෙහි ද ධර්මයෙහි ද යොදවන්නෝ ය. එසේ යොදන ලද එම තෙරවරු, ත්‍රිශික්ෂාවන් සම්පූර්ණ කර මැනවින් දුක් කෙළවර කරන්නෝය. නැතිනම් බුදුපියාණන් වහන්සේට මෙබඳු සිතක් පහළවන සේක. "මෙසේ මා වැඩම කල කල්හි තමාගේ ආනුභාවය ප්‍රකට කරන්නෝය. ඉක්බිති මම ඔවුන්ට ද එසේම ස්තුති කරන්නෙමි. ඒ මාගේ ස්තුතිය අසා ගෞරව හටගත් භික්ෂූහු, මොහු වෙත අප පැමිණිය යුතුයි. ඔහුගේ වදන් ඇසිය යුතුයි. එම වදන් පිළිගත යුතුයි." යනුවෙන් සිතති. එය උන්වහන්සේලාට බොහෝ කාලයක් හිත-සුව පිණිස පවතින්නේම ය. ධම්මදායාද සූත්‍රයේ මෙන් ධර්මයට ස්තුති කිරීමට පැමිණෙන විටදී බුදුපියාණන් වහන්සේ මෙසේ සිතන සේක. "මා විහාරයට වැඩිකල්හි ආමිස දායාදයට ගරහමින් ධර්ම දායාදයට ස්තුති කරමින් මෙම පිරිස් මැද හිඳ, සැරියුත් තෙරුන් වහන්සේ දහම් දෙසන සේක. මෙසේ අප දෙදෙනා වහන්සේ ම එකම අදහසකින් දෙසන ලද බැවින් මේ සූත්‍ර දේශනාව අග්‍ර වූයේ ද, ගෞරව කළ යුත්තේ ද වන්නේය. පාෂාණමය ඡත්‍රයක් මෙනි." මෙහිදී ආයුෂ්මත් සැරියුත් තෙරුන් වහන්සේ උසස් බවට පත්කර, බැබලීමට පත්කර තබනු කැමතිවූ බුදුපියාණන් වහන්සේ අසුනින් නැගිට ගඳකිළියට වැඩිසේක. මෙබඳු අවස්ථාවලදී භාග්‍යවතුන් වහන්සේ වැඩහුන් අසුනේදී ම අතුරුදහන්ව, චිත්ත ගමනින් විහාරයට වැඩි බව දතයුතුයි. ඉදින් කාය ගමනින් වැඩම කළසේක් නම් සියලු බුදුපිරිස, උන්වහන්සේ පිරිවරා ගෙන වඩිති. එකවරක් බිඳුණු සිත නැවත එම දේශනාවට යොමුකර ගැනීමෙන් දූෂ්‍ය වන්නේයැයි භාග්‍යවතුන් වහන්සේ නොපෙනෙන කයින් චිත්ත ගතියෙන් ම විහාරයට පිවිසි සේක.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ පිවිසි කල්හි, උන්වහන්සේගේ අදහස් අනුව ම සිංහනාද පවත්වනු කැමති ආයුෂ්මත් සැරියුත් තෙරුන් වහන්සේ, බුදුපියාණන් වැඩම කළ නොබෝ වේලාවකින් ම එහිදී භික්ෂූන් වහන්සේ ඇමතූ සේක. "පුබ්බෙ අපපටි සංවිදිතං" යනු මෙනම් දෙය විචාරන්නේ යැයි මුලදී මවිසින් නොදන්නා ලදී. නො දක්නා ලදී යනුයි. "පඨමං පඤ්ඤං" යනු "සාරිපුත්‍රය! ඉදින් කෙසේ දන්නා වූ කෙසේ දක්නා වූ නුඹවහන්සේ විසින් ජාතිය ක්‍ෂය කරන ලදී.....ආදී වශයෙන් රහත්බවට ප්‍රකට කරන ලද්දෙහිද?" යන මේ පළමු පැනයයි. "දක්ඛායිනත්තං" යනු ශාස්තෘන් වහන්සේගේ සිතේ පවතින දෙය දන්නා බවයි. නො ඉක්මන්වන බවයි. පමාවූ බවයි. "පඨමං පඤ්ඤං අනුමොදි" යනු "ඇවැත්නි! සාරිපුත්‍රය! ජාතිය වනාහි කුමක් නිදාන කර ඇද්ද?....." ආදී ලෙස මෙම දෙවන පැනය විමසන සේක් "ඇවැත්නි! ජාතිය යමක් නිදානකොට ඇත්තේද, එය....." යන ලෙස විසඳන ලද පළමු පැනය සතුටින් පිළිගත් සේක. "එතදහොසි" යනු භාග්‍යවතුන් වහන්සේ විසින් සතුටුවූ කල්හිය. න්‍යාය සියදහස් ගණනින් ප්‍රශ්නය එකම මිදුලක් මෙන් ප්‍රකටව වැටහුණු බැවින් මෙසේ සිත්විය. "දිවසං පහං භගවතො එතමත්ථං බ්‍යාකරෙය්‍යං" මගෙන් බුදුපියාණන් වහන්සේ මුළු දවස පුරාම මේ ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මයෙහි අරුත් විමසුවත්, එය එක් එක් පද-ව්‍යඤ්ජනයක් පාසා ගෙන උන්වහන්සේට විස්තර කරන්නෙමි.

"යෙන භගවා තෙනුපසංකමි" යනු මෙසේ උන්වහන්සේට අදහසක් පහළ විය. "මේ යහපත් කරුණු භාග්‍යවතුන් වහන්සේට දන්වන්නෙමි"යි තෙරුන් වහන්සේ මහත් වූ සිංහනාදයක් පවත්වන සේක. මෙසේ සිතා බුදුපියාණන් සමීපයට වැඩම කළහ.

"**සාහි භිකඛු! සාරිපුත්තසස ධම්මධාතු**" යන මෙහි "ධම්මධාතු" යනු ප්‍රත්‍යාකාර වූ සසර නැවැත්ම දැක්වීමට සමත් වූ ශ්‍රාවකයන්ගේ පාරමී ඤාණයයි. ශ්‍රාවකයන්ගේ ශ්‍රාවක පාරමී ඤාණය සර්වඥ ඤාණ ගතියම වේ. යම්සේ අතීත-අනාගත-වර්තමාන ධර්මයෝ සර්වඥ ඤාණයේ ප්‍රකටව පවතිත් ද, එසේම තෙරුන් වහන්සේගේ ශ්‍රාවක පාරමී ඤාණය සියලුම ශ්‍රාවක ඤාණයන්ට අරමුණු වන ධර්ම දනියි.

දෙවන සූත්‍රයයි.

12. 4. 3

තෙවන සූත්‍රයේ "තං සුණාථ" යනු ඒ ඤාණවත්තු දේශනාව අසවු යනුයි. "ඤාණවත්තු" යනු මෙහි ප්‍රඥාව ම ඤාණවත්තුව යැයි දතයුතුයි.

"ජරාමරණෙ 'ඤාණං'" ආදී සතරෙහි පළමුව ශ්‍රවණමය ඤාණය වේ. දෙවැන්න විමසා බලන ඤාණයයි. තෙවැන්න සත්‍යාවබෝධ ඤාණයයි. සිවුවැන්න ප්‍රත්‍යවේක්ෂණ ඤාණයයි. මෙසේ ජරාමරණ ඤාණය සිවුවැදෑරුම් වේ. දෙවැනි වූ ඤාණයත් මෙස් ප්‍රභේදවන බව දතයුතුයි. තෙවැනි ඤාණයෙහි 'විමසා බැලීම' හැර සෙසු කරුණු තුන ඇත. සතරවන ඤාණයෙහි ද එම තුන පමණක් ඇත. ලෝකෝත්තර ධර්මයන්හි 'විමසා බැලීමක්' (සම්මසනයක්) නම් නැත. "ජාතියා ඤාණං" ආදියෙහිද මේ ක්‍රමයමයි.

"ඉමිනා ධම්මෙන" යනු මේ චතුරාර්ය සත්‍ය ධර්මයෙන් හෝ මාර්ග ඤාණ ධර්මයෙන් හෝය. "දිට්ඨෙන" යනාදියෙහි ඤාණ නම් ඇසින් දැකීමෙන්ය. "විදිතෙන" යනු ප්‍රඥාවෙන් දැනීමෙන්ය. "අකාලිකො" යනු කල් නොයවා අවබෝධ කරගත් මොහොතෙහිම විපාක දීමෙන් යනුයි. "පතෙතන" යනු අවබෝධ කිරීමෙන්ය. "පරියොගාළෙහන" යනු හාත්පසින් බැසගත්, ප්‍රඥාවෙන් ඇතුලට පිවිසි යනුයි. "අතීතානාගතෙ නයං නෙති" "යෙ ඛො කෙචි" ආදී වශයෙන් අතීතයෙහි ද අනාගතයෙහි ද නය පමුණුවයි. මෙම සූත්‍රයේ දී ද චතුරාර්ය සත්‍යය ධර්මයෙන් හෝ මාර්ග ඤාණ ධර්මයෙන් හෝ අතීත-අනාගතයන්හි නය පැමිණවීමට හැකිය. චතුරාර්ය සත්‍යය මාර්ග ඤාණයෙන් අවබෝධ කළ කල්හි "පරතො ප්‍රතවේක්ෂණ ඤාණය" නම් වේ. එයින් නය පැමිණවී යැයි දතයුතුයි. "අබභඤඤංසු" යනු විශේෂයෙන් දැනගත්හ. අවබෝධ කරගත්හ. "සෙය්‍යථාපහං එතරහි" යනු යම්සේ මම දැන් චතුරාර්ය සත්‍යය ධර්මය දන්නේ නම් එසේ යනුයි. "අන්වයෙ ඤාණං" යනු අනු + අයෙ - අනුවයන ඤාණයයි. ධර්ම ඤාණයේ අනුගමන කිරීමේ ඤාණයයි. "ප්‍රත්‍යවේක්ෂණ ඤාණය" යන්න ද මෙයට යෙදේ. "ධම්මෙ ඤාණං" යනු මාර්ග ඤාණයයි. මේ සූත්‍රයෙහි රහතන් වහන්සේගේ සේඛ භූමිය කියන ලදී.

තෙවැනි සූත්‍රයයි.

12. 4. 4

සිවුවන සූත්‍රයේ "**සත්ත සත්තරි**" යනු සතක් ද සැත්තෑවක් ද වූ සැත්තෑසතකි. අර්ථ-ව්‍යඤ්ජන භාණක මහතෙරවරු බොහෝ කොට බෙදා දක්වා දේශනා කරනු ලබන විට, අවබෝධ කරගැනීමට සමත්වෙති. එනිසා ඔවුන්ගේ අදහස් වශයෙන් මේ සූත්‍රය දේශනා කරන ලදී. "**ධම්මට්ඨිති ඤාණං**" යනු ප්‍රත්‍යාකාර ඤාණයයි. 'ප්‍රත්‍යාකාර' යනු ධර්මයන්ගේ පැවතීම-සිටීම වන බැවින් "ධම්මට්ඨිති" යැයි කියයි. මෙහි ඤාණය ධර්මස්ථිති ඤාණයයි. මේ සවැදෑරුම් ජරාමරණ ඤාණයටම යෙදෙන තවත් නාමයකි. "**බය ධම්මං**" ක්ෂය වන ස්වභාවයයි. "**වය ධම්මං**" යනු ව්‍යය වන ස්වභාවයයි. "**විරාග ධම්මං**" නො ඇලෙන ස්වභාවයයි. "**නිරොධ ධම්මං**" යනු නිරුද්ධවන ස්වභාවයයි. "**සත්ත සත්තරි**" යනු එක් එක් පදයෙහි සත, සත බැගින් පද එකොළොසෙහි (7x11) සැත්තෑ සතකි. (77) මේ සූත්‍රයෙහි "විදර්ශනාපත්ති විදර්ශනාව" පවසන ලදී.

සිවුවන සූත්‍රයයි.

12. 4. 5.

පස්වන සූත්‍රයේ "**සමුදයො හොති**" යන මෙහිදී ශාස්තෘන් වහන්සේ මෙම සූත්‍ර දේශනාව අවසන් කළ සේක. කවර කරුණකින්ද? දෘෂ්ටිගතිකයාට අවසර දීම පිණිසයි. "ඒ පිරිසෙහි දෝෂාරෝපණ කිරීමෙහි සිත් ඇති දෘෂ්ටිගතිකයෙක් ඇත. ඔහු ප්‍රශ්නයක් අසයි. එවිට මම එය විසඳන්නෙමි"යි ඒ භික්ෂුවට අවසරයක් ලබාදීමට මේ සූත්‍ර දේශනාව අවසන් කළ සේක. "නො කලෙලා පඤ්හා" යනු නුසුදුසු ප්‍රශ්නයකි. මෝඩ ප්‍රශ්නයකි යන අර්ථයි. "ස්වාමීනි! ජරාමරණ කවරේද?".....යනාදී ප්‍රශ්නය මැනවින් අසන ලද්දක් නොවේද? එය මනාව විමසන ලද්දක් වුවත්, - යම්සේ දහසක් අගනා රන් තලියකින් ගෙනැවිත් තැබූ ඉතා රසවත් භෝජනයක් මතට, නෙල්ලි ගෙඩියක් පමණ කුඩා වූ අඟුරු පිඬක් වැටුනහොත් මුලු භෝජනය ම ආහාරයට නුසුදුසු වී ඉවත දැමිය යුතු වන්නේද ඒ අයුරින්ම "ජරා මරණ කවරකුගේද?" යන ප්‍රශ්නය මැනවින් ගැලපුනත්, සඤ්-පුද්ගලවාදී පදය නිසා, අඟුරු පිඬ නිසා රසවත් භෝජනය

ආහාරයට නුසුදුසු වූවාක් මෙන් මුලු ප්‍රශ්නය ම අනුවණ-මෝඩ ප්‍රශ්නයක් බවට පත්විය.

"බ්‍රහ්මචරියවාසො" යනු ආර්ය මාර්ගයේ වාසය කිරීමයි. **"තං ජීවං තං සරීරං"** යනු යමෙකුට මේ දෘෂ්ටිය වේනම් ඔහු "ජීවය වැනසෙනවිට මේ ශරීරය ද වැනැසේ. මේ ශරීරය වැනසෙනවිට ජීවිතය ද වැනසෙයි" යනුවෙන් පිළිගනියි. මෙසේ ගන්නා ලද දෘෂ්ටි ඇත්තා, "සිදේ" - "විනාශ වේ" යැයි ගත් බැවින් "උච්ඡේද දෘෂ්ටි ඇත්තා" නම් වේ. ඉදින් "සංස්කාරයෝම උපදිති. නිරුද්ධවෙති"යි යන අදහස පිළිගත්තේ නම් එය ධර්මයෙහි හැසිරෙන "සම්‍යක් දෘෂ්ටිය" නම් වන්නේය. "ආර්ය මාර්ගය" නම් වන මෙය, සසර පැවැත්මට හේතුව නිරුද්ධ කරමින් - සසර පැවැත්ම විනාශ කරමින් උපදියි. එහිම ඒ සසර පැවැත්ම උච්ඡේද දෘෂ්ටියෙන් ගත් තැනැත්තා, "සත් භාවය ඇති කල්හි ආර්ය මාර්ගය වැඩීමෙන් තොරව නිරුද්ධවන්නේ යැ"යි ආර්ය මාර්ගය වැඩීම නිරර්ථක වේ. එනිසා මෙය පවසන ලදී. "බ්‍රහ්මචරිය (බඹසර) වාසයට මෙය අයත් නොවේ" යනුවෙනි.

දෙවැනි ක්‍රමයෙහි දී **"අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං"** යමෙකුට මේ දෘෂ්ටිය වේනම් ඔහු "ශරීරය මෙහිදීම වැනැසේ. ජීවය වනාහී කුරුළු කුඩුවක් මෙන් පාවී ගොස් සැපයට යන්නේ ය." යනුවෙන් පිළිගනියි. මෙසේ පිළිගත් ඒ අදහස අනුව "මේ ලෝකයෙන් ජීවය නැතිවී පරලොවට ගියේය" යනුවෙන් ගත් බැවින්, "ශාස්වත දෘෂ්ටිය" යන නම යෙදේ.

"විසූකායිතානී" යනාදී සියලු පද මිසදිටු බව හැඟවීමට යෙදූ වදන්ය. ඒ සම්‍යක් දෘෂ්ටිය (යහපත් දැක්ම) පාසාරු කරගෙන යන වී නන්ඩුවක් මෙන් තමාගේ නපුරු හැසිරීමෙන් **"විසූකායිතං"**. සම්‍යක් දෘෂ්ටිය අනුව නොපවතින, එයට විරුද්ධ වශයෙන් පැවතීමෙන් **"විසෙවිත"** නම් වේ. කිසිවිටෙක උච්ඡේද දෘෂ්ටියත්, තව අවස්ථාවක ශාස්වත දෘෂ්ටියත් ගැනීම වශයෙන් විරූප වූ 'එහෙ-මෙහෙ පැනීම' ඇති හෙයින් **"විඵන්දිතං"** යැයි කියයි. **"තාලාවත්‍ථුකතානි"** යනු තල්ගසක් මෙන් මුදුන සිඳී. නැවත නොවැඩෙන අර්ථයෙන් මුදුන සිදි තල්ගසක් මෙන්, "මුල් සහිත තල්ගසක් උදුරා එහි මුදුන්මුල සිඳ නැවත නිබූතැන තැබූ" යන අර්ථයි. "අනභාවකතානි" යනු නැවත නූපදින බවට පමුණුවන ලද යනුයි.

පස්වන සූත්‍රයයි.

12. 4. 6.

සයවන සූත්‍රයේ "ඉති වා භික්ඛවෙ! යො වදෙය්‍ය" යනු ඒ පිරිසේ සිටි දෘෂ්ටිගතිකයා ප්‍රශ්නයක් අසනු කැමැත්තෙන් සිටියි. ඔහු අවිශාරද ස්වභාව ඇති බැවින්, නැගිට බුදුරජාණන් වහන්සේගෙන් එම ප්‍රශ්නය සෑදුව ඇසීමට අසමත් වේ. එනිසා ඔහුගේ අදහස දැන් බුදුපියාණන් වහන්සේ, එම ප්‍රශ්නය තමන් වහන්සේම විචාරා, ඊට තමන් වහන්සේ ම පිළිතුරු දීම මෙසේ ඇරඹූ සේක.

සයවන සූත්‍රයයි.

12. 4. 7.

සත්වන සූත්‍රයේ "න තුම්හා කං" යනු තමාට අයත් වන්නේ නම් "අත්තනිය" නම් වේ. ආත්ම වශයෙන් හෝ තමාගේ වශයෙන් නොපවතින බැවින් "නුඹලාගේ නොවේ"යැයි දෙසූහ. "නාපි අඤ්ඤෙසං" යන්නෙහි අන්‍යයෝ නම් අනිකුත් අයයි. ආත්මය අනුන්ගේ යැයි ගත්විට "අඤ්ඤේසං" නම් වේ. එයද අනුන් අනුව නොපවතී. එනිසා "අනුන්ගේද නොවේ" යැයි දෙසූහ. "පුරාණමිදං භික්ඛවෙ! කම්මං" යන මෙහි පුරාණ කර්මයම පමණක් නොවේ. පුරාණ කර්ම හේතුවෙන් උපන් මේ කය ද ඊට අයත් වේ. එහෙයින් ප්‍රත්‍ය ව්‍යවහාර වශයෙන් මෙසේ කියන ලදී. ප්‍රත්‍යයන්ගෙන් කරන ලද බැවින් "අභිසංඛත" නම් වේ යැයි දතයුතුයි. "අභිසංස්කරණය කිරීම"යැයි මුල් කර්ම ව්‍යවහාර වශයෙන්, මුල්ම ලිංග සමානාත්මතාවය ඇති බැවින් කියන ලදී. "අභිසඤ්චෙතයිතං" යනු "චේතනාව වස්තුකොට ඇති", "චේතනාව මුල්කොට ඇති" යනුවෙන් අර්ථ දතයුතු. "වෙදයිතං" යනු වේදනාවට වස්තුවූයේ යැයි දතයුතුයි.

සත්වන සූත්‍රයයි.

12. 4. 8.

අටවන සූත්‍රයේ "**යඤ්ච භික්ඛවෙ! චෙතෙති**" යනු "යමක් සිතයි. පවතියි" යන අර්ථයි. "**යඤ්ච පකප්පෙති**" යනු යම් කරුණක් කල්පනා කරයි. සිතයි. සිතේ එකරුණ බොහෝ වේලාවක් පවත්වාගනියි. "**යඤ්ච අනුසෙති**" යනු යමක (සිතක) සැඟවී පවතින රාගද්වේෂාදී සිතුවිලි

අත්නොහැර පවතියි. පවත්වන්නේ ද වේ යන අර්ථයයි. මෙහිද "සිතයි" යනුවෙන් තෙහුමික කුශල චේතනාව ගන්නා ලදී. 'කල්පනා කරයි' යනු අටක් වූ ලෝභ සහගත සිත්වල, තණ්හා දෘෂ්ටි විතර්ක ගන්නා ලදී. "අත් නොහැර පවතියි" යන්නෙන් දොළොසක් වූ චේතනාවන්ගෙන් සහජාත ප්‍රත්‍යයේ කෙළවර මෙන් ම උපනිශ්‍රය ප්‍රත්‍යයේ කෙළවර ද සැඟවී පවත්නා සිතුවිලි ගන්නා ලදී. "**ආරම්මණං මෙතං හොති**" යනු මේ චේතනා ආදී ධර්ම හටගත් ප්‍රත්‍යය වේ. ප්‍රත්‍යය යන්නෙන් මෙහිදී "අරමුණ" අදහස් කරන ලදී. "**විඤ්ඤාණස්ස ඨිතියා**" යනු කර්ම විඥානයේ පැවැත්මයි. "ආරම්මණෙ සති" යනු ඒ ප්‍රත්‍යයන්හි අරමුණ ඇතිකල්හිය. "**පතිට්ඨා විඤ්ඤාණස්ස හොති**" යනු ඒ කර්ම විඥානයාගේ පිහිටීම වේ. "**තසමිං පතිට්ඨිතෙ විඤ්ඤාණෙ**" යනු එහි කර්ම විඥානය පිහිටිකල්හිය. "**විරූළෙහ**" යනු කර්මය වේගයෙන් දුවගොස් ප්‍රතිසන්ධිය ගැනීමට සමත් වූ, මූලබීජය හටගත් කල්හි. "**පුනබ්භවාභිනිබ්බත්ති**" යනු පුනර්භවය නම් වූ ඉපදීමයි. "නො වෙ භිකඛවෙ! චෙතෙති" යන මෙයින් තෙහුමික චේතනාවෙන්හි 'නොපවත්නා ක්ෂණය' පවසන ලදී. "**නො ච පකප්පති**" යන මෙයින් තෘෂ්ණා දෘෂ්ටි විතර්කයන්ගේ නොපවත්නා ක්ෂණය පැවසේ. "**අථ චෙ අනුසෙති**" යන මෙයින් තෙහුමික විපාකයන්හි අල්ප වූ ක්‍රියාවන්හි "රූපය" යැයි මෙහි ප්‍රහීන නොවූ කෙළවර ඇති, සැඟවී පවතින රාගාදී සිතුවිලි ගන්නා ලදී. "**ආරම්මණමෙතං හොති**" යනු සැඟවී පවත්නා අනුසයන් පවතින විට කර්ම විඥානයේ උපත, හටගැනීම නොවැලැක්විය හැකිය. එය "අනුසය ජාත" ප්‍රත්‍ය වේ.

"නොවෙ ව චෙතෙති" යනාදියෙහි පළමු පදයෙන් තෙහුමික කුශලාකුශල චේතනාවන් නවතන ලදී. දෙවැනි පදයෙන් අටවැදෑරුම් වූ සිත්හි තෘෂ්ණා දෘෂ්ඨි ආදිය නවතන ලදී. තෙවැනි පදයෙන් කියූ පරිදිම ධර්මයන්හි ප්‍රහීන නොවී පවත්නා අනුසය ධර්මවේ නම්, ඒවා වලකන ලදී. නවතන ලදී. තවද මෙහි නොමුලාබව පිණිස සිතයි. කල්පනා කරයි. අත්නොහැර පවතියි; සිතයි. කල්පනා නොකරයි. අත්නොහැර පවත්වයි; නොසිතයි. කල්පනා නොකරයි. අත්නොහැර පවත්වයි; නො සිතයි. කල්පනා නොකරයි. අත්නොහැර නොපවත්වයි. මේ සතර ක්‍රමය දැනගත යුතුයි. මෙහි පළමු ක්‍රමයෙන් ධර්මය බෙදා දැක්වීම දක්වන ලදී. දෙවැනි ක්‍රමයෙන් "සිතයි" යනු තෙහුමික කුශල චේතනා, සිවුවැදෑරුම් අකුසල චේතනා ගන්නා ලදී. "කල්පනා නොකරයි" යනුවෙන් සිත් අටෙහි තණ්හා දෘෂ්ටිය නවතන ලදී. "අත්නොහැර පවත්වයි" යනුවෙන් තෙහුමික

කුසලයන්හි උපනිශ්‍රය වූ ද සතර අකුසල චේතනාවන්හි පවතින සහජාත වූ ද උපනිශ්‍රය වූ ද අනුසයන් ගන්නා ලදී. තෙවැනි ක්‍රමයෙහි "නොසිතයි" යනු තෙහුමික කුශලාකුශලයෝ නවතන ලදී. "කල්පනා නොකරයි" යනුවෙන් අටක් වූ සිත්හි තණ්හා දෘෂ්ටිය නවතන ලදී "අත්නොහැර පවත්වයි" යනුවෙන් සූත්‍රයේ පැමිණි කරුණ වලක්වා, තෙහුමික කුශලාකුශල, විපාක, ක්‍රියා, රූපාදියෙහි අප්‍රහීන වූ උපනිශ්‍රය ප්‍රත්‍යය ගන්නා ලදී. සතරවන ක්‍රමය පළමු ක්‍රමයට සමාන වේ. "තදපපතිඨිතෙ" යනු එහි නොපිහිටි කල්හිය. "අවිරූළ්හෙ" යනු කර්මය දුවගොස් ප්‍රතිසන්ධිය ඇදගැනීමට සමත් වූ නොහටගන්නා මුල් ඇති කල්හිය. විඤ්ඤාණය නොවැඩුණු කල්හිය. - මෙහිදී කුමක් කියන ලදද? අර්හත් මාර්ගයේ කටයුතු, රහතන් වහන්සේගේ කටයුතු, නවලෝකෝත්තර ධර්මය යනාදියද මෙහි සඳහන් කිරීම සුදුසුය. මෙහිද විඤ්ඤාණයට මෙන්ම මතු පුනර්භවයට ද අතර එක් සන්ධියක් ඇත. වේදනා හා තණ්හා දෙක අතර එක් සන්ධියකි. භව හා ජාති දෙක අතර තවත් සන්ධියකි. මෙසේ සන්ධි තුනකි.

අටවන සූත්‍රයයි.

12. 4. 9.

නවවන සූත්‍රයේ - විඤ්ඤාණ හා නාමරූප දෙක අතර එක් සන්ධියකි. වේදනා හා තණ්හා දෙක අතර එක් සන්ධියකි. භව හා ජාති දෙක අතර එක් සන්ධියකි. මෙසේ සන්ධි තුනකි.

නවවන සූත්‍රයයි.

12. 4. 10

දසවන සූත්‍රයේ - "නති" යනු තණ්හාවයි. ඒ තණ්හාව වනාහී ප්‍රිය රූපාදියෙහි නැමෙන බැවින් 'නති' යැයි කියනු ලැබේ. "අගතිගති හොති" යනු පැමිණීමෙහි "ගමන" (ගති) වේ. කර්මයක් හෝ කර්ම නිමිත්තක් හෝ ගති නිමිත්තක් පැමිණි කල්හි, එළඹ සිටි කල්හි ප්‍රතිසන්ධි වශයෙන් විඤ්ඤාණයට "යෑම" වේ. "ඵුතූපපාතො" යනු මෙසේ විඤ්ඤාණය

ප්‍රතිසන්ධි විඤයට පැමිණි කල්හි, පැමිණි කල්හි "චුති" යන වචනය යෙදේ. එහි ඉපදීම් සංඛ්‍යාත වූ "උපපාතො" (ඉපදීම) යන වචනය යෙදේ. ඒ දෙක එකතු වී මේ "චුතූපපාත" යන වචනය සැකසේ නම් වේ. මෙසේ මෙම සූත්‍රයෙහි තණ්හාවට ද (නතියා) අරමුණෙහි විඤ්ඤාණය පැවතීමට ද (අගතිගතියා) අතර එකම සන්ධියක් කියන ලදී.

දසවන සූත්‍රයයි.

සතරවන කළාරඛත්තිය වර්ගය නිමාවිය.

12. 5. 1.

ගහපති වර්ගයේ පළමු සූත්‍රයෙහි "**යතො**" යනු යම් කලෙකයි. "භයානි වෙරානි" යනු භය, වෛර, චේතනාදියයි. "**සොතාපත්තියංගෙහි**" යනු දෙවැදෑරුම් සෝවාන් අංගයන්ය. යමක් පූර්වභාග සෝවාන්ඵල ප්‍රතිලාභය පිණිස පවතියි. ඒවා සත්පුරුෂ සේවනය, සද්ධර්ම ශ්‍රවණය, නුවණින් මෙනෙහි කිරීම, ධර්මානුධර්ම ප්‍රතිපත්තියම"යැයි පැමිණියේය. ලබන ලද ගුණ ඇතිව සෝවාන් ඵලයට පැමිණ සිටියහුගේ යම් අංගයක් වේනම් එය ද 'සෝතාපන්නයාගේ අංගය' යැයි කියයි. බුදුරදුන් කෙරෙහි අචල ප්‍රසාදයක් ඇත්තවුන්ට මේ තවත් වචනයකි. මෙය මෙම සූත්‍රයේ දී අදහස් කරන ලදී. "අරියෝ" යනු දෝෂ නොමැති බවයි. දෝෂාරෝපණ නොමැති බවයි. "ඤායෝ" යනු හේතුවකින් හටගත් බව දැන යනුයි. යීති ඤාණය ද පටිච්ච සමුප්පාදය ද දැනගත් යනුයි. එහෙයින් කියන ලදී. "ඤායෝ" යනු පටිච්චසමුප්පාදයයි. ආර්ය අෂ්ඨාංගික මාර්ගයට ද "ඤායෝ" යැයි කියයි. "**පඤ්ඤාය**" යනු භවයෙන් භවයට උපන් විදර්ශනා ප්‍රඥාවෙනි. "**සුදිට්ඨා හොති**" යන භවයෙන් භවයට ඉපිද දැකීම් වශයෙන් මැනවින් දක්නා ලදි යනුයි. "**ඛීණ නිරයෝ**" යනු යනාදියෙහි මතු එහි නූපදින බැවින් "මගේ නිරය ක්‍ෂය විය" "ඒ මම ක්‍ෂීණ වූ නිරය ඇත්තෙක්මි." යනුවෙන් දැනීමයි. මේ ක්‍රමය සැමතැන ම දතයුතුයි. "**සොතාපනෙනා**" යනු නිවණට යන මාර්ග ශ්‍රෝතසට (දියපහරට) පැමිණියේ යනුයි. "අවිනිපාත ධමෙමා" යනු දුක් ඇති තැනට නොවැටෙන ස්වභාව ඇති. "නියතො" යනු පළමු මාර්ගය නම් වූ යහපත් නියමිත පිළිවෙලින් නියත වූ යනුයි. "සමෙබාධි පරායණෝ" යනු 'මතු මාර්ගත්‍රය' නමැති

සම්බෝධියයි. "මට පරම වූ උතුම් මාර්ගය ඇත. ඒ මම උතුම් සම්බෝධිය පිණිටකොට ඇත්තෙමි වෙමි" ඒ සම්බෝධිය ඒකාන්තයෙන් විශිෂ්ටාවබෝධය ඇත්තකැයි යන අර්ථයි.

"**පාණාතිපාත පචචයා**" යනු ප්‍රාණඝාතාදී කර්ම හේතුවෙනි. "**භයං වෙරං**" යනු අර්ථ වශයෙන් එකකි. මේ වෛරය දෙපරිද්දකින් වේ. බාහිර හා අධ්‍යාත්මික වශයෙනි. එක් අයෙකු විසින් තව කෙනෙකුගේ පියා මරණ ලදී. ඔහු මෙසේ සිතයි. "මොහු විසින් මගේ පියා මරණ ලදී. මම ද මොහුව මරන්නෙමි"යි තියුණු ආයුධයක් ගෙන හැසිරෙයි. ඔහුගේ අභ්‍යන්තරයේ උපන් මේ වෛර චේතනාව, "බාහිර වෛරය" නම් වේ. යමෙකු වනාහී වෙනත් අයෙකු පිළිබඳව "මොහු මා මැරීමට හැසිරේ. මමම පළමුව මොහුව මරමි"යි චේතනාවක් ඉපිද ක්‍රියා කරයි. මෙය 'ආධ්‍යාත්මික වෛරය' නම් වේ. මේ වෛර දෙකම මෙලොව දීම ඇතිවේ. යම් ඒ නිරයේ උපන් සත්ත්වයකු දක "මොහුට ගසමි"යි දැල්වුණු ගිනිඅඟුරක් ගත් නිරයපාලයාගේ සිතුවිල්ල "සම්පරායික බාහිර වෛර නම් වේ. යම් ඒ නිරයේ උපන් සත්ත්වයාට "මොහු නිර්දෝෂ වූ මාහට ගැසීමට පැමිණේ. මම මොහුට පළමුව පහරදෙමි"යි සිතීම "සම්පරායික අධ්‍යාත්මික වෛර" නම් වේ. මෙහිදී යම් බාහිර වෛරයක් විස්තර කරන ලද්දේද එය, අට්ඨකථාවෙහි (හෙළටුවායෙහි) පුද්ගල වෛරයකැයි කියන ලදී. "**දුකඛ දොමනසසං**" යනු දුක්දොම්නස්ය. මේ දෙකම අර්ථ වශයෙන් සමාන ය. යම්සේ ඉහත පැවසුයේ ද ඒ අයුරින් ම මෙම සෙසු පදයන්හි අර්ථද ගත යුතුය. "මොහු විසින් මගේ බඩු පැහැරගන්නා ලදී." "රහමෙරින් මත් වී මෙනම් දෙය කළේය." ආදී වශයෙන් වෛරයේ උපත දතයුතුයි. "**අවෙචචපපසාදෙන**" යනු නො නැසුණු, නො සෙල්වෙන ශ්‍රද්ධාවෙන්-ප්‍රසාදයෙන් යුක්ත වූ යැයි. "**අරියකනෙතහි**" යනු ඒ පංචශීලයෙනි. ආර්යයන්ට කැමති වූ ප්‍රිය වූ ශීලයයි. අන්‍ය භවයකට ගිය ආර්යයෝ පවා මේ ශීලය අත් නොහරිති. එනිසා 'ආර්යයන්ට ප්‍රියවූ' යනුවෙන් කියති. මෙහි එන සෙසු පදයන් පිළිබඳ යම් විස්තරාර්ථ දැනගනු කැමති නම්, ඒ සියල්ල විශුද්ධි මාර්ගයේ අනුස්සති නිර්දේශය බලා දතයුතුය.

පළමු සූත්‍රයයි.

12. 5. 2

දෙවන සූත්‍රයේ - පළමු සූත්‍රය මෙනි. මෙහි ඇති විශේෂත්වය නම්, මෙම සූත්‍රය භික්ෂූන් වහන්සේ අරමුණු කරගෙන දේශනා කිරීමයි. (පළමු සූත්‍රය අනේපිඬු සිටුහුට දේශිතය.)

දෙවන සූත්‍රයයි.

12. 5. 3.

තෙවන සූත්‍රයේ "**දුකඛස්ස**" යනු සසර පැවැතීම් දුකෙහිය. "සමුදයං" යනු ඛණික සමුදය හා ප්‍රත්‍ය සමුදය යන දෙවැදෑරුම් සමුදයන්ය. ප්‍රත්‍ය සමුදය දකින්නා වූ භික්ෂුව ඛණික සමුදය (ක්ෂණික හටගැනීම) දකියි. ඛණික සමුදය දකින භික්ෂුව ද ප්‍රත්‍ය සමුදය (ප්‍රත්‍ය හටගැනීම) දකියි. අස්තංගම හෙවත් නැතිවීම ද දෙකොටසකි. අත්‍යන්ත අස්තංගමය හා රෝධ අස්තංගමය යනුවෙනි. අත්‍යන්ත අස්තංගමය දකින්නා රෝධ අස්තංගමය දකියි. රෝධ අස්තංගමය දකින්නා අත්‍යන්ත අස්තංගමය දකියි. "දෙසෙසසාමි" යනු "මේ සසර පැවතුම් දුකෙහි ඇතිවීම-නැතිවීම-ඉපදීම යනාදී භේද දේශනා කරන්නෙමි. එය අසව්." යන අර්ථයයි. "පටිච්ච" යනු නිශ්‍රය වශයෙන් මෙන්ම ආරම්මණ වශයෙන් ද හේතුවීමෙන් "**තිණණං සංගති එසෙසා**" යන තුනෙහි එකතුවීමෙන් ස්පර්ශය ඇතිවේ. "අයං දුකඛ සමුදයො" යනු මේ සසර පැවතීම් දුකේ ඉපදීමයි. "**අත්‍ථංගමො**" යනු නැතිවීමයි, බිඳීයෑමයි. මෙසේ සසර පැවතීම් දුක බිඳීගියේය. නැතිවිය. නැවත පිළිසිඳ ගැනීමක් නැත.

තෙවන සූත්‍රයයි.

12. 5. 4

සිවුවන සූත්‍රයේ "**ලොකසස**" යනු සංස්කාර ලෝකයේ. මෙම සූත්‍රයේ ඇති විශේෂත්වය ලෝකයේ ඇතිවීම හා නැතිවීම කථා කිරීමයි.

12. 5. 5.

පස්වන සූත්‍රයේ "ඤාතිකෙ" යනු පරපුරු දෙකෙහි නෑයන්ගේ ගමෙහි යනුයි. "ගිඤ්ඣකාවසථෙ" යනු ගඩොල්වලින් කරන ලද මහා ප්‍රාසාදයේය. "ධම්මපරියායං" යනු ධර්ම පර්යායකි. (දහම් කරුණකි) "**උපසඞ්කමිත්වා**" යනු දේශනාව ඇසෙන තැනකය. "යම් තැනකට පැමිණීමෙන් භාග්‍යවතුන් වහන්සේගේ කටහඬ ඇසීමට හැකිවේද, එතැන සිටියේ" යන අර්ථයයි. ඒ භික්ෂුව වනාහී ගඳකිළිය හෙවත් ගඳකිළි පිරිවෙණ ඇමදීමට පැමිණ, තම ක්‍රියාව අතරමග නවතා, භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසන හඬ අසමින් සිටියේය. "අදදසා" යනු එකල්හි වනාහී භාග්‍යවතුන් වහන්සේ මුලදීම ප්‍රත්‍යාකාරය සිහිකරන සේක්, "මේ ප්‍රත්‍යය හේතුවෙන් මෙය වේ. මේ ප්‍රත්‍යයෙන් මෙය ඇතිවේ" යැයි ආවර්ජනය කරන සේක්, අකනිට්ඨ බඹලොව දක්වා ප්‍රදේශය එක මිදුලක් මෙන් විය. ශාස්තෘන් වහන්සේ සිහිකිරීම අත්හැර වචනයෙන් සජ්ඣායනා කරන සේක්, ගැලපීම් කරන ලද පරිදිම දේශනාව නිමවූ සේක. අනතුරුව "මේ ධර්ම පර්යාය කිසිවකු විසින් හෝ ඇසුවේද?"යි සිහිපත් කර බලන සේක්, ඒ භික්ෂුව දුටු සේක. එනිසා "භාග්‍යවතුන් වහන්සේ විසින් දකින ලදී"යි කියැවිණි. "**අසෙසාසිනො**" යනු "ඇසුවෙහි ද?" නැතිනම් "අසෙසාසි නො" ලෙස ගෙන "අපගේ දෙසුම ඇසුවේද?" යන අරුතයි. "**උගණ්හාහී**" යනාදියෙහි මේ සූත්‍රය අසා, නිශ්ශබ්දව හිඳ ප්‍රගුණ කිරීම 'උගනියි' (උගණ්හාති) නම් වේ. පදයෙන් පදය අර්ථ ගලපා වචනයෙන් වචනය පුරුදු කරනුයේ "පිරිවහයි" (පරියාපුණාති) නම් වේ. මේ දෙකම ප්‍රගුණ කිරීමට ආධාරවනුයේ "දරයි" (ධාරෙති) නම් වේ. "**අත්ථ සඤ්හිතො**" යනු හේතු-කාරණා සහිතය. (අර්ථ සහිතය.) "ආදිබ්‍රහ්මචරියකො" යනු මාර්ග බ්‍රහ්ම චර්යාවට මුල්වී පිහිටන සුලු යනුයි. මෙලෙස මෙම සූත්‍ර තුනෙහිම සසර පැවැත්ම හා සසර නැවැත්ම ඔ (වටටවිවටටමෙව) විස්තර කරන ලදැයි දත යුතුයි.

පස්වන සූත්‍රයයි.

12. 5. 6.

සයවන සූත්‍රයේ "අඤ්ඤතරො" යනු නමින් අප්‍රකට වූ එක්තරා බමුණෙක් අදහස් කරන ලදී.

සයවන සූත්‍රයයි.

12. 5. 7.

සත්වන සූත්‍රයේ "**ජාණුසෙසාණි**" යනු තනතුරු වශයෙන් මෙලෙස තබන ලද නම් ඇත්තෙකි. අසූකෙළක් පමණ ධනය ඇති මහා පුරෝහිතයෙකි.

සත්වන සූත්‍රයයි.

12. 5. 8.

අටවන සූත්‍රයේ "**ලොකායතිකො**" ය නු විතණ්ඩවාදයෙහි පරලොවක් නැතැයි පිළිගත් (භෞතිකවාදී) ඉගැන්වීමෙහි කරන ලද පුහුණුවීම් ඇත්තෙකි. "**ජෙට්ඨමෙතං ලොකායතං**" යනු පළමු ලෝකායත වාදයයි. "ලෝකායත" යනු ලෝකයේම දිගයි. (ලොකසස+ආයතංÕ ලොකායතං) බාල පුහුදුන් ලෝකයේ දික්වූ මහත් වූ ගැඹුරු වූ ළංවූ අල්ප වූ ආශ්‍රව සහිත වූ දෘෂ්ටි ගැනීමයි. "**එකනතං**" යනු එකම ස්වභාවයයි. නිත්‍ය වූ ස්වභාවයම යැයි කියයි. "**පුථුත්තං**" යනු පමු ස්වභාවයෙන් විවිධ ස්වභාවයන්ට පැමිණීමයි. වෙනස්වීම. "දේව මනුෂ්‍යාදී වශයෙන් පළමුව ඉපිද පසුව එම තත්ත්ව නොලබයි" යන උච්ඡේදවාදය පිළිගත් නිසා විමසයි. මෙපරිද්දෙන් මේ සූත්‍රයේ එන "**සබ්බමත්ථි සබ්බ මෙකත්තං**" යන පළමු ප්‍රශ්න දෙක ශාස්වතවාද දෘෂ්ටිය යැයි ගතයුතුය. "**සබ්බං නත්ථි සබ්බං පුථුත්තං**" යන අවසන් ප්‍රශ්න දෙක උච්ඡේදවාද දෘෂ්ටිය යැයි දතයුතුයි.

අටවන සූත්‍රය යි.

12. 5. 9.

නවවන සූත්‍රයේ "**කිං නු ඛො**" යනු සැකසහිත බවේ උපත, ආකාරය දැක්වීමකි. "**සමුදයති**" යනු උපදියි (හටගනියි) යනුයි.

නවවන සූත්‍රය යි.

12. 5. 10.

දසවන සූත්‍රයේ - නය හෙවත් ක්‍රම දෙකකින් එකම කරුණක් කියන ලදී. මෙය මුල් සූත්‍රයේම නානා බවකි. විවිධත්වයකි. සෙසු පද අර්ථාදිය මුල් සූත්‍රයේ මෙන් දතයුතුයි.

පස්වන ගහපති වර්ගය නිමියේය.

12. 6. 1

දුකඛ වර්ගයේ පළමු සූත්‍රයේ "**පරිඤ්ඤංසමානෝ**" යනු පරීක්ෂා කරමින්ය. "**ජරාමරණං**" යනු එකම වූ ජරාමරණ දෙක අනේකවිධය, නානාප්‍රකාර යැයි කියා කුමක් නිසා ගන්නා ලද්දේ ද? එසේ ගත් කල්හි සියලු දුක් අදහස් වන බැවිනි. යම්සේ කෙස් වැටියෙන් අල්ලාගත් කල්හි, ඒ පුරුෂයාම අල්ලාගත් සේ සළකන්නාක් මෙන් ජරාමරණ දෙක ගත් කල්හි සියලු ම දුක ගන්නා ලද්දේ වේ. එනිසා "යම් මේ අනේකවිධ වූ නානාප්‍රකාර වූ දුක් ලෝකයේ උපදින්නේයැ"යි දිය නා සිටි පුරුෂයා දූක්වූවාක් මෙන් සියලු දුක් දක්වා, ඔහුගේ හිසකෙස් වැටියෙන් අල්ලා ගන්නාක් මෙන් ජරාමරණ දෙක ගත් බව දතයුතුයි. "**ජරාමරණ නිරොධ සාරුප්පගාමිණී**" යනු "ජරාමරණ දෙකේ නිරුද්ධ වීමට සමාන ස්වභාවයෙන් නිකෙලෙස් බව පිණිස, පිරිසිදු බව පිණිස, සමානව යන්නා වූ ප්‍රතිපදාව" යන අර්ථයි. "**තථා පටිපන්නෙනා ච හොති**" යම්සේ ඊට අනුකූල වූයේ යැයි කියනු ලැබේද එසේ පිළිපන්නේ වේ. "අනුධම්මචාරී" යනු නිර්වාණ දහමට අනුගත වූ ප්‍රතිපත්ති දහමෙහි හැසිරෙයි. එය සම්පූර්ණ කරයි යන අර්ථයි. "**දුකඛකඛයාය පටිපන්නෙනා**" යනු සීලය මුල් කරගත් ජරාමරණ දුකෙහි නිරුද්ධවීම පිණිස පිළිපන් යනුයි. "**සංඛාර නිරොධාය**" යනු සංස්කාර දුකෙහි නිරෝධය පිණිසය. මෙපමණෙකින් රහත් බව දක්වා දේශනාව සිදුකරන ලදී. දැන් රහත් ඵල ප්‍රත්‍යවේක්ෂණයත්; නිරන්තර වාසයත් දක්වා දේශනාව නැවැත්විය යුතු වුවත් එසේ නොකර "අවිජ්ජාගතෝ...." යනාදී වශයෙන් මෙය කුමක් හෙයින් දක්වන ලද්දේ ද? රහතන් වහන්සේගේ ඉක්මවන ලද සසර පවත්නා දුක දක්වීම් වශයෙනි. තවද නැවත සසර පැවතීම් ආකාරයෙන් ආරම්භ කර, සසර නැවැත්ම දේශනා කරන කල්හි අවබෝධ කරගත හැකි පුද්ගලයෙක් මෙහි ඇත. ඔහුගේ අදහස වශයෙන් මෙය දක්වන ලදැයි දතයුතුයි.

එහි "අවිජ්ජාගතෝ" යනු අවිද්‍යාව පැමිණි, එළඹී, ඊට බැසගත්, අවිද්‍යාවෙන් යුක්ත යනුයි. "පුරිසපුග්ගලෝ" පුරුෂයාම පුද්ගලයා වේ. මේ වචන දෙකින්ම සම්මුති දේශනාව කියවේ. බුදුවරුන්ගේ සම්මුති දේශනාව හා පරමාර්ථ දේශනාව වශයෙන් දේශනා දෙකකි. එහි සත්ත්වයා, මිනිසා, පුරුෂයා, පුද්ගලයා, තිස්ස, නාගයා යනාදී වශයෙන් පවතිනුයේ සම්මුති කථාවයි. ස්කන්ධ, ධාතු, ආයතන වශයෙන් පවතිනුයේ පරමාර්ථ කථාවයි. පරමාර්ථ දේශනාව කිරීමේ දී සම්මුතිය අත්නොහැරම දේශනා කරති. උන්වහන්සේලා සම්මුති දේශනාව කළත් පරමාර්ථ දේශනාව කළත් සත්‍යයම දේශනා කරති. එනිසා මෙය කියන ලදී.

දුවෙ සච්චානි අක්ඛාසි සම්බුදෙධා වදතං වරෝ
සම්මුති පරමත්ථංච තතියං නූප ලබභති
සංකෙත වචනං සච්චං ලොක සම්මුති කාරණා
පරමත්ථ වචනං සච්චං ධම්මාණං භූත ලක්ඛණා

"කියන්නවුන අතරින් උතුම් වූ බුදුරජාණන් වහන්සේ සම්මුති හා පරමාර්ථ වශයෙන් සත්‍ය දෙකක් ම වදාරති. තෙවැනි සත්‍යයක් මෙහි කිසිකලෙක නොලැබේ."

"ලෝක සම්මුතිය නිසා සංකේතාත්මකව භාවිත වචන සත්‍ය වේ. ධර්මයන්ගේ ඇති තතු ප්‍රකාශ කරන හෙයින් පරමාර්ථ වචනය ද සත්‍යය වේ."

"පුඤ්ඤං චෙ සංඛාරා" යනු දහතුනක් වූ චේතනා භේදයෝ ය. කුශල සංස්කාර ධර්මයි. "අභිසංඛරොති" යනු රැස්කරයි. "පුඤ්ඤාපගං හොති විඤ්ඤාණං" යනු කර්ම කුශලයෙන් කර්ම විඤ්ඤාණය යුක්ත වේ. විපාක කුශලයෙන් විපාක විඤ්ඤාණය යුක්ත වේ යනුයි. "අපුඤ්ඤං චෙ සංඛාරා" යනු දොළොසක් වූ චේතනා භේද ඇති අකුශල සංස්කාර රැස්කරයි. "ආනඤ්ජං චෙ සංඛාරා" යනු සිවු චේතනා භේද ඇති අරූපාවචර කුශල සංස්කාරයි. "ආනඤ්ජූපගං හොති විඤ්ඤාණං" අරූපාවචර කර්මයන් ගෙන් කර්ම විඤ්ඤාණය ද අරූපාවචර විපාකයන්ගෙන් විපාක විඤ්ඤාණය ද යුක්ත වූයේ වේ. මෙහිද ත්‍රිවිධ වූ කර්ම රැස්කිරීම් ගන්නා ලද බැවින් දොළොස් ප්‍රත්‍යාකාරය ගන්නා ලද්දේමය. මෙපමණෙකින් සසර පැවැතීම් චක්‍රය දක්වන ලදී. දැන් සසර නැවැත්ම පිළිබඳ චක්‍රය දක්වන සේක් "යතො ඛො භික්ඛවෙ" යනාදිය දෙසූහ.

එහි, "**අවිජජා**" යනු චතුරාර්ය සත්‍යය පිළිබඳ නොදැනීමයි. "**විජජා**" යනු අරහත් මාර්ග ඤාණයයි. මෙහිදී පළමුව ම අවිද්‍යාව ප්‍රහීණ කිරීමෙන් විද්‍යාව උපදියි. යම්සේ සිවුවැදෑරුම් රාත්‍රී ඝන අන්ධකාරය පහන් දැල්වීම මගින් නැතිවේ ද, එලෙසින් ම විද්‍යාව පහළවීමෙන් අවිද්‍යාවේ නැතිවීම-ප්‍රහීණවීම දතයුතුයි. "**නවකිඤ්චි ලොකෙ උපාදියති**" යනු ලොව කිසිදු දහමක් තණ්හාවෙන් අල්ලා නොගනියි. අතනොගායි යනුයි. "**අනුපාදියං න පරිනසසති**" යනු දැඩිව උපාදාන නොකර ගනුයේ තණ්හාවෙන් තැති නොගනියි. බියෙන් තැති නොගනියි. තණ්හාව නැත. බිය නැත යන අර්ථයි. "**පචචතතඤඤුඤඤව**" යනු තමාම ය. තමා ම පිරිණිවේ. අනිකකුගේ ආනුභාවයෙන් නොවේ. "**සො සුඛං චෙ වෙදනං**" යන මෙය කුමක් නිසා ඇරඹුසේක් ද? රහතන් වහන්සේගේ ප්‍රත්‍යවේක්ෂා ඤාණය දක්වා, අනතුරුව නිතර එහි වාසය කිරීම දක්වීමට අරඹන ලදී. "**අනජෙඣසිතා**" යනු තණ්හාවෙහි ගිලී අවසන් කළේ යැයි නොගත් බැවින්. තණ්හාවෙන් නොබැසගත්. අනතුරුව "දුක් වේදනාව කුමක් නිසා කියන ලද ද?" "කිම එහි පිළිගැනීමක් ඇද්ද?" "එසේය, පිළිගැනීමක් ඇත." සැප ආදරයෙන් පිළිගැනීමට - සතුටුවීම ම, දුක පිළිගත්තා නම් වේ. දුකට පැමිණ සැප පැතීම් වශයෙන් සැපයේ ද විපරිණාමය දුකකි. "**කාය පරියනතිකං**" යනු කය සමීපයේ ඇති, කය පිරිසිඳ ඇති, යම්තාක් පඤ්චද්වාරික වූ කය පවතීද ඒ තාක් පවතින පඤ්චද්වාරික වේදනාව යන අර්ථයි. "**ජීවිත පරියනතිකං**" යනු ජීවිතය සමීපයේ ඇති, ජීවිතය පිරිසිඳ ඇති, යම්තාක් දිවි පවතියි ද ඒතාක් පවත්නා, මනෝද්වාරික වූ වේදනාව යන අර්ථයි. එහි පංචද්වාරික වේදනාව පසුව ඉපිද පළමුව නිරුද්ධ වේ. මනෝද්වාරික වේදනාව පළමුව ඉපිද පසුව නිරුද්ධ වේ. එය වනාහී ප්‍රතිසන්ධික්ෂණයෙහි වස්තු රූපයෙහිම පිහිටයි. පංචද්වාරික වශයෙන් පවතින පංචද්වාරයෝ, පළමු වසර විස්සක් පමණ වන කාලයේ ඇලීම්, කිපීම්, මුළාවීම් වශයෙන් අධික ප්‍රමාණයෙන් බලවත් වේ. වසර පනහක් වන කල්හි ඇලීම් ආදිය නැවතුණේ වේ. සැට වයස් පමණ කාලයේ පටන් ඇලීම් ආදිය පිරිහී ගොස් වයස අවුරුදු අසූවක්-අනූවක් වන කල්හි අතිශයින් මඳ වේ. ඉතා දුර්වල වේ. "අපි බොහෝ කලක් එකට හිඳිනෙමු. එකට හොත්තෙමු"යි පැවසුවත් මේ කාලයේ මිනිස්සු "අපි නුඹ නොහඳුනන්නෙමු"යි පවසති. අතිශය බලවත් වූ රූපාදී අරමුණු පවා "නොදකෙමු. නොඇසුණෙමු. සුවඳ-ගඳ නොදනුනෙමු. යහපත් හෝ අයහපත්, තද හෝ මෘදු වශයෙන් කිසිදෙයක් පිළිබඳව නොදන්නෙමු"යි පවසති. මෙසේ වයස්ගත වූ ඔවුන්ගේ පඤ්චද්වාරික වේදනාවෝ බිඳුනේ වේ. මනෝද්වාරික වේදනාවන්-

විඤ්ඤාණයත් පවතින්නේම ය. එය ද අනුපිළිවෙලින් පිරිහී ගොස් මරණාසන්න කාලයේ හදවතේ කෙළවර ඇසුරු කරමින් ම පවතියි. එම වේදනාව පවතිනතාක් කල් සත්ත්වයා ජීවත් වේයැයි පවසයි. යම්දිනෙක මනෝද්වාරික විඤ්ඤාණය නොමැත්තේ ද එවිට සත්ත්වයා "මැරුණේය. ප්‍රාණය නිරුද්ධ වූයේයැ"යි පැවසේ. මෙම අර්ථය ම මෙහිදී වැව පිළිබඳව සළකා බැලීමෙන් මැනවින් අවබෝධ වේ.

යම්සේ පුරුෂයෙක් ජල මාර්ග පහකින් සමන්විත වැවක් සාදන්නේය. පළමුව වැසි වැටුණු කල්හි ජලමාර්ග පහෙන් ජලය පිවිස වැව ඇතුලේ ඇති ආවාට පුරවාලයි. නැවත නැවත වැසි වැටෙන කල්හි ඒ ඒ තැන උතුරා යමින් ජලමාර්ග පිරී ගව්වක් - අඩ යොදුනක් පමණ තැන් ජලයෙන් වැසී පවතියි. ඉක්බිති ජලය පිටකරන දොරවල් හැර දමා කුඹුරු කර්මාන්ත කරනු ලබන කාලයේ ජලය නික්මේ. ශස්‍ය පැසෙන කාලයේ දිය අඩුවී යයි. එවිට "මාළු අල්ලමු"යි කිවයුතු බවට පැමිණේ. හෙවත් ගම්වැසියෝ මාළු ඇල්ලීමට එති. එවිට ද ආවාට කිහිපයක ම දිය ඉතිරිව පවතියි. යම්තාක් කල් එම ආවාටයන්හි දිය පවතී ද ඒතාක් කල් "මහවැවේ දිය ඇත"යි පිළිගැනේ. යම්දිනෙක ඒවාද සිඳී යයි. එවිට "වැවේ ජලය නැත"යි කියනු ලැබේ. මෙසේ මේ සියලු අවස්ථා දනගත යුතුයි.

පළමුව වැසිවැටුණු කල්හි ජලමාර්ග පහෙන් දිය අවුත් වැව ඇතුලේ ආවාට පිරෙන අවස්ථාව මෙන්, පළමු ප්‍රතිසන්ධි ක්ෂණයෙහි මනෝද්වාරික වේදනාව වස්තු රූපයන්හි පිහිටි කාලය දතයුතුයි. නැවත නැවත වැසි වැටෙන කල්හි ජලමාර්ග පහම පිරුණු (කාලය) අවස්ථාව මෙන් පඤ්චද්වාරික විඤ්ඤාණයන්ම පවතින අවස්ථාව දතයුතුයි. වැවේ ගව්වක්-අඩ යොදුනක් පමණ උසට ජලය පැතිර පවතින අවස්ථාව මෙන්, විසිවයස් පමණ වූ තරුණ කාලයේ ඇලීම් ආදී වශයෙන් පසිඳුරන් ප්‍රබල බලවත් තත්ත්වයට පත්වීමේ අවස්ථාව දතයුතුයි. යම්තාක් කල් වැවෙන් දිය පිටතට නොයා වැව පිරී පවතින්නේද ජලය පිරී සිටි ඒ කාලය මෙන් පනස්විය දක්වා වූ කාලය දනගත යුතුයි. ජලමාර්ග විවෘත කර, කෘෂි කර්මාන්තාදිය ඇරඹූ කල්හි ක්‍රමයෙන් දිය පිටවී වැව හිස්වන්නාක් මෙන් වයස අවුරුදු සැටේ සිට ක්‍රමයෙන් ඉන්ද්‍රියයන්ගේ පිරිහී යෑම දතයුතුයි. දිය මාර්ගවල දිය බැසගොස් අල්ප වූ ජලය පවතින අවස්ථාව මෙන්, අසූ-අනූ වියට එළඹි කල්හි පඤ්චද්වාරිකයන්ගේ විඤ්ඤාණයත් දුර්වල වන අවස්ථාව දතයුතුයි. ආවාටයන්හි පමණක් දිය ඉතිරිව පවතින අවස්ථාව

මෙන් හදවතේ අග මනෝද්වාර විඤ්ඤනයත් ඇසුරුකර පවතින අවස්ථාව දතයුතුයි. ආවාටයන්හි ස්වල්ප දිය ඇති කල්හි "වැවේ ජලය ඇත" යනුවෙන් පවසන්නාක් මෙන් යම්තාක් කාලයක් හදවතේ, සිත (මනෝද්වාරික විඤ්ඤනය) පවතිද ඒතාක් සත්ත්වයා ජීවත් වේයැයි කියයි. යම් අවස්ථාවක ආවාටයන්හිද ජලය සිඳීගිය විට "වැවේ දිය නැත"යි කියන්නාක් මෙන් - මනෝද්වාරික විඤ්ඤනය නැතිවූ කල්හි ම "සත්ත්වයා මළේය"යි කියයි. මේ වේදනාව සඳහා "ජීවිතාවසානය දක්වා වේදනාව විඳිමින්" යැයි කියන ලදී.

"කායසස භෙදා" යනු කයෙහි බිඳීයෑමෙනි. **"ජීවිත පරියාදානා උදඛං"** යනු ජීවිතක්ෂයට පත්වීමට පෙරය. **"ඉධෙව"** යනු ප්‍රතිසන්ධි වශයෙන් වෙනත් තැනෙක නොගොස් මෙලොව ම යනුයි. **"සීති භවිස්සනති"** යනු පැවැත්ම-දැඟලීම්-දාහයන් ආදිය නොමැතිව වේදනාවෝ ශීතලවීමයි. වේදනාවන් නොපවත්නා බවට පත්වන්නේය. **"සරීරානි"** යනු ධාතු (පඨවි ආදියෙන් නිර්මිත) ශරීරයන්ය. **"අවසිස්සනති"** යනු ඉතිරි වූයේ වන්නේය යනුයි.

"කුමභාකාර පාකා" යනු කුඹල්කරුගේ බඳුන් සාදන උඳුනෙන්ය. **"පතිවිසෙය්‍ය"** යනු තබන්නේය යනුයි. **"කපලලානි"** යනු මුව වැට සමග ඒකාබද්ධ වූ කුඹල් කබල්ය. **"අවසිසෙසයුං"** යනු (ශේෂවන්නේය.) ඉතිරි වන්නේය යනුයි. **"එවමෙව ඛො"** යනු මෙම සූත්‍රයේ දක්වූ උපමාව සසඳා බැලීමයි. ඇවිලගත්, ගිනියම් වූ කුඹල් උඳුන මෙන් ත්‍රිවිධ භවයන් දැකිය යුතුයි. යෝගාවචරයා යනු කුඹලායි. පැසෙන (පිළිස්සෙන කුඹල් උඳුනෙන් බැහැර කරන දණ්ඩ මෙන් අර්හත් මාර්ග ඤාණය දතයුතුයි. අසංඛත වූ නිර්වාණය බඳුන තැබූ සම වූ බිම්කඩ මෙනි. දණ්ඩෙන් උණුසුම් කළයක් රැගෙන සමවූ භූමිභාගයෙහි තැබූ අවස්ථාව මෙන් අරඹන ලද විදර්ශනා ඇති පුද්ගලයාගේ රූප-අරූප සප්තකයන්, විදර්ශනා කරන්නාට ප්‍රගුණ වූයේ වේ. ඒවා ප්‍රකටව උපස්ථාන කරන කල්හි, තමාට යෝග්‍ය වූ ඍතු ආදිය ලැබ, එක අසුනෙහිම හිඳ විඳසුන් වඩා අග්‍රඵලය වූ රහත්බවට පැමිණ සතර අපායන්ගෙන් සිය ආත්මභාවය ගලවාගෙන, අසංඛත වූ නිර්වාණ නම් තලයෙහි පිහිටි අවස්ථාව දතයුතුයි. රහතන් වහන්සේ රත් වූ කළයක් මෙන් රහත් වූ දිනම පිරිනිවීමට නොයන සේක. සසුන් පිළිවෙතෙහි ගැටෙමින්-යෙදෙමින් වසර පනහක් හෝ හැටක් මෙලොව ජීවත්වී අවසාන චිත්තෝත්පත්තියත් සමඟ ම තමාගේ

යැයි දැඩිව අල්ලාගත් ස්කන්ධයන්ගේ බිඳී-විසිර යෑමෙන් අනුපාදිශේෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවීමට පත්වෙති. ඉක්බිති කුඹල්හළේ ඉතිරිවන "කුඹල් කළ කබල්" මෙන් උපාදාන වශයෙන් නො ගන්නා ලද මේ ශරීරය පමණක්ම මෙහි දමා යයි.

"පජානාති" යනුවෙන් රහතන් වහන්සේගේ පිළිපැදීම්-යෙදීම් වර්ධනය කිරීමට කියන ලදී. "විඤ්ඤාණං පඤ්ඤායෙථ" යනු ප්‍රතිසන්ධි ඇගයූ සේක. "එවමෙවෙතං" යනු ඉදින් මේ ත්‍රිවිධ අභිසංස්කාරයන් නොපවතින විට, ප්‍රතිසන්ධි විඤ්ඤාණයේ නොපැනවීම"යි. ආදී වශයෙන් - මේ අයුරින්ම යනුයි. "එසෙවනෙතා දුක්ඛස්ස" යනු මෙය ම සසර පැවතුම් දුකෙහි කෙළවරයි. මෙය අවසානයයි. මෙයම උතුම් වූ නිර්වාණයයි.

පළමු සූත්‍රය යි.

12. 6. 2.

දෙවන සූත්‍රයේ "උපාදානීයෙසු" යනු තෙභූමික ධර්ම වූ ප්‍රත්‍යයන් කෙරෙහි පවතින උපාදාන සතරෙහිය. "අස්සාදානුපස්සිනෝ" යනු ආශ්වාදය අනුව බලන්නාටයි. "තත්‍ර" යනු ඒ ගිනිකඳෙහිය. "තදාභාරෝ" යනු ඊට ප්‍රත්‍ය වේ. හේතුවේ යනුයි. "තදාපාදානෝ" යනු පෙර පදයට ම සමාන පදයකි. "එවමෙව බො" යන මෙහි ගිනිකඳ මෙන් ත්‍රිවිධ භවයන් දතයුතුය. තෙභූමික සසර පැවැත්ම ඊට සමානය. ගිනිදල්වන පුරුෂයා මෙන් සසර පැවැත්ම ඇසුරු කරගත් බාල පුහුදුන් පුද්ගලයා දතයුතුයි. ආශ්වාදය අනුව බලමින් පුහුදුන් පුද්ගලයා තණ්හාදී ක්ලේශ ධර්ම ඉන්ද්‍රිය සයෙන්ම රැස්කිරීම, ගින්නට වේළුණු තණ-ගොම ආදිය දැමීම මෙනි. තණ-ගොම ආදිය ක්ෂය වූ කල්හි නැවත නැවත ඒවා දැමීමෙන් ගිනිකඳ වැඩෙන්නාක් මෙන් බාල පුහුදුන් පුද්ගලයාගේ කර්ම රැස්කිරීම නිසා ඉපිද-මැරෙමින් භවයෙන් භවයට පවතින සංසාරික වූ දුක ඇතිවේ. හටගනියි. "න කාලෙන කාලං සුකඛානි චෙව තිණානි පකඛිපෙය්‍ය" යන මෙහි කිසියම් යහපත කැමති අයෙක් මෙසේ කියයි. "පින්වතුනි! නැගිට-සොයමින් වියළිතණ-දර ආදිය මිටි වශයෙන් බැඳ, වියළි ගොම ආදිය ද කුඩවලට පුරවාගෙන, මෙසේ ගිනි දල්වනුයේ කුමටද? මෙනිසා නුඹට ඇතිවන යහපතක් තිබේද? මින් ප්‍රයෝජනයක් තිබේද?" "පින්වත! එවැන්නක් නැත. මෙය අපගේ පරපුරින් පැමිණියකි. මෙයින් මට

සිදුවනුයේ අවැඩක්ම ය. කවර යහපතක් ලැබේද? මම මේ ගිනිදැල්වීමෙහිම යෙදී සිටීම නිසා නැමට, කෑමට, නිදාගැනීමට අවසරයක් නොලබමි"යි ගිනිදැල්වන්නා පවසයි. එවිට යහපත කැමැත්තා "පින්වත! එසේනම්, නුඹ මේ නිරර්ථක වූ ගිනිදැල්වීම කුමකට කරන්නේද? එන්න. නුඹ මේ රැස්කර ගෙනා තණ ආදිය මෙහිම දමූ විට ඒවා ඉබේම දැවෙන්නේය. නුඹ මේ ගිනි ඇවිලීම අත්හැර, අසුවල් තැන ඇති සිසිල් දිය පොකුණින් නා, මල් ගඳ විළුවුන් දරාගෙන, සැරසී මැනවින් හැඳ පොරවාගෙන, අඟනා පාවහන් යුවලක් දමාගෙන නගරයට පිවිස, උතුම් පහයකට නැගී, වා කවුළු හැරදමා මහපාර දෙස සන්සුන්ව, සැපයෙන් යුක්තව විමසා බලමින් හිඳින්න. නුඹ එසේ සැපෙන් සිටි කල්හි මේ ගින්නට දමූ තණ ආදී සියලු ද්‍රව්‍ය තමාම දැවී අප්‍රඥප්ති බවට පත්වන්නේය. ක්ෂය වී යන්නේය." ගිනි දැල්වන්නා මේ අවවාදය අනුව කටයුතු කරයි නම්, පහයේ හුන් ඔහුට ගින්න උපාදාන වශයෙන් නොගැනීම නිසා අනියම් බවට (අප්‍රඥප්ති) පත්වන්නේය. මේ කාරණය දැක්වීම සඳහා "න කාලෙන කාලං" යනාදිය පැවසූ සේක.

"එවමෙව ඛො" යනු මෙම සූත්‍රයේ උපමා සන්සන්දනයයි. සතළිසක් පමණ දර ආදියෙන් දැල්වෙන මහ ගිනිකඳ මෙන්, තෙහුමික වූ සසර පැවැත්ම දැකිය යුතුය. ගිනිදැල්වන පුරුෂයා මෙන්, සසර පැවැත්ම ආශ්‍රය කරගත් යෝගාවචරයා ද යහපත කැමති පුරුෂයා මෙන් සම්මා සම්බුදු රජාණන් වහන්සේද, ඒ පුරුෂයා විසින් දුන් අවවාද මෙන් තථාගතයන් වහන්සේ විසින් "මහණ මෙහි එව! තෙහුමික ධර්මයන්හි කළකිරෙව! මේ අයුරින් ක්‍රියාකොට සසර දුකින් මිදෙව!"යි ඔහුට තෙහුමික ධර්මයන්හි කළකිරවන කමටහන් දෙසූ අවස්ථාව ද දතයුතුයි. ඒ ගිනි පිදූ පුරුෂයා එම අවවාද අනුවම ක්‍රියාකර පහයේ සුවසේ සිටි අවස්ථාව මෙන් යෝගාවචරයා සුගතයන් වහන්සේගේ අවවාද පිළිගෙන ශූන්‍යාගාරයට පිවිස, තෙහුමික ධර්මයන්හි විදසුන් වඩා අනුක්‍රමයෙන් සුදුසු වූ ආහාර-පානාදිය ලැබ, එක අසුනකම හිඳ ලැබූ රහත්ඵලය ඇති අවස්ථාව දතයුතුය. ඒ ගිනිපිදූ පුරුෂයා -නා-සුවඳ විලවුන් දරාගෙන පිරිසිදු-අලංකාර වූ කයින්, ඒ පහයේ සිටි අවස්ථාව මෙන් - යෝගාවචරයා, ආර්යමාර්ග නම් පොකුණෙහි මාර්ග ඤාණ නම් දියෙන් මැනවින් නා පිරිසිදු වී කෙලෙස් දූවිලි සෝදාහැර, ලැජ්ජා-බිය නමැති සළුව පොරවාගෙන, ශීලය නම් සුවඳවිළුවුන් තවරාගෙන, රහත්බව නම් ආභරණයන්ගෙන් ආත්මභාවය අලංකාර කරගෙන, විමුක්තිය නම් මල්දම පැළඳගෙන, සෘද්ධිපාද නම් පාවහන්වලට නැගී නිවන නම් පුරයට පිවිස, පහයට

නැගී සතිපට්ඨාන නම් බබළන මහා වීථිය දෙස බලාගෙන, නිර්වාණ අරමුණෙහි ඵල සමාපත්තියට පැමිණ සිටි කාලය හෙවත් අවස්ථාව දතයුතුයි. එහි හුන් පුරුෂයාට තෘෂ්ණාදිය ක්ෂය වී යෑමෙන් "ගිනිකඳ නැත" යන ප්‍රඥප්තියට පැමිණි අවස්ථාව මෙන්, රහතන් වහන්සේ තම ආයුෂ අවසන් වනතෙක් සිට තමාගේ යැයි ගත් ස්කන්ධයන්ගේ බිඳීයෑමෙන්-අනුපාදිශේෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවි උතුමහුගේ සසර පැවැත්ම නම් වූ මහා චක්‍රය සන්සිඳුනේය යැයි දතයුතුයි.

දෙවන සූත්‍රයයි.

12. 6. 3.

තෙවැනි සූත්‍රයේ "සංයොජනියෙසු" යනු දස සංයෝජන ධර්මයන්හිය. "ඣායෙය්‍යාති" යනු දල්වන්නේය යනුයි. "තෙලං ආසිඤ්චෙය්‍ය වට්ටිං' උපහරෙය්‍ය" යනු පහන ආරක්ෂා කරගැනීමට තෙල් බඳුනක් ද මහත් වූ පහන්තිර ද ගෙන සමීපයේ නිතර හිඳ තෙල් සිඳෙනවිට තෙල් දමයි. වැටිය ගෙවීයන විට තව වැටියක් දමයි යනුයි.

සෙසු පදයන්ගේ අර්ථ සමඟ උපමා සන්සන්දනය මුලින් පැවසූ සූත්‍රය සමඟ ගලපා දතයුතුය.

තෙවන සූත්‍රයයි.

12. 6. 4.

සිවුවන සූත්‍රයේ - පළමුව උපමාව පවසා, පසුව අර්ථය දක්වන ලදී. ඉතිරි පද අර්ථ පළමු සූත්‍රයේ මෙනි.

සිවුවන සූත්‍රයයි.

12. 6. 5.

පස්වන සූත්‍රයේ "උඬ්ඩං ඔජං අභිහරන්ති" යනු පඨවි රසය ද ආපෝ රසය ද උඩට ගෙනයයි. ඕජාවෙන් (සාරයෙන්) නැගුණු බැවින්

රියන් සතක් උසැති ගසේ අංකුර අග් හි බිඳු බිඳු මෙන් වී සාරය පිහිටයි. මෙහි උපමා සන්සන්දනය මෙසේය. මහගස මෙන් තේ‍රභූමික සංසාරික පැවැත්ම දතයුතුයි. ගසේ මුල් මෙන් සවැදෑරුම් ආයතන දතයුතුයි. මුල්වලින් සාරය උඩට නැගීමෙන්, සදොරින් ක්‍රියාවන් නැගීමත්; ඕජාවෙන් මනාව වැඩුණු මහගසෙහි පැවතීම මෙන් සත්ත්වයාගේ සංසාරික පැවැත්ම ආශ්‍රිත වූ පුහුදුන් පුද්ගලයා සදොරින් කර්ම රැස්කිරීම නිසා භවයෙන් භවයට යමින් දීර්ඝ සංසාරයේ සැරිසැරීමත් දතයුතුයි. "කුදඳාල පිටකං" යනු උදුල්ලක් ද කුඩයක් ද යනුයි. "ඛණඩා ඛණඩිකං ජිනෙය්‍ය" යනු කුඩා-මහත් වශයෙන් කඩ කරමින් සිදින්නේය යනුයි. මේ දැක් කෙරුණේ උපමා සන්සන්දනය මෙසේ දතයුතුයි.

මෙහි මහා වෘක්ෂය මෙන් සත්ත්වයාගේ සංසාරික වූ තේ‍රභූමික පැවැත්ම දතයුතුයි. ගස සිඳීමට කැමති පුරුෂයා මෙන් යෝගාවචරයා ද උදුල්ල මෙන් ප්‍රඥාව ද කුඩය මෙන් සමාධිය ද ගස සිඳීමට උපකාර වන පොරව මෙන් සිහිනුවණ ද දතයුතුයි. ගසේ මුල සිඳි අවස්ථාව මෙන් යෝගාවචරයා ආර්යයන් වෙතින් කමටහන් ගෙන සිහිකරන අවස්ථාවේ ඇතිවන ප්‍රඥාව දතයුතුයි. කඩකඩව සිඳින කාලය (අවස්ථාව) මෙන් සංක්ෂිප්ත වශයෙන් සිවුමහාභූත සිහිකිරීමේ අවස්ථාව දතයුතුයි. ගස පැලීම මෙන් සතලිස් දෙකක් වූ කොට්ඨාශයන්හි පැතිරවූ මෙනෙහි කිරීම දතයුතුයි. රුක කැබලි කැබලි බවට පත්කරන අවස්ථාව මෙන් උපාදාය රූපයේ මෙන් ම රූපස්කන්ධ ආරම්මණයේ ද විඤ්ඤාණයේ ද යන ලෙස නාමරූප ධර්ම විමසීම දතයුතුයි. මුල් සිඳ දැමීම මෙන් ඒ නාමරූපයන්ගේ ප්‍රත්‍ය පරීක්ෂා කිරීම දතයුතුයි. මුල් සිඳ අව්වේ හා සුළඟේ දමා වේලා, ගින්නේ දවන අවස්ථාව මෙන් අනුපිළිවෙලින් විදසුන් වඩා එක් සුදුසු කමටහනක් ලැබ, එය ප්‍රකටව එළඹ සිටි කල්හි, එක් අසුනක හිඳ ශ්‍රමණ ධර්ම කරන්නාගේ රහත් ඵලයට පත්වීමේ අවස්ථාව දතයුතුයි. හළු කිරීම මෙන් රහත්බවට පත්වූ දිනයේ සිට පිරිනිවන් නොපා සිටින රහතන් වහන්සේගේ ජීවිතාවසානය දක්වා සිටින අවස්ථාව දතයුතුයි. මහ සුළඟෙහි එම හළු පොළා හැරීම, ගඟෙහි පාකර හැරීම මෙන් තමාගේ යැයි උපාදාන කරත් ස්කන්ධ බිඳියෑමෙන් අනුපදිශේෂ වූ නිර්වාණ ධාතුවෙන් පිරිනිවුණු රහතන් වහන්සේගේ, සංසාරික පැවැත්ම-සංසඳීම, නැතිව යෑම දැනගත යුතුය.

පස්වන සූත්‍රය යි.

12. 6. 6.

සයවන සූත්‍රයේ ද පළමුව උපමාව පවසා, පසුව දහම් කරුණ පවසන ලදී. ඉහත සූත්‍රයට වඩා මෙම සූත්‍රයේ ඇති වෙනස වනුයේ එය පමණි.

සයවන සූත්‍රයයි.

12. 6. 7.

සත්වන සූත්‍රයේ "තරුණෝ" යනු මල් හා ඵල හටනොගත් යනුයි. "පලිසඡ්ඡෝය්‍ය" යනු සෝදාහරින්නේය. "පංසුං දදෙය්‍ය" යනු තද-රළු පස් ඉවත්කර මුදු ගොම කුඩු මිශ්‍ර වූ සිනිඳු පස් දමන්නේය. "වුද්ධිං" අභිවෘද්ධියට පැමිණ. ඵලහටගන්නා ගස්වල ඵල ද මල් හටගන්නා ගස්වල මල් ද හටගන්නේය. මෙහි එන උපමා සන්සන්දනය මෙසේය. තරුණ ගස මෙන් තෙහුමික වූ සංසාරික පැවැත්ම දතයුතුයි. ගසට සත්කාර කරන පුරුෂයා මෙන් සංසාරික පැවැත්මෙහි නියැලී සිටින පුහුදුන් පුද්ගලයා දතයුතුයි. මුල් ශුද්ධකිරීම් ආදිය මෙන් තිදොරින් කුසලාකුසල කර්ම රැස්කිරීම දතයුතුයි. ගසේ වර්ධනය මෙම හේතූන් නිසා සිදුවීම මෙන් පුහුදුන් පුද්ගලයා භවයෙන් භවයට යමින් සසර සැරිසැරීම දතයුතුයි. සසර නැවැත්ම, එම ගසේ විනාශය මෙන් දතයුතුයි.

සත්වන සූත්‍රයයි.

12. 6. 8-9

අටවන හා නවවන සූත්‍ර දෙකෙහි අර්ථ ඉතා ප්‍රකටය.

12. 6. 10

දසවන සූත්‍රයේ "කුරුසු විහරති" යනු "කුරු" යන මෙසේ බහුවචන වශයෙන් ලබන ලද ව්‍යවහාර ඇති ජනපදයේ වාසය කරයි. "කම්මාසසදම්මං නාම කුරූනං නිගමෝ" යනු කම්මාස්සදම්ම නම් වූ

කුරු දේශයේ නියම්ගමකි. "එය ගොදුරුගම කරගෙන" යන අර්ථයි. "ආයසමා" යන මෙය ප්‍රිය වදනකි. ගරු වදනකි. "ආනන්දෝ" යනු ඒ ආනන්ද තෙරුන්ගේ නාමයයි. "එකමන්තං නිසීදි" යනු සයක් වූ හිඳීම්-හිඳගැනීම් දෝෂයන්ගෙන් තොරව, දකුණු දණමඩලට (බුදුරදුන්ගේ) අභිමුඛ වූ තැන්හි, සවණක් සන බුද්ධරශ්මීන්ගේ ඇතුලට පිවිස, ප්‍රසන්න වූ ලාක්ෂා රසයකට බැසගන්නාක් මෙන් ද රන්පැහැ වස්ත්‍රයක් පොරවා ගන්නාක් මෙන් ද රතු උපුල් වියනක් මැදට පිවිසෙන්නාක් මෙන් ද ධර්ම භාණ්ඩාගාරික ආයුෂ්මත් ආනන්ද තෙරුන් වහන්සේ හිඳගත්හ. එනිසා " එකත්පසෙක සිටියේය"යි කියන ලදී.

කුමන වේලාවක කවර කරුණකින් මේ තෙරුන් වහන්සේ, භාග්‍යවත් බුදුපියාණන් වහන්සේ වෙත එළඹි සේක්ද? සවස් වේලාවෙහි ප්‍රත්‍යයන්ගේ ආකාර දක්වෙන ප්‍රශ්නයක් විමසීම සඳහායි. එදින අනඳ තෙරණුවෝ කුල සංග්‍රහය පිණිස, ගෙදරක් ගෙදරක් පාසා දහසක් බඩුපොදි බහා තබන්නාක් මෙන් කම්මාස්සදම්ම නියම්ගමෙහි ගෙපිළිවෙලින් පිඬු පිණිස හැසිර, සවස් යාමයේ පිණ්ඩපාතයෙන් වැළකුණු සේක. ශාස්තෘන් වහන්සේට වත් දක්වා, ශාස්තෘන් වහන්සේ ගඳකිළියට වැඩම කළ කල්හි උන්වහන්සේට වැඳ, තමා දහවල ගතකරන තැනට ගොස් අන්තේවාසිකයන්ට වත් දක්වා, නික්මුණු කල්හි දවල් වසන තැන හැමද සම්කඩ පනවා දියබඳුනින් දියගෙන, අත්පා සිතල කරගෙන පලඟකට නැගී හුන් සේක. එසේ හිඳිමින් සෝවාන් ඵල සමවතට සමවැද අනතුරුව පිරිසිඳ දක්වූ කාල වශයෙන් සමවතින් නැගිට, ප්‍රතීත්‍ය සමුපපාදයෙහි සිත පිහිටවූ සේක. උන්වහන්සේ අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාර ඇතිවේ යනාදී ලෙස මුල සිට අගටත්, අග සිට මුලටත් උභයාන්තයේ සිට මැදටත්, මැදසිට අන්ත දෙකටත් වශයෙන් තෙවරක් ම දොළොස් පදයක් ඇති ප්‍රතීත්‍ය සමුප්පාදය සිහිපත් කළ සේක. මෙසේ සිහිපත් කරන උන්වහන්සේට ප්‍රතීත්‍ය සමුප්පාද ධර්මය මැනවින් ප්‍රකටවූ සේක. උඩුකුරු කළ කුන්තායුධයක් මෙනි. ඉක්බිති උන්වහන්සේට මෙසේ වැටහුනි. "මේ ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මය සියලු බුදුවරුන් විසින් "ඉතා ගැඹුරුය. අවබෝධ කරගැනීම අපහසුය. දුරවබෝධය"යැයි වදාරන ලදහ. අල්ප වූ දැනීම් ඇති ශ්‍රාවකයකු වූ මාහට මෙය උඩුකුරු වී අතිශය ප්‍රකටව වැටහුනේය. මෙසේ උඩුකුරුව මැනවින් වැටහෙනුයේ මාහට පමණක්ද? අන්‍යයන්ට නොවැටහේද?"යි සිතා තමාට වැටහුණු මෙම කාරණය ශාස්තෘන් වහන්සේට දන්වන්නෙමි යි හුනස්නින් නැගිට, සම්කඩ ගසාදමා, එයත්

රැගෙන සවස් වේලෙහි භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹි සේක. එනිසා කියන ලදී. "සවස් වේලෙහි ප්‍රතීත්‍ය සමුත්පාදය පිළිබඳව ප්‍රශ්නයක් විමසා දැනගැනීමට බුදුරදුන්ගේ සමීපයට වැඩි සේක" යනුවෙන්.

"යාව ගම්භීරෝ" යනු "යාව" ශබ්දය ප්‍රමාණය අතික්‍රමණය කරයි. ඉක්මවා සිටියි. ප්‍රමාණය ඉක්මවූ ගැඹුරු - අතිශය ගැඹුරු යන අර්ථයි. "ගම්භීරාවභාසෝ" යනු ගැඹුරුවූයේ ම බබලයි. දක්නට ලැබෙයි යන අර්ථයි. එය වනාහී ප්‍රකට වූයේ නමුත් ගැඹුරු ආකාරයෙන් වැටහේ.[1] මේ එක් ක්‍රමයකි. කුණු වූ කොළවල රස, කසට ආදියෙන් කළඵාට වූ පල් වූ වතුරක් මෙන් දණක් පමණ උස ඇත්තේ වුවත් එම වතුරට එබී බැලූවහුට මිනිසුන් සියයකගේ පමණ උස ඇති (ගැඹුරු වූ) ජලාශයක් මෙන් වැටහේ.[1] තව ක්‍රමයක් මැණික් මෙන් ආලෝකවත් වූ ඉතා ප්‍රසන්න ජලාශයක දිය මෙන් ගැඹුරු වූයේ නමුත් ප්‍රකටවූ බැබලීම් ඇත.[2] එම ජලාශය වනාහී මිනිසුන් සියයකගේ පමණට ගැඹුරු වුවත්, දණහිස පොවන දියකඩක් මෙන් වැටහේ. තවත් ජලයේ ක්‍රමයක් නම් ප්‍රකට වූයේ අතිශය ප්‍රකට වූයේම වේ.[3] භාජනයකට දැමූ දිය මෙනි. තව ජලයේ ක්‍රමයක් නම් ගැඹුරු වූයේ අතිශය ගැඹුරුව දක්නට ලැබේ. වැටහේ.[4] මහමෙර පාමුල ඇති මහා සමුද්‍රයේ දිය මෙනි. මෙසේ එකම ජලයම සතර වැදෑරුම්ව දක්නට ලැබෙයි. මෙවැන්නක් ප්‍රතීත්‍ය සමුත්පාදයේ නම් නැත. එය වනාහී ගැඹුරුවූයේ ම අතිශය ගැඹුරුවූයේ ම දක්නට ලැබේ. එනිසා එකම නමක් ලබයි. මෙසේ සමාන වුවත් "අථ ච පන මෙ උත්තානා කුත්තානකොා විය භායති" මට ඉතා ප්‍රකට වූවක් මෙන් වැටහේ. එය මෙහි "අචම්භරියං භන්තෙ! අබ්භුතං භන්තෙ!" යනුවෙන් තම විස්මය-පුදුමය ප්‍රකාශ කරන සේක්, තමන්ගේ ප්‍රශ්නය විමසා නිහඬ වූහ.

භාග්‍යවතුන් වහන්සේ අනඳ හිමියන්ගේ වදන් අසා 'ආනන්ද, අකනිට්ඨ බඹලොව අල්ලාගැනීමට අතදිගු කරන්නාක් මෙන් ද මහමෙර බිඳදමා එහි මදය බැහැර කරගැනීමට උත්සාහ කරන්නාක් මෙන් ද නැවක් නොමැතිව මහමුහුද තරණය කිරීමට සිතන්නාක් මෙන් ද පොළව පෙරළා පෘථිවි රසය ගැනීමට වෑයම් කරන්නාක් මෙන් ද බුදුවරුන්ට ම විෂය වූ ප්‍රශ්නයක් "තමාට මැනවින් ප්‍රකට වී"යැයි පවසයි. මොහුට මෙහි ගැඹුරු බව පෙන්වා දෙමි"යි සිතා, "ආනන්දය, එසෙ නොකියන්න"යනාදිය දෙසූහ.

1. උත්තානමෙව ගම්භීරාවභාසංහොති.
2. ගම්භීරං උත්තානාවභාසං හොති
3. උත්තානං උත්තානාවභාසං හොති
4. ගම්භීරං ගම්භීරාවභාසං හොති

එහි "මාහෙවං" යන තැන්හි "හ" කාරය නිපාතයකි. "මෙසේ නොපවසන්න" යන අර්ථයයි. මෙහි භාග්‍යවතුන් වහන්සේ, "එසේ නොකියන්න" යනුවෙන් ආයුෂ්මත් ආනන්ද තෙරුන් උත්සාහවත් කරමින් ද නින්දා කරමින් ද වදාරන සේක. මෙම සූත්‍රයේ දී වදාරන ලද්දේ තෙරුන් උත්සාහවත් කිරීම සඳහායි. "ආනන්දය, නුඹ මහා පඬිවරයෙකි. විෂද වූ ඥාණ ඇත්තෙකි. එනිසා නුඹට ගැඹුරු වූ ප්‍රතීත්‍ය සමුත්පාදය ඉතා ප්‍රකටව වැටහේ. අන්‍යයන්ට ද එසේ ප්‍රකටව වැටහෙන්නේ යැයි නො සැළකිය යුතුයි. එය ගැඹුරුය. අතිශය ගැඹුරු වූ දැකීම් ඇත්තකි. ඒ සඳහා මේ උපමා සතර කියනු ලැබේ. සමසක් ඉතා රජ බොජුන් වළඳා පෝෂිත ශරීරයක් ඇති, කරන ලද නිසි පුහුණුවීම් ඇති මහාමල්ලවපොරකාරයකු උත්සව සමයේ දී කරන ලද මල්ලවපොර බැඳීමකට යුද්ධබිමට යන්නේ, අතරමගදී තවත් එවැනිම මල්ලව පොරකාරයකු දැමූ ගලක් දකින්නේය. ඔහු "මේ කුමක්ද?"යි ඇසූවිට අවට සිටි මිනිස්සු "මල්ලවයකු දැමූ ගලකි"යි පවසති. ඔහු "එය ඉවත් කරවු"යි සෙස්සන්ට කී කල්හි, "එය එසවීමට නොහැක"යි ඔවුහු පවසති. එවිට මල්ලවයා තමාම ගොස් "මේ ගලේ බරක් කොයින්ද?"යි දෙඅතින් එය ඔසවා ක්‍රීඩා බෝලයක් මෙන් කරකවා ඈතට විසිකර යන්නේය. එහිදී මල්ලවයාට මල්ලව පාෂාණය සැහැල්ලු දෙයක් විය. එනමුත් සෙසු මිනිසුන්ට එය "සැහැල්ලු දෙයකි"යි නොකිව යුතුයි. සමසක් ඉතා පෝෂ්‍යදායී රස අහරින් පෝෂිත වූ මල්ලවයා මෙන්, කල්ප සියදහස් ගණනක් පාරමීදම් පුරා සම්පූර්ණ කරගත් ප්‍රාර්ථනා ඇති මේ ආනන්ද තෙරුන් දතයුතුයි. ඒ තෙරුන් වහන්සේගේ මහා ප්‍රඥාවන්ත බව නිසා ප්‍රතීත්‍ය සමුත්පාදය මැනවින් ප්‍රකට වූයේ මල්ලවයාගේ මහා බලය නිසා මල්ලව පාෂාණය සැහැල්ලු වූවාක් මෙනි. වෙනත් අයෙකුට ප්‍රතීත්‍ය සමුත්පාදය වහා ප්‍රකට වේයැයි නොකිව යුතුයි. මහ මුහුදෙහි මහා මත්ස්‍යයෝ සත්දෙනෙක් වෙති. තිමිර නැමැති මහා මත්ස්‍යයා යොදුන් දෙසියක් විශාලය. තිමිංගල මත්ස්‍යයා යොදුන් තුන්සියක් විශාලය. තිමිර පිංගල නම් මහා මත්ස්‍යයාගේ විශාලත්වය යොදුන් පන්සියකි. ආනන්ද, තිමිඳ, අජ්ඣාරෝහ සහ මහාතිමි යන මේ සිවු මත්ස්‍යයන්ගේ විශාලත්වය යොදුන් දහසකි. මෙහි තිමිර පිංගල මත්ස්‍යයාම (ඔහු පමණක්ම) සළකා බලනු ලැබේ. එම මත්ස්‍යයාගේ දකුණු කණ සෙලවූ විට යොදුන් පන්සීයක් පමණ ප්‍රදේශයේ දිය සෙලවේ. වම්කණ සෙලවූ විටද එසේමය. වලිගය ද හිස ද සෙලවූ විට එපරිද්දෙන් ම යොදුන් පන්සීයක් පමණ ප්‍රදේශයේ දිය සෙලවේ. දෙකන් සොළවා වලිගය දෙපසට වනා පහර දී, හිස දෙපැත්තට වනා ක්‍රීඩා කිරීමට ඇරඹූ කල්හි යොදුන් හත-අටක් පමණ තැන්හි ජලය,

භාජනයක දමා ලිපේ තැබූ චතුරක් මෙන කැකෑරේ. පැසෙයි. යොදුන් සීයක් පමණ ශරීරයේ තැන් ජලයෙන් නොවැසී පවතියි. එනිසා මේ මහා මත්ස්‍යයා මෙලෙස කියයි. "මේ මහමුහුද ගැඹුරුය. අතිශය ගැඹුරු යැයි පවසති. කවර ගැඹුරක්ද? මාගේ පිට තෙමාගැනීමට තරම් වූ දියක්වත් මෙහි නැත" යනුවෙනි. මහමුහුදේ මහා කයකින් යුක්ත වූ තිමිර පිංගලයාට මහමුහුද නොගැඹුරු, ඉතා ප්‍රකට වූවක් වුවත් අන්‍ය කුඩා මත්ස්‍යයන්ට එය නොගැඹුරු වන්නේයැයි නොකිව යුතුයි. මෙලෙසින් ම මහා ඤාණයෙන් යුක්ත වූ තෙරුන් වහන්සේට ප්‍රතීත්‍ය සමුත්පාදය මැනවින් ප්‍රකට වුවත්, අන්‍යයන්ට ද එසේ ප්‍රකටවන්නේ යැයි නොකිව යුතුයි. ගුරු රජා යොදුන් එකසිය පනහක් පමණ විශාලය. උගේ දකුණු පියාපත යොදුන් පනහක් පමණ විශාල වේ. වම් පියාපත ද එලෙසමය. පිල් කළඹ සැට යොදුනක් පමණ දිගුවේ. බෙල්ල යොදුන් තුනක් විශාලය. මුඛය යොදුන් නවයක් විශාලය. පාදයන්ගේ විශාලත්වය යොදුන් දොළසකි. ගුරුළු සුළඟ (සුවණ්ණ වාතං), ක්‍රීඩාව දක්වීමට ඇරඹූ කල්හි ගුරුළාට යොදුන් හත්අට සීයක් පමණ වූ අහස ප්‍රමාණවත් නොවේ. එවිට ඔහු මෙසේ කියයි. "මේ අහස අනන්තය. අප්‍රමාණයැයි ඇතැම්හු කියති. අනන්ත බවක් කොහිද? මගේ පියාපත් හොඳින් දිගහැර නිදහසේ ඉගිලයෑම් පමණ වූ අවසරයක් වත් නොලබමි"යි යනුවෙනි. මෙහිදී මහා කයකින් යුතු වූ බැවින් ගුරුළු රජුට ආකාශය කුඩා වියැයි ද එනිසා ම සෙසු කුඩා පක්ෂීන්ට ද අහස ඉතා කුඩා වූවකැයි නො පැවසිය යුතුයි. මේ ආකාරයෙන් ම මහා ප්‍රඥාවෙන් යුක්ත ව ආනන්ද තෙරුන් වහන්සේට ප්‍රතීත්‍ය සමුත්පාදය ප්‍රකටව වැටහුනත් අන්‍යයන්ට ප්‍රකටව වැටහෙන්නේ යැයි නොකිව යුතුයි. රාහු අසුරේන්ද්‍රයාගේ පයේ පටන් හිසකෙස් අග දක්වා යොදුන් හාරදහස් අටසීයක් විශාල වේ. ඔහුගේ බාහු දෙක අතර දිග යොදුන් එක්දහස් දෙසීයකි. මහත යොදුන් හයසීයකි. අත්-පා පතුල් තුන්සිය යොදුනක් පමණ විශාලය. මුඛයත් එසේමය. එක් ඇඟිලි සන්ධියක දිග යොදුන් පනහකි. බැම දෙක අතර දිග ද එසේමය. නළලෙහි ප්‍රමාණය යොදුන් තුන්සීයකි. හිස යොදුන් නවසීයකි. ඔහු මහමුහුදට බැසගත්විට එහි ගැඹුරු ජලය දණහිස දක්වා පමණක් සිටී. එවිට ඔහු මෙසේ කියයි. "මේ මහමුහුද ගැඹුරුය. අතිශය ගැඹුරු යැයි ඇතැම්හු පවසති. ගැඹුරු බවක් එහි කොයින්ද? මගේ දණමඬලවත් වසා ගැනීමට ප්‍රමාණවත් දිය එහි නැත"යි යනුවේ. ඒ මහා කයකින් යුක්ත වූ බැවින් රාහු අසුරේන්ද්‍රයාට මහා සමුදුය නොගැඹුරු වුවත් අන්‍යයන්ට නොගැඹුරු යැයි නොකිව යුතුයි. එලෙසින්ම ඤාණයෙන් යුක්ත වූ ආනන්ද තෙරුන්ට ප්‍රතීත්‍ය සමුත්පාදය ප්‍රකට වුවත් අන්‍යයන්ටත් එසේම වහා වැටහෙන්නේ යැයි

නොකිව යුතුයි. මේ අර්ථය ප්‍රකාශ කිරීම සඳහා භාග්‍යවතුන් වහන්සේ "ආනන්ද! එසේ නො කියන්න. එසේ නොකියන්න"යි වදාළහ. අනඳ තෙරුන්ට සතර කරුණකින් ගැඹුරු වූ ප්‍රතීත්‍ය සමුත්පාදය නො ගැඹුරු යැයි වැටහුනේය. කවර සතරකින්ද? පූර්ව උපනිශ්‍රය සම්පත්තියෙන්, තීර්ථ වාසයෙන්, සෝවාන් ඵලයට පත් වූ බැවින් හා බහුශ්‍රැත භාවයෙන්. (යන කරුණු සතරෙනි.)

මෙයින් කල්ප සියදහස් ගණනකට පෙර පදුමුත්තර නම් ශාස්තෘන් වහන්සේ ලොව පහළ වූ සේක. උන්වහන්සේ ඉපදුණු නුවර හංසවතී නම් විය. පිය රජු ආනන්ද නම් විය. මව් බිසව වූයේ සුමේධා දේවියයි. බෝසතාණන් වහන්සේ 'උත්තර' නම් තම පුතු ඉපදුණු දිනම මහහිනික්මන් කොට, පැවිදිව ප්‍රධන්වීර්යය වඩන සේක් අනුක්‍රමයෙන් සර්වඥතා ඥානය ලැබ, "අනේකජාති සංසාරං....." යනාදී ප්‍රීතිවාක්‍ය වදාළහ. සත්දිනක් බෝමැඩ මුල පලඟින් කල්යැවූ උන්වහන්සේ "දැන් පොළවේ පය තබමි"යි පා දෙක දිගුකළ සේක. එවිටම පොළව පැලී මහපියුමක් නැඟී සිටියේය. එහි ප්‍රධාන පෙති රියන් අනූවකි. රේණු තිස් රියනකි. කර්ණිකාව දොළොස් රියනකි. කළ නවයක් පමණ රේණුවලින් පිරුණි. ශාස්තෘන් වහන්සේ වනාහී උසින් රියන් පනස්අටක් විය. උන්වහන්සේගේ බාහු දෙක අතර දිග දහඅට රියනකි. නළලත රියන් පහකි. අත්පා රියන් එකළොසක් දිගය. උන්වහන්සේගේ රියන් එකළොසක් දිග පාදයෙන් දොළොස් රියන් වූ කර්ණිකාව පෑගීම සඳහා දිගු කළවිට, කළ නවයක් පමණ වූ රේණු පනස්අට රියන් ප්‍රදේශය පුරා පැතිර සිටියේ, විසිරුණු රත් සිරියල් කුඩු මෙනි. මෙනිසා භාග්‍යවතුන් වහන්සේට පදුමුත්තර යන නම භාවිත විය. උන්වහන්සේගේ අගසවු වූවෝ දේවල හා සුජාත යන දෙනමයි. අමිතා හා අසමා යන දෙදෙන අග්‍රශ්‍රාවිකාවෝ වූහ. උපස්ථායක වූයේ සුමන තෙරුන්ය. පදුමුත්තර බුදුපියාණන් වහන්සේ පියාට හිතවැඩ පිණිස භික්ෂූන් වහන්සේ සියදහස් ගණනක් පිරිවරාගෙන හංසවතී නුවර විසූ සේක. උන්වහන්සේගේ බාල සොහොයුරා "සුමන" නම් විය. ඔහුට රජතුමා හංසවතී නුවරින් විසියොදුනක් පමණ වූ ඈත ප්‍රදේශයක් පාලනය සඳහා පවරා දුන්නේය. ඔහු වරින්වර අවුත් පියරජතුමා ද බුදුපියාණන් ද බැහැදකියි. එක්දිනක් ප්‍රත්‍යන්තයක ජනයා කුපිතව කැරලි ගැසීය. සුමන කුමරු රජුට මෙවන් පණිවුඩයක් එවීය. "රජතුමනි! ඔබවහන්සේ මා වැනි දරුවකු සිටියදී කුමට යුද්ධයට එන්නේ ද? ඒ සොරුන් සන්සිඳුවා ජනපදය සාමයෙහි පවත්වා ඔබ හමුවට එමි" යනුවෙනි. ඒ හසුන කියවා සතුටු වූ

රජු, "මගේ පුතා! කැරලි නිමවා වහා එත්වා"යි පණිවිඩ යැවීය. ඒ කුමරුට ඇමතියෝ දාහකි. කැරල්ල නිමවා රජු හමුවට යන අතරමගදී තම ඇමතියන් ඇමතූ රජකුමරු, "මගේ පියා සතුටුව ඉදින් වරයක් දෙන්නේ නම් කුමක් ඉල්ලමිද?" යනුවෙන් ඇසීය. ඔවුන්තරින් එක් ඇමතියෙක් නැගිට "ඇතෙක් ඉල්ලන්න"යිද තවකෙක් "කුමරුනි, අශ්වයෙක් ඉල්ලන්න"යිද තවකෙක් "ජනපදයක් ඉල්ලන්න"යිද තව ඇමතියෙක් "සප්ත රත්නයන් ඉල්ලන්න" යනාදී වශයෙන් එක් එක් ඇමතිවරු ඉල්ලන දෑ පැවසූහ. මෙවිට නැගිසිටි එක් බුද්ධිමත් ඇමතියකු "නුඹවහන්සේ රජතුමාගේ පුතුය. එනිසා ඔබට වස්තුව-ධනය දුර්ලභ නොවේ. එම සම්පත් සියල්ල ලැබූවත් මැරෙන මොහොතේ මේ සියල්ල හැරදා යායුතුයි. අපට පරලොව ගෙන යා හැක්කේ "පින" පමණි. එනිසා රජතුමා වරයක් දුනහොත්, "පදුමුත්තර බුදුරදුන්ට තෙමසක් උපස්ථාන කිරීමට අවසර දෙන්න"යි ඉල්ලන්න"යි පැවසීය. එය ඇසූ රජකුමරු, "නුඹ මගේ කලණ මිතුරෙකි. මට මෙබඳු සිතක් නොවීය. නුඹ විසින් එම කුසල් සිත උපදවන ලදී. මම එලෙසම කරමි"යි පවසා සහපිරිවරින් ගොස් පියරජු බැහැදක්කේය. රජු ඔහු වැළඳගෙන සිප සනහා නළල සිඹ "පුතේ! නුඹට කැමති වරයක් ඉල්ලව. එය දෙමි"යි පැවසූ විට "පියරජතුමනි! මම භාග්‍යවතුන් වහන්සේට තෙමසක් උපස්ථාන කිරීමෙන් ජීවිතය වද නොවූවක් කරගනු කැමැත්තෙමි. මේ වරය මට දෙන්න"යි කුමරු පැවසීය. රජු - "පුතේ! එය නම් දිය නොහැක. අනික් ඕනෑම දෙයක් ඉල්ලව"යි කීවේය. එවිට පුත්කුමරු "රජතුමනි! ක්ෂත්‍රියයන්ගේ ලඟ කථා දෙකක් නම් නැත. මේ වරය පමණක් ම දෙන්න. වෙනත් වරයකින් මට වැඩෙක් නැත"යි පැවසීය. එවිට රජතුමා, "පුතේ! බුදුවරුන්ගේ සිත නම් අවබෝධ කරගැනීම අපහසුය. ඉදින් භාග්‍යවතුන් වහන්සේ නොකැමති නම් මම වරය දුන්නත් වැඩක් වේද?"යි ඇසීය. එවිට එකුමරු "යහපති රජතුමනි! මම භාග්‍යවතුන් වහන්සේගේ සිත දැනගෙන එමි"යි පවසා විහාරයට ගියේය. මෙවිටම භාග්‍යවතුන් වහන්සේ බත් කිස නිමවා ගඳකිළියට පිවිසියේ වේ. ඔහු මණ්ඩලමාලයේ හුන්නා වූ භික්ෂූන් වහන්සේලාගේ සමීපයට ගියේය. එවිට උන්වහන්සේලා ඔහුගෙන් "රාජපුත්‍රය! කුමක් නිසා මෙහි පැමිණියේද?යි ඇසූහ. එවිට කුමරු "මම බුදුරදුන් දැකීම පිණිස පැමිණියෙමි"යි කීවේය. "මට උන්වහන්සේ දක්වන්න"යි ඉල්ලීය. එවිට භික්ෂූහු "රාජපුත්‍රය! අපිනම් කැමති වේලාවට භාග්‍යවතුන් වහන්සේ දැකීමට අවසර නොලබමු"යි පැවසූහ. එවිට රජකුමරු "එසේනම් ස්වාමීනි! කවරෙකු අවසර ලබයිද?"යි විමසීය. භික්ෂූන් වහන්සේ "රාජපුත්‍රය! සුමන තෙරුන් ඒ අවසරය ලබා ඇත"යි

පැවසූහ. කුමරු "උන්වහන්සේ කොහි වෙසේද?"යි අසා දැනගෙන එම කුටියට ගොස් උන්වහන්සේට වැඳ, "ස්වාමීනි! මම භාග්‍යවතුන් වහන්සේ දකිනු කැමැත්තෙමි. මට උන්වහන්සේ දක්වන සේක්වා"යි ඉල්ලා සිටියේය. තෙරුන් වහන්සේ "රාජපුත්‍රය! එන්න"යි කියා කුමරු කැඳවාගෙන ගොස් ඔහු ගඳකිළි පිරිවෙණෙහි තබා; ගඳකිළියට වැඩියහ. එවිට භාග්‍යවතුන් වහන්සේ "සුමන! කුමක් නිසා පැමිණියේද?"යි ඇසූ සේක. තෙරණුවෝ "ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස, ඔබවහන්සේ දැකීමට රාජපුත්‍රයා පැමිණියේය"යි පිළිතුරු දුන්හ. "එසේනම් අසුනක් පනවන්න"යි බුදුහු වදාළහ. තෙරුන් වහන්සේ අසුනක් පැනවූහ. භාග්‍යවතුන් වහන්සේ ඒ පැනවූ අසුනෙහි වැඩහිඳ කල්හි, රජපුතු උන්වහන්සේට වැඳනමස්කාර කර, පිළිසඳර කථාව කොට නිමියේය. "රාජපුත්‍රය, නුඹ කුමන වේලාවෙහි පැමිණියේද?"යි බුදුහු විමසූහ. කුමරු "ස්වාමීනි! නුඹවහන්සේ ගඳකිළියට පිවිසි වේලාවෙහිම පැමිණි මාහට, "අපි භාග්‍යවතුන් වහන්සේ කැමති කැමති වේලාවට දැකීමට අවසර නොලබමු. සුමන තෙරුන්ට පමණක් එම අවසරය ඇතැ"යි පවසා, භික්ෂූන් වහන්සේලා මා සුමන තෙරුන් වෙත යොමු කළහ. උන්වහන්සේ වනාහී එක වචනයකින් ම මාහට බුදුපියාණන් දැක්වූහ. ස්වාමීනි! මේ තෙරුන් වහන්සේ, නුඹවහන්සේගේ සසුනෙහි ඉතා ප්‍රියයෙක් වෙයැයි සිතමි"යි පැවසුවේය. එවිට බුදුපියාණන් වහන්සේ මෙසේ වදාළහ. "එසේය රජකුමරුනි! මුන්වහන්සේ මගේ සසුනෙහි ඉතා ප්‍රිය භික්ෂුවකි" යනුවෙනි. මෙය ඇසූ රජකුමරු, "ස්වාමීනි! බුදුවරුන්ගේ ශාසනයන්හි ඉතා ප්‍රිය භාවයට යෑම සඳහා කුමක් කළයුතුද?"යි ඇසීය. එම පැනයට පිළිතුරු දෙන බුදුපියාණන් වහන්සේ, "කුමරුනි! දන්දී, සිල්සමාදන්ව, පොහෝ කර්ම කර ප්‍රියභාවයට පත්විය හැකියැ"යි වදාළ සේක. එවිට රජකුමරු, "භාග්‍යවතුන් වහන්ස! මම ද මේ තෙරුන් මෙන් බුදුසසුනක ප්‍රියයෙක් වීමට කැමැත්තෙමි. තෙමසක් වූ වස්කාලය තුල මාගේ උපස්ථානය ඉවසන සේක්වා!"යි ආරාධනා කළේය. භාග්‍යවතුන් වහන්සේ "මේ ගමනින් යහපතක් වේද?"යි විමසා බලා, යහපතක් වන බව දැන, "රාජපුත්‍රය! ශූන්‍යාගාරයන්හි වාසයට බුදුවරු කැමතිවෙති"යි වදාළහ. කුමරු "බුදුරජාණන් වහන්සේ මගේ ඇරයුම පිළිගත්හ. අනුදත්හ"යි දැන "ස්වාමීනි! මම පළමුව ගොස් විහාරයක් කරවමි. මා පණිවුඩයක් එවූ කල්හි භික්ෂූන් වහන්සේ සිය-දහස් ගණනක් පිරිවරාගෙන වඩිනු මැනව"යි පොරොන්දු ගෙන පියරජු සමීපයට ගොස්, "රජතුමනි! භාග්‍යවතුන් වහන්සේ මට අවසර දුන් සේක. මා පණිවුඩයක් එවූ කල්හි භාග්‍යවතුන් වහන්සේ එහි වැඩම කරවුව මැනව"යි කියා පියාට වැඳ, තම නුවරට යන්නේ සතරමඟ යොදුනක්-යොදුනක් පාසා

විහාරාරාම කරවමින් විසියොදුන් මගගෙවා සිය නුවරට පැමිණියේය. තම නුවරට ගොස් විහාරයකට සුදුසු තැනක් සොයනුයේ "සෝභන" නම් සිටුපුතුගේ උයන දැක ලක්‍ෂයකට එය මිලදීගෙන, තවත් ලක්‍ෂයක් වියදම් කර මහාවිහාරයක් කරවූයේ ය. එහි භාග්‍යවතුන් වහන්සේගේ ගඳකිළිය හා සෙසු භික්‍ෂූන් වහන්සේගේ දවල් වසන තැන්, රාත්‍රී වසන තැන්, කුටි-ලෙන්-මණ්ඩප කරවා, පවුරකින් වටකරවා; පිවිසෙන ද්වාර-ශාන තොටු ආදිය ද පිළියෙල කරවා, අනතුරුව තම පියාණන් වෙත, "මගේ කටයුතු නිමකරන ලදී. භාග්‍යවතුන් වහන්සේ වැඩමවන සේක්වා!"යි හසුන්පත් යැවීය. පියරජු භාග්‍යවතුන් වහන්සේට වළඳවා, "ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! සුමනගේ කටයුතු නිමකරන ලදී. ඔහු නුඹවහන්සේගේ පැමිණීම බලාපොරොත්තුව සිටියි" යනුවෙන් පැවසීය. බුදුපියාණන් වහන්සේ ලක්‍ෂ ගණනක් භික්‍ෂූන් වහන්සේ පිරිවරාගෙන, යොදුනෙන් යොදුන විහාරවල වාසය කරන සේක් පිළිවෙලින් එනුවරට වැඩම කළ සේක.

කුමරා ශාස්තෘන් වහන්සේ පැමිණෙන පුවත අසා සතුටුව, යොදුනක් පෙර ගමන් කර, සුවඳ මල් ආදියෙන් පූජා පවත්වමින් විහාරයට වැඩම කරවාගෙන අවුත්, "ලක්‍ෂ ගණනක් මිලදී ගත්, ලක්‍ෂ ගණනක් වියදම් කර සාදවන ලද මේ සෝභන නම් වූ උයන, මුනීන්ද්‍රයන් වහන්සේ මා හට අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!"යි (70 පිටුවේ පළමු ගාථාවේ අර්ථය)

පවසා විහාරය බුද්ධප්‍රමුඛ මහා සංඝයාට පූජා කළේය. ඔහු වස් එළඹෙන දින මහදන් පවත්වා, තම අඹුදරුවන්ද ඇමතියන්ද කැඳවා මෙසේ කීය. "ශාස්තෘන් වහන්සේ අපගේ සමීපයට වැඩියේ බොහෝ දුර සිටයි. බුදුවරු නම් ධර්ම ගරුකරන්නෝ මිස ආමිස ගරු කරන්නෝ නොවෙති. එනිසා මේ තෙමස ම මම සලු දෙකක් පමණක් හැඳගෙන, දසසිල් සමාදන්ව මෙහිම වෙසෙමි. නුඹලා සියලුම රහතන් වහන්සේලාට ම මේ අයුරින්ම තෙමස පුරා දන් දෙවු"යි යනුවෙනි. ඔහු සුමන තෙරුන් වැඩවෙසෙන තැනට සමීපවූ තැනක වෙසෙමින්, තෙරුන් වහන්සේ විසින් භාග්‍යවතුන් වහන්සේට කරනු ලබන සියලු වත් පිළිවෙත් දක, "මේ සස්නෙහි ඒකාන්තයෙන්ම ඉතා ප්‍රිය වූයේ මේ තෙරුන්මය. මෙම තනතුර පැතීම ඉතා අගනේය"යි සිතා වස් පවරාණය ළංවූ විට ගමට පිවිස සත්දිනක් මහදන් දී, සත්වැනි දින ලක්‍ෂ ගණනක් භික්‍ෂූන්ගේ පාමුල තුන් සිවුරු තබා, භාග්‍යවතුන් වහන්සේට වැඳ, "ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස, ඉදින් මවිසින් අතරමග යොදුනක් පාසා විහාර කරවීමේ පටන්

කරන ලද සියලු පින්කම්වලින් ශක්‍ර සම්පත්, මාර, බ්‍රහ්ම සම්පත් ආදියක් නොපතමි. හුදෙක් ලොවුතුරා බුදුවරයෙකු හමුවේ උපස්ථායක තනතුර දරීමට ම ප්‍රාර්ථනා කරමි. එනිසා ස්වාමීනි! මේ සුමන තෙරුන් මෙන් මමද බුදුවරයන් වහන්සේ කෙනෙකු හමුවේ අග්‍ර උපස්ථායකයකු වේවා!"යි පතමින් පසඟ පිහිටුවා වැඳගෙන සිටියේය.

භාග්‍යවතුන් වහන්සේ මේ මහත් වූ කුල පුතුගේ ප්‍රාර්ථනාව ඉටුවන්නේද? නොවන්නේ ද?යි විමසා බලන සේක් "අනාගතයේ දී - මින් කල්ප සියදහසක් ගතවූ කල්හි ගෞතම නම් බුදුරජාණන් වහන්සේ පහළවන සේක. මෙකුමරු උන්වහන්සේගේ අග්‍ර උපස්ථායක වන්නේය"යි දුන

ඉච්ඡිතං පත්ථිතං තුයහං ඛිපමෙව සමිජ්ඣතු
සබ්බා පූරෙනතු සංකපපා චන්දෝ පණ්ණ රසෝ යථා

"ඔබ සිතු-පැතු සියල්ලම වහා සමෘද්ධිමත් වේවා! පසළොස්වක සඳ මෙන් ඔබගේ සියලු සංකල්පනාවෝ සම්පූර්ණ වෙත්වා!"යි වදාළ සේක.

මෙය ඇසූ සුමන කුමරු "බුදුවරු නම් දෙයාකාර වූ කථාවක් නොදෙසන්නෝමය"යි සිතා දෙවැනි දින පටන් ඒ භාග්‍යවතුන් වහන්සේගේ පාසිවුරු ගෙන පිටුපසින් අනුව යන්නාක් මෙන් හැඟුනේය. එසේ සිතමින් ප්‍රීති විය.

ඔහු ඒ බුද්ධෝත්පාද කාලයේ වර්ෂ සියදහස් ගණනක් මහදන් දී දිව්‍යලෝකයේ ඉපිද කසුප් බුදුරජාණන් වහන්සේ වැඩවසන සමයෙහි පිඬු පිණිස හැසිරෙන භික්ෂුවකට සිය පාත්‍රය තබාගෙන යෑම සඳහා සුදුසු වූ එතුරු සලුවක් පූජා කළේය.

නැවත දෙව්ලොව ඉපිද, ඉන් චුතව බරණැස් මහරජුව ඉපිද, පසේ බුදුවරු අටනමක් සඳහා පන්සල් කරවා, මැණික් පුටු පූජා කරවා සිවු පසයෙන් ඇප උපස්ථාන කරමින් වර්ෂ දසදහසක් ගත කළේය. මෙතැන් සිට ඇති තොරතුරු ඉතා ප්‍රකටය.

කල්ප සියදහස් ගණන්ක දන් දෙමින් ම අපගේ බෝධිසත්ත්වයන් වහන්සේ සමග ම තුසිත පුරයෙහි ඉපිද, ඉන් සැව අමිතෝදන ශාක්‍යයාගේ භාර්යා කුස පිළිසිඳගෙන, පිළිවෙලින් කරන ලද අභිනික්මන් ඇති අප

සිදුහත් තාපසතුමා සම්මා සම්බුද්ධත්වයට පැමිණ පළමුවර කපිලවත්පුවට වැඩි අවස්ථාවේ දී ශාක්‍ය රජවරු ගත් තීරණයට අනුව කපිලවත්පුවෙන් නික්මුණු බුදුපියාණන් වහන්සේ පිරිවරා ගැනීමට ශාක්‍ය කුලයෙන් පැවිදිවන භද්දියාදී කුමාරවරු සමග ගිහිගෙයින් නික්මුණු ආනන්ද කුමරු, භාග්‍යවතුන් වහන්සේ වෙත පැවිදි වූයේය. නොබෝ දිනකින් ම ආයුෂ්මත් පුණ්ණ මන්තානි පුත්ත මහතෙරුන්ගේ ධර්ම කථාවක් අසා සෝවාන් ඵලයෙහි පිහිටි ආනන්ද තෙරණුවන්ගේ පූර්ව උපනිශ්‍රය සම්පත්තීන් මෙපරිද්දෙන් දතයුතුයි. ඒ පූර්ව උපනිශ්‍රය සම්පත් හේතුවෙන් ගැඹුරු වූ ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මය වඩාත් ප්‍රකටව වැටහුණු බව දතයුතුයි.

තීර්ථ වාසය (තිත්ථවාස) යනු ගුරුවරු සමීපයේ සිට ධර්ම කරුණු ඉගෙනීම, ශ්‍රවණය, විචාරීම, ධාරණය කරගැනීමාදී ක්‍රියාවන්ය. මෙකරුණු ආනන්ද තෙරුන් පිළිබඳව විමසා බැලීමේදී අතිශයින් පිරිසිදුය. එනිසා මෙම ගැඹුරු ධර්මය මැනවින් වටහාගත හැකි වූ බව දතයුතුයි.

සෝවාන් වූවන්ටද මේ ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මය උඩුකුරු වී මෙන් මැනවින් ප්‍රකටව අවබෝධ වේ. ආනන්ද තෙරුන් ද සෝවාන්ව සිටි බැවින් මෙම සත්‍යය ධර්මය මැනවින් වැටහෙන්නට ඇති බව දතයුතුයි.

බහුශ්‍රැතයන්ට වනාහී; සිවුරියන් කාමරයක පහන් දල්වන කල්හි ඇඳපුටු ආදිය මැනවින් ප්‍රකටව පෙනෙන්නාක් මෙන් නාමරූපයන්ගේ බෙදා දැක්වීම් මනාව ප්‍රකටව වැටහේ. මේ ආනන්ද තෙරුන් වහන්සේද බහුශ්‍රැතයන්ට අග්‍රවූයේමය. මෙලෙස බහුශ්‍රැත බවින් අග්‍ර හෙයින් උන්වහන්සේට ගැඹුරු වූ ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මය උඩුකුරු වූවක් මෙන් මනාව වැටහුණේය.

ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මයේ ගැඹුරු බව සතරාකාරව දතයුතුයි. ඒ ගාම්භීරතාවයන් විශුද්ධිමාර්ගයේ විස්තර කරන ලදී. එම සියලු ගාම්භීරතාවයන් ආනන්ද තෙරුන්ට වඩා අවබෝධ විය. එනිසා භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද තෙරුන් උත්සාහවත් කරවන සේක්, "ආනන්ද එසේ නොකියන්න" යනාදිය වදාළ සේක.

මේ එහි අදහසයි.- "ආනන්දය! නුඹ මහා ප්‍රාඥයෙක. ප්‍රකට වූ ඤාණ ඇත්තෙක. එනසා නුඹට අතිශය ගැඹුරු වූ ප්‍රතීත්‍ය සමුත්පාදය ද

උඩුකුරු වූවක් මෙන් වැටහුනේය. එනිසා මාහටම මෙය උඩුකුරු වූවක් මෙන් වැටහුණිද? නැතිනම් සෙස්සන්ටත් මෙය වැටහේද? යනාදී වදන් නොපවසන්න" යනුවෙනි. නින්දා කරමින් යමක් කියන ලදද එහි මේ අදහස ඇත. "ආනන්දය! තවත් "මට උඩුකුරුව-ඉතා ප්‍රකටව වැටහේ"යැයි නොපවසන්න. ඉදින් නුඹට ඉතා ප්‍රකටව ප්‍රතීත්‍ය සමුත්පාදය වැටහේ නම් කුමක් නිසා නුඹ තම ධර්මතා වශයෙන් සෝවාන් ඵලයට පත් නොවූයෙහිද? මවිසින් දේශිත නය අනුව නුඹ සෝවාන් ඵලයට පත් වූයෙහිය. ආනන්දය! මේ නිවන් මග ඉතා ගැඹුරුය. ප්‍රතීත්‍ය-සමුත්පාදය වනාහී ප්‍රකට වූයේ - මැනවින් වැටහෙනුයේ නම් කුමක් නිසා නුඹ ඕලාරික වූ කාමරාග සංයෝජනය, ප්‍රතිඝ (තරහ) සංයෝජනය හා කාමරාගානුසය හා ප්‍රතිඝානුසය යන මේ සිවුවැදෑරුම් ක්ලේශ ධර්ම උපුටා දමා සකෘදාගාමී ඵලය සාක්ෂාත් කර නොගත්නෙහි ද? කිම ඒ අත්‍යල්ප වූ සතරවිධ ක්ලේශ ධර්ම සම්පූර්ණයෙන් ම නසා අනාගාමී ඵලය සාක්ෂාත් නොකරන්නේ ද? රූපරාගාදී පස්විධ සංයෝජනයන් ද මාන-භව-අවිද්‍යාදී අප්‍රකට ක්ලේශධර්ම අට ද සම්පූර්ණයෙන් ම නසා රහත්ඵල සාක්ෂාත් කරණය නොකර සිටිනුයේ මන්ද? සිය දාහක් කල්පයන්හි ඒකාසංඛෙය්‍ය කල්ප ලක්ෂයක් පිරූ පාරමී ධර්ම ඇති, සැරියුත්-මුගලන් මහතෙරවරු මෙන් ශ්‍රාවක පාරමී ඤාණය අවබෝධ නොකළේ කුමක් නිසා ද? කල්ප අසංඛෙය්‍ය කල්ප ලක්ෂ දෙකක් පුරා පිරූ පාරමී දම් ඇති පසේ බුදුවරු මෙන් පසේ බුදු ඤාණය අවබෝධ නොකළේ ඇයිද? ඉදින් නුඹට සියලුම ආකාරයෙන් මේ ධර්මය ඉතා ප්‍රකටව වැටහෙන්නෙහි නම්, අසංඛ්‍යය කල්ප ලක්ෂ හතරක්, අටක් හෝ දාසයක් පුරා පුරන ලද පාරමිතා ධර්ම ඇති ලොවුතුරා බුදුවරයෙකු මෙන් සර්වඥතා ඥානය කුමක් නිසා සාක්ෂාත් කර නොගන්නෙහිද? මේ සුවිශේෂී වූ අධිගමයන්ගෙන් අනර්ථයක් හෝ අවැඩක් වන්නෙහිද? බලන්න! නුඹගේ අපරාධ වූ ප්‍රකාශයේ තරම. නුඹ ශ්‍රාවක ඤාණයෙහි පිහිටියේ ඉතා ගැඹුරු වූ ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මය උඩුකුරු වූවක් මෙන් වැටහෙන්නේ යැයි පවසන්නෙහිය. මේ නුඹගේ ප්‍රකාශය ලොවුතුරු බුදුවරුන්ගේ දේශනාවට විරුද්ධවූයේ වෙයි. නුඹ වැනි භික්ෂූන් විසින් බුදුවරුන්ගේ දේශනාවට පටහැනි වූවක් පැවසීම නුසුදුසුම ක්‍රියාවකි. ආනන්දය! මාහට මෙම ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මය අවබෝධ කරගැනීම සඳහා සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් ඉක්ම නොගියේද? මේ ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මය අවබෝධ කරගැනීම සඳහා මවිසින් නොදුන් දානයක් නම් නැත. නොපිරූ පාරමිතාවක් නම් නැත. "අද ප්‍රතීත්‍ය-සමුත්පාදය අවබෝධ කරන්නෙමි"යි මාරබලය පරදා කළ ඒ උත්සාහය ඵලරහිතය. ඔබ මේ ප්‍රකාශය කරන

කල්හි මහපොළව දෑගිල්ලක් තරම්වත් කම්පා නොවිණි. එනමුත් බුදුවනදා ප්‍රථමයාමයේ දී පුබ්බේනිවාසානුස්සති ඥානය ද මධ්‍යම යාමයේ දී දිබ්බචක්ඛු ඥානය ද උපදවාගෙන පශ්චිම යාමයේදී ඉතා අලුයම් වේලාවෙහි අවිද්‍යා, සංස්කාරාදිය නවාකාරයකින් ප්‍රත්‍යවන්තේ යැයි දුටු පමණින් ම දස දහසක් සක්වල යකඩ දණ්ඩකින් තලන ලද ලෝහ තලියක් මෙන් රාවප්‍රතිරාව සීයක්, රාවප්‍රතිරාව දාහක් මුදමින්, සුලඟින් සොලවන ලද නෙලුම් පත්‍රයේ ඇති දියබිඳු මෙන් කම්පා විය. මෙලෙන "ආනන්දය! මේ ප්‍රතීත්‍ය සමුත්පාදය ඉතා ගැඹුරුය. ගැඹුරු වූයේම ගැඹුරුව පෙනේ. ආනන්දය! මේ දහම නොදැනීම නිසා, අවබෝධ නොකිරීම නිසා -පෙ- සසර නො ඉක්මවත්."

"**එතසස ධම්මස්ස**" යනු මේ ප්‍රත්‍යය ධර්මයාගේය. "**අනනුබොධා**" යනු දන්නා ලද, සම්පූර්ණයෙන් දැනගත් ආදී ලෙස අවබෝධ කර නොගැනීමෙනි. "**අපපටිවෙධා**" යනු තීරණ, ප්‍රහාණ හා පිරිසිඳ දැනීම් වශයෙන් අනවබෝධ වූ යනුයි. "**තනතාකුලක ජාතා**" යනු නූලක් මෙන් අවුල් වූ යනුයි. යම්සේ වැරදි ලෙස දමනු ලැබූ, මීයන් විසින් කනලද පේෂකාරයන්ගේ නූලක් ඒ ඒ තැන අවුල්වේද, මේ අගය, මේ මූලය ගත නොහැකි ද, අගින් අග හෝ මූලින් මූල හෝ ගැලවීම අපහසු වේද ඒ ආකාරයෙන්ම සත්ත්වයෝ මේ ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මයෙහි පැකිලී, අවුල්ව - ව්‍යාකුලව ගියාහු වෙති. ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මය ඍජු කරගැනීමට නො හැකි වේ. එහි අවුල් වූ නූල ප්‍රත්‍යක්ෂයෙන් දත් පුරුෂයෙකු ලවා ම දිගහැර ගැනීමට හැකිවන නමුත් මේ ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මය තමාගේම ධර්මතාවක් වශයෙන් වටහා ගැනීම සඳහා බෝසත්වරු දෙදෙනෙක් ලඟ තබාගෙනවත් නොහැකි වන්නේමය. එවැනි හැකියාවක් නැත්තේමය. යම්සේ අවුල් වූ නූල කැඳෙහි දමා මුස්නකින් ගසනවිට ඒ ඒ තැන ගුළාවක් මෙන් ගැට-බැඳීම් ඇතිවන්නේ ද එසේම මේ සත්ත්වයෝ ප්‍රත්‍ය ධර්මයන්හි පැකිලී, ප්‍රත්‍ය ධර්මය ඍජුව වටහා ගැනීමට නොහැකිව දෙසැට මිසදිටුවලට යෑම් වශයෙන් ගුළාවක් මෙන් වේ. ගැට බැඳීම් ඇති වේ. යම් කිසිවෙකු දෘෂ්ටි ඇසුරු කළෝ නම් ඔවුහු සියල්ලෝම ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මය ඍජුව වටහා ගැනීමට නොහැකිවූවෝ වෙති. "**ගුළාගුණ්ඩික ජාතා**" යනු අවුල් වූ නූල් ගුළාවකි. පේෂකාරයන්ගේ කැඳෙහි දමූ නූලකි. ඇතැම්හු (අභයගිරිකාදී) මෙසේ කියති. "ගුළා" යනු පක්ෂි වර්ගයකි. ඒ පක්ෂීන්ගේ කූඩු මෙන් අවුල් වූ යන අර්ථයයි. මේ අර්ථ දෙකම ආකුල වූ, අගින් අග හෝ මූලින් මූල ගැලපීමට දුෂ්කර වූ යන මූලින් කී අර්ථ දෙකම ආකුල වූ, අගින් අග හෝ මූලින් මූල ගැලපීමට

දුෂ්කර වූ යන මුලින් කී අර්ථයට ම යෙදිය යුතුයි. "මුඤ්චබඛඛජඡතා" යනු මුදුතණ මෙන්, සවැන්න තණමෙන් වූ, එලෙස හටගත් යනුයි. යම්සේ ඒ තණ අඹරා කරන ලද රැහැන කැඩුණු විට කිසිවෙක් වැටුණු කැබැල්ලක් ගෙන, ඒ තණවල 'මේ අගයි. මේ මුලයි' යනුවෙන් අගින් අග හෝ මුලින් මුල හෝ ගැලපීමට දුෂ්කර වේ. එයද ප්‍රත්‍යක්ෂයෙන් දත් පුරුෂයකු ලවා ම ඍජුකර ගැනීමට හැකිවන්නකි. එනමුත් බෝසත්වරු දෙදෙනෙක් දෙපස තබාගෙනවත් තමාම ධර්මතා වශයෙන් ප්‍රතීත්‍ය සමුත්පාදය ඍජුව වටහා ගන්නෙක් නම් නැත. මෙසේ මේ සාමාන්‍ය ජනයා ප්‍රත්‍ය ධර්ම ඍජුව වටහා ගැනීමට නොහැකි වනුයේ දෘෂ්ටිගත වශයෙන් ගැට හටගත්තෝ වී "**අපායං දුග්ගතිං විනිපාතං සංසාරං නාතිවත්තන්ති**" සැපෙන් පහවී නපුරු ගති ඇති නරකයෙහි වැටී සසර නො ඉක්මවති. මෙහි "අපාය" යනු නිරය, තිරිසන් යෝනිය, ප්‍රේත විෂය හා අසුර ලෝකයයි. ඒ සියල්ලෝම "වර්ධනය වීම" නම් වූ "අය" වීමෙන් දුරුවූයේ-නොවැඩෙන්නේ "අපාය" නම් වේ. එසේම දුකට යෑම් වශයෙන් "දුගති" නම් වේ. සැප කයින් වැටුණු බැවින් "විනිපාත" නම් වේ. සෙසු පදයන්හි අර්ථ -

"ඛන්ධානං පටිපාටී ච ධාතු ආයතනානිච
අම්බොච්ඡිනනං වත්තමානං සංසාරොති පවුච්චති"

"ස්කන්ධයන්ගේ පිළිවෙල හා ධාතු-ආයතනාදිය නොසිඳී-අඛණ්ඩව එකට බැඳී පවතිනුයේ ද "ඒ සංසාරය" යැයි කියනු ලැබේ.

ඒ සියල්ල ද නො ඉක්මවයි. අතික්‍රමණය නොකරයි. අනතුරුව චුතියෙන් ප්‍රතිසන්ධිය ද ප්‍රතිසන්ධියෙන් චුතිය ද ලැබීම් වශයෙන් මෙලෙස නැවත නැවත චුති-ප්‍රතිසන්ධි ලබන සත්ත්වයෝ ත්‍රිවිධ භවයන්හිද නව සත්තාවාසයන්හි ද ඉපිද මැරෙමින්; මහමුහුදේ ඒ මේ අත ගසාගෙන යන නැවක් මෙන් ද යන්ත්‍රයේ යොදන ලද ගොනෙකු මෙන් ද පරිභ්‍රමණය කරත්මය. මේ සියල්ල භාග්‍යවතුන් වහන්සේ විසින්, ආයුෂ්මත් ආනන්ද හිමියන්ට නිදා කරමින් දේශනා කළහයි දතයුතුයි. මෙම සූත්‍රයේ ඉතිරි පදයන්ගේ අර්ථ ඉතා ප්‍රකටය.

දසවන සූත්‍රයයි.

සයවන දුක්ඛ වර්ගය නිමියේය.

12. 7. 1.

මහාවර්ගයේ පළමු සූත්‍රයේ "අසුතවා" යනු ස්කන්ධ, ධාතු, ආයතන, ප්‍රත්‍යාකාර, සතිපට්ඨානාදියෙහි ඉගෙනීම්, ප්‍රශ්න කිරීම්, විනිශ්චය කිරීම් ආදිය රහිත වූ පුද්ගලයාය. "පුථුජ්ජනෝ" යනු පැතිර සිටි (පුථු) නානාප්‍රකාර වූ ක්ලේශාදීන්ට ඉපදීම සඳහා උපකාර වූ හෙයින් "පුථුජ්ජන" නම් වූ. එනිසා කියන ලදී. "ව්‍යාප්ත වූ" (පුථු) "ක්ලේශයන් උපදවයි" (ජනන) යන අරුතින් "පුථුජ්ජන" නම් වේ. මෙලෙස සෑම තැනකදීම විස්තර කළ යුතුයි. තවද - පැතිර යාමෙන් ගණන් කිරීමේ සීමාව ඉක්මගිය, ආර්ය ධර්මයන්ට විරුද්ධ වූ, නීච ධර්මයන්ට සමවූ හැසිරීම් ඇති ජනයාගේ එකතුව "පුථුජ්ජන" නම් වේ. වෙන් වෙන් වූ හෝ මෙය වෙන්වූ ම සංඛ්‍යාවට ගියේ සීල, තාදී ගුණයන්ගෙන් යුක්ත ආර්ය ජනයන්ගෙන් වෙන්වූයේ - ඔවුන් හා සම්බන්ධ නොවූයේ "පුථුජ්ජන" නම් වේ. මෙසේ මේ සූත්‍රයේදී "අශ්‍රැතවත් පෘථජ්ජනයා" යන දෙපදයෙන් අදහස් කළ පුද්ගලයා වනාහී

දුවෙ පුථුජ්ජනා වුත්තා - බුද්ධෙනාදිච්ච බන්ධුනා
අන්ධෝ පුථුජ්ජනෝ එකෝ - කල්‍යාණෙකෝ පුථුජ්ජනෝ

"සූර්යවංශික වූ බුදුරජාණන් වහන්සේ විසින් පුහුදුන් පුද්ගලයෝ දෙකොටසක් දක්වූහ. එක් අයෙක් අන්ධ පුහුදුන් පුද්ගලයායි. දෙවැන්නා කල්‍යාණ පුහුදුන් පුද්ගලයායි."

මෙලෙස පුහුදුන් පුද්ගලයෝ දෙදෙනෙක් පිළිබඳව පැවසේ. ඔවුන් අතුරින් මුලින් පැවසූ අන්ධ පුහුදුන් පුද්ගලයාම මෙම සූත්‍රයේ දී අදහස් කරන ලදී. "ඉමසම්ිං" යනු වර්තමාන ප්‍රත්‍යක්ෂ වූ කය දක්වයි. "චාතුම්මහාභූතිකෙ" යනු සිවුමහා භූත ධර්මයන්ගෙන් උපන්, සිවුමහා භූතමය වූ යන අර්ථය. "නිබ්බින්දෙය්‍ය" යනු කළකිරෙන්නේය යනුයි. "විරජෙජය්‍ය" යනු නොරඳන්නේ ය. "විමුච්චෙය්‍ය" යනු මුදනු කැමති වන්නේය. "ආචයො" යනු අභිවෘද්ධියයි. "අපචයො" යනු පිරිහීමයි. "ආදානං" යනු උපතයි. "නික්ඛෙපං" යනු බිඳියෑමයි. "තසමා" යනු යම්හෙයකින් මේ සිවු වැදෑරුම් වූ අභිවෘද්ධි, පරිහානි, උප්පත්ති හා බිඳියෑම් යනාදිය ප්‍රකට වෙද්ද එහෙයින්. ඒ හේතුවෙන් යන අර්ථයි.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ සිවුමහා භූතමය වූ කයෙහි රූපය අල්වා ගැනීමට අයුතු රූපයක් (නුසුදුසු වූවක්) කර, අරූපය අල්වා ගැනීමට (සුදුසු සේ) යුතු රූපයක් කරන සේක. කුමක් නිසාද? ඒ භික්ෂූන්ගේ

රූපයෙහි ඇලුණු සිත ඉතා බලවත් ය. අධික ය. එනිසා ඒ රූපයේ දැඩිව ඇලුණු පුද්ගලයන්ට අල්වාගත යුතු රූපයක් දක්වා නෙරපන සේක්, අරූපයෙහි පිහිටුවීම සඳහා මෙසේ වදාළහ. **"චිත්තං"** යනාදී සියල්ල "මන" ආයතනයට ම භාවිත පද වේ. විසිතුරු වස්තුවක් වූ බැවින් ද විසිතුරු ලෙස ගෝචර වන බැවින් ද එක්ව යෙදුණු ධර්මයන්ගේ විසිතුරු බැවින් ද **"චිත්ත"** නම් වේ. සිතීම් (මනන) අර්ථයෙන් "මනො" නම් වේ. දැනීම් (විජානන) අර්ථයෙන් "විඤ්ඤාණං" නම් වේ. "නාලං" යනු අසමත්. සමත් නොවේ යනුයි. "අජ්ඣොසිතං" යනු තණ්හාවෙහි ගිලී අවසන් කරගන්නා ලද. බැසගන්නා ලද යනුයි. "ම මායිතං" යනු තණ්හාවෙන් "මම", මගේ මෙය මගේ යැයි මමායනය කරගත්, "පරාමට්ඨං" යනු දෘෂ්ටියෙන් පිරිමැද ගන්නා ලද. "එතං මම" යනු තණ්හාවෙන් ගැනීමකි. එයින් එකසිය අටක් වූ තණ්හාව අදහස් කරන ලදී. "එසොහමස්මි" යනු "මේ මම වෙමි"යි මානයක් ගැනීමයි. එයින් මාන නවය අදහස් කරන ලදී. **"තසමා"** යනු මෙසේ බොහෝ කාලයක් තුල පිළිගන්නා ලද වැරදි පිළිගැනීම් ඇති නිසා නිවීමට (ඒවා අත්හැරීමට) අසමත් වනුයේ යනුයි. **"පරං භික්ඛවෙ"** මෙය කුමක් නිසා කියන ලද්දේ ද? බුදුපියාණන් වහන්සේ පළමුව ශ්‍රාවක භික්ෂූන් විමසීම සඳහා රූපය නුසුදුසු වූවක් ලෙස ද අරූපය සුදුසු වූවක් ලෙස ද දේශනා කරන ලද සේක. ඉක්බිති ඒ භික්ෂූන්ගේ සිත, රූපය දැඩිව ගැනීමෙන් ඉවත් වී, අරූපය දැඩිව ගත් බවට පත්වූ බව දැන ඉන් මිදවීම සඳහා මේ දේශනාව ඇරඹූ සේක.

එහිදී **"අතනතො උපගච්ඡෙය්‍ය"** යනු ආත්ම වශයෙන් ගන්නේය යනුයි. **"භියොපි"** යනු වසර සීයකට ද මත්තෙහිය. කුමක් හෙයින් භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක් ද? කිම "තවත් වසර සීයක් සිටීම" මෙහිදී අදහස් වේද? පළමු වයසේ පැවති රූපය, මැදි වයසට නො පැමිණේ. මැදි වයසේ පවතින රූපය පශ්චිම වයසට නොපැමිණේ. පෙරබත් කල පැවති රූපය පසුබත් කල නැතිවේ. පසුබත් කල පැවති රූපය රෑ ප්‍රථම යාමයේ දී නැතිවේ. ප්‍රථම යාමයේ පැවති රූපය මැදියමේදී නැතිවේ. රෑ මැදියමේ පවතින රූපය, රෑ පශ්චිම යාමයේදී නැතිවේ. එලෙසින්ම ගමන් කිරීමෙහිදී පවතින රූපය සිටගෙන සිටිවිට ද, සිටගෙන සිටින විට ඇති රූපය හිඳගත් විටද, හිඳගත් විට ඇතිවන රූපය සයනය කරන විටද නැතිවේ. එකම ඉරියව්වේ සිටියත් රූපය වෙනස් වේ. ගමනාරම්භයේ පැවති රූපය ගමන් කිරීමේදී නැත. පළමු පියවර තැබූ විට ඇති රූපය දෙවන පියවර තබනවිට නැත. ගමන් කිරීමේදී පවතින රූපය ගමන නැවැත්වූ විට නැත. ගමන නැවැත්වීමේදී ඇති රූපය

නැවත නික්මෙනවිට නැත. නැවත නික්මෙනවිට ඇති රූපය ගමන නැවැත්වූ විට නැත. ඒ ඒ තැන ම වෙන් වෙන් වශයෙන් පුරුක්-පුරුක් වශයෙන් වී රත්වූ කබලෙහි දමන ලද තල මෙන් තට, තට හඬදෙමින් සංස්කාරයෝ බිඳෙත් ද, වෙනස් වෙත් ද යන මෙය සත්‍යයකි. යම්සේ පහනෙහි දල්වන ලද දූල්ල ඒ ඒ වැටියේ ප්‍රදේශය නො ඉක්මවමින් ඒ ඒ තැනම බිඳෙත් ද එමෙන්ම ප්‍රවේණි වශයෙන් සම්බන්ධ වී "පහත මුළු රෑ පුරාම දූල්වුණි" යැයි කියත්ද එලෙසින් ම මෙහිදී ප්‍රවේණි වශයෙන් මේ කයද ස්ථිරවූවක් මෙන් දැකිය හැකි වේ. එනිසා මෙතැනදී මේ කයද බොහෝ කලක් පවතින්නක් මෙන් දක්වන ලදී. "**රතතියා ච දිවසසස ච**" යනු රාත්‍රියේ ද දාවල ද යනුයි. මෙය සත්තමී අර්ථයේ (කාලාර්ථ) ඡට්ඨී විභක්ති වචනයකි. "**අඤඤදෙව උපපජජති, අඤඤං නිරුජඣති**" යනු "යමක් රෑ උපදියිද එය දැන් නිරුද්ධ විය. දාවල අනිකක් ම උපදියි. එසැනින් ම එය නිරුද්ධ වේ." යනුවෙන් මෙහි අර්ථ නොගත යුතුයි. රෑද දාවල්ද යනුවෙන් පළමු ප්‍රවේණියෙන් කුඩා ප්‍රවේණියක් ගෙන ප්‍රවේණි වශයෙන් කියන ලදී. එක් රෑයක් හෝ එක් දවසක් තුල එකම සිතක් පැවතීමට හැකියාවක් නැත. එක් අසුරු සැණෙකදී නොයෙක් සිත් කෙළ ලක්ෂ ගණනක් උපදිත්.

මෙකරුණු මිළින්ද ප්‍රශ්නයේ විමසන ලද්දේ නොවේද? - "මහරජ! වාහන සීයක්, කුඩා වාහන පනහක්, කුරුණි සතක හා ලාභ දෙකක දූමූ වී ප්‍රමාණයට, එක් අසුරුසැණෙක දී උපදින සිත් සංඛ්‍යාව සමාන කල නොහැක. ඒ සිත් සංඛ්‍යාවෙන් දහසයෙන් කොටසකට හෝ ඉන් භාගයකටවත් සමාන නොවේ."

"පවනෙ" යනු මහාවනයෙහිය. "**තං මුඤචිතවා අඤඤං ගණහාති, තං මුඤචිතවා අඤඤං ගණහාති**" යනු මෙසේ ඔහු ගතයුතු අත්තක් නොලැබූ විට බිමට බසියි යනුයි. ඉක්බිති "ඒ මහාවනයේ හැසිරෙමින් ඒ ඒ අතු අල්ලා ගනිමින් ම හැසිරේ"යැයි අර්ථ දක්වන ලදී. "**එවමෙව ඛො**" යනු මේ දැක්වූ උපමාව සන්සන්දනය කිරීමයි. ආරණ්‍ය මහාවනය අරමුණු වනයක් මෙන් දතයුතුයි. ඒ කැළයේ හැසිරෙන වඳුරා යනු අරමුණු වනයෙහි හටගන්නා සිතයි. වඳුරා අතු අල්ලා ගැනීම මෙන් සිත අරමුණුවල එල්බෙයි. යම්සේ ඒ කැළයේ හැසිරෙන වඳුරා ඒ ඒ අතු අත්හැර, වෙන වෙන අතු අල්ලා ගනියි ද මෙසේ මේ අරමුණු නමැති වනයේ හැසිරෙන සිත ද කිසිවිටෙක රූපාරම්මණය ගෙන උපදියි. කිසිකලෙක ශබ්දාදී වෙනත් අරමුණු ගෙන උපදියි. කිසිවිටෙක අතීත වූත්, අනාගත වූත්, ප්‍රත්‍යුත්පන්න වූත් අරමුණු ගෙන උපදියි. එසේම කිසිවිටෙක ආධ්‍යාත්මක

වූත්, කිසිවිටෙක බාහිරවූත් අරමුණු ගෙන උපදියි. යම්සේ "ඒ කැළයේ හැසිරෙන වඳුරා අත්තක් නොලැබ බිමට බැස සිටින්නේය"යි කිවනොහැක. එක් අත්තක් අල්ලාගෙන ම සිටින්නේය. මේ අයුරින් ම අරමුණු වනයෙහි හැසිරෙන සිත ද "එක් එලඹිය යුතු අරමුණක් නොලැබ උපන්නේයැ"යි කිව නොහැක. පසිඳුරන්ගෙන් කිසියම්ම හෝ එක් අරමුණක් ලබාගෙනම සිත උපදින්නේ යැයි දතයුතුයි. මෙපමණකින් භාග්‍යවතුන් වහන්සේ රූපයෙන් බැහැර කර අරූපයෙහි සිත පිහිටුවන ලද සේක. අරූපයෙන් බැහැර කර, රූපයෙහි සිත පිහිටුවන ලද සේක. දැන් මේ දෙකින්ම බැහැර කරනු කැමතිසේක්, "තත්‍ර භික්ඛවෙ! සුතවා අරියසාවකො"යි දේශනාව ඇරඹි සේක. මෙහි අර්ථ විස්තරය සර්පදෂ්ඨ උපමාවෙන් දතයුතුයි.

එක් පුරුෂයෙක් සර්පයකු විසින් දෂ්ඨ කරන ලදී. ඉක්බිති "ඔහුගේ විෂ ඉවත් කරන්නෙමි"යි කියා එක් වෛද්‍යවරයෙක් අවුත්, වමනයක් කරවා "යට ගුරුළාය. මත්තෙහි නාගයායැ"යි මන්ත්‍ර පිරිවහා විෂ මතුපිටට ගෙනාවේය. ඔහු ඒ විෂ රෝගියාගේ ඇස් ප්‍රදේශය දක්වා පැමිණි බව දැන, "මින් උඩ නැංවීමට ඉඩ නොදෙන්නෙමි. දෂ්ඨකල තැනටම විෂ ගෙනයමි"යි කියා එසේ කරයි. නැවත "මත්තෙහි ගුරුළාය. යට නාගයායැ"යි මන්ත්‍ර පිරිවහා කණෙහි දුම් දී දණ්ඩකින් ගසා විෂ බැහැර කරවා, නැවත දෂ්ඨ කළ තැනම තැබීය. ඔහුගේ තුවාලයේම එය සිටි බව දැන බෙහෙත් ආලේපයකින් විෂ මැඩපවත්වා, නහවා "සුවපත් වේවා!"යි කියා තමා කැමති තැනකට ගියේය. එහි සර්පයා විසින් දෂ්ඨකළ රෝගියාගේ කයෙහි විෂ පිහිටි තැන මෙන්, මේ භික්ෂූන්ගේ රූපයේ අධිකව අල්ලාගැනීම දතයුතුයි. දක්ෂ වෙදා මෙන් තථාගතයන් වහන්සේගේ පහළවීම දතයුතුයි. මන්ත්‍ර පිරිවහා උඩට විෂ රැගෙන ගිය අවස්ථාව මෙන් ඒ භික්ෂූන් වහන්සේලාගේ රූපමය ග්‍රහණයෙන් බැහැර කරවා අරූපයෙහි පිහිටවූ අවස්ථාව දතයුතුයි. ඇස් ප්‍රදේශය දක්වා නංවන ලද විෂ ඉන් උඩට යානොදී, නැවත මන්ත්‍ර බලයෙන් දෂ්ඨ කළ තැනට ගෙනවුත් තැබුවාක් මෙන් ශාස්තෘන් වහන්සේ, ඒ භික්ෂූන් වහන්සේලාගේ සිත අරූපග්‍රහණයෙන් මුදවා රූපයෙහි පිහිටවූ අවස්ථාව දතයුතුයි. දෂ්ඨ කළ තැන සිටි විෂ, බෙහෙත් ආලේපයකින් මැඩ පැවැත්වූවාක් මෙන් රූප-අරූප ග්‍රහණ දෙකින්ම මුදනු කැමතිසේක් මේ දේශනාව ආරම්භ කළ අවස්ථාව දතයුතුයි. එහි "**නිබ්බිඳං විරජ්ජති**" යනුවෙන් මේ මාර්ගය පවසන ලදී. "**විරාගා විමච්චති**" යනු ඵලයයි. විපාකයයි. "**විමුත්තසමිං**" ආදී වශයෙන් ප්‍රත්‍යවේක්ෂණාව පවසන ලදී.

පළමු සූත්‍රයයි.

12. 7. 2.

දෙවැනි සූත්‍රයේ "සුඛවෙදනීයං" යනු සැප වේදනාවේ ප්‍රත්‍යයයි. හේතුවයි. "එසසං" යනු චක්ඛු ස්පර්ශාදියයි. චක්ඛු ස්පර්ශය, සැප වේදනාවට ප්‍රත්‍යයක් නොවන්නේද? සහජාත ප්‍රත්‍යයෙන් නොවේ. උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් වනාහී ජවන වේදනාව ඇතිවේ. ඒ සඳහා මෙය කියන ලදී. සෝත ස්පර්ශාදියෙහි ද මේ ක්‍රමයමයි. "තජජං" යනු එයින් හටගත් ඒ රූපයයි. ඒ ස්පර්ශයේ අනුරූපයකි යන අර්ථයි. "දුකඛ වෙදනීයං" යනාදිය ඉහත පැවසූ පරිදිම දත යුතුයි. "සංඝටට සමොධානා" යනු ගැටීමෙන් හා එක්වීමෙන් ද, ගැටී එකට සම්පිණ්ඩනය වූ යන අර්ථයි. "උසමා" යනු උණුසුමයි. උෂ්ණාකාරයයි. "තෙජෝ අභිනිඛඛත්තති" යනු ගිනිසිළු පිටවේයැයි නොගත යුතුයි. උණුසුම් ආකාරයට ම යෙදුණු තවත් වදනකි මෙය. එහි "දවිනනං කටඨානං" යනු ගිනි උපදවන දඬුදෙකින්. එහි - යට දණ්ඩ වස්තුව, (ඉන්ද්‍රිය) මෙනි. උඩ දණ්ඩ අරමුණ මෙනි. ඒ දෙක ගැටීම නම් ස්පර්ශයයි. එහි ප්‍රතිඵලය වන උණුසුම යනු වේදනාවයි.

දෙවැනි සූත්‍රයයි.

12. 7. 3

තෙවැනි සූත්‍රයේ - "චතතාරෝ මෙ භිකඛවෙ! ආහාරා" යනාදිය පෙර කියන ලද පරිදිමය. මේ සූත්‍රයේ අර්ථොත්පත්තිය බහාතැබිය යුතු හෙයින් එය දක්වා, මෙහි පෙර විස්තර නොකළ පදයන්ගේ විවරණ පමණක් දක්වමු. කුමක් අරභයා මේ සූත්‍රය දේශනා කළේ ද? ලාභසත්කාර අරභයායි. භාග්‍යවතුන් වහන්සේට වනාහී මහත් ලාභසත්කාර ඇතිවිය. යම්සේ සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පුරා පුරන ලද දානපාරමිතා රාශියේ ප්‍රතිඵල වශයෙනි. සෑම දිසාවකින් ම මහවැසි දෙක බැගින් පැන නැගී මහා සැඩ පහරක් ඇතිවූවාක් මෙන් සියලු පාරමිතාවෝ, "එකම ආත්ම භාවයක විපාක දෙන්නෙමු"යි එක්රැස් වී ලාභසත්කාර නමැති මහසැඩ පහරක් හටගත්තේ ය. ඒ ඒ දෙසින් ආහාරපාන, යාන, වස්ත්‍ර, මල් ගඳවිලවුන් ආදිය ගත් අත් ඇතිව ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදීහු අවුත් "බුදුරජාණන් වහන්සේ කොතැනද?" "භාග්‍යවතුන් වහන්සේ කොතැනද?" "දෙවියන්ට දෙවි වූ උතුමා කොතැනද?" "අති උතුම් මිනිසා කොතැනද?" "පුරුෂ ශ්‍රේෂ්ඨයා කොතැනද?"යි භාග්‍යවතුන් වහන්සේ ම සොයා යති. කරත්ත

සිය ගණනින් ප්‍රත්‍ය පුරවාගෙන අවුත්, දෙව්රමෙහි අවසරයක් නොලැබ හාත්පස ගවුවක් පමණ ප්‍රදේශයේ කරත්ත වියගසෙන් වියගස ගැටෙන සේ තබා අසූක විහැ බ්‍රාහ්මණාදීහු මෙන් ලුහුබැඳ සිටිත්. මේ විස්තර සියලු බසූකයන්හිද ඒ ඒ සූත්‍රයන්හිද පැමිණි අයුරින් දතයුතුයි. භාග්‍යවතුන් වහන්සේට මෙන් ම භික්ෂු මහා සංඝයාට ද මෙම ලාභසත්කාර ඇතිවිය. එනිසා මෙය කියන ලදී. "එසමයේ භාග්‍යවතුන් වහන්සේට සත්කාර කරන ලද්දේ, ගරුකරන ලද්දේ, පුදන ලද්දේ, පූජාකරන ලද්දේ, අපචායනය කරන ලද්දේ, සිවුරු-පිණ්ඩපාත-සේනාසන-ගිලන්පස බෙහෙත් පිරිකර ආදිය ලබන සුළු වූයේ වේ. භික්ෂු සංඝයාටද සත්කාර කරන ලද්දේ, ගරු කරන ලද්දේ -පෙ- වේ." එසේම "චුන්දය! යම්සේ දැන් මේ ලෝකයේ පහළ වූ යම් සමූහයක්, ගණයක් වේනම්, චුන්දය! භික්ෂු සංඝයා මෙන් ලබන ලද ලාභ, කීර්ති ප්‍රශංසාදියෙන් යුක්ත වූ අන්‍ය සමූහයක් හෝ ගණයක් මම නොදකිමි." මෙලෙසින් භාග්‍යවතුන් වහන්සේට ද භික්ෂු මහා සංඝරත්නයට ද උපන් (මහා සැඩපහර දෙකක් බඳු) ලාභ සත්කාර දෙක එක්වී, මහා නදී දෙකක ජලපාර මෙන් අප්‍රමාණ විය.

ඉක්බිති ශාස්තෘන් වහන්සේ තනිව හුදකලා වූ සේක් මෙසේ සිතූ සේක. "අතීත බුදුවරුන්ට ද ලාභසත්කාර ලැබීම් මේ අයුරින් ම සිදුවිය. අනාගත බුදුවරුන්ට ද මෙසේම සිදුවේ. කිම භික්ෂූන් වහන්සේලා රසවත් ආහාරපාන ලැබ, සිහිකල්පනා ඇතිව රාගාදිය දුරුකරමින් සිවුපසය පරිභෝජනය කිරීමට සමත්වේද? අසමත්වේද?"යි යනුවෙනි. මෙසේ විමසා බැලූ බුදුපියාණන් වහන්සේ දැන් අලුත පැවිදි වූ ඇතැම් කුලපුත්‍රයෝ ප්‍රත්‍යවේක්ෂා නොකර ආහාරපානාදිය පරිභෝජනය කරනු දුටුසේක. එය දැකීමෙන් පසු බුදුපියාණන් වහන්සේට මේ අදහස පහළවිය. "මවිසින් සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පුරා පාරමීදම් පිරූයේ හුදෙක් චීවරාදී ප්‍රත්‍ය ලැබීමට නම් නොවේ. උතුම් ඵලය වූ අර්හත් බව පිණිසම පුරන ලද්දේය. මේ භික්ෂූහු මා ළඟ පැවිදි වූවෝ චීවරාදී ප්‍රත්‍ය ලබාගැනීමට ම නොවෙති. අර්හත් ඵලය සාක්ෂාත් කරගැනීමට ම පැවිදි වූහ. දැන් ඔවුහු මා දක්වූ අසාර දෙය සාර ලෙසත් සාර දෙය අසාර ලෙසත් ගනිති"යි බුදුරදුන්ට ධර්මසංවේග පහළවූ සේක. අනතුරුව මෙසේ සිතූසේක. "ඉදින් මට පස්වන පාරාජිකාවක් පැණවිය නොහැක. ප්‍රත්‍යවේක්ෂා නොකර ආහාර ගැනීම පස්වන පවිති ඇවතක් ලෙස සමාන වුවත්, මේ ආහාර ගැනීම් ආදිය පුහුදුන් සත්ත්වයන්ගේ නිත්‍ය අවශ්‍යතාවක් වන බැවින් එසේ පැණවිය නොහැක. මෙය පස්වැනි පාරාජිකාව මෙන් දේශනා කළ කල්හි,

අනාගතයේ එය සිහිපත් කරන භික්ෂූන් වහන්සේලා ප්‍රත්‍යවේක්ෂා කරමින් සිවුපසය වළඳන්නෝ ම ය. උන්වහන්සේලා මෙසේ ධර්මයේ දායසන්ව, සංවරයෙන් යුක්තව, තම සීමාව මැනවින් දැනගනිති. මේ අර්ථෝත්පත්තිය සඳහාම මෙම පුත්තමංස උපමා සූත්‍රය දේශනා කළ සේක.

එහි "**චත්තාරෝ මෙ භික්ඛවෙ! ආහාරා**" යනාදිය ඉහත පැවසූ පරිදිම අර්ථ දැනගත යුතුය. සතර ආහාරයන් දක්වා දැන් ඒවායේ ආදීනව දක්වීමට "**කථඤ්ච භික්ඛවෙ! කබලිංකාරෝ ආහාරෝ දට්ඨබ්බෝ**" යනාදිය දේශනා කළ සේක.

එහි - "**ජයම්පතිකා**" යනු අඹුව හා සැමියාය. "**පරිත්තං සම්බලං**" යනු බත් මුලක්, අත්සුණු, අග්ගලා යනාදී අනිකුත් අල්ප මාර්ගෝප-කරණයන්ය. "**කන්තාර මග්ගං**" යනු කාන්තාරය මැදින් වූ මාර්ගයට. කාන්තාරයේ වූ මාර්ගය. කාන්තාර පහකි. චෝර කාන්තාරය, වාළ කාන්තාරය, අමනුෂ්‍ය කාන්තාරය, නිරුදක කාන්තාරය හා අල්ප භක්ෂ කාන්තාරය යනුවෙනි. යම් කාන්තාරයක සොරබිය ඇත්නම් ඒ චෝර කාන්තාරයකි. යම් කාන්තාරයක සිංහ, ව්‍යාඝ්‍රාදී නපුරු-දරුණු සත්තු සිටිත් නම් ඒ වාළ කාන්තාරයයි. යම් කාන්තාරයක වළවාමුබ යක්ෂණිය වැනි අමනුෂ්‍යයන්ගේ වශයෙන් භයක් වේනම් ඒ අමනුෂ්‍ය කාන්තාරය නම් වේ. බීමට හෝ නෑමට දියපොදක් නොමැති කාන්තාරය, "නිරුදක" නම් වේ. යම් කාන්තාරයක කෑයුතු හෝ බුදියයුතු දෙයක්වත්, යටත් පිරිසෙයින් කඳ-මුල් ආදියක්වත් නොමැත්තේද ඒ අල්ප භක්ෂ කාන්තාරය නම් වේ. යම් තැනක වනාහී මේ පස්වැදෑරුම් බිය ඇතිවන්නේ ද එය කාන්තාරයක්මය. මෙබඳු වූ යම් ප්‍රදේශයක් දින දෙකතුනකින් ඉක්මවිය හැකිනම් එබඳු ප්‍රදේශය මෙහිදී අදහස් නොවේ. මේ සූත්‍රයේදී නිරුදක වූත් අල්පභක්ෂ වූත් යොදුන් සීයක් පුරා පැතිර සිටි මහා කාන්තාරයක් අදහස් කරන ලදී. එබඳු වූ කාන්තාර මාර්ගයක් "**පටිපජ්ජෙය්‍යුං**" යනු සාගිනි බියෙන් ද රෝග බියෙන් ද එසේම රාජ බියෙන් ද යන උපද්‍රවයන්ගෙන් මිදීමට මගට බැස - "මේ කාන්තාරය තරණය කර, වෙනත් රටක ධාර්මික වූ රජෙකු යටතේ නිරුපද්‍රිතව සුවසේ වෙසෙමු"යි සිතමින් "**එකපුත්තකො**" යනු ඔසවා ගත් අනුකම්පා කළයුතු, අස්ථිර වූ ශරීරයක් ඇති (ඉතා ළදරු වූ) එක් පුතෙකු "**වල්ලූරඤ්චෙව සොණ්ඩිකඤ්ච**" ඝන වූ තද වූ අර්ථයෙන් ගෙන වියලිමස්, ඇට-නහර ආශ්‍රිත වූ ඇටමස් යන අර්ථයි. "**පතිපිංසෙය්‍යුං**" යනු පහර දෙන්නාහුය. "**කහං එකපුත්තකා**"

යන මෙය ඒ මවුපිය දෙදෙන වැළපෙන ආකාරයයි. මේ දක්වූයේ සිදුවූ පුවතෙහි පැමිණි සූත්‍රාගත වචනවල සංක්ෂිප්ත අර්ථ වර්ණනාවයි.

දැන් කථාව සංක්ෂිප්තව දක්වමු. අඹුසැමි දෙදෙන තම පුතා ද රැගෙන අල්ව වූ මාර්ගෝපකරණ සහිතව යොදුන් සීයක් වූ කාන්තාර මාර්ගයට පැමිණියහ. ඔවුන් ගෙනා මාර්ගෝපකරණ යොදුන් පනහක් ගිය තැන නිමාවට පත්විය. ඔවුහු සා පිපාසා දෙකින් පීඩිතව දුර්ලභ ගස් සෙවනක හිඳගත්හ. පුරුෂයා භාර්යාවට මෙසෙ කීවේය. "සොඳුර! මේ හාත්පස පනස් යොදුනක් යනතෙක් ගමක් හෝ නියම්ගමක් හෝ නැත. එනිසා පුරුෂයකු විසින් කළයුතු සීසෑම්-ගවරක්ෂණාදියක් මාහට දැන් කළ නොහැක. එන්න. මා මරා මගේ ශරීරයෙන් භාගයක් කා, ඉතිරි භාගය මාර්ගෝපකරණ ලෙස ගෙන පුතා සමග කාන්තාරය තරණය කරන්න"යි පැවසූ වදන් ඇසූ බිරිඳ "ස්වාමීනි! මවිසින්ද දැන් ස්ත්‍රියක විසින් කළයුතු වූ නූල්කැටීම් ආදී ජීවනෝපායක් කළ නොහැක. එන්න. මා මරා ශරීරයෙන් අඩක් කා, ඉතිරි අඩ මාර්ගෝපකරණ ලෙස ගෙන පුතා සමග සුවසේ කාන්තාරයෙන් එතරවන්න"යි කීවාය. එය ඇසූ සැමියා නැවත බිරිඳට මෙසේ කීවේය. "සොඳුර! ස්ත්‍රියගේ මරණය සිදුවුවහොත් දෙදෙනෙක් මරණයට පත්වේ. මේ ළදරු කුමරා මව නොමැතිව ජීවත්වීමට අසමත් වේ. ඉදින් අපි දෙදෙනම ජීවත්වෙමු නම් නැවත දරුවකු ලබාගන්නෙමු. එනිසා අපි පුතා මරා මස් කා කාන්තාරය තරණය කරමු" යනුවෙනි. එවිට මව තම පුතුට මෙලෙස කීවාය. "පුතේ ! පියා ලඟට යන්න" දරුවා පියා ලඟට ගියවිට, පියා "මවිසින් මේ පුතණුවන් නොයෙක් ගොවිතැන්-ගවරක්ෂණාදී කර්මාන්තවල යෙදීමෙන් අනල්ප වූ දුක් විඳිමින් පෝෂණය කළෙමි. මම පුතා මැරීමට අසමත් වෙමි. නුඹම නුඹේ පුතා මරව"යි කියා දරුවාට "පුතේ ! අම්මා වෙත යන්න"යි කීවේය. දරුවා නැවත මවු ලඟට ගියේය. එවිට මවු ද "මවිසින් පුතෙකු ප්‍රාර්ථනා කරමින් ගෝවෘත, සුනබවෘත, දෙවියන්ට කන්නලවු කිරීමාදියෙන් අනල්පවූ දුක් නුඹ ලබාගැනීමට වින්දෙමි. නුඹ කුසදරණ කාලයේ විඳි දුක් ගැන කියනු කිම? මේ පුතු මැරීමට මම අසමත් වෙමි"යි කීවාය. මෙලෙස මේ මවු-පිය දෙදෙන වෙත යමින් ම දරුවා මැරී වැටුණි. ඔවුහු එය දක හඬා වැලපී සූත්‍රයේ දැක්වෙන අයුරින් මස් ගෙන කමින් පිටත්ව ගියහ.

ඔවුන්ගේ ඒ පුත්‍ර මාංශය කාරණා නවයකින් පිළිකුල් සහගත වේ. ක්‍රීඩා පිණිස හෝ මදය පිණිස හෝ අලංකාරය පිණිස හෝ සැරසීම පිණිස හෝ නොව හුදෙක් කාන්තාරයෙන් එතෙරවීම සඳහා ම ඔවුහු එය

අනුභව කරති. කවර කාරණා නවයකින් එම ආහාරය පිළිකුල් කටයුතු වේද? තම වර්ගයේම අයෙකුගේ මස් බැවින්, සිය ඥාතියකුගේ මස් බැවින්, තම එකම පුතුගේ මස් බැවින්, ප්‍රිය වූම පුතුගේ මස් බැවින්, ළදරු මස් බැවින්, අමු මසක් බැවින්, නොකෑ යුතු මසක් බැවින්, ලුණු නැති මසක් බැවින්, නොපිසූ මසක් බැවින් යන කරුණු නවයෙනි. මෙසේ ආකාර නවයකින් පිළිකුල් වූ ඒ මස් ඔවුහු දෙදෙන ඇලී ගිජුව ගෙන නොම අනුභව කළහ. මධ්‍යස්ථ වූම නොකැමති විරාගී පරිභෝජන සිතින් යුක්තවම අනුභව කළහ. ඔවුහු දරුවාගේ සිරුරේ ඇට, නහර, සම් ආදිය ආශ්‍රිත වූ අපද්‍රව්‍ය බැහැර කර, තරවූ දැඩිවූ හොඳ මස්ම තෝරාගෙන අනුභව නොකළහ. අතට පැමිණි මසක්ම ගෙන අනුභව කළහ. මදින්මද ඒ ඒ දිනට යැපීම් පමණට ම මස් අනුභව කළහ. ඔවුනොවුන් කෙරෙහි මසුරු-ලෝභ සිතින් නොම අනුභව කළහ. දුරුවූ මසුරුමල ඇති, පිරිසිදු වූ සිතින්ම එය අනුභව කළහ. "අනික් කිසියම් මුව මසක් හෝ මොණර මසක් හෝ එවැනි අනික් මසක් කමු"යි නොමුලාව ම අනුභව කළහ. මෙය මා ප්‍රිය පුතුගේ ම මාංශය යැයි දැන දැනම අනුභව කළහ. එපමණක් නොව, "අනේ අපිට මෙබඳු වූ තවත් පුතෙකුගේ මාංශයක් කෑමට ලැබේවා!"යි ප්‍රාර්ථනා නොකර ම මේ මස් අනුභව කළහ. කිසිදු පැතුමක් නොමැතිවම ආහාරය අනුභව කළහ. "මේ කොටස කාන්තාරයේදී අනුභව කර, ඉතිරි කොටස කාන්තාරය නිමවූ පසුව ගමට ගොස් ලුණු-ඇඹුල් යොදා රසකර කන්නෙමු"යි මස් ඉතිරි කරගෙන අනුභව නොකළහ. කාන්තාරය අවසන් වූ කෙණෙහිම "නුවර මහජනයා දකී"යැයි ඉතිරි මස් වළ දමූහ. නැතිනම් ගින්නට දමූහ. "වෙන අන් කිසිවෙක් අප මෙන් තම පුතුගේ මස් කෑමට නොලැබුවෝයැ"යි තමා ගැන මානයක් හෝ ආඩම්බරයක් නොදක්වූහ. නිහතමානීව, නිරහංකාරව ම එය අනුභව කළහ. "මේ ලුණු නැති, ඇඹුල් නැති, නොපිසූ, දුගඳ හමන ආහාරයෙන් කවර වැඩක් ද?"යි පිළිකුල් කරමින් අනුභව නොකළහ. "පිළිකුල" දුරින්ම දුරුකර අනුභව කළහ. "මේ නුඹේ භාගයයි." "මේ මගේ භාගයයි." "නුඹේ පුතා" "මගේ පුතා" යනුවෙන් ඔවුනොවුන්ට අවමන් කරමින් අනුභව නොකළහ. සමගි සමාදානයෙන් යුක්තව ම එම මස් අනුභව කළහ. ඔවුන්ගේ මේ "නිවඡනඩවිරාගී පරිභෝජනය" සළකා බලන ශාස්තෘන් වහන්සේ භික්ෂු සංඝයාට ද ඒ කාරණය ම අනුදන වදාරන සේක්, "තං කිං මඤ්ඤථ භික්ඛවෙ! **අපිනු තෙ දවාය වා ආහාරං** ආහරෙයුං" යනාදිය දෙසූහ.

එහි "දවාය වා" ආදී පදයන්ගේ විස්තර විශුද්ධි මාර්ගයේ විස්තර

කළ පරිදිම දතයුතුයි. "**කන්තා රසසා**" යනු පසුකොට ගොස් ඉතිරි වූ කාන්තාරයේ "**එවමෙව ඛො**" යනු "පිළිකුල් කටයුතු නවාකාර වශයෙන් ම ප්‍රියවූ පුත්‍ර මාංශය හා සමානකර දැකිය යුතුයි" යන අර්ථයයි. ඒ කවර නවයක්ද?

ගමනාගමන වශයෙන්, ගෙයක් පාසා සෙවීම් වශයෙන්, පරිභෝග වශයෙන්, පිත්තාදීන්ට ආශ්‍රයවීම් වශයෙන්, තැන්පත් වන ස්ථාන වශයෙන්, නොපැසීම් වශයෙන්, පැසීම් වශයෙන්, ගලායෑම් වශයෙන් හා ගැල්වීම් වශයෙනි.

මෙසේ පිළිකුල් වශයෙන් ප්‍රත්‍යවේක්ෂා කරමින් ම කබලිංකාර ආහාරය පිළිගනියි. මෙම ගමනාගමනාදී වශයෙන් එන පිළිකුල් බව පිළිබඳ දීර්ඝ විස්තර විශුද්ධිමාර්ගයේ ආහාර ප්‍රතිකූල සංඥා නිර්දේශයේ විස්තර කරන ලද්දේමය.

මෙසේ මේ නවාකාර ප්‍රතිකූලයන්ගේ වශයෙන් පුත්‍ර මාංශය උපමා කරගෙන ආහාර අනුභව කළයුතුයි. යම්සේ අඹුසැමි යුවල පිළිකුල් වූ පුතුගේ මාංශයම අනුභව කරන ලද්දේ එහි ඇලී-ගිජු සිතින් නොවේ. මධ්‍යස්ථ භාවයෙන් හා දුරුකළ ඡන්ද-රාග ඇතිවම එය අනුභව කළාක් මෙන් භික්ෂුව ද සිවුපස පරිභෝජනය කිරීමේදී "ඡන්ද-රාග දුරුකළ මැදහත් සිත" පවත්වාගත යුතු වේ. එම දෙමාපිය දෙදෙන ඇට, සම්, නහර මිශ්‍රිත වූ මස් කොටස් බැහැරලා, තද-දඩි වූ හොඳ හොඳ මස්ම අනුභව නොකර, අතට පැමිණි මසක්ම අනුභව කිරීම මෙන් භික්ෂුව ද නීරස බත් ව්‍යඤ්ජනාදිය පිටි අත්ලෙන් බැහැර කර, වටුමස්-කුකුල්මස් ආදිය සීමාවක් නොදන පිළිගෙන ඒ ගිතෙල් මස් ආදියෙන් යුතු රසවත් ආහාරම සොයා අනුභව නොකර, සිංහයකු මෙන් පිළිවෙලක් සහිතව අනුභව කළ යුතුය. යම්සේ ඒ දෙමාපිය දෙදෙන ගෙල ලඟට ම ආහාර නොගෙන එක් එක් දිනට යැපෙන පමණට මදින් මද ආහාර අනුභව කළේ ද එලෙසින්ම භික්ෂූන් වහන්සේ ද ආහාරහට්ඨකාදී බමුණන් මෙන් කුස පිරියන තරම් ආහාර නොගෙන, සතර පස් පිඬකට ඉඩ තබා ධර්මසේනාපති සැරියුත් මහතෙරුන් මෙන් වැළඳිය යුතුයි.

තෙරුන්වහන්සේ වනාහී අවුරුදු හතලිස් පහක් වැඩ වසමින් පසුබත් කල, ඇඹුල්රස උගුරට එන පරිදි කිසිදිනෙකවත් ආහාර නොගත් බව සිංහනාද කරමින් පවසන සේක් මේ ගාථාව වදාළහ.

චතුතාරෝ පඤ්ච ආලොපෙ අභුඤා උදකං පිවෙ
අලං ඵාසු විහාරාය- පහිතත්තසස භික්ඛුනො

"කුසේ සතර-පස් පිඩකට ඉඩ තිබියදී ආහාර අනුභව නොකර ජලය පානය කළෙමි. නිවණ පිණිස මෙහෙයූ-වීර්ය වඩන්නා වූ සිත් ඇති භික්ෂුවගේ පහසු විහරණයට මෙනිසා හැකියාව ලැබේ."

ඒ අඹුසැමියෝ දෙදෙන ඔවුනොවුන්ට මසුරුසිත් නූපදවා, දුරුකල මසුරු සිත් ඇතිව, පිරිසිදු සිතින් ම පුත්‍ර මාංශය අනුභව කළාහුද එපරිද්දෙන්ම පිණ්ඩපාතය ලැබ ඒ පිළිබඳ මසුරුසිත් නොමැතිව; "මේ සියල්ල ගන්නහුට මේ සියල්ලම දෙමි. මින් අඩක් ගන්නහුට ඒ අඩ දෙමි. ඉදින් අන්‍යයන් රැගෙන ඉතිරි වූ දෙයක් වේනම් එය තමා විසින් අනුභව කරන්නේය" යන සාරාණීය (සිහිකටයුතු) ධර්මයේ පිහිටියහු විසින් ම ආහාර අනුභව කළයුතු වන්නේය.

ඒ අඹුසැමි දෙදෙන "අනික් කිසියම් මුව-මොණර ආදී රසවත් මාංශයකි"යි මුළාවට පත්නොවී, "මේ පුත්‍ර මාංශය මයැ"යි දැන දැනම අනුභව කළාක් මෙන් පිණ්ඩපාතය ලැබ; "මම ආහාර ගනිමි. අනුභව කරමි" යැයි ආත්ම දර්ශනයේ පිහිටා මුලාවීමට අවසර නොදී, "මේ කබලිංකාහාරය, සිවුමහාභූතමය වූ මේ කය තමා විසින්ම පෝෂණය කරන්නේ ය"යි නොදනී. මේ සිවුමහා භූතමය කය ද කබලිංකාර ආහාරයෙන් මා වර්ධනය වන්නේ යැයි නොදනී. යනුවෙන් මෙසේ නොමුලාව අනුභව කළ යුතුයි. සති සම්ප්‍රජඤ්ඤ වශයෙන් හෝ නොමුලා වී වැළඳිය යුතුයි. එසේම දෙමාපිය දෙදෙන - "අනේ අපට නැවතත් මෙබඳු පුත්‍ර මාංශයක් කෑමට ලැබේවා!"යි ප්‍රාර්ථනා නොකොට, මෙබඳු පැතුමක් නොමැතිවම අනුභව කළේද, ඒ අයුරින්ම භික්ෂුව ප්‍රණීත භෝජනයක් ලැබ, "අනේ හෙටත්, ඉන් පසුවත් මෙබඳු ම ආහාර ලැබේවා!"යි යනුවෙන් ද, නීරස ආහාරයක් ලැබ "අනේ ඊයේ මෙන් අද රස භෝජනයක් නොලැබුණේයැ"යි යනුවෙන්ද ප්‍රාර්ථනා කිරීම හා ශෝක කිරීම යන දෙකම තණ්හා දුරුකළ භික්ෂූන්ට නුසුදුසුය.

"අතීතං නානු සොචාමි නපප ජපපාන මනාගතං
පවවුපපනෙන න යාපෙමි- තෙන වණෙණා පසීදති"

"අතීතය පිළිබඳව ශෝක නොකරමි. අනාගතය පිළිබඳ කල්පනා ඇතිකර නොගන්නෙමි. වර්තමානයේ ම යැපෙමි. ජීවත් වෙමි. එයින් සිරුර පැහැපත් වේ.

මෙසේ අවවාද සිහිකරන්නහු විසින් "වර්තමානයේ ම යැපෙමි"යි ආහාර වැළඳිය යුතුයි. මවුපිය දෙදෙන, "මේ මස් කොටස කාන්තාරයේදී අනුභව කර, ඉතිරි කොටස ගමකට පැමිණ ලුණු-ඇඹුල් යොදා රසට කමු"යි තැන්පත් නොකළහ. කාන්තාරය නිමවූ විහා "නුවර ජනයා දකිවි"යැයි බියෙන් ඉතිරි වූ මාංශ පොළවෙහි සැඟවූහ. ගින්නට හෝ දැමූහ. මේ අයුරින් ම

අනහානමථෝ පාණානං බාදනීයානං අථොපි වත්ථානං
ලද්ධන සනනිධිං කයිරා නව පරිතසෙස තානි අලහමනෝ

"ආහාර පානයන් ද කෑයුතු-බුදිය යුතු දේ ද වස්ත්‍රාදිය ද ලැබ ඒවා රැස්කිරීම නොකල යුතුයි. ඒවා නොලැබුණුවිට ශෝකකිරීම ද නොකළ යුතුයි." යනාදී මේ අවවාද සිහිකරන්නවුන් විසින් සිවුපසයෙන් තමාට යමක් ලැබේද එයින් යැපෙන පමණක් ගෙන, ඉතිරිය අන්‍ය සබ්‍රහ්මචාරීන්ට දී රැස් කිරීමෙන් තොරව සිවුපස පරිභෝජනය කළයුතුයි.

මාපිය දෙදෙන, "අනික් කිසිවකු අප මෙන් මෙබඳු වූ පුත්‍ර මාංශයක් කෑමට නොලැබුවෝය"යි මානයක් හෝ ආඩම්බරයක් හෝ නූපදවා, නිහතමානීව-නිරහංකාරවම එය අනුභව කළහ. මේ අයුරින් ම රස භෝජනයක් ලැබ, "මම වනාහී ඉතා උසස් සිවුරු, පිණ්ඩපාත ආදිය ලබන්නෙමු"යි මානයක්-ආඩම්බරයක් නොකළ යුතුයි. "මේ පැවිද්ද සිවුරු ආදී හේතුවක් නිසා නොව රහත්බව පිණිසමයැ"යි ප්‍රත්‍යවේක්ෂා කර දුරුවූ මාන දර්ප ඇතිව සිවුපස පරිභෝජනය කළ යුතුයි.

ඒ මාපිය දෙදෙන - "මේ ලුණු නැති, ඇඹුල් නැති, නොපිසූ, දුඟද හමන ආහාරයෙන් කවර වැඩක් ද?"යි පිළිකුල් නූපදවා, පිළිකුල දුරුකර මාංශය අනුභව කළහ. ඒ අයුරින්ම භික්ෂුව පිණ්ඩපාතය ලැබ, "මේ රූක්ෂ වූ නීරස වූ අශ්ව, ගවාදීන්ට දෙන ආහාර වැනි වූ - ආහාරයෙන් කවර ප්‍රයෝජනයක්ද? මෙය ප්‍රාණීන් සහිත දොළකට දමවු"යි කියා පිණ්ඩපාතය විසිකිරීම හෝ, "මෙය අනුභව කරනුයේ කවුද? බලු කපුටන්ට ම දෙව"යි කියා දායකයන් දුන් දානය පිළිකුල් කර ඔවුන්ට ම දීම හෝ නොකළ යුතුයි.

සපතතපාණී විචරනෙතා- අමුගො මූග සම්මතෝ
අපපං දානං න හීළෙය්‍ය- දාතාරං නාව ජානියා

"පාත්‍රය අතින් ගෙන හැසිරෙනුයේ - ගොළුවකු නොවූයේ නමුත් කිසිවකු හා කථාබහ නොමැතිව, අල්ප දානයේ දී වුවත් පිළිකුල් නූපදවා දෙන්නා වූ දායකයාට ද අවමන් නොකර පිණ්ඩපාතයේ හැසිරිය යුතුයි."

මේ අවවාද සිහිකරන්නා විසින් පිණ්ඩපාතය අනුභව කළ යුතුයි. ඒ දෙමාපියෝ "මේ නුඹගේ භාගයයි. මේ මගේ භාගයයි. මේ නුඹේ පුතායි. මේ මගේ පුතායි" යනුවෙන් ඔවුනොවුන් ඉක්මවමින් අවමන් කිරීමෙන් ඉවත් වී සමගිව සතුටින් යුක්තවම මාංශය අනුභව කළහ. එපරිද්දෙන්ම පිණ්ඩපාතය ලැබූ ඇතැම් භික්ෂූහු, "නුඹලාට දන් දෙන්නේ කවුද? නිකරුණේ ගෙදර එළිපත්ත මත පැකිළෙමින් ඇවිදින්නෙහු. නුඹලා වැපූ මව පවා නුඹලාට දන් නොදෙති. මට වනාහී ගිය ගිය තැන ප්‍රණීත වූ සිවුරු පිරිකර ලැබේ" යනුවෙන් සිල්වත් සබ්‍රහ්මචාරීහු හෙළාදකිමින්, ඔවුන්ට අවමන් කරති. ඒ සඳහා මෙය කියන ලදී. "ඒ භික්ෂුව ලාභ, ඍත්කාර, කීර්ති, ප්‍රශංසාදියෙන් අන්‍ය ශික්ෂාකාමී භික්ෂූහු පහත්කොට සිතයි. අවමන් කරයි. මහණෙනි! ඒ මෝඩ හිස් පුරුෂයාට එම කාරණය බොහෝ කාලයක් අහිත පිණිස, දුක්පිණිස හේතු වන්නේය" යනුවෙන් බුදුරජාණන් වහන්සේ වදාළහ. එනිසා මෙසේ කිසිවකුත් පිළිබඳව අවමන් නොකර, සියලු බ්‍රහ්මචාරීන් සමග සමගිව සමාදානයෙන් යුතුව සතුටින් සිවුපස පරිභෝජනය කළ යුතුයි.

"පරිඤ්ඤාතෙ" යනු ඤාත පරිඤ්ඤාව, තීරණ පරිඤ්ඤාව හා ප්‍රහාණ පරිඤ්ඤාව යැයි යන මේ ත්‍රිවිධ පරිඥාවන්ගෙන් ආහාරය පිළිබඳව පිරිසිඳ දත් කල්හිය. ඒ කෙසේද? මේ ශාසනයේ භික්ෂුවට කබලිංකාර ආහාර නම් වූ සවත්‍රුක වශයෙන් ඕජාෂ්ඨමක රූපය වේ. ඔජාෂ්ඨමක රූපය කොතැන හැපේද? ජිව්හා ප්‍රසාදයෙහි හැපේ. ජිව්හා ප්‍රසාදය කුමක් ඇසුරු කරන ලද්දේ ද? සිවුමහා භූතයන් ඇසුරුකරන ලදී. මෙසේ ඕජාෂ්ඨමක ජිව්හා ප්‍රසාදය, එහි ප්‍රත්‍ය වූ මහාභූතයෝ යන මේ ධර්ම රූපස්කන්ධය නම් වේ. එය පරීක්ෂා කිරීම් වශයෙන් උපන් ස්පර්ශය පස්වැනි කොට ඇති ධර්මයෝත්, සතර අරූපස්කන්ධ ධර්මයෝත් යන සියල්ල පංචස්කන්ධයයි. සංක්ෂිප්ත වශයෙන් නාමරූප මාත්‍රයම යැයි දනගනියි. ඔහු මේ ධර්ම ස්වකීය ලක්ෂණ වශයෙන් වෙන් වෙන්ව දක්වා, ඒ ප්‍රත්‍ය පිළිබඳව විමසා බලනුයේ අනුලෝම ප්‍රතිලෝම වශයෙන් ප්‍රතීත්‍ය සමුත්පාදය දකියි. මෙපමණකින් "කබලිංකාර ආහාරය" නමින් විස්තර වූ ප්‍රත්‍ය සහිත නාමරූප ධර්මයන්ගේ යථා ස්වභාවය දුටු බැවින් ඒ කබලිංකාර ආහාරය ඤාත පරිඤ්ඤාවෙන් පිරිසිඳ දත්තේ වේ.

උන්වහන්සේ ඒ ප්‍රත්‍ය සහිත වූ නාමරූප අනිත්‍යය, දුක්ඛය, අනාත්ම යැයි ත්‍රිවිධ ලක්ෂණයන් හ ආරෝපණය කොට සත්ත්වයන්ගේ නුවණින් සලකා බැලීම් වශයෙන් විමසයි. මෙපමණකින් මේ ත්‍රිවිධ ලක්ෂණ "ප්‍රතිවේධ විමර්ශන ඤාණ" නම් වූ තීරණ පරිඤ්ඤාවෙන් කබලිංකාර

ආහාරය පිරිසිඳ දන්නේ වේ. ඒ නාමරූප ධර්මයන් ඡන්දරාග වශයෙන් පහතට ඇදීමෙන් අනාගාමී මාර්ගය විශේෂයෙන් දැනගැනීම් වශයෙන් ප්‍රහාණ පරිඤ්ඤාවෙන් ආහාරය පිළිබඳව පිරිසිඳ දත්තේ වේ. "පඤ්චකාම ගුණිකො" යනු පඤ්චකාම ගුණයන්ගේ හටගැනීමයි. "රාගො" යනු රාගය පිරිසිඳ දත්තේ වේ. මෙහි ඒක පරිඤ්ඤාව, සර්ව පරිඤ්ඤාව හා මූල පරිඤ්ඤාව යනුවෙන් පරිඤ්ඤා තුනකි. ඒක පරිඤ්ඤාව නම් කුමක්ද? යම් භික්ෂුවක් ජිව්හා ද්වාරයෙන් එක් රස තෘෂ්ණාවක් පිරිසිඳ දැනගනියි. එයින් පංචකාම ගුණික රාගය පිරිසිඳ දැනගත්තා වෙයි. කුමක් නිසාද? එය එම වස්තුවෙහි ඉපදීම් වශයෙනි. එම තණ්හාව ම චක්ඛුද්වාරයේ උපන්නෙහි නම් "රූපරාග" නම් වේ. ශෝතද්වාරයේ උපන්නේ නම් "ශබ්දරාග" නම් වේ. සෙසු ඉන්ද්‍රියයන්හිද එම නාමය ලබයි. යම්සේ එකම සොරෙකු මාර්ග පහක පැහැරගැනීම් ආදිය සිදුකරන විට, එම සොරා අල්ලාගෙන එක මඟකදී හිස සිඳ දමූවිට මාර්ග පහම නිර්භය වූයේ වන්නේ ද එලෙසින්ම ජිව්හා ද්වාරයේ දී රස තෘෂ්ණාවෙන් පිරිසිඳ දත් "පංචකාම ගුණික රාගය" මැනවින් පිරිසිඳ දැනගත්තේ වේ. මෙය "ඒක පරිඤ්ඤාව" නම් වේ. "සර්ව පරිඤ්ඤාව" යනු කුමක්ද? පාත්‍රයේ දමන ලද පිණ්ඩපාතයෙහි එකම වූ පඤ්චකාම ගුණික රාගයක් ලබයි. ඒ කෙසේද? පිරසිඳු වූ ඒ ආහාරයේ වර්ණය බැලීමෙන් "රූපරාගය" ඇතිවේ. ගිතෙල් ආදියෙහි ලා රත්කරන කල්හි හා තෙල් ආදිය ඉසින කල්හි පට, පට යන ශබ්ද නැඟේ. එබඳු වූ කෑයුතු දේ අනුභව කරන තැනැත්තාට "මුරු, මුරු" ශබ්දය ද උපදියි. එය ආශ්වාදය කිරීමෙන් "ශබ්ද රාගය" උපදියි. දිරවීමට යොදන උපකාරක ද්‍රව්‍යයන්ගේ සුවඳ ආඝ්‍රාණය කරන්නාට "ගන්ධ රාගය" ඇතිවේ. යහපත්-ප්‍රිය රස වශයෙන් ආශ්වාද කරන්නාට "රස රාගය" ඇතිවේ. "ඉතා මෘදු ආහාරය" යැයි ස්පර්ශ කිරීම් වශයෙන් ආශ්වාදයක් ලබන්නාට "ඵස්ස (ඵොට්ඨබ්බ) රාගය" ඇතිවේ. මේ අයුරින් ආහාරයේ සිහිය පිහිටුවා විමසා බැලීමෙන් හා ඡන්ද-රාග පරිභෝජනයෙන් වෙන්ව පරිභෝග කරන කල්හි, ඔහුට සියල්ල ම පිරිසිඳ දත හැකි වේ. මෙය "සර්ව පරිඤ්ඤාව" නම් වේ. "මූල පරිඤ්ඤාව" නම් කුමක්ද? පඤ්චකාම ගුණික රාගය ඇතිවීමෙහි කබලිංකාහාරය මූලය වේ. කුමක් නිසාද? එය ඇතිකල්හි පඤ්චකාමය උපදින හෙයිනි. බැමිණිතියා සාය ඇතිවූ කාලයේ දොළොස් වසරක් ම අඹුසැමියන්ට ඔවුනොවුන් පිළිබඳ සිතක් නම් ඇති නොවිණි. කුමක් නිසාද? ආහාර මද බැවිනි. දුර්භික්ෂ කාලයක් ඇතිවූ බැවිනි. මේ දුර්භික්ෂය නිමාවී ආහාරපාන සුලබ වූ කල්හි, තම්බපණ්ණියේ හෙවත් ලංකාවෙහි යොදුන් සීයක් පමණ ප්‍රදේශය දරු උපත් නිසාම හටගත් එකම මංගල කෝලාහලයක් ඇතිවිය. මෙසේ කාමයට මුල්වූ

ආහාරය පිරිසිඳ දත් කල්හි පඤ්චකාමරාගය මැනවින් පිරිසිඳ දැනගත්තා වේ. මෙය මූල පරිඤ්ඤාවයි. "**නත්ථි තං සංයොජනං**" යනු රාගය සමග ම ප්‍රහාණය වූවක් බැවින් නැවත ප්‍රහීන කළයුත්තක් නැත යනුයි.

මෙසේ මේ දේශනාව අනාගාමී මාර්ගය දක්වාම දේශනා කරන ලදී. මෙපමණකින් අවසන් කිරීමට නොපැමිණ මේ රූපාදීන්ගේ වශයෙන්ම පඤ්චස්කන්ධයෙහි විදර්ශනාව වඩා රහත්බව දක්වා විස්තර කිරීම සුදුසුය.

පළමු ආහාර වර්ණනාව නිමාවිය.

දෙවැනි ආහාරයේ "**නිවචමම**" යනු කුරයේ පටන් අං අග දක්වා ම සියලු ශරීරයෙන් උපුටා දමන ලද සම ඇති, (සම ගලවා දැමූ) එරබදු මල් රැසක් බඳු පැහැ ඇති යනුයි. කුමක් නිසා වෙනත් ඇත්, අස්, ගව ආදී උපමාවක් නොගෙන ගැලවූ සම් ඇති එළදෙනගේ උපමාව ගත්තේද? ඉවසීමට අසමත් බව පෙන්වීම පිණිසයි. ස්ත්‍රිය වනාහී උපන් දුක් වේදනා, ඉවසීමට-දරාගැනීමට නොහැකි වේ. අසමත් වේ. මේ අයුරින් ම එස්සාහාරය ද අබලය. දුර්වලයැයි දැක්වීමට, ඊට සමවූ මෙම උපමාව දක්වන ලදී. "**කුඛඩං**" යනු ගල් බිත්ති ආදී අනෙකුත් බිත්තියයි. "**කුඛඩනිසසිත පාණා**" යනු මකුළුවෝ, හූනෝ, මීයෝ වැනි සත්තුය. "**රුකඛනිසසිතා**" යනු දළඹුවෝ වැනි සත්තුය. "**උදක නිසසිතා**" යනු මත්ස්‍ය-කිඹුල් ආදීහුය. "**ආකාස නිසසිතා**" යනු මැසි, මදුරු, කපුටු, උකුසු ආදීහුය. "**බාධෙයුං**" උදුරා කන්නේය. ඒ එළදෙන ඒ ඒ තැන් ඇසුරු කිරීමට පැමිණි ප්‍රාණීහු ශරීරය කඩාකෑමේ බියෙන් යුක්තව. තමාට සත්කාර කිරීම් වශයෙන් සිදුකෙරෙන පිටෙහි සත්තු එලවීම, සිරුර සම්බාහන කිරීම්, උණුදිය ඉසීම් ද අකමැති වන්නීය. මෙලෙසම භික්ෂුවට එස්සාහාරය මූලික කරගත්, ක්ලේශ නම් ප්‍රාණීහු කෑමේ බිය දක්වමින් තෙහුමික ස්පර්ශයෙහි විපත් කැමති වේ. "**එසෙස භිකඛවෙ! ආහාරෙ පරිඤ්ඤාතෙ**" යනු ත්‍රිවිධ පරිඤ්ඤාවන් (ආහාරය පිළිබඳ) මනාව පිරිසිඳ දත් යනුයි. මෙහිද පරිඤ්ඤා තුනකි. එහි ස්පර්ශය සංඥා ස්කන්ධයයි. සිත විඤ්ඤාණස්කන්ධයයි. ඒ වස්තු ආරම්මණයන්ගේ රූපස්කන්ධයයි. මෙසේ ප්‍රත්‍ය සහිත නාමරූපයාගේ යථා ස්වභාවය දැකීම ඤාත පරිඤ්ඤාවයි. එහිම ත්‍රිලක්ෂණය ආරෝපණය කර, සත්ත්වයන්ගේ තුවණින් බැලීම් වශයෙන් අනිත්‍යාදිය හා තුලනය කිරීම තීරණ පරිඤ්ඤාවයි. ඒ තාම රූපයෙහිම ඡන්දරාගයන් පිටතට ඇදීම් වශයෙන් ඇතිවන අර්හත් මාර්ගය ප්‍රහාණ පරිඤ්ඤාවයි.

"**තිසෙසා වෙදනා**" යනු මෙසේ ස්පර්ශාහාරයෙහි ත්‍රිවිධ පරිඤ්ඤාවන්ගෙන් පිරිසිඳ ගත් කල්හි ත්‍රිවිධ වේදනාව පිරිසිඳ දනගත්තේම වේ යනුයි. එය මූලික වූත් සම්ප්‍රයුක්ත වූත් ධර්මයක් බව අවබෝධ වේ. මෙලෙස ස්පර්ශනාහාර වශයෙන් දේශනාව රහත්බව දක්වාම දේශනා කරන ලදී.

දෙවැනි ආහාර වර්ණනාව නිමා විය.

තෙවැනි ආහාරයේ "අංගාරකාසු" අඟුරුවලකි. "කාසු" යනු රාශියයි. ආවාටයයි.

අංගාරකාසුං අපරෙ පුණනති
නරා රුදනතා පරිදඩඪ ගතතා
භයං හි මං විනදති සූත! දිසවා
පූවජාමි තං මාතලි! දෙව සාරථී

"අන්‍යයෙක් අඟුරු රැස රැස්කරති. මිනිස්සු දැවිගිය සිරුරු ඇතිව හඬති. සාරථිය! මෙය දුටු මට බියක් ඇතිවේ. දේව රියදුරු වූ මාතලිය! මම නුඹගෙන් විමසමි."a

මෙහි "කාසු" යන්නෙන් "රාශිය" අදහස් විය. "රියදුර! කුමක් නිසා ඉක්මන් කමකින් යුතුව වලක් සාරන්නෙහිද? (කාසු ඛණසි)"b යන මෙහි "කාසු" යනු වලකි. මෙම සූත්‍රයේ ද "කාසු" යන්නෙන් "වල" යන තේරුම (ආවාටය) ගතයුතුයි. "**සාධිකපොරිසා**" යනු පුරුෂ ප්‍රමාණයට වඩා වැඩිවූ, අධික වූ, පස්රියනක් පමණ වූ යනුයි. "**වීතචවිකානං වීතධූමානං**" යන මෙයින් මහත්වූ ගිනිමැලයක් දක්වයි. ගිනිදැල් හෝ දුම හෝ ඇති කල්හි, සුලඟ හමයි. එවිට ගිනිමැලය කුඩා වේ. සුලඟ නතර වූ විට නැවත ගිනිමැලය විශාල වේ. "**ආරකාවසසා**" යනු දුරම පවත්නේය. "**එවමෙව ඛො**" යනු මෙහි උපමා සන්සන්දනයයි. අඟුරුවල මෙන් තෙහුම්මික වූ සසර පැවැත්ම දතයුතුයි. ජීවත්වනු කැමති පුරුෂයා මෙන් සසර ඇසුරු කළ බාල පුහුදුන් පුද්ගලයා දතයුතුයි. බලවත් පුරුෂයන් දෙදෙනා මෙන් කුසලාකුසල ධර්ම සැළකිය යුතුයි. ඔවුහු ඒ පුරුෂයා නොයෙක් අත්වලින් ගෙන අඟුරුවලට ඇදගෙන යන කාලය මෙන් පුහුදුන් පුද්ගලයාගේ කර්ම රැස්කිරීමේ අවස්ථාව දැකිය යුතුයි. කර්ම රැස්කිරීම ම ප්‍රතිසන්ධියට ඇදගැනීම නම් වේ. අඟුරු වලෙහි දැමීම දුකක් මෙන්, කර්ම රැස්කිරීම

a. නිමි ජාතකය b. මූගපකඛ ජාතකය

සසර දුකට හේතුවේ යැයි දතයුතුයි. "පරිඤ්ඤාතෙ" යනු ත්‍රිවිධ පරිඥාවන් මැනවින් පිරිසිඳ දත් යනුයි. මෙහි විශේෂ ඤාණයෙහි යෙදීම ස්පර්ශාහාරයේ කියූ පරිදි දතයුතුයි. "තිස්සො තණ්හා" යනු කාම තණ්හාව, භව තණ්හාව සහ විභව තණ්හාවයි. මේ තණ්හාවත් මැනවින් පිරිසිඳ දැනගත්තා වේ. කුමක් නිසාද ? මනොසඤ්චේතනාහාරය තණ්හාමූලික බැවිනි. මෙසේ මනෝසඤ්චේතනාහාර වශයෙන් ද අර්හත්බව දක්වා දේශනා කරන ලදී.

තෙවැනි ආහාර වර්ණනාව නිමාවිය.

සිවුවැනි ආහාරයේ "ආගුචාරිං" යනු වැරදි-පවිටු හැසිරීම් ඇති, දෝෂ-වැරදි කරන පුද්ගලයායි. "කථං සො පුරිසො" යනු ඒ පුරුෂයා කෙසේද? කිම ජීවත්වේද? ජීවත් නොවේද?යි අසයි. "තථෙව දෙව! ජීවති" පෙර පරිදිම ඔහු ජීවත් වේ. "එවමෙව ඛො" යනු උපමා සන්සන්දනයයි. - රජු මෙන් කර්මය දකිය යුතුයි. සංසාර පැවැත්ම ඇසුරුකරන බාල පුහුදුන් පුද්ගලයා, වරද කළ පුරුෂයා මෙනි. ප්‍රතිසන්ධි විඤ්ඤාණයද අඩියටි තුන්සීය මෙනි. වරදකාරී පුරුෂයකුට අඩියටි තුන්සීයක් ගැසීමට රජු අණ කළ අවස්ථාව මෙන් කර්මය නමැති රජු සංසාරික පුහුදුන් පුද්ගලයා රැගෙන ප්‍රතිසන්ධියෙහි දමන අවස්ථාව සැලකිය යුතුයි. එහි අඩියටි තුන්සීය මෙන් ප්‍රතිසන්ධි විඤ්ඤාණය පවතියි. අඩියටියෙහි දුක පිහිටා නැත. එම ආයුධය වැදීමෙන් ඇතිවූ තුවාලය මූලික කරගෙන දුක ඇතිවේ. මේ අයුරින්ම ප්‍රතිසන්ධියෙහි දුකක් නැත. ප්‍රතිසන්ධියෙන් ඇතිකරන විපාක දුක, ආයුධවලින් ගැසීමෙන් ඇතිවූ තුවාලවල දුක මෙන් දතයුතුයි. "පරිඤ්ඤාතෙ" යනු ත්‍රිවිධ පරිඤ්ඤාවන්ගෙන්ම පිරිසිඳ දත් යනුයි. මෙහිද පිරිසිඳ දැනීමෙහි පිළිවෙත ඵස්සාහාරයේ කියූ පරිදිම දතයුතුයි. "නාමරූපං" යනු විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාමරූප ඇතිවේ. විඤ්ඤාණය පිරිසිඳ දත් කල්හි නාමරූපය මැනවින් දැනගත්තා නම් වේ. නාමරූප දෙකට විඤ්ඤාණය ම මුල්වූ බැවින් සහ විඤ්ඤාණයත් සමග උපදින බැවිනි. මෙසේ විඤ්ඤාණාහාර වශයෙන් ද අර්හත්ඵලය දක්වා ම සූත්‍ර දේශනාව පැවැත්වූ සේක.

සතරවන ආහාර වර්ණනාව නිමාවිය.

තෙවැනි සූත්‍රයයි.

12. 7. 4.

සිවුවැනි සූත්‍රයේ "රාගො" ආදිය ලෝභයට ම භාවිත නම් වේ. එම වස්තුවෙහි සිත් ඇලවීම් වශයෙන් "රාගො" නම් වේ. සතුටුවීම "නන්දි" යයි. තෘෂ්ණාව ඉපදීම් වශයෙන් "තණහා"ව යැයි කියයි. "පතිට්ඨිතං තත්‍ර විඤ්ඤාණං විරූළහං" යනු කර්මය ධාවනය කරවා ප්‍රතිසන්ධිය ඇදගැනීමට සමත් විඤ්ඤාණය එහි පිහිටියේද වර්ධනය වූයේද වේ. "යත්‍ර" යනු තෙහුමික වූ සංසාරික පැවැත්මෙහි. සත්තමී ආධාර්ථයයි. සැමතැන්හි විකල්පාර්ථයේ මුල් මුල් පදයන්හි මේ සත්තමිය යෙදේ. "අත්‍ථි තත්‍ර සංඛාරානං වුද්ධි" යනු මේ විපාක චක්‍රයෙහි පිහිටි අනාගත සංසාරික පැවැත්මට උපකාර වන සංස්කාරාදිය නිසා කියන ලදී. "යත්‍ර අත්‍ථි ආයතිං පුනබභවාභි නිබබත්තී" යනු යම්තැනක අනාගත පුනර්භව උපතක් ඇත්තේ ද "එවමෙව ඛො" යනු මෙම සූත්‍රයේ පැමිණි උපමාව සන්සන්දනය කිරීමයි. රඳවා හෝ සිත්තරා මෙන් රැස්වූ කර්මරාශිය දතයුතුයි. පුවරුව, බිත්තිය, රෙදිපට ආදිය මෙන් සංසාරික පැවැත්ම දතයුතුයි. යම්සේ රඳවා හෝ සිත්තරා පිරිසිදු වූ ඵලකවල රූප අඳියි ද එලෙසින් ම ඒකරාශී වූ කර්මය භවයෙහි රූප ස්කන්ධය ඇතිකරවයි. එහිදී අදක්ෂ සිත්තරා ඇඳි රූපය විරූපී වූයේ, අප්‍රිය වූයේ යම්සේ ද එලෙසින් ම ඤාණවිප්‍රයුක්ත සිතින් කළ කර්මයාගේ හේතුවෙන් උපදින රූපයේ චක්ඛු ආදී ඉන්ද්‍රිය සම්පත්තිය නොපිහිටයි. දුර්වර්ණ වූ, නපුරු වූ පිහිටීම් ඇති මාපියන්ට ද පිළිකුල් වූ රූපයක්ම උපදවයි. ඉතා දක්ෂ වූ සිත්තරා ඇඳි රූපය මැනවින් පිහිටියේ, මනාප වූයේ, ඉතා අලංකාර වූයේ වේද එලෙසින්ම ඤාණසම්ප්‍රයුක්ත සිතින් කරන ලද කර්ම හේතුවෙන් උපදින රූපයට චක්ඛු ආදී ඉන්ද්‍රිය සම්පත්තිය මැනවින් පිහිටයි. වර්ණවත් වූ මනාව පිහිටියා වූ, අලංකාරව පිළියෙල වූ රූපයක්ම උපදවයි. මෙම සූත්‍රයේ ද ආහාරය විඤ්ඤාණයත් සමග හකුළුවාගෙන ආහාරය හා නාමරූප හා සංස්කාර අතර එක් සන්ධියකි. සංස්කාර හා අනාගත භවය අතර එක් සන්ධියකි. මෙසේ සන්ධි තුනක් දතයුතුයි. "කූටාගාරං" යනු එක් මුදුන් කොතක් ඇතිවන සේ කරන ලද ගෙය. "කූටාගාර සාලා" යනු මුදුන්කොත් දෙකක් ඇතිවනසේ කරන ලද ශාලාව. "එවමෙව ඛො" යන මෙහි රහතන් වහන්සේගේ කර්මය සූර්ය රශ්මිය වැනි යැයි දතයුතුයි. සූර්ය රශ්මිය වනාහී ඇති දෙයකි. නමුත් එය පිහිටීම් වශයෙන් (භෞතිකව) නොමැති බැවින් නොපවතින-නොපිහිටි සංඛ්‍යාවට ගැනේ. ක්ෂීණාස්‍රවයන්ගේ ද ක්‍රියාවක් නොමැති බැවින් නොපිහිටියේ වේ. උන්වහන්සේලාට අත්පා ආදිය ඇත. නමුත් උන්වහන්සේලාගේ ක්‍රියාවන්

කුසලාකුසල ලෙස නොහඳුන්වයි. ක්‍රියාමාත්‍රය පමණක් ම වේ. විපාක නොදෙයි. මෙසේ උන්වහන්සේට කර්ම නොමැති බැවින් ම "**අප්පතිට්ඨ**" (නොපිහිටි) නම් වෙති.

සතරවන සූත්‍රයයි.

12. 7. 5.

පස්වන සූත්‍රයේ "**නාමරූපෙ ඛො සති විඤ්ඤාණං**" යන මෙහි සංස්කාරයන් ඇති කල්හි විඤ්ඤාණය ද අවිද්‍යාව ඇතිකල්හි සංස්කාරයන්ද ඇතිවෙයැයි කිවයුතු වන්නේය. එම දෙකම මෙහි නොපැවසුණි. කුමක් නිසාද? අවිද්‍යා සංස්කාර දෙක වනාහි භවයට තෙවැනි හේතූන් වේ. ඒවා සමග මේ විදර්ශනාව නොගැටෙයි. මහා පුරුෂයා වනාහි වර්තමාන පඤ්චවෝකාර වශයෙන් ඇතුලට බැස සිටියි. අවිද්‍යා සංස්කාරාදිය නොදක්නා කල්හි බුදුවීමට නොහැකිද? සත්‍ය වශයෙන්ම නොහැක. දැන් ඒ භව, උපාදාන, තණ්හා වශයෙන් එම තුන දක්නා ලද්දේමය. ගොයෙකු පසුපස එළවාගෙන යන පුරුෂයා ඌ ළිඳට පිවිසෙනු දැක, ඊට බැස ඌ ගියතැන දක්වා සාරා ගොයා අල්ලාගෙන යයි. ඉතිරි කොටස නොසාරයි. කුමක් නිසාද? එහි කිසිවක් නොමැති බැවිනි. මෙසේ මහා පුරිස බෝධිසත්ත්වයෝ ද ගොයා ලුහුබැඳ ගිය පුරුෂයා මෙන් බෝමැඩ හුන් සේක් ජරාමරණ දෙකෙහි සිට "මෙයින් මේ ප්‍රත්‍ය ඇතිවේ", "මෙයින් මේ ප්‍රත්‍යය ඇතිවේ" යැයි පරීක්ෂාකර බලා නාමරූප ධර්ම ප්‍රත්‍ය දුටු පසු; ඊටද හේතුව සොයා බලනුයේ විඤ්ඤාණය දුටුසේක. ඉක්බිති මෙපමණකින් පඤ්චවෝකාර භව වශයෙන් විමසා බලන වාරය හෙයින් විදර්ශනා කිරීම නතරකළ සේක. ගොයා ගත් පසු හිස්වූ ළිඳ නැවත නොබිඳී මැවීමෙන් අවිද්‍යා සංස්කාර දෙක තිබියදීත්, ඒ දෙකට මත්තෙන් පැවති විඤ්ඤාණයම විදර්ශනාවෙන් ගත් බැවින් එම දෙක මෙහිදී වෙන් වෙන් වශයෙන් නොදක්වන ලදැයි දත යුතුයි.

"**පවුදා වත්තති**" යනු නැවත හැරෙයි. මෙහි විඤ්ඤාණය ඇති තැනින් ආපසු හැරී යනුයේ කුමක් නිසාද? ප්‍රතිසන්ධි විඤ්ඤාණය ද විදර්ශනා ඤාණය ද නිසයි. එහි ප්‍රතිසන්ධි විඤ්ඤාණය ප්‍රත්‍ය වශයෙන්ද විදර්ශනා විඤ්ඤාණය අරමුණු වශයෙන් ද නැවත හැරෙයි. මේ දෙක ම නාමරූප අතික්‍රමණය නොකරයි. නාමරූපයන්ගෙන් එහාට නොයයි.

"එත්තාවතා ඡායෙථ වා" යනාදියෙහි **විඤ්ඤාණය** නාමරූපයන්ට ප්‍රත්‍යවන කල්හිද නාමරූප **විඤ්ඤාණයට** ප්‍රත්‍යවන කල්හි ද මේ දෙකම අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රත්‍ය වන කල්හිද මෙපමණකින් හටගනිවූ, උපදිවූ යනුයි. මෙයින් මත්තෙහි හටගත යුත්තක් හෝ ඉපදිය යුත්තක් නැත. මෙලෙස භවයෙන් භවයට යන චුති ප්‍රතිසන්ධිය සමග පදපහ දක්වා නැවත එය මෙපමණක්මයැයි මුලින් කී අර්ථය ම පවසනුයේ **"යදිදං නාමරූප පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං"**යි දේශනා කර, අනතුරුව අනුලෝම ප්‍රත්‍යාකාර වශයෙන් විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් ඇතිවන නාමරූප මූලික වූ අනාගත ජරාමරණයන් දැක්වීමට, **"නාමරූප පච්චයා සළායතනං"** යනාදිය දේශනා කළ සේක.

"අඤ්ජසං" යනු මාර්ගයට ම යෙදුණු තවත් නමකි. **"උදඤ්ඣාපං"** ජලයෙන් උස්ව නැගුණු බැවින් **"උදඤාපං"** යනු වහර ලත් ප්‍රාකාර වස්තූන්ගෙන් සමන්විත **"රමණීයං"** යනු හාත්පස සිවු දොරටු අතරෙහි නානාවිධ භාණ්ඩ නම් සම්පතින් අලංකාර වූ **"මාපෙහි"** යනු මහජනයා යවා වාසය කරවන්නෙහිය. **"මාපෙය්‍ය"** වාසය කරවන්නේ ය. එයද පළමුව දහඅට කෙළක් ජනයා යවා **"සම්පූර්ණ වූයේද?"**යි අසා **"තවම නැත"**යි පැවසූ විට, තවත් කුල පහක් යවයි. නැවත විචාරා අසම්පූර්ණ බව දන තව කුල තිහක් යවයි. නැවත විචාරා **"අසම්පූර්ණ බව"** දැන, තවත් කුල දහසක් ද, නැවත කුල එකොළොස් නහුතයක් ද නැවත කුල අසූ හතරක් ද යවයි. මෙසේ වාර කිහිපයක් ම යවා, **"දැන් නුවර සම්පූර්ණද?"**යි ඇසූ රජුට, **"මහරජ! කුමක් කියයිද? ඉතා විශාල වූ නගරයේ කිසිදු බාධාවක් නැත.** මෙලෙස කුලයන් යවා පිරවිය නොහැක. අඬබෙර හසුරුවා **"අසුවල් නුවර මේ මේ සම්පත්වලින් පරිපූර්ණය.** යමෙක් එහි **විසීමට කැමතිනම් සැපසේ එහි යෙත්වා.** ඔවුන්ට මේ මේ ආරක්ෂා විධි **ලැබෙන්නේය"**යි නගර වර්ණනාවක්, ලැබෙන ලාභප්‍රයෝජනත් පවසන්නේ **නම් මැනවි."**යි නගරාරක්ෂක පුරුෂයා කීවේය. රජු එසේ කළ කල්හි, මිනිස්සු නගරයේ ගුණත්, පරිහාර ලාභයනුත් අසා සැම දිසාවකින්ම **රැස්ව** නගරය පිරවූහ. ඉන්පසුව එනුවර ජනයාගෙන් සම්පූර්ණ වූයේ වෙයි. **එනිසා "තදසස නගරං අපරෙන සමයෙන ඉද්ධං චෙව පීතං ච"** යනාදිය පවසන ලදී. එහි **"ඉද්ධං"** යනු සමෘද්ධිමත් වූයේ. ආහාරපාන **සුලබ වූයේ යනුයි. "පීතං"** යනු සියලු සැපතින් පිරුණුබවයි. **"බාහුජඤ්ඤං"** යනු බොහෝදෙනා විසින් දැනගත යුතු හෝ බොහෝ දෙනාට හිත පිණිස යනුයි. **"බහුජනං"** යන පාඨය ද සුදුසුය. **"ආකිණ්ණ මනුසසං"** යනු මිනිසුන්ගෙන් ආකීර්ණ වූ. නිරන්තරව පිරුණු යනුයි. **"චුද්ධිං**

වෙපුල්ලපබ්බතං" යනු අභිවෘද්ධිය පැමිණි, විපුලත්වයට පැමිණි යනුයි. ශ්‍රේෂ්ඨ බවට ද බොහෝ දියුණු වූ දසදහසක් සක්වල අග නගරයක් විය.

"එවමෙව ඛෝ" යනු මෙහි උපමා සන්සන්දනයයි. ආරණ්‍ය මහවනයේ හැසිරෙන පුරුෂයා මෙන් දීපංකර පාදමූලයේ සිට පාරමිතා පුරමින් පැමිණි, ශ්‍රේෂ්ඨ මහා පුරුෂයාණන් වහන්සේ සැළකිය යුතුයි. ඒ පුරුෂයාට පෙර සිටි මිනිසුන් ගියමග දැක්වීම මෙන් අනුපිළිවෙලින් බෝමැඩ සිට මහා සත්ත්වයන් වහන්සේට පූර්ව භාගයෙහි අෂ්ඨාංගික විදර්ශනා මාර්ගය දැක්වීම දතයුතුයි. උන්වහන්සේ මතුයෙහි විදර්ශනාව පුරුදු කරන සේක්, ලෝකෝත්තර මාර්ගය දක්වාම, උපමාවේ නගරාරක්ෂක පුරුෂයා ඒ එකම අඩිපාරෙන් ගොස් පසුව නුවරට යන මහමාවත දැකීම මෙන් යැයි දතයුතුයි. පුරුෂයා එම මහමාවතින් ගොස්, ඉදිරියෙහි නගරය දැකීම මෙන් තථාගතයන් වහන්සේ නිර්වාණය නම් වූ නගරය දැකීම දතයුතුයි. මෙහි නගරයෙන් පිටත ප්‍රදේශය අන්‍යාගමිකයන් විසින් දක්නා ලදී. වෙනත් මිනිසුන් වාසය කරන ලදී. නිවන්පුරය තථාගතයන් විසින්ම දක්නා ලදී. උන්වහන්සේ විසින්ම වාසය කරන ලදහ. ඒ පුරුෂයා නුවර සිවුදොරටු දුටුවාක් මෙන් තථාගතයන් වහන්සේ සතර මාර්ගයන් දුටු සේක. ඒ පුරුෂයා සිවු දොරටුවෙන් නුවරට ඇතුලුවීම මෙන් තථාගතයන් වහන්සේගේ සිවු මාර්ගයෙන් නිවණට පැමිණීම දතයුතුයි. ඒ නගර අභ්‍යන්තරයෙහි භාණ්ඩාදිය වෙන්වෙන්ව දකින්නාක් මෙන්, තථාගතයන් වහන්සේගේ ප්‍රත්‍යවේක්ෂණ ඤාණයෙන් පනසකට වැඩි වූ කුසලධර්ම බෙදා දකින ලද අවස්ථාව දතයුතුයි. නගරයේ ගෙවල් සාදා ගැනීමට සුදුසු කුල සෙවූ අවස්ථාව මෙන් තථාගතයෝ ඵල සමවතින් නැගිට හේතු සම්පත් ඇති සත්ත්වයන් දෙස බැලීම දතයුතුයි. ඒ පුරුෂයාගේ ඇරයුම ලද තථාගතයන් වහන්සේ අඤ්ඤාකොණ්ඩඤ්ඤ තෙරුන් දුටු සේක. රජු මහකෙළෙඹියා අමතා "නුවර වාසය කරව"යි යැවූ අවස්ථාව මෙන්, තථාගතයෝ එක් සවසක අටළොස් යොදුන් මගගෙවා ගොස්, ඇසල පුන්පෝ දිනක බරණැස ඉසිපතනයට පිවිස, පස්වග තවුසන් කාය සාක්ෂි කරගෙන දහම් දෙසූහ. මහකෙළෙඹියා දහඅට කෙළක් ජනයා ගෙන නගරයේ වාසය කළාක් මෙන්, තථාගතයන් වහන්සේ දම්සක් පැවතුම් සූත්‍රය දෙසූ කල්හි කොණ්ඩඤ්ඤ තෙරුන් වහන්සේ දහඅට කෙළක් බඹුන් සමග සෝවාන් ඵලයෙහි පිහිටි සේක. මෙලෙස නිර්වාණ නගරය පළමුවෙන් ම ජනාවාස විය. ඉක්බිති නගරය පිරුණේද?"යි අසා "නොමැත"යි පැවසූවිට පස් කුලයන්ගේ සිට අසූහාර දාහක් කුලයන් යැවුවාක් මෙන් තථාගතයන් වහන්සේ පස්වන දිනයේ සිට අනන්ත

ලක්ඛණ සූත්‍රාදිය දෙසමින් පස්වග තවුසන් ආදී කරගෙන; යස ප්‍රමුඛ කුල පුතුන් පනස්පස්දෙන, භද්දවග්ගිය කුමරුන් තිස්දෙන, පුරාණ ජටිලයෝ දහස, බිම්සර ප්‍රමුඛ එකොළොස් නහුතයක් පුරුෂයෝ, තිරෝකුඩ්ඩ සූත්‍ර දේශනාව ඇසූ හාරදහසක් ජනයා ද යන මෙපමණ වූ පිරිස ආර්ය මාර්ගයට ඔසවා තබා, උතුම් නිවන්පුරයට පැමිණවූහ. ඉක්බිති මෙලෙස නුවර නොපිරෙන කල්හි බෙර හසුරුවා-නගරයේ සුන්දරත්වය හා ඊට යන කුලයන්ට ලැබෙන ලාභාදියත් පැවසීම මෙන් මාසයේ දින අටක් ඒ ඒ තැන හිඳ ධර්මකථික මහතෙරවරු නිර්වාණය වර්ණනා කිරීමත්, නිවන් දකින ලද සත්ත්වයන්ට ලැබෙන ඉපදීම ආදී වූ දුක් කාන්තාරාදියෙන් මිදීම් ආදී ආනිසංස සෝෂා පැවැත්වීමත් දතයුතුයි. ඉක්බිති සෑම දිසාවකින්ම ජනයා අවුත් නගරය පිරිගියාක් මෙන් ඒ ඒ තැන පැවති ධර්මකථාවන් අසා, ඒ ඒ තැනින් නික්මී පැවිදිවීම් ආදී අනුලෝම ප්‍රතිපදාවට පිළිපන් අප්‍රමාණ කුලපුතුන්ගෙන් නිවන්පුරය පිරියෑම දතයුතුයි.

"පුරාණං මග්ගං" යනු ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි. මෙම ආර්ය මාර්ගය පවාරණ සූත්‍රයේ දී නොපවතින අර්ථයෙන් "නූපන් මාර්ගය"යැයි කියන ලදී. මේ සූත්‍රයේ පරිහරණ කිරීම් අර්ථයෙන් "පුරාණ මාර්ගය"යැයි කියන ලදී. මේ සූත්‍රයේ පරිහරණ කිරීම අර්ථයෙන් "පුරාණ මාර්ගය"යැයි කියන ලදී. "බ්‍රහ්මචරියං" යනු ශික්ෂාත්‍රයේ සංග්‍රහ කරන ලද සියලු ශාසනයයි. "ඉදධං" යනු ධ්‍යාන ලැබීම් ආශ්වාදයෙන් සමෘද්ධ වූ, ආහාරපාන සුලභ වූ යනුයි. "පීතං" යනු අභිඥා නම් අභරණවලින් පිරුණු යනුයි. "විත්‍ථාරිකං" යනු විස්තීර්ණ වූ යනුයි. "බාහුජඤ්ඤං" යනු බොහෝදෙනා විසින් දතයුතු දේය. "යාවදෙව මනුසෙසහි සුපපකාසිතං" යනු දස දහසක් සක්වල දක්වා දෙව් මිනිසුන් අතර වෙන් කිරීමක් වේද ඔවුන් අතරෙහි ද තථාගතයන් වහන්සේ විසින් මැනවින් දෙසන ලදී.

පස්වන සූත්‍රයයි.

12. 7. 6.

සයවැනි සූත්‍රයේ "ආමන්තෙසි" කවර හෙයින් ඇමතූ සේක්ද? මේ භික්ෂු පිරිසට සූක්ෂම වූ ත්‍රිලක්ෂණයෙන් යුක්ත ධර්මදේශනාව වැටහෙන බැවිනි. ඒ ජනපදයෙහි මිනිස්සු සත්‍යතුක ප්‍රතිසන්ධියක් ලැබූ ප්‍රඥාවන්තයෝ වෙති. එහි ආහාර ඉතා සිනිඳුය. මොළොක් වේ. එම අහර වළඳන

ජනයාගේ ප්‍රඥාව වර්ධනය වේ. ඔවුහු ගැඹුරු ත්‍රිලක්ෂණමය ධර්ම දේශනාව අවබෝධ කරගැනීමට සමත් වෙති. මෙනිසා බුදුපියාණන් වහන්සේ දීඝ, මජ්ඣිම නිකාය දෙකෙහි එන මහාසතිපට්ඨාන, චූල සතිපට්ඨාන, මහානිදාන, ආනෙඤ්ජ සප්පාය යන සූත්‍ර සහ සංයුක්ත නිකායේ චූල නිදාන සූත්‍රාදී ගැඹුරු වූ සූත්‍ර ධර්ම මෙම ජනපදයේදී ම දේශනා කළහ.

"**සම්මසථ නො**" යනු ස්පර්ශ කරන්නේ ද යනුයි. විමසා බලන්නේද? "අනතරා සම්මසනං" යනු අභ්‍යන්තර ප්‍රත්‍ය පිළිබඳ විමසා බැලීමයි. "**න සො භිකඛු භගවතො චිත්තං ආරාධෙසි**" යනු ප්‍රත්‍යාකාර වශයෙන් විවරණය කරවීමට කැමති කොටය. බුදුරදුන්ගේ අදහස ගැනීමට ද්වත්තිංසාකාර වශයෙන් විවරණය කිරීම නිසා නොහැකි විය.

"**එතදවොච**" යනු දේශනාව මැනවින් ගැලපී නොගියේය. මනාව ගලපා ගැනීම සඳහා මෙලෙස වදාළහ. "**තෙනහානන්ද! සුනාථ**" යන මෙය ත්‍රිපිටක බුදුවදනෙහි නොබිඳුණු පදයකි. නිතර යෙදෙන්නෙකි. අන් සමයක මෙසේ කීමක් නැත. "**උපධිනිදානං**" යනු අදහස් කරන ලදී. "උපපජ්ජති" යනු උපදියි. "**නිවිසති**" යනු නැවත නැවත පැවතීම් වශයෙන් පිහිටයි. "**යං ලොකෙ පියරූපං සාතරූපං**" යනු ලොව ඇතිවූ යම් බඳු මිහිරි ස්වභාවයද ප්‍රිය ස්වභාවය ද යන දෙකයි. "**චකඛුං ලොකෙ**" යනු ලොව චක්ෂු ආදී ඉන්ද්‍රියයන්හි ප්‍රමාද වූ, ඒවායේ ඇලී සිටින සත්ත්වයෝ සම්පත්තියෙහි පිහිටා තම ඇස කැඩපත් ආදියේ නිමිති ගැනීම් අනුසාරයෙන් පැහැදුණු පඤ්චප්‍රසාදය, රන් විමනක ගලවා දැමූ මැණික් සිංහ මැදිරියක් මෙන් සිතති. කන රිදී පිල්ලක් මෙන් ද හවඩි නූලක් මෙන්ද සිතති. "උස්වූ නාසය" යැයි ලබන ලද ව්‍යවහාර ඇති නාසය, පෙරළා තැබූ රන් වටාපතක් මෙන් සිතති. දිව රතු කම්බිලි පටලයක් මෙන් මෘදු-සිනිඳු-මිහිරි ස්වරයකැයි සිතති. කය-ශරීරය තරුණ තල්ගසක් මෙන් රන් තොරණක් මෙන් ද සිතති. සිත; මනසින් අන්‍යයන්ගේ මනස හඳා අසමාන වූ මහත් දෙයකැයි සිතති.

"**නිචතො අදඤඛු**" යනු "නිත්‍ය"යැයි දුටුවහ යනුයි. සෙසු පදයන්හිද මේ ක්‍රමයමයි. "**න පරිමුචචිංමු දුකඛසමා**" යනු සියලුම අයුරින් සසර පැවතීම් දුකින් නොමිදුනාහ යනුයි. "**දකඛිනති**" යනු දකිති. "**ආපාණියකංසො**" යනු දියබොන භාජනයට නමකි. යමකින් දියබොත් ද එය "ආපාණිය" නම් වේ. ආපාණවූයේත් කංසවූයේත් එම "ආපාණියකංසො" නම් වේ. රා ඔඩමට මේ තවත් නමකි. "**වණණසමපනෙනා**" යනාදී

වචනවලින් ඒ ඔඩමෙහි පැවති පානයේ වටිනාකම කියැවේ. **"සම්මාභිතතෙතා"** ග්‍රීෂ්මයෙන් අතිශයින් පෙළුණු. **"සම්මපරතො"** යනු ග්‍රීෂ්මයෙන් ස්පර්ශ කළ, අනුව ගිය යන අර්ථයි. **"ජිවතො හි තං ඡාදිසසති"** යනු ඒ පානය බොන්නා, එය බීමෙන් වර්ණාදී සම්පත් රුචිකරයි. මුළු සිරුරෙහිම පැතිරගිය සතුට උපදවමින් සිටියි. "අපපටිසංඛා" යනු **ප්‍රත්‍යවේක්ෂා** නොකර යනුයි. **"එවමෙව ඛො"** යනු මෙහි උපමා සන්සන්දනය කිරීමයි.

ජල බඳුන මෙන් ලෝකයේ ප්‍රිය වූ සැපවත් වූ රූපාදී අරමුණු දතයුතුයි. ග්‍රීෂ්මයෙන් තැවුණු පිපාසිත පුද්ගලයා යනු සසර පැවැත්ම ඇති පුහුදුන් පුද්ගලයා වේ. දිය බඳුනෙන් ආරාධිත (සතුටුවන) පුරුෂයා මෙන් ලොව ප්‍රිය රූපමය අරමුණුවලින් ආරාධිත ජනයා දතයුතුයි. දිය බඳුනෙහි පවතින සම්පත්තීන් (ආනිසංස ද) ආදීනව ද පවසන දියසැල භාර පුරුෂයා මෙන් ආචාර්ය-උපාධ්‍යායන් ප්‍රමුඛ වූ කල්‍යාණ මිත්‍රයෝ දැකිය යුතුයි. පිපාසිත පුරුෂයාට දිය සැලෙහි සිටි මිනිසා දියබඳුන බීමේ ගුණාගුණ පවසන්නාක් මෙන් ආචාර්ය-උපාධ්‍යායවරු ශිෂ්‍ය භික්ෂූන්ට පඤ්චකාමයේ ඇති ආශ්වාදයත් ආදීනවයත් පවසති. එලෙස දියබඳුනේ ගුණාගුණ පැවසූ විට, ඒ පුරුෂයා එම පානයේ ඇති "ගුණ" පමණක් සලකාගෙන (ප්‍රිය ආශ්වාදයේ පමණක් ඇලී) හටගත් වේගවත් බව ඇතිව "ඉදින් මරණය ඇතිවේනම් පසුව එය දැනගන්නෙමි"යි ලෝභ සිතින් වහා සැක රහිතව එම පානය බී, මරණයට හෝ මරණ සමාන දුකට පැමිණේ. මෙලෙස ම තරුණ භික්ෂූහු ද පංචකාමයන්හි දර්ශන වශයෙන් උපත් සොම්නස නිසා ම ආශ්වාදයේ ඇලෙති. එහි ආදීනව ලෙස "මෙලෝ පරලෝ බොහෝ නානාප්‍රකාර වූ අප්‍රසාදය වූ කාමයෝ බොහෝ දුක්කරදර උපදවයි." යනුවෙන් ආචාර්ය-උපාධ්‍යායන් විසින් දේශිත ආනිසංස ද ආදීනව ද අසති. "පැවිදි ප්‍රතිපදාවට එළඹ, ඉන්ද්‍රිය සංවරයෙහි නියුක්ත වන්න. ආහාරයේ පමණ දැනගත්තෙක් වන්න. නිදිවැරීමෙහි යෙදුනෙක් වන්න." යනුවෙන් අවවාද දෙනු ලැබුවත් ආශ්වාදයේ සිත බැඳුණු තැනැත්තා, "ඉදින් මෙසේ ආදීනව වේනම් එය පසුව දැනගන්නෙමි"යි ආචාර්ය-උපාධ්‍යායන්ට අප්‍රසාද උපදවා පාමොක් උදෙසීම්-විමසීම් මෙන්ම වත්පිළිවෙත් ද අත්හැර ලෝකාමිෂ කථාවෙහිම නියැලී සිට කම්සැප විඳීමට ශික්ෂා ප්‍රතික්ෂේප කර ගිහිබවට පත්වෙයි. පසුව දුසිරිත් පුරවන ඔහු ගෙවල් බිත්ති සිඳ සොරකම් කල කල්හි "මේ සොරෙයි"යි රජුට අල්ලා දක්වූ විට, මෙලොවදීම හිස්, අත්පා සිඳීම් වැනි දුකට පැමිණෙයි. පරලොව සතර අපායෙහි ද ඉපිද දුක්විඳියි.

"පාණියෙන වා විනෙතුං" යනු සීතලෙන් හෝ පානයෙන් ඉවත් වීමටය. "දධිමණ්ඩකෙන" යනු මිදුණු කිරිවල දියෙනි. "මත්ථ ලොණිකාය" යනු ලුණු සහිත අත්සුණු දියෙනි. "ලොණසොවීරකෙන" යනු සියලු ධාන්‍ය වර්ග, ගෙඩි, ගොබ ආදිය දමා "ලුණුකාඩි හොද්දක්" සාදයි එයින් යනුයි. මෙහි උපමා සන්සන්දනය මෙසේය. ග්‍රීෂ්මයෙන් තැවුණු මිනිසා මෙන් සංසාරික වූ යෝගාවචරයා දතයුතුයි. ඒ මිනිසා නුවණින් සලකා බලා ඔඩමේ වූ දිය ඉවතලා, පැන් බීමෙන් පිපාසය සන්සිඳුවා ගන්නාක් මෙන්, භික්ෂුව ද ආචාර්ය-උපාධ්‍යාය අවවාදයේ පිහිටා සදොරින් විමසා බලමින් අනුක්‍රමයෙන් විදසුන් වඩා අර්හත් ඵලයට පැමිණේ. පානයට සුදුසු සතරක් වූ පානයන් මෙන් සිවුමග දතයුතුයි. ඉන් එක් පානයක් බී, රා බීමේ ආශාව දුරුකර සුවසේ කැමති තැනකට යෑම මෙන් රහතන් වහන්සේ "සිවුමග" නම් වූ පානය වළඳා තණ්හාව දුරුකළ සේක්, මෙතෙක් නොගිය විරූ නිවණ නමැති දිශාවට වැඩම කිරීම දතයුතුයි.

සයවන සූත්‍රයයි.

12. 7. 7.

සත්වන සූත්‍රයේ "කිනනුඛො ආවුසො" යන්න කුමක් නිසා විචාළේ ද? මෙසේ විමසූ කල්හි "කෙසේනම් පිළිතුරු දෙන්නේදයි" තෙරුන්ගේ අදහස දනගැනීම පිණිසයි. එමෙන් ම "අතීතයේදී අග්‍රශ්‍රාවක දෙනම මේ ප්‍රශ්නය විනිශ්චය කරන ලද"යි අනාගත භික්ෂූහු දැනගනිති. එනිසා ද මේ ප්‍රශ්නය ඇසීය. "ඉදානෙව ඛො මයං" මේ තෙරුන් වහන්සේ යම් නාමරූපයකට විඤ්ඤාණය ප්‍රත්‍ය වේයැයි දැක්වූයේ ද ඒ නාමරූපය ම විඤ්ඤාණයට ද ප්‍රත්‍ය වේයැයි දැක්වූ බැවින් මෙසේ කියන ලදී. "නළකලාපියො" යන මෙහි අයකලාප (යකඩ මිටි) වශයෙන් උපමාවක් නොදක්වා, විඤ්ඤාණ නාමරූපයන්ගේ අබල-දුබල බව දක්වීමට මේ "බටමිටි" උපමාව දක්වන ලදී. "නිරොධො හොති" යන මෙපමණකින් වර්තමාන පඤ්චවෝකාර භව වශයෙන් දේශනා කරන ලදී. "ඡතනිංසාය වත්තුහි" යට විස්තර කළ ප්‍රතීත්‍ය සමුත්පාදයේ පැමිණි අංග දොළොස; එකක් කොටස් තුනකට බෙදීමෙන් අංග තිස්හයක් වේ. එම කොටස් තුන නම්; පළමුවැන්න ධර්මකථික ඉණයි. ප්‍රතිපත්තිය දෙවැන්නයි. තෙවැන්න එම ප්‍රතිපත්තියේ ඵලයයි. එහි පළමු ක්‍රමයෙන් දේශනා සම්පත්තිය ද දෙවන ක්‍රමයෙන් සේඛ භූමිය ද තෙවන ක්‍රමයෙන් අසේඛ භූමිය ද ප්‍රකාශිතය.

සත්වන සූත්‍රයයි.

12. 7. 8.

අටවන සූත්‍රයේ "අඤ්ඤත්‍රෙව" යනු ඇතමෙක් අනිකකු විශ්වාස කර යනුයි. "මොහු යමක් කියයිද එයම සත්‍යයැ"යි පිළිගනියි. තව අයෙක් හිඳ කල්පනා කරනුයේ යම් කරුණක් රුචි වේ ද ඔහු "එය ඇත"යි රුචිය නිසා පිළිගනියි. තව අයෙක් "බොහෝ කලක සිට මෙකරුණ පරපුරින් පැවත ආවේය. එනිසා එය සත්‍යයකි"යි පරපුරින් පැමිණි නිසා පිළිගනියි. තව කෙනෙකු විතර්ක කරනුයේ එක කරුණක් වැටහේ. ඔහු එය "සත්‍ය වශයෙන් ම ඇත"යි ආකාර පරිවිතර්කයෙන් පිළිගනියි. තවත් අයෙකු එසේම කල්පනා කරනවිට එක් දෘෂ්ටියක් උපදියි. යම් කරුණක් නැවත නැවත විමසා බලා එය රුචි වේ. කැමති වේ. ඔහු එය "සත්‍ය වශයෙන් ඇත"යි දෘෂ්ටි වැටහීමට අනුවම පිළිගනියි. තෙරුන් වහන්සේ මේ අයුරින් ගන්නා පිළිගැනීම් ප්‍රතික්ෂේප කර, ප්‍රත්‍යක්ෂයෙන් ම අවබෝධ කරගත් බැවින් විමසනුයේ "අඤ්ඤත්‍රෙව ආවුසො! මූසිල සඳධාය...." යනාදිය වදාළහ. එහි "අඤ්ඤත්‍ර" යනු ශ්‍රද්ධාවෙන් ඇදහීම් ආදිය දුරුකර, මෙකරුණුවලින් අත්හැර යනුයි. "භවනිරොධො නිබ්බාණං" අරහත්ය. නමුත් "මම රහතන් වහන්සේ නමක් වෙමි. නොවෙමි" යනුවෙන් නොපවසා නිශ්ශබ්දවම සිටි සේක.

"ආයසමා නාරදො ආයසමනතං සවිටයං එතදවොච" යනු කවර හේතුවකින් පැවසූවක් ද? උන්වහන්සේ මෙසේ සිතූහ. "භව නිරෝධය නිවණ නම් වේ. මේ ප්‍රශ්නය සේඛයන් විසින් ද දැනගත යුත්තකි. මේ තෙරහු, මූසිල තෙරුන්ව අසේඛ භූමියෙහි තබයි. මෙකරුණ විමසා දැනගතිමි"යි සිතා මෙසේ ඇසූහ. "සම්මපඤ්ඤාය සුදිටඨං" යනු විදර්ශනාවත් සමග මාර්ග ප්‍රඥාවෙන් වහා දක්වන ලදී. "න චමහි අරහං" අනාගාමී මාර්ගයේ සිටි බැවින් "රහත් නොවෙමි"යි දක්වයි. යම් ඤාණයකින් "මේ භව නිරෝධයෙන් නිර්වාණය වේ"යැයි වැටහේද ඒ දහනවයක් වූ ප්‍රත්‍යවේක්ෂණ ඤාණයෙන් මිදුණු, ප්‍රත්‍යවේක්ෂණ ඤාණයයි. "උදපාදො" යනු රියන් විස්සක්-තිහක් ගැඹුරු පැන් බොන ලිඳයි. "උදකවාරකො" යනු දිය ඉසින වාරයයි. "උදකනති හි බො ඤාණං අසස" යනු ඉවුරේ සිට බලන තැනැත්තාට මේ ඤාණය වේ යනුයි. "න ච කායෙන එසසිත්වා" යනු දිය ඉවතට ගෙන සිරුරේ තවරා ගැනීමට නොහැකි වන්නේය යනුයි.

ළිඳෙහි ජලය දැකීම මෙන් අනාගාමී පුද්ගලයා නිවණ දැකීම

දතයුතුයි. ග්‍රීෂ්මයෙන් දැවුණු පුද්ගලයා මෙන් අනාගාමී පුද්ගලයා දතයුතුයි. අර්හත් මාර්ගය දියගත්නා බඳුන මෙනි. ග්‍රීෂ්මයෙන් පීඩිතයා ළිඳේ ජලය දැකීම මෙන් අනාගාමියා ප්‍රත්‍යවේක්ෂණ ඤාණයෙන් මතුයෙහි අර්හත්ඵල අවබෝධය ඇතැයි දනියි. පීඩිතයාට බඳුනක් නොමැති බැවින් දියගෙන කය තෙමාගත නොහැකි වන්නාක් මෙන් අනාගාමී පුද්ගලයාට අර්හත් මාර්ගය නොමැති බැවින් නිවණ අරමුණු කරගෙන, අර්හත් ඵල සමවතට නොපැමිණ හිඳීමට නොලැබේ.

අටවන සූත්‍රයයි.

12. 7. 9.

නවවන සූත්‍රයේ "**උපයනෙතා**" යනු ජලය වැඩෙන සමයේ, දිය උඩුගං බලා ගලන කාලයයි. "**මහානදියෝ**" යනු ගංගා-යමුනාදී මහාගංගාවෝය. "**උපයාපෙති**" යනු මතුයෙහි පෝෂණය කරයි. වඩයි. පුරවයි යන අර්ථයයි. "**අවිජ්ජා උපයනති**" යනු අවිද්‍යාව මත්තෙහි ඇතිවනුයේ සංස්කාරාදී ප්‍රත්‍ය ඇතිවීමට හැකියාව ලබයි යනුයි. "**සංඛාරෙ උපයා පෙති**" යනු සංස්කාරයන් මතුයෙහි පෝෂණය වේ. වර්ධනය වේ. මෙසේ සෑම පදයකම අර්ථ දතයුතුයි. "**අපයනෙතා**" පහල යනුයේ, බැස යනුයේ. "**අවිජ්ජා අපයනති**" යනු අවිද්‍යාව ඉවත යනුයේ. බැහැර වනුයේ. ඉන්පසු ඇතිවන සංස්කාරාදී ප්‍රත්‍ය ඇතිවීමට හැකියාවක් නැත. "**සංඛාරෙ අපයාපෙති**" යනු සංස්කාරයන් ඉවත්ව යයි. සෙසු පදයන්හිද මේ ක්‍රමයෙන් අර්ථ දතයුතුයි.

නවවන සූත්‍රයයි.

12. 7. 10.

දසවන සූත්‍රයේ "**ගරුකතො**" යනු සියලු දෙව්මිනිසුන් විසින් ගල්කුඩයක් (ඡත්‍රයක්) මෙන් සිතින් ගරුකරන ලද "**මානිතො**" යනු සිතින් ප්‍රියකරනුයේ. "**අපචිතො**" යනු පහත් පැවතුම් ගැනීම් ආදී වශයෙන් පුදන ලද. මිනිස්සු බුදුපියාණන් වහන්සේ දැක ඇතුන්ගේ පිටින් බසිති. මග ඉඩ දෙති. උරයේ ඇති සළුව අතට ගනිති. අසුනින් නැගිටිති. වඳිති. මෙලෙස ඔවුහු ඒ හැසිරීම් වලින් ගරු (අපචායන) කරන ලද්දේ වේ.

"**සුසීමො**" යනු එනමින් යුතු වේදාංගයන්හි දක්ෂ වූ පිරිවැජියා ය. "**එතදවොචුං**" යනු ඔවුන්ට මෙසේ සිත්විය. "ශ්‍රමණ භවත් ගෞතමයෝ ජාතිගෝත්‍රාදියෙන් පැමිණි ලාභයන්ගේ අග්‍රඵවට පත්නොවූයේ මය. උන්වහන්සේ මහා පණ්ඩිත ශ්‍රේෂ්ඨයෙකි. උතුම් පණ්ඩිත්‍යයෙන් ශ්‍රාවකයන්ට ග්‍රහ බැඳ දෙයි. ඔවුහු ඒවා ඉගෙන උපස්ථායක පිරිසට, සමීපයේ හුන්විට කරන කථාවේදීත් අනුව සතුටු වීමේදීත් හඬනගා පැවසීමාදියෝත් එය පවසති. එවිට දායක පිරිස ප්‍රසන්න වී මහත් වූ ලාභ සත්කාර ලඟට ම ගෙනවුත් දෙති. ඉදින් අපි ශ්‍රමණ භවත් ගෞතමයන් දන්නා ප්‍රමාණයෙන් ඉතා අල්ප ප්‍රමාණයක් හෝ දැනගන්නෙමු නම් අපගේ අදහස් එහි යොදා අපගේ උපස්ථායකයන්ට පවසන්නෙමු. එවිට අපට ද ලාභාදිය ලැබෙන්ම ය. භික්ෂූන්ට ද වඩා ලාභ ලබන්නෙමු. ශ්‍රමණ භවත් ගෞතමයන් ලඟ පැවිදිව ඒ දහම ඉක්මණින් ඉගෙනීමට දක්ෂයා කවුද?" යනුවෙන් සිතා සුසීම පිරිවැජියා මෙයට ඉතා දක්ෂයෙකියි දැන ඔහු ලඟට පැමිණ මෙසේ කීහ. "**යෙනායසමා ආනන්දො තෙනුපසංකමි**" යන සුසීමට මෙසේ සිතුණි. "මා හට මේ ධර්මය ඉක්මණින් උගත හැකිවනුයේ කාගේ ලඟට ගියහොත් ද?" මෙසේ විමසන ඔහුට "ශ්‍රමණ ගෞතමයෝ ගුරුවරයා වෙති. එතුමෝ තේජසින් බහුලය. නොවෙනස් ක්‍රියාවලියක (කාලසටහනක් අනුව) එතුමෝ ක්‍රියා කරති. නොකල්හි උන්වහන්සේ හමුවීමට නොහැක. වෙනත් බොහෝ ක්ෂත්‍රියාදිහු ශ්‍රමණ ගෞතමයන් වෙත එළඹෙති. එනිසා එම සමාගමයේදී සමීපයට යා නොහැක. ශ්‍රාවකයන් අතරින් සැරියුත් තෙරණුවෝ මහා ප්‍රඥාවන්තයෙකි. එතුමෝ විදර්ශනා ලක්ෂණ බෙදා දක්වීම අග්‍රවෙති. සමාධි ලක්ෂණ බෙදා දක්වීමෙහි අග්‍රස්ථානය මහමුගලන් තෙරණුවෝ ලබා ඇත. කාශ්‍යප තෙරණුවෝ ධුතාංගධාරීන්ගෙන් අග්‍ර වෙති. දිවැස් ඇත්තවුන් අතරින් අනුරුද්ධ තෙරණුවෝ අග්‍ර වෙති. පුණ්ණමන්තානි පුත්ත තෙරණුවෝ විසිතුරු ධර්ම කථා ඇත්තවුන් අතරින් අග්‍රවෙති. උපාලි තෙරණුවෝ විනයධාරීන් අතරින් අග තනතුරු ලබති. මේ ආනන්ද තෙරණුවන් වනාහී බහුශ්‍රැතය. ත්‍රිපිටකධාරීය. ශාස්තෘන් වහන්සේද ඒ ඒ තැන දෙසූ දහම් කරුණු එතුමන්ට නැවත දේශනා කරන සේක. උන්වහන්සේ අග්‍රතනතුරු පහක් ලැබූහ. අට වරයක් ලැබූහ. සතර ආශ්චර්ය අද්භූත ධර්මයන්ගෙන් යුක්තය. එනිසා ආනන්ද තෙරුන් ලඟට ගියහොත් වහා ධර්මය උගත හැකිවේ. එබැවින් උන්වහන්සේ වෙත එළඹෙමි"යි සිත්විය.

"**යෙන භගවා තෙනුපසංකමි**" යනු කුමක් නිසා තමන් ම ඔහු

පැවිදි නොකර, තථාගතයන් වෙත පැමිණවූ සේක්ද? ආනන්ද හිමියන් මෙසේ සිතුණි. "මොහු අන්‍ය තීර්ථක පැවිද්දෙකි. මා මොහු පැවිදි කළහොත් ශාස්තෘන් වහන්සේ මම යැයි සිතා කටයුතු කරයි. පැවිදිවී සසුනට අලාභ කිරීමට ද පිළිවන. එමෙන් ම මම මොහුගේ අභ්‍යන්තරය නොදනිමි. ශාස්තෘන් වහන්සේම එය දනිති. එනිසා ඔහුත් රැගෙන භාග්‍යවතුන් වහන්සේ වෙතම යන්නෙමි" යනුවෙන් සිතා බුදුරදුන් වෙත එළඹියහ.

"තෙනහානන්ද! සුසීමං පබ්බාජෙහි" යනු භාග්‍යවතුන් වහන්සේට මේ අදහස පහළවූ සේක. "මේ පිරිවැජියා අන් සසුනකින් මෙහි පැමිණ පැවිදි වී "මම ශාස්තෘවරයාය"යි පිළිගෙන හැසිරේ. මේ සසුනේ ද මාර්ග බ්‍රහ්මචර්යාවෙහි හැසිරීමට කැමති යැයි කියයි. කිම මොහු මාහට ප්‍රසන්න වූයේක් ද? පැහැදුණු පුද්ගලයෙක් ද? නැතිනම් මගේ ශ්‍රාවකයන්ට පැහැදුණු පුද්ගලයෙක් ද? නැතිනම් මගේ හෝ ශ්‍රාවකයන්ගේ ධර්ම කථාවකට පැහැදුණු අයෙක් ද?" එවිට ඔහු එකම කාරණයකින් පැහැදි බව දැන "මොහු මගේ සසුනෙන් ධර්මය සොරා ගනිමි"යි පැවිදි වේ. මොහුගේ සසුනට පැමිණීමේ සිත අපිරිසිදුය. මොහුගේ හේතු සම්පත් කවරාකාරද?යි බලන සේක් - "ධර්මය සොරකම් කිරීමේ සිතින් පැවිදි වුවත්, කීපදිනක් උත්සාහ කර - රහත්ඵලය ලබාගන්නේය" යනුවෙනි. මෙනිසා "ආනන්දය! එසේනම් සුසීම පැවිදි කරන්න"යැයි වදාළ සේක.

"අඤ්ඤා බ්‍යාකතා හොති" යනු ඒ භික්ෂූහු තථාගතයන් සමීපයෙන් කමටහන් ගෙන, තෙමසක් වස් වැස - ඒ තෙමස තුලදීම උත්සාහ කර, වෑයම් කර රහත්ඵලය ලබාගත්හ. ඔවුහු මහා පවාරණයෙන් වස් පවාරණය කොට, "අපගේ ගුණමහිමයන් ශාස්තෘන් වහන්සේට දන්වන්නෙමි"යි සෙනසුන් හකුළුවා තබා හෝ ඒවා අත්හැර තථාගතයන් වෙත පැමිණ, තමන් වහන්සේලා ලැබූ අධිගමයන් - ගුණ මහිමයන් දන්වූහ. එනිසා මෙය කියන ලදී. "අඤ්ඤා" යනු රහත් බවයි. "බ්‍යාකතා" යනු දන්වන ලදී. පවසන ලදී.

"අසෙසාසි" යනු ඔහු අසනු කැමතිව යොමු කළ සවන් ඇතිවයි. ඒ ඒ භික්ෂූන් වැඩ වෙසෙන ස්ථානවලට යමින් උන්වහන්සේලා ලැබූ අධිගම පිළිබඳ විස්තර කථා ඇසීමට යයි.

"**යෙන තෙ භික්ඛු තෙනුපසංකමි**" යනු කුමක් නිසා එළඹියේ ද? උන්වහන්සේලා බුදුරදුන්ගේ සම්පයේ කළ කථාව ඇසූ ඔහුට "රහත් බව යනු මේ බුදුසසුනෙහි ඇති පරම සාර වූ ගුරු මුෂ්ටිය විය යුතුය. ඒ ගැන අසා දැනගතිමි" යන සිත ඇතිවිය. මෙනිසා උන්වහන්සේලා සම්පයට එළඹියේය. "**අනෙකවිහිතං**" යනු නානාවිධ වූ යනුයි. "**ඉදධිවිධං**" යනු ඍද්ධි කොටස්ය. ඍද්ධිමය ප්‍රාතිහාර්ය පාන්නා වූ ආකාරයන්ය. "**ආවිභාවං තිරොභාවං**" යනු පෙනෙන ආකාරය දක්වා නොපෙනී යාමයි. නොපෙනී සිට පෙනෙමින් යාමයි. ආදිය සිදුකිරීමට හැකිද?"යි අසයි. "**තිරොකුඩ්ඩං**" යනු බිත්තිය හරහාය. "**තිරොපබ්බතං**" යනාදියේත් පර්වත හරහා යැයි අර්ථ දත යුතුයි. "**උම්මුජ්ජ නිමුජ්ජං**" යනු කිමිදීමත්-මතුවීමත්ය. "**පල්ලඞ්කෙනාති**" යනු පලක් බැඳගෙනය. "**කමථ**" යනු "එසේ හිඳීමට හෝ යෑමට හැකිද?"යි ප්‍රශ්න කිරීමයි. "**පක්ඛිසකුණො**" යනු පියාපත් සහිත පක්ෂියාය. මේ දක්වූයේ සංක්ෂිප්ත වශයෙනි. විස්තර වශයෙන් දැනගනු කැමැත්තන් විසින් මේ ඍද්ධිවිධ හා සෙසු දිබ්බසෝතා දී ප්‍රාතිහාර්ය පිළිබඳව විශුද්ධිමාර්ගය බලා දතයුතුයි.

"**සන්තා විමොක්ඛා**" යනු අංග සන්තතිය මෙන්ම අරමුණු සන්තතිය ද ශාන්ත වූ අරූප විමොක්ෂයෝ ය. "**කායෙන එසසිත්වා**" යනු නාමකයින් ස්පර්ශ කර, ලැබගෙන යනුයි. "**පඤ්ඤා විමුත්තා චො මයං ආවුසො**" යනු "ඇවැත්නි! අපි අවබෝධවීම් ඇති-ධ්‍යාන වැඩීම් නැති ශුෂ්ක විදර්ශකයෝ වෙමු යනුයි. ප්‍රඥාවෙන් පමණක්ම ලැබූ රහත් බව ඇත්තෙමු"යි දක්වයි. "**අජානෙය්‍යාසි වා ත්වං ආවුසො සුසීම! න වා ත්වං අජානෙය්‍යාසි**" කුමක් නිසා මෙසේ වදාළ සේක්ද? උන්වහන්සේලාට මෙබඳු සිතක් විය. "අපි මොහුගේ අදහස පිළිබඳව නොදන්නෙමු. දසබලයන් වහන්සේගෙන්ම විචාරා සැක දුරුකර ගන්නෙමු." යනුවෙනි.

"**ධම්මට්ඨිති ඤාණං**" යනු විදර්ශනා ඤාණයයි. එය පළමුවම උපදියි. "**නිබ්බාණෙ ඤාණං**" යනු විදර්ශනාවෙන් පුරුදු කරමින් පවතින මාර්ග ඤාණයයි. එය පසුව උපදියි. එනිසා භාග්‍යවතුන් වහන්සේ මෙලෙස වදාළ සේක.

"**ආජානෙය්‍යාසි වා**" යනාදිය කුමක් හෙයින් දෙසූ සේක්ද? සමාධියෙන් තොරව වුව ද මෙලෙස ප්‍රඥාවේ උපත ඇති බව දැක්වීමටයි. මෙය කියන ලදී. - "සුසීම! මාර්ගය හෝ ඵලය හෝ සමාධියේ විපාකයක්

නොවේ. සමාධියෙන් ලැබෙන ආනිසංසයක් නොවේ. සමාධියේ නිෂ්පත්තියක් නොවේ. රහත් මාර්ගය හා ඵලය විදර්ශනාවේම විපාකයකි. විදර්ශනාවේම ආනිසංසයකි. විදර්ශනාවේම නිෂ්පත්තියකි. එනිසා නුඹ "ඉක්බිති, ධර්මස්ථිති ඤාණය මුලින් ඇතිවේ. පසුව නිර්වාණ ඤාණය ඇතිවේ" යන මෙය දන්නෙහි ද? නොදන්නෙහි ද?"

දැන් ඔහුගේ සිත ප්‍රතිවේධයට සුදුසු බව දැන තිපරිවර්ත ධර්මදේශනාව දක්වන සේක්. "**තං කිං මඤ්ඤසි සුසීම! රූපං නිච්චං වා අනිච්චං වා**" යනාදිය දෙසූහ. තිපරිවර්ත ධර්මදේශනාව අවසන සුසීම තෙරුන් රහත් බවට පත්විය.

දැන් ඔහුට පිළිවෙතක්-කළයුත්තක් පවරන සේක් - "**ජාතිපච්චයා ජරාමරණනති සුසීම! පසසසි**" යනාදිය දේශනා කළ සේක. "**අපිනුත්‍වං සුසීම**" යනුවෙන් මෙය කුමක් නිසා ඇරඹුවේ ද? ධ්‍යාන වැඩීම් ආදියක් නොමැති ශුෂ්ක විදර්ශක භික්ෂූන්ගේ හැකියාවන් පිළිබඳව ප්‍රකට කිරීම පිණිසයි. මෙහි අදහස මෙසේය. "හුදෙක් නුඹ පමණක් ම ධ්‍යාන වැඩීම් නැති ශුෂ්ක විදර්ශකයෙක් නොවේ. මෙම භික්ෂූහු ද එබඳු පුද්ගලයෝය"යි දැක්වීම සඳහායි. සෙසු පදයන්ගේ අර්ථ විභාග ප්‍රකටය.

දසවන සූත්‍රයයි.

සත්වැනි මහා වර්ගය නිමාවට පත්විය.

12. 8. 11

ශ්‍රමණ බ්‍රාහ්මණ වර්ගයේ - ජරාමරණාදියෙහි එක් එක් පදය වශයෙන් ගෙන වෙන වෙනම දක්වා එකලොස් සූත්‍රයක් දේශනා කරන ලදී. එහි අර්ථ ඉතා ප්‍රකටය.

අටවැනි ශ්‍රමණ බ්‍රාහ්මණ වර්ගය නිමාවට පත්විය.

12. 9-20-1-120

මෙයින් පසුව "සත්‍යා පරියෙසිතබ්බා" යනු මේ ආදී වශයෙන් පැවති දොළොස්, "අන්තර පෙය්‍යාල වර්ගය" නම් වේ. ඒ සියලුම සූත්‍ර ඒ ඒ තැන්වලදී අවබෝධ කරගත්තා වූ භික්ෂුවිය යුතු පුද්ගලයන්ගේ අදහස් වශයෙන් කියන ලදී. එහි "සත්‍යා" යනු බුදුරජාණන් වහන්සේ හෝ ශ්‍රාවකයෙක් හෝ යමක් නිසා මාර්ග ඥාණයක් ලබයිනම් එතුමා "සත්‍යා" හෙවත් "ශාස්තෘවරයා" නම් වේ. ඔහු පිළිබඳව සෙවිය යුතුයි. **"සික්ඛාකරණියා"** ත්‍රිවිධ ශික්ෂාවන් වැඩිය යුතුයි. යෝගාදියෙහි "යොගො" යනු ප්‍රයෝගයයි. යෙදීමයි. **"ඡන්දෝ"** යනු කරනු කැමති, කුසලට ඇති කැමැත්ත. **"උසෙසාළ්හී"** යනු සියල්ල ඉවසන අධික මානු වූ වීර්යයයි. **"අපපටිවානි"** යනු නොනැවතීමයි. **"ආතපපං"** යනු කෙලෙස් තවන වීර්යයයි. **"විරියං"** යනු වීර්යම වේ. **"සාතච්චං"** යනු නිතරම කරන ක්‍රියාවයි. **"සති"** යනු ජරාමරණාදී වශයෙන් චතුරාර්ය සත්‍ය මනාව පරිග්‍රහණය කරගත් සිහියයි. **"සම්පජඤ්ඤං"** යනු එවැනි වූම ඥාණයයි. **"අප්පමාදො"** යනු සත්‍ය භාවනා වශයෙන් අප්‍රමාදී වීමයි. සෙසු පදයන්ගේ අර්ථ ඉතා ප්‍රකටය.

අන්තර පෙය්‍යාල වර්ගය නිමාවිය.

12. 21. 1.

අභිසමය වර්ගයේ පළමු සූත්‍රයෙහි **"නබ්භිබා යං"** යනු මස් තිබෙන තැනින් නික්මුණු නිය අග. ලෞකික මිනිසුන්ගේ නිය අග මහත් ය. බුදුවරයන් වහන්සේලාගේ වනාහී රතු උපුල් පියුම් පෙත්තක කෙළවර මෙන් අතිශය සියුම්ය. කෙසේනම් මෙහි පස් පිහිටා සිටියේද? අධිෂ්ඨාන බලයෙනි. භාග්‍යවතුන් වහන්සේ ධර්ම කාරණය මැනවින් අවබෝධ කරවනු සඳහා අධිෂ්ඨාන බලයෙන් ඒ පස් නිය අග පිහිටවූ සේක. **"සතිමංකලං"** යනු මහපොළොවේ පස් සිය කොටසකට බෙදා ඉන් එක කොටසකි. සෙසු පදයන්හිද මේ ක්‍රමය ම යෙදේ. "අභිසමෙතාවිතො" ප්‍රඥාවෙන් ආර්ය සත්‍යයන් අවබෝධ කරගෙන සිටි පුද්ගලයාගේය. **"පුරිමං දුක්ඛක්ඛන්ධං පරිකිණං පරියාදිණ්ණං උපනිධාය"** යනු මෙහිදීමය. බොහෝ වූ දුක ක්ෂය කරවන ලදී. මෙලෙස දුක්ඛස්කන්ධය හා සමාන කර

බලා ප්‍රථමයෙන් කියන ලදී. ඤාණයෙන් එය, ඒ සමීපයේ තබා පිරික්සා බලමින් යන අර්ථයයි. මෙහි මුල් දුක නම් කුමක්ද? යමක් ක්ෂය කරන ලදද එය දුක නම් වේ. ක්ෂය කරන ලද්දේ කුමක්ද? යමක් පළමු මාර්ගය නොවැඩීමෙන් උපදින්නේ ද එයයි. පිහිටන්නේ කුමක්ද? යමක් සතක් වූ ආත්මභාවයන්හි ද අපාය අටවැනි වූ ප්‍රතිසන්ධිය මුල්කරගත් යම්තැනක උපදින්නේ නම්, ඒ සියලු ස්ථානවල ඉපදීම ක්ෂය කරන ලදැයි දතයුතුයි. "**සතතකඛතතුං**" යනු සත්වාරයක්. සත් භවයක් ඇතුලතදී. "**පරමතා**" යනු මෙය ඔහුගේ ප්‍රමාණයයි යනුවෙන් ප්‍රමාණය දක්වයි. "**මහජ්ජියෝ**" යනු මහත් වූ අර්ථයක් නිපදවන්නෙකි.

පළමු සූත්‍රයයි.

12. 21. 2.

දෙවැනි සූත්‍රයේ - "**පොකඛරණී**" යනු වැවයි. "**උඛෙඛධෙන**" යනු ගැඹුරු බැවින්, "**සමතිතතිකා**" යනු මුවවිට හා සම වූ. "**කාකපෙය්‍ය**" යනු ඉවුරේ සිටි කපුටෙකුට ස්වභාවයෙන්ම කෙටි වූ මුවතුඩ බහා බීමට හැකියාව ඇති.

දෙවැනි සූත්‍රයයි.

12. 21. 3.

තෙවැනි සූත්‍රයේ "**යත්තීමා**" යනු යම් බිඳුණු තැනෙක්හි ඇති මේවාය. "**සංසන්දනති**" යනු සමග ගොස් ගලා බසියි යනුයි. "**සමෙනති**" යනු එකට මිශ්‍රව ගලා බසියි. "**දෙව වා නි වා**" යනු දෙකක් හෝ තුනක්ය. "**උදක-ථුසිතානි**" යනු ජල බින්දුය. "**සමෙභජ්ජං උදකං**" යනු අන්‍ය නදීන් සමග මිශ්‍ර වූ තැන්හි ඇති ජලයයි.

තෙවැනි සූත්‍රයයි.

12. 21. 4.

සිවුවන සූත්‍රයේ අර්ථ ඉතා ප්‍රකටය.

සිවුවන සූත්‍රයයි.

12. 21. 5.

පස්වන සූත්‍රයේ "මහාපඨවියා" යනු සක්වල අභ්‍යන්තරයෙහි මහපොළවෙත් උදුරා යනුයි. "කොළටඨිමතතියෝ" යනු ඩෙබර ගෙඩි පමණ වූ. "ගුළිකා" යනු මැටිගුලිය. "උපනිකඛිපෙය්‍ය" යනු එකම තැනක තබන්නේය යනුයි.

පස්වන සූත්‍රයයි.

12. 21. 6-10

සයවන සූත්‍රයේ සිට දසවන සූත්‍රය දක්වා ඉහත කියන පරිදි ම අර්ථ දතයුතුයි.

12. 21. 11

අවසාන සූත්‍රයේ "අඤ්ඤතිත්‍ථිය සමණබ්‍රාහමණ පරිබබාජකානං අධිගමො" යනු බාහිර ආගමික සම්ප්‍රදායන්ගේ සියලුම ගුණයන්ගේ අධිගමයයි. ප්‍රථම ආර්ය මාර්ගයෙන් ලබන ලද ගුණ සම්පත්තියෙන් සීයෙන් භාගයක්වත්, දහසින් භාගක්වත්, ලක්ෂයකින් භාගයක්වත් නොවටියි. සමීපවිය නොහැක.

අභිසමය වර්ගය නිමාවිය.

අභිසමය සංයුත්තය නිමාවට පත්විය.

13. 1. 1.

ධාතු සංයුත්තයේ පළමු සූත්‍රයේ - අනාත්ම (නිසසතත) ශූන්‍ය (සුඤ්ඤත) යන අර්ථ සංඛ්‍යාත වූ "ස්වභාවයෙන් පවතින" යන අරුතින් "ධාතු" නම් වූ ධර්මයන්ගේ නානාවිධ වූ ස්වභාවය "ධාතුනානත්තං" යනු වේ. චක්ඛුප්‍රසාදය "චක්ඛුධාතු" නම් වේ. රූපාරම්මණය "රූපධාතු" නම් වේ. චක්ඛුප්‍රසාද වස්තුවෙහි පහළවූ සිත "චක්ඛු විඤ්ඤාණධාතු" නම් වේ.

ශ්‍රෝතප්‍රසාදය "සෝතධාතු" නම් වේ. ශබ්දාරම්මණය "සද්දධාතු"වයි. ශ්‍රෝත ප්‍රසාද වස්තුව පිළිබඳ වූ සිත "සොතවිඤ්ඤාණ ධාතු" නම් වේ. අඝ්‍රාණ ප්‍රසාදය "ඝානධාතු"වයි. ගන්ධාරම්මණය "ගන්ධධාතු" නම් වේ. ආඝ්‍රාණ වස්තුක වූ සිත "ඝාන විඤ්ඤාණ ධාතු" නම් වේ. ජිව්හා ප්‍රසාදය "ජිව්හා ධාතු" නම් වේ. රස ආරම්මණය "රස ධාතු" නම් වේ. ජිව්හා ප්‍රසාද වස්තුක වූ සිත "ජිවහා විඤ්ඤාණ ධාතු" නම් වේ. කාය ප්‍රසාදය "කායධාතු"වයි. ඵස්සාරම්මණය "ඵොට්ඨබ්බ ධාතු" නම් වේ. කාය ප්‍රසාද වස්තුක වූ සිත "කාය විඤ්ඤාණ ධාතු" නම් වේ. ත්‍රිවිධ මනෝධාතූහු "මනොධාතු" නම් වේ. වේදනා දී ත්‍රිවිධ ස්කන්ධයෝ, සූක්ෂම රූප ද නිවණ ද "ධම්මධාතු" නම් වේ. සියලුම මනෝවිඤ්ඤාණය "මනො විඤ්ඤාණ ධාතු" නම් වේ. මෙහිද මුල් සොළොස් ධාතූහු කාමාවචරය. අවසන් ධාතු දෙක චතුර්භූමිකය. (හෙවත් කාම, රූප, අරූප හා ලෝකෝත්තර භූමීන්හිම යෙදේ.)

පළමු සූත්‍රයයි.

13. 1. 2.

දෙවැනි සූත්‍රයේ "**උපජ්ජති එසසනානත්තං**" යනු නානා ස්වභාව වූ ස්පර්ශය උපදියි යනුයි. එහි චක්ඛු ස්පර්ශාදිය, චක්ඛු විඤ්ඤාණාදිය සමග එක්ව යෙදේ. (සම්ප්‍රයුක්තය) මනෝ ස්පර්ශය මනෝද්වාරයේ පළමු ජවන් සිත සමග එක්ව යෙදේ. එනිසා "**මනොධාතුං 'පටිචච**" යනුවෙන් මනෝද්වාරා වජ්ජනය, කිරිය මනෝ විඤ්ඤාණ ධාතුව නිසා ඇතිවේ යනුයි. පළමු ජවන් සිතේ ස්පර්ශය, එකට ගැටී උපදියි" යනු මෙහි අර්ථයයි.

දෙවැනි සූත්‍රයයි.

13. 1. 3.

තෙවැනි සූත්‍රයේ "**නො මනො සමඵසසං පටිචච උපපජ්ජති** මනොධාතු" යනු මනෝද්වාරයේ පළමු ජවන් සිත හා එකට යෙදීමෙන් ආවර්ජන කිරිය මනෝ විඤ්ඤාණ ධාතුව නූපදින්නේය" යනුවෙන් අර්ථ දතයුතුයි.

තෙවැනි සූත්‍රයයි.

13. 1. 4.

සිවුවන සූත්‍රයේ "චක්ඛුසම්ඵස්සජා වෙදනා" යනු පිළිගන්නා වූ මනෝධාතුවේ සිට එම ද්වාරයේ හටගන්නා සියලුම වේදනාවෝ පවතින්නෝය. නිෂ්පත්ති පහසුව සඳහා අනන්තර වූ මනාව පිළිගන්නා (සම්පටිච්ඡන) වේදනාවම ගැනීමට සුදුසු යැයි කියන ලදී. "මනො **සම්ඵස්සං පටිච්ච**" යනු මනෝද්වාරයෙහි ආවර්ජන ස්පර්ශය නිසා පළමු ජවන වේදනාව ද පළමු ජවන ස්පර්ශය නිසා දෙවන ජවන වේදනාවද ඇතිවේ" යන අදහසයි.

සිවුවන සූත්‍රයයි.

13. 1. 5.

පස්වන සූත්‍රයේ - තෙවන, සිවුවන සූත්‍රවල කියන ලද ක්‍රමයෙන් එක්කර දෙසන ලදී. මෙසේ දෙවැනි සූත්‍රයේ එන සූත්‍ර සතරෙහි මනෝ ධාතුව, "**මනෝධාතු**" ලෙස නො ගෙන මනෝ ද්වාරා වජ්ජනය ම "මනෝ ධාතුව" යැයි ගන්නා ලදී. මේ සියලුම සූත්‍ර දේශනා ඒ ඒ අයුරින් දේශනා කරනවිට, අවබෝධ කරගන්නවුන්ගේ වශයෙන් දෙසන ලදී. මෙහි සෙසු පදයන්ගේ අර්ථ ද මේ ක්‍රමයෙන් දතයුතුයි.

පස්වන සූත්‍රයයි.

13. 1. 6.

සයවන සූත්‍රයේ - මෙහි විස්තර වන මුල් ධාතු පස කාමාවචර වේ. සයවන "ධර්ම ධාතුව" සිවුභූමික වේ.

සයවන සූත්‍රයයි.

13. 1. 7.

සත්වන සූත්‍රයේ "**රූපධාතු**" යනු ඉදිරියේ සිටි තමාගේ හෝ අනුන්ගේ සලුවලින් වෙලීම් ආදී වස්තුක වූ රූපාරම්මණය. "**රූප සඤ්ඤා**" යනු චක්ඛු විඤ්ඤාණය සම්ප්‍රයුක්ත වූ (එක්ව යෙදුණු) සංඥාව. "**රූප**

සංකපෙපා" යනු පිළිගැනීම් ආදී ත්‍රිවිධ සම්ප්‍රයුක්ත සංකල්පයෝය. "රූපඡඤ්ඤා" යනු රූපයෙහි කැමැත්ත කරන ලද අර්ථයෙන් ඡඤ්ඤයයි. "රූප පරිළාහො" යනු රූපයේ දැවීම් තැවීම් අරුතින් පිරිතැවීමයි. "රූප පරියෙසනා" යනු පිරිතැවීමක් (දාහයක්) උපන් කල්හි ඉදිරියේ සම්මුඛ වූ දෙය රැගෙන රූපයේ ලැබීම පිණිස කරන පරීක්ෂණයයි. මෙහිද - සංඥා, සංකප්ප, ඡන්දාදිය එක් ජවන් වාරයකද නානාවිධ ජවන් වාරයන්හි ද ලැබෙත්. පිරිතැවීම් පර්යේෂණය (සෙවීම) වනාහී නානාවිධ ජවන් වාරයන්හිම ලැබෙත්. "**එවං බො භිකඛවෙ! ධාතූනානත්තං**"-මෙහිද "මෙසේ රූපාදී නානා ස්වභාව ඇති ධාතූන් නිසා රූප සංඥාදී නොයෙක් ස්වභාව ඇති සංඥාවෝ උපදියි." මේ ක්‍රමයෙන් අර්ථ දැකිය යුතුයි.

සත්වන සූත්‍රයයි.

13. 1. 8.

අටවන සූත්‍රයේ "**නො ධම්ම පරියෙසනං පටිච්ච උපජ්ජති ධම්ම පරිළාහො**" යනු මෙසේ පැමිණි නානාවිධ වූ ප්‍රතික්ෂේප කිරීම් පමණක්ම ය.

අටවන සූත්‍රයයි.

13. 1. 9

නවවන සූත්‍රයේ - "**උපජ්ජති රූප සඤ්ඤා**" යනු කියන ලද ක්‍රමයෙන් අරමුණෙහි සංඥාව උපදියි යනුයි. "**රූප සංකපෙපා**" යනු ඒ අරමුණෙහි ත්‍රිවිධවිධ චිත්තයන් සමග එක්ව යෙදුණා වූ සංකල්පනාවයි. "රූප සමඵසෙසා" යනු ඒ අරමුණ ම ස්පර්ශ කරන ඵස්සයයි. "**වේදනා**" යනු ඒ අරමුණම විඳින වේදනාව යි. ඡන්දාදියෙහි කියන ලද ක්‍රමයමයි. "රූපලාභො" යනු පර්යේෂණය කර ලැබූ තණ්හා සහිත අරමුණ "රූප ලාභය" යැයි කියන ලදී. මෙය වනාහී සියලු සංග්‍රහ කිරීම් නය වශයෙන් එකම අරමුණක සියලු ධර්මයන්ගේ ඉපදීම් වශයෙන් කියන ලදී. අනික ආගන්තුක ආරම්මණ මිශ්‍ර වූයේ වේ. රූප සංඥාව, රූප සංකල්පය, ස්පර්ශය, වේදනාව යන මේ සතර ධර්ම ස්ථීර පරිභෝගයෙහි නිබද්ධා රම්මණයෙහි පවතියි. නිබද්ධාරම්මණය වනාහී කිසියම් වූ මනෝඥ, සිත අලවන, ප්‍රියමනාප වූ දෙයක් මෙන් එළඹ සිටියි. ආගන්තුක අරමුණ

වනාහී යම්කිසි සමාන වූවක් ඇත්තේද එය කළඹා සිටියි. එහි මේ නිදසුන් කථාවයි.

එක්තරා ඇමති පුතෙක් ගැමියන් විසින් පිරිවරාගෙන ගම මැද සිට වැඩකටයුතු සිදුකරයි. එසමයේ උවැසියක් ගඟට ගොස් නා, අලංකාරව සැරසී කිරිමවු සමූහයා විසින් පිරිවරාගත්තී තම ගෙදරට යමින් සිටියාය. ඈ දුරදීම එනුදුටු ඇමති පුතා, "මැය" ආගන්තුක ස්ත්‍රියක් වන්නීයැ"යි සිතා "කොල! යව. මැය කවුදැයි දැනගෙන එව!"යි පුරුෂයකු යැවීය. ඒ පුරුෂයා ඈ වෙත ගොස් පසුපස යමින් පරිවාර ස්ත්‍රීන් මගින් "ඇය කොහේ ද?"යි අසා දැනගෙන තත්වූ පරිදි සියලු තොරතුරු ඇමති පුතුට දන්වූයේය. මෙලෙසින්ම ආගන්තුක අරමුණ සිතේ කැළඹීම් ඇතිකරයි. එහි උපන් ඡඳය "රූපඡන්ද" නම් වේ. එයම අරමුණු කර උපන් දාහය-පිරිතැවීම "රූප පරිළාහ" නම් වේ. එක්ව ගොස් එය සෙවීම "**රූපපරියෙසනා**" නම් වේ. පර්යේෂණය කර ලබන ලද තණ්හා සහිත අරමුණ "රූපලාභ" නම් වේ.

උරුවෙලාවාසී වූළනිස්ස තෙරුන්වහන්සේ මෙසේ පවසයි. ත්‍රිපිටක පාළියෙහි ස්පර්ශ වේදනාවෝ, මධ්‍යයෙහි ගන්නා නමුත්, පාළියෙහි පිරිවහා කියන ලද පරිදි අරමුණේ උපදින සංඥාව රූප සංඥාවයි. එහිම උපදින සංකල්පය රූප සංකල්පයයි. එහි උපදින ඡඳය රූප ඡන්දයයි. එහි ඇතිවන දාහය, "රූප පරිළාහ" යයි. එහි සෙවීම "රූප පර්යේෂණය"යි. සෙවීමෙන් ලබන තණ්හා සහිත අරමුණ "රූපලාභය"යැයි. මෙසේ ලබන ලද අරමුණෙහි ගැටීම ස්පර්ශයයි. විඳීම වේදනාවයි. රූප ස්පර්ශය හා රූප ස්පර්ශයෙන් හටගත් වේදනාව යැයි යනුවෙන් මෙසේ දෙකක් ලැබේ" යනුවෙනි.

අන්‍යයෝ "**අවිභූත වාරය**" යැයි ගනිති. - අරමුණ තිරවලින් වටකරන ලද්දේ, තණපත් ආදියෙන් වසන ලද්දේ වේ. ඉන් අඩක් දකින ලද්දේ, "මම අරමුණු මැනවින් දකින්නෙමි"යි බලනුයේ, ඒ අරමුණෙහි උපන් සංඥාව "**රූප සංඥා**" නම් වේ. එහිම උපන් සංකල්පාදිය "රූප සංකප්ප" නම් වේ යැයි දතයුතුයි. මෙපමණකින් ද සංඥා, සංකප්ප, ස්පර්ශ, වේදනා, ඡන්දාදිය එක් ජවන් වාරයක ද නානාවිධ ජවන් වාරයන්හි ද ලැබේ. පිරිතැවීම්, පර්යේෂණ ලාභයන් නානාවිධ ජවන් වාරයෙහි ම වේ.

නවවන සූත්‍රයයි.

13. 1. 10.

දසවන සූත්‍රයේ අර්ථ ඉතා ප්‍රකටය.

පළමුවන නානත්ත වග්ගයයි.

13. 2. 1.

දෙවැනි වර්ගයේ පළමු සූත්‍රයේ "**ආභාධාතු**" යනු ආලෝක ධාතුවයි. ආලෝකයෙහි ද ආලෝක කසිණයේ පරිකර්ම කොට උපන් ධ්‍යානයාගේ ප්‍රීතිය, අරමුණ සහිත ධ්‍යානයට මේ නම යෙදේ. "**සුභා ධාතු**" යනු සුභ කසිණයේ උපන් ධ්‍යාන වශයෙනි. අරමුණු සහිත ධ්‍යානයමයි. ආකාසානඤ්චායතනය ම "**ආකාසානඤ්චායත ධාතු**" නම් වේ. සංඥා වේදයිත නිරෝධයම "**සඤ්ඤා වෙදයිත නිරොධ ධාතු**" නම් වේ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ ගැලපීමෙහි දක්ෂ වූ භික්ෂුව, එහි හිඳ ප්‍රශ්න විචාරනු කැමැත්තාට අවසර දෙන සේක් දේශනාව නැවැත්වූ සේක.

"**අන්ධකාරං පටිච්ච**" යනු අන්ධකාරයමයි. ආලෝකයෙන් වැසුණු, ආලෝකය ද අන්ධකාරය නිසා ඇතිවේ. අන්ධකාරයෙන්ම ආලෝකය ප්‍රකට වේ. එනිසා "අඳුර නිසා ප්‍රකට වේ. පැහැදිළි වේ"යැයි කියන ලදී. "**අසුභං පටිච්ච**" යන මෙහිද මේ ක්‍රමයම යෙදේ. අසුභය සුභයෙන් ද සුභය අසුභයෙන් ද වැසුණේ වේ. අසුභය ඇති කල්හි සුභය ප්‍රකට වේ. එනිසා මෙසේ දෙසූහ. "**රූපං පටිච්ච**" යනු රූපාවචර සමාපත්තිය නිසාය. රූපාවචර සමාපත්තිය ඇතිකල්හි. එය ආකාසානඤ්චායතන සමාපත්ති නම් වේ. රූපය ඉක්මවීම හෝ සිදුවේ. එනිසා මෙසේ වදාළහ. "**විඤ්ඤාණධාතු**" ආදියෙහි ද මේ ක්‍රමයයි. "**නිරොධං පටිච්ච**" යනු සතර ස්කන්ධයන්ගේ නැවත සැකසීමක් සිදුනොවන හෙයින්. ස්කන්ධ නිරෝධය නිසා "නිරෝධ සමාපත්තිය" ප්‍රකට වේ. ස්කන්ධයාගේ පැවතීමෙන් එය ප්‍රකට නොවේ. එනිසා මෙසේ වදාළහ. මෙහි ද සිවු ස්කන්ධයන්ගේ නිරෝධයම "නිරෝධ සමාපත්තිය" වේයැයි දතයුතුයි.

"**කථං සමාපනති පතතබබා**" යනු කවරාකාර සමාපත්තියකට, කවර සමවතකට පැමිණිය යුතු ද? "**සඤ්ඤා සමාපනති පතතබබා**" යනු සංඥාව ඇති බැවින් "සංඥා සමාපත්තිය" නම් වී පැමිණිය යුතුයි. "**සංඛාරාවසෙසා සමාපනති පතතබබා**" යනු සූක්ෂම සංස්කාරයන් ඉතිරිවන බැවින්

සංඛාරාවශේෂ සමාපත්ති නම් වී පැමිණිය යුතුයි. "**නිරොධ සමාපතති පතතබබා**" යනු "නිරෝධයම නිරෝධ සමාපත්තියයි. නිරෝධ සමාපත්ති නම් වී පැමිණිය යුතුයි" යන අර්ථයි.

පළමුවැනි සූත්‍රයයි.

13. 2. 2.

දෙවැනි සූත්‍රයේ "**සනිදානං**" යනු භාව නපුංසක ලිංග වචනයකි. සනිදාන යනු "ප්‍රත්‍ය සහිත වී උපදියි" යන අර්ථයි. "කාමධාතුං **හිකබවෙ! පටිචච**" යන මෙහි කාම විතර්කය ද කාමාවචර ධර්ම ද විශේෂයෙන් සියලු කුසල් ද 'කාමධාතු' නම් වේ. එනිසා මෙසේ කියන ලදී. "එහි කාමධාතුව නම් කවරේද? කාම ප්‍රතිසංයුක්ත වූ තර්කයක්, විතර්කයක්, සංකල්පයක්, අර්පණයක්, බලවත් අර්පණයක්, අරමුණෙහි සිත පිහිටුවීමක්, මිථ්‍යා සංකල්පයක් වේද එය කාමධාතුව නම් වේ. යටින් අවීචි නිරයේ පටන් මත්තෙහි පරනිම්මිතයක් වේද එය කාමධාතුව නම් වේ. යටින් අවීචි නිරයේ පටන් මත්තෙහි පරනිම්මිත වසවර්ති දෙවියන් සහිත වූ මේ අතර ලෝකයන්හි බැසගෙන සිටින, මේ අතරට ඇතුලත් වන යම් ස්කන්ධධාතු, ආයතනයක් වේද; රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණයක් වේද මේ සියල්ල කාමධාතුව නම් වේ. සියලු අකුසල ධර්මයෝද කාමධාතු නම් වෙති."a මෙහි සර්ව සංග්‍රාහිකය හා අසම්භින්න යැයි කථා දෙකක් වේ. මෙය සර්වසංග්‍රාහිකය යි." ඒ තුන අතුරින් ව්‍යාපාද-විහිංසා ධාතු දෙක වෙන වෙන ම පැමිණි බැවින් ඉතිරි ධර්ම "කාම ධාතු" යැයි ගැනීම අසම්භින්න කථාවයි. මේ අසම්භින්න කථාව ම මෙම සූත්‍රයේ දී අදහස් කරන ලදී. මේ කාමධාතුව අරමුණු වශයෙන් හෝ සම්ප්‍රයෝග වශයෙන් හෝ හේතුවීමෙන් කාම සංඥාව උපදියි. "කාම පටිචච" යනු කාම සංඥාව වනාහී සම්ප්‍රයෝගයෙන් හෝ උපනිශ්‍රය වශයෙන් හේතුවීමෙන් කාම සංකල්පය උපදියි. මේ ක්‍රමයෙන් සෑම පදයක ම අර්ථ දත යුතුයි.

"**තීහියානෙහි**" යනු ත්‍රිවිධ කාරණයෙන්. "**මිචඡා පටිපජජති**" යනු වැරදි වූම ප්‍රතිපදාවක්, නිවනට අයත් නොවන පිළිවෙතක් පිළිපදියි. "**බ්‍යාපාද ධාතුං හිකබවෙ**" යන මෙහි ව්‍යාපාද විතර්කය ද ව්‍යාපාදය ද "ව්‍යාපාද ධාතු" නම් වේ. එනිසා මෙය කියන ලදී. "එහි ව්‍යාපාද ධාතුව

නම් කුමක්ද? ව්‍යාපාද ප්‍රතිසංයුක්ත වූ තර්කය, විතර්කය -පෙ- යන මෙය ව්‍යාපාද ධාතුවයි. දශවිධ ආඝාත (ක්‍රෝධ) වස්තුවෙහි හෝ චිත්තයෙහි ක්‍රෝධයක්, ප්‍රතිඝාතයක්, ප්‍රතිඝයක්, ප්‍රතිවිරෝධයක්, කෝපයක්, ප්‍රකෝපයක් -පෙ- නොඝතුටු වූ බවෙක් වේද එය ව්‍යාපාද ධාතු නම් වේ."a මේ ව්‍යාපාද ධාතුව, සහජාත ප්‍රත්‍යාදි වශයෙන් හේතු වී "ව්‍යාපාද සංඥාව" උපදියි. ඉතිරි පදයන්ගේ අර්ථ මූලින් පැවසූ ලෙස දතයුතුයි.

"විහිංසාධාතු භිකඛවෙ" යන මෙහි විහිංසා විතර්කය ද විහිංසාව ද "විහිංසා ධාතු" නම් වේ. එනිසා කියන ලදී. "එහි විහිංසා ධාතුව නම් කුමක්ද? විහිංසාවෙන් යුක්ත වූ තර්කය, විතර්කය -පෙ- මෙය විහිංසා ධාතුව යැයි කියනු ලැබේ. මෙහි කෙනෙක් අතින් හෝ ගලකින් හෝ දණ්ඩකින් හෝ සැතකින් හෝ රැහැනකින් හෝ වෙනත් කිසිවකින් සතුන් නසයිද වෙහෙස කරයි ද; මෙබඳු වූ හිංසාව, රිදවීම, හිංසනය, විහිංසාව, රොස් පරොස් කීම, අතුනන් නැසීම යන මේවා විහිංසා ධාතු නම් වේ."a මේ විහිංසා ධාතුව සහජාත ප්‍රත්‍ය වශයෙන් හේතු වී විහිංසා සංඥාව උපදියි. මෙහි ද ඉතිරි පද පෙර පරිදිම දතයුතුයි.

"තිණදායෙ" යනු තණවලින් ගහණ වූ කැළයේ ය. "අනයබ්‍යසනං" යනු නොවැඩීමයි. විනාශයයි. "එවමෙවඛො" යන මෙහි වියලි තණ ආදිය මෙන් අරමුණ දැකිය යුතුයි. තණ සුල මෙන් අකුසල සංඥාව දතයුතුයි. තණපඳුරු ආශ්‍රිත ප්‍රාණීහු මෙන් මේ සත්ත්වයෝ දතයුතුයි. යම් සේ වියළි තණ ආදියේ තබන ලද තණහුලින් නැගි ගින්න වහා වෑයම් කර නොමනිවූයේ නම් ඒ ප්‍රාණීහු දැඩි ව්‍යසනයට පත්වෙති. මෙලෙසින්ම යම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් උපන් අකුසල් සංඥාව විෂ්කම්භන, තදංග ප්‍රහාණ හා සමුච්ඡේද ප්‍රහාණ වශයෙන් අත් නොහරිනුයේ මහත් වූ දුකට පත්වෙයි. "විසමගතං" යනු රාගවිෂමාදිය අනුව ගිය අකුසල සංඥාව. "න ඛිපපමෙව පජහති" යනු විෂ්කම්භනාදිය වශයෙන් වහා අත්නොහරියි යනුයි. "න විනොදෙති" යනු බැහැර නොකරයි. යනු යනුයි. "න බ්‍යනතී කරොති" යනු බිඳුණු පමණින් ඉතිරි නොකර, ඉවත් නොකරයි යනුයි. "න අනභාවං ගමෙති" යනු සම්පූර්ණයෙන් නොපවතින බවට නොපැමිණේ යනුයි. මෙලෙස සෑම පදයකම 'න'කාරය (නිශේධාර්ථය) දක්විය යුතුයි. "පාටිකංඛා" යනු බලාපොරොත්තු විය යුතුයි. කැමති විය යුතුයි යනුයි.

---

a. විභංග පාළි

"නෙක්ඛම්ම ධාතුං භික්ඛවෙ" යන මෙහි නෙක්ඛම්ම විතර්කය ද සියලු කුසල දහම් හු ද "නෙක්ඛම්ම ධාතු" නම් වේ. එනිසා කියන ලදී. "එහි නෙක්ඛම්ම ධාතුව නම් කුමක්ද? නෛෂ්ක්‍රම්‍යයෙන් යුක්ත වූ තර්කය, විතර්කය -පෙ- යහපත් කල්පනාව යනාදිය නෛෂ්ක්‍රම්‍ය ධාතුව නම් වේ."a මෙහිද කථා (විස්තර ක්‍රම) දෙකකි. නෛෂ්ක්‍රම්‍ය ධාතුව ගැනීමේදී සෙසු ධාතු දෙක ද අදහස් කරන ලද්දේ වේ. කුශලධර්ම පර්යාපන්න වූ බැවින් මෙය සර්ව සංග්‍රාහික නම් වේ. ඒ ධාතුහු වෙන වෙන ම දැක්විය යුතුයැයි සෙසු ධාතුහු තබා ඉතිරි වූ සෙසු සියලු කුසල් නෙක්ඛම්ම ධාතුව යැයි ගතයුතුයි. මෙය අසම්භින්න කථාවයි. මේ නෙක්ඛම්ම ධාතුව සහජාත ප්‍රත්‍ය වශයෙන් උපකාරී වී "නෙක්ඛම්ම සංඥාව" උපදියි. සංඥා ආදිය නිසා විතර්කාදිය සුදුසු පරිදි ඇතිවේ.

"අබ්‍යාපාදං ධාතුං භික්ඛවෙ" යන මෙහි අව්‍යාපාද විතර්කය ද අව්‍යාපාදය ද "අව්‍යාපාද ධාතු" නම් වේ. එනිසා කියන ලදී. "එහි අව්‍යාපාද ධාතුව නම් කුමක්ද? අව්‍යාපාද සිතින් යුක්ත වූ තර්කය -පෙ- යනු අව්‍යාපාද ධාතුවයි. සත්ත්වයන් කෙරෙහි පතුරන මෛත්‍රිය, මිත්‍රත්වය, මෙත් සිත පැතිරවීම, මෛත්‍රී චේතෝ විමුක්තිය යනු මේ අව්‍යාපාද ධාතුවයි."a මේ "අව්‍යාපාද ධාතුව" නිසා මුලින් පැවසූ ලෙස ම අබ්‍යාපාද සංඥාව උපදියි.

"අවිහිංසාධාතුං භික්ඛවෙ" යන මෙහිද අවිහිංසා විතර්කය ද කරුණාව ද "අවිහිංසා ධාතු" නම් වේ. එනිසා කියන ලදී. "එහි අවිහිංසා ධාතුව යනු කුමක්ද? අවිහිංසාවෙන් යුක්ත වූ තර්කය -පෙ- මෙය අවිහිංසා ධාතුව නම් වේ. යමෙක් සත්ත්වයන් කෙරෙහි කරුණාව, කරුණා සිත, කාරුණිකත්වය, කරුණා චේතො විමුක්තිය පතුරුවා වෙස්ඳ ඒ අවිහිංසා ධාතුව නම්වේ."a මේ අවිහිංසා ධාතුව නිසා කියන ලද ආකාරයෙන් ම අවිහිංසා සංඥාව උපදියි. ඉතිරි සියලු පද අර්ථ කියන ලද පරිදිම දතයුතුයි.

දෙවැනි සූත්‍රයයි.

---

a. විභංග පාළි

13. 2. 3.

තෙවැනි සූත්‍රයේ "**ධාතුං හිකඛවෙ**" යනුවෙන් මෙතැන් පටන් ඇති අදහස (කැමැත්ත) ධාතුව යැයි දක්වයි. "උපපජ්ජති සඤ්ඤා" යනු කැමැත්ත නිසා සංඥාව උපදියි. "**උපපජ්ජති දිටඨි උපපජ්ජති විතකෙකා**" යන මෙහිදී ද කච්චායන තෙරුන් ප්‍රශ්නයක් විමසන්නේ යැයි උන්වහන්සේට අවසර දීමට දේශනාව නතර කළ සේක.

"**අසමමා සම්බුදෙධසු**" යනු ෂඩ් ශාස්තෘන් අතුරින්ය. "**සමමා සම්බුදධා**" යනු අපි සම්මා සම්බුදු වෙමු'යි. "**කිං පටිච්ච පඤ්ඤායති**" "කුමක් ඇති කල්හි මෙසේ සිදුවේද?"යි ශාස්තෘන් වහන්සේලාට උපන් දෘෂ්ටිය පිළිබඳව විමසයි. සම්මා සම්බුදු නොවූ ඔවුන් කෙරෙහි "මොවුහු සම්මා සම්බුදුවරයෝ වෙති"යි තීරථක ශ්‍රාවකයන්ට උපන් දෘෂ්ටියට විචාරන්නේය. දන් ඔවුන්ට අවිද්‍යා ධාතුව නිසා මෙබඳු දෘෂ්ටියක් ඇතිවී යැයි දක්වමින් "ඒ අවිද්‍යා ධාතුව මහත් වූවකි. ඒ මහත් වූ ධාතුව නිසා ඒ වැරදි දෘෂ්ටිය ඇතිවීයැයි "**මහතීඛො එසා**" යනාදිය වදාළහ.

"**හීනං කච්චාන! ධාතු පටිච්ච**" යනු හීනවූ අදහස් නිසා, "**පණිධි**" යනු සිතේ ඇති ප්‍රාර්ථනාව. ප්‍රණිධිය, එය ප්‍රාර්ථනා කරන්නාට ස්ත්‍රීභාවය හෝ වඳුරු ආදී තිරිසන් ආත්මභාවයන්හි ඉපදීමට හැකිවේ. "**හීනො පුගගලො**" යමෙකුට මේ හීනධර්ම උපදිත් ද ඒ සියලුම පුද්ගලයෝ "හීන" නම් වේ. "හීනාවාචා" යනු යමෙකුගේ වචනය ද හීනය. පහත්ය. "**හීනං ආචිකඛති**" යනු ඔහු යමක් පවසනුයේ හීන වූ දෙයක්ම පවසයි. යමක් දෙසනුයේ හීන වූ ම දෙයක් දේශනා කරයි. මෙලෙස සෑම පදයකම යෙදිය යුතුයි. "**උපපත්ති**" යනු උපත් දෙකකි. "ප්‍රතිලාභ" හා "**නිබ්බත්ති**" වශයෙනි. නිබ්බත්ති යනු හීන කුලවල ඉපදීමයි. "ප්‍රතිලාභ" යනු සිත උපදින ක්ෂණයයි. හීනාර්ථ වශයෙන් කියන්නාගේ පංචවිධ නීච කුලයන්හි ඉපදීම් වශයෙන් හීන වූ ඉපදීමයි. වෛශ්‍ය-ශූද්‍ර කුලයන්හි ඉපදීම් වශයෙන් මධ්‍යම වේ. ක්ෂත්‍රිය-බ්‍රාහ්මණ කුලයන්හි ඉපදීම් වශයෙන් උසස් වේ. දොළොස් කුසල සිත් ඉපදීම් වශයෙන් ලබන ප්‍රතිලාභය හීනවූවකි. තෙහුමික ධර්මයන්ගේ ප්‍රතිලාභය මධ්‍යම වේ. නවලෝකෝත්තර ධර්ම ප්‍රතිලාභයම ඉතා උසස් වේ. මේ සූත්‍රයේ නිබ්බත්තිය ම උත්පත්තිය වශයෙන් සලකන ලදී.

තෙවැනි සූත්‍රයයි.

13. 2. 4.

සිවුවන සූත්‍රයේ "**සංසන්ධනති**" යනු එක්ව වෙති යනුයි. "සමෙනති" එකට එකතුවෙති. අතරක් නොමැතිව එකතුවෙති. "හීනාධිමුත්තිකා" යනු හීනවූ අදහස් ඇත්තෝයි. "කල්‍යාණාධිමුත්තිකා" යනු යහපත් (උසස්) අදහස් ඇත්තෝයි.

සතරවන සූත්‍රයයි.

13. 2. 5.

පස්වන සූත්‍රයේ "**පසසථ නො**" යනු දකින්නහුද? යනුයි. "**සබෙබ බො එතෙ**" යනු භාග්‍යවතුන් වහන්සේ විසින් සැරියුත් තෙරුන්ව, "මහණෙනි, මගේ ශ්‍රාවක භික්ෂූන්ගෙන් මහා ප්‍රඥාවන්තයන් අතරින් මේ සැරියුත් තෙරණුවෝ අග්‍රවෙති"යි මහාප්‍රාඥයන් අතර අග තනතුරට පත්කළ සේක. එනිසා උන්වහන්සේගෙන් ස්කන්ධ, ධාතු, ආයතන, සතිපට්ඨාන, බෝධිපාක්ෂික ධර්ම, ත්‍රිලක්ෂණ ආදියේ ගැඹුරු ප්‍රඥාව විචාරන්නෙමු"යි මහා ප්‍රඥාවන්තයෝම පිරිවරාගෙන සිටිති. උන්වහන්සේද ඔවුන්ට පොළව දිගහරින්නාක් මෙන් ද මහමෙර පාමුලින් වැලි උදුරා ගන්නාක් මෙන්ද සක්වල පව්ව බිඳින්නාක් මෙන් ද මහමෙර ඔසවා තබන්නාක් මෙන්ද අහසේ හැසිරෙන සඳහිරු දෙදෙන උදාකරන්නාක් මෙන්ද ඇසූ ඇසූ ප්‍රශ්න විසඳන සේක. එනිසා මෙලෙස වදාළහ. "**සබෙබ බො එතෙ භික්ඛවෙ! භික්ඛු මහා පඤ්ඤා**" මහමුගලන් තෙරුන් ද තථාගතයන් වහන්සේ විසින් - "මහණෙනි! මගේ ශ්‍රාවකයන් අතර ඍද්ධිමත් භික්ෂූන්ගෙන් මහමුගලන් තෙරණුවෝ අග්‍රවෙති"යි ඍද්ධිමතුන් අතර අග තනතුරෙහි තබන ලදහ. එනිසා "උන්වහන්සේගෙන් "ඍද්ධි පරිකර්ම, ආනිසංස, අධිෂ්ඨාන, විඤ්ඤාණ ආදිය විමසන්නෙමු"යි ඍද්ධිමත් තෙරවරුම පිරිවරාගෙන සිටිති. උන්වහන්සේ ද ඔවුන්ගේ ප්‍රශ්නවලට ඉහත පැවසූ අයුරින්ම පිළිතුරු දෙති. එනිසා බුදුහු මෙසේ වදාළහ. "**සබෙබ බො එතෙ භික්ඛවෙ! භික්ඛු මහිද්ධිකා**" මහාකාශ්‍යප තෙරුන් ද භාග්‍යවතුන් වහන්සේ විසින් "මහණෙනි! මාගේ ශ්‍රාවක භික්ෂූන්ගෙන් ධුතාංගධාරීන් අතරින් මහාකාශ්‍යප තෙරණුවෝ අග්‍රවෙති"යි ධුතාංගධාරීන් අතර අග තනතුරෙහි පිහිටවූ සේක. එනිසා උන්වහන්සේගෙන් "ධුතාංගයන්ගේ ආරක්ෂාව, ආනිසංස, සමාදන් වීම, අධිෂ්ඨානය, බිඳීයෑම විචාරන්නෙමු"යි ධුතාංගධාරී භික්ෂූහූම පිරිවරාගෙන සිටිති. උන්වහන්සේ ද

ඔවුන්ගේ ප්‍රශ්නයන් වහා නිරාකරණය කරදෙති. මෙනිසා මෙසේ වදාළහ. "සඛෙ බො එතෙ භික්ඛවෙ! භික්ඛු ධුතවාදා" භාග්‍යවතුන් වහන්සේ විසින් අනුරුද්ධ තෙරුන් ද "මහණෙනි! මගේ ශ්‍රාවක වූ දිවැස් ඇති භික්ෂූන් අතරින් අනුරුද්ධ තෙරණුවෝ අග්‍රවෙති"යි දිවැස් ඇති භික්ෂූන් අතර අග තනතුරෙහි පිහිටවූ සේක. මෙනිසා උන්වහන්සේගෙන් ද "දිවැස් ආරක්ෂා කරගැනීම, අනුසස්, එය කිලිටිවන ආකාරය අසා දැනගන්නෙමු"යි දිවැස් ඇති භික්ෂූහුම පිරිවරාගෙන සිටිති. උන්වහන්සේද ඔවුන්ගේ සෑම ප්‍රශ්නයක්ම නිරාකරණය කරදෙති. එනිසා මෙසේ වදාළහ. "සඛෙ බො එතෙ භික්ඛවෙ! භික්ඛු දිබ්බ චක්ඛුකා" භාග්‍යවතුන් වහන්සේ විසින් පුණ්ණ තෙරණුවෝ ද "මහණෙනි! මාගේ ශ්‍රාවක භික්ෂූන් අතර ධර්ම කථිකයන්ගෙන් පුණ්ණ මන්තානි පුත්ත තෙරහු අග්‍රවෙති"යි ධර්මකථික භික්ෂූන් අතර අගතනතුරෙහි තබන ලද සේක. මෙනිසා උන්වහන්සේගෙන් "ධර්මකථාවේ දී සංක්ෂිප්ත, විස්තර, ගැඹුරු, ප්‍රකට, විසිතුරු කථාවන් සිදුකරන ආකාරයන් විචාරන්නෙමු"යි ධර්මකථික තෙරවරු විසින්ම පිරිවරාගෙන සිටිති. උන්වහන්සේ ද ඔවුන්ට "ඇවැත්නි! ධර්මකථිකයා විසින් පිරිසට පළමුව වර්ණනාවන් දෙසීම සුදුසුය. මධ්‍යයේ දී ශූන්‍යතාව ප්‍රකාශ කළයුතුයි. අවසානයේ දී චතුරාර්ය සත්‍ය වශයෙන් ප්‍රධාන අරමුණ ගැනීම සුදුසුයැ"යි මෙලෙසින් ඒ දහම් කථා නය පිළිබඳව කරන සේක. එනිසා මෙසේ වදාළහ. "සඛෙබ බො එතෙ භික්ඛවෙ! භික්ඛු ධම්මකථිකා" භාග්‍යවතුන් වහන්සේ විසින් උපාලි මහතෙරුන් ද "මහණෙනි! මගේ ශ්‍රාවක භික්ෂූන් අතර විනයධාරීන් අතුරින් උපාලි තෙරණුවෝ අග්‍ර වෙති"යි විනයධාරීන් අතර අගතනතුරට පත් කළ සේක. මෙනිසා උපාලි තෙරණුවන්ගෙන් "ගරුක, ලහුක, කර්මාදිය, පිළියම් කළහැකි හා කළ නොහැකි වැරදි, ආපත්ති-අනාපත්ති ආදිය විචාරන්නෙමු"යි විනයධරයෝම පිරිවරාගෙන සිටිති. උන්වහන්සේ ද ඔවුහු අසන අසන ප්‍රශ්න ඒ ඒ ලෙසම මනාව විසඳා දෙති. මෙනිසා මෙසේ වදාළහ. "සඛෙබ බො එතෙ භික්ඛවෙ! භික්ඛූ විනයධරා" භාග්‍යවතුන් වහන්සේ විසින් අනඳ තෙරණුවෝ ද "මහණෙනි! මගේ ශ්‍රාවක භික්ෂූන්ගෙන් බහුශ්‍රැතයන් අතුරින් අග්‍රවෙති"යි බහුශ්‍රැතයන් අතර අගතනතුරෙහි තැබූ සේක. මෙනිසා ආනන්ද හිමිගෙන් "දශවිධ ව්‍යඤ්ජන, විචාරා, අර්ථෝත්පත්ති, අනුසන්ධි, පූර්ව-අපර වශයෙන් විචාරන්නෙමු"යි බහුශ්‍රැත භික්ෂූහු ම පිරිවරාගෙන සිටිති. උන්වහන්සේද ඔවුන්ට "මෙය මෙසේ විය යුතුයි. මෙය මෙසේ වටහාගත යුතුයි." යනාදීන් ලෙස සියල්ල පවසති. මෙනිසා මෙසේ වදාළහ. "සඛෙබ බො එතෙ භික්ඛවෙ! භික්ඛූ බහුසසුතා" දෙවිදත් තෙර වනාහී පවිටුය. ආශාවන්ගෙන් මඩනා ලද්දේය. එනිසා

උන්වහන්සේගෙන් "කුල සංග්‍රහ ලබාගැනීම්, නානාප්‍රකාර වූ කුහක ක්‍රියාවන් විචාරන්නෙමු"යි පවිටු භික්ෂූහු ම පිරිවරාගෙන සිටිති. උන්වහන්සේ ද ඔවුන්ට ඒ ඒ න්‍යායන්-ක්‍රමයන් කියාදෙති. මෙනිසා වදාළ සේක. **"සබ්බෙ ඛො එතෙ භික්ඛවෙ! භික්ඛූ පාපිච්ඡා"**. කුමක් නිසා මේ මහතෙරවරු භාග්‍යවතුන් වහන්සේට නුදුරෙහි හිඳිමින් සක්මන් කළාහුද? "දෙව්දත් තෙර, ශාස්තෘන් වහන්සේ කෙරෙහි දූෂිත වූ සිතැතිව අනර්ථ කිරීමට ම උපක්‍රම කරන්නේයැ" යි බුදුපියාණන් වහන්සේ කෙරෙහි දූෂිත වූ සිතැතිව අනර්ථ කිරීමට ම උපක්‍රම කරන්නේයැ"යි බුදුපියාණන් වහන්සේ ආරක්ෂා කරගැනීම පිණිසයි. දෙව්දත් තෙර කුමක් හෙයින් සක්මන් කළේ ද? "මෙතෙම ගුණදහම් නොවඩන අක්‍රියයෙකි. ඉදින් ක්‍රියාකාරියෙක් වන්නේ නම් මෙහි පැමිණිය යුතු වන්නේයැ"යි තමා පිළිබඳ ඇතිවන දොස් වැනසීම, වැලක්වීම සඳහාම පැමිණියේය. කිම භාග්‍යවතුන් වහන්සේට අනර්ථ කිරීමට දෙව්දත් තෙර සමත් වේද? භාග්‍යවතුන් වහන්සේට මෙබඳු ආරක්ෂා සංවිධානයන්ගෙන් ප්‍රතිඵලයක් තිබේද? නැත්තේමය. මෙනිසා බුදුහු මෙසේ වදාරා ඇත. "ආනන්දයෙනි! මෙය විය නොහැක. කුමක්ද? තථාගතයන් වහන්සේ අන්‍යයකුගේ උපක්‍රමයකින් පිරිනිවෙයන මෙය සිදුවීමට ඉඩ නැත." මහතෙරවරු බුදුරජාණන් වහන්සේ කෙරෙහිම හටගත් ගෞරවයෙන් මෙහි පැමිණියහ. එනිසාම බුදුපියාණෝ, "ආනන්දයෙණි! භික්ෂු සංඝයා විසුරුවන්න"යි වදාරා ඔවුහු පිටත්කර හැරි සේක.

පස්වන සූත්‍රයයි.

13.2.6.

සයවන සූත්‍රයේ "ගුථො ගුථෙන සංසෙන්දති සමෙති" යනු සමුද්‍ර-ජනපද-සක්වල අතර සිටියා වූ වර්ණ, ගන්ධ, රස ආදී නානාවිධ වූ කරුණු අනුව යන්නේ එකට සැසඳෙති. එකට එක්වෙති. නිරතුරුව එක සමාන වෙති. සෙසු පදයන්හි අර්ථ ද මෙසේ දතයුතුයි. මේ අප්‍රිය උපමාවෙන් හීන අදහස් ඇත්තෝ හීනයන් සමගම ගැලපෙන බව දක්වන ලදී. කිරි ආදී විශිෂ්ට උපමාවන් යහපත් අදහස් ඇත්තන්, යහපත් අදහස් ඇති අය සමගම එක්වෙන බව දැක්වීමට යොදන ලදී. "සංසගගා" යනු දර්ශන, ශ්‍රවණ, සංස්ර්ගාදී වශයෙන් වස්තු-තණ්හා ස්නේහයෙනි. "වනථො **ජාතො**" යනු කෙලෙස් වනයේ හටගත් යනුයි. **"අසංසගෙගන ජීජජති"** යනු එක් තැනක හිඳීම් ආදිය නොකරන්නහුගේ එක් නොවීමෙන්-

නොරැඳීමෙන් එය සිඳේ-බිඳේ යනුයි. "**සාධුජීවී**" යනු පාරිශුද්ධ වූ දිවියක් ගත කරනුයේ යනුයි. "**සහාවසෙ**" යනු එක්ව වාසය කරන්නා වූ යනුයි.

සයවන සූත්‍රයයි.

13. 2. 7

සත්වන සූත්‍රයේ "**අසඳධා අසඳදෙධහි**" යනාදියෙහි ත්‍රිවිධරත්නය කෙරෙහි ශ්‍රද්ධාවක් නොමැතිව, ඕජස් නැති, රසයක් නැති, පුද්ගලයෝ මුහුදේ මෙතෙර සිටියාහු එතෙර සිටියා වූ අශ්‍රද්ධාවන්තයන් සමග, අදහස්වලින් සමාන වූ බැවින් අතරක් නොමැතිව එකතුවෙති. එසේම "**අහිරිකා**" ශිෂ්ට සීමාව බිඳි, නිර්ලජ්ජී පුද්ගලයෝ. "**අහිරිකෙහි**" එබඳුම ලැජ්ජා නැත්තන් සමග එක්වෙති. "**අනොතතාපිතො**" යනු පාප ක්‍රියාවන්හි බියක් නැති පුද්ගලයෝ, "**අනොතතාපීහි**" - පවට බිය නොවූවන් හා එක්වෙති. "**අපපසසුතා**" යනු ඇසුපිරුතැන් නැත්තෝ "**අපපසසුතෙහි**" අල්පශ්‍රැතයන් සමගම එක්වෙති. "**කුසීතා**". කම්මැලියෝ "**කුසීතෙහි**" කම්මැලියන් සමගම එක්වෙති. "**මුටඨසසතිනො**" යනු බත් දැමූ, කපුටුමස් ආදිය දැමූ සිවලුන් හා සමවූවෝ "**මුටඨසසතීහි**" මුලාවූවන් සමග එක්වෙති. "**දුපපඤඤා**" යනු ස්කන්ධාදිය වෙන්කර නොදකින ප්‍රඥාව නැත්තෝ "**දුපපඤඤහි**" එබඳුම ප්‍රඥාව නැත්තන් සමග එක්වෙති. "**සදධා සමපනනා**" යනු චෛත්‍යවන්දනාදී කටයුතුවල යෙදුණෝ "**සදධහි**" ශ්‍රද්ධාවන්තයන් හා එක්වෙති. "**හිරිමතා**" ලජ්ජා ඇත්තෝ "**හිරිමතෙහි**" ලජ්ජා ඇත්තවුන් හා එක්වෙති. "**ඔතතාපිනො**" පවට බිය ඇත්තෝ "**ඔතතාපීහි**" පවට බිය ඇත්තවුන් සමග ද "**බහුසසුතා**" බොහෝ ඇසූ පිරූ තැන් ඇති, පෙළදරන, බුදුවදන ආරක්‍ෂා කරන, ආර්ය වංශය සුරකින පුද්ගලයෝ "**බහුසසුතෙහි**" බහුශ්‍රැතයන් සමගද "**ආරදධවිරියා**" පිරිපුන්-දැඩි පරාක්‍රමයෙන්, වීර්යයෙන් යුක්තවූවෝ "**ආරද්ධ විරියෙහි**" ඇරඹූ වීර්ය ඇත්තවුන් සමග ද එක්වෙති. "**උපටඨිත සතිනො**" සියලු කටයුතු කටයුතු කිරීමෙහි සමත් සිහියෙන් යුක්තවූවෝ "**උපටඨිත සතීහි**" එළඹුණු සිහි ඇත්තවුන් සමග ද "**පඤඤාවනෙතා**" මහා ප්‍රඥාවෙන් වජ්‍ර පර්වතයක් බඳු ඤාණයෙන් යුක්ත වූවෝ "**පඤඤාවනෙතහි**" ප්‍රඥා ඇත්තවුන් සමගද ඉතා දුර සිටියත් ඒ ප්‍රඥා සම්පත්තියෙන් "**සංසන්දනති. සමෙනති**" සැසඳෙති. එකට එක්වෙති.

සත්වන සූත්‍රයයි.

13. 2. 8-12.

අටවන සූත්‍රයේ සිට - ඒ අශ්‍රද්ධාවන්ත ධර්මයන් තුනේ කොටස් ලෙස බෙදා දක්වන ලදී. එහි අටවන සූත්‍රයේ අශ්‍රද්ධා දී මූලික වූ සිත් ඇත්තෝ කලු පක්ෂය, සුදු පක්ෂය වශයෙන් තුනේ කොටස් පහක් (පංච ත්‍රිකයක්) දේශනා කර ඇත. නවවන සූත්‍රයේ පවට ලැජ්ජා නොවන්නෝ මූලන් කොටස් සතරකටත්, දසවන සූත්‍රයේ දී පවට බිය ඇත්තෝ මූලිකව තුනේ කොටස් තුනකටත් බෙදා දක්වන ලදී. එකළොස්වන සූත්‍රයේ අල්පශ්‍රැතයෝ තුනේ කොටස් දෙකකි. දොළොස්වන සූත්‍රයේ කුසීත-කම්මැලි බව මූලික කරගත්තෝ එක් ත්‍රිකයකි. මෙසේ සූත්‍ර පසෙහි ම තුනේ කොටස් (ත්‍රික) පහළොවකි. ඇතැම්හු "පසළොස් ත්‍රික සූත්‍ර" යැයි මෙය නම් කරති. මෙය තික පෙය්‍යාල නම් වේ.

දෙවැනි වර්ගයයි.

13. 3. 1-2

ඉන් අනතුරුව එන පළමු සූත්‍රයේ - අශ්‍රද්ධාව ආදී කරුණු පංචක වශයෙන් කියන ලදී. දෙවන සූත්‍රයේ ද එසේමය. පළමු උපචාර අර්පණාදී සමාධි රහිත වූ අසමාහිත පද සතරකි. දෙවැනි සූත්‍රයේ දුස්සීල පදය ද යෙදේ. මෙම සූත්‍ර අවබෝධ කරගන්නා වූ පුද්ගලයන්ගේ අදහස් වශයෙන් මෙලෙස සූත්‍ර දෙකක් දේශනා කරන ලදී. මෙහි "අසමාහිත" යනු උපචාර-අර්පණාදී සමධියෙන් තොරවූ යනුයි. "දුස්සීලා" යනු සිල්නැති බවයි.

13.3. 3-4

තෙවන සූත්‍රය - පස් කර්මපථ වශයෙන් අවබෝධ කරගන්නවුන්ගේ අදහස් වශයෙන් දේශනා කරන ලදී. සතරවන සූත්‍රය සත් කර්මපථ වශයෙන් දේශිතය. පස්වන සූත්‍රය දශ කර්මපථ වශයෙන් දෙසන ලදී. එහි තෙවැනි සූත්‍රයේ "සුරාමෙරය මජ්ජපමාදට්ඨායිනො" යනු "රහමෙර" නම් වූ මදයට ප්‍රමාදයට හේතු වූ මත්වීමේ සිතෙන් පානය කරති. එය මදයට හා ප්‍රමාදයට හේතුවූ රහමෙර යැ"යි කියනු ලැබේ. එහි යෙදුනෝ " රහමෙර පානය කරන්නෝ" නම් වෙති. අමුතු පදයකට ඇත්තේ මෙම පදය පමණි. සෙසු පදයන්හි අර්ථ ඉතා ප්‍රකටය.

13. 3. 5.

පස්වන සූත්‍රයේ-"ප්‍රාණය වේගයෙන් හෙළයි" යනු "පාණාතිපාතිනො" නම් වේ. "පරපණ නසයි" යන අර්ථයයි. "නුඳුන්දේ ගනියි" යනු "අදිනනා දායිනො" නම් වේ. "අනුන්ගේ දේ ගනියි" යන අර්ථයයි. වස්තු කාමයෙහිත් ක්ලේශ කාමයෙහිත් වැරදි හැසිරීම් ඇත්තේ "කාමෙසු මිචඡාචාරිනො" නම් වේ. බොරු කියයි. රවටයි යනු "මුසාවාදිනො" නම්. අන්‍යයන්ගේ යහපත නසන, හිස්-බොරු, පදනමක් නැති වදන් පවසයි. යන අර්ථයයි. කේලාම් කියයි යනු "පිසුණාවාචා" නම්. "මොවුහු මර්මස්ථාන සිඳ දමන එරුෂ වදන් ඇත්තෝය" යනු "එරුසා වාචා" නම්. ප්‍රලාප, නිරර්ථක වචන කථා කරන්නෝ "සමඵපපලාපිනො". දැඩිසේ ලෝභ කරන්නෝ "අභිජඣාලුනො" නම් වේ. "අන්‍යන්ගේ සම්පත් පිළිබඳව එල්බෙන ස්වභාව ඇති" යනු "බ්‍යාපතත චිතතා" නම්. "වැරදි පවිටු නුවණැත්තන් විසින් ගැරහූ දෘෂ්ටියක් මොවුන්ට ඇත" යනු "මිචඡා දිටඨිකා" නම් වේ. කර්මපථ ඇතුලත් දානයේ විපාක නැත ආදී වශයෙන් දැක්වූ වැරදි දේ ඇතුලත් නිවණට අයත් නොවන දෘෂ්ටියෙන් යුක්ත වූ" යන අර්ථයයි. යහපත් වූ ශෝභන වූ නැණවතුන් විසින් පසසන ලද මොවුන්ගේ දෘෂ්ටිය යනු "සමමාදිටඨිකා" නම් වේ. කර්මපථයට ඇතුලත් වූ "දානයේ විපාක ඇත" යනාදී කර්මය පිළිබඳව දැක්වූ දැක්මක් සහිත. "නිවැරදි වූ මාර්ග දෘෂ්ටියෙන් යුක්ත වූ" යන අර්ථයයි. මෙය වනාහී පෙර නො පැවසූ පදයන්ගේ වර්ණනාවක් පමණි.

ප්‍රාණඝාතය, අදත්තාදානය, කාම මිත්‍යාචාරය, මුසාවාදය, පුසාණාවාචා, සම්ප්‍රප්ඵලාපය, අභිධ්‍යාව, ව්‍යාපාදය හා මිත්‍යා දෘෂ්ටිය යන මේ අකුසල පක්ෂයේ අර්ථය දශවිධ වේ. එහි ප්‍රාණයාගේ වේගවත් වැටීම ප්‍රාණඝාතයයි. ප්‍රාණයක් වදයක් වීම ප්‍රාණඝාත නම් වේ. "ප්‍රාණ" යනු සම්මුති වශයෙන් සත්ත්වයායි. පරමාර්ථ වශයෙන් ජීවිතින්ද්‍රියයි. ඒ ප්‍රාණය යන හැඟීම් ඇති සත්ත්වයා කෙරෙහි ජීවත්වීමේ ශක්තිය සිඳ දමන, උපක්‍රම උපදවන කායවාග් ද්වාරයන්ගෙන් එකකින් පවතින වධකමය චේතනාව ප්‍රාණ ඝාතයයි. සියලු ගුණයන්ගෙන් දුරුවූ එය, තිරිසන්ගත කුඩා ප්‍රාණීන් කෙරෙහි අල්ප සාවද්‍ය වේ. මහා ශරීර ඇති සතුන් කෙරෙහි මහා සාවද්‍ය වේ. කුමක් නිසාද? ප්‍රයෝගයේ මහත් බව නිසයි. වස්තුව විශාල වනවිට ඊට යොදන ප්‍රයෝගය ද මහත් වේ. ගුණවත් සත්පුරුෂයකු නම් මහා සාවද්‍ය වේ. අල්ප ගුණ ඇත්තෙකු නම් අල්ප සාවද්‍ය වේ. මෙහි දී ශරීරය එකසමාන වුවත් ගුණයන් මත

තීරණය වේ. කෙලෙස්, උපක්‍රම ආදියේ මෘදුතාවය නිසාද අල්ප සාවද්‍ය වේ. ඒවායේ තියුණු බැවින් මහාසාවද්‍ය වේ. ප්‍රාණඝාතය සම්පූර්ණ වීමට අවශ්‍ය කරුණු පහකි. ප්‍රාණියෙක් වීම, ප්‍රාණියෙක් බව දැනගැනීම, මරණ සිත, ඊට උපක්‍රමයක් යෙදීම, ඒ උපක්‍රමයෙන් මරණයට පත්වීම යන කරුණු පසයි. මෙහි ප්‍රයෝග සයකි. සියතින් කිරීම, අණකර කරවීම, අත්හැරීමේදී ස්ථාවරව සිටීමේදී, විද්‍යාමය වශයෙන් හා ඍද්ධිමය වශයෙනි. මෙලෙස අර්ථ විස්තර කරන කල්හි අතිශයින් ප්‍රමාද වේ. එනිසා වැඩි විස්තර නොපවසමු. දිගු විස්තර කැමැත්තන් විසින් සමන්තපාසාදිකා විනය අටුවාව බලා කරුණු දැනගත යුතුයි.

නුදුන් දේ ගැනීම අදින්නාදානයයි. අනුන්ගේ දේ ගැනීම සොරකමකි. එහි "නුදුන් දේ" යනු අනුන් විසින් අල්වාගත්. යම්තැනක් අනුන්ගේ කැමැත්ත ඇතිව දඬුවමකට හෝ දොස් නැගීමකට නොහැකිවේද එබඳු අනුන් අයත් වූ තැන්. අනුන් අයත් වස්තු ඒ බව දැන දැන, සොරසිතින් උපක්‍රම උපදවා ගැනීම, අනුන්ගේ පරිත්‍යාග කිරීමක් නොමැතිව ගැනීම අදින්නාදානයයි. ඒ දෙය අනුන් සතු වූ හීන වූ දෙයක් නම් අල්ප සාවද්‍ය වේ. උසස් දෙයක් නම් මහා සාවද්‍ය වේ. කුමක් නිසාද? වස්තුවේ උසස් බව නිසයි. වස්තු සමාන කල්හි ගුණවැඩි අයගේ වස්තුව ගැනීමෙහි මහා සාවද්‍ය වේ. එහි ගුණ අධික බව සලකා බැලේ. ගුණහීනයන්ගේ අයත් වස්තුවෙහි අල්ප සාවද්‍ය වේ. මෙහිද සම්පූර්ණ විය යුතු කරුණු පහකි. අනුන් අයත් වස්තුවක් වීම, අනුන් අයත් බව දැන සිටීම, සොරකම් කිරීමේ සිත, උපක්‍රමය, එයින් වස්තුව සොරාගැනීම යන පසයි. ප්‍රයෝග හයකි. ඉහත කී ප්‍රයෝග සයම මෙහිදී යෙදේ. එහිද සුපුරුදු පරිදි සොරසිතින් ගැනීම, බලහත්කාරයෙන් ගැනීම, සැඟවී ගැනීම, පරිකල්පනයෙන් - අදහසින් ගැනීම හා සිටිටු වශයෙන් ගැනීම යන මේ සොරාගැනීම් වශයෙන් පවතියි. මේ සංක්ෂිප්ත දක්වීමයි. මේ සියල්ල සවිස්තරව සමන්තපාසාදිකාවෙහි දැක්වේ.

"කාමයෙහි වරදවා හැසිරීම" යන මෙහි - "කාමයෙහි" යනු ලිංගික හැසිරීමයි. "වැරදි හැසිරීම" යනු ඒකාන්තයෙන් නින්දිත වූ ළාමක හැසිරීමකි. ලක්ෂණ වශයෙන් අසත්ධර්මයේ අදහසින් කායද්වාරයේ පවතින, නොයා යුතු තැන් සොයන සිත - කාමයෙහි වැරදි හැසිරීමයි. එහි "නොයායුතු තැන" නම් පුරුෂයන්ගේ ආරක්ෂාව ඇති, මව ආරක්ෂා කරන, පියා ආරක්ෂා කරන, මාපිය දෙපලම ආරක්ෂා කරන, සෝයුරා රකින, සෝයුරිය රකින, ගෝත්‍රයෙන් ආරක්ෂා වන, ධර්මයෙන් ආරක්ෂා වන, රැකවලින්

ආරක්ෂා වන සහ පරිදණ්ඩ සහිත යනාදී ලෙස ස්ත්‍රීහු දසදෙනෙකි. මිලදීගත් දාසිය, කැමැත්තෙන් වසන්නිය, භෝග වාසිනිය, පටවාසිනිය, ඕදපත්තකිනිය, දරුණුවේ සැඟවුණිය, දාසී භාර්යාව, කම්මකාරී භාර්යාව, කොඩිගත් තැනැත්තිය, නැකැත් කියන්නිය යනාදී දසදෙනෙක් ද වෙති. මේ ස්ත්‍රීන් විසිදෙන අතුරින් පසුව කී දසදෙනා සහ ආරක්ෂා කරන හා පරිදණ්ඩ සහිත යන දෙදෙන සහිත දොළොස් ස්ත්‍රීහු වෙත වෙනත් පුරුෂයකු නොයායුතු වේ. එය නොයායුතු තැනයි. වැරදි හැසිරීම් සහිත සීලාදී ගුණ ඇති නොයායුතු තැන්වලට යෑම - අල්ප සාවද්‍ය වේ. සීලාදී ගුණ සම්පන්න නම් මහා සාවද්‍ය වේ. එහි උපකරණ සතරකි. නොයායුතු වස්තුව සේවනය කිරීමේ සිත, ඇසුරට ප්‍රයෝග කිරීම, මගින් මගට යෑමේ පිළිවෙත, එය ඉවසීම යනු ඒ හතරයි. මෙහි ප්‍රයෝග එකකි. සියතින් තමාම කිරීමයි.

බොරුකීම - මුලාව පෙරටු කරගත් යහපත බිඳදමන කාය-වාග් ප්‍රයෝගය මුසාවාදයයි. රැවටීමේ අදහසින් අනුන් මුලාකිරීමට යෙදූ කාය-වාග් ප්‍රයෝගයෙහි උපන් සිත මුසාවාදයයි. තවත් ක්‍රමයක් මෙසේය. "මුසා" යනු අසත්‍ය, පදනමක් නැති වස්තුවයි. "වාද" යනු එහි සත්‍ය බවක් පදනමක් පෙන්වීමයි. ලක්ෂණ වශයෙන් අසත්‍ය දෙයක් සත්‍ය ලෙස අනුන්ට පෙන්වනු, දන්වනු කැමති පුද්ගලයාගේ එසේ දැනුම්දීම උපදවන සිත මුසාවාදයයි. එය යම් අල්ප වූ අර්ථයක්-යහපතක් බිඳියිද එය අල්ප සාවද්‍ය වේ. මහත් වූ දෙයක් විනාශ කිරීම මහාසාවද්‍ය වේ. තවද ගිහියන්ගේ තමා සන්තකව "නොදෙන කැමැත්තක් නැතැ"යි ඇති වස්තු කෙරෙහි අල්ප සාවද්‍ය වේ. පැවිද්දන්ට අල්ප වූ තෙල් ගිතෙල් ආදියක් ලැබ කවටකම් අදහසින්, "අද ගමේ තෙල් ගගක් ගලන්නේ යැයි සිතමි" ආදී ලෙස පිරවීමේ අදහසින් පවතින කථාව අල්ප සාවද්‍ය වේ. "නොවුටු දෙයක් දකිමි"යි පැවසීම මහාසාවද්‍ය වේ. මෙහි සම්පූර්ණ වියයුතු කරුණු 4කි. අසත්‍ය වූ වස්තුවක් වීම, අනුන් රැවටීමේ සිත, ඊට කරන ප්‍රයෝගය හා ඇසූ පුද්ගලයා පිළිගෙන රැවටී දුකට පත්වීම යනු ඒ හතරයි. මෙහි "තමා විසින්ම කිරීම" (සාහත්‍ථික) නම් එකම ප්‍රයෝගයක් ඇත. එය කයින්, කයේ බැඳුණු දෙයකින්, වදනින් ආදියෙන් රැවටීම කළ හැකිය. එම ක්‍රියාවන්ගෙන් අදාළ පුද්ගලයා අර්ථය දැනගනියි. මේ ක්‍රියාව (කාය-වාග්) පහළ වූ ක්ෂණයෙහිම මුසාවාද කර්මය සිදුවී එය බැඳී පසුපස එයි.

යම් වදනකින් අනිකකුගේ වචනයක් ප්‍රකාශවේද, එය අසන්නාගේ සිතින් තමා කෙරේ ප්‍රියභාවයකුත් අනිකා කෙරෙහි ශූන්‍ය භාවයකුත්

(වෛරයක් වැනි) ඇතිකරයි ද එය "පිසුණාවාචා" නම් වේ. යම් වචනයක් පවසනවිට කියන්නාත්-අසන්නාත්, පරුෂ-රෞද්‍ර බවට පත්වේද වදන ද ස්වභාවයෙන් පරුෂ ද කණට අප්‍රිය වේද හෘදයංගම නොවේද ඒ "ඵරුසා වාචා" නම් වේ. යමකු විසින් හිස්වූවක් කියයිද නිරර්ථක දෙයක් කියයිද එය සම්ප්‍රප්ඵලාපයයි. "සම්ඵප්පලාපා". මේ ක්‍රියා කරන්නන්ගේ චේතනාවද "පිසුණාවාච" යනාදී නාමයන් ම ලබයි. එම චේතනාව ම මෙහිදී අදහස් විය.

එහි කිලිටි සිතින් අනුන් බිඳවීමටත්, තමා ප්‍රියවීමටත්, කාය-වාග් ප්‍රයෝගයෙන් හටගත් චේතනාව "පිසුණාවාචා" නම් වේ. ඉන් අල්ප ගුණ ඇත්තෙකු භේද කරයි නම් "අල්ප සාවද්‍ය" වේ. මහත් ගුණ ඇත්තකු නම් "මහා සාවද්‍ය" වේ. එහි සම්පූර්ණ විය යුතු කරුණු හතරකි. අනුන් බිඳලීමේ අදහස - "මොවහු වෙනස් වෙත්වා, වෙන්ව සිටිත්වා" යන භේද කිරීමේ අදහස, "මමම ප්‍රිය වෙමි.-විශ්වාසයට යමි" යන සිත, ඊට උත්සාහ කිරීම, ඔහුගේ අදහස දැනගෙන භේදවීම යන සතරයි. අන්‍යයන්ගේ මර්මස්ථාන සිඳීමට සමත් කාය-වාග් ප්‍රයෝගයෙන් හටගත්, ඒකාන්ත පරුෂ වූ චේතනාව "ඵරුසාවාචා" නම් වේ. එහි අර්ථ මැනවින් වටහා ගැනීමට මේ කථා වස්තුව සුදුසු ය.

එක් දරුවෙක් මවගේ වචනය නො අසා කැලයට යයි. මව ඔහු නැවැත්වීමට නොහැකි වූවා - "එම්බල, අකිකරු දරුව! තා මීහරක් දෙනක් ලුහුබඳීවා!"යි කියා කෑ ගැවාය. කැලයේ ඇතට ගිය ඔහු පසුපස මව කී ලෙසම මීගව දෙනක් එළවාගෙන ආවාය. එවිට දරුවා "මගේ මවගේ මුවින් පිටවූ දෙය ඉටුනොවේවා! ඇගේ හදවතින් පැතූ දෙයම ඉටුවේවා!"යි සත්‍යක්‍රියා කළේය. මීදෙන එහිම අල්ලා බැන්දාක් මෙන් නතර වූවාය. මෙසේ මර්මස්ථාන බිඳලන වචනයක් වුවත් සිතේ එරුෂ බවක් නොමැතිව කියන්නේ ද එය පරුෂ වදනක් නොවේ. මවුපියවරු කිසිදිනෙක සිය දූ පුතුන්ට "සොරු නුඹලා කඩකඩ කෙරෙත්වා!යි නොකියති. නොසිතති. උපුල්පතක් පවා ඔවුන් මත වැටීම නො ඉවසති. ආචාර්ය-උපාධ්‍යායයෝ ද කිසිදිනෙක තමා යටතේ වෙසෙන සාමණේරවරුන්ට මෙසේ කියති. "කිම මෙසේ ලැජ්ජා නැතුව, බිය නැතුව මෙලෙස හැසිරෙවුද? මෙතැනින් ඉවත්ව යවු" යනුවෙන් මෙසේ වදනින් කියූවත් සිතින් සාමණේරවරුන්ගේ මාර්ගාධිගමනය ම, සැපතට කැමති වෙති. යම්සේ සිතේ මෘදුභාවය ඇතිව කියූ වදන ඵරුෂ වචනයක් නොවන්නේද එලෙසින්ම වචනයේ මෘදුමොලොක් වූ සිතේ ඵරුෂ වූ ප්‍රිය වචනය ද

ප්‍රියවචනයක් නොවේ. යමෙක් මරණු කැමති සිතින් "මෙහි සුවසේ සැතපෙව"යි යන වදන් කීම පරුෂ වචනයකි. සිතේ ඇති පරුෂ බව නිසා එය එරුෂ වචනයක් වේ. යම් පරුෂ වචනයකට ලක්වූ පුද්ගලයා තුල අල්ප ගුණ වේනම් එය අල්ප සාවද්‍ය වේ. මහත්වූ ගුණ ඇත්තෙකුට පැවසූයේ නම් මහා සාවද්‍ය වේ. මෙහිදී සම්පූර්ණ වියයුතු කරුණු තුනකි. "අන්‍යයකුට අක්‍රෝශ කළයුතු වීම, කෝප සිත, අක්‍රෝශ කිරීම යන කරුණු තුනයි.

අනර්ථය අවබෝධ කරවන වාග් ප්‍රයෝගයෙන් හටගත් අකුසල චේතනාව සම්ප්‍රජ්ඵලාඵයයි. එය අල්පව ඇසුරු කිරීමෙන් අල්ප සාවද්‍ය වේ. මහත්සේ එහි යෙදීම මහා සාවද්‍ය වේ. මෙහිදී සම්පූර්ණ වියයුතු කරුණු දෙකකි. භාරත යුද්ධ-සීතා පැහැරගැනීම් ආදී නිරර්ථක කථා පෙරටුකරගත් කථා කීම හා ඒවා පිළිබඳ සාකච්ඡා කිරීම. "දඩිසේ ලෝභ කිරීම" - "අභිජ්ඣා" නම් වේ. අනුන්ගේ භාණ්ඩවලට ආශාවෙන් ඒවා තමා සතු වේවායි පවතින කැමැත්ත. "අනේ මෙය මට වේවා"යි අනුන්ගේ බඩු පිළිබඳ දැඩි ලෝභ කිරීම මෙහි ඇති ලක්ෂණයයි. අදින්නාදානාදියේ මෙන් මෙය ද අල්පසාවද්‍ය හා මහා සාවද්‍ය වේ. මෙහිදී සම්පූර්ණ විය යුතු කරුණු දෙකකි. අන්‍යයන් සතු භාණ්ඩයක් පැවතීමත්, එය තමා සතු කරගැනීමත් ය. අන්‍ය දේපල පිළිබඳ දැඩි තණ්හාව ඇතිවී යම්තාක් "අනේ මට සම්පත් අයත් වේවා!"යි තමා අයත් කර නොගනියිද ඒතාක් කර්මපථය භේද නොවේ. හිත සුවපත් ගතියට ද්වේෂ කිරීම ව්‍යාපාදයයි. එය අනුන් වැනසීමට කැමති ලක්ෂණයයි. එරුස වචනය මෙන් මෙය ද අල්ප සාවද්‍ය හා මහා සාවද්‍ය වේ. එහි සම්පූර්ණ විය යුතු කරුණු දෙකකි. වෙනත් සත්ත්වයකු සිටීමත් ඔහු විනාශ කරන සිතත්ය. වෙනත් සත්ත්වයකු පිළිබඳ ක්‍රෝධය උපන් කල්හි යම්තාක් කල් "අනේ මොහු විනාශ වන්නේ නම් සිඳී යන්නේ නම් යෙහෙකි" යනුවෙන් විනාශය නොපතත්ද ඒ දක්වා කර්මපථ භේදය නොවේ. තත්වූ පරිද්දෙන් ගැනීමක් නොමැති හෙයින් "වැරදි ලෙස දකියි" යනු මිත්‍යාදෘෂ්ඨියයි. එහි "දානයේ විපාක නැත" යනාදී වශයෙන් පවතින විපරීත ලක්ෂණයයි. මෙහි අල්ප හා මහා සාවද්‍ය වීම සම්ප්‍රජ්ඵලාපයේ කියූ ලෙස දතයුතුයි. නියමක් නොවූ විට අල්ප සාවද්‍ය වේ. නියමිත පැනවීමක් නම් මහා සාවද්‍ය වේ. මෙය සම්පූර්ණ වීමට ද අවශ්‍ය වන කරුණු දෙකකි. වස්තුවත් (කාරණයක්) එය පිළිගන්නා ආකාරයේ විපරීත බවත් යන දෙකයි. ඔහු පිළිගන්නා (වස්තුව) ආකාරයෙන් ම ඔහුට කරුණු අවබෝධ වේ.

මේ දශ අකුශල කර්මපථ ධර්ම වශයෙන්, කොටියාශ වශයෙන්, ආරම්මණ වශයෙන්, වේදනා වශයෙන් හා මූල වශයෙන් යන පස් ආකාරයෙන් විනිශ්චය දතයුතුයි. එහි - ධර්ම වශයෙන් පිළිවෙලින් සප්ත චේතනා ධර්ම වේ. අභිධ්‍යාදී ත්‍රිවිධ චේතනාවන්ගෙන් යුක්තය. කොටියාශ වශයෙන් යනු පිළිවෙලින් සප්ත මිථ්‍යා දෘෂ්ටියයි. යන මුල් නොවූ අටවැදෑරුම් කර්මපථයෝ ම වෙති. අභිධ්‍යාව, ව්‍යාපාදය යන කර්මපථයෝ ම මෙහිදී මූලික වෙති. අභිධ්‍යාව දස අකුශල ලෝභ අකුශල මූලයකි. ව්‍යාපාදය ද්වේෂ අකුශල මූලයකි. මිත්‍යාදෘෂ්ටිය මෝහ අකුශල මූලයකි. ආරම්මණ වශයෙන් - ප්‍රාණඝාතය ජීවිතේන්ද්‍රිය ආරම්මණයක් හෝ සංස්කාර ආරම්මණයක් වේ. අදින්නාදානය සප්තාරම්මණයක් හෝ සංස්කාරාරම්මණයක් වේ. මිත්‍යාචාරය ස්පර්ශ වශයෙන් සංස්කාරාරම්මණයක් මය. ඇතැම්හු සප්තාරම්මණයෙකැයි පවසති. මුසාවාදය සප්තාරම්මණයක් හෝ සංස්කාරාරම්මණයක් වේ. එසේම පිසුනාවාචයත්, ඵරුෂාවාචයත් සප්තාරම්මණම වේ. සම්ප්‍රපඵලාපය දුටු-ඇසූ-ගැවුණු ලෙස දැනගැනීම් වශයෙන් සප්තාරම්මණයක් හෝ සංස්කාරාරම්මණයක් වේ. අභිධ්‍යාව ද එසේමය. ව්‍යාපාදයෙහි සප්තාරම්මණය පමණක් ඇත. මිත්‍යා දෘෂ්ටිය තෙහුමූලික ධර්ම වශයෙන් සංස්කාරාරම්මණයක් වේ. වේදනා වශයෙන් යනු ප්‍රාණඝාතයෙන් දුක් වේදනාව වේ. රජවරු සොරෙකු දැක සිනාසෙමින් වුවත් - "යවු. මොහු මරවු"යි කියති. ඔවුන්ගේ අධිෂ්ඨාන චේතනාව දුකින් යුක්තමය. අදින්නාදානයේ ද වේදනා තුනකි. ඵරුෂ වචනයෙහි දුක් වේදනාව ඇත. සම්ප්‍රපඵලාපයෙහි වේදනා තුනකි. අභිධ්‍යාවෙහි සුඛ හා මධ්‍යස්ථ ලෙස වේදනා දෙකකි. මිත්‍යා දෘෂ්ටියෙහි ද එසේමය. ව්‍යාපාදයේ දුක් වේදනාව පමණක් ඇත. මූල වශයෙන් ප්‍රාණඝාතයෙහි දෝස-මෝහ වශයෙන් මූල දෙකකි. අදින්නාදානයේ දෝස-මෝහ ලෙස හෝ ලෝභ-මෝහ ලෙස මූල දෙකකි. මිත්‍යාචාරයෙහි ලෝභ-මෝහ වශයෙන් මූල දෙකක. පිසුනාවාචයෙහිත් සම්ප්‍රපඵලාපයෙහිත් එසේම ය. පරුෂ වචනයේ දෝස-මෝහ වශයෙන් මූල දෙකකි. අභිධ්‍යාවෙහි මෝහ වශයෙන් එකම මූලයකි. ව්‍යාපාදයේත් එසේම වේ. මිත්‍යා දෘෂ්ටියෙහි ලෝභ-මෝහ වශයෙන් මූල දෙකකි.

"පාණාතිපාතා පටිවිරතා" යනු ප්‍රාණඝාත කිරීම් ආදිය ඉහත පැවැසූ හෙයින් ඒවයින් වැලකීම "පටිවිරතා" නම් වේ. විරතියෙහි (වැලකීමෙහි) කොටස් තුනකි. සමපතත විරතිය, සමාදාන විරතිය හා සමුච්ඡේද විරති යනුවෙනි. එහි සමාදන් වූ ශික්ෂාපදයක් ද තම ජාතිය, වයස, බහුශ්‍රැත බව ආදියත් සිහිකර කර. "මෙලෙස කිරීම අපට නුසුදුසුය"යි පැමිණි වස්තුව

නො ඉක්මවන්නන්ට උපදින විරතිය, "සම්පන්න විරතිය" නම් වේ. සිංහල දීපයේ චක්කන උපාසකයාට මෙනි.

ඔහු ළමා කාලයේදී ම මවට රෝගයක් ඇතිවිය. වෛද්‍යවරයා විසින් "අමු හාවකුගේ මස් ලැබුනොත් හොඳයැ"යි කියන ලදී. එවිට චක්කනගේ සෝයුරා "දරුව! යන්න. කුඹුරු ලැහැබෙහි ඇවිද බලන්න"යි කියා චක්කන එහි යැවීය. චක්කන කුඹුරට ගොස් බලාසිටින විට එක් හාවෙකු ළපටි ගොයම් කෑමට කුඹුරට බැස සිටියේය. ඌ චක්කන දැක වේගයෙන් දුවන්නේ වැලකින් බැඳුණි. කිරි කිරි ශබ්දයෙන් හැඬුවේය. චක්කන එම ශබ්දය අනුව අවුත් හාවා රැගෙන "මවට බෙහෙත් කරමි"යි සිතුවේය. නැවත තමා ගැන සිහිපත්ව "මගේ මවගේ ජීවත්වීම පිණිස තව කෙනෙකුගේ ජීවිතය පැහැර ගැනීම මාහට තරම් නොවේ. එය මට නොගැලපේ. නුසුදුසු ක්‍රියාවකි. එනිසා නුඹ බේරී පලායව! කැළයේ හාවුන් සමග තණදිය වළඳව!"යි කියා සෙනෙහසින් හාවා මුදාහැරියේය. නිවසට පැමිණි චක්කන දුටු සෝයුරා, "කිම ද දරුව! හාවෙකු ලැබුනේ ද?"යි චක්කනගෙන් විමසීය. චක්කන සිදුවූ පුවත කීවේය. කෝපයට පත් සෝයුරා චක්කනට දෝෂාරෝපණය කළේය. දුක්බිත සිතින් මව සමීපයට ගිය චක්කන, "මම උපන් තැන් පටන් දැන දැන සතෙකුගේ ජීවිතය විනාශ නොකළෙමි. ඒ සත්‍ය බලයෙන් මගේ මව සුවපත් වේවා!"යි සත්‍යක්‍රියා කළේය. එකෙණෙහිම මව සුවපත් වූවාය.

සමාදන් වූ ශික්ෂාපදයන්ගේ ගුණබල සිහිකර, ශික්ෂාපද සමාදානය ම තම ජීවිතයටත් වඩා අගනා බව සලකා, දිවි ගියත් සිල්පද ආරක්ෂා කරන්නන්ට උපදින විරතිය "සමාදාන විරති" නම් වේ. අන්තර වඩ්ඪමාන පර්වත වැසි උපාසකයා මෙනි.

ඔහු අම්බරිය විහාරවාසී පිංගල බුද්ධරක්ඛිත තෙරුන්ගෙන් ශික්ෂාපද සමාදන්ව කුඹුරක් සීසායි. එවිට ඔහුගේ ගොනෙක් නැතිවිය. ඔහු ඒ ගොනා සොයා යනුයේ අන්තර වඩ්ඪමාන පර්වතයට නැගුණි. එහිදී ඔහු මහා සර්පයකු විසින් අල්ලා ගන්නා ලදී. එවිට ඔහු "මේ තියුණු වෑයෙන් සර්ප හිස සිඳිමි"යි සිතිය. එවිට ම ඔහුට "ඒ මම ගරුකටයුතු තෙරුන් වෙතින් සිකපද සමාදන් වීමි. එය බිඳීම මට තරම් නොවේ" යන කල්පනාව ඇතිවිය. මෙසේ තෙවරක් ම සිතා "දිවි ගිය ද සිකපද නොකඩමි"යි ඉනේ ගසාගෙන සිටි තියුණු වෑය කැළයට විසි කළේය. එවිට ඒ මහා සර්පයා ඔහු අත්හැර ඉවත ගියේය.

ආර්ය මාර්ගයෙන් යුක්ත වූ විරතිය "සමුච්ඡේද විරති", නම් වේ. යමකුට උපතේ සිට "පරපණ නොසමි"යි සිතක් නොම වේද, ඒ ආර්යයන්ගේ ම විරතිය මෙහිදී අදහස් විය.

දශ අකුශල මෙන්ම දශ අකුශල කර්මපථද, කොට්යාශ, ආරම්මණ, වේදනා, මූල යන පස් ආකාරයෙන් විනිශ්චය කළයුතුයි. ධර්ම වශයෙන්- මෙහි පිළිවෙලින් සප්ත චේතනාවන් ද විරති ද යෙදීම සුදුසු වේ. කෙළවර තුනෙහි ද (අන්තිම තුනේ) එතන ම යෙදුනේමය. කොට්යාශ වශයෙන් - පිළිවෙලින් මුල් සත කර්මපථයන් ම වේ. මුල් නැත. අවසන් තුන කර්මපථ ද මූලයන් ද වෙයි. අනභිධ්‍යාවෙහි මූලයට පැමිණි අලෝභය කුසල මූලයක් වේ. අව්‍යාපදයෙහි මූලය වූ අදොසය කුසල මූලයකි. සම්මා දෘෂ්ටිය, අමෝහයේ කුසල මූලයකි. ආරම්මණ වශයෙන් - ප්‍රාණ ඝාතාදියේ අරමුණුම මේවායෙහි ද අරමුණු වේ. ඉක්මවිය යුතු වස්තුවම "විරති" නම් වේ. යම්සේ නිර්වාණාරම්මණය ආර්ය මාර්ගයේ ඇති කෙලෙස් දුරුකරයි ද එලෙසින් ම ජීවිතින්ද්‍රිය ආදී කොට ඇති අරමුණුවලින් මේ කර්මපථයන්හි ප්‍රාණඝාතාදී දුශ්ශීලයන් දුරු කරන්නේ යැයි දතයුතුයි. වේදනා වශයෙන්-සියල්ලෙහි ම සුඛ වේදනාව හා මධ්‍යස්ථ වේදනාවම පවතියි. කුසලයට පැමිණි දුක්වේදනාවක් නම් නැත. මූල වශයෙන්- පිළිවෙලින් මුල් සතෙහි සම්ප්‍රයුක්ත සිතින් වැලකෙන්නහුට අලෝභ, අදෝස, අමෝහ වශයෙන් ත්‍රිවිධ මූලයෝම වෙති. ඤාණ විප්‍රයුක්ත සිතින් වැලකෙන්නහුට මූල දෙකක් වේ. අනභිධ්‍යාවෙහි ඤාණ සම්ප්‍රයුක්ත සිතින් වැලකෙන්නහුට මුල් දෙකකි. ඤාණවිප්‍රයුක්ත සිතින් වැලකෙන්නහුට එක් මූලයකි. අලෝභය තමා ම තමාට මූලයක් නොවේ. අව්‍යාපාදයෙහිද මේ ක්‍රමයමයි. සම්මා දිට්ඨිය අලෝභ-අදෝස වශයෙන් මූල දෙකක් ම වේ.

පස්වන සූත්‍රයයි.

13. 3. 6-7

සයවන සූත්‍රය ආර්ය අෂ්ඨාංගික මාර්ගය වශයෙන් ද අවබෝධ කරගන්නා පුද්ගල අදහස් වශයෙන් ද දේශනා කරන ලදී. සත්වන සූත්‍රය දශවිධ මිථ්‍යාව හැසිරීම හා යහපත් හැසිරීම ලෙස දේශනා කරන ලදී. එහි "**මිච්ඡා ඤාණිනො**" යනු වැරදි විඤ්ඤාණයයි. (දූනීමයි) "වැරදි ප්‍රත්‍යවේක්ෂණයෙන් යුක්ත වූයේය" යන අදහසයි. "**මිච්ඡා විමුත්තිකා**"

යනු නිවනට අයත් නොවන විමුක්තියයි. අකුසල් කිරීම මිදීම යැයි ගෙන සිටී. "**සම්මාඤාණිනො**" යනු යහපත් ප්‍රත්‍යවේක්ෂණයයි. "**සම්මා විමුතතිකා**" යනු නිවණට අයත් ඵල විමුක්තියෙන් යුක්ත වූ යන අර්ථයයි.

තෙවැනි කර්මපථ වර්ගය නිමාවිය.

13. 4. 1.

සතරවන වර්ගයේ පළමු සූත්‍රයේ "**පඨවි ධාතු**" යනු පිහිටන ධාතුවයි. "**ආපෝ ධාතු**" යනු එකට බැඳෙන ධාතුවයි. "**තෙජො ධාතු**" යනු මෝරා යන ධාතුවයි. "**වායෝ ධාතු**" යනු පුම්බවන ධාතුවයි. මේ දක්වූයේ සංක්ෂිප්ත වශයෙනි. සවිස්තර ලෙස විසි කොටියාසි වශයෙන් කිව යුතුයි.

පළමු සූත්‍රයයි.

13. 4. 2.

දෙවන සූත්‍රයේ "**අයං පඨවි ධාතුයා අසසාදො**" යනු මේ පඨවි ධාතුව ආශ්‍රිත වූ ආශ්වාදයයි. ඔහු මේ කය ඉතා උස්කර, උදරය දිගහැර "මෙහි මගේ ඇඟිල්ල පිවිසවීමට වෑයම් කරවු" කියා හෝ අත දිගහැර "මෙය නැවීමට වෑයම් කරවු" කියා හෝ පවසයි. මෙසේ පවතින ආශ්වාදයයි. "**අනිචචා**" යනාදියෙහි - පැවතී විනාශවන අර්ථයෙන් "**අනිචචා**" නම් වේ. පෙලීමට ලක්වන ආකාරයෙන් "**දුකඛා**". ස්වභාවය වෙනස්වන ආකාරයෙන් "**විපරිණාම ධමමා**". "**අයං පඨවි ධාතුයා ආදීනවො**" යනු යම් අයුරකින් මෙය අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වන්නේ ද මෙලෙසින් පඨවි ධාතුවේ ආදීනව ද දතයුතුයි. "**ඡන්දරාග විනයො ඡන්දරාගපපහාණං**" යන නිවණට පැමිණ පඨවි ධාතුවෙන් ඡන්දරාගය දුරුකරයි. එසේම ප්‍රහීණ කරයි. එනිසා නිර්වාණය යනු ඉන් නිදහස් වීමයි. "**අයං ආපොධාතුයා අසසාදො**" යනු මේ ආපෝධාතුව ආශ්‍රිත වූ ආශ්වාදයයි. ඔහු මේ ආපෝ ධාතුවේ උපද්‍රව දැක "මෙය උපන් දවස සිටම මුත්‍ර ලෙස ම නික්මෙන්නේ ද පිවිසෙන්නේ ද වේ. අල්පමාත්‍ර වූ ද ක්‍රියාවක් කරන්නාගේ දහඩියෙන් තෙත්වූ වස්ත්‍ර පීඩාවක් වේ. අනුමෝදනා දේශනාව පැවැත්වීමේදීත් තල්පතක් ගතයුතු වේ. මේ කිමද? අපි වනාහී සවස නිදාගෙන උදේම නැගිටින්නෙමු. අපගේ සිරුර පිරුණු කළයක් මෙන් මැනවින් පවතියි. මහත් වූ වෙහෙස ඇතිකරන කටයුත්තක් සිදුකළේ

නමුත් දහඩිය මාත්‍රයක් වත් නූපදී. හෙනහඬ මෙන් ධර්මදේශනා කළත් ශරීරයේ වන උණුසුම් මාත්‍රයක්වත් අපට නැත"යි මෙසේ පැවතීම් වශයෙන් දතයුතුයි. "අයං තෙජෝ ධාතුයා අසසාදෝ" යනු මේ තේජෝ ධාතුව ආශ්‍රිත වූ ආශ්වාදයයි. ඔහු ශීතලෙන් ගැහෙන අයෙකු දැක මෙසේ කියයි. "කිම මොවුහු කිසියම් කැඳ, බත්, කැවිලි ආදියක් ගිල දමා, තද වූ කුසක් ඇතිව හිඳ, මුළු රෑම අඟුරු කබල් සොයති. ශරීරයේ ස්පර්ශ කළ පමණින් ම අඟුරු කටාරමට බ ැස පොරවාගෙන මෙන් නිදාගනිති. අපි වනාහී ඉතා තදවූ මස් හෝ කැවිලි හෝ කමු. කුස පිරෙන්න බත් කමු. එකෙණෙහිම අප සිරුරට ඇතුලු වූ එම ආහාර කෙළපිඩක් මෙන් දියවේ. සතියක් අහස වැහි වළාකුලින් වැසී තිබුණත් අප සිරුරෙහි මද සීතලකුදු නැත්තේය. "මෙසේ පැවතීම් වශයෙන් දතයුතුයි. "අයං වායෝ ධාතුයා අසසාදෝ" යනු මේ වායෝ ධාතුව ආශ්‍රිත වූ ආශ්වාදයයි. ඔහු සෙසු වාතයෙන් ආබාධිත වූවන් දැක මෙසේ කියයි. "මොවුහු අල්ප වූ කාර්යයක් කළත්, අනුමෝදනා දේශනාව පමණක් කළත් සිරුරෙහි වාතය කිපෙයි. ගවුවක් පමණ මාර්ගයේ ඇවිද ගියවුන්ගේ අත්පා රිදේ. පිට වේදනා දෙයි. කුසේ වාතය, හිසේ වාතය, කණේ වාතය නිතර උපද්‍රව දෙයි. තෙල්, පැණි ආදියෙන් නිතර වාතයට බෙහෙත් ගනිමින් වෙසේ. අපි මහත් වූ කටයුතු කරමු. තුන් යම් රාත්‍රියෙහිම ධර්ම දේශනා කරන්නෙමු. එක්දිනම යොදුන් දහයක් දුර වුවත් යන්නෙමු. අපගේ අත්පා රිදීමක් හෝ වෙහෙසීමක්, පිට රිදීමක් නොවේමය." මෙසේ පැවතීම් වශයෙන් දතයුතුයි. මෙලෙස පැවතීම එම ධාතූන්ගේ ආශ්වාද කිරීමයි.

"අබභඤ්ඤාසිං" යනු ඉතා විශේෂ ඥානයෙන් දැනගත් යනුයි. "**අනුත්තරං සම්මා සම්බොධිං**" යනු තමාට වඩා උතුම් අයෙකු නොමැති යනුයි. සියල්ලන්ට ම ශ්‍රේෂ්ඨ වූ හෝ තමාම අවබෝධ කරගත් යනුයි. නැතහොත් ප්‍රශස්ත වූ සුන්දර වූ බෝධියයි. බෝධි යනු ගසක් ද මාර්ගයද සර්වඥ ඥානය ද නිවණ ද අදහස් වේ. "බොධිරුක්ඛමූලෙ පඨමාභි සම්බුදෙධා" (බෝරුක මුල සම්බුද්ධත්වයෙන් පළමුව) "අනතරාව බොධිං අනතරා ච ගයං" (බෝධියටත් ගයාවටත් අතර) මේ දෙතැන්හි "බෝධි" යනු ගසකි. වෘක්ෂයකි. "බොධි වුචචති චතුසුමගෙගසු ඤාණං" (බොධි යනු සිවුමග ඥානයයි.) යනතැන්හි බෝධි යනු මාර්ගයයි. පපෙපාති බොධිං වරහරිමෙධසො" (උතුම් ප්‍රඥා සම්පන්න නුවණැතියන් වහන්සේ බෝධියට පැමිණ) යන මෙහි බෝධි යනු සර්වඥ ඥානය අදහස් වේ. "පත්‍වාන බොධිං අමතං අසංඛතං" (අමෘතයක් වූ අසංඛත වූ බෝධියට

පැමිණ) යන මෙහි බෝධි යන්නෙන් නිවණ අදහස් වේ. මෙම සූත්‍රයේ බෝධි යන්නෙන් භාග්‍යවතුන් වහන්සේගේ අර්හත් මාර්ගය අදහස් විය.

ශ්‍රාවකයන්ගේ අර්හත් මාර්ගය 'අනුත්තර වූ බෝධියක්" වේද? නොවේද? නොවේමයි. කුමක් නිසාද? සියල්ලන්ට ම සමාන ගුණ නොදෙන්නක් වන බැවිනි. රහතුන්ගෙන් කිසිවකුට අර්හත් මාර්ගය, අර්හත් ඵලයම දෙයි. කිසිවකුට ත්‍රිවිද්‍යාව පමණක් දෙයි. කිසිවකුට ෂඩ් අභිඥාව ද කිසිවකුට චතු පටිසම්භිදාව ද කිසිවකුට ශ්‍රාවක පාරමී ඤාණය ද ලබාදෙයි. පසේ බුදුවරුන්ට ද ප්‍රත්‍යෙක බෝධි ඤාණය ම දෙයි. ලොවුතුරු බුදුවරුන්ට වනාහි සියළු ගුණ සම්පත්තියම ලබාදෙයි. අභිෂේක කළ රජු මෙන් මුළු ලෝකයේම ප්‍රධාන බවයි. එනිසා වෙනත් කිසිවකුට "අනුත්තර වූ බෝධිය" නොලැබේ.

"අභිසම්බුදෙධා පවචඤඤාසිං" යනු මැනවින් අවබෝධ කරගත් සේක්. බුද්ධත්වයට පත්වූ සේක් අවබෝධ කර සිටියේ යැයි මෙසේ දත් සේක. "ඤාණං ච පන මෙ දසසනං උදපාදි" යනු අවබෝධ කළ ගුණ දර්ශනයන්ට සමත් ප්‍රත්‍යවේක්ෂණ ඤාණය ද මට පහළ විය යනුයි. "අකුපපා මෙ වෙතො විමුත්ති" යනු "මේ මගේ අර්හත් ඵල විමුක්තිය ස්ථිරයැ"යි දන්නා ඤාණය පහළ විය යනුයි. එම ස්ථිරත්ව බව දැනීම දෙපරිද්දකින් සිදුවේ. කාරණ වශයෙන් හා ආරම්මණ වශයෙනි. සිවු මාර්ගයෙන් මනාව සිඳ දැමූ කෙලෙසුන් නැවත නූපදින බැවින් කාරණ වශයෙන් ස්ථිරය. ස්ථිර ධර්මයක් වූ නිවණ අරමුණු කරගෙන පවතින බැවින් ආරම්මණ වශයෙන් ස්ථිරය. "අනතිමා" යනු පසුව වූ, අන්තිමට වූ. "නත්ථිදානි පුනබභවො" යනු දැන් නැවත වෙනත් භවයක් නම් නැත.

මේ සූත්‍රයේ චතුරාර්ය සත්‍ය ප්‍රකාශ විය. කෙසේද? සතර ධාතූන්හි ආශ්වාදය සමුදය සත්‍යයයි. ආදීනවය දුක්ඛ සත්‍යයයි. නිස්සරණය නිරෝධ සත්‍යයයි. නිරෝධ සත්‍ය විශේෂයෙන් දැනගන්නා මාර්ගය මාර්ග සත්‍යයයි. විස්තර වශයෙන් පැවසීමට ද සුදුසුය. මෙහි යම් පඨවි ධාතුවක් නිසා උපදින සැප, සොම්නස "මේ පඨවි ධාතුවේ ආශ්වාදය" ප්‍රභාණය කළ යුතුයැයි අවබෝධ වීම සමුදය සත්‍යයයි. යම් පඨවි ධාතුවක් අනිත්‍ය, දුක්ඛ, විපරිණාම ධර්මවලින් යුක්ත ද "මෙය පඨවි ධාතුවේ ආදීනවයැ"යි විශේෂයෙන් දැනීම, අවබෝධවීම දුක්ඛ සත්‍යයයි. යමෙකුට පඨවි ධාතුවේ ඡන්දරාග නිර්මවීම, ඡන්දරාග ප්‍රහාණය කරයි ද "මේ පඨවි ධාතුවේ නිස්සරණය"යැයි සාක්ෂාත් කළ යුතුය යන අවබෝධය නිරෝධ සත්‍යයයි.

යමෙක් මේ ත්‍රිවිධ තැන්හි දෘෂ්ටිය, සංකල්ප, වචන, ක්‍රියාව, දිවිපැවැත්ම, වෑයම, සිහිය, සමාධිය යනු මේ මාර්ගය වැඩිය යුතුය යන අවබෝධය මාර්ග සත්‍යයයි.

දෙවන සූත්‍රය යි.

13. 4. 3

තෙවැනි සූත්‍රයේ "**අචරිං**" යනු ඤාණයේ හැසිරීමෙන් සැරිසැරීම් යනුයි. අනුභව කිරීම් වශයෙන් හැසිරුණෙමි යන අර්ථයි. "**යාවතා**" යනු යම් පමණකින්.

තෙවන සූත්‍රයයි.

13. 4. 4.

සිවුවන සූත්‍රයේ - "**නිසසටා**" ආදියේ මුලදී කියන ලද වැලැක්වීම (ප්‍රතිශේධාර්ථය) යොදා නොනික්මුණහ.", "වෙන් නොවූහ", "නොමිදුනහ". "කෙලෙස් සීමා ඇති සිතින් යුතුව නො විසූහ." යනුවෙන් දතයුතුයි. දෙවැනි ක්‍රමයෙහි. "**විමරියාදිකතෙන**" යනු ඉක්මවූ සීමා ඇති සිතින් කරන ලද යනුයි. එහි සීමාවන් දෙකකි. කෙලෙස් සීමාව හා සංසාරික පැවතුම් සීමාව යනුවෙනි. එහිද යමකුගේ හරි අඩකින් කෙලෙස් ප්‍රහීන වූයේ, අඩකින් ප්‍රහීන නොවූයේ වේද සංසාරික පැවැත්ම අඩකින් ප්‍රහීන වූයේ, අඩකින් ප්‍රහීන නොවූයේද ඔහුගේ සිත ප්‍රහීන වූ කෙලෙස්වල හෝ සංසාරික පැවැත්ම නිසා ඉක්මවූ සීමා ඇත. මෙහිදී මේ දෙකම ප්‍රහීන කළ බැවින් "ඉක්මවූ කෙලෙස් සීමා ඇති සිතින්" යැයි කියන ලද සීමාවක් නොකර සිටි, "ඉක්මවූ සීමා ඇති සිතින්" යන අර්ථයි. මෙලෙස මෙම සූත්‍ර තුනෙහි ම චතුරාර්ය සත්‍යය ම පවසන ලදී.

සිවුවන සූත්‍රය යි.

13. 4. 5.

පස්වන සූත්‍රයේ - "**එකනත දුකඛා**" යනු ඉක්මවා දුරුකළ. නූල් බර මෙන් ඒකාන්තයෙන් ම දුක් සහගත යනුයි. "**දුකඛානුපතිතා**" යනු දුකින් පෙළුණු. "**දුකඛාවකකනතා**" යනු දුකින් බැසගත්. දුකින් මැඩුණු. "**සුඛා**"

යනු සැප වේදනාවෙන් ප්‍රත්‍ය වූ. මෙසේ සැමතන්හිම අර්ථ දතයුතුයි. මේ සූත්‍රයේ ලක්‍ෂණ පවසන ලදී.

පස්වන සූත්‍රය යි.

13. 4. 6-10

සයවන, සත්වන සූත්‍රවල සසර නැවැත්ම සිදුවන අයුරු පැවසේ. අවසන් සූත්‍ර තුනෙහි (8, 9, 10) චතුරාර්ය සත්‍යයම දක්වේ. විස්තර වේ.

ධාතු සංයුත්තය නිමාවිය.

14. 1. 1.

අනමතග්ග සංයුත්තයේ පළමු සූත්‍රයෙහි - "**අනමතගෙඟා**" යනු නොදත් අග ඇති යනුයි. (අනු අමතගග අනමතගග) වර්ෂ **සියක්**, දාහක් ඎණයෙන් ලුහුබැඳ ගියත් සසර අග දැනගත නොහැක. එහෙත්, මෙහෙත් හෝ අගක්-මුලක් දැනගත නොහැකි 'සීමා රහිත පූර්ව හා අපර කෙළවර ඇති' යන අර්ථයි. "**සංසාරෝ**" යනු ස්කන්ධාදියේ නොසිඳීමෙන් පවත්නා පිළිවෙලයි. "**පුබ්බා කොටින පඤ්ඤායති**" යනු පූර්ව සීමාව නොපෙනේ යනුයි. යම් අගක පූර්ව කෙළවර නොපෙනේ ද පසුව ද ඒ අගම නොපෙනේ. සත්වයෝ මධ්‍යයෙහිම හැසිරෙති. "**පරියාදානං ගචෙඡය්‍ය**" මේ උපමාව කුඩා බැවින් කියන ලදී. වෙනත් සමයන්හි අර්ථය කුඩා වී උපමාව මහත් වේ. "මේ ගොනා ඇතා මෙනි" "මේ ඌරා ගොනා මෙනි" "මේ වැව සමුද්‍රය මෙනි" මෙම උපමා කී කල්හි ඒවා එකම ප්‍රමාණ නොවේ. බුදුසමයෙහි උපමාව කුඩා වේ. අර්ථය ඉතා මහත්ය. පෙළෙහි එක් ජම්බුද්වීපයක් ගන්නා ලදී. මෙබඳු ජම්බුද්වීප සියක්, දාහක්, ලක්‍ෂයක් වුවත් ගෙන ඒවායේ ඇති තෘණ ආදී සියල්ල චිනාශ කළත් පුරුෂයාගේ මව, මවුවරු නොවෙති. (මාතු මාතරෝ) "**දුකඛං පචචනුභූතං**" යනු නුඹලා විසින් දුක් විඳින ලදී. "**නිබබං**" යනු තියුණු දුකටම තවත් වදනකි. "**බ්‍යසනං**" යනු ඥාති ව්‍යසන වශයෙන් නන්වැදෑරුම් වේ. "**කටසී**" යනු සොහොන්බිමයි. නැතිනම් මහපොළවමයි. එය නැවත නැවත මැරෙනවුන්ගේ ශරීර දැමීමෙන් ම වැඩෙන්නකි. "අලමෙව" යනු සුදුසුමය.

පළමු සූත්‍රයයි.

14. 1. 2.

දෙවන සූත්‍රයේ "මහාපඨවිං" යනු සක්වළ කෙළවර වූ මහපොළවයි. "නික්ඛිපෙය්‍ය" යනු ඒ පොළව බිඳ, කියන ලද ප්‍රමාණයෙන් ගුළිකර පසෙකින් තබන්නේය.

දෙවන සූත්‍රයයි.

14. 1. 3.

තෙවන සූත්‍රයේ - "**කඤ්ඤනත්ථානං**" යනු හඬන්නවුන්ගේය. "**පස්සන්දං**" යනු ගලායමින් පවතින යනුයි. "**චතූසු මහා සමුද්දෙසු**" යනු මහමෙරෙහි රශ්මියෙන් සීමාකළ සිවු සයුරෙහි. එහි පෙරදිග ප්‍රදේශය රිදීමය වේ. දකුණු ප්‍රදේශය මාණික්‍යමය වේ. බටහිර ප්‍රදේශය ස්ඵටිකමය වේ. උතුරු ප්‍රදේශය රන්මය වේ. පෙරදිගින් හා දකුණු දිගින් නික්මුණු රිදී-මැණික් රශ්මිහු එක්වී මහමුහුද මතුපිටින් ගොස් සක්වල ගලෙහි හැපී සිටිති. දකුණු-බටහිර ප්‍රදේශවලින් නික්මුණු මැණික්-ස්ඵටික රශ්මිහු ද බටහිර-උතුරු ප්‍රදේශවලින් නික්මුණු ස්ඵටික - රන් රශ්මිහු ද උතුරු - පෙරදිග ප්‍රදේශවලින් නික්මුණු රන්-රිදී රශ්මිහු ද එකට එකතුවී මහමුහුද මතුපිටින් ගොස් සක්වල ගලෙහි හැපී සිටිති. ඒ රශ්මීන්ගේ අතරෙහි මහා සමුද්‍රය වේ. ඒ සඳහා "සිවුමහා සයුරුවල" යනුවෙන් කියන ලදී. "**ඤාති බ්‍යසනං**" යනාදියෙහි ව්‍යසනය යනු වි+අසතං විනාශය - විපත යන අර්ථයි. ඤාතීන්ගේ විනාශය "**ඤාතිබ්‍යසනං**". භෝගයන්ගේ විනාශය "**භොග බ්‍යසනං**" නම් වේ. රෝගය වනාහී තමාම "නිරෝගී බව නැතිකරයි. විනාශ කරයි" යන අර්ථයෙන් ව්‍යසනයකි. රෝගයේ ම විනාශය "**රොග බ්‍යසනං**" නම් වේ.

තෙවන සූත්‍රයයි.

14. 1. 4.

සිවුවන සූත්‍රයේ - "**මාතුඨඤ්ඤං**" යනු එකම නම් ඇති මිනිස් මවුන්ගේ කිරිය. ගැඩිවිල්, කුහුඹු ආදීන්ගේ ද මත්ස්‍ය කැසුබු ආදීන්ගේ ද පක්ෂීන්ගේ ද උපදින කාලයේ ඒ මවුන්ට කිරි නැත. එළු, ගව, මී ආදීන්ගේ උපත් කාලයෙහි ම මවුට කිරි ඇත. මිනිසුන්ගේත් එසේමය. එහි එළු ආදී

ආත්මවල දී ද මිනිසුන් අතර දී "දේවී", "සුමනා", "තිස්සා" යන මේ නොයෙක් නොයෙක් නම් ඇත්තියන්ගේ කුසෙහි උපන් කාලයන් ද අත්හැර, "තිස්සා" යන එකම නම් ඇති මෑණි කෙනෙකුගේ කුසෙහි උපන් කාලයේ බොනලද කිරි ප්‍රමාණය සිවුමහා සයුරේ දියටත් වඩා වැඩියයි දතයුතුයි.

සිවුවන සූත්‍රයයි.

14. 1. 5.

පස්වන සූත්‍රයේ - "**සක්කාපන හනෙන**" යනු ඒ භික්ෂුව මෙසේ සිතුවේය යනුයි. ශාස්තෘන් වහන්සේ "පහසු නොවේ. පහසු නොවේ"යැයි දේශනා කරමින් ම කථාව නොසිඳින සේක. "මෙයට උපමාවක් කිරීමට හැකිද?"යි එනිසා අසන ලදී. "**කාසිකෙන**" යනු කපුපුළුන් තුනක් එකට ගෙන කඩින ලද නූලෙන් විය ඉතා සියුම් වස්ත්‍රයෙන්. ඉන් පිරිමැදි කල්හි කොපමණ ප්‍රමාණයක් ක්ෂය වන්නේ ද? අබ ඇටයක් පමණ.

පස්වන සූත්‍රයයි.

14. 1. 6.

සයවන සූත්‍රයේ "**ආයසං නගරං**" යනු යකඩින් කළ පවුරකින් වටකළ නුවරකි. එහි ඇතුලත යකඩින් කළ, එක් බිමක පිහිටි ප්‍රසාදවලින් ගැවසී ගත්තේ යැයි නොසැලකිය යුතුයි.

සයවන සූත්‍රයයි.

14. 1. 7.

සත්වන සූත්‍රයේ "**අනුසසරෙයුං**" යනු එක් අයෙක් කල්ප ලක්ෂ ගණනක් සිහිකළ කල්හි, වෙන අයෙක් ඔහු සිටින සිට තවත් කල්ප ලක්ෂයක් ද, එතැන් සිට තව අයෙක් කල්ප ලක්ෂයක් ද එසේම තව අයෙක් කල්ප ලක්ෂයක් ද යන ක්‍රමයෙන් සිවු දෙනෙක් සාර ලක්ෂයක් කල්පයන් පිළිබඳව සිහිපත් කරන්නේය යනුයි.

සත්වන සූත්‍රයයි.

14. 1. 8.

අටවන සූත්‍රයේ "**යා එතසම්ං අනන්තරෙ වාලිකා**" යනු යම් මේ දෙක අතර දිගින් පන්සීයක් යොදුන් අතරමග වූ වැලිය.

අටවන සූත්‍රයයි.

14. 1. 9.

නවවන සූත්‍රයේ කිවයුත්තක් නැත.

නවවන සූත්‍රයයි.

14. 1. 10

දසවන සූත්‍රයේ - "**අටඨීකංකළොෙ**" යනාදියෙහි තුන් පදයම " රාශි" යන්නට යෙදුණු සමාන වදන්ය. මේ සත්ත්වයන්ගේ ඇට සහිතව උපදින කාලයට වඩා ඇට නැතිව උපදින කාලයම ඉතා වැඩි වේ. ගැඩිවිල් ආදී ප්‍රාණීන් ලෙස උපන්විට ඔවුන්ට ඇට නැත. මත්ස්‍ය, කැසබු ආදී වූ සත්ත්වයන්ගේ ඇට බොහෝය. එනිසා මෙකී ඇට නැති ආත්මභාවත් ඇට බොහෝ ඇති ආත්මභාවත් අත්හැර, මධ්‍යම ප්‍රමාණ වූ අල්ප ඇට ඇති කාලය ම මෙම සූත්‍රයේ දී අදහස් කළ යුතුයි. "**උත්තරෙ ගිජ්ඣකූටස්ස**" යනු ගිජුකුළු පවුවෙහි උතුරු දෙස සිටියේ. "**මගධානං ගිරිබ්බජෙ**" යනු මගධ රටේ ගිරිබ්බජ නම් පුරාණ රාජධානියේය. පර්වත බෑවුමෙහි (පරික්ෂේපයෙහි) පිහිටියේය යන අර්ථයි. මෙහි ඉතිරිපද සියල්ලෙහි අර්ථ ඉතා ප්‍රකටය.

දසවන සූත්‍රය යි.

පළමු වර්ගය නිමියේය.

14. 2. 1.

දෙවන වර්ගයේ පළමු සූත්‍රයේ "**දූගතං**" යනු දිළිඳු බවයි. බැගෑපත් බවයි. "**දූරුපෙතං**" යනු නපුරු නුසුදුසු තැන්වල අත්පා පිහිටි-විරූප වූ යනුයි.

පළමු සූත්‍රයයි.

14. 2. 2.

දෙවන සූත්‍රයේ "**සුඛිතං**" යනු සැපෙන් යුක්ත වූ යනුයි. මහත් ධනය ඇති, මහත් භෝග ඇති. "**සජ්ජිතං**" යනු අලංකාරව පිළියෙල කරන ලද ඇත් කඳට නැගුණු මහත් පිරිවර සහිත වූ යනුයි.

දෙවන සූත්‍රය යි.

14. 2. 3.

තෙවන සූත්‍රයේ - "**පාවෙය්‍යකා**" යනු පාවෙය්‍ය (පාවා) නුවරවාසීය. "සබෙබ ආරඤ්ඤකා" යනාදියෙහි ධුතාංග සමාදන්වීම් වශයෙන් ඔවුන්ගේ ආරණ්‍ය බව වටහාගත යුතුයි. "**සබෙබ සසංයෝජනා**" යනු සියලු බන්ධනයෝය. කිසිවෙක් සෝවාන්ය. කිසිවෙක් සකෘදාගාමී වේ. ඇතමෙක් අනාගාමීය. ඔවුන'තර රහත් තෙරනමක් හෝ පුහුදුන් තෙරනමක් නොවිණි. "ගුණඤං" යනාදියේ සුදුවීම, කළුවීම ආදී වර්ණ ගැනීම්හි එක් වර්ණයක් පැවති කාලයම ගතයුතුයි. "**පාරිපන්ථිකා**" යනු උවදුරු සහිත මාර්ගයේ සිටින මංපහරණ සොරුය. "**පාරිදාරිකා**" යනු අනුන්ගේ අඹුවන් ඇසුරු කිරීමට පැමිණියෝය.

තෙවන සූත්‍රය යි.

14. 2. 4-9.

සිවුවන සූත්‍රයේ සිට නවවන සූත්‍රය දක්වා - ලිංග නියමයෙන් මෙන්ම සක්වල නියමයෙන් අර්ථ දතයුතුයි. පුරුෂයන් ස්ත්‍රීන්ව ඉපදීම, ස්ත්‍රීන් පුරුෂයන්ව ඉපදීම යන මෙය ලිංග නියමයයි. සත්ත්වයෝ මේ සක්වලින් අන්‍ය සක්වලකට ද අන්‍ය සක්වලකින් මේ සක්වලට ද පැමිණෙති. සැරිසරති. ඔවුනතුරින් මේ සක්වලෙහි ස්ත්‍රියක් ව ඉපිද මවක් වූ අවස්ථාව ම දක්වනුයේ "**යො න මාතාභූත පුබෙබා**" යනාදිය දේශනා කළ සේක. "**යොන පිතා භූත, පුබෙබා**" යනාදියේද මේ පිළිවෙල දතයුතුයි.

14. 2. 10.

දසවන සූත්‍රයේ - "**භූතපුබබං**" යනු අතීතකාලයේ සිදුවූ එක්

චරිත කථාවක් ගෙනහැර දක්වයි. "**සාමඤ්ඤා උදපාදි**" යනු පැණවීමක් විය. "**චතුහෙන ආරොහනති**" යනු මෙය වීර්යය මධ්‍යම කිරීම සඳහා කියන ලදී. "අඟඟං" යනු උතුම් වූ යනුයි. "භද්දයුගං" යනු සුන්දර යුවලකි. "**තීහෙන ආරොහනති**" යනු මෙපමණකින් මේ බුදුවරයන් වහන්සේලා දෙනම පහළවූ කාලය අතර දී පොළව යොදුනකින් උස්විය. ඒ පවුව යොදුන් තුනක් උස්විය. "අපපං වා භියෝ" යනු වර්ෂ සීයෙන් ඉහලට අල්ප වූ දසවසක් හෝ විසිවසකි. නැවත තවත් අවුරුදු සීයක් සිටින්නෙක් නම් නැත. උතුම් සත්ත්වයෝ පමණක් තව වසර හැටක් හෝ අසූවක් ජීවත් වෙති. වර්ෂ සීයට නොපැමිණ වසර පහේදී හෝ දහයේදී මියදෙන්නෝම බහුලය. වෙති. මෙහි දක්වෙනුයේ කකුසඳ බුදුරජාණන් වහන්සේගේ පහළවීම වසර හතලිස්දාහක් පරමායුෂ වූ කාලයේත්, කෝණාගමන බුදුරජාණන් වහන්සේගේ පහළවීම වසර තිස්දහසක් වූ කාලයේත් ලෙස අනුපිළිවෙලින් ආයු පිරිහීම දක්වෙන දේශනාවකි. මෙවැනි පිරිහීමක් නොවිණි. එම කාල දෙක අතර දී ආයු පිරිහී ගොස් වර්ධනය වූ බව දතයුතුයි. ඒ කෙසේද?

කකුසඳ භාග්‍යවතුන් වහන්සේ මේ මහා භද්‍ර කල්පයෙහිම මිනිසුන්ට පරමායුෂ වසර හතලිස්දාහක් වූ කාලයේම උපන් සේක. උන්වහන්සේ එම ආයු ප්‍රමාණය පස් කොටසකට බෙදා, ඉන් සතර කොටසක් ගෙවූ සේක්, පස්වන කොටස ඉතිරිව තිබියදීම පිරිණිවි සේක. එසේ ක්‍රමයෙන් ආයු පිරිහී ගොස් පරමායුෂ වසර දහයක් විය. නැවත ආයු වර්ධනය වනුයේ පරමායුෂ අසංඛ්‍ය දක්වා වැඩිවිය. නැවත එය පිරිහෙමින් අවුත් පරමායුෂ වසර තිස්දාහක් වූ කාලයේදී කෝණාගම බුදුරජාණන් වහන්සේ ලොව පහළවූ සේක. උන්වහන්සේ ද ඉහත කී ලෙසම ආයු ගෙවා පිරිනිවි කල්හි, ආයු අඩුවෙමින් ගොස් පරමායුෂ වසර දහයක් විය. නැවත ක්‍රමයෙන් ආයු වැඩි වීගෙන ගොස් පරමායුෂ වසර අසංඛ්‍යයක් විය. නැවත ආයු පිරිහෙනුයේ පරමායුෂ වසර විසිදාහක් වූ කාලයේදී කස්සප ලොවුතුරු බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සේක. උන්වහන්සේද පෙර කී ලෙසම පිරිනිවි කල්හි පරමායුෂ වසර දහය දක්වා පැමිණ නැවත වර්ධනය වී අසංඛ්‍ය දක්වා ගොස්, නැවත පිරිහෙනුයේ පරමායුෂ වසර සීයක් වූ කාලයට පැමිණියේය. එකල්හි අපගේ සම්මා සම්බුදුරජාණන් වහන්සේ ලොව පහළවූ සේක. මෙසේ අනුපිළිවෙලින් ආයු පිරිහීම හා වැඩීම පුන පුනා සිදුවන බව දතයුතුය. එහිදී යම් ආයු

ප්‍රමාණයක් පරමායුෂ වූ මිනිස් සමාජයක ලොවුතුරු බුදුරජාණන් වහන්සේලා පහළවෙත් ද උන්වහන්සේලාට ද ඒ ආයු ප්‍රමාණය ම වේ.

දසවන සූත්‍රයයි.

දෙවන වර්ගය නිමියේය.

අනමතග්ග සංයුත්තය නිමාවට පත්විය.

15. 1. 1.

කස්සප සංයුත්තයේ පළමු සූත්‍රයෙහි "**සනතුථාය**" යනු මොනු සතුටින් සිටින්නෙකි. "**ඉතරීතරෙන**" යනු මහත් වූ සියුම් රූක්ෂ වූ ප්‍රණීත වූ ස්ථිර වූ දිරාගිය යන එක් දෙයකින් නොව යම්සේ ලැබේ ද ඒ ඕනෑම චීවරයකින් සතුටට පත්වේ යන අර්ථයයි.

චීවරයෙහි සතුටුවීම් තුනකි. යථාලාභ සන්තෝෂය, යථාබල සන්තෝෂය, යථා සාරුප්‍ය සන්තෝෂය යනුවෙනි. පිණ්ඩපාතාදියේත් මේ ක්‍රමය ම දතයුතුයි. මේ එහි ප්‍රභේද විස්තර කිරීමයි. - මේ බුදුසසුනෙහි භික්ෂුවක් යහපත් හෝ අයහපත් සිවුරක් ලබයි. උන්වහන්සේ ඉන් සතුටු වෙති. අනිකක් නොපතති. ලැබුනත් නොගනිති. මෙය යථාලාභ සන්තෝෂය නම් වේ. තවද ස්වභාවයෙන් ම දුර්වල හෝ ලෙඩ රෝගාබාධ නිසා දිරාගිය ශරීර ඇති භික්ෂුවක් බර වූ සිවුරක් ලැබ, එය පොරවනුයේ අධික වෙහෙසට පත්වේ. උන්වහන්සේ සබ්‍රහ්මචාරී (එක්ව මහණදම් පුරණ) භික්ෂූන් සමග එය හුවමාරු කරගෙන සැහැල්ලු සිවුරක් ලබාගෙන පොරවමින් ඉන් සතුටට පත්වෙති. මෙය උන්වහන්සේගේ චීවර විෂයෙහි යථාබල සන්තෝෂයයි. නව භික්ෂුවක් ප්‍රණත වූ ඉතා උසස් චීවරයක් ලබන්නේය. උන්වහන්සේ පටසිවුරු ආදී අන්‍ය මහා අනර්ඝ සිවුරු බහුලව ලැබ, මෙය පැවිදිවී බොහෝ කල්ගත වූ ස්ථවිර භික්ෂූන්ට ම සුදුසුය. මෙය බහුශ්‍රැත භික්ෂූන්ට සුදුසුය. මෙය රෝගී භික්ෂූන්ට සුදුසුය. මෙය අල්ප වූ ලැබීම් ඇති භික්ෂූන්ට සුදුසු යැයි ලද සිවුරු මේ භික්ෂූන්ට දී, ඔවුන්ගෙන් ලැබුණු පරණ සිවුරක් හෝ කසල ගොඩවල් ආදියෙන් රෙදිකඩක් අහුලාගෙන ඉන් සිවුරක් මසාගෙන හෝ සතුටුවෙමින් පොරවන සේක. මෙය චීවර විෂයෙහි "යථා සාරුප්‍ය සන්තෝෂය"යි මෙහි භික්ෂුවක්

රූක්ෂ වූ හෝ ප්‍රණීත වූ පිණ්ඩපාතයක් ලබයි. උන්වහන්සේ ඉන් යැපෙමින් අනික් ආහාරයක් නොපතති. ලැබුනත් අනුභව නොකරති. මෙය පිණ්ඩපාත විෂයෙහි "යථාලාභ සන්තෝෂය" නම් වේ. යමෙක් තමාට ස්වභාවයෙන්ම විරුද්ධ වූ, තම රෝගාබාධයන්ට විරුද්ධ වූ පිණ්ඩපාතයක් ලබයි. එය වැළඳුවහොත් උන්වහන්සේට අපහසුවක් වෙති. එනිසා උන්වහන්සේ එම පිණ්ඩපාතය සබ්‍රහ්මචාරී භික්ෂුවකට දී, උන්වහන්සේගෙන් ලද කැපවූ ආහාරයක් වළඳා සතුටින් වෙසෙති. මෙය පිණ්ඩපාත විෂයෙහි "යථාබල සන්තෝෂය" නම් වේ. තව භික්ෂුවක් බොහෝ ප්‍රණීත වූ පිණ්ඩපාතයක් ලබයි. උන්වහන්සේ එය චිරරාත්‍රඥ, අල්ප ලැබීම් ඇති, ගිලන් වූ භික්ෂූන්ට පිරිනමා ඔවුන්ගෙන් ලද දෙයක් හෝ නැවත පිඬු පිණිස හැසිර ලද මිශ්‍රාහාරයක් හෝ සතුටින් වළඳති. මෙය උන්වහන්සේගේ පිණ්ඩපාත විෂයෙහි "යථා සාරුප්‍ය සන්තෝෂය"යි. මේ සසුනෙහි භික්ෂුවක් මනාප වූ හෝ අමනාප වූ සෙනසුනක් ලබයි. උන්වහන්සේ ඉන් සතුටු වී, සොම්නස්-දොම්නස් නූපදවා තණ ඇතිරියක් හෝ ලැබ, ලද පමණින් තුටු වී එහි සැතපෙති. මෙය සේනාසන විෂයෙහි යථාලාභ සන්තෝෂයයි. යමෙක් තම තමාට හෝ තම රෝගාබාධයන්ට ස්වභාවයෙන් ම විරුද්ධ වූ සෙනසුනක් ලැබ, එහි විසීම අපහසු හෙයින්; සබ්‍රහ්මචාරී හිමිනමක සමග එය හුවමාරු කරගෙන සතුටින් වෙසෙයි. මෙය සේනාසන විෂයෙහි යථාබල සන්තෝෂය නම් වේ. තවත් ඉතා පුණ්‍යවන්ත වූ භික්ෂුවක් ලෙන්, මණ්ඩප, කූටාගාරාදී බොහෝ උසස් සෙනසුන් ලබයි. උන්වහන්සේ එම සෙනසුන් ඉහත පැවසූ ලෙස ම චිරරාත්‍රඥ, බහුශ්‍රැත, ගිලන්වූ, අල්ප ලැබීම් ඇති භික්ෂූන්ට පිරිනමා තමාට ලැබුණු වෙනත් තැනක සතුටින් වෙසෙති. මෙය සෙනසුන් විෂයෙහි යථා සාරුප්‍ය සන්තෝෂයයි. යම් භික්ෂුවක් "සෙනසුන් නම් ප්‍රමාදවීමට ස්ථාන වේ. යම්තැනක වැඩහිඳීමෙන් ථීනමිද්ධය බැසගනීද නින්දෙන් නැගිටිනවිට පාප සිතුවිලි, විතර්කාදිය පහළවේ"යැයි සළකා එබඳු උසස් සෙනසුන් ලැබුනත් නොපිළිගනියි. උන්වහන්සේ එබඳු සෙනසුන් හැරදමා අභ්‍යවකාශයෙහි රුක්මුල් ආදියෙහි වෙසෙමින් තුටුවෙති. මෙය ද සෙනසුන් විෂයෙහි යථා සාරුප්‍ය සන්තෝෂයකි. මේ සසුනෙහි භික්ෂුවක් රූක්ෂ වූ හෝ ප්‍රණීත වූ හෝ බෙහෙත් ආදියක් ලැබ, ඉන් පමණක් සතුටු වේද-වෙනත් කිසිවක් නොපතත් ද ලැබුනත් නොගනිත් ද එය ගිලානප්‍රත්‍ය විෂයෙහි "යථාලාභ සන්තෝෂය"යි. යම් භික්ෂුවකට තෙල් අවශ්‍ය වූ විට උසස් තෙල් ලැබේ. උන්වහන්සේ එය අනිකුත් සුදුසු භික්ෂූන්ට දී ඔවුන්ගෙන් ලද තෙලක් හෝ නැවත සොයාගොස් ලැබූ තෙලකින් හෝ බෙහෙත් කර, ඉන් සතුටට පත්වෙති. මෙය ගිලානප්‍රත්‍ය විෂයෙහි "යථාබල සන්තෝෂය" නම් වේ.

වෙනත් මහපින් ඇති භික්ෂුවක් බොහෝ තෙල්, මීපැණි ආදිය සහිත මිහිරි බෙහෙත් ලබයි. ඒවා ගිලන් වූ අනෙකුත් භික්ෂූන්ට පිරිනමා, ඔවුන් දෙන යමකින් යැපෙමින් සතුටු වේ. යම් භික්ෂුවක් වෙත එක් බඳුනක "අරළු හා මුත්‍ර"ද "එක් චතුමධුරයක්"ද තබා "ස්වාමීනි! ඔබ කැමති බෙහෙතක් ගන්න"යි ආරාධනා කල කල්හි; උන්වහන්සේ, "වෙනත් බෙහෙත්වලින් ද මෙම රෝගය සන්සිඳේ. මේ මුත්‍ර හරීටකයම බුදුරජාණන් වහන්සේ විසින් වර්ණනා කරන ලදහ"යි සිතා චතුමධුර ප්‍රතික්ෂේප කර - මුත්‍ර හරීටකයම (මුත්‍ර හා අරළු බෙහෙතම) ගන්නා සේක. ඉන් සතුටට පත්වෙති. මෙය ගිලන්පස විෂයෙහි යථාසරුප්‍ය සන්තෝෂයයි. මෙසේ විස්තර කළ ත්‍රිවිධ සන්තෝෂයන් සඳහා, "මහණෙනි! මේ කාශ්‍යප තෙරුන් වහන්සේ, තමාට ලැබුණු සිවුපසයෙන්ම තුටුවෙති. ඕනෑම දෙයකින් තුටුවෙති. ලද සිවුරු ආදියකින් ම තුටුවෙමින් පොරවති" යන්න දේශනා කළ සේක.

"වණ්ණවාදිනී" යනු ඇතමෙක් සතුටට පත්වන මුත් සන්තෝෂ ගුණ නොපවසති. ඇතමෙක් සතුටට පත් නොවනුයේ නමුත් සතුටුවීමේ ගුණ පවසති. තව ඇතමෙක් සතුටට පත්වීමක් නැත. සතුටුවීමෙහි ගුණද නොකියති. ඇතමෙක් සන්තෝෂ වෙති. එහි ගුණ ද නිති පවසති. මේ සිවුවැනිව දක්වූ ගණයට අප කාශ්‍යප රහතන් වහන්සේ ද අයත් වන බව දක්වීමට, "ලැබෙන ඕනෑම සිවුරකින් සතුටුවීමේ ගුණ පවසන" යන්න දේශනා කරන ලද සේක. "අනෙසනං" යනු දූතයන් යැවීම්, ගමනා-ගමනයන්හි යෙදීම් ආදී නානාවිධ වූ ප්‍රභේද සහිත වූ නුසුදුසු ජීවිකා වෘත්තීන්හි නියැලි යනුයි.

"අලද්ධා" යනු නොලැබ යනුයි. ඇතමෙක්, "කෙසේ හෝ සිවුරු ආදිය ලබාගන්නෙමි"යි පින්වත් භික්ෂූන් සමග එක්ව සිටිමින් ම, කුහකකම් කරනුයේ තැතිගනිති. ආශාවෙන් පීඩිත වෙති. මෙම කාශ්‍යප මහරහතන් වහන්සේ එසේ නොලබන සේක්, එනිසාම තැති නොගනිති යන අර්ථයි. "ලද්ධා" යනු ධර්මානුකූලව ලැබ ගෙනයි. "අගථිතො" යනු දුරුකළ ලෝභාදී ගිජුකම් ඇතිවයි. "අමුච්ඡිතො" යනු අපමණ තණ්හාවෙන් මුලාවීමට නොපැමිණි යනුයි. "අනජ්ඣා පනෙනා" යනු තණ්හාවෙන් නො මඩන ලද, නොවෙලන ලද්දේ යනුයි. "ආදීනව දසසාවී" යනු නුසුදුසු ජීවිකාවන්ට පැමිණීමෙහිද ගිජුවූ පරිභෝගයන්හි ද ආදීනව දකිනුයේය. "නිසසරණපඤ්ඤා" යනු 'යම්තාක් සීතල නැසීමට' ආදී වශයෙන් කියන

ලද යනුයි. නික්ම යෑම ම විශේෂයෙන් දැන ගනිමින් සිවුපස පරිභෝජනය කරයි යන අර්ථයි.

"**ඉතරීතරෙන පිණ්ඩපාතෙන**" යනාදියෙහි ද "යම්සේ ලැබූ පිණ්ඩපාතයකින්, සෙනසුනක්, ගිලන්පස බෙහෙත් ආදියකින්" යන අර්ථයි. මෙසේ අර්ථ ගලපා දතයුතුයි.

"**කසසපෙන වා හි වො භික්ඛවෙ! ඔවදිසසාමි**" යනු යම්සේ මහා කාශ්‍යප මහතෙරුන් වහන්සේ සිවුපස විෂයෙහි ත්‍රිවිධ සන්තෝෂයෙන් සතුටුවූ සේක්ද "නුඹලා ද එසේ වවු" යනුවෙන් අවවාද දෙන සේක්, "කාශ්‍යප තෙරුන් විසින් දුන් අවවාද" නම් වේ. "යො වා පනසස **කසසපාදිසො**" යනු මෙපමණකින් කාශ්‍යප තෙරුන් හා සමාන වූ "මහා කාශ්‍යප තෙරුන් මෙන් සිවුපසයෙහි ත්‍රිවිධ සන්තෝෂයෙන් සතුටු වේනම්", "නුඹලා ද එසේ විය යුතුයි" යනුවෙන් අවවාද කරන සේක් කාශ්‍යප තෙරුන් හා සමවීමට අවවාද කරන සේක. "තථතතාය පටිපජජිතබබං" යනු "සම්මා සම්බුදුරජාණන් වහන්සේ මෙම සත්තුවිධී සූත්‍රයෙහි දේශනා කළ, "කෙලෙස් ලියාලන ප්‍රතිපත්තිය පැවසීම" නම් වූ භාරධූර කටයුත්තකි. අපද මේ ප්‍රතිපත්ති සම්පූර්ණ කිරීම, මහත්ම භාරධූර කාර්යයක් ඉටුකිරීමකි. පැමිණියා වූ මේ භාරධූර කාර්යය පිළිගත යුතුය." මෙලෙස සිතා "මා විසින් දේශනා කරන ලද පරිද්දෙන් තථබව සඳහා (සත්‍යාවබෝධය පිණිස) නුඹලා විසින් මෙලෙස පිළිපැදිය යුතුයැ"යි බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක.

පළමු සූත්‍රයයි.

15. 1. 2.

දෙවන සූත්‍රයේ - "**අනාතාපී**" යනු යම් වීර්යයකින් කෙලෙස් තවයි ද ඉන් තොරවූයේ යනුයි. "අනොතතාපී" යනු බිය නැතිකමයි. කෙලෙස් ඉපදවීමට ද කුසල් නූපදවීමට ද බියක් නැත. "**සමෙබාධාය**" යනු මනාව අවබෝධ කරගැනීම සඳහාය. "**නිබබාණය**" යනු නිර්වාණය සාක්ෂාත් කරගැනීමටය. "**අනුතතරසස යොගකෙඛමසස**" යනු රහතන් වහන්සේටය. එහි අනුත්තර වූ (අතිඋතුම් වූ), සතර යෝගයන්හි නිර්භය වූ යනු අර්ථයි.

"**අනුපපනනා**" යනාදියෙහි - යමෙක් පෙර නොලැබූ විරූ සිවුරු ආදී ප්‍රත්‍යයක් හෝ උපස්ථායක, සද්ධිවිහාරික, අන්තේවාසිකයන්ගේ

සිත් අලවන වෙනත් වස්තුවක් හෝ ලැබ; එය 'හොඳයි-සැපයි' යනුවෙන් අඥානකමින් ගන්නාට සහ තම නොවිඳින ලද වෙනත් සුභ අරමුණක් පිළිබඳ අනුවණකමින් සිහිකරන්නාට ලෝභාදී පවිටුධර්ම උපදියි. "එබඳු ධර්ම නූපදී" යැයි අර්ථ දතයුතුයි. අන් අයුරකින් - අග මුලක් නැති සසරෙහි නූපන් අකුසල් සහගත පවිටු සිතක් නම් නැත. පෙර විඳින ලද වස්තුවෙහි ද කරුණා කළයුතු අරමුණෙහි ද, යමෙකුට ස්වභාව බුද්ධියෙන් හෝ උදෙසීම-විචාරීම ආදියෙන් හෝ පර්යාප්ති-නවකර්ම නුවණින් මෙනෙහි කිරීම් ආදියෙන් හෝ වෙනත් දෙයකින් පෙර නූපදින ලද පාපී අදහස්, පසුව එබඳු වූ ප්‍රත්‍යයකින් වහා උපදියි. මෙය ද "නූපන් ධර්ම උපදවමින් අනර්ථය පිණිස පවතින්නේය"යි දතයුතුයි. "ඒ වස්තු ආරම්මණයන් හි ම නැවත නැවත උපදිමින් ප්‍රහීණ නොවී පවතී" යන අදහසයි. "ඒවා ඉපදී ප්‍රහීන නොවී අනර්ථය පිණිස ම පවතින්නේය." යනුවෙන් දතයුතුයි. මේ දැක්වූයේ සංක්ෂිප්ත විස්තරයයි. සවිස්තරව උපනුපන් භේදයන්ද ප්‍රහාණප්‍රහාණ නියමයන්ද යන සියල්ල විශුද්ධි මාර්ගයේ ඤාණදස්සන විශුද්ධි නිර්දේශයේ පැවසූ පරිදි දතයුතුයි. "අනුපපන්නා මෙ කුසලා ධම්මා" යනු සීල, සමාධි, ඵල සංඛ්‍යාත වූ නිවැරදි ධර්ම නොලැබූවත් යනුයි. "උපපන්නා" යනු ඒවාම ලැබුවානුය. "**තිරුජ්ඣමානා අනත්‍ථාය සංවත්තෙයුං**" යනු ඒ සීලාදී ධර්ම පිරිහීම වශයෙන් නැවත නූපදින්නේ, නිරුද්ධ වනුයේ අනර්ථය පිණිස පවතියැයි දතයුතුයි. මෙහිද ලෞකික ධර්මයන්ගේ පිරිහීමක් මිස ලෝකෝත්තර ධර්මයන් පිරිහීමක් නොමැති බව දතයුතුයි. උපන් කුසල් දහම්වල පැවතීමෙන් සම්මා විරියෙහි (යහපත් වීර්යයෙහි) පිහිටීම් වශයෙන් දේශනාව කරන ලදී. දෙවැනි මාර්ගය වහා නූපදින කල්හි, පළමු මාර්ගය නිරුද්ධ වනුයේ එය අනර්ථය-අයහපත පිණිස පවතින්නේය" යන මේ අර්ථය ගතයුතුයි. මෙලෙස මෙම සූත්‍රයෙහි සතර සම්‍යක් ප්‍රධන් වීර්යයෝ පූර්වභාග විදර්ශනා වශයෙන් දේශනා කරන ලදැයි දතයුතුයි.

දෙවන සූත්‍රයයි.

15. 1. 3.

තෙවන සූත්‍රයේ - "**චන්‍දූපමා**" යනු සඳ මෙන් වී යනුයි. කිම පරිමණ්ඩල වශයෙන්ද? නැත. චන්‍ද්‍රයා අහස් තලයට නැගෙනකල්හි කිසිවකු සමග එක්ව විසීමක්, සෙනෙහසක්, ආලයක්, ප්‍රාර්ථනාවක් හෝ මැඩගෙන (පාගාගෙන) පිවිසීමක් නොකරයි. එනමුත් මහජනයාට ප්‍රියවෙමින් ම

උදාවේ. "නුඹලා ද මෙසේම කිසිවකු සමග එක්ව විසීම් ආදියක් නොකර, මහජනයාට ප්‍රියමනාපව සඳ මෙන් ක්ෂත්‍රියාදී සිවු කුලයන් වෙත එළඹෙවු" යන අර්ථයයි. තවද චන්ද්‍රයා අන්ධකාරය දුරුකරයි. ආලෝකය පතුරුවයි. එලෙසින්ම කෙලෙස් අඳුර දුරුකිරීමෙන් හා ඤාණාලෝකය පැතිරවීමෙන් සඳ මෙන් විසිය යුතුයි. මෙලෙස මෙහි අර්ථ දතයුතුයි. "අපකසෙසව කායං අපකසෙසව චිත්තං" යනු ඉහත කී එක්ව විසීම් ආදිය නොකිරීමෙන් කය ද සිත ද ඉවතට ඇද-පහකර යන අර්ථයි. යම් භික්ෂුවක් අරණ්‍යයෙහි නොවෙසෙයි. කාම විතර්කාදිය කල්පනා නොකරයි. මේ භික්ෂුව කය හා සිත ඉවත් නොකර ම වෙසෙයි. යම් භික්ෂුවක් අරණ්‍යයෙහි වෙසෙයි. කාමවිතර්කාදිය කල්පනා කරයි. මේ භික්ෂුව කය පමණක් ඉවත්කර වෙසෙයි. සිත ඉවත් නොකරයි. යම් භික්ෂුවක් ගම් සෙනසුනක වෙසෙමින් කාමාදී විතර්ක නොසිතයි. මේ භික්ෂුව සිත ඉවත් කර, කය ඉවත් නොකර වෙසෙයි. යම් භික්ෂුවක් අරණ්‍යයෙහි වෙසෙමින් කාමවිතර්කාදිය ද පහළ කර නොගනියි. මේ භික්ෂුව කය, සිත දෙක ම ඉවත්කර වෙසෙන උතුම් භික්ෂුවයි. "මෙලෙස වී කුලයන් වෙත යායුතුයි" යන අර්ථය දක්වමින්, "කය හා සිත ඉවත් කරවූයේම" යනුවෙන් දෙසූ සේක.

"නිවවනවක" යනු නිතර නවකයෙක් ව යනුයි. ආගන්තුකයෙක් හා සමානව යන අර්ථයි. ආගන්තුකයා පිළිවෙලින් පැමිණි ගෙයක වෙසෙනුයේ, ගෘහස්වාමිවරුන් විසින් දකින ලදුව - "අපගේ දරුවෝ, සෝයුරෝ අපගෙන් වෙන් වූහ. මොහු ද ඔවුන් මෙන් හැසිරෙයි." යනුවෙන් අනුකම්පා කරමින් - ඔහුට නිදාගැනීමට දී ආහාරපාන ද දෙති. අහර වළඳා අවසන ආගන්තුකයා "නුඹලාගේ මේ ආහාර භාජනය ගන්න"යි පවසා වැළඳූ භාජන දී නිහඬව බැහැරව යයි. ඔවුන් සමග එක්ව විසීම් ආදියක් නොකරයි. කළයුතු කාර්ය විධානයක් නොකරයි. "නුඹලා විසින් ද මහණෙනි, පිළිවෙලින් පැමිණි ගෘහයට පිවිස යම් හැසිරීමකින් පැහැදුණු මිනිසුන් දුන් දෙයක් වේනම් එය ගෙන - ඔවුන් හා කිසි කථාබහක් නොකර - කළයුතු කිසිදු කටයුත්තක නොයෙදී නිවසින් නික්මෙවු" යනුවෙන් භික්ෂූන්ට අවවාද දුන්හ. මෙහිදී නිත්‍ය නවකයාගේ ස්වභාවය මැනවින් දක්වීමට "දෙසොයුරු පැවිදි කථාව" (දෙවභාතික වත්ථු) කිවයුතුයි.

"වසාළ නගර" නම් ගමින් සොහොයුරෝ දෙදෙනෙක් නික්ම අවුත් පන්සලෙහි පැවිදි වූහ. ඒ දෙදෙන චූලනාග තෙරුන් ය, මහානාග තෙරුන් යැයි ප්‍රසිද්ධ වූහ. ඒ දෙදෙන සිතුල්පවුවෙහි වෙසෙමින්, භාවනා කර - වසර තිහකට පසු රහත්ඵලය ලබා ගත්හ. "මව දකිමු"යි තම

මෑණියන් බැලීම සඳහා අවුත් වසාළනගර විහාරයේ වාසය කර, දෙවැනි දින මව සිටින ගමට පිඬු පිණිස, දෙදෙනා වහන්සේ ම වැඩම කළහ. මවු ද ඉතා සැදැහැයෙන් විශාල කැඳ හැන්දක් ගෙන වැඩිමල් තෙරුන්ගේ පාත්‍රයට බෙදන්නී, තෙරුන්ගේ මුහුණු බලා උපන් දරු සෙනෙහස ඇත්තී, "දරුව! නුඹ මගේ පුතු වූ මහානාග නේද?"යි ඇසුවාය. තෙරුන් වහන්සේ, "උපාසිකාවනි! පසුපස සිටින තෙරුන්ගෙන් විමසනු මැනවි"යි පවසා විහාරයට ම වැඩම කළහ. දෙවැනි තෙරුන්ට ද එලෙසින්ම කැඳ බෙදූ මෑණියෝ, "දරුව! නුඹ මගේ පුතු වූ චූලනාග නේද?"යි විමසුවාය. "කිම උපාසිකාවනි! මුලින් සිටි තෙරුන්ගෙන් නොවිමසුවෙහි ද?"යි පවසා උන්වහන්සේ විහාරයට වැඩම කළහ. මෙලෙස තම වැදූ මව සමඟවත් ආගිය තොරතුරු කථාකිරීමක්, එක්ව විසීමක් නොමැති භික්ෂුව "නිත්‍ය නවකයා" නම් වේ.

"අසපගබහා" යනු ප්‍රගල්භ නොවූ යනුයි. ගැටීම් නැති. අටස්ථානයක කයින් ගැටීම ද සිවුතැනක වචනයෙන් ගැටීම නොයෙක් තැන්හි මනසින් ගැටීමද දුරුකළ. අටතැනක කයින් ගැටීම නම් - "සංඝ, ගණ, පුද්ගල, භෝජන ශාලා, ගිනිහල්ගෙය, නානතොට, පිඬු පිණිස යන මාර්ගය, ඇතුල් ගමට පිවිසීම යන තැන්වලදී කයින් නුසුදුසු දේ කිරීමයි." ඒ කෙසේද? ඇතැම් භික්ෂුවක් විහාරයේ සඟ මැද අත්දෙක ගොතාගෙන වාඩිවී සිටියි. පයින් පය ගටාගෙන හිඳියි. මේ ආදී ලෙසයි. මෙසේ ම සමූහයක් මැදදී ද සිවුපිරිසෙහි සමාගමයකදී ද සූත්‍ර පිටකාදියක් උගන්නා පිරිස් එකතුවීමක දී ද අයෝග්‍ය හැසිරීම් දැක්වීමයි. වෘද්ධතර භික්ෂූන් කෙරෙහි ද එලෙස හැසිරීම. වැඩිමහල් භික්ෂූන්ට දානශාලාවේදී ආසන නොදෙයි. නවකයන්ට ආසන පැමිණීම වලක්වයි. ගිනිහල් ගෙයි ද මෙලෙසම හැසිරේ. වැඩිහිටි භික්ෂූන් නොවිමසා, ගිනිදැල්වීම් ආදිය කරයි. නානතොටේදී "මේ සාමණේරයෙකි. මේ වෘද්ධ හිමිනමකි" ආදී ලෙස ප්‍රමාණ නොකර-ආගත පටිපාටියෙන් දියනෑ යුතුයැයි බුදුහු වදාරා ඇත. එම නියමය කඩකරමින් පසුවී පැමිණ, දියට බැසීමාදියෙන් වෘද්ධ-සාමණේර හිමිවරුන්ට බාධා කරයි. පිඬු පිණිස යන මාර්ගයේ දී අග්‍ර ආසන, අග්‍ර දිය, අග්‍ර පිණ්ඩපාත ආදිය ලබාගැනීමට අතින් ගටමින් පිළිවෙල ඉක්මවා ඉදිරියට යයි. ඇතුළු ගමට හෝ ඇතුළු ගෙට පිවිසීමේදී වැඩිමහලු භික්ෂූන්ට පෙරින් ගොස පිවිසෙයි. ළදරු භික්ෂූන් සමග කයින් ක්‍රීඩා ආදිය කරයි. මෙලෙසින් කයින් වැරදි හැසිරීම් දැක්වීමයි. "සිවුතැනක වචනයෙන් ගැටීම"නම් - සංඝ, ගණ, පුද්ගල හා ඇතුළුගමට - ඇතුළුගෙට පිවිසීමේදී නුසුදුසු වචන පැවසීමයි. ඒ කෙසේද? මේ සසුනෙහි ඇතැම්

භික්ෂුවක් වැඩිහිටි අවසරයක් නැතිව සඟමැද බණ කියයි. එලෙසින් ම අවසරයක් නොමැතිව ගණයා මැදද පුද්ගලයන් සම්පයේද සිදුකරයි. තවද මිනිසුන් ප්‍රශ්න විමසූ විට වැඩිහිටි අවසරයක් නොගෙන, ඒවා විසඳයි. ඇතුළු ගමේදී පිඬු පිණිස යමින් ම "අසුවල් ගෙදරින් කුමක් ලැබේද?" "කෑ දෑද? නැතිනම් කෑයුතු වැළඳිය යුතු දෙයක්ද?" "මට දෙන්නේ මොනවාද?" "කිම අද කමුද?" "වළඳමුද?" "කිම අද බොන්නෙහිද?" ආදිය කියයි. මෙලෙස වචනයෙන් නුසුදුසු හැසිරීම් දක්වයි. නොයෙක් තැන්හි මනසින් ගැටීම නම් ඒ ඒ තැන ඉහත කී අයුරින් කාය-වාග් වැරදි හැසිරීම් ආදියට නොපැමිණි නමුත් මනසින් ම කාමවිතර්කාදිය සිතයි. තවද දුසිල්ව හිඳගෙන, "ජනයා මා සිල්වතෙකු ලෙස දැනගනිත්වා!"යි මෙසේ පවතින පවිටු සිත, ස්වභාවය මනසින් ගැටීම නම් වේ. "මේ දක්වූ සියලුම ආකාරයේ ගැටීම්වලින් දුරවූයේ. ඒවායෙහි නොයෙදී - නොගැටී කුලයන් වෙත පැමිණෙවු" යන අර්ථයයි.

"**ජරූදපානං**" යනු දිරාගිය ළිඳයි. "**පබ්බත විසමං**" යනු විෂම වූ පර්වතයයි. වැටෙන තැනයි. "**නදී විදුගඟං**" යනු ගඟෙහි ගමනට අපහසු තැනයි. වැවේ සිදුණු තැනක්. "**අපකසෙසව කායං**" යනු ඒ ඒ තැන්වල යමෙක් ක්‍රීඩාදියේ නියුක්තව, කය ඉවත් නොකරම, හුදකලාව බරපතල කම් ගැන නොසිතා, ආධාරක දෙයක් නො අල්වාම සිත ද ඉවතට නොගෙන - මෙහි වැටී අත්පා බිඳීම් ආදී දුකට පත්වේ. මෙසේ තැති නොගෙන - ආදීනව නොසළකා සතුටුවෙමින් ඒ දෙස එබී බලයි. ඔහු එහි වැටී අත්පා බිඳීම් ආදී අනර්ථයට-දුකට පත්වේ. යමෙක් ජලයෙන් ප්‍රයෝජනයක් ඇතිව ළිඳ වෙත ගොස් කය බැහැර කර, සිත එක්තැන් කරගෙන, ආදීනව බැරෑරුම්ව සළකා බලමින්, ආධාරක උපකරණ අල්වාගෙන, සිතද බැහැරකර, තැතිගැනීම් සහිතව බලයි. ඔහු ළිඳට නොවැටෙයි. රිසිසේ ළිඳ බලා, සුවසේ තමා කැමති තැනකට යයි.

"**එවමෙව ඛො**" යනු මෙහි උපමා සන්සන්දනයයි. සතර කුලයන්, දිරාගිය ළිඳ මෙනි. යෝගාවචර භික්ෂුව, ළිඳ බැලීමට පැමිණි පුරුෂයා මෙනි. ඉවත් නොකළ කය ඇතිව, ඉවත් නොකළ සිත් ඇතිව ළිඳ බලන පුරුෂයා එහි වැටෙන්නාක් මෙන් නොරකින ලද කය හා සිත් ඇතිව කුලයන් වෙත එළඹෙන භික්ෂුවද කුලයන්හි ඇලේ. බැඳේ. ඉන්පසු නානාප්‍රකාර සිල් නම් වූ පාබිඳීම් ආදී අනර්ථයට ළිඳට වැටුණු මිනිසා මෙන්ම පත්වේ. බැහැර කළ කය-සිත් ඇති නුවණැති පුරුෂයා ළිඳට නොවැටෙන්නාක් මෙන් ආරක්ෂා කරන ලද කය-සිත හා වචන ඇති

මනාව පිහිට වූ සිත ඇති නුවණැති භික්ෂුව සිහි ඇතිව ම කුලයන් වෙත එළඹෙයි. කුලයන් කෙරෙහි නො ඇලෙයි. නොබැඳෙයි. නොවැටී සුවසේ තමා කැමති තැනට ගිය නුවණැති පුරුෂයා මෙන් එම භික්ෂුවගේද සීල නමැති පාද නොබිඳුණේය. ශ්‍රද්ධාව නැමති අත් නොබිඳුණේය. සමාධිය නැමති කුස නො බිඳුණේය. ඤාණය (ප්‍රඥාව) නැමති හිස නොබිඳුණේය. රාග නැමති හුන්, කටු ආදියෙන් බාධාවක් නොවූයේය. තමා රිසි තැනකට සුවසේ ගියාක් මෙන් භික්ෂුව ද කුලයන් නිසා චීවරාදී සිවුපසය ලබාගෙන, කමටහන් වඩා සංස්කාර ස්වභාවය මෙනෙහිකර, රහත්ඵලය සාක්ෂාත් කරගෙන - ලොවුතුරු සුවයෙන් සුවපත් වූයේ, තමාට අභිමත වූ පෙර නොගිය විරූ ක්ෂේමභූමියක් වූ "නිර්වාණය" නම් දිශාව බලා යන්නේය.

දැන් හීනවූ අදහස් ඇති වැරදි දේට පිළිපන් යමෙක් මෙසේ කියන්නේය. සම්මා සම්බුදුරජාණන් වහන්සේ "ත්‍රිවිධ වූ ගැටීම් දුරලා නිත්‍ය නවකයකු ලෙස චඤ්‍රයා මෙන් කුලයන් වෙත එළඹෙවු"යි වදාරන සේක් භික්ෂූන් වහන්සේලා නුසුදුසු තැන්හි වාසය කරවන සේක. නොඉවසිය හැකි බරක් පටවන සේක. මෙලෙස කිරීමට හෝ කරවීම ඉතා අසීරුය" යනුවෙනි. එබඳු වාදයන් (අදහස්(සිඳදමමින්, "එලෙස ජීවත්විය හැකියැ"යි තහවුරු කරමින් "එසේ ජීවත්වන භික්ෂූහු වෙති"යි උදාහරණ දක්වන සේක "**කසසපො භිකඛවෙ**"..... යනාදිය දෙසූහ.

"**ආකාසෙ පාණිං චාලෙසි**" යනු නිල් අහසේ, එකට වෙලී පවතින විදුලිය දෙකක් සැරිසරන්නාක් මෙන් යටින් ද උඩින් ද දෙපැත්තෙන් ද අත සැරිසැරුවේය යනුයි. (අත එහෙ මෙහෙ විහිදවූ සේක.) මෙයද ත්‍රිපිටක බුද්ධ වචනයෙහි අසම්භින්න වූ පදයකි. "**අත්තමනො**" යනු සතුටු සිත් ඇති, පිනාගිය සිත් ඇති යනුයි. දොම්නසින් පැහැරගත් මනසක් නොමැතිවයි.

"**කසසපසස භිකඛවෙ**" යන මෙහිද පෙර පැවසූ ලෙස ම අන්‍යයන්ගේ වාද සිඳ දමමින් "මෙබඳු භික්ෂූහු ඇත"යි දක්වීමට වදාළ සේක.

"**පසනනාකාරං කරෙයයුං**" යනු චීවරාදී ප්‍රත්‍යයන් දෙන්නාහු නම් යනුයි. "**තථතතාය පටිපජජෙයයුං**" යනු සීලය පැමිණි තැන්හි සීලය සම්පූර්ණ කරමින්, සමාධි විදර්ශනා මාර්ගඵල පැමිණි තැන්හි ඒ ඒ දෙය සම්පාදනය කරමින්, ඒ සඳහාම පිළිපදින්නාහු නම් යනුයි. "**අනුද්දයං**" යනු ආරක්ෂා කරන බවයි. "අනුකම්පං" යනු මුදුසිත් ඇතිබවයි. මේ පද දෙකම කරුණාවට ම යෙදුණු සමාන වදන් වේ. "**කසසපො භිකඛවෙ**"

යන මෙහිද පෙර කියන ලද පරිදිම පරවාදයන් බිඳලමින් "මෙබඳු භික්ෂූහු ඇත"යි දැක්වීමට දෙසන ලද සේක. "**කසසපෙන වා**" යන මෙහි සඳ උපමාව ආදී විස්තර මුලින් පවසා ඇති අයුරින්ම දතයුතුයි.

තෙවන සූත්‍රයයි.

15. 1. 4.

සිවුවන සූත්‍රයේ - "**කුලූපගො**" යනු කුල ගෙවල්වලට පැමිණෙන්නාය. "**දෙනතුයෙව මෙ**" යනු මා හටම දෙත්වා යනුයි. "**සාදියති**" යනු කරදරයට පත්වෙයි. පෙළයි. සෙසු පදයන්ගේ අර්ථ කියන ලද පරිදි ම දතයුතුයි.

සිවුවන සූත්‍රය

15. 1. 5.

පස්වන සූත්‍රයේ - "**ජිණ්ණා**" යනු ස්ථවිර වූ, මහලු වූ යනුයි. "**ගරුකානි**" යනු ඒ සිවුර ශාස්තෘන්වහන්සේ වෙතින් ලැබූ කාලයේ පටන්, සිදුණු ඉරුණු තැන් නූලෙන් මැසීමෙන් ද නොයෙක් සිය ගණන් අණ්ඩ දැමීමෙන්ද බරවූවක් බවට පත්විය. "**නිබ්බසනානි**" යනු පෙර භාග්‍යවතුන් වහන්සේ විසින් හැඳ පොරවා බැහැර කළ බැවින් මෙනමින් හැඳින්විණි. "**තසමා**" යනු යම්හෙයකින් නුඹ ජරාවට පත්වූයේ ද ගරුකටයුතු පාංශුකූලික පැවිද්දෙක් වූයේ ද එනිසාය. "**ගහපතිකානි**" යනු "පාංශුකූලිකාංගය හැරදමා ගහපතියන් විසින් දුන් සිවුරු දරන්න" යන අදහසයි. "**නිමනතණෙසු**" යනු "පිණ්ඩපාතිකාංගය හැරදමා සළාක බත් ආදියෙන් ආරාධිත දානය වළඳන්න" යන අදහසයි. "**මමඤ්ඤව සනතිකෙ**" යනු "ආරණ්‍යයේ ම විසීම අත්හැර ගම් සෙනසුන්හි ම වෙසෙන්න" යන අදහසයි. රජතුමා සේනාපතියකු සේනාපති තනතුරෙහි තමා විසින්ම තබා, රාජ උපස්ථාන ආදිය මගින් තමාගේ සිත සතුටුකරන එම සෙන්පතියාගේ එම තනතුර වෙනත් අයෙකුට දේනම්; රජු නුසුදුසු ක්‍රියාවක් කරන්නේ නොවේද? මෙසේ ම භාග්‍යවතුන් වහන්සේ ම මහා කාශ්‍යප තෙරුන්ට පෙරගමන් කරනු වස් තුන් ගවුවක් මග ගෙවා ගොස් රජගහ නුවරට ද නාලන්දාවටද අතර වූ බහුපුත්තක නම් රුක්මුල හුන් සේක්, ත්‍රිවිධ අවවාදයන්ගෙන් ම ඕවාද පටිග්ගහණ උපසම්පදාව ලබාදී, උන්වහන්සේ සමග තම සිවුර

හුවමාරු කරගෙන පැවිදි වූ දින පටන් ම කාශ්‍යප තෙරුන් ආරණ්‍යයෙහි වාසය කරන ධුතාංගධාරී තනතුරට පත්කළ සේක. මහකසුප් තෙරණුවෝ මේ දක්වා බුදුසිත නොරිදවමින් කළයුතු වතාවත් නිසිපරිදි ඉටු කරද්දී ම නැවත භාග්‍යවතුන් වහන්සේ විසින් උන්වහන්සේට, පාංශුකූලිකංගය හැරදමා ගහපති සිවුරු පිළිගැනීම් ආදියට යොමුකරවන සේක. මෙය අයුක්තියක්, නුසුදුසු ක්‍රියාවක් නොවන්නේද? නැත. එය අයුක්තියක් ඉටුකිරීමක් නොවේ. කුමක් නිසාද? තමන්වහන්සේගේ ම අදහසක් වන බැවිනි. ශාස්තෘන් වහන්සේ ධුතාංග ආදිය අත්හැරීමට - ඉවත දැමීමට නො කැමති සේක. "යම්සේ නොගටන ලද බෙර ආදිය ශබ්ද පිට නොකරයිද එලෙසින්ම නොගටන ලද මෙබඳු උතුම් පුද්ගලයෝ සිංහනාද නොකරති"යි කාශ්‍යප තෙරුන්ගේ සිංහනාදය අසනු රිසි වූ බැවින් මෙලෙස වදාළහ.

තෙරුන් ද භාග්‍යවතුන් වහන්සේගේ අදහස අනුවම "අහං බො හනෙත! දීඝරත්තං ආරඤ්ඤකො චෙව" යනාදී ක්‍රමයෙන් සිංහනාද පැවැත්වීය.

"දිට්ඨධම්ම සුඛ විහාර" නම් වූ මෙලොවදී ලබන සැප විහරණය නම් අරණ්‍යවාසීහුම ලබති. ග්‍රාමවාසීහු නොලබති. ගමෙහි වසන භික්ෂුවට දරුවන්ගේ ශබ්ද ඇසේ. නුසුදුසු රූප දකියි. නුසුදුසු ශබ්ද ඇසෙයි. එයින් උන්වහන්සේට ගිහිගේ පිළිබඳ ඇලීමක්, ආශාවක් උපදියි. ආරණ්‍යවාසී භික්ෂුව ගවුවක් හෝ අඩයොදුනක් දුර ගම ඉක්මවා කැළයට ඇතුළු වී වාසය කරයි. කොටි-ව්‍යාඝ්‍රාදී සතුන්ගේ ශබ්ද පමණක්ම අසයි. ඒවා ඇසීමෙන් අමානුෂික වූ බියක් උපදියි. ඒ සඳහා මෙය කියන ලදී.

සුඤ්ඤාගාරං පවිටඨස්ස - සන්ත චිත්තස්ස භික්ඛුනො
අමානුසි රති හොති - සම්මා ධම්මං විපස්සතො

යතො යතො සම්මසති - ඛන්ධානං උදයබ්බයං
ලහති පීති පාමොජ්ජං - අමතං න විජානතං

පුරතො පච්ඡතො වාපි - අපරො චෙ න විජ්ජති
තත්ථෙව ඵාසු භවති - එකස්ස රමතො වනෙ

"ශූන්‍යාගාරයට පිවිසියා වූ ශාන්ත සිත් ඇති, මැනවින් ධර්මය විමසා බලන භික්ෂුවට අමානුෂික වූ ඇල්මක් ඇති වේ."

"යම් යම් ආකාරයකින් ස්කන්ධයන්ගේ ඇතිවීම හා නැතිවීම විමසා බලන්නේ ද නිවණ මැනවින් අවබෝධ වී ප්‍රීතිය හා ප්‍රමෝදය ලබාගනියි."

"ඉදිරියෙන්ද පසුපසින්ද උන්වහන්සේට දෙවැනියකු නැත. හුදකලාවම වනයෙහි ඇලී, එහිම වෙසෙනුයේ සැපවිහරණ සුව විඳියි."

මෙලෙසින් ම පිණ්ඩපාතික වූ භික්ෂුවම මෙලොවදී සැප ලබයි. ඉන් වැලකුණු භික්ෂුව දිවිඇතිමම සුඛය විඳින්නෙක් නොවේ. පිණ්ඩපාතික නොවූ භික්ෂුව අකාලචාරී වේ. ඉක්මන් ගමන් ඇතිවේ. හුවමාරු කරගනියි. පළිබෝධ සහිතවම යයි. එසේම බොහෝ සැකයන්ට බඳුන් වේ. පිණ්ඩපාතික භික්ෂුව අකාලයේ නොහැසිරෙයි. ඉක්මන් ගමන් ඇත්තෙක් නොවේ. හුවමාරු කර නොගනියි. හිරිහැර-කරදර ආදී පලිබෝධ කිසිත් නොමැතිව යයි. උන්වහන්සේගේ ගමනින් කිසිදු සැකයකට බඳුන් නොවෙති. ඒ කෙසේද?" පිණ්ඩපාතික නොවූ භික්ෂුව ගමින් දුර විහාරයක වාසය කරයි. උදේම පිබිද "කල් ඇතිවම කෑදක් හෝ බත් ආදියක් මට පැමිණේද?"යි සොයමින් මකුළුදැල් කඩමින්, නිදාසිටින ගව ආදී සතුන් නැගිටුවමින් උදෙන්ම යන්නේ අකාලයේ හැසිරේ. දායකයන් කුඹුරු වැඩ ආදී කර්මාන්තවලට යෑමට පෙර, ඔවුන් ගෙදරින් නික්මෙද්දීම නිවෙස් වෙත පැමිණීම සඳහා මුවන් ලුහුබැඳ යන්නාක් මෙන් වේගවත් වූ ගමන් ඇත්තේ වේ. අතරමගදී කිසිවකු දක "අසුවල් උපාසකයා හෝ උපාසිකාව ගෙදර සිටීද? ගෙදරින් පිටවිද?" ආදිය අසයි. "ගෙදරින් පිටව ගියේය"යි පැවසුවහොත් "දැන් කොතැනින් අහර ලබමිද?"යි ගින්නෙන් දැවුණු තැනැත්තෙකු මෙන් කම්පාවෙයි. විපිළිසර වෙයි. තමා බටහිර දෙසට යාමට කැමැත්තෙන් සිටිය දී නැගෙන දෙස වූ නිවසක සළාක බතක් ලබයි. එවිට වහාම බටහිර දෙස සළාකයක් ලද භික්ෂුවක් සොයා යායුතු වේ. එබඳු භික්ෂුවක් වෙත එළඹ, "ස්වාමීනි! මම බටහිර දෙසට යන්නෙමි. මගේ සළාකය ඔබවහන්සේ ගන්න. ඔබවහන්සේගේ සළාකය මට දෙන්න"යි සළාක හුවමාරු කරගනියි. එක් සළාක බතක් ගෙනැවිත් වළඳන කල්හි, තවත් සළාක බතකට "පාත්‍රය දෙන්න"යි මිනිස්සු ඉල්වති. එවිට සම්පව සිටි අන්‍ය හිමිනමකට "ස්වාමීනි! නුඹවහන්සේගේ පාත්‍රය දෙන්න. ගෙනා පසු බත් මගේ පාත්‍රයේ දමාගෙන නැවත ඔබවහන්සේට පාත්‍රය දෙන්නෙමි"යි කියා උන්වහන්සේගේ පාත්‍රය දායකයන්ට දෙයි. එය පුරවාගෙන පැමිණිවිට, එම බත් තම පාත්‍රයේ දමාගෙන නැවත පාත්‍රය අයිතිකාර හිමිනමට දීම පාත්‍ර හුවමාරුව නම් වේ. විහාරයේ රාජරාජ මහාමාත්‍යාදීහු මහදන් පවත්වති. මෙම භික්ෂූහු ද "ඊයේ දුරගමක

සළාකයක් ලැබූ බැවින් එහි ගොස් පැමිණෙනවිට සත්දිනක් ම සළාක නොලැබේ"යැයි නොලැබීම් බියෙන්ම යයි. මෙසේ හිරිහැර පළිබෝධ සහිතවම යෑම සිදුවේ. දැන්වන ලද යමකුගේ සළාක බතක් සඳහා යනුයේ "එය දෙයිද? මා හට එය නොලැබේද? එය ප්‍රණීතව දේවිද? රූක්ෂ ලෙස දේවිද? ස්වල්පයක් දෙයිද? නැතිනම් බොහෝ ආහාර දේවිද? සීතල වූ ආහාරයක් ලැබේද? නැතිනම් උෂ්ණ වූ ආහාරයක් ලැබේද?" මෙලෙස බොහෝ සැක සංකා සහිතවම යෑමට සිදුවේ.

පිණ්ඩපාතික වූ භික්ෂුව උදයේ ම නැගිට වත්පිළිවෙත් දක්වා, ශරීරකෘත්‍ය සිදුකර - තමා වසන තැනට පිවිස, කමටහනක් සිහිපත් කරයි. අනතුරුව කල්වේලා බලා, මහජනයාට කැඳබත් ආදියක් පිළියෙල කරගැනීමට ප්‍රමාණවත් වන කාලයෙහි ම ගමට පිඬු පිණිස හැසිරෙයි. සුදුසු කාලයේ මිස අකාලයේ නොහැසිරෙයි. පිඬු පිණිස වඩිමින්ද එක් එක් පියවරක් කොටස් සය බැගින් බෙදා විඳසුන් වඩමින් හැසිරෙයි. මෙනිසා උන්වහන්සේට ඉක්මන් ගමන් නැත. තම ගෞරවණීය භාවය නිසා "අසුවලා ගෙදර සිටීද? නැතිද?" ආදියක් කිසිවකුගෙන් නොවිමසයි. සළාක බත් ආදියක් නොගනියි. එනිසාම සළාක භුවමාරුවක්ද නොලැබේ. අවශ්‍ය නොවේ. මෙනිසා පළිබෝධ හිරිහැර නැත. කමටහන් මෙනෙහි කරමින්ම තමන් රිසි තැනකටම වැඩම කරයි. එනිසා සෙසු තෙරවරුන්ට මෙන් බොහෝ සැක සංකා නූපදී. එක් ගමකට, වීථියකට පමණක් ඇලී නොසිට වෙනත් තැන්වලට යයි. එක්තැනක නොඇලී, අන්‍ය තැන්වලට යන බැවින් මිශ්‍ර වූ බත් අමෘතයක් මෙන් වළඳා යයි. පැවිද්දෙහි ඇති දිට්ඨධම්මික සුවය මැනවින් විඳියි. පැවිද්දෙන් මෙලොවදී ලබන සැප පාංශුකූලික වූ භික්ෂුවම ලබයි. එසේ නොවූ භික්ෂුව නොලබයි. පාංශුකූලික නොවන භික්ෂුවට වස්වසන තැනක් සොයා යෑමට සිදුවේ. සුදුසු සෙනසුනක් නොම සොයයි. නමුත් පාංශුකූලික භික්ෂුව වස් වසන තැන් නොසොයයි. තමාට සුදුසු සෙනසුනක්ම සොයා ගනියි. තේචීවරිකංගය සමාදන් වූ භික්ෂුවම මෙලොවදී ලබන පැවිද්දෙහි සැප වළඳයි. එසේ නොවූ භික්ෂුව නොලබයි. තේචීවරිකංගය සමාදන් නොවූ භික්ෂුවට බොහෝ පිරිකර ඇත. බොහෝ භාණ්ඩ ඇත. එනිසා උන්වහන්සේට පහසු විහරණයක් නම් නැත. අල්පේච්ඡ වූවන්ටම පැවිද්දෙහි ඇති මෙලෝ සැප ලැබේ. එසේ නොවූවන්ට නොලැබේ. මෙනිසා "**අත්තනො ච දිට්ඨධම්ම සුඛ විහාරං සමපස්සමානො**" යනුවෙන් කියන ලදී.

පස්වන සූත්‍රයයි.

15. 1. 6.

සයවන සූත්‍රයේ "අහං වා" යනුවෙන් වදාළේ කුමක් නිසාද? තෙරුන් වහන්සේ තමන් වහන්සේ සිටින තැන තැබීම සඳහායි. ඇයි සාරිපුත්‍ර-මහමුගලන් ආදී මහතෙරවරු මේ සඳහා සුදුසු නොවේද? ඔවුහු නැද්ද? උන්වහන්සේලා සිටිති. බුදුපියාණන් වහන්සේට මෙබඳු කල්පනාවක් පහළවිය. "මොවහු බොහෝ කලක් නොසිටිති. මහාකාශ්‍යප තෙරුන් වනාහී වර්ෂ එකසිය විස්සක් ආයු ඇත්තෙකි. උන්වහන්සේ මා පිරිණිවි කල්හි සප්ත පර්ණි ගුහාද්වාරයේ හිඳ ධර්මවිනය මනාව සංග්‍රහ කරමින්, මගේ සසුන වසර පන්දාහක් පමණ කල් පැවතීමට කටයුතු කරන්නේය." යනුවෙන් සලකා, තමන්වහන්සේගේ ස්ථානයේ තැබූ සේක. මෙනිසා සෙසු භික්ෂූහු කාශ්‍යප තෙරුන්ට ඇහුම්කන් දියයුතු බවට පමුණුවමින් මෙලෙස වදාළහ.

"දුබබවා" යනු දුකින් කිවයුතු යනුයි. "**දොවචසස කරණෙහි**" යනු අකීකරුකම් කරන්නාහුය. "**අපපදක්ඛිගගාහිනො**" යනු අනුශාසනාව අසා එය නියමාකාරයෙන් වටහා නොගනියි. අනුශාසනා කල පරිද්දෙන් නොපිළිපදියි. පිළිනොපදින්නාහු "වාමග්‍රාහී" නම් වෙතැයි දක්වයි. "**අචවාවදනෙන**" යනු වාදය ඉක්මවාය. "ඇසූ පර්යාප්ති ධර්ම ඇති බැවින් අතිශයින් වාද කරති" යන අර්ථයි.

"**කො බහුතරං භාසිසසති**" යනු "ධර්මය දේශනා කරන්නා වූ කවරෙක් බොහෝකොට කියන්නේද? කිම නුඹද? නැතිනම් මමද?" යනුයි. "**කො සුභරතරං**" යනු එක් අයෙක් බොහෝ කොට දෙසන්නාහු ඉවසීමක් හෝ ධර්ම සාහිත්‍යයක් නොමැතිව අමිහිරිව දේශනා කරයි. තව අයෙක් ඉවසීමෙන්, ධර්ම සාහිත්‍ය සහිතව, මිහිරිව ධර්ම දේශනා කරයි. ඒ සඳහා පවසන ලදී. කවරෙක් අතිශයින් සුන්දරද? එක් අයෙක් බොහෝ කොට ද සුන්දරව ද ධර්මදේශනා කරනුයේ නමුත් බොහෝවේලා නොදෙසයි. ඉක්මණින් ම නැගී සිටියි. තව අයෙක් දීර්ඝ මාවතකට පමුණුවයි. හෙවත් බොහෝවේලා දහම් දෙසයි. එනිසා "**කො චිරතරං**" යනුවෙන් කියන ලදී.

සයවන සූත්‍රය යි.

15. 1. 7

සත්වන සූත්‍රයේ "**සදධා**" යනු විශ්වාස කරන ශ්‍රද්ධාවය. "**විරියං**"

යනු කයේ හා චෛතසිකයන්ගේ වීර්යයයි. "පඤ්ඤා" යනු කුසල්දහම් දැනගන්නා වූ ප්‍රඥාවයි. "න සන්ති භික්ඛූ ඔවාදකා" යනු "මේ පුද්ගලයාට අවවාද දෙන්නෝ, අනුශාසකයෝ, කල්‍යාණ මිත්‍රයෝ නැත" යන මේ වස්තුව "භනෙත පරිහාණං" යනුවෙන් දක්වයි.

සත්වන සූත්‍රය යි.

15. 1. 8.

අටවන සූත්‍රයේ - "තථා හි පන" යනු පෙර සුවච කීකරු බැවින් ද දැන් දුර්වච අකීකරු බැවින් ද යන කරුණු දක්වීමට යෙදූ නිපාතයකි. "තත්‍ර"යනු ඒ තෙරවරු අතර යනුයි. "කො නාමො" යනු මේ භික්ෂුවගේ නම කුමක්ද? කිම "තිස්ස" තෙරුන්ද? කිම "නාග" තෙරුන්ද? යනුයි. "තත්‍ර" යනු එහිදී මෙසේ සත්කාර කරන කල්හි "තථතතාය" යනු ඒ සඳහා, එසේවීම සඳහා, ආරඤ්ඤිකාංග සමාදානාදිය සඳහා යන අර්ථයි. "සබ්‍රහ්මචාරිකාමො" යනු "මොවුහු මා පිරිවරාගෙන හැසිරේවා"යි මෙලෙස කැමති වේ. අපේක්ෂා කරයි. එය ප්‍රාර්ථනා කරයි. සබ්‍රහ්මචාරීන්ට කැමති වේ. "තථතතාය" යනු ලාභසත්කාර ඉපිදවීම සඳහාය. "බ්‍රහ්මචාරූපදද්‍දවෙන" යනු යමෙක් බ්‍රහ්මචාරීන්ගේ සිවුපස විෂයෙහි උපදවන අධික වූ ඡන්දරාගය, උපද්‍රවයකැයි කියයි. එයින් පීඩා වූ "අභිභවතා" යනු අධික ප්‍රාර්ථනා ඇති යනුයි. "බ්‍රහ්මචාරී අභිභවනෙන" යනු බ්‍රහ්මචාරීන්ගේ අධික ප්‍රාර්ථනා සංඛ්‍යාත වූ සිවුපසය නොලැබීමෙන්ය.

අටවන සූත්‍රය යි.

15. 1. 9.

නවවන සූත්‍රයේ - "යාවදෙව ආකංඛාමි" යනු යම්තාක් කල් කැමතිවෙමි ද යනුයි. මෙයින් මතු "විවිචෙවව කාමෙහි" යනාදී වශයෙන් යම් ඒ සිවු රූපාවචර ධ්‍යානයන් කියනු ලැබේ. "සබ්බසො රූපසඤ්ඤානං සමතිකකමා" ආදී ක්‍රමයෙන් සතර අරූපාවචර සමාපත්තීහු ගණන් ගැනේ. "සබ්බසො නෙවසඤ්ඤානා සඤ්ඤායතනං සමතිකකමම සඤ්ඤාවෙදයිත නිරොධං" යනු මෙසේ නිරෝධ සමාපත්තියයි. "අනෙකවිහිතං ඉද්ධිවිධං" යනාදී ක්‍රමයෙන් ලෞකික අභිඥා පසඳ කියන ලදී. එහි යමක් කිවයුතු නම් ඒ සියල්ල අනුපද වර්ණනාව හා භාවනා විධානය ද සහිතව

විශුද්ධිමාර්ගයේ විස්තර කරන ලද්දේමය. ඡඩ් අභිඥාව වනාහී "ආසවානං ඛයා" යනු ආශ්‍රවයන්ගේ ක්ෂයවීමෙන්. "අනාසවං" යනු ආශ්‍රවයන්ගේ ප්‍රත්‍ය නොවූ, නොපැවතිමයි. "චෙතොවිමුතති" යනු අර්හත් ඵල සමාධියයි. "පඤ්ඤා විමුතතිං" යනු අර්හත්ඵල ප්‍රඥාවයි.

නවවන සූත්‍රයයි.

15. 1. 10.

දසවන සූත්‍රයේ "ආයාම භනෙත" යනුවෙන් කුමක් නිසා භික්ෂුණීන්ගේ අසපුවකට යෑම සඳහා ආරාධනා කළෙහිද? ලාභසත්කාරමය හේතුවකින් නොවේ. කමටහනින් යහපතක් වන භික්ෂුණීහු වෙති. ඔවුන් උත්සාහවන්ත කර, කමටහන් ලබාදෙන්නෙමි"යි මෙලෙස ආයාචනා කළේය. ආනන්ද තෙරුන් වහන්සේ ත්‍රිපිටකධර බහුශ්‍රැතයෙක් නොවේද? මෙසේ ඉල්වනුයේ තමාට කමටහන් ලබාදිය නොහැකි නිසාද? නැත. උන්වහන්සේට හැකිය. බුදුරජාණන් වහන්සේ හා සමාන වූ ජ්‍යෙෂ්ඨතම ශ්‍රාවකයාගේ දේශනාව ඇදහිය යුතු වූවකැයි සිතන බැවින් මෙසේ ආයාචනා කරන ලදී. "බහුකිවෙවා ඣං බහුකරණියො" යනු කිම තෙරුන් වහන්සේ නවකර්මාන්ත ආදියේ නියුක්තව සිටින බැවින් ආනන්ද හිමියන්ට මෙසේ දේශනා කළ සේක්ද? නැත. බුදුරජාණන් වහන්ස පිරිනිවි කල්හි සිවුපිරිස ආනන්ද තෙරුන් වෙත එළඹ, "ස්වාමීනි! දැන් කාගේ පාසිවුරු ගෙන හැසිරෙන්නෙහිද? කාගේ පිරිවෙණ අමදින්නෙහිද? මුවදෙනා පැන් පිළිගන්වනුයේ කාටද?"යි කියමින් හඬති. වැලපෙති. තෙරුන් වහන්සේ "සංස්කාරයො අනිත්‍යහ. උතුම් බුදු සිරුරටද නිර්ලජ්ජී මාරයා පහර දුන්නේය. මෙය සංස්කාරයන්ගේ ධර්මතාවයි. එනිසා ශෝක නොකරන්න. නොවැලපෙන්න." යනුවෙන් පිරිස සන්සිඳුවයි. මෙසේ වූ බොහෝ කටයුතු ඇති බැවින් තෙරුන් වහන්සේ අනඳ හිමිට මෙසේ වදාළහ. "සතෙසසසි" යනු ප්‍රතිපත්ති ගුණ දක්වීය යනුයි. "සාමදපෙසි" යනු කරුණු ගන්වයි යනුයි. "සමුතතෙජෙසි" යනුවෙන් උත්සාහවත් කරවීය. "සමපහංසෙසි" යනු ලබන ලද ගුණයෙන් පිරිසිදු කරවයි.

"ථුලලනිසස" යනු ශරීරයෙන් මහත්වූ නමින් තිස්ස වූ යනුයි. "වෙදෙහමුනිනො" යනු පණ්ඩිත මුනිවරයෙකි. පණ්ඩිත යනු ඤාණය නම් වූ වේදයෙන් සියලු කටයුතු කිරීමට උත්සාහ ගනියි. කරයි. එනිසා

"වේදෙහ"යැයි කියන ලදී. වේදේහ වූයේත් ඔහුමය. මුනිවූයේත් ඔහුමය. වේදේහ මුනි වේ. "**ධම්මං භාසිතබ්බං මඤ්ඤති**" යනු ත්‍රිපිටකධර වූ ධර්ම භාණ්ඩාගාරික වූ අනඳ තෙරුන් හමුවේ අරණ්‍යවාසී වූ පාංශුකූලිකංග සමාදන් වූ මහාකාශ්‍යප තෙරුන් "මම ධර්මකථිකයෙකි"යි ධර්මදේශනා කළේ යැයි සිතයි. මේ ධර්මකථාව කුමන හේතුවකින් කළේදයි නොදන්නී මෙසේ කීවාය.

"අසෙසාසි" යනු අනිකකු පැමිණ දැන්වීම් වශයෙන් ඇසූහ යනුයි. "ආගමෙහි තවං ආවුසො" යනු "ඇවැත්නි! නුඹ සිටින්න. නවතින්න" යනුයි. "**මා තෙ සංසො උතතරිං උපපරිකඛි**" යනු "භික්ෂු සංඝයා අනාගතයේ විශේෂ අවසරයකින් නුඹ පරීක්ෂා කර බැලීම සිදුනොවේවා! යනුයි. මෙය කියන ලදී. "ආනන්ද තෙරුන් විසින් බුදුරජාණන් වහන්සේට සමාන වූ ශ්‍රාවකයෙක් වලකන ලදී. එක් භික්ෂුණිය නොවලකන ලදී. ඇය සමග එක්ව විසීමක් හෝ ස්නේහයක් හෝ වන්නේයැ"යි සංඝයා මෙසේ නුඹ ගැන නොසිතවා" යන අදහසිනි.

දැන් තමාගේ බුදුරජාණන් වහන්සේ හා සමාන බව දක්වන සේක්, "**තං කිං මඤ්ඤසි ආවුසො**" ආදිය දේශනා කළහ. "**සතතරතනං**" යනු සත් රියනක් පමණයි. "**නාගං**" යනු ඇතෙකි. "**අඩඪඨරතනං වා**" යනු රියනෙන් අඩක් අඩු වූ අට රියනක් හෝ. රියන් හතහමාරක් වූ යනුයි. "පෙර පාදයේ සිට කුම්භස්ථලය දක්වා වියතකුත් රියන් හතක් උස වූ ඇතෙක්" යන අර්ථයි. "**තාලපතනිකාය**" යනු ළා තල්කොළයකිනි. "**චවිත්‍වා**" යනු චුතවිය යනුයි. මැරුණේ හෝ නැසුනේ නොවේ. බුදුරජාණන් වහන්සේ හා සමාන වූ ශ්‍රාවකයෙකුට උපවාද කර, මහාකාශ්‍යප තෙරුන් ෂඩ් අභිඥා පිළිබඳව සිංහනාද කරන කල්හි ඇය පොරවාගෙන සිටි කශාය වස්ත්‍රය කටුඅත්තක් මෙන් ද කහඹිලියා අත්තක් මෙන්ද වී ශරීරය කෑමට (කැසීමට) පටන් ගත්තීය. ඒ කාශාය වස්ත්‍රය හැරදමා සුදුවතක් හැඳි කෙනෙහි ම ඇයට සහනයක් ඇතිවිය.

දසවන සූත්‍රයයි.

15. 1. 11.

එකොළොස්වන සූත්‍රයේ - "**දක්ඛිණගිරිසමිං**" රජගහනුවර පිරිවරා සිටි කඳුවලින් දකුණ පැත්තේ වූ ජනපදය "**දක්ඛිණගිරි**" නම් වේ. එහි

චාරිකාවේ හැසිරේ යන අර්ථයි. චාරිකාවේ ප්‍රභේද දෙකකි. තුරිත චාරිකාව හා අතුරිත චාරිකාව යනුවෙනි. එහි යමෙක් එක් කසාවතක් හැඳ, එක් කසාවතක් පොරවාගෙන, පාසිවුරු උරයේ එල්ලාගෙන කුඩය ගෙන සිරුරින් දහඩිය වගුරුවමින් දවසකට යොදුන් හත-අටක් යයි. බුදුවරු කිසියම් හේතු සම්පත් ඇති සත්ත්වයකු දැක යොදුන් සීයක්-දාහක් වුවත් ක්ෂණයකින් යති. එය තුරිත චාරිකාව නම් වේ. දිනපතා සිදුවන පරිදි ගවුවක්, අඩ යොදුනක්, තුන් ගවුවක්, යොදුනක් යනාදී මෙපමණ දුර මාර්ගයක් ගෙවා යන දානයක් සඳහා ආරාධනා කරන ලද්දේ එය ඉවසා, ජනසංග්‍රහ කරමින් වැඩම කිරීම, "**අතුරිත චාරිකා**" නම් වේ. මේ අතුරිත චාරිකාව මෙහිදී අදහස් කරන ලදී.

තෙරුන් වහන්සේ වසර විසිපහක් බුදුරදුන්ගේ සෙවණැල්ල මෙන් පසුපසින් ගමන් කරන ලද්දාහු නොවෙත් ද? "ආනන්ද කොතැනද?" යන වචනය බුදුමුවින් පිටවීමට අවසරයක් නුදුන්නේමය. උන්වහන්සේ කවර කාලයක භික්ෂු සංඝයා පිරිවරාගෙන මෙසේ චාරිකාවේ යෑමට අවසරයක් ලැබූසේක් ද? ශාස්තෘන් වහන්සේ පිරිනිවි වසරේදී ම ය. පිරිනිවීමට අනතුරුව මහාකාශ්‍යප තෙරණුවෝ, සම්බුද්ධ පරිනිර්වාණයට වැඩමකළ භික්ෂු මහා සංඝරත්නය මැද වැඩහිඳ ධර්මවිනය සංග්‍රහ කිරීමට පන්සියක් මහරහත් තෙරවරු තෝරාගෙන, "ඇවැත්නි! අපි රජගහනුවර වස් වසමින් ධර්ම විනය සංගායනා කරන්නෙමු. නුඹවහන්සේලා පෙරවස් විසීමට ඇති තම තමන්ගේ උවදුරු බාධා සිඳ දමා රජගහනුවරට රැස්වවු"යි පවසා තමන් වහන්සේ රජගහ නුවරට වැඩිසේක. ආනන්ද තෙරුන් ද භාග්‍යවතුන් වහන්සේගේ පාසිවුරු ගෙන මහජනයාට දැනුම් දෙමින් සැවැත්නුවරට වැඩ, ඉන් රජගහ නුවර බලා වඩින අතරමග දක්ඛිණ ගිරියෙහි චාරිකාවේ හැසිරුණේය. ඒ සඳහා කියන ලදී.

"**යෙහුය්‍යෙන කුමාරහූතා**" යනු යම් ඒ පිරිසක් ගිහිබවට ගියාහු ද බොහෝ සෙයින් කුමාරවරු වූ බාලවූ තරුණ වූ ඔවුහුය. එක්වසක් දෙවසක් ඇති භික්ෂූහු මෙන් ම සාමණේරවරු ද මේ පිරිසේ විය. මොවුහු පැවිදිවූයේ ඇයි? ගිහිබවට පැමිණියේ ඇයි? මේ ළදරුවන්ගේ මවුපියවරු, "ආනන්ද තෙරුන් වහන්සේ ශාස්තෘන් වහන්සේට ඉතා විශ්වාසියෙකි. උන්වහන්සේ අටවරයක් ඉල්ලාගෙන උපස්ථාන කරති. තමා කැමති තැන්වලට ශාස්තෘන් වහන්සේ වැඩම කරවීමෙහි සමත්කම් ඇත්තෙකි. අපගේ දරුවන් උන්වහන්සේගේ සමීපයේ පැවිදි කරමු. ආනන්ද හිමියෝ අප ගමට වැඩමවන විට ශාස්තෘන් වහන්සෙ සමග ම වැඩමවති. එවිට

අපට මහත් වූ සත්කාරයන්ගෙන් බුදුරදුන්ට පූජා පැවැත්වීමට හැකිවේ"යැයි සාකච්ඡා කොට තම තම දරුවෝ පැවිදි කළහ. ශාස්තෘන් වහන්සේ පිරිනිවි කල්හි ඔවුන්ගේ අභිලාෂය ද වැනසී ගියේය. එනිසා ඔවුහු එකම දින උපැවිදි වූහ.

"යථාභිරතනං" යනු කැමති සේය. අදහස් අනුවය. **"නිකභොජනං පඤ්ඤතනං"** යනු මේ චීවර සමයෙහි හැර ගණභෝජනයෙහි පවිති ඇවත වේ."a යන ශික්ෂාපදය නිසා කියන ලදී. මෙහිදී තුන් ජනයාගේ කැපනොවූ ආරාධනාව ඉවසා, එක්තැන්වම පිළිගන්නා භික්ෂූන්ට ආපත්ති නැත. එනිසා 'තිකභෝජනය' යැයි කියන ලදී. **"දුම්මංකූනං පුගලානං නිගගහාය"** යනු දුසිල් පුද්ගලයන්ට නිග්‍රහ කිරීමටය. **"පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය"** යනු දුස්සීලයන්ට නිග්‍රහ පිණිසත්, ශික්ෂාකාමී තෙරවරුන්ට පොහෝ පවුරුණු පවත්වමින් සමගි වාසයටත් හේතු වේ. මෙය උන්වහන්සේලාගේ පහසු විහරණයයි. මේ පහසු විහරණය සඳහා **"මා පාපිචඡා පකබං නිසසාය සංඝං භිඤ්ඤයුං"** යනු යම්සේ දෙව්දත් තෙර පිරිවර සහිතව ගොස් කුලයන්ට දන්වා වළඳන්නාහුය. මේ පාපීන් නිසා සංඝයා බිඳුනේය. මෙලෙස වෙනත් පවිටු ළාමකයන්ගේ සමූහ විසිනුත් කුලයන්ට දන්වා වළඳමින් සමූහය වර්ධනය කර, ඒ පක්ෂය නිසා සංඝයා නොබිඳේවායි පතයි. "මෙසේ මේ කාරණයෙන් පනවන ලදී" යන අර්ථයි. **"කුලානුදයතායච"** සලාකබත් ආදිය දී දිව්‍යලෝක සාප පිහිට කරගත්තෝ වෙති. මෙසේ මොවුන්ට කුලයන් කෙරෙහි කරුණාව හා අනුග්‍රහය ද පණවන ලදී යන අර්ථයි. **"සඝසඝාතං මඤ්ඤෑ චරසි"** යනු ශාස්‍ය නසන්නවුන් මෙන් ඇවිදින්නෙහි යනුයි. **"කුලූපඝාතං මඤ්ඤෑ චරසි"** යනු කුලයන් නසන්නාක් මෙන්, විනාශ කරන්නාක් මෙන් ඇවිදින්නෙහි යනුයි. **"උලලුජජති"** යනු වැනසෙයි. බිඳෙයි යනුයි. **"පලුජජති බො තෙ** ආවුසො! නවපපායා" යනු ඇවැත්නි! මේ නුඹගේ බෙහෙවින් නවක වූ වස් එකක්, දෙකක් ඇති බාලවූවෝ මෙන්ම සාමණේරවරු ද වැනසෙති. බිඳෙති යනුයි. **"න චායං කුමාරකො මතතමඤ්ඤති"** යනු මේ කුමාරයා තමාගේ පමණ නොදනී යැයි තෙරුන්ට තර්ජනය කරමින් මෙලෙස වදාළහ. "කුමාරකවාදා න මුචචාම" යනු කුමාරක වාදයෙන් නොමුදමු. **"තථාහි පන තඛං"** යනු මෙහි මොහුගේ මේ පැවැත්මෙහි හේතු දැක්වීම සඳහා කියන ලදී. මෙහි අදහස මෙසේය. "යම් හෙයකින් නුඹවහන්සේ මේ

---

a. භික්ෂු ප්‍රාතිමෝක්ෂය

ඉන්ද්‍රිය සංවරයක් නැති නවක භික්ෂූන් සමග හැසිරෙන්නේ නම්; එනිසා ම කුමාරයන් සමග හැසිරෙන කුමාරයෙකැයි පැවසීමට සුදුසු වේ.

"අඤ්ඤතිත්ථිය පුබ්බා සමානෝ" යනු මේ ආයුෂ්මත් කාශ්‍යප තෙරුන්ට මේ සසුනෙහි ආචාර්යවරයෙක් හෝ උපාධ්‍යායවරයෙක් නොපෙනේ. "තමාම කසාවත් හැඳ පෙරවා ගිහිගෙයින් නික්මුණේයැ"යි නොසතුටු සිත් ඇති ඇය "පෙර අන්‍යතීර්ථක වූ බව ආරෝපණය කරමින් මෙලෙස කීවාය.

"සහසා" යනු මෙහි රාග-මෝහ හැසිරීමද වේගවත් හැසිරීමකි. මෙහිදී ද්වේෂ සහගත වේගවත් හැසිරීම අදහස් වේ. **"අපපටි සංඛා"** යනු කරුණු සොයා නොබලාය. දැන් තමාගේ පැවිද්ද පිරිසිදු කරන සේක්- **"යතොහං ආවුසො"** යනාදිය දෙසූහ. එහිද - **"අඤ්ඤං සත්ථාරං උද්දිසිතුං"** යනු භාග්‍යවතුන් වහන්සේ හැර අන් අය මගේ ශාස්තෘ යැයි මෙසේ නියම කිරීමක් කළ බවක් නොදනමි යනුයි. **"සම්බාධො පරාවාසො"** යනාදියෙහි ඉදින් රියන් හැටක් උසැති ගෙයක යොදුන් සීයක් අතර අඹුසැමි දෙදෙනෙක් වාසය කරති. එනමුත් ඔවුන්ගේ කෙලෙස් හිරිහැර වශයෙන් ගිහිගෙයි වාසය හිරිහැරයක්මය. **"රජාපථො"** යනු රාගය නම් වූ ක්ලේෂයන්ගේ නැගී සිටීමට ස්ථානයකියි මහා අට්ඨකථාවේ කියන ලදී. **"ආගමන පථො"** යන පාඨයද සුදුසුය. නොඇලීම් අර්ථයෙන් අභ්‍යවකාශය මෙන් යනු **"අබ්භොකාසො"** නම් වේ. පැවිද්දෝ කූටාගාර, රන්මය ප්‍රසාද දිව්‍ය විමන්හි වසන ලද දොරකවුලු ඇතුව විසුවත් ඒවායෙහි නො ඇලෙත්මය. නො බැඳේමය. එනිසා **"අබ්භොකාසො පබ්බජ්ජා"** යනුවෙන් කියන ලදී. තවද **"සම්බාධො සරාවාසො"** යනු කුසල ක්‍රියාවන්ට අවසරයක් නොමැති බැවිනි. **"රජාපථො"** යනු නොවැසූ කුණුගොඩක් මෙන් කෙලෙස් දූලීන්ට එක්රැස්වන ස්ථානයක් වූ යනුයි. **"අබ්භොකාසො පබ්බජ්ජා"** යනු කුසල ක්‍රියාවන්ට සැප කැමති සේ අවසර ඇති බැවිනි. **"නයිදං සුකරං** -පෙ- **පබ්බජ්ජං"** යන මෙහි මේ සංක්ෂිප්ත විස්තරයයි. ඉදින් මේ ශික්ෂාත්‍රය බ්‍රහ්මචර්යාව එක්දිනක් නොකඩකර, අවසානයේ වූ සිතට පැමිණවිය යුතු බැවින් **"එකනත පරිපුණ්ණං"** එක් දිනක්වත් කෙලෙස් මලින් නොකිලිටි වී හැසිරිය යුතු බැවින්, අවසානයේ වූ සිතට පැමිණවිය යුතු බැවින්ය. **"එකනත පරිසුද්ධං සංඛලිඛිතං"** යනු ලියන ලද සකක් හා සමාන වූ යනුයි. පිරිසිදු වූ සකක් හා සමානව හැසිරිය යුතුයි. මෙය පහසු දෙයක් නොවේ. **"අගාරං අජ්ඣාවසතා"** ගිහිගෙහි වසන්නහු විසින්ය.

"එකනත පරිපුණ්ණං -පෙ- චරිතුං" "යනනු නාහං කෙසමසසුං ඔහාරෙත්වා" යනු කසට රසයෙන් කහවත් වූ යනුයි. "කාසායානි" යනු බඔසර හැසිරෙන්නවුන්ට යෝග්‍ය වූ යනුයි. "වත්ථානි අච්ඡාදෙත්වා" වස්ත්‍ර හැඳගෙනයි. "අගාරසමා" යනු ගිහිගෙයින් නික්මී යනුයි. "අනගාරියං පබ්බජෙය්‍යං". මෙහිද ගිහිගෙයි වසන්නවුන්ට හිතවූ කෘෂිකර්මාන්ත-වෙළඳාම් ආදිය "අගාරියං" යනුවෙන් ගිහිගෙට අයත් යැයි කියයි. මෙය පැවිද්දන්ට සුදුසු නැත. එනිසා පැවිද්ද "අනගාරික" යැයි කිවයුතුයි. ඒ අනගාරික වූ සසුනේ "පබ්බජෙය්‍යං" යනු පැවිදිවීමට පැමිණියේය. "පට පිලොතීනං" යනු සිදුණු රෙදිකඩවල්ය. රියන් දහතුනක් වූ අලුත් වස්ත්‍රයක් දහයකට සිදි අවස්ථාවේ සිට එයට "පිළොතිකා" යැයි කියයි. (රෙදිකඩ යන තේරුමයි) මෙසේ ඉතා වටිනා වස්ත්‍ර ඉරා, මසන ලද දෙපට සිවුර සඳහා "කඩ කපාගත් රෙද්දෙන් මැසූ සගල සිවුර"යැයි කියන ලදී. "අදධානමගග පටිපනෙනා" යනු අඩයොදුන් මග. දීර්ඝ මාවත. ඒ දිගුමගට පිළිපන්නේ යන අර්ථයි. මොහු පැවිදි වූ අයුරුත් දිගුමගට පැමිණි අයුරුත් වටහා ගැනීමට පළමු අභිනීහාර අවස්ථාවේ සිට මේ පිළිවෙල කථාව දතයුතු වේ.

අතීතයේ කල්ප ලක්ෂ ගණනකට පෙර පදුමුත්තරනම් බුදුරජාණන් වහන්සේ ලොව පහළවූ සේක. ඒ හංසවතී නුවර ඇසුරුකර ක්ෂේම භූමියක් වූ මිගදායෙහි වැඩවාසය කරන කාලයෙහි වේදේහ නම් අසූ කෙළක් ධනය ඇති සිටුපුතෙක් උදෑසනම රසවත් භෝජන වළඳා, පෝය අටසිල් සමාදන්ව, ගඳමල් ආදිය ගෙන විහාරයට ගොස් බුදුන්ට පුදා වැඳ එකත්පසෙක සිටියේය. එකෙණෙහි ශාස්තෘන් වහන්සේගේ තෙවැනි ශ්‍රාවක වූ මහා නිසඟ නම් තෙරුන් වහන්සේ "මහණෙනි! මගේ ශ්‍රාවක භික්ෂූන්ගෙන් ධුතාංගධාරී භික්ෂූන්ගේ අග්‍රස්ථයට නිසඟ තෙරහු පත්කරමී"යි අගතනතුරෙහි තැබූ සේක. මෙය දුටු උපාසකතුමා බෙහෙවින් ප්‍රසන්නව ධර්මකථාව අවසන, මහජනයා නැගිට ගිය කල්හි බුදුරජාණන් වහන්සේට වැඳ, "ස්වාමීනි! හෙට මගේ දානය ඉවසා වදාරන මැනවි"යි ආරාධනා කළේය. බුදුපියාණෙනි, "උපාසකය! භික්ෂු සංඝයා ඉතා විශාලය"යි වදාළහ. එවිට උපාසකයා "ස්වාමීනි! බුදුරජාණන් වහන්ස! කොපමණ ප්‍රමාණයක් වේද?"යි විමසීය. "භික්ෂූහු හැටඅට ලක්ෂයක් පමණ වැඩවෙසෙති." "ස්වාමීනි! එක් සාමණේර නමක්වත් විහාරයේ ඉතිරි නොකර දානය සඳහා වැඩමවන්න"යි නැවතද ආරාධනා කළේය. බුදුහු එය ඉවසූ බැව් දැන තම ගෙදරට ගොස් මහාදානයක් පිළියෙල කරවා, දෙවැනි දින

බුදුරදුන්ට කාලය දන්වීය. බුදුපියාණන් වහන්සේ පාසිවුරු ගෙන, මහා භික්ෂු සංඝයා විසින් පිරිවරන ලදුව, උපාසකයාගේ නිවසෙහි පැනවූ අසුන්වල වැඩසිටියහ. පරිභෝගය සඳහා දියවත් කිරීම අවසන් වූ කල්හි, කැඳබත් ආදිය පිළිගනුවනුයේ වැළඳවීම කළේය. උපාසකයා ද බුදුපියාණන් සමීපයේ ම හුන්නේය.

මේ අතර මහා නිසඟ තෙරහු පිඬු පිණිස හැසිරෙන සේක්, ඒ වීථියටම වැඩිසේක. උන්වහන්සේ දුටු උපාසකයා නැගිට ගොස් තෙරුන්ට වැඳ, "ස්වාමීනි! අපට පාත්‍රය දෙනු මැනවි"යි කීවේය. තෙරණුවෝ පාත්‍රය දුන්හ. "ස්වාමීනි! මෙහි පිවිසෙන සේක්වා. ශාස්තෘන් වහන්සේ ද මෙහි වැඩ වෙසෙති"යි උපාසකයා පැවසූ කල්හි, "උපාසකය!, එය සුදුසු නොවේ" යැයි තෙරුන්වහන්සේ පැවසූහ. උපාසකයා තෙරුන්ගේ පාත්‍රය පුරවා බැහැරට ගෙනවුත් තෙරුන්ටම පිළිගැන්වීය. නැවත තෙරුන් අනුවම පසුගමන් කර නැවතුණි. නැවතත් බුදුපියාණන් වහන්සේ වෙත ගොස්, "ස්වාමීනි! මහා නිසඟ තෙරණුවෝ, "ශාස්තෘන් වහන්සේ ගෙයි වැඩ සිටිති"යි මා පැවසූ කල්හි, ඇතුලට පිවිසීමට අකමැති වූහ. උන්වහන්සේට ඉතා වැඩි ගුණයක් පවතින්නේ ද?"යි ප්‍රශ්න කළේය. බුදුවරු නම් ගුණයන්ගේ මසුරුකම් කරන්නෝ නොවෙති. අනුන් ගුණ නොමකති. බුදුපියාණන් වහන්සේ "උපාසකය! අපි භික්ෂාවේ පැමිණීම බලමින් ගෙයි වෙසෙමු. ඒ නිසඟ තෙරහු එසේ නොසිට, භික්ෂාව සොයා ගනියි. අපි ගම් සෙනසුන්හි වසමු. උන්වහන්සේ ආරණ්‍යයෙහිම වෙසෙති. අපි ආවරණය වූ ස්ථානයක ම වසමු. උන්වහන්සේ එළිමහනෙහිම වෙසෙති. මෙලෙස උන්වහන්සේගේ ගුණ ඉතා විශාලය"යැයි ගුණ සමූහය මහමුහුද පුරවන්නාක් මෙන් වදාළහ.

ස්වභාවයෙන් දූල්වුණු පහණට තෙල් දැමුවාක් වැනි මේ දේශනාව ඇසූ උපාසකයා ද බෙහෙවින් ප්‍රසන්න වූයේ "මට වෙනත් සැපතකින් කවර ප්‍රයෝජනයක් ද? අනාගතයේ එක් බුදුරජාණන් වහන්සේගේ සසුනෙහි ධුතාංගධාරීන් අතරින් අග තනතුර සඳහා ප්‍රාර්ථනා කරන්නෙමි"යි සිතා නැවතද බුදුරදුන්ට ආරාධන කොට සත්දිනක් ම මහදන් පැවැත්වීය. අවසන් දින හැටඅට ලක්ෂයක් භික්ෂූන්ට තුන්සිවුරු පූජාවක් ද පවත්වා, බුදුපියාණන්ට වැඳ, "ස්වාමීනි! මවිසින් සත්දිනක් මහදන් පැවැත්වූයේ මෙත් සහගත වූය කාය-වාග්-මනෝ කර්ම ඇතිවමය. මේ උතුම් මහා පින්කමෙන් මම දිව්‍ය, ශක්‍ර, බ්‍රහ්මාදී සැපතක් නොපතමි.

මේ උතුම් පුණ්‍යමහිමයේ බලයෙන්, අනාගත බුදුවරයන් වහන්සේ නමකගේ සසුනෙහි නිසහ තෙරුන් මෙන් තෙලෙස් ධුතාංගධාරීන් අතර අගතනතුරට පත්වේවා!යි ප්‍රාර්ථනා කළේය.

බුදුරජාණනන් වහන්සේද මොහු විසින් මහත් වූ තනතුරක් ප්‍රාර්ථනා කරන ලදී. එය ඉටුවේද? නොවන්නේද? විමසා බලන සේක්, එය ඉටුවන බව දුටුසේක. "නුඹ විසින් ඉතා ප්‍රිය වූ තනතුරක් පතන ලදී. අනාගතයේ කල්ප ලක්ෂයක් ඉක්ම ගියකල්හි, ගෞතම නම් වූ සම්මා සම්බුදුරාණන් වහන්සේ ලොව පහළවෙති. නුඹ වහන්සේගේ තෙවැනි ශ්‍රාවකයා වූ මහා කාශ්‍යප තෙරුන් නමින් ප්‍රකට වන්නේය" යනුවෙන් පැවසූ බුදුවදන් ඇසූ උපාසකයා, "බුදුවරු ලඟ කථා දෙකක් නම් නැත"යි සිතා දෙවැනි දින සිටම එම තනතුර ලැබුවාක් මෙන් ප්‍රීති වූයේය. ඔහු ආයු කෙළවර දක්වා සීලාදිය රක්ෂාකොට, කළුරිය කිරීමෙන් පසු දෙව්ලොව උපන්නේය.

එතැන් සිට දිව්‍ය, මනුෂ්‍ය සැපසම්පත් විඳිමින් සසර සැරිසරන කල්හි, මින් කල්ප අනූඑකකට පෙර පහළවූ විපස්සී සම්මා සම්බුදුපියාණන් වහන්සේ බන්ධුමතී නුවර නිසා ක්ෂේමභූමියක් වූ මිගදායෙහි වැඩවසන සමයෙහි දෙව්ලොවින් චුතව එක් දුක්පත් බමුණු ගෙදරක උපන්නේය. එසමයෙහි බුදුපියාණන් වහන්සේ සත්වැනි වසරෙහි ධර්මදේශනා කරන සේක් මහාකෝළාහලයක් ඇතිවිය. දෙවියෝ මුළු දඹදිවට ම "ශාස්තෘන් වහන්සේ ධර්මදේශනා කරන සේක"යි දැනුම් දෙති. මේ දුක්පත් බමුණාද එපුවත අසා බණ ඇසීමට යාමට කැමති විය. නමුත් ඔහුට හා බැමිණියට හැඳගෙන පිටතට යා හැකි එකම සලුවක් පමණක් ඇත. පොරවාගෙන යැමටද ඇත්තේ එකම සලුවකි. එනිසා මුලුනුවර මොහු "ඒකසාටක බමුණා" යැයි ප්‍රසිද්ධ විය. බමුණන්ගේ කිසියම් රැස්වීමක්-උත්සවයක් වේනම් බැමිණිය ගෙදර නවතා බමුණා පමණක් ඒ සඳහා යයි. බැමිණියන්ගේ එක්වීමක්-උත්සවයක් ඇතිවූ කල්හි බමුණා ගෙදර නැවතී බැමිණිය පමණක් යයි. මෙදින බණ ඇසීමට යාමට රිසි වූ බමුණා, "පින්වතිය! කිම නුඹ රාත්‍රී බණ ඇසීමට යන්නීද? නැතිනම් දහවල් බණ ඇසීමට යන්නීද?"යි බැමිණියගෙන් විමසුවේය. "අපි ස්ත්‍රීහුය. එනිසා රෑ බණ ඇසීමට යා නොහැක. දවල් ම බණ ඇසීමට යමි"යි බැමිණිය කීවාය. ඇය බමුණා ගෙදර නවතා වස්ත්‍රය හැඳ-පොරවා ගෙන දහවල් බණ ඇසීමට උපාසිකාවන් සමග ගොස් එකත්පසෙක සිට බණ අසා උපාසිකාවන් සමග ම පැමිණියාය.

ඉන්පසු බමුණාද බැමිණිය ගෙදර නවතා, වස්ත්‍රය හැඳ පොරවාගෙන විහාරයට ගියේය. එවිට බුදුපියාණන් වහන්සේ පිරිස් මැද අලංකාර වූ ධර්මාසනයක හිඳ, විසිතුරු විජිනිපතක් ගෙන; අහස්ගඟට බස්වන්නාක් මෙන් ද මහමෙර මතට නැගී සාගරය මඩින්නාක් මෙන් ද ධර්මකථාව පවත්වන සේක. පිරිස් කෙළවර හිඳ බණ අසන්නා වූ බමුණාට රාත්‍රී ප්‍රථම යාමයේදී මුළු සිරුරම පිනායමින් පස්වණක් ප්‍රීතිය පහළවිය. ඔහු පොරවාගෙන සිටි වස්ත්‍ර රැගෙන "මෙය බුදුන්ට පූදමි"යි සිතීය. එවිට ඔහුට ආදීනව දහසක් දක්වමින් මසුරුකම පහළවිය. "බැමිණියටත් මටත් ඇත්තේ එකම වස්ත්‍රයකි. අනික් කිසිම පොරවාගෙන යෑමට වස්ත්‍රයක් නැත. මෙය නොමැතිව ගෙයින් පිටව යා නොහැක." මෙලෙස කල්පනා වූ වහාම දීමේ කැමැත්ත ඉවත් විය.

ඔහුට ප්‍රථම යාමය ඉක්මගිය කල්හි මධ්‍යම යාමයෙහිදී ද එවැනිම වූ මහා ප්‍රීතියක් ඇතිවිය. පෙරසේම වස්ත්‍රය පූජාකිරීමේ සිත ඇතිවුවත් නැවතත් පෙරසේම මසුරුකම මතුවිය. මෙලෙස ධර්මශ්‍රවණය කරන ඔහුට පශ්චිම යාමයේදී ද මහත් වූ පස්වණක් ප්‍රීතියක් ඇතිවිය. ඔහු වහා නැගිට "එතෙරවීම හෝ මරණය හෝ වේවා! එය පසුව දැනගනිමි"යි වස්ත්‍රය රැගෙන වහා ගොස් බුදුපියාණන් වහන්සේ පාමුල තැබුවේය. ඉන්පසු වම්අත හකුලා දකුණු අතින් තෙවරක් අත්පොලසන් දී "මම දිනුවා"යි තෙවරක් ම මහහඬින් කෑගැසිය.

මේ වෙලාවෙහි බන්ධුම රජු ධර්මාසනයට පසුපසින් තිරයෙන් පිටුපස හිඳ බණ අසයි. රජතුමාට නම් "මම දිනුවා" යන අනුන්ගේ වදන් අප්‍රියම වේ. ඔහු පුරුෂයෙක් යවා, "යව! කුමක් නිසා මෙසේ ප්‍රීතිවෙත්දැයි මොහුගෙන් අසා දැනගෙන එව"යි කීවේය. ඔහු බමුණා ලඟට ගොස් ප්‍රීතිවීමට හේතු විචාළේය. "වෙනත් පුද්ගලයෝ ඇත් යානාදියකට නැගී කඩු හා පලිහ ආදිය ගෙන සතුරුසේනා ජයගනිති. එය ආශ්චර්යයක් නොවේ. මගේ පසුපසින් දිවඑන්නා වූ කුළු ගොනෙකුට මුගුරකින් පහරදී, හිස බිඳ ඌ පලවා හරින්නාක් මෙන් මසුරු සිත මැඩ පවත්වා පෙරවූ එකම වස්ත්‍රය බුදුරදුන්ට පිදුවෙමි. මම ඒ මසුරු සිත ජයගත්තෙමි"යි බමුණා කීවේය.

රාජ පුරුෂයා මේ පුවත රජුට දැන්වීය. රජතුමා "කොළ! අප දසබලයන් වහන්සේට සුදුසු වූ දෙය නොදනිමු. බමුණාම එය දනියි" පවසා ඔහු වෙත අගනා වස්ත්‍ර යුගලයක් යැවීය. බමුණා එය දැක මෙසේ

සිතීය. "පෙර නිශ්ශබ්දව සිටි මාහට කිසිවක් නුදුන් මොහු දැන් බුදුගුණ පවසත්දී මාහැඟි වස්ත්‍ර යුගලයක් දෙයි. බුදුගුණ නිසා උපන් මේ පරිත්‍යාගයෙන් මට කවර ප්‍රයෝජනයක්ද?"යි පවසා එම වස්ත්‍ර යුගලයද බුදුරදුන්ටම පිදුවේය. රජු බමුණා කල ක්‍රියාව දැන නැවතත් වස්ත්‍ර යුගලක් එවීය. ඔහු එයද බුදුරදුන්ටම පිදුවේය. රජු මෙලෙස තවත් වස්ත්‍ර යුගලක් වශයෙන් වස්ත්‍ර දෙතිස් යුගලක් බමුණා වෙත එවීය.

එවිට බමුණා මෙය වඩ වඩා ගැනීමක් වන්නේ යැයි සිතා තමාටත්, බැමිණියටත් ප්‍රමාණවත් වූ වස්ත්‍ර දෙකක් ගෙන ඉතිරි යුගල තිහම බුදුරදුන්ට පිදුවේය. එතැන් පටන් ශාස්තෘන් වහන්සේ ඉතා විශ්වාස අයෙකු විය. රජු, එක් සිත කාලයක බුදුරදුන් සමීපයේ හිඳිමින් බණ අසන ඔහු දැක ලක්ෂයක් අගනා තමා පොරවාගෙන සිටි රතු කම්බිලිය දී, "මෙතැන් පටන් මෙය පොරවාගෙන බණ අසව"යි කීවේය. බමුණා "මේ කුණු ශරීරය, මේ උතුම් වූ කම්බලියෙන් වැසීමෙන් කවර ප්‍රයෝජනයක්ද?" යි සිතා තථාගතයන් වහන්සේගේ ගඳකිළිය ඇතුලෙහි ඇඳමත්තෙහි වියනක් කොට බැඳ පූජා කළේය.

දිනක් රජු උදෑසන ම විහාරයට පැමිණ, ගඳකිළියට පිවිස බුදුරජාණන් වහන්සේ සමීපයේ ම හිඳ පිළිසඳර කථාවෙහි නියුතු විය. මේ වේලාවෙහි සවණක් ගණ බුදුරැස් මාලාවෝ විහිද ගොස් කම්බිලියෙහි වදී. කම්බිලිය අතිශයින් බබලයි. රජු උඩ බලා කම්බිලිය හඳුනාගෙන, " ස්වාමීනි! මගේ මේ කම්බිලිය මම සාටක බමුණාට දුන්නෙමි"යි කීවේය. "මහරජ! නුඹ විසින් බමුණා පිදුවේය. බමුණා විසින් මා පුදන ලදී"යි බුදුපියාණෝ දේශනා කළ සේක. රජතුමා "බමුණා විසින් ඉතා සුදුසු වූවක්ම කරන ලදී. අප මෙන් නොවේ"යැයි පැහැදී මිනිසුන්ට උපකාර වන වස්තු සියල්ල, අට,අට බැගින් වනසේ "සඞ්ඝට්ඨක" නම් වූ මහාදානයක් බමුණාට පවත්වා, ඔහු පුරෝහිත තනතුරෙහි තැබුවේය. බමුණාද අට්ඨ අට්ඨක නම් හැටඅටක්ම වේයැයි සළාක බත් හැටඅටක් පිහිටුවා නිති දන්දෙමින් සිල් රැක ආයු කෙළවර ඉන් චුතව දෙව්ලොව උපන්නේය.

නැවත ඉන් චුතව මේ මහා භද්‍ර කල්පයේ කෝණාගමන හා කාශ්‍යප යන බුදුවරයන් වහන්සේලාගේ කාලය අතර බරණැස සිටුගෙයක උපන්නේය. වැඩිවිය පැමිණ ගිහිගෙයි වසන ඔහු දිනක් දිවා සුඛවිහරණය සඳහා කැළයේ සක්මන් කරන අවස්ථාවෙහි පසේ බුදුවරයන් වහන්සේ නමක් නදීතෙර හිඳ සිවුරක් මසනු දුටුවේය. පසුපසින් එන සුලඟ නිසා

එය මැසීමට නොහැකිව හැකිලීමට සැරසෙනු දුටු සිටුතුමා, "ස්වාමීනි! කවර හෙයින් හකුළා තබන්නේද?"යි විමසූ විට "පසුපසින් එන සුලඟ නිසා සිවුර මැසීම අපහසුයැ"යි පැවසූ සේක. එවිට සිටුතුමා "මෙයින් හොඳ සිවුරක් මසාගන්නා සේක්වා!"යි වටිනා වස්ත්‍රයක් පූජාකර "මාහට උපනුපන් ආත්ම භාවයන්හි කිසිදු පිරිහීමක් නොවේවා!"යි පැතුවේය.

දිනක් ඔහු ගෙදර සිටිනවිටදී තම නැගණිය හා බිරිඳ කලහ කරමින් සිටි අවස්ථාවක පසේබුදුපියාණන් වහන්සේ පිඬුසිඟා වැඩි සේක. උන්වහන්සේගේ පාත්‍රය ගත් නැගණිය එය ආහාරවලින් පුරවා පූජාකොට, ඔහුගේ භාර්යාව නිසා "මෙබඳු බාලයන්ගේ ඇසුර යොදුන් සීයකින් දුරු කෙරේවා!"යි ප්‍රාර්ථනා කළාය.

ඔහුගේ භාර්යාව, ඇගේ ප්‍රාර්ථනාව අසා වහා දිවඅවුත්, පාත්‍රය නැවත ගෙන "මෙය නොවළඳන සේක්වා!"යි කියා ආහාර ඉවතලා, පාත්‍රයෙහි මඩ පුරවා දුන්නාය. නැගණිය එය දැක, "එම්බා මෝඩ ස්ත්‍රිය! මා හට අක්‍රෝශ කරව. පහර දෙව. මෙසේ දෙයාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පුරා පුරන ලද පාරමීදම් ඇත්තහුගේ පාත්‍රයෙන් බත් ඉවතලා මඩ පුරවා දිම නම් සුදුසු නොවේ"යැයි කීවාය. එවිට ඔහුගේ බිරියට නුවණැස පහළ විය. ඇය "ස්වාමීනි! මදක් සිටින්න"යි පවසා මඩ ඉවතලා, පාත්‍රය සෝදා, සුවඳ කුඩු තවරා, සුවඳදුම් දී, ප්‍රණීත චතුමධුරයන්ගෙන් එය පුරවා, ඒ මත පියුම්ගැබක වර්ණය ඇති ගිතෙල් වත්කර සැදැහැයෙන් පූජා කරන්නී, පාත්‍රය බුදුරදුන්ගේ හස්තයෙහි තබා "මේ පිණ්ඩපාත ආහාරයේ යම් ආලෝකයක්-ප්‍රභාවක් වේද එබඳු වූම ප්‍රභාවක් මාගේ ශරීරයේද වේවා!"යි පැතුවාය. පසේබුදුරජානෝ පින් අනුමෝදන් කළ සේක් අහසට පැන නැඟී වැඩි සේක.

ඒ අඹුසැමි දෙදෙන ආයු ඇති තෙක් කුසල් දහම් සිදුකර - දෙව්ලොව ඉපිද නැවත ඉන් චුත වූවාහු දෙදෙන ම අසූකෙලක් ධන ඇති බරණැස් සිටු පවුල් දෙකක උපන්හ. වැඩිවිය පැමිණි ඔවුහු දෙදෙන ම මාපිය අනුමැතියෙන් විවාහ විය. ස්ත්‍රියගේ පෙර භවයේ කළ පාපකර්මය මතුවෙමින්, පතිකුලයට පිවිසි කෙණෙහිම ස්වාමියාගේ ගෙදර එළිපත්තෙහි සිට මුලු ගෙදරම විවෘත කළ වැසිකිළිවලක් මෙන් දුගඳින් පිරී ගියේය. "මේ කාගේ ගඳක්ද?"යි අසා "සිටුදුවගේ ගඳකි"යි යන පිළිතුරින් කිපී "වහා මැය ඉවත් කරවු. දුරුකරවු"යි පැවසුවේය. මෙනිසා ඇය විවාහ වී පැමිණි දිනම තම නිවසට යෑමට සිදුවිය.

මෙලෙස සත්වරක් ම ඇය සැමියන් විසින් පිටමං කරන ලද්දී "මම සත් තැනකින්ම පිටමං කරන ලද්දිය. මගේ දිවියෙන් ඇති ප්‍රයෝජනය කුමක්ද?"යි ආභරණ සියල්ල එක්රැස් කර, රියනක් දික්වූ රියනක් පළල වූ සතර අඟලක් උස්වූ රන් ගඩොලක් කරවූවාය. පසුව එම ගඩොලද රත්සිරියල් පිඬක් ද උපුල්මල් මිටි අටක්ද ගත් අත් ඇත්තී කසුප් බුදුරදුන්ගේ චෛත්‍ය කරන තැනට පිවිසියාය. එකෙණෙහි එක් ගඩොල් පේලියක් වටකරගෙන එන වඩුවානන්ට එම පේලියෙහි කළයක් පමණ ප්‍රමාණයක අඩුවක් විය. වහා සිටුදුව ඉදිරිපත්ව වඩුවාට මෙසේ කීවාය. "මේ ගඩොල මෙතැන තබන්න" යනුවෙනි. සතුටට පත් වඩුවා "එසේය! නැගණියනි. නුඹ නියම වේලාවට පැමිණියෙහිය. නුඹම ඔය රන්ගඩොල තබව"යි කීවේය. ඇය එතැනට නැගී තෙලින් රත්සිරියල් කුඩු කලවම් කර යෙදූ බදාමයෙන් ගඩොල එම හිස්තැනෙහි තබා ඒ මත උපුල්මල් මිටි අට පූජාකර වැඳගෙන "උපනුපන් ආත්මභාවයෙහි මගේ කයින් සඳුන් සුවඳද මුවින් උපුල්මල් සුවඳ ද හමත්වා!"යි පැතුවාය. එසේ පතා සෑය වැඳ-පැදකුණු කර නිවසට ම ගියාය.

මේ උතුම් පින්කම කළ කෙණෙහි ම සිටු පුතණුවන්ට තමා සමග විවාහ වී සිටි මැය පිළිබඳව සිහිපත් විය. නගරයේ ද මෙවේලෙහිම නැකැත් කෙළියට දැනුම්දීමක් විය. ඔහු සේවකයන් කැඳවා "මෙහි රැගෙන ආ සිටුදුව වසන්නී කොතැනද?"යි ඇසුවේය. "ස්වාමිපුත්‍රය! ඇය තම නිවසෙහි වසන්නීය"යැයි පැවසූ විට, සිටුපුතා "වහා ඇය කැඳවන්න. ඇයත් සමග නැකැත් ක්‍රීඩා කරන්නෙමු"යි පැවසීය. සේවකයෝ ගොස් සිටුදුවට වැඳ සිටිකල්හි "දරුවනි! කුමක් නිසා පැමිණියේද?" ඇසුවාය. සිටුපුතාගේ කැඳවීම ඇයට දැනුම් දුන් කල්හි, "දරුවනි, මවිසින් සියළු ආභරණ සෑයට පුදන ලදී. මාහට ආභරණ නැත"යි පැවසුවාය. ඇයගේ ප්‍රකාශය සිටුපුතාට දැනුම් දුන් කල්හි, "ඇය කැඳවාගෙන එවු. ආභරණ දෙන්නෙමි"යි පැවසීය. සේවකකාරකාදීහු වහා ගොස් ඇය නැවතත් කැඳවාගෙන ආහ. ඇය එම සිටුගෙදරට පිවිසි කල්හිම මුළු ගෙයම සඳුන් සුවඳින් ද නිලුපුල් සුවඳින් ද පිරී ගියේය. සිටුපුතා "පෙරදී නුඹගේ සිරුරින් මහා දුගඳක් හැමීය. දැන් නුඹගේ සිරුරින් සඳුන් සුවඳ හමයි. මුවින් උපුල්මල් සුවඳ හමයි. මෙයට කරුණු කිමිද?"යි ඇගෙන් ඇසුවේය. ඇය මුල සිට ම තමා කළ ක්‍රියාව සිටුපුතාට කීවාය. සිටුපුතා "මෙබඳු වූ බුදුසසුන ඒකාන්තයෙන් සසරින් නික්මීම සලසා දෙන්නකි"යි පැහැදී යොදුනක් වූ රන්සෑය කම්බිලි සැට්ටයකින් වටකර ඒ ඒ තැන රිය සකක්

පමණ රන් පියුම්වලින් අලංකාර කළේය. එම පියුම්වලින් දොළොසක් අත් එල්බෙයි.

ඔහු මෙසේ පින්දහම් කර, ආයු පමණින් පරලොව ගොස් ඉන් චුතවී බරණැස් නුවරින් යොදුනක් පමණ තැන්හි ඇමති පවුලක උපන්නේය. සිටුදුව දෙව්ලොවින් චුතවූවා එතුවරම රජගෙදර වැඩිමහල් දියණිය ලෙස උපන්නීය. ඔවුහු වැඩිවියට පත් කල්හි කුමරා වසන ගමෙහි නැකැත් කෙළියට කල් දුන්වීය. ඔහු තම මවු වෙත ගොස් "අම්මේ! මට සලුවක් දෙන්න. නැකැත් ක්‍රීඩාවෙහි යෙදෙන්නෙමි"යි කීවේය. මව පිරිසිදු වස්ත්‍රයක් දුන්නීය. "අම්මේ! මෙය ගොරෝසු සලුවකි"යි පුතු කීවේය. මව තව වස්ත්‍රයක් දුන්නීය. එයද ප්‍රතික්ෂේප විය. තව සිනිදුම වස්ත්‍රයක් දුන් විටද එයද ප්‍රතික්ෂේප විය. මෙවිට මව "දරුව! යම්ගෙයක මා උපන්නී නම් එහි මීට වඩා සිනිඳු වස්ත්‍රයක් ලැබීමට මා පින්කර නැත"යි කීවාය. මවගේ වදන් ඇසූ පුතු, "අම්මේ! එබඳු වස්තු ලබන තැනකට යෙමි"යි කියූවිට මෑණියෝ "පුත! නුඹට අද ම බරණැස් නුවර රජකම ලැබෙවා'යි මම පතන්නෙමි"යි කීවාය. ඔහු සතුටු සිතින් මවුට වැඳ "මෑණියනි! යමි"යි කියා "පුත! යන්න"යි අවසරය ලබාගෙන, ගෙදරින් පිටවිය. ඔහු "යන්නේ කොතැනද? එහෙ මෙහෙ යමිද? ගෙදර සිටිමිද?" ආදී ලෙස විතර්ක කරනුයේ පූර්වකෘත පුණ්‍යබලයේ මෙහෙයවීමෙන් බරණැසටම පැමිණවූයේය. බරණැස් නුවරට ගොස් මඟුල් උයනට පිවිස රාජකීය ගල්තලාවෙහි හිස පටන් පොරවාගෙන නිදාගත්තේය. එදින බරණැස් රජු කළුරිය කිරීමෙන් උදාවූ සත්වැනි දිනයයි. ඇමතිවරු රජුගේ ශරීරය ආදාහනය කර - සියලු කටයුතු නිමවා; හිඳ සාකච්ඡා කළහ. "රජුට එක් දුවක්ම සිටී. පුත්තු නැත. රජකු නැති රාජ්‍යය නොපවතී. රජවන්නේ කවුද?" "කිම නුඹද?" "කිම නුඹද?" යනුවෙන් කථාකරන්නා වූ ඇමතිවරුන්ට පෙරවි බමුණා මෙසේ කීවේය. "බොහෝකොට විමසීමෙන් ප්‍රයෝජනයක් නැත. රාජ රථය පිටත්කර හරිමු"යි යනුවෙනි. සියලු දෙන සුදු සෙන්ඩව අසුන් යෙදූ පංචවිධ කකුධ භාණ්ඩ-සේසත් ආදියෙන් අලංකෘත රථය සරසා එය තනිවම පිටත්කර හැර, පසුපසින් සංගීත තූර්යභාණ්ඩ ඔසවාගෙන ගියහ. රථය නැගෙනහිර දොරටුවෙන් පිටත්ව උයන දෙසට හැරුණේය. සෙසු ඇමතිවරු "රථය පුරුදු පරිදිම උයනට යන්නේය. එනිසා එය නවත්වමු"යි කීහ. නමුත් පුරෝහිතයා "නවත්වන්න එපා!"යි කීවේය. රථය උයනට පිවිස කුමරු වටා පැදකුණු කර, ඔහු නංවාගැනීමට සූදානම්ව මෙන් සිටියේය. එතැනට පිවිසි

පුරෝහිතතුමා කුමරුගේ පොරවාගෙන සිටි පොරෝනාව ඔසවා, පාතලය බලා, "නවතින්න. මේ දිවයිනද දෙදහසක් දිවයින් පිරිවර කරගත් සතරමහා ද්වීපයටම එකම රජුවීමට මොහු සුදුසුයැ"යි ප්‍රීතියෙන් පවසා, "වහා නැවත තූර්ය භාණ්ඩ නාදකරවු" "නැවත ද නාද කරවු"යි කියා තෙවරක් ම තූර්යනාද පැවැත්වීය.

එවිට කුමරු මුව විවෘත කර බලනුයේ "කුමක් නිසා මෙහි ආවේද?"යි පිරිසගෙන් ඇසීය. "දේවයන් වහන්ස! නුඹට රාජ්‍ය පැමිණියේය." පිරිස කී බස් අසා "නුඹලාගේ රජු කොහි ගියේද?"යි විමසීය. "ස්වාමීනි! දෙව්ලොව ගියේය. "අදට කෙතෙක් දවස් ඉක්ම ගියේද?" "ස්වාමීනි! අද සත්වැනි දවස වේ." "රජුට පුතෙක් හෝ දුවෙක් හෝ නොසිටියේද?" "දේවයන් වහන්ස! දුවක් පමණක් ඇත. පුතෙකු නැත"යි කී බස් පිළිගෙන "එසේනම් රාජ්‍යය කරමි"යි පැවසුවේය.

ඔවුහු එකෙණෙහි ම අභිෂේක මංගල්‍යයක් කරවා, රජදුව සර්ව ආභරණයන්ගෙන් සරසා ගෙනවුත් පාවාදී කුමරු අභිෂේක කළහ. කරන ලද අභිෂේක ඇති ඔහුට ලක්ෂයක් අගනා වස්ත්‍ර එළවූහ. ඔහු "දරුව! මේ මොනවාද?"යි ඇසීය. "දේවයන් වහන්ස! හඳින වස්ත්‍රයන්ය." එවිට රජතුමා "දරුව! මේවා අතිශයින් රළු වේ."යැයි පැවසූ විට "දේවයන් වහන්ස! මිනිසුන් පරිභෝග කරන වස්ත්‍ර අතර මීට වඩා සිනිඳු වස්ත්‍ර නොමැත"යි සේවකයා කීවේය. "නුඹලාගේ රජතුමා පෙරවූයේ මෙබඳු වස්ත්‍රද?" "එසේය ස්වාමීනි!" "නුඹලාගේ රජතුමා පින්වතෙකියි නොසිතමි. රන් කෙණ්ඩියක් ගෙනෙවු. වස්ත්‍ර ලබන්නෙමි"යි කියූ රජතුමා රන් කෙන්ඩියක් ගෙනැවිත් දුන් කල්හි, එය රැගෙන නැගිට මුව සහ අත්සෝදා පවිත්‍රව, අතින් දියගෙන පෙරදිග දිශාවට ඉස්සේය. එවිට ඝන මහපොළව බිඳගෙන කල්ප වෘක්ෂ අටක් පැන නැංගේය. නැවත දියගෙන දකුණට, බටහිරට, උතුරට යන දිවුදිශාවන්ටම ඉසින ලදී. සියලු දිශාවන්හි අට, අට බැගින් කල්ප වෘක්ෂයෝ දෙතිසක් පහළ වූහ. රජු එක් දිව්‍ය වස්ත්‍රයක් හැඳ, එකක් පොරවාගෙන; "නන්ද රජුගේ විජිතයේ නූල් කටින ස්ත්‍රීහු නොසිටිත්වා!"යි අණබෙර හසුරුවන දැනුම් දෙවා, සේසත් නංවා අලංකාරව සැරසූ ඇතෙකු පිට නැගී නුවරට පිවිස රජ මාලිගාවට පිවිස මහත් රජසිරි විඳ්දේය.

මෙසේ කල්ගතවන විට රජදේව්‍ය, රජුගේ සම්පත් ශ්‍රී විභූතිය දැක "අනේ! තපස්වී කෙනෙකැ"යි කරුණා ඇතිබවක් දක්වූවාය. "දේවිණි!

මේ කිමෙක්ද?"යි ඇසූවිට "දේවයන් වහන්ස! නුඹවහන්සේගේ සම්පත් ඉතා මහත්ය. අතීතයේදී බුදුවරුනට සිත් පහදවා උතුම් පින්කම් නොකළාහුද? දැන් අනාගතය සඳහා පින්දහම් නොකරන්නෙහිද?"යි කීවාය. එබස් ඇසූ රජු "කාහට දෙමුද? සිල්වතෙක් නැත." "දේවයන් වහන්ස! මේ ජම්බුද්වීපය රහතුන්ගෙන් ශූන්ය නොවේ. එනිසා නුඹවහන්සේ දානය පිළියෙල කරන්න. මම රහතුන්ට ආරාධනා කරමි"යි දේවිය කීවාය. රජු දෙවැනි දින නැගෙනහිර දොර සම්පයේ දන්හලෙහි දානය පිළියෙල කරවීය. දේවිය උදේම නැගිට අටසිල් සමාදන්ව, ප්‍රසාද මතුයෙහි හිඳ-පෙරදිග බලාගෙන වැඳහෙව "ඉදින් මේ දිශාවෙහි රහතන් වහන්සේලා වෙත් නම් අපගේ භික්ෂාව පිළිගැනීමට වඩිත්වා!"යි කීවාය. එම දෙස රහතන් වහන්සේලා නොම වූහ. පිළියෙල කළ දානය දුගී මගී යාචකාදීන්ට පිරිනැමූහ. දෙවන දින දකුණු ද්වාරයේ එලෙසම දානය පිළියෙල කරවා ආරාධනා කළාය. තෙවන දින බටහිර දෙස ද සිවුවන දින උතුරු දෙසද ඒ ලෙසින්ම දන් පිළියෙල කරවා ආරාධනා කළාය. සිවුවැනි දින දේවිය ආරාධනා කළ කල්හි හිමවත වාසය කළ, පදුමවතියගේ පුතුන් වූ පන්සියක් පසේ බුදුවරුන්ගෙන් ප්‍රධාන වූ මහාපදුම පසේ බුදුපියාණෝ, තම සෝයුරු පසේ බුදුවරු ඇමතූහ. "නිදුකාණනි! නන්ද රජු නුඹවහන්සේලාට දන් පිණිස ආරාධනා කරයි. එම ඇරයුම පිළිගන්නා සේක්වා!" යනුවෙනි. උන්වහන්සේලා එම ඇරයුම පිළිගෙන, එදින අනෝතප්ත විලින් මුව සෝදාගෙන, අහසින් අවුත් උතුරු ද්වාරයෙහි බැස දන්හලෙහි වැඩසිටියහ. මිනිස්සු පැමිණ "දේවයන් වහන්ස! පන්සීයක් පසේබුදුවරු වැඩිසේක"යි රජුට දැන්වූහ.

රජු, දේවිය සමග ගොස් වැඳ පාත්‍රාගෙන පසේ බුදුවරු ප්‍රාසාදයට වැඩම කරවාගෙන අවුත් මහදන් දී අවසන, රජු ප්‍රධාන පසේ බුදුවරයන් වහන්සේ සමීපයේද අගබිසවු අවසන් පසේබුදුවරයන් වහන්සේ සමීපයේද හිඳගෙන පාමුල වැඳවැටී - "ආර්යයන් වහන්සේලා සිවුපසය නොලැබීමෙන් ක්ලාන්ත නොවීම පිණිසත්, අපිට පිනින් නොපිරිහී සිටීම සඳහාත්, අපගේ දිවි ඇතිතෙක් මෙනුවරම වසන බවට ප්‍රතිඥා දෙත්වා!"යි අයැද සිට, ප්‍රතිඥා ගෙන මගුල් උයනෙහි පන්සීයක් සක්මන් මලුද පන්සල්ද කරවා, සියලු ආකාරයෙන්ම නිවාසාදිය සපයා එහි වාසය කරවූහ.

මෙලෙස කල් ගතවනවිට රජුගේ රාජ්‍යයේ ප්‍රත්‍යන්ත ජනපදයක කැරැල්ලක් ඇතිවිය. රජතුමා "මම ප්‍රත්‍යන්තයේ කැරැල්ල සංසිඳවීමට

යමි. නුඹ පසේබුදුවරුන්ට අප්‍රමාදීව සත්කාර කරව"යි දේවියට අවවාද දී සේනාව පිරිවරාගෙන ගියේය. ඔහු ඒමට පෙරම පසේබුදුවරුන්ගේ ආයු සංස්කාරය නිමාවිය. මහාපදුම බුදුපියාණන් වහන්සේ තුන්යම් රාත්‍රියෙහිම ධ්‍යාන ක්‍රීඩාවෙහි යෙදීසිටි සේක්, එළිය වැටෙන අවස්ථාවෙහි සක්මනේදී පිහිටාධාර වූ ඵලකය ම ආධාර කරගෙන සිටිසේක් අනුපදිසේස නිර්වාණ ධාතුවෙන් පිරිණිවියහ. මේ ක්‍රමයෙන් සෙසු පසේබුදුවරු ද පිරිනිවියහ.

ඊට පසුදින දේවිය උයනට අවුත් පසේබුදුවරු වැඩසිටින තැන් නැමදීම් ආදිය කරවා, මල් විසුරුවා, සුවඳදුම් දී උන්වහන්සේලාගේ පැමිණීම අපේක්ෂිතව හුන්නී පමාවන හෙයින් පුරුෂයකු කැඳවා, "දරුව! යන්න. ආර්යයන් වහන්සේලාට අපහසුවක් වීද?"යි දනගෙන එව!"යි කියා ඔහු වැඩහිඳින කුටි වෙත යැවීය. ඔහු එහි ගොස් මහාපදුම පසේ බුදුන් වැඩහිඳින කුටියෙහි දොර හැර බලා, එහි නොදැක සක්මන් කරන තැනට ගොස් එල්ඔෙන එලකය ආධාර කරගෙන සිටිනු දැක, "උන්වහන්සේට වැඳ, "ස්වාමීනි! දැන් කාලයයි" පැවසීය. පිරිණිවි සිරුර කුමක් පවසත්ද? ඔහු "බුදුන් නිදාසිටී"යැයි සිතා ලඟට ගොස් පිටපය අතින් පිරිමැද එහි සීතල බැවිනුත් - තද බැවිනුත් පිරිනිවි බව දැන රජ ගෙදරට දිව ගියේය. "දරුව! පසේබුදුවරු කොහිද?" විචාළ රජ දේවියට "දේවයනි, උන්වහන්සේලා පිරිනිවියහ"යි පුරුෂයා කීවේය.

එය ඇසූ දේවිය හඬන්නී - වැලපෙන්නී නුවරුන් සමග නික්ම අවුත් රජඋයනට පිවිස ආගමික උත්සවයක් කරවා, සියලු පසේබුදුවරුන්ගේ සිරුරු ආදාහනය කරවා, සියලුම ධාතු පිහිටුවා චෛත්‍යයක් කරවූවාය.

රජු ප්‍රත්‍යන්ත ජනපදය සාමයෙහි පවත්වා නුවරට පැමිණෙන කල්හි පෙරගමන් පැමිණි දේවියගෙන්, "කිම සොඳුර! පසේ බුදුවරු කෙරෙහි අප්‍රමාදීව උපස්ථාන කළෙහිද? උන්වහන්සේලා නිරෝගීව සිටින්ද?"යි විමසුවේය. ඇය "දේවයන් වහන්ස! උන්වහන්සේලා පිරිනිවියහ"යි පැවසුවාය. එබස් ඇසූ රජතුමා "මෙබඳු වූ මහ පඬිවරුන්ටත් මරණය පැමිණේ. අපට කවරනම් වූ මිදීමක්ද?"යි සිතා නුවරම නොගොස් ම, තම වැඩිමල් පුතු කැඳවා, රාජ්‍ය පවරා දී තෙමේම මහළු පැවිද්දෙන් පැවිදිවිය. දේවින්ද "මොහු පැවිදි වූ කළ මා කුමක් කරමිද?යි පවසා ඒ උයනෙහි දී ම පැවිදි වූවාය. දෙදෙනම ධ්‍යන වඩා ආයුකෙළවර බඹලොව උපන්හ.

ඔවුහු එහි ම වෙසෙමින් සිට, අපගේ බුදුරජාණන් වහන්සේ ලොව පහල වී උතුම් දම්සක් පැවතුම් සූත්‍රය දෙසා පිළිවෙලින් රජගහනුවරට වැඩම කළසේක් වේළුවනාරාමයෙහි වැඩවෙසෙන කාලයෙහි; "පිපළිලී" නමින් මගධරට මහාතිත්ථ බමුණුගම කපිල බමුණාගේ භාර්යා කුස ද "භද්දකාපිලානි" නමින් මදුරට සාගල නම් නුවර කෝසියගොත්ත බමුණුගේ භාර්යා කුසද පිළිසිඳගෙන බිහිව වැඩිවියට පත්වූහ. පිපළිලී කුමරුට විසිහවුරුද්දක් හා කාපිලානියට දාසය හවුරුද්දක් වූ කාලයෙහි, පිපළිලි කුමරුගේ දෙමාපියෝ "පුත! නුඹ නිසිවයසට පත්වූයෙහිය. කුලවංසය පිහිටුවීමට කටයුතු කරව!"යි කීහ. මෙසේ අතිශයින් කරදර කළහ. තරුණයා, "මගේ කණට ඇසෙන සේ මෙබඳු අමිහිරි කථා නො පවසන්න. නුඹ දෙදෙනා ජීවත්වන තෙක් මම මනාව සළකන්නෙමි. ඉන්පසු ගිහිගේ හැර පැවිදි වෙමි"යි කීවේය. දෙමාපියෝ දින කිහිපයකට පසුව නැවත ඇවිටිලි කළහ. ඔහුද පෙරසේම එය ප්‍රතික්ෂේප කළේය. නැවත කියූවත් ප්‍රතික්ෂේප විය. ඉන්පසු මව නිතරම ඒ පිළිබඳව ගතුකිමට පටන් ගත්තීය.

තරුණයා, "මගේ මවුට මෙය අවබෝධ කරවමි"යි, රන්කරුවෙකුට රන් ආලේපිත කහවනු දහසක් දී එක් ස්ත්‍රී රූපයක් කරවා - එහි මැදිම, ගැටීම් නිමවූ කල්හි රතු වස්ත්‍රයක් හන්දවා - වර්ණවත් මලින් ද නානාවිධ වූ අලංකාරයන්ගෙන්ද සරසවා, මවු කැඳවා "මෑණියනි! මෙබඳු කාන්තාවක් ලැබේ නම් ඇය හා විවාහ වී ගෙයි වසමි. නොලැබේ නම් පැවිදි වෙමි"යි කීවේය.

නුවණැති බැමිණිය මෙසේ සිතුවාය. "මගේ පුතා පින්වතෙකි. දුන් දානවලිනුත්, කරන ලද ප්‍රාර්ථනා වලිනුත් පින්දහම් කරන ලද්දේ තනිවම නොවේ. ඒකාන්තයෙන් මොහු සමග පින්කළ තැනැත්තිය රන්රුවක් හා සමාන විය යුතුමය." බමුණන් අටදෙනෙකු කැඳවා ඔවුන් රිසිසේ සන්තෝෂ කරවා, රන්රුව රථයකට නංවා, "යවු! දරුවනි! යම්තැනක අපට ජාති-ගෝත්‍රාදියෙන් සමාන පවුලක මෙබඳු දරියක් ඇතිනම් සොයවු. මේ රන් රුවම නුඹලාට තෑගියක් කොට දෙමි"යි කුමරියක් සෙවීමෙහි යෙදවූවාය.

ඔවුහු "අප දැන් කොතැනක යමුද?" "සාකච්ඡා කරන්නේ, මදුරට නම් ස්ත්‍රීන්ට ආකාරයකි. එහි යමු"යි මදුරට සාගල නුවරට ගියහ. එහි එක් නානතොටක රන්රුව තබා තුමූ සැඟවී හුන්හ. එවිට කාපිලානියගේ කිරිමව, ඇය නහවා සරසා ශ්‍රී යහන් ගබඩාවේ නිදිකරවා, තමා දිය නෑමට එන්නී මේ රුව දුටුවාය. "ආර්යදුව, මා පසුපස මෙහි නැවත

පැමිණියා විය යුතුයැ"යි යන සිතෙන්, තර්ජනය කරන්නී - "අකිකරු තැනැත්තිය! නුඹ මෙහි කුමට ආවෙහිද?"යි ගැසීමට අත ඔසවා "වහා ගෙදර යව!"යි වැරෙන් කම්මුලට ගැසුවාය. ඇගේ අත ගලක ගැසුවාක් මෙන් කම්පා විය. පුදුම වූ ඈ මදක් ඉවත්ව බලන්නී මහත් වූ ගෙල දක "මෙය ආර්ය දුවයැ"යි මට සිතුණු නමුත් මෙහි මගේ ආර්ය දුවගේ යැයි පැවසීමට සුදුසු වස්තුයක් වත් නැතැයි කීවාය.

අවධ සැඟවී සිටි බමුණෝ රැස්ව - ඇය පිරිවරාගෙන "මේ රුව නුඹගේ ස්වාමිදුව වැනිද?"යි ඇසූහ. එවිට කිරිමව, "මේ කිමිද? මීට වඩා සියදහස් ගුණයකින් මගේ ආර්ය දුව ශෝභාමත් වන්නීය. රූප සම්පන්නය. දොළොස්රියන් ගැබෙක නුන්නී පහන් නොදල්වාම සිය සිරුරේ ශෝභාවෙන් අඳුර දුරු කරන්නීය"යි කීවාය. "එසේනම් ඒ නිවසට යමු"යි පුදපූජා ගෙන රුන්රුව ද රථයට නංවාගෙන, කෝසිය ගොත්තගේ ගෙදරට ගොස් ද්වාරයේ සිට පැමිණි බව දන්වා යැවූහ. බමුණා පිළිසඳර කථාකර, "කොහි සිට ආවෙහිද?" ඇසුවේය. "මගධරට මහාතිත්ථ ගමෙහි කපිල බමුණාගේ ගෙදර සිටයැ"යි කීහ. "කුමක් නිසා මෙහි ආවෙහිද?" "මෙනම් කරුණක් නිසායැ"යි කාරණය දැන්වීය. "දරුවනි! යහපති. සමවූ ජාති ගෝත්‍ර සම්පත් ඇති අපි බමුණෝ වෙමු. දැරිය දෙන්නෙමි"යි ත්‍යාගය ගත්තේය.

ඔවුහු කපිල බමුණාට, "දැරියක් ලද්දෙමු. කළයුත්තක් කරන්න"යි හසුනක් යැවූහ. ඔහු හසුන අසා සතුටුව පිප්ඵලි මානවකට ඒ බව දන්වීය. මානවකයා, "මම නොලැබේ යැයි සිතුවෙමි. මොවුහු දැරියක් ලැබුණු බව කියති. ඇයට මා පැතීමේ අනර්ථ බව දන්වා යවමි"යි රහසිගතව ලිපියක් ලියුවේය. "භද්‍රවනි! ඔබ තමාට දෑගොල කුත් සමාන වූ තරුණයකු ලබත්වා! මම ගිහිගෙන් නික්ම පැවිදිවෙමි. පසුව විපිළිසර නොවනු මැනවි"යි යනුවෙන් ලියා ඇය වෙත යැවීය. භද්‍රාව ද අසුවලා මාහට යෝජනා කරන ලදැයි දැන රහසිගත වූවා, ලිපියක ලියුවාය. "ආර්ය පුත්‍රය! තමාට දෑකුලගොත් සමාන වූ සුදුසු තරුණියක් ලබත්වා! මම ගිහිගෙන් නික්ම පැවිදි වන්නෙමි. පසුව විපිළිසර නොවනු මැනවි"යි ලියා පිප්ඵලි තරුණයාට යැවුවාය. ලියුම්කරුවෝ දෙදෙන අතරමගදී හමුවූහ. "මේ කාගේ ලියුමක්ද?" "කාපිලානියගෙන් පිප්ඵලිට යැවෙන්නකි." "මේ කාගේ ලියුමක්ද?" "පිප්ඵලිගෙන් කාපිලානියට යැවෙන්නකි." එසේ නම් ලිපිදෙක බලමුයි. බලා "දරුවන් වැඩ බලවු"යි කියා - එම ලිපි දෙක

ඉරා විසිකර, වෙනත් ලිපි දෙකක් ලියා දෙතැනට යැවූහ. මෙලෙස ඔවුන්ගේ නොකැමැත්තෙන්ම එක්වීම සිදුවිය.

විවාහ වූ දිනම පිප්ඵලිද කාපිලානියද මල්දම් දෙකක් ගෙතූහ. ඒවා සයනය මැදින් තබා, රාත්‍රී අහරගෙන, දෙදෙනම "ඇඳට යන්නෙමු"යි පැමිණ තරුණයා දකුණුපසින් ඇඳට නැංගේය. භද්‍රාව වම්පසින් නැගුණි. මෙසේ කීවාය. "යමෙකුගේ පැත්තෙහි මල්දම මැලවූයේ ද එම සංඥාවෙන් ඔහුට හෝ ඇයට 'රාග සිතක් පහලවියැ'යි දැනගන්නෙමු. මේ මල්දම නො අල්වමු"යි කීවාය. ඔවුහු "තම ශරීර ඔවුනොවුන් හා ගැටෙති'යි බියෙන් රාත්‍රියෙහි නොනිදාම පහන් කරති. දාවලට ද රාග සිතක් හෝ පහළ නොවෙති. මේ දෙදෙනම ලෞකික ආමිෂයන්හි නොඇලී මෙසේම මවුපියවරු ජීවත්ව සිටින තාක් 'පවුල' පිළිබඳව නොවිමසා සිට ඔවුහු මියගිය පසුව තම සම්පත් පිළිබඳව සොයා බැලූහ. විමසූහ. කුමරුගේ සම්පත් ඉතා මහත්ය. එක්දිනක් ශරීරයේ ගා අත්හැර දමන රන් චූර්ණයම මගධ නැළියෙන් දොළොස් ගුණයක් පමණ වේ. යන්ත්‍ර බැඳි වැව්-පොකුණු ආදිය සැටකි. කෘෂිකර්මාන්තයෝ දොළොස් යොදුනක් පුරා පැතිර ඇත. අනුරපුරය හා සමාන වූ දාසගම් දාහතරකි. යුධ කරන ඇත්තු තුදුසකි. යුධ අශ්වයෝ තුදුසකි. යුධ රථ තුදුසකි.

එක්දිනක් ඔහු අලංකාරව සැරසූ අසකු පිට නැගී, ජනයා පිරිවරාගෙන කෘෂිකර්මාන්ත කරන තැනට ගොස්, කුඹුරු කෙළවර සිටියේය. නගුලෙන් සිඳින ලද භූමියෙන් නැගුණා වූ ගැඩිවිල් ආදී පණු ජාතීහු කපුටා ආදී කුරුල්ලන් විසින් කනු දුටුවේය. "දරුවනි! මේ කුරුල්ලෝ කුමක් කත්ද?", "ස්වාමීනි! ගැඩිවිල්ලෝය." "මොවුන් කරන පාපය කාහට අයත් වේද?" "ස්වාමීනි! නුඹවහන්සේටම අයිති වේ." එවිට තරුණයා මෙලෙස සිතුවේය. "ඉදින් මොවුහු කරන ලද පවු මා හටම වේනම් අසූහත් කෙළක් වූ ධනයෙන් මට කවර ප්‍රයෝජනයක්ද? දොළොස් යොදුන් කර්මාන්තයෙන් කවර වැඩක්ද? යන්ත්‍ර බැඳි තඩාග සැටෙන් කවර වැඩක්ද? දාසගම්වලින් කවර ප්‍රයෝජනයක්ද? මේ සියලු සම්පත් කාපිලානියට ම පවරා මම පැවිදි වන්නෙමි. ගිහිගෙන් නික්මෙමි"යි යනුවෙනි.

කාපිලානිය ද මේ මොහොතෙහි නිවසේ මැද මිදුලෙහි තල කළ තුනක් අතුරා - කිරිමවුවරු පිරිවරාගෙන හුන්නී, තලවල සිටින පණුවන් කන කපුටන් දක "මැණියනි! මොවුහු කුමක් කත්ද?", "ස්වාමි දුවණියනි!

පණුවන්ය." "මොවුන් කරන්නා වූ මේ පාපය කාහට අයත් වේද?" "ස්වාමි දුවණියනි! නුඹටම අයත්වේ" යැයි පැවසූ වදන් අසා "මට රියන් හතරක වස්ත්‍රයක් ද නැළියක් පමණ බත් ද ලැබීම සුදුසුය. මෙපමණ ජනයා විසින් කරන අකුසල් මාහට වේනම් ආත්ම භාව දාහකින්වත් සසර පැවැත්ම නිමකර, හිස එසවීමට මට නොහැකි වේ. මේ සියලුම සම්පත් ආර්ය පුත්‍රයාටම පවරා දී ගිහිගෙන් නික්ම පැවිදි වන්නෙමි." මෙවැනිම සිතකින් නිවසට පැමිණි තරුණයා දියනා උතුම් පහයට නැගී, මහත් අනර්ඝ පළඟක හුන්නේය. ඔහුට යෝග්‍ය වූ භෝජනයක් (සක්විති රජකුට සුදුසු වූ) පිළිගැන්විණි. අඹුසැමි යුවලම ආහාර කිස නිමවා රහසිගත තැනක හුන්හ.

ඉන්පසු තරුණයා "හදාවෙනි, හදාවෙනි ! නුඹ මේ ගෙදරට එනවිට කොපමණ ධනයක් රැගෙන ආවේද?"යි ඇසීය. "ආර්ය පුත්‍රය! පනස් පන්දාහක් කරත්තවලින් ධනය රැගෙන ආවෙමි." "හදාවෙනි! එම සියලුම ධනයත්, මේ ගෙදර ඇති අසූකෙළක් ධනයත්, යන්ත්‍ර බැඳි සැටක් තඩාගාදී සියලුම සම්පත් නුඹට ම පවරා දෙමි." තරුණයා කීවේය. "ආර්ය පුත්‍රය! නුඹ ඉන්පසු කුමක් කරන්නේද?" "මම පැවිදි වන්නෙමි", "ආර්ය පුත්‍රය! මමද නුඹගේ පැමිණීම බලමින් ම මෙහි සිටියෙමි. මමද පැවිදි වන්නෙමි." මෙසේ ඔවුනොවුන්ට ගිනිගත් කොළසෙවිලි කළා වූ ශාලාවක් මෙන් ත්‍රිවිධ භවයෝ වැටහුනහ. ඒ දෙදෙන වෙළඳසැළකින් කහපැහැති වස්ත්‍ර ද මැටිපාත්‍රා ද ගෙන්වාගෙන, ඔවුනොවුන්ගේ කෙස් බැහැර කරවාගෙන, "ලොව යම් රහත් කෙනෙක් වේනම් ඔවුන් උදෙසා අපගේ පැවිද්ද වේවා!"යි පවසා පැවිදි වූහ. පසුම්බිවල පාත්‍රා දමාගෙන - උරයේ එල්ලාගෙන ප්‍රාසාදයෙන් බැස ගියහ. ගෙදර දැසිකම්කරු කිසිවෙක් ඔවුහු හඳුනා නොගත්හ.

ඔවුහු ඒ බමුණු ගමින් නික්ම දාසගම් දොරින් යනකල්හි පැවැත්ම, විලාශ හා අකාරාදියෙන් දාසගම් වැසියෝ ඒ දෙදෙන හඳුනාගත්හ. ඒ දෙදෙන පාමුල හඬාවැටෙමින් "ආර්යයෙනි! කිම අපි අනාථ කරවුද?"යි ඇසූහ. "අපි ත්‍රිවිධ භවයම ගිනිගත් කොළ සෙවිලි කළ ශාලාවක් මෙන් වැටහී පැවිදි වූයෙමු. ඉදින් නුඹලාගෙන් එක් එක් පුද්ගලයා දාස බවින් මුදවත් නම්, වර්ෂ සියකුත් ප්‍රමාණවත් නොවේ. නුඹලා ම නුඹලාගේ හිස් සෝදාගෙන දාසකමින් නිදහස් වී ජීවත් වෙවු"යි කියා ඔවුහු හඬද්දී ම පිටත්ව ගියහ.

තෙරුන් වහන්සේ මුලින් ම ගමන් කරමින් පසුපස හැරී බලා මෙසේ සිතුවේය. "මේ භද්‍රාකාපිලානිය, මුළු දඹදිවට ම අගනා ස්ත්‍රියකි. ඇය මා පසුපස පැමිණීම සුදුසු දෙයක් නොවේ. ඇතමෙක් මෙසේ සිතීමටද පුළුවන. "මේ දෙදෙනා පැවිදි වූවත් වෙන්වීමට නොහැකිව නුසුදුසු හැසිරීමක් කරති" යනුවෙන්. ඇතැම්හු මනස දූෂණය කරගෙන ආපාගාමී වෙති. මැය අත්හැර මම තනිව ම යාම සුදුසුය"

ඉදිරියෙන්ම වැඩමකරන තෙරණුවෝ දෙමං සන්ධියකට පැමිණ ඒ මැද නැවතුනහ. භද්‍රාවද පසුපසින් පැමිණ, උන්වහන්සේට වැඳ පසෙකින් සිටියාය. ඉක්බිති ඇයට "භද්‍රාවනි! නුඹ වැනි ස්ත්‍රියක් මා පසුපස එනු දැක, 'මේ දෙදෙන පැවිදි වූවත් වෙන්වීමට නොහැක්කෝ වෙති' සිතා අප කෙරේ සිත් දූෂිත කරගෙන මහජනයා අපාය පුරවන්නෝ වෙති. මේ පාරවල් දෙකකි. එකකින් ඔබ යනු මැනවි. අනිකින් මම යමි"යි පැවසූ සේක. භද්‍රාවද "ආර්ය පුත්‍රය! එසේය. පැවිද්දන්ට ස්ත්‍රියනම් කිලුටකි. පැවිදිවීත් වෙන් නොවෙති"යි ජනයා අපගේ දොස් දකිති. නුඹවහන්සේ එක් පාරක යන්න. දැන් අපි වෙන්වෙමු"යි තෙවරක්ම පැදකුණු කොට, සිවුතැනක හිඳ පසඟ පිහිටුවා වැඳ, තෙරුන්ගේ දසනිය එක්වී බබලන ඇඟිලි සහිත පාදෙක අල්ලාගෙන - "කල්ප ලක්ෂයක් පමණ වූ දීර්ඝ සංසාරයේ කරන ලද මිතු කරාබස් ඇති අපගේ සබඳතාව, අදින් පසු බිඳී යයි. නුඹවහන්සේ 'දක්ඛිණ ජාතික' නම් වේ. එනිසා නුඹ දකුණු දෙස පාරෙන් යනු මැනවි. මා මාතුගාම නම් වේ. මාහට චම්පස මාර්ගය සුදුසුය"යි මෙසේ පවසා චම් පැත්තෙහි මාර්ගයට බැස ගියාය. ඔවුන්ගේ වෙන්වන වේලාවෙහිදී මේ මහාපොළව, "මම සක්වල ගල, මහමෙර ආදිය දරාසිටීමට සමත් වුවත් නුඹලාගේ ගුණමහිමය දරාගැනීමට නොහැක්කෙමි"යි පවසන්නාක් මෙන් මහහඬින් කම්පා විය. අහස හෙන හඬ දෙමින් සුලං හැමීය. සක්වල පර්වතය ද මහත් නාද පැවැත්වූයේය.

සම්මා සම්බුදුරජාණන් වහන්සේ වේළුවන මහා විහාරයේ ගඳකිළියෙහි වැඩහුන් සේක්, පොළව කම්පාවන ශබ්දය අසා, "කුමක් නිසා පොළව කම්පාවීද?"යි සිහිපත් කර බලන සේක්; "පිප්ඵලි මාණවකයාද භද්‍රාකාපිලානිය ද මා උදෙසා අපමණ සැපසම්පත හැරදමා පැවිදි වූවාහුය. ඔවුන්ගේ වෙන්වීමේදී දෙදෙනාගේම ගුණබලයෙන් මහපොළව කම්පිත විය. මා විසිනුදු මොවුන්ට සංග්‍රහ කිරීම සුදුසුය." යනුවෙන් සිතා වදාරා, ගඳකිළියෙන් නික්ම තමන් වහන්සේ ම පාසිවුරු ගෙන අසූමහා

ශ්‍රාවකාදීන්ගෙන් කිසිවකු නො අමතා, තුන්ගවුවක් පමණ පෙරගමන් කළ සේක. රජගහටද නාලන්දාවටද අතර වූ බහුපුත්තක නම් නුග ගස මුල පළක් බැඳගෙන වැඩහුන් සේක. එසේ වැඩහිඳි සේක්, වෙනත් පාංශු කුලිකාදීන් මෙන් නොව බුද්ධවේෂය ගෙන අසූරියනක් දුර උතුම් බුදුරැස් විහිදුවමින් වැඩහුන් සේක.

මෙලෙස ඒ මොහොතෙහි ඡත්‍රමය කුඩ, කරත්ත රෝද, කූටාගාර යනාදී ප්‍රමාණවලින් බුදුරැස් දසදිග්හි පැතිරුණාහුය. ඔබිනොබ ගමන් කළාහුය. සඳ දාහක් හිරු දාහක් උදව් කලක් මෙන් ඒ වනාන්තරය එකම ආලෝකයකින් බැබලුණි. දෙතිස් මහ පුරිස් ලකුණින් හෙබියා වූ බුදුසිරුර අහසේ බබලන තරු සමූහයක් මෙන්ද වනයේ දියපොකුණුවල මැනවින් පිපි නෙලුම්, මානෙල් ආදී පියුම් මෙන්ද බැබලුණි. ශෝභාමත් විය. සාමාන්‍යයෙන් නුගරුකෙහි කඳ සුදුපාට වේ. පතු නිල්පාට වේ. ගෙඩි රතුපාට වේ. එදින කඳ සහිත සීයක් අතු ඇති නුගරුක රන්වන් පැහැයෙන් බැබලුණි.

මෙසේ මෙම "**අද්ධානමගග පටිපන්නො**" යන පදයාගේ අර්ථ පවසා, දැන් "යම්සේ මෙම කාශ්‍යප තෙරුන් පැවිදි වීද? යම්සේ දිගු මාවතකට එළඹියේ ද?" යන මෙම අර්ථය පහදා දීම සඳහා අභිනීහාරයේ පටන් අනුපිළිවෙල කථාව මෙලෙස දතයුතු වේ.

"**අනතරාච රාජගහං අනතරාච නාලන්දං**" යනු රජගහටද නාලන්දාවටද අතර යනුයි. "**සත්ථාරඤ්චෙව වතාහං පස්සෙය්‍යං භගවන්තමෙව පස්සෙය්‍යං**" යනු ඉදින් මම ශාස්තෘන් වහන්සේ දකින්නෙම් නම්, මේ බුද්ධත්වයට පත්වූම භාග්‍යවතුන් වහන්සේ දකින්නෙමි. මෙයින් බැහැර වූ අනික් ශාස්තෘවරයෙක් සිටිය නොහැක. "**සුගතඤ්චෙව වතාහං පස්සෙය්‍යං භගවන්තමෙව පස්සෙය්‍යං**" යනු ඉදින් මම මනා ප්‍රතිපත්තියෙන් මැනවින් ගමන්කළ නිසා සුගතනම් වන සුගතයන් වහන්සේ බලන්නෙම් නම් මේ භාග්‍යවතුන් වහන්සේම බැලිය යුතුයි. මෙයින් වෙනත් සුගතයන් වහන්සේ කෙනෙක් මට නැත. "**සම්මා සම්බුද්ධඤ්චෙව වතාහං පස්සෙය්‍යං භගවන්තමෙව පස්සෙය්‍යං**" යනු ඉදින් මම යහපත්ව තමාම සත්‍ය අවබෝධ කළ බැවින් සම්මා සම්බුද්ධ නම් වූ බුදුරදුන් දකින්නේ නම්, මේ භාග්‍යවතුන් වහන්සේම දකිය යුතු වේ. මේ හැර වෙනත් සම්මා සම්බුදුවරයෙක් මාහට නොමැත. මෙහි අර්ථ මෙසේ දතයුතුයි. මෙලෙස රුව දැකීමෙන්ම "මේ භාග්‍යවතුන් වහන්සේමය. මේ ශාස්තෘන් වහන්සේමය. මේ සුගතයන් වහන්සේම ය. මේ සම්මා සම්බුදුරජාණන් වහන්සේමය"

යනුවෙන් ඇවැත්නි නිසැකව මාහට එය වැටහුනේය. අවබෝධ විය යන අදහසයි. **"සත්‍ථා මෙ භගෙත"** යන මෙම ප්‍රකාශය සූත්‍රයේ දෙවරක් දක්වුනත් එය තුන්වරක්ම පැවසූ බව සිතාගත යුතුයි.

මෙයින් උන්වහන්සේ තෙවරක්ම මෙලෙස "සිය ශ්‍රාවකත්වය" ප්‍රකාශ කළ බව "ඇවැත්නි" යන්නෙන් දක්වයි. **"අජානංයෙව"** යනු නොදන්නේමය. දෙවන පදයෙහිද මෙම ක්‍රමයමයි. **"මුදධාපි තසස විපතෙයය"** යනු අන්‍යයෙකුට තමා නොදන්නේම දන්නෙමියි ප්‍රතිඥා දෙන බාහිර සමයක ශාස්තෘවරයාටය. "මෙලෙස මුලු හිතින්ම ප්‍රසන්න වූ සිතැති ශ්‍රාවකයා මෙලෙස අතිශය යටහත් ගෞරව දැක්වීම් කරන්නේ නම් එකෙණෙහි එම ශාස්තෘවරයාගේ හිස, නටුයෙන් ගිලිහුණු තල්ගෙඩියක් මෙන් බෙල්ලෙන් ගිලිහී වැටෙන්නේය. සත්කඩකට පැලෙන්නේය." යන අර්ථයි. මෙලෙස පැවසූයේ ඇයි? ඉදින් මහාකාශ්‍යප තෙරුන් වහන්සේ දක්වූ මේ සිත් පැහැදවීමෙන් - මේ අතිශය ගෞරවාදර දක්වීමෙන් ඉදින් මහමුහුදක් මවන්නේ නම් රත්වූ කබලෙහි දැමූ දිය මෙන් වහා වේලීමට යන්නේය. ඉදින් සක්වලක් මවන්නේ නම් කපුටු තුඩින් පහරදුන් පිටි මිටක් මෙන් සුණුවිසුණු වී යන්නේය. ඉදින් මහපොළවක් මවන්නේ නම් සුලඟින් ගසාගෙන යන අළුමිටක් මෙන් විසිරෙන්නේය. මෙබඳු වූ තෙරුන්ගේ ගෞරව දැක්වීම නිසා ශාස්තෘන් වහන්සේගේ රත්වන් පා මතුපිට එක් රෝමකූපයක්වත් කඩා බිඳදැමීමට නොහැකි විය. මහාකාශ්‍යප තෙරුන් පසෙක සිටිත්වා. එවැනි මහතෙරවරු දහසකගේ, ලක්ෂයකගේ වුවත් ගෞරව දක්වීම් ආදියෙන් දසබලයන් වහන්සේගේ පා මතුපිට ඇති රෝමයක්වත් සෙලවීමට හෝ පාංශුකූල සිවුරෙහි අංශුමාත්‍රයක් සෙලවීමට හෝ සමත් නොවේ. ශාස්තෘන් වහන්සේ මෙලෙසින් අතිශය මහානුභාව **සම්පන්න** වෙති. **"තසමානිහ තෙ කසසප"** යනු යම් හෙයකින් මම දැනගෙනම දනිමියි පවසමි. දකිමින්ම දකිමියි පවසමි. එනිසා කාශ්‍යපය! නුඹ විසින් මෙලෙස හික්මිය යුතුය. **"නිබබං"** යනු ඝන වූ තියුණු වූ මහත් වූ යනුයි. **"හිරොතතපපං"** යනු පාපයට ඇති ලජ්ජාවද බියද යන දෙකයි. **"පවවුපටඨිතං හවිසසති"** පළමුවම එළඹ සිටියේ වේ. "යමෙක් වනාහී මහතෙරවරුන් කෙරෙහි ලැජ්ජා බිය උපදවා එළඹෙයිද, තෙරවරුද ලජ්ජා සහිතව, බිය සහිත ඔහු වෙත එළඹෙයි" යන අර්ථයයි. මෙය මෙහි ඇති ආනිසංසයයි. **"කුසලුපසංහිතං"** යනු කුසල් ආශ්‍රය කළ යනුයි. **"අටඨිකත්වා"** යනු තමා විසින් ඒ ධර්මයෙන් අර්ථයක්-යහපතක් කොට යනුයි. ඒ ධර්මය හෝ එයින් මට වැඩක් ඇතැයි අර්ථවත් දෙයක් කොට. **"මනසිකත්වා"** යනු සිතේ තබාගෙනයි. **"සබබ චෙතසො සමනනා හරිත්වා"**

යනු සිතේ මදක්වත් පිටත නික්මීමට නොදෙමින්ය. සියලු අයුරින්ම එක්තැන් වූ සිතින්. සිත එක් අරමුණක පිහිටුවා. **"ඔහිත සොතො"** යනු පිහිටවූ- යොමුකළ කන් ඇතිව යනුයි. ඤාණය නම් වූ කණ්ද පැහැදීම නම් වූ කණ ද යොමුකර - මවිසින් දෙසූ ධර්මය සකසාම අසන්නෙමි" යනුවෙන් නුඹලා හික්මිය යුතුයි. **"සාතසහගතා ච මෙ කායගතාසති"** යනු අසූහයේ මෙන්ම ආනාපාන සතියේ ද ප්‍රථමධ්‍යාන වශයෙන් සැපෙන් යුක්ත වූ කායගතා සතියයි. මෙසේ දෙන ලද මේ අවවාද තුනම තෙරුන් වහන්සේගේ පැවිද්ද ද උපසම්පදාව ද විය. **"සාණො"** යනු කෙලෙස් සහිතව, ණය සහිත වී යනුයි. **"රථඨ පිණඩං භුඤජි"** යනු ශ්‍රද්ධාවෙන් දෙන ලද්ද අනුභව කළෙමි යනුයි. පරිභෝග කිරීම් හතරකි. ථෙය්‍ය පරිභෝගය, ඉණ පරිභෝගය, දායජ්ජ පරිභෝගය, සාමි පරිභෝගය යනුවෙනි. එහි දුස්සීලයාගේ අනුභව කිරීමද පරිභෝගය ද (සඟ මැද හිඳ) ථෙය්‍ය පරිභෝගය නම් වේ. කුමක් නිසාද? ඔහුට සිවුපසයෙහි හිමිකමක් නොමැති බැවිනි. සිල්වතාගේ ප්‍රත්‍යවේක්ෂා නොකර පරිභෝග කිරීම, ඉණ පරිභෝගය නම් වේ. සප්ත සේඛ පුද්ගලයන්ගේ සිවුපස පරිභෝජනය දායජ්ජ පරිභෝග නම් වේ. රහතන් වහන්සේගේ පරිභෝගය, සාමි පරිභෝග නම් වේ. මෙලෙස රහතන් වහන්සේම ස්වාමියකුව-ණය නැතුව වළඳන්නේ වේ. තෙරුන්වහන්සේ තමා ප්‍රහුදුන්ව සිටියදී වැළඳූ ආහාරය "ඉණ පරිභෝගය" ලෙස හඳුන්වමින් මෙසේ දෙසූහ. **"අථඛ්‍යා අඤඤං උදපාදි"** යනු අටවැනි දින අර්හත්ඵලයට පත්විය.

"අථඛො භගවා මගගා ඔකකමම" යනු මාර්ගයෙන් ඉවත්ව යනුයි. පළමුව භාග්‍යවතුන් වහන්සේ හා සමාගමය එදිනම සිදුවිය. රහත්වීම පසුව සිදුවිය. දේශනාචාරයේ මෙසේ පැමිණි බැවින් රහත්වීම පළමුව දක්වන ලදී. කුමක් නිසා බුදුපියාණන් වහන්සේ මාර්ගයෙන් ඉවත්වූ සේක්ද? උන්වහන්සේට මෙබඳු සිතක් පහළවූ බැවිනි. "මෙම භික්ෂුව උපතින්ම ආරඤ්ඤිකංගය සමාදන් වූවෙක්, උපතින්ම පාංශුකූලිකයෙක්, උපතින්ම ඒකාසනිකංගය සමාදන් වූවෙක් කරන්නෙමි"යි යනුවෙන් සිතා මාර්ගයෙන් ඉවත්වූ සේක.

"මුදුකා ඛො තෘායං" යනු (මුදුකා ඛො තෙ අයං) නුඹගේ මේ සිවුර මෘදුය යනුයි. මේ වචනය භාග්‍යවතුන් වහන්සේ නෙලුම් මල් පැහැයෙන් යුතු අතින් සිවුරෙහි අගින් අග පිරිමදිමින් වදාළහ. කුමක් නිසාද? තෙරුන් සමග සිවුරු හුවමාරු කරගනු කැමැත්තෙනි. කුමක් නිසා හුවමාරු කරගැනීමට කැමැත්තක් දක්වූයේද? තෙරුන් වහන්සේ, ස්වකීය ස්ථානයෙහි තබනු රිසියෙනි. (ශාසනභාරධාරීත්වය පවරණු

සඳහායි.) තෙරුන් වහන්සේ කියූ ලෙසම, සිවුරක හෝ පාත්‍රයක ගුණ කී කල්හි "නුඹ මෙය ගන්න"යි යනාදී වදන් පැවසීම චාරිත්‍රයක් මය. එනිසා **"පතිගණ්හාතු මෙ භන්තෙ භගවා"**යි දෙසූහ. **"ධාරෙසසි පන මෙ ත්වං කසසප! සාණානි පංසුකූලානි නිබබසනානි"** යනු කාශ්‍යපයි! නුඹ මේ පරිභෝගයෙන් දිරාගිය, පාංශුකූල සිවුර පෙරවීමට හැකියැයි කියයි. එය කාය බලය නිසා නොව ප්‍රතිපත්ති පූරණය සඳහා ම මෙලෙස කියන ලදී. මෙය මෙහි අදහසයි. පුණ්ණා නම් දාසිය විසින් පොරවා අමුසොහොනේ අත්හැර දමූ මේ සිවුර ඒ සොහොනට පිවිස තිබිණ් පමණ පණුවන්ගෙන් ගැවසී තිබියදී ඒ පණුවන් ඉවත්කර මහා ආර්යවංශයෙහි පිහිටා සිට මම පිළිගත්තෙමි. ඒ මම මේ සිවුර ගත් දිනයේ දස දහසක් සක්වල, මහපොළව මහඟින් නද දෙමින් කම්පා විය. අහසෙහි සුළං හැමීය. සක්වල දේවතාවෝ සාධුකාර දුන්හ. මේ සිවුර ගන්නා වූ භික්ෂුව විසින් උපතින්ම පාංශුකූලිකයෙක්, උපතින් ම ආරඤ්ඤිකයෙක්, උපතින්ම එක් ආසනයක හිඳින්නෙක්, උපතින්ම පිඬු පිණිස හැසිරෙන්නක් වීමට සුදුසුය. නුඹ මෙසේ මේ සිවුරට යෝග්‍ය වූ දෙය සිදුකිරීමෙහි සමත්කම් ඇත්තෙකි. තෙරුන් ද තමා ඇතුන් පහකගේ බල දරන්නේ නමුත් ඒ පිළිබඳව තර්ක නොකරම "මම ඒ ප්‍රතිපත්ති පුරන්නෙමි"යි උත්සාහයෙන් සුගත සිවුරට යෝග්‍ය වූවක්ම කරනු කැමති ව **"ධාසෙසාහං භන්තෙ"** යනාදිය පැවසීය. **"පටිපජ්ජිං"** යනු පිළිගන්නෙමි යනුයි.

මෙසේ මේ සිවුරු හුවමාරුව සිදුකර; තෙරුන් මෙතෙක් පෙරවූ සිවුර බුදුපියාණන් වහන්සේ පෙරවූහ. බුදුපියාණන්ගේ සිවුර තෙරුන් පෙරවීය. එසමයේ මහපොළව ජලය සීමා කරගෙන මහඟින් කම්පා විය. **"භගවතො පුත්තො"** යනාදියෙහි, තෙරුන් වහන්සේ වනාහී බුදුරජාණන් වහන්සේ නිසාම ආර්ය ජාතියෙහි උපන්නාහයි. **"භගවතො පුත්තො"** නම් වේ. හදවතේ තිබී මුවින් නික්මුණු අවවාද වශයෙන් පැවිදි-උපසම්පදා දෙකෙහි පිහිටි බැවින් - **"ඔරසො මුඛතො ජාතො"** නම් වේ. අවවාද ධර්මතා වශයෙන් උපන් බැවින්, අවවාද ධර්මයෙන් නිර්මිත වූ බැවින් - **"ධම්මජො ධම්ම නිම්මිතො"** නම් වේ. අවවාද ධර්ම දායාදයට නව ලෝකෝත්තර ධර්ම දායාදයටම සුදුසු වේයැයි **"ධම්මදායාදො"** නම් වේ. **"පටිගණ්හාතු සාණානි පංසුකූලානි"** යනු ශාස්තාන් වහන්සේ පෙරවූ පංශුකූල සිවුර පෙරවීම සඳහා පිළිගත් යනුයි. **"සම්මාවදමානො වදෙය්‍ය"** යම් අයෙක් භාග්‍යවතුන් වහන්සේගේ "පුතෙකැ"යි යනාදී ගුණයන්ගෙන් යුක්තයැයි කියන්නේ නම් එය මා සඳහාම කියන්නකි. එය සත්‍ය ප්‍රකාශයකි.

මෙපමණකින් කාශ්‍යප තෙරණුවන්ගේ පැවිද්ද පිරිසිදු කරන ලදී. මෙහි අදහස මෙසේ දතයුතුයි. "ඇවැත්නි! යමෙකුට උපාධ්‍යායවරයෙක් හෝ ආචාර්යවරයෙක් සිටින බවක් නොපැණෙවේ ද; ඔහු ආචාර්ය උපාධ්‍යායවරයකු නොමැතිව, නාවන ලද මුණ්ඩකයකුව, තමාම පොරවාගත් කසාවත් ඇතිව, අන්‍ය තීර්ථක පක්ෂ ගත්තෙකුව යන චෝදනා සහිත වූවකුට මෙසේ ලොවුතුරු බුදුරජාණන් වහන්සේගේ තුන්ගවුවක් පමණ පෙරගමන් කිරීම කෙසේ ලැබුණේද? කයින් කය සිවුරු හුවමාරුව කෙසේ ලැබුණේද? මෙනිසා ථුල්ලනන්දා භික්ෂුණියගේ වචනය දුර්භාෂිතයකි. - නපුරු කීමකි"

මෙසේ පැවිද්ද පිරිසිදු කරවා, දැන් ෂඩ් අභිඥා වශයෙන් සිංහනාද පැවැත්වීමට "අහං බො ආවුසො" යනාදිය දෙසූහ. සෙසු පදයන්ගේ අර්ථ පෙර සේම දතයුතුයි.

එකළොස්වන සූත්‍රයයි.

15. 1. 12.

දොළොස්වන සූත්‍රයේ - "තථාගතො" යනු සත්ත්වයායි. "න හෙතං ආවුසො අත්ථ සංහිතං" යනු ඇවැත්නි මේ දෘෂ්ටිය අර්ථයෙන් යුක්ත වූවක් නොවේ. "නාදිබ්‍රහමචරියකං" යනු මාර්ග බ්‍රහ්ම චර්යාවට මුල්වූවක්, පූර්වභාග ප්‍රතිපදාවක්වත් නොවේ. "එතං ආදිබ්‍රහමචරියකං" යනු මෙය මාර්ග බ්‍රහ්මචර්යාවට මූලික වූ ප්‍රතිපදාවකි.

දොළොස්වන සූත්‍රයයි.

15. 1. 13

දහතුන්වන සූත්‍රයේ "අඤ්ඤාය සණඨහිංසු" යනු රහත්බවෙහි පිහිටියහ යනුයි. "සද්ධම්ම පතිරූපකං" යනු සද්ධර්ම ප්‍රතිරූපක දෙකකි. අධිගම සද්ධර්ම ප්‍රතිරූපකය සහ පර්යාප්ති සද්ධර්ම ප්‍රතිරූපකය යන දෙකයි. එහි

ඔභාසෙ චෙව ඤාණෙව පීතියාව විකම්පති
පස්සදධියා සුඛෙචෙව යෙහි චිත්තං පවෙදති

අධිමොක්ඛ ච පග්ගාහෙ උපට්ඨා නෙ විකම්පති
උපෙක්ඛා වජ්ජනෙ වෙව උපෙක්ඛාය නිකන්තියා

බොනි දසඨානානි පඤ්ඤා යසසපරිච්චිතා
ස තත්ථ කුසලෝ හොති නව සමෙමාහං ගවජ්ජති

"ආලෝකයෙහිද ඤාණයෙහි ද ප්‍රීතියෙහිද විශේෂයෙන් කම්පා වෙයි. ශාන්තබවෙහි ද සැපයෙහි ද යමෙකුගේ සිත කම්පාවෙයි."

"සිතේ ස්ථිරත්වයෙහිද උත්සාහයෙහිද උපස්ථානයෙහිද කම්පා වේ. උපේක්ෂා ආවර්ජනයෙහි මෙන් ම උපේක්ෂාවෙහිද බලවත් ආශා ඇතිව"

"යමෙකුගේ ප්‍රඥාව මේ දසතැන්හි පුරුදුකරන ලද ද ඔහුට ඉන් කුසලයක්ම (දියුණුවක්ම) වේ. මුලාවට පත් නොවේ."

මෙම විදර්ශනා ඤාණයේ කිලුටු ඇතිවීම-හටගැනීම "අධිගම සද්ධර්ම ප්‍රතිරූපය" නම් වේ. ත්‍රිවිධ සංගායනාවන්හි නොනගන ලද ධාතුකථා, ආරම්මණ කථා, අසුභ කථා, ඤාණවත්ථු කථා, විජ්ජාකම්මඵල යන කථාවස්තු පහද වෙනත් (අභයගිරිකාදී) සමයන්හි වූ ගුල්හවිනය, ගුල්හ වෙස්සන්තර, ගුල්හ මහෝසධ, වණ්ණ පිටක ය, අංගුලිමාල පිටකය, රට්ඨපාල ගජ්ජිතය, ආළවක ගජ්ජිතය, වෙතුල්ල (වේදල්ල) පිටකය යන බුදුවදන් නොවූ කොටස් පර්යාප්ති සද්ධර්ම ප්‍රතිරූපක නම් වේ. "**ජාතරූප පතිරූපකං**" යනු රන්රසය විදින ලද (ආලේප කරන ලද) පිත්තල වූ රන්වන් ආභරණවල ඇතිවීමයි. උත්සව කාලයේදී මිනිස්සු "ආභරණාදී භාණ්ඩ ගන්නෙමු"යි වෙළඳසැල්වලට යති. ඔවුන්ට වෙළඳසැල් හිමියෝ මෙසේ කියති. "ඉදින් ඔබලාට ආභරණ අවශ්‍ය නම් මේවා ගන්න. මෙම ආභරණ ඝන වූයේත්, වර්ණවත් වූයේත් වේ. වටිනාකම අඩුවේ." ඔවුහු එය අසා කරුණු සලකා බලා මෙසේ කැමති වෙති. "අලංකාර වූ අඩු මිලට ගතහැකි වූ මේ ආභරණ පැළඳ නැකැත් ක්‍රීඩා කළ හැකිය" යනුවෙන් සිතා ඒවා ගෙන යති. නොවිකිණිය හැකි (වැඩිමිල) රන්බඩු සඟවා තබන ලද්දේම වේ. මෙසේ ඒ රන් ආභරණ වැනි වූම ආභරණ ඇතිවූ කල්හි, එම රන් ආභරණ අතුරුදහන් වීම සිදුවේ. "**අථ සද්ධම්මස්ස අනන්තරධානං හොති**" යනු අධිගම සද්ධර්මයයි. ප්‍රතිපත්ති සද්ධර්මය හා පර්යාප්ති සද්ධර්මය යනු ත්‍රිවිධ සද්ධර්මයන්ගේ ම අතුරුදහන් වීම සිදුවේ.

ප්‍රථම සම්බෝධියෙහි (බුද්ධත්වයට පත්වූ අලුත) භික්ෂූහු සිවුපිළිසිඹියාපත් වූහ. ඉක්බිති කල්ගත වනවිට සිවුපිළිසිඹියාපත් වීමට නොහැකිව ෂඩ් අභිඥාලාභී වූහ. ඒ සඳහා ද අසමත් වූ පසුකාලීන භික්ෂූහු ත්‍රිවිද්‍යා උපදවාගත්හ. දිගුකලකට පසු ඊට ද අසමත් වූ බැවින් ආසවක්ඛය ඤාණය පමණක්ම ලබාගැනීමට දක්ෂ වූහ. එයද නොහැකි වූ කාලයෙහි අනාගාමී ඵලය පමණක් විය. අනාගාමී වීමට නොහැකි වූ විට සකදාගාමී ඵලයට පත්වූහ. ඊටද අසමත් වූවෝ සෝවාන් ඵලයට පත්වූහ. කාලයක් යනවිට සෝවාන් වීමටද නොහැකි වේ. ඉන්පසුව විදර්ශනාව, මෙම කෙලෙස් ධර්මයන්ගෙන් කිලුටුවීමෙන් පටන්ගත් තැනම නතරවේද එකල්හි අධිගම සද්ධර්මය අතුරුදහන් වූයේ වේ.

ප්‍රථම බෝධියෙහි සිටි භික්ෂූහු සිවුපිළිසිඹියාපත් වීමට සුදුසු වූ පිළිවෙත් සම්පූර්ණ කළහ. කල් ගතවනවිට ඊට අසමත් වූ භික්ෂූහු ෂඩ් අභිඥාවන් සඳහා ද එයද නොහැකි වූ විට ත්‍රිවිද්‍යාව සඳහාද පිළිවෙත් පිරූහ. එයටද අසමත් වූ විට අර්හත් ඵලය සඳහා පමණක් ගැලපෙන පිළිවෙත් පිරූහ. පසුව අනාගාමී ඵලයට යෝග්‍ය පිළිවෙත් පිරූහ. එයට අසමත් වූ කල්හි සකදාගාමී ඵලයට ද ඉන්පසුව සෝවාන් ඵලයට ද යෝග්‍ය වූ පිළිවෙත් සම්පූර්ණ කළහ. යම්කලෙක සෝවාන් වන පිළිවෙත් පිරීමටද නොහැකි වූයේද එවිට ශීල පාරිශුද්ධිය පමණක් ම පවතින්නේය. මෙවිට ප්‍රතිපත්ති සද්ධර්මය අතුරුදහන් වූයේ වේ.

යම්තාක් කල් ත්‍රිපිටක බුද්ධවචනය පවතින්නේද ඒතාක් කල් බුදුසසුන අතුරුදහන් වූයේ යැයි පැවසීම නුසුදුසුය. ත්‍රිපිටකය තිබියේවා. අභිධර්ම පිටකය අතුරුදහන්ව සෙසු දෙපිටකය පවතියිද සසුන අතුරුදහන් වීයැයි නොකිව යුතුයි. විනය පිටකය පමණක් තිබියදීත් එසේ කිව නොහැක. එහිද බන්ධක-පරිවාර දෙක අතුරුදහන්ව උභතෝ විභංගය පමණක් ඉතිරි වූ විටද, මහාවිනය අතුරුදහන්ව ප්‍රාතිමෝක්ෂය පමණක් පවත්නා විට ද "සසු අතුරුදහන් වූයේයැ"යි පැවසීම නුසුදුසුය.

යම්කලෙක උභය ප්‍රාතිමෝක්ෂය අතුරුදහන් වන්නේද එකල්හි පර්යාප්ති සද්ධර්මය අතුරුදහන් වේ. එය අතුරුදහන් වූ කල්හි ම සසුන අතුරුදහන් වූයේ වේ. පර්යාප්තිය අතුරුදහන් වීමේ හේතුවෙන් අධිගමය අතුරුදහන් වේ. ප්‍රතිපත්තිය අතුරුදහන් වීමෙන් අධිගමය අතුරුදහන් වේ. කුමන කරුණක් නිසාද? අධිගමය වනාහී පර්යාප්තියටද

ප්‍රතිපත්තියට ද හේතුවූ බැවිනි. ප්‍රතිපත්තිය අධිගමයට ද හේතුවේ. මෙසේ ප්‍රතිපත්තියද පර්යාප්තියේ ම ප්‍රමාණය වේයැයි දතයුතුයි.

කාශ්‍යප බුදුරජාණන් වහනසේගේ කාලයෙහි "කපිල" නම් අනාරාධිත භික්ෂුවක් "ප්‍රාතිමෝක්ෂය දේශනා කරමි"යි විඥිනිපත ගෙන අසුනේ හුන්නාහු නොවෙත්ද? පිරිසේ වූවෙක් "මෙහි පැවැත්මක් ඇද්ද?"යි විචාළවිට ඔහුට බියවූ භික්ෂුව "යමක් ප්‍රාතිමෝක්ෂයේ පවතී ද ඒවා අපි ලඟ පවතිමු"යි නොපවසා "නොපවතිමු"යි කීවේය. උන්වහන්සේ විඥිනිපත තබා අසුනින් නැගිට ගියේය. එනිසා එම සම්මා සම්බුදුරජුන්ගේ සසුන පසුබැස්සේය. පසුබැස පිරිහීගිය නමුත් ඒකාන්තයෙන්ම පර්යාප්තිය ප්‍රමාණවත් වේ. " මහාතඩාගයක ස්ථිර වූ ඉවුරු ඇති කල්හි ජලය නොසිටී යැයි නොකිව යුතුයි. ජලය ඇති කල්හි පියුම් ආදී මල් නොපිපේ යැයි නොකිව යුතුයි. මේ ලෙසින් ම මහා තඩාගයේ ස්ථිර වූ ඉවුර, ත්‍රිපිටක බුදුවදනට සමානය. එය පවතින කල්හි මහා තඩාගයේ ජලය හා සමාන වූ පිළිවෙත් පුරන කුලපුත්තු නැතැයි නොකිව යුතුයි. ඔවුහු සිටින කල්හි මහා තඩාගයේ පියුම් පිපෙන්නාක් මෙන් සෝවාන් ආදී මාර්ගඵල ලද ආර්යයෝ නැතැයි නොකිව යුතුයි. මෙලෙස ඒකාන්ත වූ පර්යාප්තියට ම මෙය ප්‍රමාණවත් වේ.

"පඨවිධාතු" යනු දෙලක්ෂ හතලිස් නහුතයකටත් වඩා ඝන වූ මහපොළවයි. **"ආපො ධාතු"** යනු පෘථිවියේ සිට සුභකිණ්ණ බ්‍රහ්ම ලෝකය දක්වා නැගෙන කල්පය විනාශ කරන ජලයයි. **"තෙජො ධාතු"** යනු පොළව පටන් ආභස්සර බඹලොව දක්වා නැගෙන කල්ප විනාශ කරන ගින්නයි. **"වායො ධාතු"** යනු පොළවේ සිට වේහප්ඵල බඹලොව දක්වා කල්පය විනාශ කරන වායුවයි. මේවා එකකින්වත් ශාස්තෘ ශාසනය (බුදුසසුන) වැනසිය නොහැක. අතුරුදහන් කළ නොහැක. එනිසා මෙසේ වදාළහ. **"ඉධෙව තෙ උපජඣනති"** යනු ලෝභයෙන්ම ඉපදී ලෝභයම කාදමන මලකඩ මෙන්, මොවුහු මගේ සසුනෙහි ම උපදිති යනුයි. **"මොඝ පුරිසා"** යනු හිස් පුරුෂයෝය. **"ආදිකෙනෙව ඔපිලවතී"** මෙහි **"ආදිකෙන"** යනු දැඩිව ගැනිමෙන්ය. අල්ලා ගැනිමෙන්ය. **"ඔපිලවති"** යනු කිම්දෙයි යනුයි. මෙය කියන ලදී. ජලයේ හැසිරෙන නැව වැඩිපුර බඳු පටවනුයේ නම් ගිලෙයි. කිම්දෙයි. එලෙසින්ම පර්යාප්ති ආදිය පිරිහී යාමෙන් සද්ධර්මයේ අතුරුදහන් වීමක් සිදු නොවේ. පර්යාප්තිය පිරිහීමෙන් ප්‍රතිපත්තිය පිරිහේ. ප්‍රතිපත්තිය පිරිහීමෙන් අධිගමය පිරිහේ. පර්යාප්තිය

පුරන්නා වූ පර්යාප්තිධර පුද්ගලයෝ ප්‍රතිපත්තිය ම පුරවති. ප්‍රතිපත්තිය සම්පූර්ණ කරන්නෝ අධිගමය සම්පූර්ණ කරති. මෙසේ නවසඳක් මෙන් පර්යාප්ති ආදියෙන් වැඩෙන්නා වූ මගේ සසුන වර්ධනය වන්නේ ම යැයි දක්වයි.

දැන් යම් කරුණකින් සද්ධර්මය අතුරුදහන් නොවී පවතිද්ද, ස්ථිරව පවතිද්ද එය දක්වන සේක්, "පඤ්චඞ්ග" යනාදිය දෙසූහ. එහි "ඔකකමණියා" යනු ඉවත්වීමට, පිරිහීමට, පහතට යෑමට යන අර්ථයි. "සත්ථරි අගාරවා" යනාදියෙහි "අගාරවා" යනු ගෞරව රහිතවය. "අපතිසසා" යනු අකීකරුව, පහත් පැවතුම් ඇතිව යනුයි.

එහි යමෙක් චෛත්‍යාංගණයට නැගෙමින් කුඩ පාවහන් රැගෙන ම යයි ද අනිකකු දෙස බලාගෙන කථාකරමින් ම යයිද මෙය ශාස්තෘන් වහන්සේට කරන අගෞරවයකි. යමෙක් ධර්මශ්‍රවණය සඳහා සෝෂා කළ කල්හි ළදරු සාමණේරවරු පිරිවරාගෙන හිඳීම හෝ වෙනත් නව කර්මාන්තාදියෙහි නියුක්තව හිඳියිද බණ අසන පිරිස් කෙළවර හිඳියි ද එතැනට ගොස් නිදාගනියි ද වික්ෂිප්ත වූ සිත් ඇතිව සිටියිද බණ අසන අන්‍යයන් සමග කථාකරයි ද මෙම අකීකරු ක්‍රියාවන් ධර්මයට කළ අගෞරව නම් වේ. යමෙක් තෙරවරුන්ට උපස්ථාන කිරීමට ගොස් නොවැඳ හිඳියි. අත්බැඳගෙන හිඳියි. රෙදි බැඳගෙන හිඳියි. අන්‍යයන්ටද අත්පා වලින් කුකුස් ඇතිකරයි. වැඩිහිටියන් සමීපයේදී අනාරාධිතව කථා කරයි. මෙය "සංඝ අගෞරවය" නම් වේ. ත්‍රිවිධ ශික්ෂා සම්පූර්ණ නොකිරීම "ශික්ෂා අගෞරවය" නම් වේ. අෂ්ට සමාපත්ති නූපදවීම හා ඊට උත්සාහ නොකිරීම සමාධියට කරන ලද අගෞරවයකි. මේ දැක්වූ විවරණයන්හි යහපත් පැත්ත මෙම පදයන්ගේ අර්ථ විරුද්ධ අතට පෙරළීමෙන් ම දතයුතුයි.

දහතුන්වන සූත්‍රයයි.

කස්සප සංයුත්තය නිමාවට පත්විය.

16. 1. 1.

ලාභසත්කාර සංයුත්තයේ පළමු සූත්‍රය "දාරුණෝ" යනු තද වූ දරුණු වූ යනුයි. "**ලාභසකකාර සිලොකො**" මෙහි "ලාභය" නම් සිවුපස ලාභයයි. "සත්කාරය" නම් මනාසේ සකස් කළ, මනාව පිළියෙල කළ ලාභයයි. "සිලොක" යනු කීර්ති ඝෝෂාවයි. "කටුකො" යනු තියුණුය. "ඵරුසො" යනු කර්කෂය. "අනතරායිකො" යනු අන්තරායක් කරයි.

පළමු සූත්‍රයයි.

16. 1. 2.

දෙවන සූත්‍රයේ "බාළිසිකො" යනු බිලිපිත්තක් ගෙන හැසිරෙන මසුන් මරන්නායි. "ආමිසගතං" යනු ආහාරමය ඇමයි. "ආමිස චකඛු" යනු ආහාරයේම පැවති ඇසේ දර්ශනය ඇති තැනැත්තා. "ආමිස චක්ඛු" නම් වේ. "**ගිළ බළිසො**" යනු ගිලින ලද බිලිය ඇති යනුයි. "අනයං **අපනෙනා**" යනු දුකට පැමිණියේ යනුයි. "ව්‍යසනං ආපනෙනා" යනු ව්‍යසනයට පැමිණියේ යනුයි. "**යථාකාම කරණීයො**" යනු කැමති පරිදි-රිසි සේ යනුයි. යම්සේ බිලිබාන්නා කැමති වේ. ඒ අයුරින් ඔහුට කළහැකි වේ. "**යථාකාම කරණීයො මාරස්ස**" යනු ක්ලේශ මාරයාට රිසි දේ කළ හැකි වේ. නිරයට හෝ ප්‍රේත යෝනියට හෝ තිරිසන් යෝනියට හෝ කැමති තැනකට පමුණුවන්නේය.

දෙවන සූත්‍රයයි.

16. 1. 3-4

තෙවැනි සූත්‍රයේ "**මහාකුමමකුලං**" මහත් වූ ඇටකැස්බා කුලයක් යනුයි. "**අගමාසි**" යනු ඒකාන්තයෙන් මෙහි කිසියම් කෑයුතු දෙයක් ඇතැයි, ඒ පිළිබඳ මසුරුකමින් මට එය නැතිවේය යන සංඥාවෙන් ගියේය යනුයි. "**පපතාය**" යනු වැටුණේය යනුයි. දිගු රැහැනකින් බැඳි යකඩ කොපුවක දණ්ඩක් ඇතුලු කර තනාගත් මුදුනෙහි හිලක් යෙදූ ගල් කඩුව-යකඩ කටුව, යමකට වේගයෙන් වැටී පිටපැත්තෙහි ඇලුණු මොහොතේ දණ්ඩක් නික්මී රැහැණින් එකට බැඳී යයි. "සො කුමෙමා"

යනු ඒ ළදරු කැස්බෑවාය. "**යෙන සො කුමෙමා**" යනු ජලයේ ශබ්දය අසා සැක සහිත තැනක් වන්නේ යැයි නැවතී සිටී තමාට යහපත කැමති කැස්බෑවාය. "**තදානි ත්වං අමහාකං**" යනු දැන් නුඹ අපගේ සතුරන් අතට ගියේය. අපට අයත් නොවේ යන අර්ථයි. මෙසේ ඔවුහු කථාකරමින් සිටියදීම නැවේ සිටි වැද්දා රහැන ඇද, කැස්බෑවා ගෙන කැමති දෙයක් කළේය.

මෙම අර්ථය ම සිවුවන සූත්‍රයේදී ද දතයුතුයි.

තෙවන හා සිවුවන සූත්‍රයන් ය.

16. 1. 5.

පස්වන සූත්‍රයේ - "එළකා" යනු අශුචි කා ජීවත්වන සත්ත්‍වය. "ගූථාදී" යනු අශුචි කන යනුයි. "ගූථ පුරා" යනු ඇතුල අශුචියෙන් බරවූ යනුයි. "**පුණණා ගූථස්ස**" යනු මෙය මුල්පදයේම අර්ථය දැක්වීමකි. "**අතිමඤ්ඤැඤ්ඤය්‍ය**" යනු පසුපාදයෙන් බිම හිඳ, පෙර පාදයෙන් අශුචි මතුපිටට නැඟ සිටගෙන - "මම වනාහී අශුචිවලින් පිරුණේයැ"යි කියමින් සෙසු පණුවන් ඉක්මවා සිතයි. "**පිණඩපාතො වසස පූරො**" යනු ඔහුගේ පාත්‍රය පිරී ප්‍රණීත පිණ්ඩපාතය ලැබුණේ වෙයි.

පස්වන සූත්‍රයයි.

16. 1. 6.

සයවන සූත්‍රයේ "**කං භිකඛවෙ! අසනි විචකකං**" යනු "මහණෙනි! කවර පුද්ගලයෙක් මත වැටී මඩිමින් විනාශවන හෙනගුලිය එන්නේද?" යනුයි. "**අපපතත මානස**" යනු රහත්බව අවබෝධ නොකළ යනුයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ සත්ත්‍වයන්ගේ දුක්සහගත කාමයේ ආදීනව දැක්වීමට පමණක්ම මෙය නොදෙසූහ. හෙනගුලියක් හිසමත වැටුනහුගේ එක් ආත්මභාවයක් පමණක් විනාශ වේ. ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාදියේ ඇලුණු සිත් ඇත්තා නිරයාදියෙහි ආත්මභාව ගණනාවක් අනන්ත දුක් විඳියි.

සයවන සූත්‍රයයි.

16. 1. 7.

සත්වන සූත්‍රයේ "දිඬගතෙන" යනු විෂ පොවන ලද යනුයි. "විසලෙලන" යනු විෂ ආලේප කරන ලද හුලෙන්. සැතෙන්. ආයුධයෙන් යන අර්ථයි.

සත්වන සූත්‍රයයි.

16. 1. 8.

අටවන සූත්‍රයේ "සිඟාලො" යනු ජරාවට පත් සිවලාය. යම්සේ රන්වන් වූ ශරීරයත් කුණු ශරීරයක්ම වේ. එකෙණෙහිම ගත්තා වූ මුත්‍ර පවා "කුණු වූ මුත්‍ර" නම් වේ. මෙලෙස එදිනම උපන් සිවලාත් "මහළු වූ සිවලෙකි"යි දැක්විණි. "**උකකණ්ඨකෙන නාම**" එනම් ඇති රෝගයෙන්. එය ශීත කාලයේ සෑදෙන්නකි. එය වැළඳුණුවිට මුලු ශරීරයේම ලෝම හැලෙයි. සිරුරේ ලොම් නැතුව හාත්පස ස්පර්ශ කරයි. සුලං වැදී තුවාල වේදනා දෙයි. පිස්සු බල්ලෙකු විසින් හපා කන ලද මිනිසෙකු මෙන් ස්ථීර නොවූයේ, එහෙ-මෙහෙ හැසිරේ. මෙම රෝගය උපන් කල්හි මෙසේ කැරකීම හා ඇවිදීම ඇතිවේ. අසුවල් තැන සැපක් ඇතිවේයැයි නොවැටහේ.

අටවන සූත්‍රයයි.

16. 1. 9.

නවවන සූත්‍රයේ "**වෙරම්බ වාතා**" යනු එනම් වූ නම් ඇති මහ සුලඟයි. මේ සුලඟ කවර තැනක හමන්නේද? යම්තැනකදී සතරමහා දිවයින් උපුල්පතක් මෙන් පෙනෙන්නේද (ඉහල අහසේ) එබඳු තැන මේ සුලඟ හමයි. "**යො පකඛී ගචඡති**" යනු අලුතින් වැසි වැටුණු කල්හි නද දෙමින් සුලං කුරුල්ලෝ එහි පියඹා යති. එනිසා මෙය කියන ලදී. "**අරකඛිතෙනෙව කායෙන**" යනාදියෙහි අත්පාවලින් ක්‍රීඩාකරන - කොඳු ඇට නවන ස්වභාවය, "කය නොරැකීම" නම් වේ. නානාප්‍රකාර අසභ්‍ය වදන් කථාකිරීම "වචන නොරැකීම" නම් වේ. කාම විතර්කාදිය විතර්කනය

කිරීම "සිත නොරැකීම" නම් වේ. "**අනුපට්ඨානාය සතියා**" යනු කායගතාසතිය නොපිහිටුවාය.

නවවන සූත්‍රය යි.

16. 1. 10.

දසවන සූත්‍රයේ "අසකකාරෙන වූභයං" යනු අසකකාරෙන ච උභයෙන සත්කාර කිරීමෙන්ද අසත්කාර කිරීමෙන්ද යනුයි. "**සමාධී**" යනු අර්හත්ඵල සමාධියයි. ඔහු එයින් කම්පා නොවේ. "**අපපමාණ විහාරිතො**" යනු අප්‍රමාණ වූ ඵලසමාධියෙන් යුක්තව වාසය කරන්නාටය. "**සාතතිකං**" යනු නිතර ක්‍රියාකරන්නාය. "සුඛුමදිට්ඨි විපසසකං" යනු අර්හත් මාර්ග දෘෂ්ටියෙන්, සූක්ෂම දෘෂ්ටියෙන් ඵල සමාපත්තිය සඳහා විදර්ශනාව වඩා, විදර්ශනාවට පැමිණි බැවින්. "උපාදානකඛයාරාමං" යනු උපාදානක්ෂය නම් වූ නිවණෙහි ඇලුණු යනුයි. "ආහු සපපුරිසො ඉති" යනු සත්පුරුෂයෙක් යැයි කියති.

දසවන සූත්‍රයයි.

පළමු වර්ගය නිමියේ ය.

16. 2. 1.

දෙවැනි වර්ගයේ පළමු සූත්‍රය - "**සමපජාන මුසා භාසනතං**" යනු අල්පමාත්‍ර වූ කාරණයකින් ද දැන දැනම බොරු කියන. "සිල් පුරවන්නෙමි"යි යොදාගත් භික්ෂුව මහමෙර පමණ ප්‍රත්‍ය රැසක් නිසාවත් සෙලවීමට නොහැක. යම්විටෙක සිලය අත්හැර ලාභ සත්කාර ඇසුරු කරන්නේද එවිට සහල් කුඩු මිටක් නිසාද බොරු කියන්නේය. අනිකුත් නොකටයුතු දැඩ සිදු කරන්නේය.

පළමු සූත්‍රයයි.

16. 2. 2.

දෙවැනි සූත්‍රයේ අර්ථ ඉතා ප්‍රකටය.

දෙවැනි සූත්‍රයයි.

16. 2. 3-10.

තෙවැනි සූත්‍රයේ සිට "**සුවණ්ණ නිකඛසස**" යනු එක්තරා රනින් නිමකරන ලද කාසි වර්ගයකි. "**සිංගී නිකඛසස**" යනු සිඟුරන් කාසියකි. "**පඨවියා**" යනු සක්වල ඇතුලත වූ මහපොළවේය. "**ආමිසකිඤ්චිකඛහෙතු**" යනු කිසියම් ආහාරයක් හේතුකරගෙනය. යටත් පිරිසෙන් කුඩුසහල් මිටක් හෝ හේතුවෙන්. "**ජීවිතහෙතු**" යනු කැලයේ දී සොරු විසින් අල්ලාගෙන දිවි තොර කරන කල්හිය. ඒ හේතුවෙන්වත් "**ජනපද කල්‍යාණියා**" යනු ජනපදයේ උතුම් ස්ත්‍රියයි.

දෙවැනි වර්ගය නිමියේය.

16. 3. 1.

තෙවැනි වර්ගයේ පළමු සූත්‍රය - "**නතසස භිකඛවෙ මාතුගාමො**" යනු එහි රහසිගත වූ, හුදකලාව හුන් තැනැත්තාටය. යමකුගේ සිත ලාභසත්කාර, කීර්ති ප්‍රශංසාදියෙහි නියැලීමෙන් විනාශවීමට යන්නේ ද එවැනි වූ බරපතල විනාශයක්, ස්ත්‍රියක් ඔහුගේ සිත ගැනීමෙන්, එම ධර්මයෙහි යෙදීමෙන් සිදු නොකරයි.

පළමු සූත්‍රය යි.

16. 3. 2.

දෙවැනි සූත්‍රයේ අර්ථ ඉතා ප්‍රකටය

දෙවැනි සූත්‍රයයි.

16. 3. 3.

තෙවැනි සූත්‍රයේ - "**සද්ධා**" යනු සෝතාපන්න වූ. ඉතිරි පදයන්ගේ අර්ථ ඉතා ප්‍රකටය.

තෙවැනි සූත්‍රය යි.

16. 3. 4-6.

සතරවන, පස්වන හා සයවන සූත්‍රවල ද අර්ථ එසේම ඉතා ප්‍රකටය.

16. 3. 7.

සත්වන සූත්‍රයේ - "**සමුදයං**" යනාදියේ පූර්ව කර්මයත් සමගම; සිටුපුතෙක් බඳු ආත්මභාවයේ කීර්ති ප්‍රශංසා, සුන්දරත්වය, යහපත් කටීක හැකියාව, ස්ථිර ගුණ පැතිරවීම්, පිරිවර සම්පත් මේ ආදී ලාභ සත්කාරයන්ගේ හටගැනීමයි. සමුදය ප්‍රත්‍ය වශයෙන් නොදනිති. නිරෝධය ද ප්‍රතිපදාව ද නිරෝධ සත්‍යය හා මාර්ග සත්‍යය ලෙසම දතයුතුයි.

සත්වන සූත්‍රය යි.

16. 3. 8.

අටවන සූත්‍රයේ - යම්හෙයකින් ලාභසත්කාර **කීර්ති** ප්‍රශංසා නිසා නරකාදියෙහි උපදින්නෝ මුලුමහත් අත්බවම නසාගනිති. මෙලොවදීද මරණයට හෝ මරණ සමාන දුකට පත්වෙති. එනිසා "**ජීවිතං ජීහදති**" යනාදිය කියන ලදී.

අටවන සූත්‍රයයි.

16. 3. 9.

නවවන සූත්‍රයේ "**වාළ රජ්ජුයා**" ය නු නූල් ආදියෙන් කරන ලද

රැහැන මෘදු හෝ සියුම් වේ. දළ අස්කෙඳි රැහැන කර්කෂ වේ. පරුෂය. එනිසා මෙම නූලම ගන්නා ලදී.

නවවන සූත්‍රය යි.

16. 3. 10.

දසවන සූත්‍රයේ - "දිටඨධම්ම සුඛ විහාරා" යනු ඵලසමවත් සුවයෙන් වසන යනුයි. "**තෙසාහමසස**" යනු "**තෙසං අහං අසස**" යනුයි.

රහතන් වහන්සේ වනාහී ප්‍රත්‍ය ලබනුයේ, පිනින් යුක්ත වූයේ වෙයි. කැඳබත් කැවිලි ආදිය රැගෙන පැමිණි පුද්ගලයන්ට පුණ්‍යානුමෝදනා කරන සේක. ධර්මදේශනා කරමින් ප්‍රශ්න විසඳන සේක. ඵල සමවතට නොඑළඹ සිටීමට ඉඩකඩ නොදෙයි. එම කරුණ සඳහා මෙය කියන ලදී.

දසවන සූත්‍රයයි.

තෙවැනි වර්ගය නිමියේය.

16. 4. 1.

සතරවන වර්ගයේ පළමු සූත්‍රයෙහි අර්ථ ඉතා ප්‍රකටය.

පළමු සූත්‍රයයි.

16. 4. 2-4.

දෙවැනි සූත්‍රයේ සිට "**කුසලමූලං**" යනු අලෝභය ආදී ත්‍රිවිධ වූ කුසල මූලයන් ය. "**සුක්කා ධම්මා**" යනු එහි පර්යාය දේශනාවකි. සමාන වදනකි. මෙහි සංක්ෂිප්ත අර්ථය මෙසේය. යම් කුශල මූල නම් වූ නිවැරදි ධර්මයක් විනාශ නොකළාහු නම් දේවදත්ත දෙව්ලොව හෝ උපදින්නේය. මගඵලයක් හෝ ලබා ගන්නේය. ඔහු මේ සෑම දෙයක් ම විනාශ කරදමා - සෑම අතින්ම විනාශයට පත්විය. නැසීමට පැමිණියේය.

16. 4. 5.

පස්වන සූත්‍රයේ "**හතනාභිහාරෝ**" යනු ඉදිරියට ගෙන යායුතු බතයි. එහි ප්‍රමාණය දැක්වීමට "**පඤ්ච ථාලිපාකසතානි**"යි කියන ලදී. එහි එක් බත් සැලියක පුරුෂයන් දසදෙනෙකුට ප්‍රමාණවත් බත් ඇත. "නාසාය පිත්තං භින්දෙය්‍යුං" යනු වලස් පිත හෝ මත්ස්‍ය පිත ඔහුගේ නාසා පුටයෙහි දමන්නේය යනුයි.

සයවන සූත්‍රයයි.

16. 4. 7.

සත්වන සූත්‍රයේ - "මාතුපි හෙතූ" යනු "ඉදින් බොරු කියන්නෙහි නම් නුඹගේ මව අත්හරිමු. නොකියන්නෙහි නම් අත් නොහරිමු"යි මෙසේ සොරු විසින් කැළයේ දී ප්‍රශ්න කරන ලදුව, ඒ සොරු අතට පත් මැණියන් හේතුවෙන්ද "දැන දැන බොරුකීම නොකරන්නේය" යන අර්ථයි. සෙසු සූත්‍රයන්හිද මේ ක්‍රමයෙන් අර්ථ දතයුතුයි.

සත්වන සූත්‍රයයි.

සතරවන වර්ගයයි.

ලාභසත්කාර සංයුත්තය නිමාවට පත්විය.

17. 1. 1.

රාහුල සංයුත්තයේ පළමු සූත්‍රයේ - "**එකො**" යනු සිවු ඉරියව්වෙහිම එකම විහරණයකින් යුක්තවයි. "**වූපකට්ඨො**" යනු කෙලෙස්වලින් දුරුව, නිශ්ශබ්දවම යනුයි. "**අප්පමත්තො**" යනු සිහියෙන් නොවෙත් වී වෙසෙමින්ය. "**ආතාපී**" යනු වීර්යයෙන් යුක්තවයි. "**පහිතත්තො විහරෙය්‍ය**" යනු විශේෂාධිගමය පිණිස මෙහෙයූ සිත් ඇතිව වසන්නේ ය යනුයි. "**අනිච්චං**" ඉපිද නැතිවන ස්වභාවයෙන් අනිත්‍ය වූ. නැතහොත් ඉපිද නැතිවන බැවින් තාවකාලික වූ. වෙනස්වීම කෙළවර කර ඇති, නිත්‍ය බව ප්‍රතික්ෂේප වන මේ කරුණු අනුව අනිත්‍ය වූ යනුයි. "**දුක්ඛං**" යනු සිවු

කාරණයකින් දුකවේ. දුකඛමණටෙඨන (දුකය යන සිතින්) දුකඛවත්ථුකටෙඨන (දුක මූලාධාර කර ඇති බැවින්) සතත සමපීළනටෙඨන (නිතර පෙළීමට පත්වන අර්ථයෙන්) සුඛ පටිපකෙඛන (සැපට ප්‍රතිවිරුද්ධ වූ අරුතින්). "**කලලං**"යනු සුදුසුය. "**එතං මම**" යනු තණ්හාවෙන් ගැනීමයි. "**එසොහමසමි**" යනු මානයෙන් ගැනීමයි. "**එසො මෙ අත්තා**" යනු දෘෂ්ටියෙන් ගැනීමයි. මෙහි තණ්හාවෙන් ගැනීම එකසිය අටක් වූ තණ්හා ප්‍රභේද වශයෙන් ද මානයෙන් ගැනීම නවයක් වූ මාන වශයෙන් ද දෘෂ්ටියෙන් ගැනීම දෙසැටක් මිසදිටු වශයෙන්ද දතයුතුයි. "**නිබ්බිඳං විරජජති**" යනු මෙහි විරාග වශයෙන් සිවු මාර්ගය කියන ලදී. "**විරාගා විමුච්චති**" යන මෙහි විමුත්ති යනු සිවු ශ්‍රමණ ඵලයන්ය. මෙහිද පඤ්ච ද්වාරයෙහි ප්‍රසාදයම ගන්නා ලදී. "**මනො**" යනු මේ තුන් භූමියට අයත් විමසා බලන වාරයේ සිතයි.

පළමු සූත්‍රයයි.

17. 1. 2.

දෙවැනි සූත්‍රයේ - පඤ්චද්වාරයන්හි අරමුණ ම පවතියි.

දෙවන සූත්‍රයයි.

17. 1. 3.

තෙවන සූත්‍රයේ - පඤ්චද්වාරයේ මනෝ විඤ්ඤාණයෙන් ප්‍රසාද වස්තුක සිතම ලැබේ. ත්‍රෙභූමික වූ සම්මසත වාරයෙහි සිතම මෙහිදීද ගන්නා ලදී. මෙසේ සෑම තැන්හිම මෙම ක්‍රමය පැමිණවිය යුතුයි.

17. 1. 6.

සයවන සූත්‍රයේ - ත්‍රෙභූමික ධර්මයන් විස්තර වේ.

17. 1. 8

අටවන සූත්‍රයේ - "**තණ්හා**" යනු ඒ ඒ ද්වාරයේ ජවන් සිතට පැමිණීමට අවසර ලබයි.

17. 1. 9

නවවන සූත්‍රයේ - විඤ්ඤාණ ධාතු වශයෙන් "නාමං" වේ. සෙසු ධාතූන්හි "රූපං" යනුවෙන් නාමරූපයන් කියන ලදී.

17. 1. 10.

දසවන සූත්‍රයේ - රූපස්කන්ධය කාමාවචර වේ. ඉතිරි සතර ස්කන්ධය සර්ව සංග්‍රාහික පරිච්ඡේද වශයෙන් සිවුභූමික වේ. මෙම සූත්‍රයේදී ත්‍රිවිධ භූමිකයැයි ගතයුතුයි.

පළමුවර්ගය නිමියේ ය.

17. 2. 1-11

දෙවන සූත්‍රයේ සිට දසවන සූත්‍රය දක්වා අර්ථ ඉතා ප්‍රකටය.

එකොළොස්වන සූත්‍රයේ - **"ඉමස්මිඤ්ච සවිඤ්ඤාණකෙ කායෙ"** යනු තමාගේ විඤ්ඤාණය සහිත වූ කය දක්වයි. "බහිද්ධාච" යනු අනිකකුගේ සවිඤ්ඤාණක හෝ අවිඤ්ඤාණක වූ. පළමු පදයෙන් තමාගේද අනුන්ගේද සවිඤ්ඤාණකයම දක්වයි. පසුපදයෙන් පිටත ඇති ඉන්ද්‍රිය හා බැඳුණු රූපය දක්වයි. **"අහිං කාරමමිංකාරමානානුසයා"** යනු "මමය" යන අහංකාර දෘෂ්ටියත්, "මගේය" යන මමංකාර තණ්හාවත් සැඟවී පවතින මානයන් ය. **"න හොන්ති"** මේ ක්ලේශයෝ දන්නා තැනැත්තාට ඇති නොවෙති. මේ වස්තූන්හි කෙලෙස් ඇති නොවනුයේ කෙසේද?යි අසයි. **"සම්මපඤ්ඤාය පසසතො"** යනු විදර්ශනාවත් සමග මාර්ග ප්‍රඥාවෙන් මැනවින් දක්නාහටය.

එකොළොස්වන සූත්‍රයයි.

17. 2. 12.

දොළොස්වන සූත්‍රයේ - **"අහිංකාර මමිංකාර මාන පගතං"** යනු අහංකාරයෙන් ද මමංකාරයෙන් ද මානයෙන් ද පහවූ යනුයි. **"විධා**

සමතික්කනතං" යනු මාන කොටියාසයන් මනාව ඉක්මවූ. "**සනතං සුවිමුත්තං**" යනු කෙලෙස් සන්සිඳීමෙන් ශාන්ත වූ යනුයි. කෙලෙස්වලින් මනාව මිදුණු. සෙසු පදයන් අර්ථ ඉතා ප්‍රකටය.

මේ සූත්‍ර දෙකින්ම අසේඛ භූමිය කියන ලදී. පළමු සූත්‍රය රාහුල හිමියන්ගේ ආයාචනයක් ලෙස දේශිතය. දෙවැනි සූත්‍රය ආයාචනයක් අනැතුවම දේශනා කළ සේක. මුළු රාහුල සංයුත්තයේ සෑම සූත්‍රයක්ම රාහුල හිමියන්ගේ විමුක්තිය මුහුකුරවා යෑම පිණිස ම දෙසූ බව වටහාගත යුතුයි.

රාහුල සංයුත්තය නිමියේය.

18. 1. 1

ලක්ඛණ සංයුත්තයේ - යමෙක් මේ "ආයසමාච ලකඛණෝ" යනුවෙන් ලක්ඛණ තෙරුන් සඳහා කියන ලදී. උන්වහන්සේ දහසක් ජටිලයන් අතුරින් ඒහිභික්ෂු මහණ උපසම්පදාව ලබා, ආදිත්ත පරියාය සූත්‍ර දේශනාවසානයේ රහත් බවට පත්වූ එක් මහා ශ්‍රාවකයෙකි. ලක්ෂණ සියල්ලෙන්ම, සර්වාකාරයෙන්ම බ්‍රහ්මයකු බඳු පිරිපුන් ආත්මභාවයක් ලබන ලද බැවින් 'ලක්ඛණ' යන නාමය ගිහි ගෙයිදී ලැබුණි. මහමුගලන් තෙරුන් වහන්සේ පැවිදිවී සත්වැනි දින රහත් වූ ගෞතම බුද්ධ ශාසනයේ දෙවැනි මහා ශ්‍රාවකයා වෙති. "**සීතං පාතෝකාසී**" යනු මද සිනහ පහළ කළේය. ප්‍රකාශ කළේය. දක්වීය යනුයි. කුමක් දකීම නිසා තෙරුන් වහන්සේ සිනහ පහළ කළසේක්ද? ත්‍රිපිටක බුදුවදනෙහි එන එක් ඇටසැකිල්ලක් බඳු ප්‍රේතලොව උපන් සත්ත්වයකු දැකීමෙනි. එය හුදෙක් දිවැසින් ම දක්නා ලද සේක. මසැසින් නොවේ. මසැසට මෙම ආත්ම භාවයන් ගෝචර නොවේ. මෙබඳු ආත්ම භාවයක් දැක කරුණාව දැක්විය යුතුව තිබියදී සිනහසුණේ ඇයි? තමන් වහන්සේගේද බුද්ධ ඥානයේද හේතුසම්පත් සිහිකිරීමෙන්, මෙම ප්‍රේතයා දැක තෙරුන්වහන්සේට, "නොදක්නා ලද සත්‍යය නමැති පුද්ගලයාගේ ලැබීම හේතුවෙන් මෙබඳු ආත්මභාවයෙන් මම මිදුනෙමි. මට වූයේ ලාභයෙක. මට වූයේ යහපතකි"යි තමාගේ සම්පත් සිහිකර, අනේ භාග්‍යවත් සම්මා සම්බුදුපියාණන්ගේ ඥාණ සම්පත්තිය මහා පුදුමයකි. "මහණෙනි! කර්ම විපාක පිළිබඳව

සිතිය නොහැක. එනිසා ඒ පිළිබඳව නොසිතිය යුතුයි." යනුවෙන් යම් දහම් කරුණක් දැක්වූ සේක්ද එය ප්‍රත්‍යක්ෂයෙන් ම දැන් උන්වහන්සේ දේශනා කළ සේක. මෙලෙස බුද්ධඤාණ සම්පත්තිය ද සිහිපත් කිරීමෙන් සිනහසුණු සේක. එකල්හි ලක්ඛණ තෙරුන් කුමක් නිසා මෙය නොදුටුවේද? උන්වහන්සේට දිවැස් නැතිද? දිවැස් ඇත. මහමුගලන් තෙරුන් ආවර්ජනය කළ නිසා එම ප්‍රේතරුව දුටුවේය. රහතන් වහන්සේලා කරුණක් නොමැතිව සිනා පහළ නොකරති. එබැවින් ලක්ඛණ තෙරණුවෝ **"කොනුඩෝ ආවුසෝ මොග්ගල්ලාන හෙතුකෝ පච්චයෝ සීතසස පාතු කම්මාය"** යනුවෙන් මේ කරුණු විමසූහ. මුගලන් තෙරණුවෝ මෙම ප්‍රේත සත්ත්වයාගේ උපත නොදුටු සෙසු මහජනයා විසින් මෙකරුණ අවබෝධ කරගැනීම අපහසු හෙයින්, භාග්‍යවතුන් වහන්සේම සාක්ෂි කරමින් විවරණය කරනු කැමති වූහ. "අකාලෝ ඛෝ ආවුසෝ" යනාදිය එනිසා වදාළහ. ඉක්බිති බුදුරදුන් සමීපයේදී ලක්ඛණ තෙරුන් විසින් මෙම කාරණය විමසූවිට "ඉධාහං ආවුසෝ" යනුවෙන් සිනහ පහළ කිරීමට හේතුවිස්තර කරන ලදී.

එහි "අට්ඨිසංඛලිකං" යනු ප්‍රේතයෙකි. මස්, ලේ නැති ඇටසැකිල්ලකි. "ගිජ්ඣාපි කාකාපි කුළලාපි" යනු මේ යක්ෂ ගිජුලිහිණියෝය. යක්ෂ කපුටෝය. යක්ෂ උකුස්සෝය. මෙසේ අවබෝධ කරගත යුතුයි. ස්වාභාවික ගිජුලිහිණි ආදිහු මෙසේ ඉදිරියට නොඑති.

"අනුපතිත්වා අනුපතිත්වා" යනු ලුහුබැඳ, ලුහුබැඳ ගොස් යනුයි. "විදනති" යනු කඩුපත් මෙන් තියුණු වූ ලෝහ කුඩුවලින් විදිමින් එහෙන් මෙහෙන් කඩා කමින් යයි යනුයි. "**සා සුදං අට්ඨසසරං කරොති**" යන මෙහි "සුදං" යනු නිපාතයකි. "ඒ ඇටසැකිල්ල බැගෑපත්ව හඬන්නෙකු, රෝගී ආතුරයෙකු කරයි" යන අර්ථයි. අකුසල විපාකයන්ගේ ආනුභාවයෙන් යොදුනක් පමණ වූ ද එබඳු ආත්මභාවයක් උපන්නේ යැයි (පහළ වියැයි) ශ්‍රද්ධාවද කළකිරීමද ඇතිවේ. පැසුණු පිළිකාවක් වැනි වූ ඒ ඇටසැකිල්ල බලවත් වේදනාවෙන් ආතුර වී එබඳු ශබ්දයක් කරන ලදී. මෙසේ වදාළ ආයුෂ්මත් මහ මුගලන් තෙරණුවෝ, සසර පවතින සත්ත්වයන්ගේ මෙබඳු ආත්මභාවයන්ට පැමිණීම සුලභයැයි සත්ත්වයන් කෙරෙහි හටගත් කරුණාවෙන් උපන් ධර්ම සංවේගයන් දක්වන සේක් **"තසස මයහං ආවුසෝ!, එතදහොසි. අච්ඡරියං වතහො"** යනාදිය දෙසූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ, තෙරුන්ගේ ආනුභාවය පවසන සේක්, **"චක්ඛු භූතා වත භික්ඛවෙ සාවකා විහරනති"** යනාදිය දෙසූහ. එහි "ඇසෙහි වූ"

(චකඛු භූතං) උපන්-පහළ වූ මේ භික්ෂූහු. උපන් දිවැස් ඇති. දිවැස උපදවා වාසය කරයි යන අර්ථයි. දෙවැනි පදයෙහි ද (ඤාණභූතා) මේ ක්‍රමයමය.

"**යත්‍ර හි නාම**" යන මෙහි "**යත්‍ර**" යනු කාරණය-හේතුව දක්වන වචනයකි. මෙහි මේ අර්ථ යෝජනාවයි. යම්බඳු ශ්‍රාවකයෙක් ද මෙබන්දෙකු පිළිබඳව දනිද දකිද සාක්ෂියක් දීම හෝ කරයි ද එනිසා කියන ලදී. "මහණෙනි! ඒකාන්තයෙන් මේ බුදු සසුනෙහි දිවැස් ඇති භික්ෂූහු වෙසෙති. දිව නැණ ඇති භික්ෂූහු වෙසෙති" යනුවෙන්. "**පුබෙබව මෙ සො භිකඛවෙ! සතෙතා දිටෙඨා**" යනු බෝමැඩදී සර්වඥ ඥානය අවබෝධ කරගත් කල්හි, අප්‍රමාණ වූ සක්වල අප්‍රමාණ වූ සත්ව ලෝකවල භව, ගති, ඨිති (භවය, ඉපදීම, පැවැත්ම) හා වාසය ද ප්‍රත්‍යක්ෂව බලන්නා වූ ම විසින් පෙරදීම මේ සත්ත්වයා දක්නා ලදයි පැවසූහ. "ගොඝාතකො" යනු ගවයන් මරා ඇටවලින් මස් මුදා විකුණා ජීවත්වන මනුෂ්‍යයෙකි. "**තසෙසව කම්මස්ස විපාකාවසෙසෙන**" යනු ඒ නානාවිධ චේතනාවන්ගෙන් රැස් කරන ලද අපරාපරිය කර්මයේය. එහි යම් චේතනාවකින් නිරයේ පිළිසිඳ ගෙන එහි විපාක නිමවූ කල්හි ඉතිරි කර්ම හෝ කර්ම නිමිති හෝ අරමුණු කරගෙන, නැවත ප්‍රේතාදියෙහි ප්‍රතිසන්ධිය පහළ වේ. එනිසා ඒ ප්‍රතිසන්ධිය කර්මට සමාන වූ බැවින් ද අරමුණට සමාන වූ බැවින්ද ඒ කර්මයාගේම ඉතිරි විපාකයෝ යැයි කියයි. මේ සත්වයාද මෙසේ උපන්නේය. එනිසා කියන ලදී. "**තසෙසව කම්මස්ස විපාකාවසෙසෙන**" (ඒ කර්මයේම ඉතිරි විපාක වශයෙන්) යනුවෙනි. ඔහුට නිරයෙන් චුතවන විටදී මස් උපුටාගත් ගොනුන්ගේ ඇටසැකිල්ලම නිමිති විය. ඔහු සැඟවුණු ඒ කර්මය නුවණැත්තන්ට ප්‍රකට කරන්නාක් මෙන් "**අටඨි සංඛලිකපෙතො**" ඇටසැකිලි ප්‍රේතයකුව උපන්නේය.

18. 1. 2.

මංසපේසි වස්තුවෙහි - ඒ ගවඝාතකයා ගවමස් පෙති කපා වියලා, වියලි මස් ලෙස විකුණමින් වර්ෂ ගණනක් ජීවත් විය. ඔහු නිරයෙන් චුතවන විටදී මස් පෙත්තක්ම නිමිති විය. එනිසා ඔහු "**මංසපෙසි පෙතො**" මස්පෙති ප්‍රේතයෙක්ව උපන්නේය.

18. 1. 3.

මංසපිණ්ඩ වස්තුවෙහි - ඒ කුරුලු මරන්නා කුරුල්ලන් අල්ලා විකුණන කාලයේ පියාපත්, සම් ඉවත්කර මස්පිඬු පමණක් කර විකුණමින් ජීවත් විය. එනිසා ඔහු නිරයෙන් චුතවන විටදී මස් පිඬක්ම නිමිති විය. ඔහු "**මංසපිණ්ඩපෙතො**" මස් පිඬු ප්‍රේතයෙක් විය.

18. 1. 4.

නිච්ඡවි වස්තුවෙහි - ඒ බැටළු වැද්දා එළුවන් මරා, සම ඉවත්කරවා විකුණා ජීවත් විය. පෙර කී පරිදිම ඔහුට සම් නැති එළු සිරුරක් නිමිති විය. ඔහු "**නිච්ඡවිපෙතො**" සම නැති ප්‍රේතයෙක්ව උපන්නේය.

18. 1. 5.

අසිලෝම වස්තුවෙහි - ඒ ඌරු වැද්දා බොහෝ කලක් සත්ව කෑම කා තරවූ ඌරන් කඩුවෙන් ගසා මරා, බොහෝ කලක් ජීවත් විය. ඔහුට ඔසවන ලද කඩුවම නිමිති විය. එනිසා ඔහු "**අසිලොම පෙතො**" කඩුමුවහත් ලෝම ඇති ප්‍රේතයෙක්ව උපන්නේය.

18. 1. 6.

සත්තිලෝම වස්තුවෙහි - ඒ මුව වැද්දා එක් මුවෙක් ද ආයුධයක් ද (සැතක්-ශස්ත්‍රයක්) එකමගක් ඇති වනයට පිවිස, ඒ මුවාගේ ලඟට එන-එන මුවා සැතින් විද මරයි. ඔහුට සැතින් විදින අවස්ථාවම නිමිති විය. එනිසා ඔහු "**සතතිලොම පෙතො**" සැත්මුවා ලොම් ඇති ප්‍රේතයෙක්ව උපන්නේය.

18. 1. 7.

උසුලෝම වස්තුවෙහි - "**කාරණිකො**" යනු රාජ අපරාධකරුවන් නානාවිධ කරුණුවලින් පීඩාවට පත්කර, අවසන ඊතලයෙන් විද මරන්නා වූ පුරුෂයායි. ඔහු අසුවල් පෙදෙසට විද මරනනේ යැයි දැන දැන ම විදියි. ඔහු මෙසේ ජීවත් වී, නිරයේ ඉපදී, ඉන් පැසී ඉතිරි වූ කර්ම බලයෙන්

මෙහි උපදින විට, ඊතලයෙන් විදින බවම නිමිති විය. එනිසා "උසුලොම පෙතො" හී මෙන් වූ ලොම් ඇති ප්‍රේතයෙක්ව උපන්නේය.

18. 1. 8.

සුචිලෝම වස්තුවෙහි - "සූතො" යනු අශ්වයන් දමනය කරන, ගවයන් දමනය කරන්නෙකු"යැයි කියන්මය. ඔහුට කෙවිටි යකඩකුරින් විදින බවම නිමිති විය. එනිසා "සුචිලොමපෙතො" ඉදිකටු ලොම් ඇති ප්‍රේතයෙක්ව උපන්නේය.

18. 1. 9.

දෙවැනි සුචිලෝම වස්තුවෙහි "සූචකො" යනු කේලාම් කියන්නෙකි. ඔහු පෙර මිනිස්සු ඔවුනොවුන් කෙරෙහි බිඳුවිය. රජ පවුලෙහිද මෙනම් ඇත්තෝ ඇත. මොහුට මේ නම අස, අසා (සුචෙත්‍රා, සුචෙත්‍රා) ව්‍යසනයට පමුණුවන බැවින් තබන ලදී. එහෙත් මෙහෙන් අසන දෙයින් මිනිස්සු බිඳෙති. එසේ ඉදිකටුවලින් අනින්නාක් මෙන් දුක් අනුභව කරන මේ කර්මයම නිමිති කරගෙන "සුචිලොම පෙතො" ඉදිකටුලෝම සහිත ප්‍රේතයා උපන්නේය.

18. 1. 10

අණ්ඩභාරි වස්තුවෙහි - (කුම්භණ්ඩ සූත්‍රය) "ගාමකූටො" යනු විනිශ්චය කරන ඇමතියායි. ඔහුට කළ කර්මය අනුවම කළයක් පමණ වූ මහා ඝටයක් පමණ වූ අණ්ඩකෝෂයෝ වූහ. ඔහු යම් සැඟවුණු තැනකදී අල්ලස් ගෙන කපටි විනිශ්චයේදී දොස් වසමින් වස්තු හිමියන්ට වස්තු අහිමි කළේය. එනිසා ඔහුගේ රහසඟ ප්‍රකටව පෙනෙන සේ පහළ විය. යම්හෙයකින් දඩ පිහිටුවමින් අනුන්ගේ නොඉවසිය හැකි බර පැටවීය. එනිසා ඔහුගේ රහසඟ නොඉසිලිය හැකි බරින් යුක්තව පහළ විය. යම්තැනක සිටි සමාන වූ අදහස් ඇත්තන්, එහි හිඳ විසම වූවන් කළේ ද එහි විපාක වශයෙන් ඔහුගේ රහසඟ විෂම වී හිඳගත්තේ වේ.

පළමු වර්ගය නිම විය.

18. 2. 1.

පාරදාරික වස්තුවෙහි - ඒ පුද්ගලයා අනිකකු විසින් රක්නා ලද, ආරක්ෂා කළ සැමියා සහිත අඹුවන්ගේ පහස ලබමින් අසුචි සැපයෙහි, කාම සැපයෙහි සිත් අලවා විසූ කර්මයට සුදුසු පරිදිම අසුචිවල ස්පර්ශය ලබමින් දුක් අනුභව කිරීමට එහි පහළ විය.

18. 2. 2.

දුටිය බ්‍රාහ්මණ වස්තුව - මෙහි අර්ථ ප්‍රකටය. (දුෂ්ට බමුණු කථාව)

18. 2. 3.

'නිච්ඡවිත්ථී (සම නැති ස්ත්‍රියගේ) වස්තුවෙහි - යම් හෙයකින් ස්ත්‍රිය නම් තමාගේ ස්පර්ශයෙහි අස්වාමිකව, ස්වාමියාට අයත් ස්පර්ශය සොරකම් කර, වෙනත් අයෙකුට කැමැත්ත ඉපිදවූවාය. ඒ කර්මයට සුදුසු පරිදි සැප ස්පර්ශයෙන් මිදී දුක්ඛිත ස්පර්ශයක් විඳීමට සමක් නැති ස්ත්‍රියක්ව උපන්නීය.

18. 2. 4.

මංකුළිත්ථී (පිළිකුල් ස්ත්‍රියගේ) වස්තුවෙහි - **"මංකුලිං"** (මංගුලි) යනු විරූපී වූ, දැකීම අපහසු වූ, බියජනක වූ. ඇය පෙර යක්ෂ-දේව දාසියක්ව මේ මේ අයුරින් මෙසේ බලිකර්ම කලවිට, නුඹලාගේ මෙනම් දෙය වැඩෙන්නේ යැයි මහජනයාගේ ගඳමල් ආදී පුදපූජා ගනිමින් - ඔවුන් රවටා, මහජනයාට නපුරු දෘෂ්ටියක්, මිථ්‍යා දෘෂ්ටියක් ඇතිකරවූවාය. එනිසා ඇයට ඒ කර්මයට සමාන වූ ලෙස, ගඳමල් වංචාවෙන් ගත් බැවින් අතිශය දුර්ගන්ධයක්ද නපුරු පිළිගැනීම් ඇතිකරවූ නිසා බැලීමට අපහසු, විරූපී, පිළිකුල් සහගත රුවක් ඇතිව ඉපදුනාය.

18. 2. 5.

ඔකිලිනි වස්තුවෙහි **"උපකකං ඔකිලිනිං ඔකිරිණි"**. ඇය අඟුරු චිතකයෙහි හොත්තී දඟලන්නී-පෙරලෙන්නී පැසුනීය. එනිසා ඉදිමී ගිය

එමෙන්ම උණු ගින්නෙන පැසුණු ශරීර ඇත්ති, ඩැහැගෙන වැටෙන ගිනිඅඟුරු ඇති සිරුරින් දහඩිය බිඳු වැගිරෙන ගිනියම් වූ සිරුරක් ඇති. ඇගේ පාවලින්ද දෙපැත්තෙන් මුදුනින්ද ඇවිලුණු කිහිරිමල් පාට ඇති ගිනිජාලා මගින් අඟුරු සැම අතටම විසිකරයි. එනිසා "උපකකං ඔකිලිනං ඔකිරී" යනු රජුගේ එක් නාටක ස්ත්‍රියකි. අඟුරු කටාරමක් ලඟින් තබාගෙන ඇඟ ජලයෙන් පිසදමයි. අතින්ද දහඩිය වගුරුවයි. මෙසේ රජුට උවටැන් කරන ඇය සමග රජු කථා කළේය. ඇගෙන් සතුටුවූ බවද දැක්වීය. අගමෙහෙසිය මෙය නො ඉවසන්නී, රජු ගිය නොබෝ වේලාවකින් නාටක ස්ත්‍රිය වෙත පැමිණ ඒ අඟුරු කටාරම ගෙන ඇගේ හිස මත හැලුවාය. ඇය මේ පාපකර්මය කරගෙන එහි විපාක විඳීමට මෙසේ ප්‍රේත ලෝකයේ උපන්නීය.

18. 2. 6.

චොරඝාත වස්තුවෙහි - ඔහු රජුගේ ආඥාවෙන් බොහෝකලක් සොරුන්ගේ හිස්සිඳ ප්‍රේතලෝකයේ ඉපදුනේ හිස නැති-කවන්ධ රූපයක් ලෙස පහළ විය.

18. 2. 7.

භිකඛු වස්තුවෙහි - "**පාපභිකඛූ**" පවිටු-ළාමක භික්ෂුවක්. ඔහු ජනයා විසින් ශ්‍රද්ධාවෙන් දුන් සිවුපසය අනුභව කර, කාය-වාග් ද්වාරයන්ගේ. සංවරයක් නොමැතිව බිඳුණු ආජීවයක් ඇතිව - සිතින් ක්‍රීඩා කරමින් හැසිරුණේය. ඉන්පසු එක් බුද්ධාන්තරයක් නිරයේ පැසී, ප්‍රේත ලොවෙහි ඉපදෙන විට භික්ෂුවකට සමාන අත්බවක් ලැබ ඉපදුනේය.

18. 2. 8-11

භික්ෂුණී, සිකඛමානා, සාමණේර, සාමණේරී යන වස්තූන්හි ද මෙම විනිශ්චයම දතයුතුයි.

ලක්ඛණ සංයුත්තය නිමියේය.

19. 1. 1.

ඔපම්ම සංයුත්තයේ පළමු සූත්‍රයේ - මුදුන වෙත ගමන් කරන්නේ නුයි. "**කූටංගමා**" මුදුනට එක්රැස් වේනුයි. "**කූටසමොසරණා**" නම් වේ. "**කූටසමුගඝාතා**" යනු කූටය-මුදුන බිඳියෑමෙන්ය. "**අවිජ්ජා සමුගඝාතං**" යනු අර්හත් මාර්ගයෙන් අවිද්‍යාව මුලින් උදුරා නසන ලදී. "**අපපමත්තා**" සිහියෙන් ඉවත් නොවීම සිටියේ යනුයි.

පළමු සූත්‍රයයි.

19. 1. 2.

දෙවන සූත්‍රයේ - "**මනුසෙසසු පචචාජායනති**" යනු මිනිස් ලොවින් චුතව මිනිසුන් අතර යමෙක් උපදිත්ද ඔවුහු ඉතාම අල්පය යන අදහසයි. "**අඤඤත්‍ර මනුසසහි**" යනු මිනිස්ලොවින් චුතවූ යමෙක්, එම මිනිස්ලොව හැරදමා සතර අපායෙහි උපදින්නේද එබඳු සත්ත්වයෝ මහපොළවේ පස් මෙන් බහුලය යනුයි. මේ සූත්‍රයේදී දෙවියෝ ද මිනිසුන් ලෙසම සළකන ලදී. එනිසා යම්සේ මිනිසුන් අතර උපදින්නෝ අල්ප වන්නේ ද දෙවියන් අතර ඉපදීමක් එසේම අල්ප බව දතයුතුය.

දෙවන සූත්‍රයයි.

19. 1. 3.

තෙවන සූත්‍රයේ "**සුපපධංසියානි**" යනු පහසුවෙන් විනාශ කළහැකිය යනුයි. "**කුම්භතෙථනකෙහි**" යනු යමෙක් අනුන්ගේ ගෙවල්වලට පිවිස, පහන් ආලෝකයෙන් බලා අනුන්ගේ බඩු ගෙනයනු කැමතිව, කළයක පහන දල්වාගෙන පිවිසෙත් ද ඔවුහු කුම්භතෙථනක (කළසොරු) නම් වෙති. ඔවුන් විසින් යනුයි. "**සුපපධංසියො හොති අමනුසෙසහි**" යනු මෛත්‍රී භාවනාව නැති පුද්ගලයාට පාංශු පිසාචාදීහු ද දෂ්ට කරති යනුයි. උසස් මිනිසුන්ගෙන් වන බාධා ගැන කියනු කිම? "**භාවිතා**" යනු වඩන ලදී යනුයි. "**බහුලීකතා**" ය නු නැවත නැවත කරන ලදී. "**යානිකතා**" බඳන ලද යානාවක් මෙන් කරන ලද. "**වත්‍ථුකතා**" යනු පිහිටවීම් අර්ථයෙන් වස්තුවක් මෙන් කරන ලද යනුයි. "**අනුට්ඨිතා**" යනු එළඹ සිටි, පැමිණ

සිටී යනුයි. "**පරිචිතා**" යනු හාත්පසින් පුරුදු කරන ලද යනුයි. "**සුසමාරද්ධා**" යනු සිතින් මනාව ආරම්භ කරන ලද යනුයි.

තෙවන සූත්‍රයයි.

19. 1. 4.

සිවුවන සූත්‍රයේ - "**ඔකබාසතං**" මහත් වූ මුවඇති හැළි සීයකි. "**දානං දදෙය්‍ය**" යනු ප්‍රණීත භෝජනයන්ගෙන් පිරුණු විශාල හැළි සීයකින් දන් දෙන්නේය යනුයි. "**උකකාසතං**" යන පාඨයද සුදුසුය. "එහි පන්දම් සීයක් ඇත" යන අර්ථයි. එක් පන්දමකින් යම් ප්‍රමාණයක ආලෝකය පතුරුවා සිටියිද එබඳු සියගුණයක් තැන් සත්රුවනින් පුරවා, දන් දෙන්නේය යන අර්ථයි. "**ගදූහනමත්තං**" යනු ගො දුහනමත්තං - ගව දෙනකගෙන් කිරිදොවන කාලය පමණවත්. ගවදෙනකගේ එක්වරක් තන අග අදින කාලය පමණක්වත් යනුයි. "**ගඤ්ඡනමත්තං**" වුවහොත් - ඇඟිලි දෙකින් සුවඳ පිඩක් ගෙන එක්වර ආඝ්‍රාණය කරන කාලය - යන අර්ථයි. මෙපමණ වූ කාලයක්වත් යමෙක් ගර්හ, පිරිවෙන්, විහාර අවට ප්‍රදේශය තුල හෝ සක්වලින් මෙහා ප්‍රදේශය තුල අප්‍රමාණ වූ ලෝකධාතූන්හි සියලු සත්‍වයන් කෙරෙහි හිතවත් භාවය පතුරුවමින් මෙත්සිත වැඩීමට හැකිය. මෙය ඉන්පසු එකදිනකට තෙවරක් දුන් දානයට වඩා මහත්ඵල - මහත් ආනිසංස ගෙන දේ.

සිවුවන සූත්‍රයයි.

19. 1. 5.

පස්වන සූත්‍රයේ "පතිලෙණිසසාමි" ආදියෙහි මුදුනට ගසා කපු පුලුන් වැටියක් මෙන් තමන්ගේ, ලාටු වැටියක් මෙන් නමන්නේ එකට ගෙන අලවනුයේ "**පතිලෙණෙති**" නම් වේ. මැදින් ගසා නැමීමෙන් හෝ දොරයට පහරදී දොර දෙක ම එකට අල්වා ගැනීම "**පතිකොටෙට**" නම් වේ. බොහෝ කාලයක් පැවතුන කපුගසක් පෙරළා දැමුවාක් මෙන් ද මනාව නැමී වක්ව ගිය පැදුරක් දිගහැර නැවත හකුලන්නාක් මෙන් ද දිගහැර නැවත හැකිලීම "**පතිවටෙට**" නම් වේ.

පස්වන සූත්‍රයයි.

19. 1. 6.

සයවන සූත්‍රයේ "දළහධම්මා ධනුගහහා" යනු දැඩි දුනු දරණ, දුනු සහිත යනුයි. දැඩි දුන්න නම් "දවීසහසසසත්‍රාම" යැයි කියයි. දවීසහසසසත්‍රාම නම් යමකට ආරෝපණය කරන ලද දුනුදියයි. ලෝහ ශීර්ෂාදියේ බර දණ්ඩෙන් ගෙන, ශරීරයේ ගෙල දක්වා ඔසවා දැමුයේ පොළවෙන් මීදෙයි. "සිකඛිනා" යනු දොලොස් දහසක් අවුරුදු ගුරුකුලයේ ඉගැන්වූ ශිල්පයයි. "කතහත්‍රා" යනු යමෙක් ශිල්පයම උගනියි ද ඔහු කෘතහස්තයකු නොවේ. මොවහු පුරුදු කළ වශීකිරීම් ඇති කෘතහස්තයෝය. "කඤ්ඤාසනා" යනු රාජකුල ආදියෙහි දක්වන ලද සිප් ඇතිවයි.

"නසස පුරිසසස ජවො" යනු මෙබඳු වෙනත් පුරුෂයෙක් පෙර නොවූ විරූය. බෝසතාණන් වහන්සේ ම 'ජවනහංස'ව උපන් කල්හි මෙය සිදුවිය. එකල්හි බෝසතුන් සතර කණ්ඩයන් එළවීය. එවිට ඔහුගේ බාල සෝයුරා "සොයුරාණනි! අපි සූර්යයා සමග දුවමු"යි දනුම් දුන්හ. බෝසත්හු "සූර්යයා නම් වේගවත් ජවය ඇත්තෙකි. නුඹලා ඔහු සමග දිවීමට නොහැකි වන්නාහුය." ඔවුහු දෙවන-තෙවන වාරයන්හිද මෙසේ කියා එක්දිනක "දුවමු"යි යුගන්ධර පර්වතයට නැඟී හුන්නහ. බෝසත්හු " සෝයුරෝ කොහිද?" විමසා "සූර්යයා සමග දිවීමට ගියේය"යි අසා "මේ තපස්වීවරු නැසෙන්නෝමය"යි කියා ඔවුන්ට අනුකම්පාවෙන් තමාම ගොස් ඔවුන් ලඟ සිටියේය.

ඉක්බිති සූර්යයා උදාවන කල්හි සෝයුරෝ දෙදෙන සූර්යයා සමග ම අහසට නැගුණහ. බෝසත්හුද ඔවුන් සමග ම පිටත්වූහ. බත් සමය හෙවත් මධ්‍යාහ්නය නොපැමිණි අතරතුරේදී දෙසෝයුරන්ගෙන් එක් අයෙකුගේ පියාපත් අතර ගින්නක් ඇතිවිය. ඔහු සෝයුරා අමතා "නොහැක්කෙමි"යි කීවේය. බෝසත්හු ඔහුට "බිය නොවන්න"යි කියා ඔහු අස්වසා (සනසා) පියාපත්වලින් ඔහු වසා (වෙලා) උෂ්ණය-දාහය දුරුකර "යන්න"යි යැවීය. දෙවැන්නාගේ ද මධ්‍යාහ්නයේ දී පියාපත් අතර ගිනි ඇතිවූ විට එසේම කීවේය. ඔහුට ද පෙර පරිදි සත්කාරකොට "යන්න"යි යැවීය. බෝසත් තෙම මධ්‍යාහ්නය දක්වා පියඹා ගොස් "මොවුහු බාලයෝය. මා විසිනිදු බාලයෙක් නොවිය යුතුයැ"යි පවසා, නැවතී නොදුටු මිත්‍රයකු වූ බරණැස් රජු "දකින්නෙමි"යි බරණැසට ගියේය. ඒ නගරය මුදුනෙහි හැසිරෙන කල්හි දොළොස් යොදුනක් වූ ඒ නුවර,

පාත්‍ර කටාහයෙන් වැසූ කුඩා පාත්‍රයක් මෙන් විය. මෙසේ හැසිරෙන කල්හි ඒ ඒ තැන සිදුරු-දෝෂ පෙනී ගියේය. තමා නොයෙක් දහසක් හංසයන් මෙන් ප්‍රකට විය.

ඔහු වේග හකුළුවා රජගෙදරට අභිමුඛ විය. රජු බලා "මගේ ප්‍රිය යහලුවා වූ ජවන හංසයා එන්නේය"යි ජනේලය හැරදමා රුවන් පුටුවක් පණවා මග බලමින් සිටියේය. බෝසත්හු රුවන් පුටුවෙහි හුන්හ. ඉක්බිති රජු දහස්වර පිසූ තෙලින් පියාපත් පිරිමැද-ආලේප කරවා, මීපැණි මිශ්‍ර පොරි ද මිහිරි පානයක් ද දුන්නේය. ඉක්බිති ඔහුට කරන ලද පරිභෝග ඇත්තේ "යහලුව! කොහි යන්නේද?"යි විචාළේය ඔහු සිදුවූ පුවත කියා, "මහරජ! ඉක්බිති මම මධ්‍යාහ්නය දක්වා ධාවනය කර, "මේ දිවීමෙන් කවර වැඩක්ද?"යි නැවතුනෙමි"යි දන්වීය.

ඉක්බිති රජතුමා මෙසේ කීවේය. "ස්වාමීනි! මම නුඹ සූර්යයා සමග දුවන වේගය දකිනු කැමැත්තෙමි. "මහරජ! එය ඉතා දුෂ්කරය. නුඹට එය බැලීමට නොහැක. "ස්වාමීනි! එසේනම් ඊට සමාන වූවක් හෝ දක්වන්න"යි ඉල්වීය. "එසේනම්, මහරජ! දුනුවායන් කැඳවන්න!" රජු දුනුවායන් කැඳෙව්වේය. හංසයා ඉන් සතරදෙනෙක් ම ගෙන, නගරය මැද තොරණක් කරවා, තමාගේ බෙල්ලේ සිනුවක් එල්ලා, තොරණ උඩ හිඳ, දුනුවායන් සිවුදෙනා තොරණ සිවු පැත්තෙහි හිඳුවා "සිවුදිසාවට එක් එක් හීය බැගින් විදින්න"යි පැවසීය. පළමු හීයත් සමගම අහසට නැගී ඒ හීය නොගෙනම දකුණු දිසාවට ගිය හීය දුන්නෙන් රියනක් පමණ ගිය තැනේදී ද දෙවන හීය රියන් දෙකක් පමණ වූ තැනේ දී ද තෙවන හීය තුන්රියන් පමණ තැනේ දී ද දෙවන හීය රියන් දෙකක් පමණ වූ තැනේ දී ද තෙවන හීය තුන්රියන් පමණ තැනේ දී ද ගෙන සිවුවැන්න බිමට පැමිණීමට පෙර ම ගත්තේය. ඉක්බිති හී හතරම ගෙන තොරණෙහි හුන් පරිදි ම සිටියේය.

ඔහු රජුට මෙසේ කීවේය. "මහරජතුමනි! අපගේ වේගය (ජවය) මෙසේ ඉතා වේගවත්ය" යනුවෙනි. මෙසේ බෝධිසත්වයෝම ජවන හංසකාලයේ දී ඒ හී ගෙන එන ලදැයි දතයුතුයි. "පුරතො ධාවනති" යනු අගින් දුවයි යනුයි. සැම කල්හි මුලින්ම සිටින්නේ නොවෙයි. කිසිවිටෙක මුලින් ද පසුපසින් ද සිටී. ආකාශස්ත විමානයන්හි උයන්ද පොකුණුද ඇත. ඒ දේවතාවෝ එහි නා ජලක්‍රීඩා කර පස්සට යයි. නැවත වේගයෙන් ගොස් පෙරටම දුවයි. "ආයුසංඛාරං" යනු රූප ජීවිතින්ද්‍රිය සඳහා කියන

ලදී. එය ඊට වඩා ශීඝ්‍රයෙන් ගෙවී යයි. අරූප ධර්මයන්ගේ භේදය වනාහි පැණවීමට - දක්වීමට පවා නොහැක.

සයවන සූත්‍රයයි.

19. 1. 7.

සත්වන සූත්‍රයේ - "දසාරහානං" යනු මෙනම් ඇති ක්ෂත්‍රියයන්ගේය. ඔවුහු අස්වැන්නෙන් දහයෙන් කොටසක් ගත්හ. එනිසා "දසාරහා" (දහරහයෝ) යැයි ප්‍රසිද්ධ වූහ. "ආණකෝ" මෙසේ ලබන ලද නම් ඇති මිහිගු බෙරයකි.

හිමාලයේ පෙර මහා කුළීර නම් විලක් විය. එහි එක් මහා කකුළුවෙක් විලට බසින, බසින ඇතුන් කයි. එවිට ඇත්තු තමාට වන විපත නිසා "මැගේ පුතා නිසා අප සැපයට පැමිණෙන්නේයැ"යි එක් ඇතින්නකට මහත්සේ සත්කාර කළහ. ඇය ද මහේශාක්‍ය පුතෙකු වැදුවාය. ඊට පසු සෙසු ඇත්තු ඔහුට ද සත්කාර කළහ. ඔහු වැඩිවියට පත්ව "කුමක් නිසා මොවුහු මට සත්කාර කරයි ද?" මවගෙන් ඇසුවේය. ඇත් ගණයාට ඇති විපත ගැන දැනුම් දුන්නාය. ඔහු ද "කිම මට කකුළුවා සෑහේද? එවු. යවු."යි මහා ඇත් පිරිවරක් සහිතව එහි ගොස්, තමා පළමුව විලට බැස්සේය. කකුළුවා දියේ කැලඹුණු හඬින් එහි විත් ඔහු අල්ලා ගත්තේය. කකුළුවාගේ අඬුව සහිත අත ඉතා මහත් එකකි. ඇත්රජු එම අඬුව එහෙ-මෙහෙ සෙලවීමටවත් නොහැකි වූයේ මුවෙහි සොඬ දමා හඬින් කෑගැසුවේය. ඇත්තු "යමෙකු නිසා අපි සැපයට පැමිණෙන්නාහ"යි සිතුවේද ඔහු පළමුව ම අල්ලා ගන්නා ලදැ"යි කියා ඒ ඒ තැන පලාගියහ.

ඇත්රජුගේ මව නුදුරෙහි හිඳ, "අපි ගොඩ නාගයෝ (ඇත්තු) වෙමු. නුඹ දිය නාගයෝ වෙහු. නාගයන් විසින් නාගයන් නොවෙහෙසිය යුතුයි" යනුවෙන් කකුළුවාට ප්‍රිය වචනයෙන් මෙසේ කීවාය.

යෙ කුළීරා සමුද්දසම්ං ගංගාය යමුනාය ච
තෙසං ත්වං වාරිජෝ සෙට්ඨෝ මුඤ්ච රොදනතියා පජනති

"ගංගා-යමුනා දී මහා ගංගාවන්හිද මුහුදෙහි ද යම් කකුළුවෝ වෙසෙත් නම්, ඒ සියලු ජලජ ජීවීන් අතරින් නුඹ ම ශ්‍රේෂ්ඨයා-ප්‍රධානියා වේ. එනිසා තම ප්‍රජාව හඬවන (ඇත්රජු) අත්හරින්න."

ස්ත්‍රියගේ ශබ්දය පුරුෂයන් කැළඹවීමට සමත්ය. එනිසා කකුළුවා තම ග්‍රහණය ලිහිල් කළේය. ඇත්රජු වේගයෙන් සිය දෙපා ඔසවා කකුළුවාගේ පිට පෑගුවේය. පෑගීමත් සමග ම පිට මැටි බඳුනක් මෙන් බිඳුනේය. ඉක්බිති දළයෙන් විද කකුළුවා උඩට ගෙන, ගොඩබිමට විසිකර සතුටු නාදයක් නිකුත් කළේය. එය ඇසූ පලාගිය ඇත්තු එහෙන්-මෙහෙත් පැමිණ කකුළුවා මැඩ-පාගා දැමූහ. උගේ එක් අඬුවක් සිරුරින් ඉවත්වී වැටුනේය. සක්දෙව් රජු එය රැගෙන ගියේය. ඉතිරි අඬුව අවු-සුලඟින් වේලී පැසුණු ලාඛා(රතු) ලාකඩ වර්ණ ඇත්තේ විය.

එය වැසි වැටුණු කල්හි ජල පහරින් ගසාගෙන අවුත් දස සෝයුරු රජවරුන්ගේ, දියපහර මත්තෙහි බැඳි දලෙහි රැඳුණි. රජදරුවෝ ගඟෙහි ජලක්‍රීඩා කරමින් පැමිණ දල සමීපයේ සිට ජලක්‍රීඩා අවසන්හි දැල ඔසවා බලා එය දැක "මේ කිමෙක්ද?"යි ඇසූහ. "ස්වාමීනි, මෙය කකුළු අඬුවකි." "මෙයින් ආභරණයක් සෑදීමට නොහැකිද?" "හාත්පසින්ම වෙලා බෙරයක් සැදිය හැකියැ"යි පවසා හාත්පසින් ම වෙලා ඊට ගැසූහ. ශබ්දය දොළොස් යොදුන් නගරය පුරාම පැතිරුණි. එවිට ඔවුහු මෙසේ කීහ. "මෙය දිනපතාම ගැසිය නොහැක. උත්සව දිනයට ගසන 'මඟුල්බෙරය' වේවා"යි එය මංගල බෙරය බවට පත්කළහ. එය ගැසූ කල්හි මහජනයා මැනවින් නා, සැරසී ඇත් යානාදියේ නැඟී වහ වහා රැස්වෙති. මෙසේ මහජනයා රැස් කරවමින්-කැඳවමින් "අණ කරන" බැවින් "ආණක" යන නාමය මේ බෙරයට තැබූහ.

"අඤ්ඤං ආණිං ඔදහිංසු" ය නු අනික් රන්-රිදීමය ඇණයක් ගැසූහ යනුයි. **"ආණිසංඝාටොව අවසිසසී"** යනු රන්-රිදීමය ඇණය ගැසූ කල්හිම ඉතිරි විය යනුයි. එවිට එහි මුලින් පැවති දොළොස් යොදුන් ප්‍රමාණ වූ හඬ නැතිවී ඇතුල් ශාලාවෙහිද දුකසේ ඇතිවන ශබ්දයක් විය. **"ගමභීරා"** යනු බුද්ධවචන වශයෙන් ගැඹුරුය යනුයි. සල්ලේඛාදීසූත්‍ර මෙනි. **"ගමභීරත්ථා"** යනු අර්ථ වශයෙන් ගැඹුරුය යනුයි. මහාවේදල්ලාදී සූත්‍ර මෙනි. **"ලොකුත්තරා"** යනු ලෝකෝත්තර අර්ථ දීපකයෝය. **"සුඤ්ඤතා පටිසංයුත්තා"** යනු සප්ත ශූන්‍යතා ධර්ම පමණක්ම ප්‍රකාශ කරන යනුයි. සංඛිත්ත සංයුත්තය මෙනි. **"උගගහෙතබබං පරියාපුණිතබබං"** යනු ඉගෙනගත යුතුය. පිරිවහා කටපාඩම් කරගත යුතුයි යනුයි. **"කවිකතා"** යනු කවිහි කතා. කවියන් විසින් කරන ලද යනුයි. **"කාවෙය්‍යා"** යන පදය ද මීට සමාන වූ පදයකි. **"චිත්තකබරා"** යනු විසිතුරු වූ අක්ෂරයන්ය.

"චිත්ත ව්‍යඤ්ජනා" යන පදයද මීට සමාන වූවකි. "**බාහිරකා**" යනු සසුනින් බැහැර වූ යනුයි. "**සාවකභාසිතා**" යනු ඒ ඒ ශ්‍රාවකයන් විසින් පවසන ලද යනුයි. "**සුසඤ්ඤයිසසනති**" යනු විසිතුරු අක්ෂර ඇති බැවින් ද ශ්‍රවණ මාධුර්ය ඇති බැවින්ද සතුටු සිත් ඇතිව යනුයි. සාමණේර, තරුණ භික්ෂූහු-ස්ත්‍රීහු මහා ධනවත් ගෘහපතීහු මේ ධර්මකථිකයෙකි'යි රැස්වී ඇසීමට කැමති වෙති. "තසමා" යනු එනිසා තථාගතයන් විසින් දේශිත සූත්‍රාන්තයෝ නොදරණ-නූගන්නා බැවින් අතුරුදහන් වෙති.

සත්වන සූත්‍රයයි.

19. 1. 8.

අටවන සූත්‍රයේ - "**කලිංගරූපධානා**" යනු ලීයෙන් කළ කොට්ට හිසට මෙන්ම පයටත් තබාගෙන යනුයි. "**අපපමත්තා**" ශිල්ප ඉගෙනීමෙහි අප්‍රමාදීව. "ආතාපිනො" යනු උට්ඨාන වීර්යයෙන් යුතුවයි. "**උපාසනසම්මං**" යනු ශිල්පයන්ගේ නිතර යෙදීමෙහිත් ගුරුවරු නිති ඇසුරු කිරීමෙහිත්ය. ඔවුහු ඒ දිනවල උදෙන්ම නැගිට සිප්හලට - ශාස්ත්‍ර ශාලාවට (පාසලට) යති. එහි ශිල්ප ඉගෙන සජ්ඣායනා කිරීම් ආදියෙහි අප්‍රමාදීව යෙදී, මුව සෝදා කැඳ බීමට යති. කැඳ බී නැවත සිප්හලට යන ඔවුහු සිප් ඉගෙන ගාථා සජ්ඣායනා කර නැවත පාතරාසය (උදේ ආහාරය) සඳහා පිටත් වෙති. කරන ලද අහර කිස ඇති ඔවුහු නින්දට කැමති වේ. කිහිරි කඳන් ආදියෙහි හිසත් පාදත් තබාගෙන සුළු වේලාවක් නිදාසිට නැවත සිප් ඉගෙන සජ්ඣායනා කරති. සවසද සජ්ඣායනා කරනුයේ ගෙදර ගොස්, අනුභව කළ සවස ආහාරය ඇතිව පළමු යාමයේ පාඩම්කර, නිදන වේලාවෙහි පෙරසේ ම ලී කඳන්, ලී කොට හිසට තබාගෙන නිදාගනිති. මෙසේ ඔවුහු විදුලි එලියෙන් දැක විදින්නෝද, හිසකෙස් පවා දෙපලු කිරීමට සමත් දුනුවායෝ ද වූහ. මේ සඳහා එය කියන ලදී. "**ඔතාරං**" යනු විවරයකි. "**ආරම්මණං**" යනු ප්‍රත්‍යයකි. "**පධානසම්මං**" යනු ප්‍රධන් භූමියෙහිය. (භාවනා කරන තැන) ප්‍රධන් වීර්යයෙහි (නොපසුබස්නා වීර්යය) යෙදුනාහු.

ප්‍රථම බෝධියෙහි - බුදුවූ අලුත සිටි භික්ෂූහු බත් කිස කොට නිමවා, කමටහන් මෙනෙහි කරති. ඔවුන් එසේ මෙනෙහි කරද්දී ම ඉර බැස යයි. ඔවුහු දිය නා නැවත සක්මනට බැස පළමු යාමයෙහි සක්මන් කරති. ඉක්බිති "බොහෝ වේලා නොනිදන්නෙමු"යි සිරුරේ වෙහෙස

නිවාගැනීමට හොත්තා හූ සයනය කලාහු දඬු කඩක් කොට්ටය ලෙස තබාගනිති. ඔවුහු නැවත පශ්චිම යාමයෙහි (මධ්‍යම යාමය නිදා සිට) නැගිටිති. සක්මනට බැසගනිති. මේ සඳහා මෙම විස්තරය කියන ලදී.

මේ දිවයිනද තුන් රජුන්ගේ කාලයෙහි එකම මහා සණ්ඨාර ශබ්දයකින් ඒකාබද්ධ වූ එක් ප්‍රධාන භූමියක් විය. නානා දිසාවෙහි ගැසූ ගණ්ඨා නාදයන් පිලිච්ජකෝළියෙහි බැස ගනී. කැලණියේ ගැසූ ගණ්ඨා ශබ්දය නාගදීපයට බැසගනී. (ඇසේ) එකල "මේ භික්‍ෂුව පුහුදුන් අයෙකි" මොහු පුහුදුන් අයෙකි"යි ඇඟිල්ල දිගුකර දක්විය හැකි පමණට පුහුදුන් භික්‍ෂූහු වැඩිවිය. එක් දිනක් මේ සියල්ලෝ ම රහතන් වහන්සේලා බවට පත්වූහ.

"**තසමා**" යනු යම්හෙයකින් ලී කොට්ට හිස තබාගෙන නිදාගත් අප්‍රමාදී වූ භික්‍ෂූන්ගේ ආරම්මණයක් (ඔවුහු වසඟ කරගැනීමක්) මාරයා නොලබයිද එහෙයිනි.

අටවන සූත්‍රයයි.

19. 1. 9

නවවන සූත්‍රයේ "**අතිවෙලං**" යනු වේලාව ඉක්මවාය. කල් ඉක්මවා ප්‍රමාණ වූ කාලය. "**කිමංග පනාහ**" යනු මම වනාහී කුමන කරුණක් නිසා නො එළඹෙමිද? නොයමිද? යනුයි. "**හිසමුළාලං**" නෙළුම් අල මෙන්ම නෙළුඹු මුල්ය. "**අබබූහෙඨා**" යනු උඩට ගෙන, උදුරාගෙනයි. "**හිංකචඡාපා**" ඇත්පැටවුය. ඔවුහු නිතර "හිංකාර" ශබ්දය කරති. එනිසා ඔවුහු "හිංක" නමින් හැඳින්වෙති. "**පසන්නාකාරං කරොනති**" යනු පැහැදුණු අය විසින් කළයුතු දේ කරත් යනුයි. සිවුපසය දෙති. "**ධම්මං භාසනති**" යනු ඇතැමෙක් ජාතක දෙකක් හෝ සූත්‍රාන්ත හෝ උගෙන නොකැඩි ස්වරයෙන් දහම් දෙසත් යනුයි. "**අසන්නාකාරං කරොනති**" යනු ඔවුන්ගේ එම දේශනාව අසා පැහැදුණු ගිහියෝ ප්‍රත්‍ය දානය කරති යනුයි. "නෙව වණ්ණාය **හොති න බලාය**" ගුණ වර්ණනාව සඳහාත් ඍද්ධාණ බලය පිණිසත් හේතු නොවේ. ගුණ වර්ණනාවන්ගෙන් පිරිහෙන විට ශරීර වර්ණය ද ශරීර බලයද පිරිහී යයි. එනිසා ශරීර බලයත්-වර්ණයත් ඇතිවේ.

නවවන සූත්‍රයයි.

19. 1. 10.

දසවන සූත්‍රයේ - "**සඤ්ඤමල සංකටීරෙ**" යන මෙහි - "**සඤ්ඤ**" යනු ගෙවල් දෙකක් අතර ප්‍රදේශයයි. "**සමල**" යනු ගමින් අසුචි නික්මෙන මාර්ගයයි. "සංකටීරං" යනු කුණු දමන තැනයි. "මුදුමුසිං" යනු මෘදු වූ මීයෙකි. "වුට්ඨානං **පඤ්ඤායති**" යනු දේශනාගාමී ඇවතකට පැමිණේ.

දසවන සූත්‍රයයි.

19. 1. 11.

එකළොස්වන සූත්‍රය - "**යෙන යෙන ඉච්ඡති**"යි ඒ මහලු හිවලා කැමති කැමති තැනකට ගොස් කැමති වූ ඉරියවුවකින් හිඳියි. සිසිල් සුලඟ හැමීමෙන් මේ අතරතුරදී ඔහු චිත්ත ආශ්වාදයක්ද (චිත්ත ප්‍රීතියක්)ද ලබන්නෙයැයි දක්වයි. "**සක්‍ය පුතතීය පටිඤ්ඤා**" මෙය දෙව්දත් සඳහා කියන ලදී. ඔහු වනාහි මෙපමණ වූ හෝ චිත්ත ප්‍රසාදයක් (සතුටක්) අනාගත (මතු) ආත්මභාවයන්හිදී නොලබන්නේ ම ය.

එකොළොස්වන සූත්‍රයයි.

දොළොස්වන සූත්‍රයේ - "**කතඤ්ඤුතා**" යනු කළ දෙය දන්නා බවයි "**කතවෙදිතා**" කරන ලද දෙය විශේෂයෙන් දන්නා බවයි. මෙහි ඒ මහලු සිවලාගේ කෘතඥතාව පිළිබඳ කථා වස්තුවයි.

සොයුරෝ සත්දෙනෙක් කුඹුරක් සීසාමින් වපුරති. ඔවුන්ගේ බාල ම සෝයුරා කුඹුර කෙළවර සිට ගවයන් බලාගනියි. ඉක්බිති එක් සිවලෙක් පිඹුරකු විසින් අල්ලා ගත්තේය. ඔහු එය දැක යෂ්ටියෙන් (කෝටුවෙන්) ගසා පෙළා පිඹුරාගෙන් සිවලා මුදාගත්තේය. පිඹුරා සිවලා අත්හැර දරුවා අල්ලා ගත්තේය. සිවලා "මොහු විසින් මගේ දිවි බේරාගන්නා ලදී. මමද මොහුගේ දිවි බේරාගනිමි"යි කැඳ කළය මතු තබා තිබූ වැය (කුඩා පිහියක්) කටින් ගෙන සෝයුරන් ලඟට දිව ගියේය. සෙසු සෝයුරෝ හිවලා දැක "සිවලා වැය කන්නේයැ"යි සිතා ඌ පසුපස එලවාගෙන ආහ. හිවලා ඔවුන් තමා පසුපස එනු දැක වැය දරුවා ලඟ දමා පලාගියේය. සෙසු සෝයුරෝ දිව අවුත් ළමයා පිඹුරා විසින් අල්ලාගෙන සිටිනු දැක,

වෑයෙන් පිඹුරා කපා දමා ඔහුත් රැගෙන ගියහ. මෙසේ මහලු හිවලා වුවත් කළගුණ දන්නා-කළගුණ ප්‍රකට කරන්නෙක් විය.

"සක්‍යපුත්තියපටිඤ්ඤඳ" යනු මෙය ද දේවදත්තගේ හැසිරීමක් සඳහා ම කියන ලදී.

දොළොස්වන සූත්‍රයයි.

ඔපම්ම සංයුත්තය නිමියේය.

20. 1. 1.

භික්ෂු සංයුත්තයේ පළමු සූත්‍රය - "**ආවුසො**" ශ්‍රාවකයන්ට ඇමතීමයි. බුදුවරු නම් ශ්‍රාවකයන්ට අමතන්නාහු "**භික්ඛවෙ**" යනුවෙන් අමතන සේක. ශ්‍රාවකයෝ වනාහි "බුදුවරු සමග අප සමාන නොවේවා" යන සිතින් පළමුව "ආවුසො" යනුවෙන් අමතා පසුව "**භික්ඛවො**" යනුවෙන් අමතති. බුදුවරු විසින්, ශ්‍රාවක භික්ෂු සංඝයා ඇමතූ කල්හි, එම භික්ෂූහු "**භදන්තෙ**" යනුවෙන් පිළිතුරු දෙන්නාහ. ශ්‍රාවකයන් ඇමතූ කල්හි "ආවුසො" යනුවෙන් පිළිවදන් දෙන්නාහ. "**අයං වුච්චති**" යම් හෙයකින් දෙවැනි ධ්‍යානයෙහි විතක්ක විචාරයෝ නිරුද්ධ වේද, යමක නිරෝධයෙන් ශබ්දායතනය නොපවතින ස්වභාවයට යයි. එනිසා මෙය "දුතියජ්ඣානය" නම් වේ. ආර්ය විනයෙහි මෙයම අර්ථයන්ගේ තුෂ්ණීම්භාවය යැයි (නිශ්ශබ්දව සිටීම) කියයි. මෙය මේ පදයේ අර්ථයයි. "**ධම්මීවා කථා අරියොවා තුණ්හීභාවො**" යනු මෙහි "කමටහන් මෙනෙහි කිරීමත් ප්‍රථම ධ්‍යානාදියත් ආර්ය වූ තුෂ්ණීම්භාවය"යැයි දක්වේ. "**විතක්ක සහගත**" යනු විතර්ක අරමුණ සහිත. "**සඤ්ඤාමනසිකාරා**" යනු සංඥාවද මනසිකාරයෝ ද යනුයි. "**සමුදාචරන්ති**" යනු පවතිති යනුයි. තෙරුන් වහන්සේට ද්විතීය ධ්‍යානය ඉතා ප්‍රගුණය. **ඉක්බිති** උන්වහන්සේට ඒ ධ්‍යානයෙන් නැගිසිටි කල්හි විතර්ක, විචාරයෝ ශාන්තව සංසිඳී වැටහුනහ. මෙසේ උන්වහන්සේට දෙවැනි ධ්‍යානය ද **සඤ්ඤා**-මනසිකාර දෙකද පිරිහීමට ගියහ. එය දක්වමින් මෙසේ වදාළහ. "**සණයපෙහි**" යනු මැනවින් තබන්න යනුයි. "**එකොදිං කරොහ**" යනු එකඟ කරගන්න යනුයි. "**සමාදහා**" යනු මැනවින් වඩන්න නංවන්න යනුයි. "**මහාභිඤ්ඤතං**" යනු **ඍද්ධි අභිඥාවයි**. ශාස්තෘන් වහන්සේ **මේ ක්‍රමයෙන්** තෙරුන්ට සත්වැනි

දිනයේදී තෙරුන්වහන්සේගේ පිරිහී ගිය සමාධිය වඩා උන්වහන්සේ ෂඩ් අභිඥාවන්ට පැමිණුවූ සේක.

පළමු සූත්‍රයයි.

20. 1. 2.

දෙවන සූත්‍රයේ "අත්ථි නු ඛො තං කිඤ්චි ලොකසමිං" යනු ඉතා උසස් වූ සත්වයෙක් හෝ සංස්කාරයක් හෝ සඳහා කියන ලදී. "සත්ථුපිඛො" මෙය යම් හෙයකින් ආනන්ද තෙරුන් තුල ශාස්තෘන් වහන්සේ කෙරෙහි පවතින අප්‍රමාණ වූ කැමැත්තත්-ප්‍රේමයත් වන්නේද එහෙයින් කිම - මේ තෙරුන්ට ශාස්තෘන් වහන්සේගේ නැතිවීමෙන් ශෝකාදියක් නූපදින්නෙහිද?යි දැනගැනීමට මෙසේ විමසන ලදී. "දීඝරතතං" උෂ්ණ හෑරූ ලෙණෙහි දී දිසනඛ නම් පිරිවැජියාට වේදනා පරිග්‍රහ සූත්‍රය දෙසූ දවසේ පටන් ඉක්ම ගිය කාලය හඟවනු වස් මෙසේ වදාළහ. ඒ දිනයේ තෙරුන් වහන්සේගේ මේ සංසාර පැවැත්ම ගෙනදෙන සකල ක්ලේශයෝ ප්‍රහීන කරන ලදහ.

දෙවන සූත්‍රයයි.

20. 1. 3.

තෙවන සූත්‍රයේ - "එකවිහාරේ" යනු එක්තරා ගැබකය. එකල්හි බොහෝ ආගන්තුක භික්ෂූහු රැස්වූහ. එහි පිරිවෙන් අග හෝ විහාර අග හෝ සෙනසුන් නොපැමිණි කල්හි (ප්‍රමාණවත් නොවූ කල්හි) අගසවු දෙනමට එකම ගැබක්-කුටියක් පැමිණියේය. ඔවුහු දවල් කාලයේ වෙන් වෙන් වූ තැන හිඳිති. රාත්‍රියේ ඔවුන් අතර සිවුරු තිරයක් දිගහරිති. ඔවුහු තමාට පැමිණි, පැමිණි තැනම හිඳිති. එනිසා "එක් විහාරයේ වසමින්" යනුවෙන් කියන ලදී. "ඔළාරිකෙත" මෙය ඕළාරික අරමුණ සඳහා කියන ලදී. දිවැස් හා දිවකන් (දිව්‍ය චක්ෂු, දිව්‍ය ශ්‍රෝත) සමාධිවලට සමවැදී උන්වහන්සේ වාසය කළහ. ඒවා ද රූපායතන, ශබ්දායතන නම් වූ ඕළාරික ආරම්මණයන්ය. මෙසේ දිවැසින් රූපයන් දුටුබැවින් ද දිව්‍යම ශ්‍රෝත ධාතුවෙන් (දිව කණින්) ශබ්ද ඇසූ බැවින්ද ඒ විහරණය "ඕලාරික" නම් වේ. "දිබ්බ චක්ඛුං විසුජ්ඣි" යනු භාග්‍යවතුන් වහන්සේගේ රුව දැකීම

පිණිස පිරිසිදු විය යනුයි. "දිබ්බා ච සොතධාතු" යනු එම දිවකණ ද භාග්‍යවතුන් වහන්සේගේ ශබ්ද ඇසීම පිණිස පිරිසිදු විය යනුයි. භාග්‍යවතුන් වහන්සේ ද තෙරුන්ගෙ රූපය දකීමට මෙන්ම ශබ්ද ඇසීමට ද එම ඥාන දෙක පිරිසිදු කළ සේක. එකල්හි තෙරුන් වහන්සේ "ශාස්තෘන් වහන්සේ දැන් කොතැනක වෙසේද"යි ආලෝකයා වඩා දිවැසින් බැලූ සේක්, ශාස්තෘන් වහන්සේ ජේතවන විහාරයේ ගඳකිළියෙහි හුන් බව දැක, උන්වහන්සේගේ දිවකනින් ශබ්ද ද ඇසූහ. බුදුපියාණන් වහන්සේද එසේම කළ සේක. මෙලෙස දෙදෙනා වහන්සේ ඔවුනොවුන්ගේ රුව දැක්කහ. ශබ්ද ද ඇසූහ. "ආරද්ධ විරියෝ" යනු පරිපූර්ණ වූ වීර්යයයි. පටන්ගන්නා ලදුව එසවූ වීර්යය. "යාවදෙව **උපනිකෙඛපණමත්තාය**" යොදුන් තුන්දහසක් පැතිරුණු හිමාල පර්වතය ඉදිරියේ තැබූ අබ ඇටයක් පමණ වූ ගල්කැටයක් "හිමාලය ද වඩා විශාල වනුයේ නැතිනම් මේ ගල්කැටයද?"යි මෙසේ සැසඳීමට, ලඟින් තැබීමට පමණක්ම උපකාර වේයැයි කියන ලදී. දෙවැනි උපමාවේද මෙම ක්‍රමයමයි. "කපපං" යනු ආයු කල්පයකි. "**ලොණ සටාය**" - "සක්වල මුවවිට ආධාර කරගත් මුවවිට සහිත බ්‍රහ්මලෝකය දක්වා ගැටී සිටි ලුණුසැලියේ"යැයි දක්වයි. මේ තෙරවරු උපමා ගෙනහැර දක්වන්නාහු ගැලපෙන නිසාද විද්‍යාමාන ගුණ නිසාද ගත්හ. කෙසේද? අගසවු දෙනමගේ සෘද්ධිය නම් ඉතා උස් වූ අර්ථයෙන් මෙන්ම මහත් වූ අර්ථයෙන් ද හිමවත හා සමානය. ප්‍රඥාව සිවු භූමිවලට අයත් ධර්මයන්හි ඇතුලට පිවිස සිටි අර්ථයෙන් සියලු ආහාර-ව්‍යඤ්ජනයන්හි ඇතුලට පිවිස සිටි ලුණු වැනිය. මෙසේ සමාන වූ අර්ථයෙන්ම උපමා ගෙනහැර දක්වූහ. මහමුගලන් තෙරුන්ගේ සමාධි ලක්ෂණය විභූතය. ප්‍රකටය. සැරියුත් තෙරුන්ගේ විදර්ශනා ලක්ෂණය විභූතය. ප්‍රකටය. සැරියුත් තෙරුන්ට අවිද්‍යමාන වූ සෘද්ධියක් නම් නැත. (සෘද්ධියෙන් අනූනය) නමුත් භාග්‍යවතුන් වහන්සේ විසින් "මහණෙනි! මගේ ශ්‍රාවක භික්ෂූන් අතර සෘද්ධිමතුන් අතර මහමුගලන් තෙරණුවෝ අග්‍රවෙති"යි උන්වහන්සේම අගතනතුරෙහි තබන ලදී. භාග්‍යවතුන් වහන්සේ විසින් "මහණෙනි! මගේ ශ්‍රාවක භික්ෂූන් අතර මහා ප්‍රඥාවන්ත භික්ෂූන්ගෙන් සැරියුත් මහ තෙරණුවෝ අග්‍රවෙති"යි සැරියුත් තෙරුන් අගතනතුරෙහි තබන ලද නමුත් මහමුගලන් තෙරුන්ට ද ප්‍රඥාව ඇත. එනිසා මේ දෙදෙනා වහන්සේ ඔවුනොවුන්ගේ තනතුරු නොව විද්‍යමාන වූ ගුණයන්ම මෙහිදී අදහස් කරන ලදී. මහමුගලන් තෙරණුවෝ සමාධි ලක්ෂණයෙහි සමෘද්ධවීමට පැමිණියහ. සැරියුත් තෙරණුවෝ විදර්ශනා ලක්ෂණයෙහි (විස්තර විභාග දැක්වීමට සමත් බැවිනි) සමෘද්ධියට පත්වූහ.

සම්මා සම්බුදු පියාණන් වහන්සේ මේ දෙකෙහිම විශේෂ විභාග දැක්වීමට අභිශය සමත්වන සේක.

තෙවැනි සූත්‍රයයි.

20. 1. 4.

සිවුවැනි සූත්‍රයේ - "අපෙපාසසුකෙකා" යනු උත්සාහයක් නොමැතිවයි. "**සංකසායතී**" යනු වාසය කරයි යනුයි. "**වෙය්‍යාවච්චං**" යනු සිවුරෙහි කළයුතු කාර්යයනය. "**ආභිචෙතසිකානං**" යනු විශේෂ සිත, උතුම් සිත ආශ්‍රිත වූ යනුයි. "**නිකාමලාභී**" යනු කැමති, කැමති ක්ෂණයෙහි සමවැදීමට සමත් වූ බැවින් - "පහසුවෙන් ලබන්නා" යන අර්ථයි. "අකිචඡාලාභී" ධ්‍යානයන්ට විරුද්ධ වූ සැපයන් මැඩපවත්වා (යටපත් කර) සමවැදීමට සමත් බැවින් නිදුකින් ලබන්නාය. "**අකසිරලාභී**" යනු වෙන්කිරීම් ඇති පරිදි නැගිටීමට (ධ්‍යානයෙන්) සමත් වූ බැවින් මහත් සේ ලබන්නායි. "ධ්‍යානය ඉතා ප්‍රගුණය" යන අර්ථයි. "**සිථිලමාරබහ**" යනු ලිහිල් වීර්යය පවත්වා යනුයි.

සිවුවන සූත්‍රයයි.

20. 1. 5.

පස්වන සූත්‍රයේ "අභිරූපෝ" යනු වෙනත් රූපයන් ඉක්මවූ - රූප ඇත්තේ යනුයි. "දසසනීයෝ" යනු දැකිය යුතු යනුයි. "**පාසාදිකෝ**" යනු දැකීමෙන්ම සිත් පැහැදවීමට සමත් වූ යනුයි. "**වණණපොකඛරතාය**" යනු උතුම් වර්ණ සුන්දරත්වයෙන් යුතු වූයේ යනුයි.

පස්වන සූත්‍රයයි.

20. 1. 6.

සයවන සූත්‍රයේ - "දුබබණණං" යනු විරූප වූ ශරීර වර්ණ ඇති යනුයි. "ඔකොටිමකං" යනු මිටි වූ යනුයි. "**පරිභූත රූපං**" යනු ප්‍රමාණ වශයෙන් නින්දා ලබන යනුයි. ඔහු වනාහී ජබ්බග්ගිය (බුදුවදනට පටහැනිව යන අකීකරු පැවිද්දන් හයදෙනෙකි.) භික්ෂූන් විසින් "ඇවැත්නි, භද්දිය"

"ඇවැත්නි, භද්දිය" යනුවෙන් ඒ ඒ තැන අතගාමින් විවිධාකාර වශයෙන් ක්‍රීඩාකරති. එහාට අදිති. මෙහාට අදිති. එනිසා "නින්දා ලබන ස්වභාව ඇති" යනුවෙන් කියන ලදී.

කුමක් නිසා මොහු මෙබඳු ස්වරූප ඇතිව උපන්නේද? මොහු අතීත අත්බවකදී මහරජෙක් විය. ඔහුට මහලු අය ද කළු කුෂ්ට ඇත්තෝ ද අතඟයින් පිළිකුල් විය. ඔහු ඉදින් මහලු වූවන් දකියි ද ඔවුන්ගේ හිස් මුදුනින් එල්ලා තබා කැසපට ගස්වා, කැමති පරිදි ක්‍රීඩා කරයි. මහලු ස්ත්‍රීහුද දක ඔවුන්ටද කැමති-කැමති විප්‍රකාර කරමින් කැමති සේ ක්‍රීඩා කරයි. ඔවුන්ගේ දූදරුවන් ඉදිරියේ මෙසේ කරනවිට මහත් වූ ලැජ්ජාවක් උපදියි. ඒ පාප ක්‍රියාවෙන් පොළවේ සිට සඳෙව්ලොව එක ම කෝලාහලයක් ඇතිවිය.

ඉක්බිති ශක්‍රයා මෙසේ සිතිය. "මේ බාලයා (මෝඩයා) මහජනයා වෙහෙසට පත්කරයි. ඔහුට නිග්‍රහයක් කරන්නෙමි". ඔහු මහලු ගැමියකුගේ ස්වරූපයක් ගෙන එක් කිරිමොරු සැළියක් ද රථයෙහි තබාගෙන, එය දක්කාගෙන නගරයට පිවිසියේය. රජු ද ඇතුපිට නැගී නගරයෙන් නික්ම ඉදිරියට එනුයේ ඔහු දක "මේ මහල්ලා, මෝරු රථයක් ගෙන මා ඉදිරියට එයි. වලකවු. වලකවු"යි මිනිස්සු ඔබිනොව ඉවත්ව ගියත් ඔහු නොදක්නේය. ශක්‍රයා "රජු පමණක් මා දකීවා. අන්‍යයන් මා නොදකීවා!"යි අධිෂ්ඨාන කළේය.

ඉක්බිති ඒ මිනිස්සු "රජතුමනි, කොහිද?" "රජතුමනි කොහිද?"යි අසද්දී ම රජු ඇතාත් සමඟ දෙනගේ ඇඟ යටින් යන වසුපැටවකු මෙන් මෝරු කරත්තයේ යටට පිවිසියේය. ශක්‍රයා මෝරු සැළිය බින්දේය. රජු හිසේ සිට මෝරුවලින් තෙත්වූ සිරුරු ඇත්තේ විය. ඔහු ශරීරය තවාගෙන, උයනේ පොකුණින් දිය නා, අලංකාර වූ ශරීරයක් ඇතිව නගරයට පිවිසෙනුයේ නැවත මහල්ලා දුටුවේය. දක "මේ මා විසින් දුටු මහල්ලා නැවත පැමිණෙයි. වලකවු"යි කීය. මිනිසසු "රජතුමනි කොහිද? ඒ මහල්ලා කොහිද?"යි අසමින් එහෙ-මෙහෙ දිවූහ.

රජතුමා පළමු විප්‍රකාරයටම නැවත පත්විය. එකෙණෙහි ම ශක්‍රයා ගොනාද රථය ද අතුරුදහන් කර, අහසෙහි සිට මෙසේ කීවේය. "අද බාලය! නුඹ මා එක් මෝරු වෙළෙන්දෙකියි සිතා සිටියි. මම ශක්‍ර දිව්‍ය රාජයාය. නුඹගේ මේ පාපක්‍රියාවන් නැවැත්වීමට පැමිණියෙමි. නැවත

මෙවැනි පාපක්‍රියා නොකරවු"යි තර්ජනය කර ගියේය. මේ කර්මය නිසා ඔහු දුර්වර්ණ වූවෙක් විය.

විපස්සී බුදුරජාණන් වහන්සේගේ කාලයේදී මොහු "චිත්‍රපත්‍ර" නම් කොවුලෙක් වී ක්ෂේම වූ (අභය භූමියක් වූ) මිගදායෙහි වසයි. එක් දිනක් හිමවතට ගොස් මිහිරි අඹගෙඩියක් තුඩින් රැගෙන එනවිට භික්ෂු මහා සංඝයා පිරිවරාගෙන වඩින බුදුරජාණන් වහන්සේ දැක මෙසේ සිතුවේය. "මම වෙන දවස්වල දී හිස් අතින් සිටියදී බුදුහු දකිමි. අද මට මේ අඹ ගෙඩියක් ඇත. දසබලයන් වහන්සේට මෙය දෙන්නෙමි"යි පහළට බැස අහසෙහි සිටියේය. බුදුරජාණන් වහන්සේ කොවුලාගේ සිත දැන, උපස්ථායක තෙරුන් දෙස බැලූ සේක. ඔහු පාත්‍රය ගෙන දසබලයන් වහන්සේට වැඳ, එම පාත්‍රය බුදුන්ගේ අතෙහි තැබුවේය. කොවුලා එම පාත්‍රයෙහි අඹ ගෙඩිය තැබීය. බුදුහු එතැනම වැඩහිඳ අඹගෙඩිය වැළඳූහ. කොවුලා අතිශය සතුටට පත්ව පුනපුනා බුදුගුණ සිහිකරමින් බුදුරදුන්ට වැඳ තමාගේ වසන තැනට ගොස්, සත්දිනක් ම ප්‍රීති සුවයෙන්ම කල්යැවීය. මෙම කර්මයේ බලයෙන් හද්දිය තෙරුන්ට මිහිරි කටහඬක් ලැබුණි.

කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ කාලයේදී චෛත්‍යය සැදීම ඇරඹූ කල්හි "කොපමණ ප්‍රමාණයකින් කරමුද?" ඇසූවිට "යොදුන් හතක් උසටය."යි කී කල්හි "එය ඉතා මහත්ය" "යොදුන් හයක් උසට සාදමු" "එයද ඉතා විශාලය". පස්-සිවු-තුන් යොදුන්, දෙයොදුන් කිරිමටවත් එදා ප්‍රධාන වඩුවා වී මොහු අකමැති විය. මෙය අනාගතයේ දී සුවසේ පිළිසකර කිරීමට හැකිවිය යුතුයැයි කියා තූලක් ගෙන වටකරමින් ගවුවක් පමණ දුරින් සිට "සෑම පැත්තක්ම ගවුවක් පමණ වේවා!"යි චෛත්‍යය යොදුනක් පමණ වසාගත්, යොදුනක් උස වූවක් වන්නේය" කීවේය. සෙස්සෝ ඔහුගේ වචනය පිළිගත්හ. චෛත්‍යය වසර හතකුත් මාස හතකුත් දින සතකුත් ගෙවුණු කල්හි සාදා නිමකරන ලදී. මෙසේ අප්‍රමාණ වූ බුදුරජාණන් වහන්සේගේ ප්‍රමාණයක් කරන ලද කර්මයේ බලයෙන් ඔහු අතිශයින් මිටි ශරීර ඇතිව උපන්නේය.

"හත්ථියො පසදා මිගං" යනු ඇත්තු ද තිත් මුවෝ ද යනුයි. **"නත්ථි කායසමිං තුල්‍යතා"** යනු කයෙහි ප්‍රමාණයක් නම් නැත යනුයි. කාය ප්‍රමාණය සැලකීම නුසුදුසුය. නිරර්ථකය. යන අර්ථයි.

සයවන සූත්‍රයයි.

20. 1. 7.

සත්වන සූත්‍රයේ - "**පොරියා වාචාය**" යනු පුරවැසි, නගරවැසි මිනිසුන්ගේ වචන හා සමාන වූ නොපිරිහුණු අකුරු-පද සහිත මිහිරි වදනින් යනුයි. "**විසඨඤ්ඤාය**" යනු නිදොස් වූ පළිබෝධ නොමැති වූ යනුයි. පිත්සෙම් ආදියෙන් පලුදු නොවූ යන අර්ථයි. "**අනෙළගලාය**" යනු යම්සේ මිනිස්සු කටින් කෙල ගලද්දී කථා කරයිද ඉන් නොරවූ, එලෙස නොවූ යනුයි. එනම් නිර්දෝෂ වූ පිරිසිදු වචන ඇතිවයි. "**පරියාපනනාය**" යනු චතුරාර්ය සත්‍ය පර්යාපන්න වූයි. චතුරාර්ය සත්‍යයන්ගෙන් නොමිදී පවතින්නා වූ. "**අනිසසිතාය**" යනු සසර පැවැත්ම ආශ්‍රය කරගෙන නොකියන ලද යනුයි. "**ධම්මො හි ඉසීනං ධජෝ**" ය නු නව ලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය ඍෂිවරුන්ගේ ධජය-කොඩිය නම් වේ.

සත්වන සූත්‍රයයි.

20. 1. 8.

අටවන සූත්‍රයේ - "**ආකොටිතපචවාකොටිනානි**" යනු එක් පැත්තක අතින් හෝ මුගුරකින් හෝ තට්ටු කිරීමෙන් මදින ලද, නැවත පෙරලා තට්ටු කිරීමෙන් නැවත නැවත උළා මදින ලද යනුයි. "**ඤඤ්ඡිඤ්ඩා**" යනු අලුතෙන් පුරවාය. "**අචඡං පතනං**" යනු අලංකාර වර්ණ ඇති මැටි පාත්‍රයකි. කුමක් නිසා තෙරුන් වහන්සේ මෙසේ කලසේක්ද? බුදුරජාණන් වහන්සේගේ අදහස දැනගැනීම සඳහායි. උන්වහන්සේට මෙසේ සිතුණි. "ඉදින් ශාස්තෘන් වහන්සේ 'මගේ මේ බාල සෝයුරු වූ නන්ද, ඉතා හොබනේයැ"යි වදාළහොත් දිවි ඇතිතාක් මේ අයුරින්ම හැසිරෙන්නෙමි. ඉදින් බුදුහු මෙහි දොස් දක්වුවහොත් මේ ස්වරූපය අත්හැර, කසල ගොඩකින් වස්ත්‍රයක් ගෙන, සිවුරක් මසා එය පොරවාගෙන පර්යන්ත සෙනසුන්හි වසමින් හැසිරෙන්නෙමි" යනුවෙනි. "**අසසසී**" යනු වන්නෙහිය. "**අඤ්ඤාතුඤ්ඤඡන**" සලකුණු කළ පොහොසත් ජනයාගේ ගෙවල්වල කුළුබඩුවලින් යුක්ත, සුවඳවත් භෝජන සොයන්නාගේ අහර සිගීම "**ඤාතුඤ්ඤ**" නම් වේ. ගෙපිලිවෙලින් දොරක් පාසා යමින් ලද මිශ්‍ර වූ භෝජනය "**අඤ්ඤාතුඤ්ඤ**" නම් වේ. මේ අර්ථය මෙහිදී අභිප්‍රේතයි. "**කාමෙසු අනපෙකඛිනං**" යනු වස්තු කාමයෙහිද ක්ලේශ කාමයෙහිද අපේක්ෂාවක්-කැමැත්තක් නොමැතිව යනුයි. "ආරඤ්ඤකො ච" ආදී

සියල්ල සමාදන්වීම් වශයෙන් කියන ලදී. "**කාමෙසු අනපෙක්ඛා**" යනු මේ සූත්‍රය දිව්‍යලෝකයේ දිව්‍යාංගනාවන් දක්වා පැමිණීමෙන් පසුව දෙසූවකි. මෙය දේශිත දවසේ පටන් තෙරුන් වහන්සේ ගැටෙන්නේ, වෑයම් කරන්නේ කිහිප දිනකින්ම රහත්බැව්හි පිහිටිසේක් දෙවියන් සහිත ලෝකයෙහි අග්‍ර දක්ෂිණෙය්‍ය බවට පත්වූහ.

අටවන සූත්‍රයයි.

20. 1. 9.

නවවන සූත්‍රයේ - "දුම්මනෝ" යනු උපන් දොම්නස් බවයි. කුමක් නිසා මොහු මෙසේ දුක්ඛිත, දොම්නස් බවට පත්වූයේද? ඔහු ක්ෂත්‍රිය කුලයෙන් පැවිදි වූවෙකි. දෙපට සලුවක් හැඳගෙන, උතුම් සිවුරක් පොරවාගෙන, ඇස් අඳුන් ගා, මනෝසිල (රත් සිරියල්) තෙල් හිස ගල්වාගෙන සිටියි. ඔහු සෙසු භික්ෂූන් වහන්සේ දිවා වසන, රාත්‍රී වසන තැන්වලට නික්මගිය කල්හි, "භික්ෂූහු නම් විවේකාවසරයකින් හිඳිය යුතුය"යි නොදන්නේ, භෝජන ශාලාවට ගොස් මහ පුටුවක වාඩිවී හුන්නේය. දිශාවන්හි හැසිරෙන ආගන්තුක වූ පාංශුකූලික භික්ෂූහු පැමිණ, "අපට මේ ආකාර වූ දූවිලි වැකුණු සිරුරින් දසබලයන් වහන්සේ දැකීමට නොහැක. අපගේ බඩුබාහිරාදිය තබමු"යි භෝජනශාලාවට ගියහ. ඒ මහතෙරවරු වඩිනවිට තිස්ස හිමියන් එසේම නිශ්චලව සිටියේය. අනික් භික්ෂූහු "අත්පා මෙහෙවර කරමු." "තල් අත්තෙන් පවන් ගසමු" ආදිය විමසති. මොහු වනාහු හුන්නේම "කොතෙක් වස්ද?"යි විමසූ විට "අපි වස් නැත්තෝය. නුඹලාගේ වස් කීයද?"යි ඒ හිමිවරුන්ගෙන් ඇසීය. උන්වහන්සේලා වස් ගණන පැවසූවිට "මම අද පැවිදිවීමී"යි තිස්ස හිමි පැවසීය.

ඉක්බිති ඒ භික්ෂූහු ඔහුට "ඇවැත්නි, දැන් කැපූ හිසකෙස් ඇත්තෙහිද? අද ද නුඹගේ හිසින් උකුණුගඳ වහනය වේ. නුඹ නම් මෙපමණ වයසට ගොස් පැවිදි වී වස් විමසන විට නිශ්ශබ්දව-නිශ්චලව හුන්නෙහිය. ගෞරව දැක්වීම් පමණකුදු නුඹ ලඟ නැත. කාගේ සසුනක පැවිදිවීද?"යි ඔහු පිරිවරාගෙන වචන නැමති හුල්වලින් පහර දෙමින් "කිම නුඹ ණය ගත්තෙක්ද? භය වූවෙක්ද? ජීවත්වීමට නොහැකිව පැවිදිවීද?"යි කීහ. ඔහු එක් තෙරනමක් දෙස බැලුවේය. එහිමි "මහල්ල! කුමක් නිසා මා දෙස

බලන්නෙහිද?"යි කී කල්හි තිස්ස හිමි වෙනත් අයෙකු දෙස බැලුවේය. උන්වහන්සේද එසේම ඇසුවිට "මොවුහු මා වටකරගෙන වචන නැමති සැත් (ආයුධ) වලින් විදින්නෝයැ"යි තිස්ස හිමිට ක්‍ෂත්‍රිය මානය උපන්නේය. ඇස්වලින් මැණික් පාට වූ කඳුලු වැගිරුණි. ඉක්බිති තිස්ස හිමි, සෙසු මහතෙරවරුන්ගෙන් මෙසේ ඇසුවේය. "කාගේ ලඟට ආවෙහිද?" ඔවුහු "අපි නුඹගේ ලඟට පැමිණියාහුයැයි නුඹ සිතන්නෙහිද? ගිහි බැඳුම් ඇති තැනැත්ත! එසේ නොසිතව. සඳෙව්ලොවට අග්‍රප්‍රද්ගලයා වූ ශාස්තෘන් ව හන්සේ දැකීමට අපි පැමිණියෙමු"යි පැවසූහ. එම වදන් අසා අතිශයින් කෝපාවිෂ්ට වූ තිස්ස හිමි, "ඒ මගේ සෝයුරා ලඟට පැමිණියේ නම්, දන් මම නුඹලා පැමිණි මාර්ගයෙන්ම ආපසු හරවා යවන්නෙමි"යි කියා බුදුරදුන් ලඟට යෑමට පිටත්වී අතරමගදී මෙසේ සිතුවේය. "මා මේ ආකාරයෙන් බුදුරදුන් ලඟට ගියහොත් මොවුහු නෙරපා හරින්නේ නැත." එනිසා දුක් දොම්නස් විලාශයක් ගෙන කඳුළු වගුරුවමින් ගියේය. මේ කාරණයෙන් මොහු මෙබඳු ස්වරූප වීයැයි දතයුතුයි.

"වාචාසනතිතොදකෙන" යනු වචන නැමති කෙවිටෙනි. "සඤ්ජම්භරිං අකංසු" හාත්පසින් නිතර ස්පර්ශ කළහ යනුයි. මතු මතුයෙහි විද්ධ"යි කියන ලදී. "වතතා" යනු අනුන් යමක් කැමති නම් කියන්නේමය යනුයි. "නොව වචනක්‍ඛමො" යනු අනුන්ගේ වචන ඉවසීමට නොහැකි වේ. මෙසේ නුඹ මේ කෝපයෙන් මේ ආත්මයේදී කියූ වචන නැමති හුල්වලින් විදින ලදී. අතීතයේදී රටින් ද පිටුවහල් කරන ලදී. මෙසේ වදාළ විට "භාග්‍යවතුන් වහන්ස! ඒ කවර කාලයකද?"යි භික්ෂූහු ඇසූහ. ශාස්තෘන් වහන්සේ මෙසේ වදාළහ.

අතීතයේ බරණැස් නුවර බරණැස් රජු රජකම් කරයි. ඉක්බිති "ජාතිමා" සහ "මාතංග" නම් ඍෂිවරු දෙදෙනෙක් බරණැසට ගියහ. ඔවුන්ගෙන් ජාතිම පළමුව ගොස් කුඹල්හලෙහි හුන්නේය. මාතංග තාපසයා පසුව අවුත් අවසර ඉල්ලීය. "මෙහි පළමුව හා පැවිද්දෙක් ඇත. ඔහුගෙන් අවසර ගන්න"යි කුඹල්කරු කීවේය. ඔහු තමාගේ පිරිකර ගෙන ශාලාවේ දොර මුල තබා, එහි සිට "ආචාර්යයෙනි! අපටද එක රැයක් විසීමට අවසර දෙන්නෙහිද?"යි ඇසීය. ජාතිම ඍෂි එවිට "පිවිසෙන්න"යි කියා පිවිස හුන් කල්හි "කවර ගෝත්‍රයේ ද?"යි ඇසීය. මාතංග ඍෂි "චණ්ඩාල ගෝත්‍රයේය"යි කීය. නුඹ සමග එක තැන නිදීමට නොහැක කියා පැත්තකට ගියේය. මාතංග තාපසයෝ එහි ම තණ

ඇතිරිය අතුරා හොත්තේය. ජාතිම තාපසයා දොරලඟ නිදාගත්තේය. මාතංග තාපසයා මහ රෑ මුත්‍රා කිරීමට නික්මෙනුයේ ඔහුගේ උරය පෑගුණි. "මේ කවුද?"යි ඇසූවිට "ආචාර්යනි! මම වෙමි"යි මාතංග කීය. "බොල චණ්ඩාලය! කිම වෙනත් මාර්ගයක් නොදක්නෙහිද? මෙහි අවුත් මා පෑගුවෙහිය"යි ජාතිම චෝදනා කළේය. "ආචාර්යනි! නොදැක මා හට පෑගුණි. මට සමාවන්න"යි මාතංග තාපස කීවේය. මෙතෙම ආපසු එනවිටදී ද මෙතැනින් ම අවුත් පාගන්නේ යැයි සිතූ ජාතිම අනිත් පැත්ත හැරී නිදාගත්තේය.

මාතංග තාපසයා ද "ආචාර්යවරයා මා පැමිණි පැත්තේ හිස තබා නිදියයි. ආපසු යනවිට පා ඇති පැත්තෙන් යා යුතුයැ"යි සිතා අනෙක් පසින් යන්නේ නැවත උරයම පෑගුවේය. "මේ කවුද?"යි ඇසූවිට "ආචාර්යතුමනි! මම වෙමි"යි මාතංග කීවේය. එවිට ජාතිම නැගිට, "පළමුව නුඹ නොදැන පෑගුවෙහිය. දැන් මා සමග ගැටීමට ම පෑගුවෙහිය. ඉර උදාවනවිටම නුඹගේ හිස හත්කඩකට පැලේවා!"යි සාප කළේය. මාතංග තාපසයා කිසිවක් නොකියා නගරයට අරුණ උදාවූ කල්හිම සූර්යයා අල්ලාගෙන නැගීමට ඉඩ නුදුන්හ. මිනිස්සුද ඇත්-අස් ආදීන්ද නින්දෙන් පිබිදුනහ. මිනිස්සු රජගෙදරට ගොස් "දේවයන් වහන්ස! මුලු නුවරම අප්‍රබුද්ධයෙක් නම් නැත. ඉර නැගීම නොපෙනේ. මෙය කුමක් නිසා සිදුවිද?" "එසේනම් නගරය පරීක්ෂා කර බලන්න"යි රජු කීවේය.

ඔවුහු පරීක්ෂා කර බලන්නාහු කුඹල්හලෙහි තාපසයන් දෙදෙනෙකු සිටිනවා දුටුවේය. මෙය මොවුන් විසින් කළ දෙයක් වන්නේයැයි නියම කර, රජුට දැන්වූහ. රජු "ඔවුන්ගෙන් විමසන්න"යි නියම කළේය. නුවරවැසියෝ පැමිණ ජාතිමගෙන් ප්‍රශ්න කළහ. "නුඹ විසින් අඳුර කරන ලදීද?" "මවිසින් නොකරන ලදී. නමුත් මෙහි කුට(කපටි) ජටිලයෙක් ඇත. ඔහු නීචයෙකි. අනන්ත වූ මායා දන්නෙකි. ඔහුගෙන් අසන්න"යි ජාතිම තාපස කීවේය. නගරවැසියෝ පැමිණ මාතංගගෙන් "ස්වාමීනි! නුඹවහන්සේ විසින් අන්ධකාරය පවත්වන්නේද?"යි ඇසූහ. "එසේය. මේ ආචාර්යවරයා මට සාප කළේය. එනිසා මවිසින් අඳුර කරන ලදී. පවත්වාගෙන යමි"යි මාතංග කීවිට, ඒ බව රජුට දැනුම් දුන්හ.

රජු පැමිණ "ස්වාමීනි, නුඹ විසින් මෙය කරන ලදීද?"යි විමසීය. "එසේය රජතුමනි!" "කුමක් නිසාද ස්වාමීනි?" "මොහු විසින් මට සාපකරන

ලද්දෙමි. ඉදින් මොහු මගෙන් සමාව ගන්නෙහි නම් සූර්යයා අත්හරින්නෙමි" රජු ජාතිම තවසා අමතා මෙසේ කීවේය. "ස්වාමීනි! කමාකර ගන්න. මොහුගෙන් සමාව ගන්න." එවිට තවුසා "කිම මා වැනි උසස් ජාති ඇත්තෙකු මෙබඳු චණ්ඩාලයෙකුගෙන් සමාව ගන්නේද? මම සමාව නොගන්නෙමි"යි කීවේය. එවිට මිනිස්සු "කිම නුඹ තමාගේ කැමැත්තෙන් සමාව නොගන්නෙහිද?"යි අත්පාවලින් ඇදගෙන ගොස් මාතංගගේ පාමුල හොවා "සමාවන්න"යි කීහ. එවිට "ආචාර්යනි, සමාව දෙමි"යි මාතංග කීවේය.

මාතංග තාපස "මම නුඹට සමාව දී සූර්යයා අත්හරින්නෙමි. සූර්යයා උදාවූ කල්හි නුඹගේ හිස සත්කඩකට පැලේ"යි කියා මොහුගේ හිස පමණ වූ මැටි පිඩක් ඔලුව මත තබා - "මොහු ගෙල දක්වා ගඟෙහි බස්වා තබව"යි මිනිසුන්ට නියම කළේය. මිනිස්සුද එසේ කළහ. මේ වනවිට රටවැසි රජුගේ බල සෙනඟ රැස්වූහ. මහා පුරුෂයා සූර්යයා අත් හළේය. සූර්ය කිරණ පැමිණ මැටි පිඬෙහි වැදුණි. එය හත්කඩකට පැලුණි. තාපසයා දියේ කිමිද වෙනත් තොටුපලකින් ගොඩවී පලා ගියේය.

ශාස්තෘන් වහන්සේ මේ කථාව ගෙනහැර දක්වා "නුඹ දැන් පමණක් නොව භික්ෂූන්ගෙන් පරිභාස ලැබුවාහු - පෙරත් පරිභාස ලැබීය. නුඹගේ මේ අහේතුක ක්‍රෝධය නිසා රටින් ද පිටුවහල් කරන ලද්දෙහිය. එකල ජාතිම නම් වූයේ මේ තිස්ස භික්ෂුවමය. මාතංගගේ නම් මම වෙමි"යි පූර්වපර සන්ධි ගලපා තිස්ස හිමිට අවවාද දෙන සේක් "නඛො තෙ තං තිසස! පතිරූපං" යනාදිය පැවසූ සේක.

නවවන සූත්‍රයයි.

20. 1. 10.

දසවන සූත්‍රයේ - **"වණණවාදිනී"** යනු ආනිසංස කියන්නා වූ යනුයි. **"යං අතීතං තං පහීනං"** අතීත (ඉක්මගිය) ස්කන්ධ පඤ්චකයෙහි පැවති ඡන්දරාගය (කැමැත්ත) ප්‍රහාණයෙන් එය "ප්‍රහීන" නම් වේ. "අනාගතං" යනු නොපැමිණියා වූ ස්කන්ධ පඤ්චකයයි. එහි ඡන්දරාගය දුරුකිරීමෙන් එය "පටිනිසසටඨං" නම් වේ. **"සබ්බාභිඤ්ඤ"** යනු සියලු ස්කන්ධායතන ධාතූනු ත්‍රිවිධ භවයන් ද අභිභවනය කොට සිටී යනුයි. **"සබ්බවිදූ"** යනු ඒ

කියන ලද ආකාරයෙන් සියල්ල දන්නා ලද්දේ ප්‍රකට කර සිටී යනුයි. "සබ්බසු ධම්මෙසු" යනු ඒ ධර්මයන්හිම තණ්හා දෘෂ්ටි නම් වූ ආලේපයෙහි නොතැවරුණු. "සබ්බං ජහං" යනු එහිම සියල්ල එහි ඡන්දරාග ප්‍රහාණයෙන් අත්හැර සිටී යනුයි. "තණ්හක්ඛයෙ විමුත්තං" යනු තණ්හාව නැතිකිරීම නම් වූ නිර්වාණයෙහි තදාරම්මණ විමුක්තියෙන් මිදුණු යනුයි.

දසවන සූත්‍රයයි.

20. 1. 11.

එකොළොස්වන සූත්‍රයේ - "මහාකප්පිනො" යනු මෙනම් ඇති අභිඥා බල ඉපිදවූ අසූමහා ශ්‍රාවකයන් අතරින් ප්‍රධාන වූ මහතෙර නමකි.

උන්වහන්සේ ගිහිකල කුක්කුටවතී නුවර, තුන්සීයක් යොදුන් ඇති නුවරක රජ කළේය. පශ්චිම භවික සත්ත්වයෝ තම පුණ්‍යමහිමයට අනුරූප වූ පණිවුඩ ඇසීමටම යොමු වූ කන් ඇතිව හැසිරෙයි. එක් දිනක් දහසක් ඇමතියන් පිරිවරාගෙන රජු උයන් කෙළියට ගියේය. එකල්හි මධ්‍යම දේශයෙන් ඒ නගරයට පැමිණි සංචාරක වෙළඳ කණ්ඩායමක්, ඒ නුවරින් බඩුගෙන තැන්පත් (රැස්) කරවා, රජු දකින්නෙමුයි පුදපඬුරු ගත් අත් ඇතිව රජගෙදරට ගොස්, රජු උයනට ගිය බව දැන, රාජෝද්‍යානයට ගියහ. දොරටුවේ සිට දොරටුපාලයාට රජු දැකීමට අවශ්‍ය බව දනුම් දුන්හ. රජුට දන්වූ කල්හි රජු ඔවුන් කැඳවීය. පුදපඬුරු පිරිනමා වැඳ පසෙක සිටිකල්හි "දරුවනි! කොහිසිට පැමිණියාහුද?"යි රජු විමසුවේය. "දේවයන් වහන්ස, සැවැත්නුවර සිටයි." "ඔබගේ රට කෙසේද? මැනවින් යැපේද? රජු දැහැමිද?" "එසේය දේවයන් වහන්ස" "නුඹලාගේ දේශයේ කිසියම් වූ ශාසනයක් තිබේද?" "දේවයන් වහන්ස! ඇත. ඒ ගැන පැවසීමට ඉඳුල් කටින් නොහැක"යි වෙළෙන්දෝ කීහ. රජු රන් කෙණ්ඩියෙන් පැන් දුන්නේය. ඔවුහු මුව සෝදා දසබලයන් වහන්සේ දෙසට ඇදිලි බැඳගෙන "දේවයන් වහන්ස! අපගේ දේශයේ බුද්ධරත්නය පහළ විය." යැයි කීහ. රජු "බුද්ධ" යන වචනය ඇසූ පමණින්ම සියලු සිරුරෙහි පැතිරුණු ප්‍රීතියක් පහළ විය. ඉක්බිති "දරුව! නුඹලා 'බුද්ධ' යැයි කීවෙහිද?" "දේවයිනි! 'බුද්ධ' යැයි අපි කීවෙමු." මෙසේ තෙවරක්ම අස්වා 'බුද්ධ' යන පදය අප්‍රමාණය. එහි ප්‍රමාණ කළ නොහැක. එනිසා එයට පැහැදුණේ වෙළෙන්දන්ට ලක්ෂයක් ධනය දී "වෙනත් කවර ශාසනයක් වේද?"යි

ඇසීය. "දේවයන් වහන්ස ධර්මරත්නය පහළවී ඇත." එයද අසා එලෙසින්ම තෙවරක් ප්‍රතිඥා ගෙන තවත් ලක්‍ෂයක් දී නැවත "අන් කවර සසුනක් තිබේද?"යි ඇසුවේය. "දේවයන් වහන්ස! සංඝරත්නය පහළවිය"යැයි වෙළඳු පැවසුවිට එලෙසින්ම ප්‍රතිඥා ගෙන තවත් ලක්‍ෂයක් දී, දුන් බව තල්පතක ලියා "දරුවනි! දේවිය සමීපයට යවු"යි ඔවුහු මාලිගය වෙත යැවීය. ඔවුන් ගිය කල්හි ඇමතියන් විමසුවේය. "දරුවනි! බුදුරජ ලොව පහළවිය. නුඹලා කුමක් කරන්නහු ද?" "දේවයන් වහන්ස! නුඹවහන්සේ කුමක් කරන්නේද?" "මම පැවිදි වන්නෙමි." "අපිද පැවිදි වන්නෙමු." ඒ සියලුදෙන ම ගෙදර හෝ පවුල හෝ නොබලා යම් අසකු පිට නැගී ගියාහුද ඔවුන් සමග ම නික්මුණාහ.

වෙළෙන්දෝ අනෝජා දේවිය සමීපයට ගොස් කොළය (තල්පත) දක්වූහ. ඇය එය කියවා "රජු නුඹලාට බොහෝ කහවණු දී ඇත. නුඹලා කුමක් කළේද?"යි ඇසුවාය. "දේවිනි! ප්‍රිය වූ පුවතක් රැගෙන ආවෙමු"යි කී කල්හි "දරුවනි! අපටද ඇසීමට හැකිද?"යි ඇසුවාය. "දේවිනි! කිවහැකිය. ඉඳුල් සහිත මුවින් එය කිව නොහැක." ඇය රන් කෙණ්ඩියකින් පැන් දෙවුවාය. ඔවුහු මුව සෝදාගෙන රජුට දැන්වූ පරිදිම දැන්වූහ. ඇයද එය අසා උපන් ප්‍රමෝදය ඇත්තී රජු කළ පරිදිම එක් එක් පදයට තුන්වර බැගින් ප්‍රතිඥා ගෙන ප්‍රතිඥා ගණනට තුන තුන බැගින් කහවනු නව ලක්‍ෂයක් දුන්නාය. වෙළෙන්දන්ට කහවණු දොළොස් ලක්‍ෂයක් ලැබුණහ.

ඉක්බිති "දරුවනි! අපගේ රජු කොහිද?"යි දේවිය ඇසුවිට "දේවිනි, පැවිදි වන්නෙමියි නික්මුණේය"යැයි වෙළෙන්දෝ කීහ. "එසේනම් දරුවනි, නුඹලා යවු"යි ඔවුහු පිටත්කර හැර, රජු සමග ගිය ඇමතිවරුන්ගේ භාර්යාවන් කැඳවා, "නුඹලාගේ සැමියන් ගියතැන දනිවුද?"යි ඇසුවිට "ආර්යාවෙනි! දන්නෙමු. රජු සමග උයන්කෙළියට ගියෝය"යි කීහ. "එසේය. ඔවුහු එහි ගොස් 'බුද්ධරත්නය ලොව පහළවිය. ධර්මරත්නය ලොව පහළවිය. සංඝ රත්නය ලොව පහළවිය යන පණිවිඩය අසා දසබලයන් ලඟ පැවිදි වන්නෙමු'යි කියා සැවැත් නුවරට ගියහ. නුඹලා දැන් කුමක් කරන්නාහුද?" "ආර්යාවෙනි! නුඹවහන්සේ දැන් කුමක් කරන්නෙහිද?" ඒ ඇමති භාර්යාවෝ ඇසූහ. "මම පැවිදි වන්නෙමි. අපේ සැමියන් විසින් වැමෑරූ දෙය දිවඅග නොතබන්නෙමි"යි කීවාය. "එසේ නම් අපිද පැවිදි වන්නෙමු"යි රථ යොදවා නික්මුණහ.

රජු ද ඇමතියන් දහස සමග ගංගා තීරයට පැමිණියේය. එසමයේ ගඟ පිරී ඉතිරී යයි. ඉක්බිති ඔවුහු එය දැක - මේ ගඟ චණ්ඩ මත්ස්‍යයන්ගෙන් ඇත. අප සමග පැමිණි දාසයෙක් හෝ කම්කරුවෙක් හෝ නැත. අපට නැවක් හෝ පවුරක් සාදා දෙන්නෙකු නැත. මෙහි ශාස්තෘන් වහන්සේගේ ගුණ මහිමය යට අවීචියේ පටන් භවාග්‍රය දක්වාම පැතිර පවතී. ඉදින් ඒ ශාස්තෘ සම්මා සම්බුදුරජුන්ගේ ගුණ මහිමයෙන් මේ අශ්වයන්ගේ බුර මතුපිටවත් නොතෙමේවා!යා පවසා දිය මතුපිටින් අශ්වයන් දක්කූහ. (මෙහෙයූහ) එකදු අශ්වයෙකුගේවත් බුර මතුපිට නොතෙමුණි. රජ මාවතින් යන්නාක් මෙන් එතෙරට ගොස් නැවත ඉදිරියේ අනික් මහානදියකට පැමිණියහ. එහිදී ද වෙනත් සත්‍ය ක්‍රියාවක් නැත. මුලින් කල සත්‍යක්‍රියාවම සිදුකර, එම අඩයොදුන් පළලැති නදියද තරණය කළහ. තෙවනුවද "චන්‍ද්‍රභාග" නම් වූ මහා නදියකට පැමිණ ඉන් එතෙරවීමට ද එම සත්‍යක්‍රියාවම උපකාර කරගත්හ.

බුදුපියාණන් වහන්සේද එදින අළුයම් වේලෙහි මහාකරුණා සමාපත්තියෙන් නැගිට, ලොව බලන්නාහු - "අද කප්පින තුන්සීයක් යොදුන් සහිත රජකම අතහැර ඇමති දහසක් පිරිවරාගෙන මා ලඟ පැවිදිවීමට එන්නේය"යි දැක මවිසිත් ඔවුන්ට පෙරගමන් කළ යුතුයැයි උදෑසනම සිරුර පිළිදගුම් කර (ශරීරකෘත්‍ය) භික්ෂු මහා සංඝයා පිරිවරාගෙන, සැවතෙහි පිඬු පිණිස හැසිරුණු සේක් - සවස් කාලයේ පිණ්ඩපාතයෙන් වැලකී තමන් වහන්සේම පාසිවුරු ගෙන, අහසට පැනනැගී චන්‍ද්‍රභාග නදීතීරයේ ඔවුන් එතෙරවන තොට ඉදිරියේ ඇති මහනුගරුක මුල පලක් බැඳ හිඳගත් සේක් සිහිය පිහිටුවාගෙන සවණක් සන බුදුරැස් විහිදුවූ සේක. ඔවුහු එම තොටින් එතෙරවෙමින්ම සවණක් සන බුදුරැස් ඔබ්නොබ දුවන්නා වූ ආකාරය බලමින් දසබලයන් වහන්සේගේ පුන්සඳ වන් මුව දැක 'යම් ශාස්තෘ කෙනෙකුන් අරබයා අපි පැවිදිවූවාහු නම්, ඒකාන්තයෙන්ම මේ උන්වහන්සේය"යි දැකීම් පමණකින්ම නිශ්චය කරගෙන - දුටු දුටු මතින්ම පහතට නැමී වැඳගෙන පැමිණ බුදුරදුන්ට වැන්දහ. රජු ගොප්ඇට අල්ලාගෙන බුදුරදුන්ට වැඳ එකත්පසෙක හුන්නේය. ඇමතියන් දහසද එසේම හිඳගත්හ. ශාස්තෘන් වහන්සේ එම පිරිසට ධර්මදේශනා කළ සේක. සියල්ලෝම දේශනාව අවසානයේ රහත්ඵලයෙහි පිහිටා පැවිද්ද ඉල්ලා සිටියහ. බුදුපියාණන් වහන්සේ පෙර මොවුන් චීවරදානය සිදුකර ඇති බැවින් - මේ මොහොතෙහි තමාම තමාගේ සිවුරු රැගෙන ආ බැවින් රන්වන් ශ්‍රී බුද්ධ හස්තය දිගුකර "එන්න මහණෙනි! මේ ධර්මය මැනවින් දේශිතය. බඹසර හැසිරෙන්න. මැනවින්

දුක් කෙළවර කරන්න"යි වදාළහ. එයම එම පින්වතුන්ගේ පැවිද්ද ද උපසම්පදාවද විය. ඔවුහු වස් සියයක් ඇති තෙරවරු මෙන් බුදුහු පිරිවරා ගත්හ.

අනෝජා දේවිය ද රිය දහසක් පිරිවරාගෙන ගංගාතීරයට පැමිණ රජු සඳහා පැමිණි නැවක් හෝ පහුරක් හෝ නොදැක, තමාගේ ව්‍යක්ත බව නිසා මෙසේ සිතුවාය. "රජු සත්‍යක්‍රියා කොට ගියා විය යුතුය. ඒ ශාස්තෘන් වහන්සේ හුදෙක් ඔවුන් සඳහා පහල වූසේක් නොවෙයි. ඒ ශාස්තෘන් වහන්සේගේ ගුණබල මහිමයෙන් අපගේ රථ ජලයෙහි නොගිලේවා"යි සත්‍යක්‍රියා කොට, ජලය මතුපිටින් රථ ගෙන ගියාය. රථවල නිම් වලල්ල පමණවත් නොතෙමුණි. දෙවැනි-තුන්වැනි නදීත් එලෙසම සත්‍යක්‍රියාවෙන් එතෙරවූවා නුගරුක මුල සිටින බුදුපියාණන් වහන්සේ දුටුවාය. ශාස්තෘන් වහන්සේ මොවුහු - තම ස්වාමිපුත්‍රයෝ දුටුවහොත් ඡන්දරාගය උපදවාගෙන - මගඵල ලැබීමට අනතුරක් කරගන්නේය. එනිසා ඔවුනොවුන් නොදකින ලෙස අවශ්‍ය කටයුතු සිදුකළහ. ඒ සියලු කාන්තාවෝ තෙවැනි නදියෙන් එතෙර වූවාහු දසබලයන් වහන්සේට වැඳ පසෙක හුන්හ. ශාස්තෘන් වහන්සේ ඔවුන්ට ද ධර්මදේශනා කළ සේක. දේශනාව අවසානයේ දී ඒ සියලු දෙන ම සෝවාන් ඵලයෙහි පිහිටියහ. තම ස්වාමිපුත්‍රයන් සිටිනුද දුටුවාහ.

ශාස්තෘන් වහන්සේ උප්පලවණ්ණා තෙරණිය මෙහි පැමිණේවායි සිතූහ. තෙරණිය අවුත් ඒ සියළු දෙනම පැවිදි කර, භික්ෂුණී ආරාමය වෙත ගෙනගියාය.

ශාස්තෘන් වහන්සේ දහසක් භික්ෂූන් වහන්සේ පිරිවරාගෙන **ජේතවනයටම** වැඩිසේක. **මේ** කාරණය නිසා "**මහාකපපිනො**" යන නම් ඇති අභිඥා බලයන් ලැබූ අසූ මහසවුවන් අතර මහතෙරුන් යැයි කියන ලදී.

"**ජනෙතසමිං**" යනු පහළවූ කල්හිය. ප්‍රජාවෙහි යන අර්ථයි. "**යො ගොතත පටිසාරීනො**" යනු අපි වාසිට්ඨයෝය, ගෝතමයෝය යනුවෙන් ගෝත්‍රය සිහිකරති යනුයි. එසේයැයි පිළිගනිති. ඔවුන් අතරින් "**ඛත්තියො සෙට්ඨො**" ක්ෂත්‍රියයා ශ්‍රේෂ්ඨ වේ යන අර්ථයි. "**විජ්ජාචරණ සම්පන්නො**" යනු අටක් වූ විද්‍යාවන්ගෙන්ද පසළොසක් වූ චරණ ධර්මයන්ගෙන් යුක්ත වූ යනුයි. "**තපතී**" යනු බබලයි. "**ඣායී තපති බ්‍රාහ්මණො**" ක්ෂීණාස්‍රව

බ්‍රාහ්මණයා - දෙයාකාර ධ්‍යානයන්ගෙන් ධ්‍යාන වඩමින් බබළයි. ආලෝකය පතුරවමින් සිටියි. මේ වේලාවෙහි කාළදායී තෙරුන් වහන්සේ දෙයාකාර ධ්‍යානයන් වඩන සේක්, නුදුරුතැනක සිටිසේක. "**බුදෙධා තපති**" යනු සර්වඥ වූ බුදුරජාණන් වහන්සේ බබලයි.

මේ ගාථා පන්තිය "සබ්බ මංගල ගාථා" නම් වේ. භාතික රජු වනාහී එක් පූජාවක් කරවා භාණකයාට මෙසේ කීවේය. "ත්‍රිවිධ රත්නයෙන් නොමිදුණු එක් ජයමංගල ගාථාවක් දේශනා කරනු මැනවි." යනුවෙනි. ඔහු ත්‍රිපිටක බුදුවදනට මෙනෙහි කර මේ ගාථාව පැවසීය. "**දිවා තපති**" ආදිවෙචා" යනුවෙන් පවසා, බැසයන සූර්යයාට ඇදිලිබැඳ වැන්දේය. "රතතිං ආභානි චන්දිමා"යි උදාවන්නා වූ චන්‍රයාට ඇදිලිබැඳ වැන්දේය. "සනතදෙධා බතතියො **තපති**" යනුවෙන් රජුට ඇදිලි බැඳ වැන්දේය. "ඣායී **තපති** බ්‍රාහ්මණො" යනුවෙන් පවසා භික්ෂු සංඝයාට ඇදිලි බැඳ වැන්දේය. "බුදෙධා **තපති** තෙජසා" යනුවෙන් පවසා මහසෑයට ඇදිලි බැඳ දොහොත් නගා වැන්දේය. එවිට රජතුමා ඔහුට "අත පහත දමන්න එපා"යි පවසා ඔසවාගෙන සිටි අතෙහි ම දහසක් තැබීය.

එකොළොස්වන සූත්‍රයයි.

දොළොස්වන සූත්‍රයේ - "**චිරරතතං සමාහිතා**" යනු දිගු කාලයක් ගලපා බලා, සමකොට බලා සිටි ලබධි (පිළිගැනීම්) ඇත්තේ යනුයි. ඔවුහු වනාහි පන්සියයක් ආත්මභාවයන්හි එකටම හැසිරුනහ. "**සමෙති නෙසං සදධමෙමා**" යනු දැන් මොවුන්ගේ මේ ශාසන ධර්මය ගැලපේ. සමාන යනුයි. "ධමෙම අරියපවෙදිතෙ" යනු බුදුරජාණන් වහන්සේ විසින් දේශිත ශ්‍රී සද්ධර්යේය. මොවුන්ගෙන් මේ ශාසන ධර්මය ශෝභමාන වේ යන අර්ථයි. "**සුවිනීතා කපපිනෙනා**" යනු තමාගේ උපධ්‍යායකත්වයෙන් ආර්යයන් විසින් දේශිත ශ්‍රී සද්ධර්මයෙහි මැනවින් හික්මුණු යනුයි. ඉතිරි පද සැමතැන්හිම ප්‍රකටය.

දොළොස්වන සූත්‍රයයි.

භික්ෂු සංයුත්තය නිමියේය.

මෙසේ සාරත්ථප්පකාසිනී නම් සංයුත්ත නිකායට ලියූ අටුවාවෙහි නිදාන වර්ගයේ අර්ථ වර්ණනාව නිමාවේ.

21. 1. 1.

ඛත්තක වර්ගයේ පළමු සූත්‍රය - "භග්ගෙසු" යනු මෙනම් වූ ජනපදයෙහිය. "සුංසුමාරගිරෙ" යනු සුංසුමාරගිරි නුවරයි. ඒ නගරය නිර්මාණය කරන කල්හි සුංසුමාරයෙක් (කිඹුලෙක්) කැඟැසිය. එනිසා "සුංසුමාරගිරි" යන නාමය එම නුවරට තැබූහ. "භෙසකලාවනෙ" යනු "භේසකලා" නම් යක්ෂණිය අධිගෘහිත බැවින් මෙම නම ලැබූ වනයෙහි. එහිම මුවන්ට අභය සඳහා දෙන ලද ප්‍රදේශයක් බැවින් "මිගදාය" යනුවෙන් ද කියයි. බුදුපියාණන් වහන්සේ ඒ ජනපදය ඇසුරු කරගෙන එම වන ලැහැබෙහි වැඩවාසය කරන සේක. "නකුලපිතා" යනු නකුල නම් දරුවාගේ පියායි. "ජිණ්ණා" යනු ජරාවෙන් මහළු වූ යනුයි. "වුද්ධා" යනු වයසින් වැඩි වූයේ යනුයි. "මහල්ලකො" යනු මහල්ලෙකු බවට පත්වූයේ යනුයි. "අද්ධගතො" වයස්ගත වූයේ. "වයො අනුපපත්තො" යනු ඒ ත්‍රිවිධ වයසින් අන්තිම වයසට පැමිණියේ යනුයි. "ආතුරකායො" යනු ගිලන් වූ කය ඇති යනුයි. මේ ශරීරය රන්වන් වූයේ වුවද නිතර වැගිරෙන අර්ථයෙන් ආතුර වූ ගිලන් වූ. "ආතුර" යන නාම විශේෂයෙන් ජරාවෙන් රෝගී වූ ව්‍යාධියෙන් (ලෙඩ) රෝගී වූ හා මරණයෙන් ආතුර වූ යන තුනින් ආතුර වූයේ වේ. ඒවා අතුරින් මෙතෙමේ මහලු බැවින් ජරාවෙන් ආතුර වූවෙකි. නිතර රෝග වැළඳෙන බැවින් ව්‍යාධි ආතුරයෙකි. මෙය මෙහිදී අදහස් කරන ලදී. "අභිණ්හාතංකො" යනු නිතර රෝගී වූයේ, නිරන්තරව රෝගාබාධයන්ගෙන් පෙළෙනුයේ යනුයි. "අනිවඳසසාවී" යනු ඒ ආතුර බැවින් කැමති කැමති වේලාවට පැමිණීමට නොහැක. කලාතුරකිනම පැමිණීමට හැකියාව ඇත. සැමකල්හිම පැමිණීමට නොහැක යන අර්ථයි. "මනොභාවනීයානං" යනු මන වඩන්නවුන්ගේ යනුයි. යමෙකු දැකීමෙන් කුශල වශයෙන් සිත වැඩේ ද ඒ සාරිපුත්ත-මහාමොග්ගල්ලානාදී මහතෙරවරු මනෝභාවනීය (මන වඩන්නෝ) නම් වෙති. "අනුසාසතු" යනු නැවත නැවත අනුශාසනා කරනු මැනවි යනුයි. පළමු අවස්ථාවේ දෙන වචනය අවවාදයයි. (ඔවාද) ඊට පසුව කරනුයේ, වෙන් වෙන්ව සිදු කරනුයේ අනුශාසනාවයි. නැතහොත් වස්තුවෙහි බැසගත් වචනය 'ඕවාද' (අවවාදය) නම් වේ. නොබැසගත්, පේළි වශයෙන් - ප්‍රවේණි වශයෙන් පවසනුයේ 'අනුශාසනාව' නම් වේ. තවද ඕවාදය (අවවාදය) හෝ අනුශාසනාව යන දෙකෙහිම අර්ථය එකමය. ව්‍යඤ්ජන වශයෙන් ම නානාවිධය. "ආතුරො භයං" යනු මේ කය ආතුර වූවක්මය යනුයි. රන්වන් වූ පියගුවන් වූ ශරීර ඇත්තේ වුවත් නිත්‍ය වූ වැගිරීම් අර්ථයෙන් රෝගියෙක්ම ය. "අණ්ඩභූතො" යනු බිත්තරයක් මෙන් වූ යනුයි. ඉතා දුර්වල, යම්සේ කුකුල් බිත්තරයක් හෝ මොණර බිත්තරයක් හෝ පන්දුවක්

මෙන් ගෙන දමන්නට හෝ පහරදීමට හෝ නොහැක. ක්‍රීඩා කළහොත් එකෙණෙහිම බිඳේ. එසේ බිත්තරයක් මෙන් වූයේ අණ්ඩභූතො නම්. "පරියොනද්ධා" යනු සියුම් වූ සිවියක් පමණ වූ, හාත්පසින් වෙළන ලද යනුයි. බිත්තරය වනාහී හරවත් සිවියෙන් වෙළන ලද්දකි. එබැවින් මැසි මදුරුවන්ට සැඟවීවත් සම සිඳ යුෂ වැගිරවීමට නොහැකි වේ. මෙහි වනාහී (මනුෂ්‍යයන්ගේ) සම සිඳ කැමති දෙයක් සිදුකිරීමට මැසිමදුරුවන්ට පුළුවන. මෙසේ සියුම් සිවියෙන් වෙළන ලදී. "**කිමඤ්ඤනු බාල්‍යා**" යනු මෝඩ බව හැර අන් කුමක් වේද? මොවු බාලයෝමය යන අර්ථයි. එනිසා මේ කය මෙබඳු ස්වරූප ඇත්තකි.

"තෙනුපසංකමි" යනු චක්කවත්ති රජතුමාට උපස්ථානයට ගොස් අනතුරුව පරිනායක (සෙන්පති) රත්නයට උපස්ථාන පිණිස යන රාජ පුරුෂයකු මෙන් සද්ධර්මචක්‍රවර්තී ව බුදුරදුන්ගේ උපස්ථානයට ගොස් අනතුරුව ධර්ම සෙන්පතිට ගෞරව කරනු කැමතිව සාරිපුත්ත තෙරුන් වෙත එළඹියේය. "විපසනනානි" යනු මැනවින් ප්‍රසන්න වූ යනුයි. "ඉන්ද්‍රියානි" මනස සයවැනි වූ ඉන්ද්‍රියයන් "**පරිසුද්ධා**" යනු නිදොස්ය. "පරියොදාතො" යනු එයටම සමාන වදනකි. ක්ලේශයන්ගෙන් තොරවූ බැවින් මෙහි පිරිසිදුවයි කියන ලදී. සුදුපාට නිසා නොවේ. මොහුගේ ද ඉතා පිරිසිදු බව ඉන්ද්‍රියයන්ගේ පැහැදුණු බවින් ම දැනගත හැකිය. නය වශයෙන් ගන්නාවිට ප්‍රඥාව මේ තෙරුන්ට මේ. "**කිං හි නො සියා**" යනු කුමන කරුණකින් නොලබන ලද්දේ වන්නේ ද? ලබන ලද්දේමය යන අර්ථයි. මෙහිදී කුමක් දක්වයි ද? ශාස්තෘන් වහන්සේ සමග ඇති විශ්වාසී භාවයයි. මොහු වනාහි බුදුරදුන් දුටු දින පටන් පියෙකු මෙන් ප්‍රේමයද, මොහුගේ උපාසිකාව (බිරිඳ) මවක මෙන් ප්‍රේමයද ලබයි. මේ දෙදෙනාම "මගේ පුතුයැ"යි බුදුරදුන්ට වදිති. ඔවුන්ගේ සෙනෙහස භව ගණනාවක සිට පැවතෙන්නකි. ඒ නකුලමාතා උපාසිකාව පන්සීයක් ආත්මභාවවල තථාගතයන් වහන්සේගේ මවු වූවාය. ඒ නකුලපිතු ගහපතිතුමා පියා වූවේය. නැවත ආත්මභාව පන්සීයක් උපාසිකාව තථාගතයන් වහන්සේගේ ලොකුමව වූවාය. ගහපතිතුමා ලොකු තාත්තා විය. එසේම ආත්මභාව පන්සීයක දෙදෙනම බෑප්පා හා සුළුමව (කුඩා මව) වූහ. මෙසේ තථාගතයන වහන්සේ පෙර ආත්ම එක්දහස් පන්සීයක දී ම මේ දෙදෙනාගේම අතෙහි වැඩුණු සේක. එනිසාම ඔවුන් දෙදෙනාට යම්සේ පුතෙකුට පියා ලඟ හිඳ කථා කිරීමට නොහැකිද එසේම ශාස්තෘන් වහන්සේ ඉදිරියේ සිට කථාකිරීම අපහසු වෙති. මේ කාරණයෙන් භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි! මගේ ශ්‍රාවක වූ උපාසකයන් අතර විශ්වාස ඇත්තවුන්ගෙන්

නකුල පිතු ගහපති අග්‍ර වේ. නකුලමාතා උපාසිකාවන් අතර අග්‍රවේ"යැයි මොවුහු අගතනතුරුවල පිහිටවූහ. මෙසේ ඔහු මේ විශ්වාසික බව ප්‍රකාශ කරමින් "**කිං හි නො සියා**" යැයි කීවේය. "**අමතෙන අභිසිතෙතා**" යනු මෙහිදී අනික් කිසි ධ්‍යානයක් හෝ විදර්ශනාවක් හෝ මාර්ගයක් හෝ ඵලයක් හෝ අමෘතාභිෂේකයක් (අමාවෙන් අබිසෙස් කිරීමක්) ලෙස නො සැළකිය යුතුයි. මිහිරි ධර්මයක් ශ්‍රවණය කිරීමට ලැබීමට අමාවෙන් අභිෂේක කිරීමකැයි දතයුතුයි. "**දූරමොපි**" යනු රට හරහා, ජනපද හරහාය. "**අසසුතවා**" යන්නෙහිත් "**පුථුජ්ජනො**" යන්නෙහිත් අර්ථ පෙර කියන ලද්දේය. "**අරියානං අදස්සාවී**" යනාදියෙහි "අරියා" යනු ක්ලේෂයන්ගෙන් දුරුවූ බැවින් විපතෙහි ඉරියවු නො පවත්වන, සැපතෙහි ඉරියවු පවත්වන, දෙවියන් සහිත වූ ලෝකයෙන් නො ඇලුණු සිතැතිව වෙන්වී වසන බුදුවරු, පසේබුදුවරු හා බුද්ධ ශ්‍රාවකයෝය. නැතිනම් මෙහි 'ආර්ය' යනු බුදුවරුමය. එනිසා කියන ලදී. "මහණෙනි! දෙවියන් සහිත ලෝකයෙහි -පෙ- තථාගතයන් වහන්සේට "අරිය" යැයි කියනු ලැබේ." "**සපපුරිසා**" යන මෙහි පසේබුදුවරු ද තථාගත ශ්‍රාවකයෝ ද සත්පුරුෂයෝ යැයි දත යුතුයි. ඔවුන තර ලොවුතුරු ගුණ යෙදීමෙන් ශෝභන වූ පුරුෂයෝ ද සත්පුරුෂයෝය. ආර්ය, සත්පුරුෂ යන මේ පද දෙකින් සියලුම බුදුවරු ද පසේබුදුවුරු ද බුද්ධ ශ්‍රාවකයෝ ද අදහස් කරන ලදී. එනිසා කියන ලදී.

යො වෙ කතඤ්ඤූ කතවෙධි ධීරො
කල්‍යාණ මිතෙතා දළහ භතතිව හොති
දුබිතසස සකකචව කරොති කිච්චං
තථාවිධං සපපුරිසං වදනති

"යම් පුද්ගලයෙක් කළගුණ දන්නේද කළ උපකාරය දන්නේද නුවණැත්තේ ද කල්‍යාණ මිත්‍රයෙක් වන්නේ ද දැඩි භක්ති ඇත්තේ වේද දුකට පත්වූවන්ගේ කටයුතු සකසා කරයි ද එබඳු පුද්ගලයා සත්පුරුෂයෙකැයි කියති."a

"කල්‍යාණ මිත්‍රයා දැඩි භක්තිය හා විශ්වාසය ඇත්තෙකි"යි යන්නෙන් බුද්ධශ්‍රාවකයා අදහස් විය. කළගුණ දන්නේ ද ආදී වශයෙන් පැවසූ අනික් ගුණ සියල්ලෙන් ම පසේබුදුවරු ද ලොවුතුරු බුදුවරු ද අදහස් වේ. දැන් යමෙක් මේ ආර්යයන්ගේ ගතිස්වභාවයන් නොදක්නේද දුටුවත් "එය මැනවි" "හොඳයි" යනුවෙන් අනුමත නොකරයි ද ඔහු "ආර්යයන්

a. සුත්ත නිපාතය

නොදක්නා" යැයි දතයුතුය. එහි ද ඇසින් නොදැකීම හා නුවණින් නොදැකීම යනුවෙන් නොදැකීමෙහි කොටස් දෙකකි. එම දෙකින් නුවණින් (ඤාණෙන) නොදැකීම මෙහිදී අදහස් විය. මසැසින් හෝ දිවැසින් ආර්යයන් දුටුවත් එය "නොදැකීමක්ම" වේ. ඔවුන්ගේ ඇසින් වර්ණය පමණක් ගැනීමෙන් ආර්ය ගුණමහිමය අවබෝධ නොවේ. ගෝචර නොවේ. බලු කැණහිල්ලද ඇසින් ආර්යයන් දකිති. එය ඔවුහු "ආර්යයන් දැකීම"කියි නොසැලකේ. එහිදී මේ කථාවස්තුව යෙදේ.

සිතුල්පවු වැසි එක් රහත් වූ මහතෙර නමක් සිය උපස්ථායක වූ වයසට ගොස් පැවිදි වූ වුඩ්ඪ පබ්බජිතයෙකු එක්දිනක් තෙරුන් වහන්සේ සමග පිඬු පිණිස හැසිර; තෙරුන්ගේ පාසිවුරු ගෙන පිටුපසින් එන්නේ තෙරුන් වහන්සේගෙන් මෙසේ ඇසුවේය. "ස්වාමීනි! ආර්යයෝ නම් කවරාකාරද? ඔවුහු හඳුනාගත හැක්කේ කෙසේද?" තෙරුන් වහන්සේ "මේ සස්නෙහි ඇතැම් මහලු පුද්ගලයෙක් ආර්යයන්ගේ පාසිවුරු ගෙන වත්පිළිවෙත් කරයි. උන්වහන්සේ සමග එක් හැසිරෙයි. එසේ වුවත් ආර්යයන් පිළිබඳව ඔහු නොදනියි. මෙලෙස ආර්යයෝ නම් හඳුනා ගැනීමට ඉතා දුෂ්කරයෝමය." යැයි වදාළහ. මෙසේ පැවසුවත් ඔහු ආර්ය පුද්ගලයා හඳුනා නොගත්තේමය. එනිසා ඇසින් දකීම පමණක් ම "දැකීම" නම් නොවේ. නුවණින් දැකීම ම "දැකීම" නම් වේ. බුදුහු මෙසේ වදාළේ නොවේද? "චක්කලිය! මේ කුණුකය දෙස බලාසිටීමෙන් ඔබට ඇති අර්ථය කුමක්ද? චක්කලිය! යමෙක් මා දෙසූ ධර්මය මැනවින් දකීනම් ඔහු මා දකියි. යමෙක් නිවැරදි ලෙස මා දකී නම් ඔහු ධර්මය දකී." එනිසා මසැසින් බැලුවත් ඤාණයෙන් (නුවණින්) ආර්යයන් විසින් දක්නා ලද අනිත්‍යාදී ලක්ෂණ නොදක්නේ ද ආර්යයන් අවබෝධ කරගත් ධර්මයන් අවබෝධ කර නොගන්නේ ද ආර්ය බවට පත්කරන ධර්මයන්ගේ ඇති "ආර්ය" භාවය නොදක්නා බැවින් "ආර්යයන් නොදක්නේ"යැයි දතයුතුයි. **"අරිය ධම්මසස අකොවිදෝ"** යනු සතිපට්ඨානාදී භේද ඇති ආර්ය ධර්මයෙහි දක්ෂ නොවූයේ යනුයි. **"අරියධම්මෙ අවිනීතෝ"** යන මෙහිඃ-

දුවිධෝ විනයෝ නාම එක මෙකෙඤ පඤ්ඤධා
අභාවතෝ තසස අයං අවිනීතොති මුවචති

"විනය ප්‍රධාන වශයෙන් දෙයාකාරය. ඒ එක එක කොටස අනුබෙදීම් පහකට බෙදේ. මේ කිසිදු ප්‍රභේදයකට අයත් විනයක් නැති පුද්ගලයා "අවිනීත" නමින් හැඳින්වේ."

මෙහි වනාහී සංවර විනය හා ප්‍රහාණ විනය වශයෙන් විනයෙහි ප්‍රධාන බෙදීම් දෙකකි. මේ දෙක ද තවත් කොටස් පහකට බෙදේ. සංවර විනය වනාහි සීල සංවරය, සති සංවරය, ඤාණ සංවරය, ඛන්ති සංවරය හා විරිය සංවරය යැයි පස්වැදෑරුම්ය. ප්‍රහාණ විනය ද තදංග ප්‍රහාණ, විෂ්කම්භණ ප්‍රහාණ සමුච්ඡේද ප්‍රහාණ, පටිප්පස්සද්ධි ප්‍රහාණ හා නිස්සරණ ප්‍රහාණ යනුවෙන් පස්වැදෑරුම්ය. එහි "මේ ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් යුක්ත වූයේ - මැනවින් යුක්ත වූයේ"a යන මෙය සීල සංවරයයි. "චක්ෂු ඉන්ද්‍රිය ආරක්ෂා කරයි. චක්ෂු ඉන්ද්‍රිය සංවරය කිරීමට පැමිණේ."b මෙය සති සංවරයයි.

යානි සොතානි ලොකසමිං (අජිතාතිහගවා)
සති තෙසං නිවාරණං
සොතානං සංවරං බ්‍රූමි
පඤ්ඤායෙතෙ පිථීයරෙ

"භාග්‍යවතුන් වහන්සේ අජිත! ලෝකයෙහි යම් ශ්‍රෝතයන් (ගලායෑමක්) වේනම් සතිය ඒවායේ වැලැක්වීමයි. ශ්‍රෝතයන්ගේ සංවරය මම නියම කරමි. මෙය ප්‍රඥාවෙන් වසනු ලැබේ."c මෙය ඤාණ සංවරයයි.

"ශීතලත් උණුසුමත් ඉවසන ලද්දේ වේ.d මෙය ඛන්ති සංවරයයි. "උපන්නා වූ කාම විතර්කය නො ඉවසයි."d මෙය විරිය සංවරයයි. මේ සියල්ල ම සංවරයන්ය. තම තමාට අයත් පරිදි සංවර කළ යුත්තන්ගේ ද භික්මවිය යුත්තන්ගේ ද කාය දුශ්චරිතාදිය සංවර කිරීම් වශයෙන් "සංවරය" ද භික්වීම් වශයෙන් "විනය"ද කියයි. මෙසේ සංවර විනය පස් ආකාරයක බෙදේ යැයි දතයුතුයි.

එසේම යම් බඳු වූ නාමරූප බෙදා දැක්වීම් ආදියෙහි, විදර්ශනා ඤාණයෙහි විරුද්ධ වූ ස්වභාවයෙන් ප්‍රදීපාලෝකයෙන් ම එය ඔහුට වැටහේ. ඒ ඒ විදර්ශනා ඥානයෙන් ඒ ඒ අංගයාගේ ප්‍රහාණය සිදුවේ. ඒ කෙසේද යත්? නාමරූප වෙන්කිරීමෙන් සක්කාය දෘෂ්ටිය ද ප්‍රත්‍ය පරිග්‍රහණයෙන් අහේතුක වූ විෂමහේතුක වූ දෘෂ්ටිය ද එහිම පසුභාගය වූ සැක දුරුකිරීමෙන් සැක සහිත භාවය ද කලාප වශයෙන් විමසා බැලීමෙන් මම ය මාගේය වශයෙන් ගැනීම ද මාර්ගාමාර්ග වෙන් කිරීමෙන් අමාර්ගයෙහි මාර්ග සංඥාව ද හටගැනීම දැකීමෙන් උච්ඡේද දෘෂ්ටිය ද විනාශය දැකීමෙන් ශාස්වත දෘෂ්ටිය ද භය දැකීමෙන් භය සහිත

a. පටිසම්භිදා මග්ග. b. අංගුත්තර නිකාය c. සුත්තනිපාත d. මජ්ඣිම නිකාය

දෙයෙහි නිර්භය සංඥාව ද ආදීනව දැකීමෙන් ආශ්වාද සංඥාව ද කලකිරීම් අනුව බැලීමෙන් තදින් ඇලීමේ සංඥාව ද මිදෙනු කැමතිවීමේ ඤාණයෙන් නොමිදෙනු කැමති බවද උපේක්ෂා ඤාණයෙන් උපේක්ෂා රහිත බවද ක්‍රමානුකූල භාවයෙන් ධර්ම ස්වභාවයද නිර්වාණයෙන් විරුද්ධ වූ භාවයද ගෝත්‍රභූ චිත්තයෙන් සංස්කාර වශයෙන් නිමිති ගැනීමද ප්‍රහාණ වේ. මෙය තදංගප්‍රහාණ නම් වේ.

යමක් වනාහී උපචාර-අර්පණා භේදයෙන් සමාධියෙන් පවත්වන ලද භාවයන්ගේ වැලැක්වීමෙන් කල පහරින් ජලය මතුපිට වූ සෙවල ඉවත් වන්නාක් මෙන් ඒ ඒ නීවරණ ධර්මයන්ගේ ප්‍රහාණය වේ. මෙය විෂ්කම්භණ ප්‍රහාණය නම් වේ.

යමක් සතර ආර්ය මාර්ගයන්ගේ වැඩීමෙන් ඒ ඒ මාර්ග වශයෙන් තමාගේ සන්තානයේ දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණ වී යැයි ආදී වශයෙන් කියන ලද, සමුදය පක්ෂයට අයත් කෙලෙස් සමූහයේ අතිශයින් නොපැවතීම් වශයෙන් ප්‍රහාණය වේ. මෙය සමුච්ඡේද ප්‍රහාණය නම් වේ.

යමක් වනාහී විපාක ක්ෂණයෙහි ක්ලේෂයන්ගේ සංසිඳීමක් වේද යටපත් වීමක් වේද එය පටිපස්සද්ධි ප්‍රහාණය නම් වේ.

යම් ඒ සියලු සංඛත වස්තූන්ගේ ඉවත් කිරීමෙන්, සියලු සංඛතයන්ගේ ප්‍රහීණ කිරීමෙන් වන නිර්වාණය වේද එය නිස්සරණ ප්‍රහාණ නම් වේ.

මේ සියල්ල ප්‍රහාණය කරන ලදී. යම්හෙයකින් පරිත්‍යාග කිරීම් අර්ථයෙන් "ප්‍රහාණ" නම් වේද හික්මවීම් අර්ථයෙන් "විනය" නම් වේද එහෙයින් "ප්‍රහාණ විනය" යැයි කියයි. ඒ ඒ ප්‍රහාණයා වශයෙන් හෝ ඒ විනයේ හටගැනීමෙන් යුක්ත වූ "ප්‍රහාණවිනය" යැයි කියයි. මෙසේ ප්‍රහාණ විනයත් පස් අයුරකින් බිඳේයැයි දතයුතුයි.

එලෙසම මේ සංක්ෂිප්ත වශයෙන් දෙයාකාර වූ භේද වශයෙන් දසවිධ වූ "විනය", අසංවර හැසිරීම් දුරු කිරීමට ද අප්‍රහීන කෙලෙස් දුරු කිරීමට ද හේතුවේ. එබඳු වූ විනය - හික්මීම අශ්‍රැතවත් පෘථජ්ජනයාට නොමැත්තේ ද, ඔහු තුල එය නොමැතිවීම් වශයෙන් "මෙතෙම අවිනීත" යැයි කියයි. මේ විස්තර ක්‍රමය ම "සපපුරිසානං අදසසාවී සපපුරිසධම්මසස අකොවිදෝ සපපුරිසධම්මෙ අවිනීතෝ" යන මෙහිද දතයුතුයි. මෙහි අර්ථ නිරාකරණය කරන ලදී. එනිසා කියන ලදී - යමෙක් ආර්යයෙක්

වේද ඔහු සත්පුරුෂයෙකි. යමෙක් සත්පුරුෂයෙක් වේද ඔහු ආර්යයෙක් වේ. යමෙක් ආර්ය වූ ධර්මය යැයි කියයිද එයම සත්පුරුෂ ධර්මයද වේ. යමක් සත්පුරුෂ ධර්මය යැයි කියයිද එයම ආර්ය ධර්මය වේ. යමක් සත්පුරුෂ විනය යැයි පවතී ද එයම ආර්ය විනය යැයි දතයුතුය. ආර්යයන් කියා හෝ සත්පුරුෂයන් කියා හෝ ආර්ය ධර්මය කියා හෝ සත්පුරුෂ ධර්මය කියා හෝ ආර්ය විනය කියා හෝ සප්පුරිස විනය කියා හෝ යෙදෙන මේ සියල්ල එකම අර්ථය වේ. සම වූ දෙයක් එකම වූ දෙයක් මේ පදයන්ගෙන් අදහස් කෙරේ.

"රූපං අත්තතෝ සමනුපසසති" මෙහි ඇතමෙක් රූපය තමාගේ යැයි සිතයි. සලකයි. "යමක් රූපය වේද එය මම වේ. යමෙක් මම වේද එය රූපය වේ." මෙසේ රූපය ද ආත්මය ද දෙකක් ලෙස නොව එකක් ලෙස දකියි. සලකයි. යම්සේ දැල්වෙන්නා වූ පහනක ගිනිදැල්ලම එහි වර්ණය වේ. වර්ණයම ගිනිදැල්ල වේ යැයි ගිනිදැල්ලත් එහි වර්ණයත් එකක් ලෙස දකින්නේ ද මේ අයුරින්ම මෙහි ඇතමෙක් රූපය ආත්ම වශයෙන් සලකයි. -පෙ- රූපයත් ආත්මයත් එකක් ලෙස ගනියි. මෙසේ "රූපය ආත්මය"යැයි ද විශ්වාස කරයි. දෘෂ්ටියක් ලෙස එය ගනියි. **"රූපවන්තං වා අත්තානං"** යනු අරූපය ආත්මයැයි ගෙන සෙවනැල්ල ඇති ගසක් මෙන් ඒ රූපවත්භාවය මනාව සළකා බලයි යනුයි. **"අත්තනි වා රූපං"** යනු අරූපයම ආත්මය ලෙස ගෙන මලෙහි සුවඳ මෙන් ආත්මීයව රූපය දකියි යනුයි. **"රූපසමිං වා අත්තනාං"** යනු අරූපයම ආත්මය යැයි ගෙන කරඬුවෙහි ඇති මැණිකක් මෙන් ඒ ආත්මය රූපයෙහි ලා සළකයි යනුයි. **"පරියුට්ඨයායී"** යනු මැඩගෙන මතුවීම-අභිභවනය **කිරීම්** වශයෙන් සිටි රූපය "මමය මාගේයැ"යි මෙලෙස තණ්හා දෘෂ්ටීන්හි ගිලී, "අවසන් කර ගැනීම" නම් වේය යන අර්ථයයි. **"තසස තං රූපං"** යනු ඔහුගේ එසේ ගන්නා ලද රූපයයි. වේදනාදියෙහිද මෙසේම අර්ථ දතයුතුයි. එහි "රූපය ආත්මීය වශයෙන් සළකයි. විමසා බලයි" යනුවෙන් ශුද්ධ රූපයම ආත්මය යැයි කියන ලදී. "රූපමය වූ ආත්මය හෝ ආත්මීය වූ රූපය හෝ රූපයෙහි වූ ආත්මය, වේදනාව-සංඥාව සංස්කාරය -විඤ්ඤාණය ආත්මීය වශයෙන් විමසා බලයි." යන මේ සත් තැන්හි අරූපය ම ආත්මය යැයි කියන ලදී. වේදනාමය වූ ආත්මය හෝ ආත්මීය වූ වේදනාව හෝ වේදනාවෙහි වූ ආත්මය යනුවෙන් මෙසේ සිවු ස්කන්ධයන්හි ත්‍රිවිධාකාරව බැලීමෙන් දොළොස් තැනක රූපාරූප මිශ්‍ර වූ ආත්මය කියන ලදී. එහි "රූපය ආත්මීය වශයෙන්

විමසා බලයි. (සලකයි) "වෙදනං -පෙ- සංඥා, සංස්කාර, විඤ්ඤාණ ආත්මය වශයෙන් සලකන්නේය" යන පස්තැනෙහි උච්ඡේද දෘෂ්ටිය කියන ලදී. සෙසු ස්ථානවල ශාස්වත දෘෂ්ටිය කියන ලදී. මෙසේ මෙහි භව දෘෂ්ටිහු පසළොසකි. විභව දෘෂ්ටිහු පහකි. ඒ සියල්ල ම මාර්ගාවරණයෝ මය. දෙව්ලෝ ගමන ආවරණය නොකරයි. මේ සියල් පළමු සෝවාන් ආර්ය මාර්ගය වර්තය කරන්නේ යැයි දතයුතුයි.

"එවං බො ගහපති! **ආතුරකායො චෙව හොති ආතුර චිත්තො ච**" කය නම් බුදුරදුන්ගේ පවා ආතුර (ගිලන්) වූවකි. සිත වනාහී රාග-ද්වේෂ-මෝහ ආදියට අනුගත වූයේ අතුර වේ. ගිලන් වේ. එය මෙහිදී දක්වන ලදී. "නො ච ආතුර චිත්තො" යි කෙලෙස් නැති (නික්ලේශී) බැවින් සිතෙහි අනාතුරභාවය දක්වන ලදී.

මෙසේ මේ සූත්‍රයෙහි ලෞකික මහාජනයා - ආතුර වූ කය ඇත්තවුන් මෙන්ම ආතුර වූ සිත ඇත්තවුන් ලෙසද දක්වන ලදී. රහතන් වහන්සේලා ආතුර වූ කය හා ආතුර වූ සිත ඇත්තෝය. සප්ත සෙඛයෝ ආතුර වූ සිත් ඇත්තෝ ද අනාතුර වූ සිත් ඇත්තෝද නොවන්නේ යැයි දතයුතුයි. ඇසුරු කරන්නා ආතුර වූ සිත ම ඇසුරු කරන බව දතයුතුයි.

පළමු සූත්‍රයයි.

21. 1. 2.

දෙවන සූත්‍රයෙහි "දෙවදහං" යන්නෙහි "දේව" යනු රජවරුයි. ඔවුන්ගේ මංගල විලයි. තමාම හටගත් - ස්වාභාවිකව හටගත් බැවින් ද ඒ විලට "දේවදහ" යැයි කියයි. එම විලට නුදුරින් ඇති නියම්ගම "දේවදහං" යනුවෙන් (දේවදහ) නපුංසකලිංග වශයෙන් සළකනු ලැබේ. "පවිජා භූමම ගම්කා" යනු පවිජාභූමම නම් වූ අපරදිග පැවති ජනපදයකට යනු කැමැත්තෝය. "නිවාසං" යනු තෙමසක් වස් වසා වැඩ සිටීමයි. "අපලොකිතො" යනු විමසවු යනුයි. කුමක් නිසා තෙරුන්ගෙන් විමසනු ලැබේද? ඔවුහු සභාරයෙහි කැමැත්තෙනි. යමෙක් එකම විහාරයේ වාසය කළත් සමීපයට නොයයි. විහාරයෙන් පිටත්ව යන්නේ නොවිමසමාම යයි. මෙය "නිබභාර" නම් වේ. යමෙක් එක ම විහාරයේ වාසය කරනුයේ පැමිණ දැක කතාබහ කරයි. විහාරයෙන් පිටත්ව යනවිට ඒ පිළිබඳ විමසා

අවසර ගෙන යයි. මෙය "සභාර" නම් වේ. මේ භික්ෂූහු ද මේ ආදී යහපත් ශීලාදියෙහි වැඩෙවායි පතමින් භාග්‍යවතුන් වහන්සේ ඔවුහු සභාරයෙහි යෙදුණුවුන් කරනු කැමැත්තෙන් "තෙරුන්ගෙන් විමසන්න"යැයි වදාළහ. "පණ්ඩිතො" යනු චක්ෂුරාදී ධාතු විභාගයෙහි දක්ෂවීම් ආදී සතර වැදෑරුම් පාණ්ඩිත්‍යයෙන් යුක්ත වූ යනුයි. "අනුග්ගාහකො" යනු ආමිෂ අනුග්‍රහයෙන් ද ධර්මානුග්‍රහයෙන්ද යන දෙවැදෑරුම් අනුග්‍රහයන්ගෙන් අනුග්‍රාහක වූ යනුයි.

සැරියුත් තෙරුන් වහන්සේ වනාහී සෙසු භික්ෂූන් මෙන් උදෙන් ම පිඬු පිණිස නොගොස් සියලු භික්ෂූහු පිඬු පිණිස වැඩිකල්හි මුළු සංසාරය පුරාම හැසිරෙමින් නොහැමදූ තැන් අමදින සේක. ඉවත නොදැමූ කසල ඉවත දමන සේක. සංඝාරාමයෙහි නුසුදුසු තැන්වල තැබූ ඇඳ-පුටු-මැටි භාණ්ඩ ආදිය සුදුසු තැන තබන සේක. කුමන කරුණකින් මෙසේ කරන සේක්ද? අන්‍ය තීර්ථකයෝ විහාරයට පිවිස මේවා දැක පරිභව නොකරත්වා යන අදහසිනි. ඉක්බිති උන්වහන්සේ ගිලාන ශාලාවට වැඩ, ගිලන් වූ භික්ෂූන් සනසා "කිසිවක් අවශ්‍යද?"යි අසා අවශ්‍ය දෙයක් පැවසූ විට එය එවීම සඳහා එම රෝගී හිමිවරුන්ගේ සාමණේරවරුන් රැගෙන, පිඬු පිණිස හැසිරීමෙන් හෝ තමාට සුදුසු ගෙදරකින් හෝ බෙහෙත් හා අවශ්‍ය දේ පිළියෙල කරවා, සාමණේරවරුන්ට දී "ගිලනුන්ට උපස්ථාන කිරීම නම් බුදු-පසේබුදුවරු විසින් වර්ණිත දෙයකි. යන්න සත්පුරුෂයනි! අප්‍රමාදීව සත්කාර කරන්න"යි ඔවුහු ගිලන්හල වෙත යවා තමන් වහන්සේ පිඬුපිණිස හැසිරෙන සේක. නැතිනම් උපස්ථායක ගෙදරකින් දන් වළඳා විහාරයට වැඩම කරන සේක. මෙසේ උන්වහන්සේ නිතර වාසය කිරීමෙන් පුරුදු කරන ලද මහඟු ගුණ ඇත.

භාග්‍යවතුන් වහන්සේ චාරිකාවෙහි හැසිරෙන කල්හි, "මම අග්‍රශ්‍රාවක වෙමි"යි පාවහන් දමාගෙන - කුඩය ගෙන ඉදිරියෙන් නොයන සේක. එම පිරිසෙහි සිටින මහලු, ආබාධිත, ඉතා කුඩා හිමිවරු වෙත ගොස් ඔවුන්ගේ රිදෙන තැන්වල තෙල් ගා, මිරිකා උන්වහන්සේලාගේ පාසිවුරු තමන් වහන්සේගේ ළදරු සාමණේරවරුන්ට දී එදිනම හෝ දෙවන දිනයේ ඔවුන් සමග වඩින සේක.

එක්දිනක් මෙසේ වැඩි සැරියුත් තෙරණුවෝ ඉතා පසුවී පැමිණි බැවින් සෙනසුනක් නොලැබ, සිවුරු කුටියක හුන් බව දුටු බුදුපියාණන් වහන්සේ දෙවැනි දින භික්ෂු සංඝයා රැස්කරවා, ඇත් වඳුරු-නිත්තර

ජාතකය දේශනා කළ සේක. ඒ අනුව වැඩිමහල් පිළිවෙල අනුව සෙනසුන් දිය යුතු යැයි ශික්ෂා පදයක් ද පැනවූහ. මෙසේ සැරියුත් තෙරණුවෝ භික්ෂූන්ට ආමිසයෙන් උපකාර කරති. අනුග්‍රහ දක්වති.

උන්වහන්සේ භික්ෂූන්ට අවවාද දෙන විට සියවාරයක්, දහස් වාරයක් වුව ද අවවාද දී ශ්‍රාවක භික්ෂූහු සෝවාන් ඵලයෙහි පිහිටුවන සේක. ඉන්පසු වෙනත් භික්ෂුවකම අවවාද දෙන සේක. මේ ක්‍රමයෙන් අවවාද දී, උන්වහන්සේගේ අවවාද මත ක්‍රියාකොට රහත් වූ භික්ෂූන් වහන්සේලාගේ සංඛ්‍යාව අප්‍රමාණය. මෙසේ උන්වහන්සේ ධර්මානුග්‍රහණයෙන් භික්ෂූන්ට උපකාර කරන සේක.

"පවචසෙසාසුං"යැයි ඒ භික්ෂූහු අපගේ උපාධ්‍යායා නොවෙයි. ආචාර්යවරයා නොවෙයි. දැක පුරුදු අයෙකුත් නොවෙයි. උන්වහන්සේ ලඟ අපි කුමක් කරමුද?" ආදී වශයෙන් සිතමින් නිශ්ශබ්දව නොසිට "එසේය ස්වාමීනි!"යි බුදුපියාණන් වහන්සේගේ වචනය පිළිගත්හ. **"එළ ගලාගුමෙබ"** යනු කුඩා පැලෑටිවලින් ගැවසුණු මණ්ඩපයෙහිය. ඒ තෝර වන ලැහැබ නිති ජලය ඇති තැනක හටගනියි. එහි පා සතරක මණ්ඩපයක් කර, ඒ ලැහැබ මත එය නැංවූහ. එම තෝර පැල ඒ මණ්ඩපය වසා ගත්තේය. ඉක්බිති එහි යට ගඩොල් අතුරා වැලි විසුරුවා අසුන් පැනවූහ. දහවල් කාලයේ දියමුසු සුලං හමයි. තෙරුන් වහන්සේ එහි හුන් සේක. මෙය සඳහා "තුවර වන ලැහැබක" යනුවෙන් කියන ලදී. **"නානා වෙරජජ ගතං"** එක් රජකුගේ රාජ්‍යයෙන් වෙනත් පිටස්තර රාජ්‍යවලට ගියා වූ යනුයි. අන්‍ය රාජ්‍යයන්හි හැසිරෙන. යම් සේ "දේශ"යෙන් පිට ප්‍රදේශ "විදේශ" වන්නේද එසේම රාජ්‍යයෙන් පිට ප්‍රදේශ "විරජ්ජ" නම් වේ. එහි පැමිණියේ, එහි යෙදුණේ (විරජ්ජ+ක) "වෙරජජං" යැයි කියයි. **"බතතිය පණ්ඩිතා"** යනු බිම්බිසාර-කොසොල් ආදී පණ්ඩිත රජවරුය. **"බ්‍රහමණ පණ්ඩිතා"** යනු චංකී, තාරුක්ඛ ආදී පණ්ඩිත බ්‍රාහ්මණවරුය. **"ගහපති පණ්ඩිතා"** යනු චිත්ත සුදත්ත ආදී පණ්ඩිත ගහපතිවරුය. **"සමණපණ්ඩිතා"** යනු සභිය, පිලෝතිකාදී පණ්ඩිත පිරිවැජියෝය. **"වීමංසකා"** යනු අර්ථ සොයන්නෝය. **"කිංවාදී"** යනු "තමාගේ වාදය කුමක්ද"යි අසයි යනුයි. කුමන ලබ්ධිකයෝ ද යන අර්ථයි. **"කිමකඛායී"** යනු කිම ශ්‍රාවකයන්ට අවවාද අනුශාසනා කරන සේක්ද යනුයි. **"ධමමසසවානුධමමං"** යනු භාග්‍යවතුන් වහන්සේ දේශිත ව්‍යාකරණයෙහි අනුව්‍යාකරණ. **"සහධමමිකො"** යනු කරුණු සහිතවයි. **"වාදානුවාදො"** යනු භාග්‍යවතුන්

වහන්සේ දෙසූ අවවාදයෙහි අනුවාදයයි. "**වාදානුපාතෝ**" යනු ද පාඨයකි. ශාස්තෘන් වහන්සේගේ වාදයෙහි වාක්ප්‍රභාරය අනුව වැටීම, අනුව යෑම යන අර්ථයි. මේ වාදය බුදුරදුන්ගේ වාදය හා අනුව ගිය වාදයක්ම යැයි දක්වන ලද්දේ වේ. "**අවිගතරාගස්ස**" යනාදියෙහි තණ්හා වශයෙන් ම අර්ථය දතයුතයි. තණ්හාවෙහි ඇලීම-ඇලවීම යනු රාගයයි. කැමැත්ත දැක්වීම ඡන්දයයි. ප්‍රිය කිරීම් අර්ථයෙන් ප්‍රේමය (පේමං) වේ. බොහු කැමැත්තේ "පිපාසාව" දැවීම-තැවීම් අර්ථයෙන් "පරිළාහ"යැයි (පරිදාහ) කියනු ලැබේ. "**අකුසලෙ ධම්මෙ**" ආදිය කවර හෙයින් පටන් ගන්නා ලද්දේ ද? පඤ්චස්කන්ධයෙහි දුරු නොකළ රාගයෙහි ආදීනවද දුරුකළ රාගයෙහි ආනිසංසද දක්වීමට අරඹන ලදී. එහි "අවිසාතෝ" යනු දුකක් නැති බවයි. කරදර විපත් නැති. "අනුපායසෝ" තැවීමක් නැති යනුයි. "අපරිළාහෝ" යනු දැවිල්ලක් නැති යනුයි. මෙසේ සැමතැන්හි අර්ථය දතයුතුයි.

දෙවන සූත්‍රයයි.

21. 1. 3.

තෙවන සූත්‍රයේ - "අවනතිසු" යනු අවන්ති දක්ඛිණාපථ නම් වූ අවන්ති රටෙහිය. "**කුරඝරෙ**" එනම් වූ නගරයෙහිය. "**පපාතෙ**" යනු එක් පැත්තක වූ ප්‍රපාතයෙහිය. ඒ පර්වතයේ එක් පැත්තක් සිඳ දැමුවාක් (කපා දැමුවක්) මෙන් විය. "**පවෙතෙ**" යන පාඨය ද උචිතය. නානා තීර්ථකයන්ගේ ලබ්ධි-පිළිගැනීම් පවතින ස්ථානයකි යන අර්ථයි. මෙසේ මහාකච්චායන තෙරණුවෝ එම රටෙහි එම නගරය නසා මෙම පර්වතයෙහි වැඩවසති. "**භාලිදඝකානී**" යනු මෙනම් ඇති තැනැත්තාය. "අටඨකවගගියෙ මාගන්දිය **පඤ්හෙ**" යනු අට්ඨක වර්ගයෙහි මාගන්දිය නම් ප්‍රශ්නයක් ඇත. එම ප්‍රශ්නයෙහිය. "**රූපධාතු**"යැයි රූපස්කන්ධය අදහස් කරන ලදී. "**රූපධාතුරාග විනිබඳධං**" යනු රූප ධාතුවෙහි රාගයෙන් (ඇලීමෙන්) බැඳුණු යනුයි. "**විඤ්ඤාණං**" යනු කර්ම විඥානයයි. "**ඔකසාරී**" යනු ගෘහාලයෙහි හැසිරෙන යනුයි. කුමක් නිසා මෙහි "විඤ්ඤාණ ධාතු" යනුවෙන් නොවදාළේ ද? මූලාවීම දුරුකිරීම සඳහායි. "ඔකො" යනු අර්ථයෙන් ප්‍රත්‍ය-හේතුව කියයි. පුරේජාත වූ කර්ම විඥානය ද පවජාජාත වූ කර්ම විඥානයටද විපාක විඥානයටද විපාක විඥානයත්, විපාක විඥානයට කර්ම විඥානයත් ප්‍රත්‍ය වේ. එනිසා විඥානය කී වැදෑරුම්ද?යි මූලාවන්නේය. එම මූලාව

දුරුකිරීමට එය නොගෙන අමිශ්‍ර වූයේම දේශනාව කළ සේක. තවද ආරම්මණ වශයෙන් සතර අභිසංඛාර විඤ්ඤාණයන්හි පැවැත්ම කියන ලදැයි එය දැක්වීමට මෙහි විඤ්ඤාණය නො ගන්නා ලදී. "**උපායුපාදානා**" යනු තණ්හා උපාය සහ දිට්ඨි උපාය වශයෙන් ඇති දෙවැදෑරුම් උපායන්ය. කාමුපාදාන ආදි සිවු උපාදානයන් ද ගතහැකිය. "**චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා**" යනු අකුසල සිතේ අධිෂ්ඨාන වූත් ආශා කිරීම් සහිත වූත් එමෙන් සැඟවී පවත්නා වූත්ය. "**තථාගතස්ස**" යනු සම්මා සම්බුදුරජාණන් වහන්සේගේය. සියලුම ක්ෂීණාස්‍රවයන්ගේ මෙය ප්‍රහීන වූයේ ම ය. ශාස්තෘන් වහන්සේ වනාහි ක්ෂීණාස්‍රවභාවයෙන් ලොව ඉතා ප්‍රකට වූ උපරිම කෙළවර වේ. එනිසා මෙසේ කියන ලදී. "**විඤ්ඤාණ ධාතුයා**" යනු මෙහි විඤ්ඤාණය කුමක් නිසා ගන්නා ලද්දේ ද? කෙලෙස් ප්‍රහීණවීම දැක්වීම සඳහායි. කෙලෙස් හුදෙක් සිවු ස්කන්ධයන්ගේ ප්‍රහීනවීම නොවේ. පඤ්චස්කන්ධයෙහිම ප්‍රහීණ විය යුතුයැයි කෙලෙස් ප්‍රහීණවීම දැක්වීම සඳහා මෙය ගන්නා ලදී. "**එවං බො ගහපති! අනොකසාරීහොති**" යනු මෙසේ කර්ම විඤ්ඤාණයෙන් නැවත ගිහිගෙයි නොහැසිරීම් වශයෙන් අනෝකසාරී නම් වේ යනුයි. "**රූප නිමිත්ත නිකෙත විසාර විනිබන්ධා**" යනු රූපයම ක්ලේශයන්ගේ ප්‍රත්‍යවීම් වශයෙන් නිමිති වූ යනුයි. ආරම්මණ ක්‍රියා සංඛ්‍යාත වූ වාසස්ථානය ක්ලේශයන්ගේ ප්‍රත්‍යවීම් වශයෙන් නිමිති වූ යනුයි. ආරම්මණ ක්‍රියා සංඛ්‍යාත වූ වාසස්ථානය වීම් අර්ථයෙන් නිකේතනයක් වූ රූප නිමිත්තට නිවාස වූ. විසාර හෙවත් පැතිරීම හා විනිබන්ධ හෙවත් බැඳීම යන දෙකින්ම කෙලෙසුන්ගේ පැවතීමම කියන ලදී. රූප නමැති නිවාසයෙහි පැතිරීම් හා බන්ධනයෝ - "රූප නිමිත්ත තිකෙත විසාර විනිබන්ධා" නම් වේ. එනිසා රූප ආරම්මණය නමැති නිවාසයෙහි උපන් කෙලෙසුන්ගේ පැතිරීමෙන් හා කෙලෙස් බන්ධනය හේතුවෙන් යන අර්ථයි. "**නිකෙතසාරිනි වුචචති**" යනුවෙන් අරමුණු කිරීම් වශයෙන් 'නිවාස ස්ථානයෙහි හැසිරෙන්නා' යැයි කියනු ලැබේ. "**පහීනා**" යනු ඒ රූප අරමුණට වාසස්ථාන වූ කෙලෙසුන්ගේ පැතිරීම හා බන්ධනයත් ප්‍රහීන වූ යනුයි. කුමක් නිසා මෙහි පංචස්කන්ධය "ඕක" යැයි කියන ලද්දේ ද? ඕඩ අරමුණු නිකේතයැයි කියන ලද්දේද? "අද අසුවල් තැන ක්‍රීඩා කරමු"යැයි කරන ලද සංකේත ඇති - නිවාස වූ උයන් ආදිය වේද, එහි කියන ලද පරිදි භාර්යා, ධනය, ධාන්‍ය ආදිය පිරුණු ගෙදර පිළිබඳ ඡන්ද රාගය බලවත් වේ. මෙසේ බාහිර වූ සවැදෑරුම් ආරම්මණයන් හි ඡන්දරාගයේ බලවත් වූ දුබලතාව නිසා මෙසේ දේශනා කරන ලදැයි දත යුතුයි. "සුඛිතෙසු සුඛිතො" යනු උපස්ථායකයන් කෙරෙහි ධන-ධාන්‍ය

ලැබීම් වශයෙන් සුඛිත වූ යනුයි. "දන් මම මනාප වූ භෝජනයක් ලබන්නෙමි"යි ලෞකික දේ හා බැඳි සුවයෙන් සුවපත් වූයේ වෙයි. ඔවුනු විසින් ලබන ලද සැප සම්පත් අනුභව කරන්නාක් මෙන් හැසිරෙත්. **"දුකඛිතෙසු දුකඛිතො"** යනු ඔවුන් කිසියම් කරුණකින් දුකක් උපන් කල්හි දෙගුණ වී දුකින් දුකට පත්වූයේ වෙයි යනුයි. **"කිච්චකරණියෙසු"** යනු කෘත්‍ය සංඛ්‍යාත වූ කළයුතු (කරණීය) ධර්මයන්හිය. "වොයොගං ආපජ්ජති" යනු තමා එහි යෙදීමට, ඒ කටයුතු සිදුකිරීමට පැමිණේ යනුයි. "කාමෙසු" යනු වස්තු කාමයන්හි. **"එවං බො ගහපති! කාමෙහි අරිතෙතා හොති"** යනු මෙසේ ක්ලේශ කාමයෙහි හිස්-ශූන්‍ය නොවූයේ වේ යනුයි. කාමයන්ගේ ඇතුලත්වීම් වශයෙන් හිස් නොවූ. යහපත් පක්ෂය නම් මේවායේ අභාවයෙන්-නැතිවීමෙන් ඇතිවන "හිස් බවයි. ශූන්‍ය බවයි" යනුවෙන් දතයුතුයි. **"පුරෙකඛරානො"** යනු සසර පැවැත්ම පෙරටු කර ගැනීමයි. "මෙබඳු රූප ඇතිවේවා!" ආදී වශයෙන් දිගු-කෙටි, කළු-සුදු ආදී වශයෙන් රූපයෙහි "මෙසේ රූපය වේවා!"යි ප්‍රාර්ථනා කරයි. **"අපුරෙකඛරානො"** යනු සසර පැවැත්මට උපකාර වන දේ කරනු නොලැබීමයි. සසර පැවැත්ම පෙරටු කර නොගනිමින්, **"සහිතං මෙ අසහිතං තෙ"** යනු නුඹගේ වචන අයුක්තිය. රළුය. මගේ වචන යුක්ති සහගතය. මටසිලිටුය. මිහිරිය. මිහිරි පානයක් හා සමානය යනුයි. **"ආචිණ්ණං තෙ විපරාවත්තං"** යනු යමක් නුඹ විසින් දිගුකාලයක සිට පුරුදු කරන ලද ද, මැනවින් ප්‍රගුණ කළේ ද එය මගේ වාදයට පැමිණ, සියල්ල ක්ෂණයකින් පෙරලී ගියේය. නැවතුණි යනුයි. **"ආරොපිතො තෙ වාදො"** යනු නුඹගේ දොස් මවිසින් නගන ලද්දේය. (පෙන්වාදෙන ලදී.) **"වර වාදපප මොකඛාය"** යනු ඒ ඒ ආචාර්යවරු වෙත පැමිණ මතුයෙහි සොයන්නේ මේ වාදයන්ගෙන් මිදීම පිණිස හැසිරෙව. ඇවිදුව යනුයි. **"නිබ්බෙඨයෙහි වා සචෙ පහොසි"** යනු ඉක්බිති තමාම සමත් වේනම් මෙහිදීම ගැටළුවලින් මිදෙන්න යනුයි.

තෙවන සූත්‍රයයි.

21. 1. 4.

සිවුවන සූත්‍රයේ **"සකකපඤ්හ"** යනු චූල ශක්‍ර ප්‍රශ්නයෙහි. මහා ශක්‍ර ප්‍රශ්නය ද මෙහි කියන ලද්දේමය. **"තණ්හා සංඛය විමුත්තා"** යනු තණ්හාව ක්ෂය කිරීම නම් වූ නිවනෙහිය. එය අරමුණු කරගත් ඵල

විමුක්තියෙන් මිදුණුහුය. "**අචලනතනිටයා**" යනු අන්තය ඉක්මවූ නිෂ්ටාවයි. නිරන්තර නිෂ්ටාවයි. සෙසු පදයන්හිද මේ ක්‍රමයෙන් අර්ථ දතයුතුයි.

සිවුවන සූත්‍රයයි.

21. 1. 5.

පස්වන සූත්‍රයේ - "සමාධිං" යනු මෙය භාග්‍යවතුන් වහන්සේ, එම භික්ෂූන් චිත්ත ඒකාග්‍රතාවයෙන් පිරිහී යනු දැක, චිත්ත ඒකාග්‍රතාව ලබන්නන්ට මේ කමටහන උපකාර වන්නේ යැයි දැන මෙසේ වදාළහ. "**අභිනඳති**" යනු ප්‍රාර්ථනා කරයි. "**අභිවදති**" ඒ ප්‍රාර්ථනාවෙන් අනේ ප්‍රියයි! මනෝඥයි! සිත් පිනවයි! ප්‍රියමනාපයි! යනුවෙන් පවසයි. වචනයෙන් සතුටුවනුයේ- ප්‍රාර්ථනා කරනුයේ, ඒ අරමුණ සඳහා මෙසේ ලෝභ උපදවනුයේ "අභිවදති" නම් වේ. "**අජෙඣාසාය තිටයති**" යනු ගිල-නිමාවට පමුණුවා ගනියි. "යා රූපෙ නන්දී" යම් ඒ රූපයක බලවත් ප්‍රාර්ථනා කිරීම් සංඛ්‍යාත වූ තෘෂ්ණාවයි. "**තදාපදානං**" යනු එය ගැනීම් අර්ථයෙන් උපාදාන (දැඩිව ගන්නා) වූ යනුයි. "**නාභිනඳති**" ප්‍රාර්ථනා නොකරයි. "**නාභිවදති**" ප්‍රාර්ථනා වශයෙන් අමනෝඥය! අප්‍රියයැයි කියයි. විදර්ශනා සිතින් යුක්තව අනිත්‍යය, දුකය ආදී ලෙස සිතින් ද වචනයෙන් ද සිහිපත් කරනුයේ "**නාභිවදති**" ප්‍රකාශ නොකරත්මය.

පස්වන සූත්‍රයයි.

21. 1. 6.

සයවන සූත්‍රයේ "**පටිසල්ලාතෝ**" යනු මෙය භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂූන් වහන්සේලා කාය විවේකයෙන් පිරිහී යනු දැක කාය විවේකය ලැබීම සඳහා මේ කමටහන උපකාර වේයැයි, අභිවෘද්ධිදායක වේයැයි දැන මෙසේ වදාළහ.

සයවන සූත්‍රයයි.

21. 1. 7.

සත්වන සූත්‍රයේ "**උපාදාපරිතසසනං**" යනු දැඩිව ගැනීමෙන් උපන් ආශාවෙන් පීඩිතවීමයි. (පරිතස්සතාව) "**අනුපාදා අපරිතසසනං**" යනු

දැඩිව නොගැනීමෙන් උපන් ආශාදියෙන් පීඩා නොවීමයි. (අපරිතස්සනාව). **"රූපච්පරිණාමානු පරිවතති විඤඤාණං හොති"** "මගේ රූපය වෙනසකට පත්වූවකි"යි හෝ "අහෝ, මට දැන් ඒ රූපය නැත ආදී වශයෙන් කර්ම විඥානය රූපයේ බෙදීම-පෙරලීම අනුව පෙරලෙයි. **"විපරිණාමානු පරිවතතිජා"** යනු විපරිණාමයේ අනුව පෙරලීමෙන් විපරිණාමය අරමුණු වූ සිතින් උපන් යනුයි. **"පරිතසසනා ධම්මසමුපපාදා"** යනු තණ්හාවෙන් පීඩිත වීම ද අකුශල ධර්මයෙන් ඉපිදවීම ද යනු දෙකයි. "චිතතං" යනු කුසල් සිතයි. **"පරියාදාය තිටඨනති"** යනු හාත්පසින් ගෙන සිටී. "උතතාසවා" යනු තැතිගැනීම් සහිතවයි. "විසාතවා" යනු පීඩා සහිත දුක් සහිත යනුයි. **"අපෙකඛාවා"** යනු ආලය සහිතවයි. **"උපාදාය ච පරිතසසති"** දැඩිව ගෙන පෙළෙන්නේ වේ. **"නරූප විපරිණාමානුපරිවතති"** රහතන්වහන්සේට කර්ම විඥානයම නැත. එනිසා රූප පෙරලීම අනුව පෙරලීම සිදුනොවේ යැයි පැවසීම සුදුසුය.

සත්වන සූත්‍රයයි.

21. 1. 8.

අටවන සූත්‍රයේ - තණ්හාව, මානය, දෘෂ්ටිය වශයෙන් දේශනාව කරන ලදී. මෙසේ පිළිවෙලින් සිවු සූත්‍රයන්හි සසර පැවැත්ම හා සසර නැවැත්ම පිළිබඳවම පවසන ලදී.

නවවන සූත්‍රයයි.

21. 1. 9

නවවන සූත්‍රයේ - **"කොපන වාදෝ පචචුපපනනසස"** යනු ප්‍රත්‍යුත්පන්නයෙහි කවර කථාවක්ද? යනුයි. මෙය අනිත්‍යමය. ඒ භික්ෂුව අතීත-අනාගත දෙක අනිත්‍යයැයි සලකා වර්තමානයෙහි වෙහෙසුනහ. ඉක්බිති "ඔවුන්ට මෙයින් අතීතයත් අනාගතයත්, වර්තමානයත් (ප්‍රත්‍යුත්පන්න) අනිත්‍යයැයි දෙසූවිට එකරුණ අවබෝධ කරගන්නෝය" යනුවෙන් ඔවුන්ගේ අදහස දැන-බුදුපියාණෝ පුද්ගල අදහස් වශයෙන් මේ දේශනාව දෙසන ලදහ.

දසවන සූත්‍රයයි.

21. 1. 10-11

දසවන - එකොළොස්වන සූත්‍රවල - "**දුක්ඛං අනත්තා**" යන පදයන්ගෙන් විශේෂණය කර, එබඳුම පුද්ගල අදහසින් පැවසූ සේක.

පළමුවන නකුලපිතු වර්ගයයි.

21. 2. 1-10

අනිත්‍ය වර්ගයේ - අවසාන සූත්‍රය පුච්ඡාවසිකයකි. (ප්‍රශ්නයකට දුන් පිළිතුරකි) සෙසු සූත්‍ර අවබෝධ කරගන්නවුන්ගේ වශයෙන් දෙසන ලදහ.

දෙවැනි අනිත්‍ය වර්ගයයි.

21. 3. 1.

භාර වර්ගයේ පළමු සූත්‍රයේ "**පඤ්චුපාදානක්ඛන්ධාතිස්ස වචනීයං**" යනු පඤ්චුපාදානස්කන්ධා ඉති අස්ස වචනීයං යනුයි. මෙසේ කිවයුතු වන්නේය යන අර්ථයි. "**අයං වුච්චති භික්ඛවෙ භාරෝ**" යනු යමෙක් මේ පංච උපාදානස්කන්ධය "මේ භාරය" යැයි කියයි ද එයයි. කුමන අරුතකින්ද? ආරක්ෂාවට යෙදූ බරපතල වූ අර්ථයෙනි. (පරිහරණයේ බරපතලකම) මේවායෙහි ගමන්කිරීම-නිදීම-නිදීම-නෑම-සැරසීම-කෑම්-බීම් ආදී පරිහරණය අතිශය බැරෑරුම්යැයි පරිහරන භාරියාර්ථයෙන් "**භාර**" යැයි කියන ලදී. "**එවං නාමෝ**" යනු තිස්ස, දත්ත ආදී නාමයන්ය. "**එවං ගොත්තෝ**" යනු කණ්හායන, වච්ඡායන ආදී ගෝත්‍රයන්ය. මෙසේ ව්‍යවහාර මාත්‍රයෙන් සිද්ධවන පුද්ගලයා "භාරහාර" යැයි දක්වයි. පුද්ගලයා වනාහී ප්‍රතිසන්ධික්ෂණයෙහි ම මේ ස්කන්ධ භාරය උසුලාගෙන දසවසක්, විසිවසක්, සියක් වසක් වුවද මේ ස්කන්ධ භාරය නාවමින්, කවමින්, මෘදු සැප ඇති ඇඳ පුටුවල නිදිකරමින්, හිඳුවමින් පරිහරණය කොට, චුතිවන ක්ෂණයෙහි හැරදමා නැවත ප්‍රතිසන්ධික්ෂණයෙහි වෙනත් ස්කන්ධ භාරයක් ගනු ලැබේ. එනිසා "භාරහාර" යැයි කියන ලදී. පහළ විය. "**පොනොභවිකා**" යනු පුනර්භවය ඇතිකරවන යනුයි. "**නන්දිරාග සහගතා**" යනු නන්දිරාගය සමග එකතුකොට යනුයි. ඒ බව සහිත වූ යන්න මෙහිදී අදහස් විය. "**තත්‍රතත්‍රාභිනන්දිනී**" යනු උත්පත්ති ස්ථානයෙහි හෝ රූපාදියෙහි ද

ආරම්මණයන්හි ද ඒ ඒ තැන සතුටුවන ස්වභාව ඇති යනුයි. කාම තණ්හාදියෙහි පඤ්චකාම ගුණික වූ රාගය-ඇලීම කාම තණ්හාව නම් වේ. රූ, අරූ භව රාගය-ධ්‍යාන තෘෂ්ණාව-ශාස්වත දෘෂ්ටි සහගත වූ රාගය යන මෙය භවතණ්හාව නම් වේ. උච්ඡේද දෘෂ්ටිය සහගත වූ (යුක්ත වූ) රාගය විභව තණ්හාව නම් වේ. "භාරාදානං" යනු භාරය ගැනීමයි. තණ්හාවෙන් මේ භාරය අල්වා ගනියි. "අසෙස විරාග නිරොධො" යනාදී සියල්ලම නිවනට යෙදුණු සමාන වදන්ය. එයට පැමිණ තණ්හාව ඉතිරි නොකර, නො ඇලෙයි. නිරුද්ධ වේ. අත්හරියි. දුරුකරයි. මිදෙයි. මෙහි කාම හෝ දෘෂ්ටි පිළිබඳ ඇලීමක් නැත. නිවණට ම මේ නම් යෙදේ. "සමූලං තණ්හං" යනු තණ්හාවේ මුල අවිද්‍යාව යනුයි. "අබ්බුයහ" යනු අර්හත් මාර්ගයෙන් ඒ මුල් සහිත තණ්හාව උදුරාදමා යනුයි. "නිච්ඡාතො පරිනිබ්බුතො" යනු තණ්හාව නැත්තේ පිරිනිවියේ නමැයි කීමට සුදුසුය යනුයි.

පළමු සූත්‍රයයි.

21. 3. 2.

දෙවන සූත්‍රයේ - "පරිඤ්ඤයෝ" යනු සම්පූර්ණයෙන් දතයුතු. ඉක්මවිය යුතු යන අර්ථයි. "පරිඤ්ඤං" යනු කෙළවර ඉක්මවූ පරිඥාවයි. ඉක්මවයි යන අර්ථයි. "රාගකඛයො" යනාදියෙහි නිවණට නම් වේ. එය "අචචනත පරිඤ්ඤා" නම් වේ.

දෙවන සූත්‍රයයි.

21. 3. 3

තෙවන සූත්‍රයේ - "අභිජානං" යනු මනාසේ දනිමින් යනුයි. මෙයින් ඤාත පරිඥාව පවසන ලදී. දෙවැනි දයෙන් තීරණ පරිඥාව ද තෙවන-සිවුවන පදවලින් ප්‍රහාණ පරිඥාව දැයි මේ සූත්‍රයෙහි ත්‍රිවිධ පරිඥාවක් කියන ලදී.

තෙවන සූත්‍රයයි.

21. 3. 4-9

සතරවන සූත්‍රයේ සිට ධාතු සංයුත්තයේ කියන ලද ක්‍රමයෙන් දතයුතුයි. පිළිවෙලින් මෙහිදී පස්වන-සයවන හා සත්වන සූත්‍රවලදී චතුරාර්ය සත්‍ය ප්‍රකාශ වේ. අට-නව සූත්‍රවලදී සසර පැවැත්ම හා නැවැත්ම කියැවේ.

21. 3. 10-11

දසවන සූත්‍රයේ "අසං" යනු දුකයි. මෙසේ මෙහිදීද දුකෙහි ලක්‍ෂණම පැවසේ. එකොළොස්වන සූත්‍රයේ - "**පභංගු**" යනු බිඳෙනසුලු ස්වභාවයයි. මෙසේ මෙහි අනිත්‍ය ලක්‍ෂණය ම කියන ලදී.

තෙවැනි භාරවග්ගය නිමියේය.

21. 4. 1.

නතුම්හාක වර්ගයේ පළමු සූත්‍රයෙහි "**පජහථ**" යනු ඡන්දරාගය ප්‍රහාණ කිරීමෙන් අත්හරිවු යනුයි. තෘණාදියෙහි "**තිණං**" යනු ඇතුලත හරයක් නැති පිටත සාරය ඇති තල්-පොල් ආදියයි. "**කටඨං**" යනු ඇතුලත සාරය ඇති පිටත හරයක් නැති කිහිරි-සල්-කොස් ආදී දැවයි. "සාඛා" නම් ගසේ බාහුමෙන් නික්මෙන අතු ඉතිය. "**පලාසං**" නම් තල්-පොල් ආදී ගස්වල කොළඅතුය.

පළමු සූත්‍රයයි.

21. 4. 2.

දෙවැනි සූත්‍රය උපමාවකින් තොරව අවබෝධ කරගන්නවුන්ගේ අදහස් වශයෙන් දේශනා කරන ලදී.

දෙවැනි සූත්‍රයයි.

21. 4. 3.

තෙවැනි සූත්‍රයෙහි **"රූපං චෙ භනෙත අනුසෙති"** යනු ඉදින් රූපය අත්නොහැර පවතියි ද එයයි. **"තෙන සංඛං ගවඡති"** යනු කාමරාගාදියේ යම් අප්‍රකට දෙයකින් ඒ රූපය අත්නොහරියි ද ඒ අනුසයෙන්ම පුද්ගලයා ඇලුණේය. දුෂ්ට වූයේය. මූඪ වූයේයැයි ප්‍රඥප්තියට (පැනවීමට) යයි ය යි. **"න තෙන සංඛං ගවඡති"** යනු ඒ අසත්‍ය වූ අනුශය මගින් රක්ත වූයේය. දුෂ්ට වූයේය. මූඪ (මුලා) වූයේය. යන සංඛ්‍යාවට නොයයි යනුයි.

තෙවන සූත්‍රයයි.

21. 4. 4.

සතරවන සූත්‍රයේ - **"තං අනුමීයති"** යනු ඒ කලක් පැවති (අනුසයිත වූ) රූපාදිය නැතිවනුයේ අනුසයත් සමග ම නැසේ යනුයි. අරමුණ බිඳි යන කල්හි, ඒ අරමුණට හේතු වූ ධර්මයෝ නොපවතින්නේ ම ය. **"යං අනුමීයති"** යනු යම් වූ රූපයක් යම් අනුසයකින් අනුව නැසේද එයයි. **"තෙන සංකං ගවඡති"** යනු ඒ රාගාදී ක්ලේශධර්ම අනුව ඇලුණේය. දුෂ්ට වූයේය හා මුළා වූයේය යන සංඛ්‍යාවට යයි යනුයි. නැතහොත් **"යං"** යන කරණ විභක්ති (තතියා) වචනයකි. යම් අනුසයකින් නැසේද එයින් රක්ත වූයේය. දුෂ්ට වූයේය. මුළාවූයේය යන සංඛ්‍යාවට යයි යන අර්ථයි.

සිවුවන සූත්‍රයයි.

21. 4. 5.

පස්වන සූත්‍රයේ **"ඨිතසස අඤ්ඤථත්තං"** යනුවෙන් දරන්නා වූ ජීවමානව පවතින්නා වූ 'ජරාව' පෙන්වා දෙයි. ප්‍රකටව පෙනේ. ඨිති යනු ජීවිතින්ද්‍රිය නම් වූ චිත්ත-චෛතසික ධර්ම ආරක්ෂා කිරීමට යෙදුණු නමකි. **"අඤ්ඤථං"** යනු ජරාවයි. දිරායෑමයි. එනිසා පැරැන්නෝ මෙසේ කීහ.

උපපාදො ජාති අකඛාතො - භංගො වුතෙතා වයොතිව
අඤ්ඤථත්තං ජරා වුතතා - ඨිතිව අනුපාලනා

"ඉපදීම 'ජාති' යැයි කියන ලදී. වැනසියාම, විනාශවීම 'භංග' යැයි කියන ලදී. අත්බවකට පත්වීම (වෙනස්වීම) 'ජරා' වයැයි ද එය ආරක්ෂා වී පැවතීම 'ඨිති' යැයි ද කියනු ලැබේ."

මෙසේ එක් එක් ඉපදීම-දිරායෑම-භංගවීම නම් වූ ත්‍රිවිධ ලක්ෂණයෝ වෙත්ද ඒ සඳහා කියන ලදී. "මහණෙනි! මේ ත්‍රිවිධ ලක්ෂණයෝ හේතුප්‍රත්‍ය එකතුවීමෙන් හටගත් සංඛත වස්තූන්හි ලක්ෂණ වෙති." එහි "සංඛත" නම් හේතු ප්‍රත්‍යයන්ගේ සමවායෙන් පහළවන දෙයයි. යම්කිසි සංස්කාරයක, සංස්කාරය ලක්ෂණය නොවේ. ලක්ෂණය සංස්කාරය නොවේ. සංස්කාරයෙන් තොරව ලක්ෂණය පෙන්වීමට නොහැකිය. ලක්ෂණවලින් තොරව සංස්කාර නොපවතී. ලක්ෂණයන් ප්‍රකට වන කල්හි සංස්කාර ප්‍රකට වන්නේය. යම්සේ ගවදෙන ලක්ෂණය නොවේ. ලක්ෂණයම ගවදෙන නොවේ. නමුත් ගවදෙන අත්හැර ලක්ෂණ පෙන්වාදීමට නොහැක. ලක්ෂණ අත්හැර ගවදෙන පෙන්වාදීමටද නොහැක. ලක්ෂණයන්තේම ගවදෙන ප්‍රකට වන්නීය. මෙසේ සියලු පද අර්ථ දතයුතුයි.

එහි සංස්කාරයන්ගේ උත්පාද ක්ෂණයෙහි සංස්කාරයන් ද උත්පාද ලක්ෂණ ද කාල සංඛ්‍යාත වූ ඒ ක්ෂණයෙහි ප්‍රකට වේ. උත්පාදය (ඉපදීම)ද පවතී යැයි කී කල්හි සංස්කාරය ද ජරා ලක්ෂණ ද කාලසංඛ්‍යාත වූ ඒ ක්ෂණයෙහි ප්‍රකට වේ. භංග ක්ෂණයෙහි සංස්කාර ද ඒ ලක්ෂණය ද කාල සංඛ්‍යාත වූ ඒ ක්ෂණයෙහි ප්‍රකට වේ. ඇතැම් සම්ප්‍රදායන්හි මෙසේ පැවසේ. (මහාවිහාරික නොවන) අරූප ධර්මයන්ගේ දිරායන ක්ෂණය නම් ප්‍රකටව දැක්වීමට නොහැක. සම්මා සම්බුදුරජාණන් වහන්සේ ද වේදනාවෙන් ඉපදීම ප්‍රකට වේ. විනාශවීම ප්‍රකට වේ. සිටියේ (පැවති අයුරින්) අන් අයුරකට පත්වීම ප්‍රකට වේ." යැයි දෙසූසේක් අරූප ධර්මයන්හි ද ත්‍රිවිධ ලක්ෂණය පණවයි. ඒවායින් ඇති (පවතින) ක්ෂණය දැඩිව ගැනීමෙන් ලැබේ යැයි පවසා-

අතීතා සබ්බ ධම්මානං ඨිතිනාම පවුච්චති
තසෙසව හෙදෝ මරණං සබ්බදා සබ්බපාණනනති

"සියලු ධර්මයන්ගේ පැවතීමෙන් "ඨිති" නමින් එය හැඳින්වේ. සැමදා ම සෑම ප්‍රාණියෙකුගේම මේ පවතින ධර්මයන්ගේ බිඳීයාම ම 'මරණය' ලෙස හැඳින්වේ."

මේ ආචාර්යවරුන්ගේ ගාථාවෙන් එම අර්ථය සම්පූර්ණ කරයි.

නැතහොත් තෘෂ්ණා වශයෙන් එතැන සිටී බව (යීති) දැනගත යුතුයැයි කියයි. සූත්‍රයෙහි මෙහි විශේෂයක් නොමැති බැවින්, ආචාර්ය මතයෙන් සූත්‍රය නො වළක්වා මේ සූත්‍රයම ප්‍රමාණ කළ යුතුය.

පස්වන සූත්‍රයයි.

21. 4. 6.

සයවන සූත්‍රයේ අර්ථ ඉතා ප්‍රකටය.

සවැනි සූත්‍රයයි.

21. 4. 7.

සත්වන සූත්‍රයේ-"ධම්මානුධම්මපටිපන්නස්ස" යනු නව ලෝකෝත්තර ශ්‍රී සද්ධර්මයන්ගේ අනුලෝම වූ ධර්මයන්ගේ පූර්වභාග ප්‍රතිපදාවට පිළිපන්නහුම යනුයි. "අයමනුධම්මො" යනු මේ අනුලෝම ධර්මය වේ යනුයි. "නිබ්බිදාබහුලො" යනු කළකිරීම බහුල වී යනුයි. "**පරිජානාති**" යනු ත්‍රිවිධ පරිඥාවෙන් විශේෂයෙන් දැනගනියි යනුයි. "**පරිමුච්චති**" යනු මාර්ගක්ෂණයෙහි උපන් ප්‍රහාණ පරිඥාවෙන් මිදෙයි යනුයි. මෙසේ මෙම සූත්‍රයෙහි ආර්ය මාර්ගය කියන ලද්දේ වේ. එසේම මීට පසුව එන සූත්‍ර තුනෙහිද එය කියැවේ. මෙම සූත්‍රයේ වනාහී නුවණින් බැලීම, නියම නැත. පසුව එන සූත්‍රයන්හි එය නියමිතය. එනිසා මෙහිදී ද එය නියමිත වශයෙන්ම නියමකොට ගතයුතුයි. මේ ත්‍රිවිධ ලක්ෂණයන් නුවණින් සළකා බැලීමෙන් තොරව සසර පිළිබඳ කළකිරීමට හෝ නිවණ අවබෝධ කරගැනීමට හෝ නොහැක.

සතරවන නකුලපිතෘ වර්ගයයි.

21. 5. 1.

අන්තදීප වර්ගයේ පළමු සූත්‍රය - "අතතදීපා" යනු තමා දිවයිනක්, පිහිටක්, ආරක්ෂාවක්, ගතියක්, පිහිටක්, උපකාරයක් කර වෙසෙවූ යන අර්ථයයි. "**අතතසරණා**" යනු මෙයටම සමාන වචනයකි. "අනඤ්ඤසරණා"

මෙය අනෙකෙකුගේ පිහිට සෙවීම ප්‍රතික්ෂේප කරයි. අනිකෙක් අනිකකුට පිහිට නොවේ. අනිකකුගේ වෑයමෙන් අනිකකුගේ දුකින් මිදීම සිදු නොවේ. මෙය කියන ලදී. "තමාට පිහිට තමාමය. තමාට පිහිටවන වෙන අයෙක් සිටින්නේ කොහිද?"a එනිසා "අනඤ්ඤසරණා" (අනිකකු පිහිට නොවේ)යැයි කියන ලදී. මෙහි "අත්ත" නම් කවුද? "අත්තා"(තමා) යනු ලෞකික-ලෝකෝත්තර ධර්මයන්ය. එනිසා "**ධම්මදීපා ධම්මසරණා අනඤ්ඤසරණා**" යනුවෙන් කියන ලදී. "**යොනි**" යනු කාරණයයි. හේතුවයි. "මෙය භූමියේ උපන් ඵලයන් අවබෝධයට හේතුවකි." ආදියෙහි මෙනි. "**කිං පහොනිකා**" යනු "කුමක් ප්‍රමුඛ කොට ඇත්තේද? කොතැනින් හටගනී ද?" යන අර්ථයි. "**රූපසඤ්ඤෙව**" මෙය ඒ ශෝකාදියේ ප්‍රභාණය දැක්වීමට ම අරඹන ලදී. "**නපරිතස්සති**" යනු නොගනියි. බිය නොවේ යනුයි. "**තදංග නිබ්බුතෝ**" එයින් විපස්සනා (විදසුන්) අංගයන්ගෙන් ශෝකාදිය නිවුණු බැවින් තදංග වශයෙන් (තාවකාලිකව) නිවුණෙකි. මේ සූත්‍රයෙහි විදර්ශනාවම කියන ලදී.

පළමු සූත්‍රයයි.

21. 5. 2.

දෙවන සූත්‍රයෙහි - "**දුකඛසමුදයගාමිණී සමනුපස්සනා**" යනු යම් හෙයකින් කය සාර වශයෙන් ගැනීම දුකකි යනුයි. එයද සමුදයගාමිණී ප්‍රතිපදාව නම් රූපය ආත්ම වශයෙන් බලන්නේය" යනුවෙන් මෙසේ දෘෂ්ටිය සලකා බැලීම කියන ලදී. එනිසා දුක් ඇතිවීමේ මාර්ගය දක්වෙන සමනුපස්සනාව (සලකා බැලීම) යැයි මෙහිදී අර්ථ දතයුතුය. "**දුකඛනිරොධ ගාමිණී සමනුපස්සනා**" යන මෙහි විදර්ශනාවත් සමග සිවුමාර්ග ඤාණය 'සමනුපස්සනාව' (මැනවින් බැලීම-දැකීම) යැයි කියන ලදී. මෙසේ මෙම සූත්‍රයෙහි සසර පැවැත්ම හා නැවැත්ම පිළිබඳව කියන ලදී.

දෙවැනි සූත්‍රයයි.

21. 5. 3.

තෙවන සූත්‍රයේ - "**සම්මපඤ්ඤාය දට්ඨබ්බං**" යනු විදර්ශනා සහිත මාර්ග ප්‍රඥාවෙන් දතයුතුයි යනුයි. "**විරජ්ජති විමුච්චති**" යනු

මාර්ගක්ෂණයෙහි නොඇලේ. විපාක ක්ෂණයෙහි මිදෙයි යනුයි. "අනුපාදාය ආසවෙහි" යනු නූපදින නිරෝධයෙන් නිරුද්ධ වූ, ආශ්‍රවයන් නොගෙන මිදෙයි යනුයි. "රූපධාතුයා" ආදිය ප්‍රත්‍යවේක්ෂණය දක්වීමට කියන ලදී. විපාකය සමග ප්‍රත්‍යවේක්ෂණ දර්ශනය යැයි කියත්මය. "ඨිතං" යනු මතුයෙහි කරන ලද කෘත්‍යානුභාවයෙන් සිටී යනුයි. "ඨිතතතා සනතු සසිතං" යනු පැමිණිය යුත්ත පැමිණි බවින් සතුටු වූ යනුයි. "පවත්තතංයෙව පරිනිබ්බායති" යනු තමාම පිරිනිවේ යනුයි.

තෙවන සූත්‍රයයි.

21. 5. 4.

සිවුවන සූත්‍රයේ "පුබ්බනතානුදිටඨියෝ" යනු පූර්වාන්තයට අනුගත වූ අටළොස් දෘෂ්ටිහු නොවෙති. "අපරනතානුදිටඨියෝ" යනු අපරාන්තයට අනුගත වූ සිවුසාළිස් ධාතුහු නොවෙති. "ඨාමසා පරාමසෝ" යනු දෘෂ්ටි ශක්ති විසින් දෘෂ්ටි අල්ලා ගැනීමක් සිදු නොවෙයි යනුයි. මෙපමණෙකින් පළමු මාර්ගය දක්වන ලදී. දැන් විදර්ශනාව සමග තුන් මාර්ගයන්ද ඵලයන්ද දැක්වීමට "රූපසමිං" ආදිය අරඹන ලදී. නැතහොත් දෘෂ්ටිහු නම් විදර්ශනාවෙන්ම ප්‍රහීනය. මෙය වනාහී මතුයෙහි විදර්ශනාව සහිතව සිවු මාර්ගය දක්වීමට අරඹන ලදී.

සිවුවන සූත්‍රයයි.

21. 5. 5.

පස්වන සූත්‍රයේ - "පඤ්චුපාදානක්ඛනධෙ සමනුපසසනති එතෙසං වා අඤ්ඤතරං" යනු පිරිපුන්ව ගැනීම් වශයෙන් පංචස්කන්ධය දකියි. අපරිපූර්ණව ගැනීම් වශයෙන් මෙයින් අන්‍ය වූ දෙයක් හෝ දකියි යනුයි. "ඉති අයංචෙව සමනුපසසනා" යනු මේ දෘෂ්ටි සමනුපස්සනාවයි. "අසමීති චසස අවිගතං හොති" යනු යමෙකුට මේ සමනුපස්සනාව ඇත්නම් එහි "මම වෙමි"යි තණ්හා-මාන-දෘෂ්ටි සංඛ්‍යාත වූ ප්‍රපඤ්චත්‍රය ඉවත් නොවූයේ ම ය. "පඤ්චනනං ඉනද්‍රියානං අවකකනති හොති" යනු ඒ ක්ලේශයන් උපන් කල්හි කර්ම ක්ලේශ ප්‍රත්‍යයන්ගේ වූ පසිඳුරන්ගේ ඉපදීම වේ. "අතථි සිකඛවෙ මනො" යන මෙය කර්මය සඳහා කියන ලදී.

"ධම්මා" යනු අරමුණයි. "**අවිජ්ජාධාතු**" යනු ජවන ක්‍ෂණයෙහි අවිද්‍යාවයි. "**අවිජ්ජා සම්ඵස්සජෙන**" අවිද්‍යාවෙන් යුක්ත වූ ස්පර්ශයෙන් හටගත්. තවද "මනො" යනු භවංගක්‍ෂණයෙහි විපාක මනෝධාතුවයි. ආවර්ජන ක්‍ෂණයෙහි ක්‍රියා මනෝ ධාතු කර්මාදිය කියන ලද පරිදිමය. "**අසම්හි පිසසහොති**" යනු තණ්හා-මාන-දෘෂ්ටි වශයෙන් "මම වෙමි"යි ඔහුට සිත්වේ යනුයි. මෙයින් අන්‍ය වූ "අයමහසම්"යි රූපාදියෙහි කිසියම් හෝ ධර්මයක් ගෙන මෙය "මම වෙමි"යි ආත්ම දෘෂ්ටි වශයෙන් කියන ලදී. "**භවිසසනති**" යනු ශාස්වත දෘෂ්ටි වශයෙනි. "**සභවිසසනති**" යනු උච්ඡේද දෘෂ්ටි වශයෙනි. "**අථෙතා**" යනු ඉක්බිති ඒ ආකාරයෙන්ම සිටි මේ ඉන්‍ද්‍රියයන්හිය. "**අවිජ්ජාපහියති**" යනු සිවු සත්‍යයන්හි නොදන්නා බව වූ අවිද්‍යාව ප්‍රහීන වේ යනුයි. "**විජ්ජා උපජජති**" යනු අර්හත් මාර්ග විද්‍යාව උපදියි. "අසමි" යනු තෘෂ්ණා-මාන දෘෂ්ටිහුය. මෙසේ මේ කර්මයාගේ පසිඳුරන් අතරෙහි එක් සන්ධියකි. විපාකමය වූ පංචේන්‍ද්‍රිය පාක්ෂික වූ පසිඳුරන්ගේ කර්මය අතර එක් සන්ධියකි. මෙසේ ත්‍රිවිධ ප්‍රපඤ්චයෝ ඒකාන්තයෙන් ඉක්මගියෝය. ඒකාන්තයෙන් ඉන්‍ද්‍රියාදිය ප්‍රත්‍යුත්පන්නය. එහි කර්ම මනස ආදීකොට අනාගතයේ ප්‍රත්‍ය දක්වන ලදී.

පස්වන සූත්‍රයයි.

21. 5. 6.

සවැනි සූත්‍රයේ - රූපස්කන්ධය කාමාවචරය. සිවු ස්කන්ධයෝ සිවුභූමිකය. "**සාසවං**" යනු ආශ්‍රවයන්ගේ අරමුණු ස්වභාවයෙන් ප්‍රත්‍ය වූ යනුයි. "**උපාදානීයං**" යනු එසේම උපාදානයන්ගේ ප්‍රත්‍ය වූ යනුයි. මෙහි වචනාර්ථය වනාහී - අරමුණුකොට පවත්වයි. ආශ්‍රවයන් සහිත වූයේ සාශ්‍රවය. දැඩිව ගතයුතු යනු උපාදානීය වූ. මෙහිද රූපස්කන්ධය කාමාවචරය. ඉතිරි වූ ත්‍රෛභූමික විදර්ශනාව වාර වශයෙන් කියන ලදී. මෙසේ මෙහි රූපය රාශි අර්ථයෙන් ස්කන්ධයන්හි පිවිසියේය. ආශ්‍රව සහිත වූ යන අර්ථයෙන් උපාදානස්කන්ධයන්හි පිවිසියේය. වේදනාදියෙහි ආශ්‍රව සහිත වූත් ආශ්‍රව රහිත වූත් වශයෙන් ප්‍රභේද වේ. ඒවා ද රාශි අර්ථයෙන් සියලුම ස්කන්ධයන්හි පිවිසියේය. ත්‍රෛභූමික වූ ධර්මයෝ මෙහි ආශ්‍රව සහිත වූ යන අර්ථයෙන් උපාදානස්කන්ධයන්හි පිවිසේ.

සයවන සූත්‍රයයි.

21. 5. 7.

සත්වන සූත්‍රයේ "සෙය්‍යෝ හමසමී" යනු විශිෂ්ට වූ උතුම් වූ " මම වෙමි"යැයි සිතයි යනුයි. "**කිමඤ්ඤත්‍ර යථාභූතසස අදසනා**" යනු තත් වූ පරිද්දෙන් නොදැකීමෙන් අනික් කිසිවක් වන්නේය. නොදැකීම අඥානකම පිණිසම වේ යන අර්ථයි. මෙහි දී දැන් ඔහුට ත්‍රිවිධ වෘත්තයක් ඇති වජ්‍රඡේද දේශනාව අරඹන සේක් "**තං කිං මඤ්ඤසි සොණා**" යනාදිය දෙසූහ.

සත්වන සූත්‍රයයි.

21. 5. 8.

අටවැනි සූත්‍රයේ අර්ථ ඉතා ප්‍රකටය.

21. 5. 9-10

නවවන හා දසවන සූත්‍රයන්හි - "**නන්දිකඛයා රාගකඛයො රාගකඛයා නන්දිකඛයො**" යන මෙහි නන්දිය (ඇලීම) හෝ රාගය යන අර්ථයෙන් එතෙර කරවීම අර්ථයෙන් කියන ලදී. නිර්වේද අනුපස්සනාවෙන් හෝ කළකිරීමට පත්වනුයේ තෘෂ්ණාව දුරුකරයි. විරාග අනුපස්සනාවෙන් නො ඇලෙන්නේ රාගය දුරුකරයි. මෙපමණකින් විදර්ශනාව නිමාකර, "**රාගකඛයා නන්දිකඛයො**" යනුවෙන් මාර්ගය දක්වා "**නන්දිරාගකඛයා චිත්තං විමුචචති**" යනුවෙන් ඵලය (විපාකය) දක්වන ලදී.

නවවන හා දසවන සූත්‍රයන්ය.

පස්වන අත්තදීප වර්ගය නිමියේය.

මූල පණ්ණාසකය සමාප්ත විය.

21. 1. 1.

උපය වර්ගයේ පළමු සූත්‍රය - "**උපයො**" යනු තණ්හා-මාන-දෘෂ්ටි වශයෙන් පංචස්කන්ධයට පැමිණි යනුයි. "**විඤ්ඤාණං**" යනු කර්ම

විඤ්ඤානයයි. "ආපජෙජය්‍ය" යනු කර්මය දවා ප්‍රතිසන්ධිය ඇදීමට සමත් වූ වෘද්ධි ආදියට පැමිණෙන්නේ ය. "**විඤ්ඤාණූපයං**" යනු පදයේ නොගැනීමෙන් හේතුව කියන ලද්දේමය. "**වොචඡිජජතාරම්මණං**" යනු ප්‍රතිසන්ධිය ඇදීමට සමත් වූ ශක්තිය නොමැතිවීමෙන් අරමුණු ගැනීම සිදී-කැඩී යයි යනුයි. "**පතිටයා විඤ්ඤාණසස**" යනු කර්ම විඤ්ඤානයට පිහිටක් නොවේ යනුයි. "**තදපපතිටයිතං**" යනු එය නොපිහිටීමෙනි. "**අනභි සංඛචච විමුත්තතං**" යනු ප්‍රතිසන්ධිය අභිසංස්කරණය නොකර මිදුණු යනුයි.

පළමු සූත්‍රයයි.

21. 1. 2.

දෙවන සූත්‍රයේ - "**බීජාජාතානි**" යනු බීජයෝය. "**මූලබීජං**" යනු වදකහ, කහ, ඉඟුරු ආදියයි. "**ඛන්ධබීජං**" යනු ඇසතු-නුග ආදියයි. "**ඵළුබීජං**" යනු උක්, උණ, බට ආදියයි. "**අගගබීජං**" යනු කුඹුක්-මුරුවා ගස් ආදිය. "**බීජ බීජං**" යනු හැල්-වී ආදී පුබ්බන්න ධාන්‍ය හා මුං-මෑ ආදී අපරන්න ධාන්‍ය වර්ගයන්ය. "**අඛණ්ඩානි**" යනු නොබිඳුණා වූ ඒවායි. බිඳුණු කාලයේ පටන් බීජයත්, බීජ සඳහා සුදුසු නොවේ. "**අපූතිකානි**" යනු ජලය වැටීම් ආදියෙන් නොතෙමුණු ඒවායි. කුණු වූ බීජයන්ද බීජ ලෙස යෙදීමට සුදුසු නොවේ. "**අවාතාතපහතානි**" යනු සුලඟින් ද අව්වෙන් ද නො නැසුණු, ඕජස් නැතිබවට පත් නොවූ යනුයි. ඕජස් රහිත කසට බීජයන් ද බීජ ලෙස නොයොදයි. "**සාරාදානි**" යනු ගන්නා ලද සාරවත් භාවය ඇති. පිහිටි සාරය ඇති යනුයි. නිසරු බීජ, බීජ සංඛ්‍යාවෙහි ලා නොසැළකේ. "**සාධසියිතානි**" යනු තුන්-සතර මාසයක් කොටුවෙහි තබා ආරක්ෂා කිරීමෙන් සුවසේ තැබූ යනුයි. "**පඨවි**" යට පිහිටන බැවින් පඨවි නම් වූ. "**ආපො**" මතුපිට තෙත්කරන වතුර (ජලය). "**වතසෙසා විඤ්ඤාණටඨිතියො**" යනු කර්ම විඤ්ඤානයට ආරම්මණ වූ රූපාදී සිවු ස්කන්ධයෝ ය. ඒවායෙහි අරමුණු වශයෙන් පිහිට වූ පඨවි ධාතුව සමාන වූ නන්දි රාගයයි. තෙත් කිරීම්-වැගිරීම් අර්ථයෙන් ආපෝ ධාතුව හා සමාන වූ. "**විඤ්ඤාණං සාහාරං**" යනු ප්‍රත්‍ය සහිත වූ කර්ම විඤ්ඤානයයි. එය වනාහී පොළවේ වැඩෙන බීජ මෙන් අරමුණ නැමති පොළවෙහි වැඩේ. (වර්ධනය වේ.)

දෙවන සූත්‍රයයි.

තෙවන සූත්‍රයේ - "උදානං උදානෙසි" යනු බලවත් සොම්නස් බව හටගැනීමෙන් ප්‍රීතිවාක්‍යයක් පහළ කල සේක යනුයි. කුමක් නිසා මෙසේ ප්‍රීතියක් බුදුපියාණන්ට ඇතිවූ සේක්ද? සසුනේ නෛර්යාණික බව නිසයි. කෙසේද? මෙසේ උන්වහන්සේට සිත්විය. මේ සසුනෙහි මූලාධාරයෝ තුනකි. දානය, සීලය, භාවනාව යන උපනිශ්‍රය සම්පත් තුනයි. ඒ තුන අතුරින් දාන උපනිශ්‍රය සම්පත්තිය දුර්වලය භාවනා උපනිශ්‍රය සම්පත්තිය ප්‍රබලය. දාන හා සීල උපනිශ්‍රය සම්පත් දෙකින් ත්‍රිවිධ මාර්ගයන්ට හා ඵලයන්ට පැමිණේ. භාවනා උපනිශ්‍රය සම්පත්තියෙන් රහත් බවට පත්වේ. මෙසේ දුර්වල උපනිශ්‍රයෙහි පිහිටි භික්ෂුව උත්සාහ කරනුයේ වැයම් කරනුයේ පඤ්ච ඕරම්භාගිය බන්ධනයන් සිඳ තුන්මාර්ග ඵල උපදවයි. අහෝ! නෛර්යාණික සසුනේ බලමහිමය පුදුමයි." ආවර්ජනය කරන්නාට මෙසේ සිත් පහළ වේ. එහි දුර්වල උපනිශ්‍රයක හිඳ වැයම් කරන්නාට ත්‍රිවිධ මාර්ග ඵලයන්ට පැමිණේ. මේ අර්ථය දක්වීමට මිලක්ඛ තෙරුන්ගේ කථාවස්තුව දක්විය යුතුය.

උන්වහන්සේ ගිහිකල ප්‍රාණඝාතාදී කර්මවලින් ජීවිතය ගෙනයනුයේ කැළයේ උගුල් සියක්ද මොහොල් සියක්ද යෙදවූහ. එක්දිනක් අඟුරුවලින් පිළිස්සූ මස් කා, උගුල් ඇටවූ තැන්වල හැසිරෙනුයේ දැඩි පිපාසාවක් ඇතිවිය. එක් ආරණ්‍ය තෙර නමක් වසන විහාරයකට ගොස් තෙරුන් සක්මන් කරන තැනට නුදුරෙහි සිට පැන්කළය විවර කළේය. අත් තෙමාගැනීම් පමණවත් දිය ඇතිබවක් නොපෙනුණි. ඔහු කිපී මෙසේ කීය. "මහණ! මහණ! නුඹලා ගහපතියන් විසින් දෙන දේ කමින් නිදාගනිවු. පැන් කළයෙහි ඇඟිලිලක් පමණවත් ජලය නොතබවු. මෙය සුදුසු නොවේ"යි බැණවැදුණි. තෙරුන් වහන්සේ "මවිසින් දන් පැන් කළය පුරවා තැබුවෙමි. මොහු කියන්නේ මොනවාද?"යි පවසමින් ගොස් බැලූසේක් පිරුණු කළය දැක දඩයම්කරුට පැන් දෝතක් පුරවා දුන්නේය. ඔහු දෙතුන් දෝතක් පුරවා පැන්බී මෙසේ සිතීය. "මෙසේ දියපිරි කළය පවා මාගේ පාපකර්මයන් පැමිණ රත්වූ කබලක් මෙන් මට වේදනා දෙයි. අනාගතයේදී මගේ ආත්මභාවයට කුමකින් කුමක් වේද?"යි කළකිරීමට පත්ව දුන්න විසිකර "ස්වාමිනි, මා පැවිදි කරන සේක්වා!"යි ඉල්වීය. තෙරුන් වහන්සේ තව පංචක කමටහන කියවා ඔහු පැවිදි කළ සේක.

ඔහු මහණදම් පුරනවිට බොහෝ මුව ඌරෝ මැරූ තැන්වල උගුල්-මොහොල් ආදී යොදන ලද ආයුධ සිහිවේ. එය සිහිකරන

උන්වහන්සේගේ සිරුරින් ඩාබිඳු වැගිරේ. කුළු ගොනෙක් මෙන් කමටහනෙහි සිත නොපිහිටයි. ඔහු "දැන් මේ මහණකමින් කුමක් කරන්නෙමිද?"යි පැවිද්දෙහි නො ඇලුණු සිත් ඇතිව වේදනාවෙන් තෙරුන් වහන්සේ සමීපයට ගොස් වැඳ "ස්වාමීනි! මම මහණදම් කිරීමට අසමත් වෙමි"යි පැවසීය. එවිට ඔහුට "දැන් හස්ත කර්මාන්ත කරව"යි තෙරුන් වහන්සේ පැවසූහ. ඔහු "ස්වාමීනි! මැනවැ"යි කියා ඉඹුල් ආදී අමු ගස් සිඳ ගොඩ ගසා "දැන් කුමක් කරම්ද?"යි ඇසීය. "ඒවා දවන්න"යි තෙරහු වදාළහ. ඔහු හතරවටින්ම අමු ඉඹුල් දරගොඩ දැවීමට උත්සාහ කර අසමත් වී තෙරුන්ට ඒ බව දන්වීය. තෙරුන් වහන්සේ එවිට "එසේනම් ඉවත්වෙන්න"යි පවසා මහපොළව දෙබෑ කර අවීචියෙන් කණාමැදිරියෙක් පමණ වූ ගිනි සිලුවක් රැගෙන ඒ ඉඹුල් දරගොඩට දැමූහ. එවිට ක්ෂණයකින් වියලි කොළ ගොඩක් මෙන් දරගොඩ දැවී ගියේය. තෙරුන් වහන්සේ පාපී භික්ෂුවට අවීචියේ බරපතලකම පෙන්වා "ඉදින් සිවුරු හැරයන්නේ නම් මෙහි පැසෙන්නේයැ"යි සංවේග ඉපිදවීය. එම පවිටු භික්ෂුව අවීචිය දැකීමේ පටන් කම්පාවූයේ "ස්වාමීනි! බුදුසසුන නෛර්යාණිකද?"යි විමසීය. "ඇවැත්නි, එසේය." "ස්වාමීනි! යහපති. බුදුසසුන සසරින් නිදහස ගෙන දෙන්නක් නම් මිලක්බය! ආත්ම මෝක්ෂය කරන්නේය. සිවුරු හැරීම ගැන නොසිතව"යි එතැන් පටන් මහණදම් පුරයි. වෑයම් කරයි. වත්පිළිවෙත් කරයි. නිදිමතින් බාධා ඇතිකරන විට තෙත් වූ පිදුරු මිටියක් හිස තබාගෙන පා ගල් පොකුණක දමා හිඳියි. ඔහු එක්දිනක් පැන් පෙරා, කළය කලවයෙහි තබාගෙන, දිය දමන මහසැළියේ දිය බිඳි බිඳි යෑම බලමින් සිටියේය. එවිටම තෙරුන් වහන්සේ එම සාමණේරයාට ඇසෙන සේ මේ ගාථාව පැවසූහ.

"උට්ඨානවතෝ සතිමතෝ සුචිකම්මස්ස නිසම්මකාරිනෝ
සඤ්ඤතස්ස ච ධම්මජීවිනෝ අප්පමත්තස්ස යසොභිවඩ්ඪති"

"නොපසුබට විරියෙන් - හා එළඹසිටි සිහියෙන්
නිදොස් වූ කිරියෙන් - හික්මුණු කය වචනයෙන්.
දිවිගෙවන දහැමින් - නොපමා බැවින් යුතු වූ
ඒ තැනැත්තහුගේ - යස රැස වැඩේ හැමදා"a

a. ධම්මපදය - අප්පමාද වග්ගය

උත්වහන්සේ මේ ගාථාවේ පද සතර තමා කෙරෙහිම ආරෝපණය කරගත්හ. උත්සාහවන්තයා (උට්ඨානවතෝ) නම් මා වැන්නකු විය යුතුයි. සිහිය ඇත්තා ආදී වශයෙන් අප්‍රමාදී පුද්ගලයා දක්වා කීවේත් මා සඳහාමය. මෙසේ ඒ ගාථාවේ අර්ථය තමාට ම පැවසුවක් ලෙස සලකා තමාට ම අවවාද දෙමින්, එම අවවාදයන්හිම පිහිටි සේක්, පසක් වූ ඕරම්භාගිය සංයෝජන සිඳදමා අනාගාමී ඵලයෙහි පිහිටි සේක. ඉන් හටගත් සතුට ඇත්තේ,

අල්ලං පළාල පුඤ්ජාහං සීසෙනාදාය චංකමිං
පතෙතාසමි තතියං ඨානං, එසථ මෙ නත්ථි සංසයෝ

"තෙත් වූ පිදුරු මිටියක් හිසින් ගෙන මම හැසුරුනෙමි.
පත් වූයෙමි තෙවැනි තැනට - නොමැත කිසිදු සැකයක් මට."

යන මේ ප්‍රීති වාක්‍ය පහළ කළ සේක.

මෙසේ දුර්වල උපනිශ්‍රයෙහි පිහිටා ගැටෙමින්-වැයම් කරමින් පහක් ඕරම්භාගිය සංයෝජන සිඳ දමයි. ත්‍රිවිධ මගඵල උපදවයි. එනිසා බුදුහු මෙසේ වදාළහ. "මම පෙර නොවීම් නම් මට අතීත කර්ම රැස්කිරීම් නොවීම් නම් මතු ස්කන්ධ පහළ කිරීමක් මට නැත. මෙසේ නිශ්චයට පැමිණි භික්ෂුව ඕරම්භාගිය සංයෝජනයන් සිදින්නේය."

එහි "**නො ච මෙ සියා**" යනු ඉදින් මම නොවන්නේ නම්; ඉදින් මට ඉක්මවූ කර්මාභිසංස්කාරයන් නොවූයෙම් නම් මේ මගේ දැන් පවතින **ස්කන්ධ** පංචකය (පස) නොවන්නේය යනුයි. "**න භවිසසති ත මෙ භවිසසති**" යනු දැන් එසේ උත්සාහ කරන්නෙමි. යම්සේ මට අනාගත ස්කන්ධ උපදවන කර්ම රැස්කිරීම් නොවන්නේ ද එය ඇතිකල්හි මට අනාගත **ප්‍රතිසන්ධියක් නම්** නොවන්නේය යනුයි. "**එවං විමුචචමානො**" යනු මෙසේ ස්ථිර සේ පිහිටන භික්ෂුව දුර්වල උපනිශ්‍රයෙහි පිහිටියේ පංච ඕරම්භාගිය සංයෝජනයන් සිදින්නේය යනුයි.

"**එවං වුතෙත**" යනු මෙසේ සසුනේ ඇති සසරින් මිදීම ගෙනදෙන බව සිහිපත් කරන බුදුරජාණන් වහන්සේ විසින් මේ උදානය පහළකල කල්හිය. "**රූපං භවිසසති**" යනු රූපය බිඳෙන්නේය යනුයි. "**රූපසස විභවා**" යනු භව විනාශය දැකීමෙන් සහ විදර්ශනා වැඩීමෙන්; විදසුන් සහිතව සිවුමග රූපාදීන්ගේ බිඳියාම දැක්වීමයි. ඒ සඳහා මෙය කියන

ලදී. "එවං විමුච්චමානො භනෙත භික්ඛු ඡනෙය්‍ය" ස්වාමීනි මෙසේ ස්ථිරව පිහිටි භික්ෂුව පස් ඕරම්භාගිය සංයෝජන සිඳින්නේමය. කුමක් නිසා නොසිඳෙන්නේ ද?

දැන් මතු මගඵල විමසන සේක්, "**කථං පන භනෙත**" යනාදිය වදාළහ. එහි "**අනනතරා**" යනු අන්තර දෙකකි. විදර්ශනා මාර්ගයට ආසන්න වූ අනන්තරය (අතරක් නැති) සහ ඵලයට දුර වූ අනන්තරය යනුවෙනි. ඒ සඳහා "ස්වාමීනි! කෙසේ දන්නා තැනැත්තාට කෙසේ දකින තැනැත්තාට විදර්ශනාවට අනතුරුව "ආශ්‍රවයන්ගේ ක්‍ෂයවීම"නම් වූ අර්හත්ඵලය වන්නේද?"යි විචාරයි. "**අතසිතායෙ**" යනු ත්‍රස්ත නොවිය යුතු තැන, බිය නොවිය යුතු තැන යනුයි. "**තාසං ආපජ්ජති**" යනු බියට-තැති ගැනීමට පැමිණේ යනුයි. "**තාසො හෙසා**" යනු යම් ඒ "ඉදින් මම් නොවීම් නම් මට අතීත කර්ම රැස්කිරීමක් නොවීනම්" යනුවෙන් පවතින දුර්වල විදර්ශනාවයි. දුර්වල විදර්ශනාව වනාහී යම් හෙයකින් ආත්ම ස්නේහය සම්පූර්ණයෙන් ගැනීමට නොහැකි වන්නේද? එහෙයින් අශ්‍රැතවත් පුහුදුන් පුද්ගලයාට ත්‍රාසය ඇතිවේ. ඔහු වනාහී "දැන් මම සිඳෙන්නේය. මතු කිසිවක් නොවන්නේය." යනුවෙන් එක්තරා බමුණෙක් මෙන් තමා ප්‍රපාතයේ වැටෙන්නෙක් මෙන් දකියි.

ලෝවාමහ ප්‍රාසාදයේ යට මහලක සිට ත්‍රිපිටක චූලනාග ස්ථවිරයෝ ත්‍රිලක්ෂණයන්ගෙන් යුක්ත ධර්මය සිංහලට නැගූහ. ඉක්බිති එක්තරා බමුණෙක් එකත්පසෙක සිට එම ධර්මය අසන්නේ සංස්කාරයන් ශූන්‍ය වශයෙන් වැටහුණි. ඔහු ප්‍රපාතයෙන් වැටුනකු මෙන් වී, හැර තිබූ දොරින් තම ගෙදරට පලාගොස්, තම පුතු උරෙහි නිදිකරවා "පුතේ! ශාක්‍යයන් වහන්සේගේ දහම සිහිකරන්නා වූ මම නැසුනෙමි"යි කීවේය.

"**න හෙසා භික්ඛු තාසො**" යනු මෙසේ පවතින බලවත් වූ විදර්ශනාව නිසා ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයාට ත්‍රාසයක්-බියක් නොමැත. ඔහුට මෙසේ නොසිතේ. "මම සිඳෙන්නෙමි හෝ වැනසෙන්නෙමි හෝ මැනවි" යනුවෙන් නොසිතෙයි. ඔහුට "සංස්කාරයෝම උපදිති. සංස්කාරයෝම නැතිවෙති"යි යන හැඟීම ඇතිවේ.

තෙවන සූත්‍රයයි.

21. 1. 4.

සිවුවන සූත්‍රයේ - "**චතුපරිවත්තං**" යනු එක් එක් ස්කන්ධයක් සතර සතර බැගින් වූ පෙරලීම් වශයෙනි. "**රූපං අබ්භඤ්ඤාසිං**" යනු රූපය දුක්ඛ සත්‍යයයැයි අවබෝධ කළෙමි යනුයි. මෙසේ සියලු පදයන්හි චතුරාර්ය සත්‍ය වශයෙන් අර්ථය දතයුතුයි. "**ආහාර සමුදයා**" යනු මෙහි ස්වච්ඡන්ද රාග සහිත වූ කබලිංකාර ආහාරය 'ආහාරය' නම් වේ. "**පටිපනනා**" යනු සීලයේ පටන් අර්හත් මාර්ගය දක්වා පිළිපන්නෝ වෙති යනුයි. "**ගාධනත**" යනු පිහිටුවති. මෙපමණකින් සේඛ භූමිය දක්වා, දැන් අසේඛ භූමිය දේශනා කරන සේක් - "**යෙ ච ඛො කෙචි භිකඛවෙ**" යනාදිය දෙසූහ. "**සුවිමුනතා**" යනු අර්හත් ඵල විමුක්තියෙන් වහා මිදුණු යනුයි. "**කෙවලිනො**" යනු කටයුතු නිමවූ යනුයි. කරන ලද සියලු කටයුතු ඇති. "**වටටං තෙසං නත්ථි පඤ්ඤාපනාය**" යනු ඔවුන්ට ඉතිරි වූ සසර පැවැත්මක් දක්වීමට නොහැක. ඔවුනු සසර පැවැත්ම සිඳ දමන ලදයි යන අර්ථයයි. නැතහොත් චර්තයක්, පැවැත්මක් යැයි දක්විය කරුණක් ඔවුන්ට නැත. මෙපමණකින් අසේඛ භූමිවාරය කියන ලදී.

සිවුවන සූත්‍රයයි.

21. 1. 5.

පස්වන සූත්‍රයේ "**සතතඨානකුසලො**" යනු සත්වැදෑරුම් අවකාශයන්හි දක්ෂ වූ යනුයි. "**වුසිතවා**" යනු විසූ බඹසර ඇති යනුයි. "**උනතම පුරිසො**" යනු ශ්‍රේෂ්ඨ පුරුෂයායි. සෙසු පදයන්ගේ විස්තර පෙර පැවසූ පරිදි දතයුතුයි. මේ සූත්‍රය වනාහී උත්සාහවත් කරන්නක් මෙන් ද පෙළඹවීම් ඇති කරන්නක් ලෙස ද දතයුතුයි. යම්සේ විජිත සංග්‍රාමය ජයගත් රජතුමා යෝධයන්ට උසස් තනතුරු දී ඔවුන්ට සත්කාර කරයි. කුමන කරුණක් නිසාද? මෙම සත්කාර දුටු සෙසු ජනයා ද ශූරයන් වීමට සිතන බැවිනි. ඊට උත්සාහවත් වන බැවිනි. මේ අයුරින්ම භාග්‍යවතුන් වහන්සේ අප්‍රමාණ කාලයක් පාරමී පුරා, මහබෝ මැඩදී කෙලෙස් මරුන් පරදා, සර්වඥත්වයට පත්වූ සේක්, සැවැත්නුවර ජේතවන මහාවිහාරයෙහි වැඩහිඳිමින් මේ සූත්‍රය දේශනා කළ සේක. එහිදී රහතන් වහන්සේලා ඔසවා ස්තුති කළ සේක. වර්ණනා කළ සේක. කුමන කරුණක් නිසා ද? මෙසේ අවශේෂ පුද්ගලයෝද අර්හත්ඵලය ලබාගැනීමට යොමුවන-

උත්සාහවත් වන බැවිනි. මේ අයුරින් මේ සූත්‍රය රහතුන් වහන්සේ ඔසවා තබමින් ප්‍රශංසා කරන බැවින් උත්සාහවත් කරන්නි. සේඛයන් පොළඹවන බැවින් (රහත්ඵලය ලබාගැනීමට) පෙළඹවීම් ඇතිකරන්නක් ද වේ යැයි දතයුතුයි.

"එවං භික්ඛවෙ භික්ඛූ සන්තටයාන කුසලො හොති" යනු මෙපමණකින් මෙහි මාර්ගඵල ප්‍රත්‍යවේක්ෂා කිරීම් වශයෙන් දේශනාව නිමවා නැවත යනුයි. **"කථඤ්ඤව භික්ඛවෙ භික්ඛූ තිවිධූපපරිකඛී හොති"** යනු මේ රහතන් වහන්සේ යම් අරමුණක නිරන්තරව සිත පිහිටුවාගෙන වෙසේ නම් "එය සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් නොවේ. ධාතු ආදියේ පැවැත්ම පමණක් වේ"යැයි යනුවෙන් රහතන් වහන්සේ නිරන්තර විහරණයෙන් "මේ ධර්මයන්හි කර්මකොට මොහු පැමිණියේයැ"යි පැමිණියා වූ පිළිවෙල ද දක්වීමට කියන ලදී. එහි **"ධාතුසො උපපරිකඛති"** යනු ධාතු ස්වභාවයෙන් බලයි. දකියි යනුයි. සෙසු දෙපදයෙහි අර්ථද මේ ක්‍රමයෙන්ම දතයුතුයි.

පස්වන සූත්‍රයයි.

21. 1. 6.

සයවන සූත්‍රයේ "කො අධිපපායො" යනු අධික වූ ප්‍රයෝග කවරේද යනුයි. **"අනුපපනනසස"** මේ මාර්ගය කාශ්‍යප සම්මා සම්බුදුරජාණන් වහන්සේ ඉපිදවූහ. අනතුරුව වෙනත් ශාස්තෘවරයෙකුට ඉපිදවීමට නොහැකි විය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ නූපන් මාර්ගය උපදවන්නාහු නම් වෙති. නගරයට සමාන වූ පරිහරණය නොකරන තැනක පිහිටි පැරණි මාර්ගයක් ඇතිවිය. එහි නොපවතින අර්ථයෙන් "නො ඉපදුණු මාර්ගය" නම් වේ. **"අසඤජාතසස"** යනු ඊටම සමාන වදනකි. **"අනකඛාතසස"** යනු නොකියන ලද යනුයි. මාර්ගය දන්නේය යනු **"මගඤඤූ"** නම් වේ. මාර්ගය දන්නා ලදී. ප්‍රකට කළේය යන අරුතින් **"මගගවිදූ"** නම් වේ. මාර්ගයෙහිද අමාර්ගයෙහිද (මග නොමග දෙකෙහිම) දක්ෂ වූ යනු **"මගගකොවිදො"** නම් වේ. **"මගගානුගා"** යනු මාර්ගය අනුව යන්නා වූය. **"පචඡාසමනනාගතා"** යනු මම පළමුව ගියේ ශ්‍රාවකයෝ පසුව යෙදී ගමන් කරති. වාසය කරති යනුයි.

සයවන සූත්‍රයයි.

21. 1. 7.

සත්වන සූත්‍රයේ - "පඤ්චවග්ගියෙ" යනු "අඤ්ඤා කොණ්ඩඤ්ඤ" ආදී පැරණි උපස්ථායකයන් වූ තෙරවරු පස්දෙනා වහන්සේ. "ආමන්තෙසි" යනු ඇසළ පුන් පොහෝදින ධම්සක් පැවතුම් සූත්‍ර දේශනාව පැවැත්වීමේ සිට අනුක්‍රමයෙන් සෝවාන් ඵලයෙහි පිහිටි කල්හි, දැන් මොවුන්ට ආශ්‍රවක්ෂය පිණිස ධර්මයක් දේශනා කරන්නෙමි"යි පස්වැනි දිනයෙහි එම භික්ෂූන් ඇමතූ සේක. "එතදවොච" යනු මේ "මහණෙනි! රූපය අනාත්මය" ආදී වශයෙන් පැවැත්වූ අනන්ත ලක්ඛණ සූත්‍රය දේශනා කළ සේක යනුයි. එහි "අනත්තා" යනු පූර්වයෙන් පැවසූ සිවු කාරණයන්ගෙන් අනාත්මීය වේ යනුයි. "තං කිං මඤ්ඤථ භික්ඛවෙ" යන මෙය කුමක් නිසා ඇරඹූ සේක් ද? මේ ස්ථානය දක්වා අනන්ත ලක්ඛණ සූත්‍රය දේශනා කරන ලදී. අනිත්‍ය-දුක්ඛ ලක්ෂණයන් නොවේ. දැන් ඒ අනිත්‍ය-දුක්ඛාදී ත්‍රිවිධ ලක්ෂණයම ගලපා දැක්වීමට මෙය ආරම්භ කරන ලදයි දතයුතුයි. "තසමා" යනු යම් හෙයකින් මේ පඤ්චස්කන්ධය ම අනිත්‍යය, දුක් සහගත හා අනාත්ම වූවක් වන්නේද එහෙයිනි. "යං කිඤ්චිරූපං" ආදියෙහි විස්තර කථාව විසුද්ධි මාර්ගයේ ප්‍රඥාභාවනාධිකාරයෙහි බඳ නිර්දේශයේ දැක්වේ. එය සැමතැනම පවසා ඇති අයුරින් දතයුතුයි. මේ සූත්‍රයෙහි වනාහි අනන්ත ලක්ෂණය ම කියන ලදී.

සත්වන සූත්‍රයයි.

21. 1. 8.

අටවන සූත්‍රයේ - "එකන්ත දුක්ඛං" ආදිය ධාතු සංයුත්තයේ කියූ ක්‍රමයෙන් දතයුතුයි.

අටවන සූත්‍රයයි.

21. 1. 9.

නවවන සූත්‍රයේ - "ආදිත්තං" යනු එකොළොස් ගින්නකින් දැවෙන, ඇවිලගත්. මෙසේ මේ සූත්‍ර දෙකෙහිම "දුක්ඛ" ලක්ෂණය ම කියන ලදී.

නවවන සූත්‍රය යි.

21. 1. 10.

දසවන සූත්‍රයේ - නිරුත්තිය ම **"නිරුත්තිපථා"** නැතහොත් - නිරුත්තිය ද ඒ නිරුත්ති වශයෙන් දන්විය යුතු අර්ථයන්ගේ මාර්ගය බැවින් **"පථ"** යැයි **"නිරුත්තිපථා"** නම් වේ. සෙසු දෙපදය ද මේ ක්‍රමයෙන් අර්ථ දතයුතුයි. මේ පද තුනම අන්‍යෝන්‍ය වශයෙන් සමාන වචනයැයි දතයුතුයි. **"අසංකිණ්ණා"** යනු දුරු නොකළ, මේවායේ අර්ථ කවරේද? යි කියා අත්නොහළ යනුයි. **"අසංකිණ්ණපුබ්බා"** යනු අතීතයෙහිත් අත්නොහල විරූය. **"නසංකීයන්ති"** යනු මේවායින් කවර වැඩක්ද?යි අත් නොහරිති යනුයි. **"න සංකියිසසන්ති"** යනු අනාගතයේද අත් නොහරින්නේය යනුයි. **"අපපතිකුට්ඨා"** යනු නො වලක්වන ලද - ප්‍රතික්ෂේප නොකරන ලද යනුයි. **"අතීතං"** යනු තමාගේ ස්වභාවය භංග වූයේ ම යැයි ඉක්මවා ගිය යනුයි. **"නිරුද්ධං"**යනු වෙනත් දේශයකට නොයා එතැනම නිරුද්ධ වූ - සංසිඳුණු යනුයි. **"විපරිණතං"** යනු පරිණාමයට, වෙනස්වීමට ගිය, විනාශ වූ යනුයි. **"අජාතං"** යනු නූපන්නා වූ යනුයි. **"අපාතුභූතං"** යනු අප්‍රකට වූ යනුයි. **"උකකලා"** යනු උක්කල ජනපදවාසීහුය. **"වසභඤ්ඤා"** වස්සද භඤ්ඤ ද, ඒ දෙදෙන ම මූල දෘෂ්ටිගතිකයෝය - අහේතුකවාදී ආදියයි. හේතුවක්, ප්‍රත්‍යයක් නැතැයි ගත් බැවින් **"අහේතුකවාදා"** නම් වේ. කිරීමෙන් ප්‍රතිඵලයක් නැත. නොකලත් ප්‍රතිඵලයක් නැතැයි පාපී අදහස් ගත් බැවින් **"අකිරියවාදා"** නම් වේ. **"දුන් දේහි විපාක නැත. ඵලයක් නැතැ"**යි ආදී වශයෙන් ගන්නා ලද්දේ **"නත්ථිකවාදා"** නම් වේ. එහි මේ පුද්ගලයෝ දෙදෙනාට දෘෂ්ටි තුනක් විය. කිම එක් අයෙකුට දෘෂ්ටි එකහමාර බැගින් වූයේද ? නැත. යම්සේ එක් භික්ෂුවක් පිළිවෙලින් සතර ධ්‍යානයන් උපදවන්නේ ද, ඒ අයුරින්ම එක් එක් පුද්ගලයා මේ ත්‍රිවිධ දෘෂ්ටිම ඉපිදවීයැයි දතයුතුයි. **"හේතුවක්-ප්‍රත්‍යයක් නැතැ"**යි නැවත නැවත සිහිකරන්නාට, ගෙනෙන්නාට, සතුටු වන්නාට, ආශ්වාදනය කරන්නාට මාර්ග දර්ශනය මෙන් වැටහේ. ඔහු බොරු නියාමයන්ට බැස ගනියි. ඔහු **"ඒකාන්තකාළකයෙකි"**යි කියයි. යම්සේ අහේතුක දෘෂ්ටියෙන් මෙසේ කරනුයේ පවු නොකරන්නේය. දුන් දෙයෙහි විපාක නැතැයි යන මේ තැන්හි මිසදිටු පිළිගැනීම්වලට බැසගනියි. **"න ගරහිතබ්බං න පටිකෙකාසිතබ්බං මඤ්ඤිසු"** යනු මෙහි ඉදින් අතීතයක් නම් නැත. අතීතයක් නොවූ මොහුට අනාගතයක් හෝ වර්තමානයක් හෝ වන්නේ දයි කියමින් ගරහයි. එහි දොස් දක්වමින් **"මොහුට ගැරහීමෙන් කවර වැඩක්ද?"**යි කීම නම් ප්‍රතික්ෂේප කිරීමකි. මේ නිරුක්ති මාර්ගයෙහි ඒ

අත්‍යන්තකාළක වූ දෘෂ්ටි පිළිගත්තෝ නොගැරහිය යුතු ප්‍රතික්ෂේප නොකළ යුතුයැයි සිතූහ. අතීතය ඉක්ම ගියේමය. අනාගතය තවම නොපැමිණියේ ය. වර්තමන දැන් පවතින්නේ යැයි කිහ. **"නින්දා බ්‍යාරොස උපාරම්භයා"** යනු නැණවතුන්ගේ සමීපයේ නින්දා කිරීමේ බියෙන් ද ගැටීම් බියෙන් ද දෝෂ දැක්වීම් බියෙන් ද දෝෂාරෝපණ බියෙන් ද එම වාදයන් නොගැරහූහ යනුයි.

මෙසේ මෙම සූත්‍රයෙහි සිවු භූමික ස්කන්ධයන්ගේ පැණවීම කියන ලදී.

දසවන සූත්‍රයයි.

පළමු උපය වර්ගය නිමාවට පත්විය.

21. 2. 1.

අරහන්ත වර්ගයේ පළමු සූත්‍රයේ - "උපාදියමානෝ" යනු තණ්හා, මාන, දෘෂ්ටි වශයෙන් ගන්නා ලද යනුයි. "බදෙධා මාරස්ස" යනු මාරයාගේ පාශයෙන් බඳිනා ලද යනුයි. "මුතෙතා පාපිමතෝ" යනු මාරයාගේ-පාපියාගේ පාශයෙන් (උගුලෙන්) මිදුණේ නම් වේ.

පළමු සූත්‍රයයි.

21. 2. 2.

දෙවන සූත්‍රයේ - "මඤ්ඤමානෝ" යනු තණ්හා-මාන-දෘෂ්ටි යන වැරදි සිතුවිලිවලින් යුක්ත වූයේ යනුයි.

දෙවැනි සූත්‍රයයි.

21. 2. 3.

තෙවන සූත්‍රයේ - "අභිනන්දමානෝ" යනු තණ්හා-මාන-දෘෂ්ටි වශයෙන් සතුටුවනුයේ යනුයි.

තෙවන සූත්‍රයයි.

21. 2. 4.

සිවුවන සූත්‍රයේ - "ඡන්දෝ" යනු තණ්හාව නම් වූ කැමැත්තයි.

සිවුවන සූත්‍රයයි.

21. 2. 5-6

පස්වන හා සයවන සූත්‍රවල ද මේ ක්‍රමය ම දතයුතුයි.

පස්වන හා සයවන සූත්‍රයන් ය.

21. 2. 7.

සත්වන සූත්‍රයේ - "**අනත්තනියං**" යනු තමාගේ සන්තකයේ-සමීපයේ නොවූ යනුයි. තමාගේ උපකරණයන්හි අභාවයෙන් (නොපැවතීමෙන්) ශූන්‍ය වූ යන අර්ථයි.

සත්වන සූත්‍රයයි.

21. 2. 8.

අටවන සූත්‍රයේ - "**රජනීය සණ්ඨිතං**" යනු ඇලී ගැලී සිටින ද්‍රව්‍යයන් ගේ ආකාරයෙන් පිහිටි යනුයි. "රාගයේ ප්‍රත්‍ය භාවයෙන් පිහිටි" යන අර්ථයි.

අටවන සූත්‍රයයි.

21. 2. 9-10

නවවන හා දසවන සූත්‍ර රාහුල සංයුත්තයේ කියන ලද පරිදි දතයුතුයි.

නවවන හා දසවන සූත්‍රයන්ය.

දෙවන අරහන්ත වර්ගයයි.

21. 3-1. 2.3

බජ්ජනීය වර්ගයේ මුල සිට ඇති සූත්‍ර තුනෙහි චතුරාර්ය සත්‍යම පවසන ලදී.

පළමු, දෙවන හා තෙවන සූත්‍රයි.

21. 3. 4.

සිවුවන සූත්‍රයේ - "යාවතා භික්ඛවෙ සත්තාවාසා" යනු මහණෙනි! යම් පමණ "සත්තාවාසයෝ" ඇද්ද යනුයි. "යාවතා භවගගං" යනු යම්තාක් භවග්‍රයක් නම් වේද යනුයි. "එතෙ අගගා එතෙ සෙටඨා" යනු මේවා අතර අග්‍රවූත්, ශ්‍රේෂ්ඨ වූත් යනුයි. "යදිදං අරහනෙතා" යනු යම් මේ අර්හත් නම් වූ උතුමෝය. මේ සූත්‍රයේ ද පෙර කී පරිද්දෙන්ම උත්සාහවන්ත කරවීමත්, පෙළඹවීම් ඇතිකිරීමත් සඳහා දෙසන ලදැයි දත යුතුයි. "අථාපරං එතදවොච" යනු එම අර්ථ දක්වීමට ම විශේෂයෙන් පැහැදිලි කිරීමට ම "සුඛිනො වත අහනෙතා" ආදී මේ ගාථා වදාළ බව දතයුතුයි. එහි "සුඛිනො" යනු ධ්‍යාන සුවයෙන් ද මාර්ග සුවයෙන් ද ඵල සුවයෙන් ද සුවපත් වූ යනුයි. "තණහා තෙසං නවිජජතී" ඔවුන්ට අපාදුක් ඇතිකරන තණ්හාව නොපවතියි. මෙසේ ඔවුහු මේ තණ්හාව මූලික වූ සිත්වලින් දුරුවූ හෙයින් සුවපත් සිත් ඇත්තෝම වෙති. "අසම්මානො" යනු නවවැදෑරුම් අස්මි මානය අර්හත් මාර්ගයෙන් සහමුලින් සිඳ දැමූ යනුයි. "මොහජාලං පදාලිතං" යනු ඥානයෙන් අවිද්‍යා දල ඉරා දැමූ යනුයි. "අනෙජං" යනු "ඒජා" නම් වූ තණ්හාව ප්‍රහාණය කිරීමෙන් ලැබුණු රහත් බවයි. "අනුපලිත්තා" යනු තණ්හා-දෘෂ්ටි ආලේපයෙන් ආලේපිත යනුයි. "බ්‍රහමභූතා" යනු ශ්‍රේෂ්ඨ වූ යනුයි. "පරිඤඤාය" යනු ත්‍රිවිධ පරිඥාවන්ගෙන් මනාව දැනගෙන යනුයි. "සත්ත සද්ධම්මගොචරා" යනු ශ්‍රද්ධා, හිරි, ඔත්තප්ප, බහුශ්‍රැත බව, පටන්ගත් වීර්ය ඇති බව, එළඹි සිහිය, ප්‍රඥාව යන මේ සත්වැදෑරුම් ධර්මයන් අවබෝධ කරගත්තෝ "සත්ත සද්ධම්ම ගෝචරා" නම් වෙති. "සතතරතන සමපනනා" යනු සත් වැදෑරුම් වූ බොජ්ඣංග රත්නයන්ගෙන් යුක්ත වූ යනුයි. "අනුවිචරනති" යනු ලෞකික මහජනතාව ද නිසැකව හැසිරෙන්මය යනුයි. මෙහි වනාහී රහතන් වහන්සේලාගේ සැක-බිය නොමැති හැසිරීමම අදහස් කරන ලදී. එනිසා මෙසේ වදාළහ. "පහීනභය භෙරවා" යනුවෙනි. එහි - "භයං" යනු බියවීමයි. "භේරවං" යනු ප්‍රබල ලෙස බියවීමයි. "දස භංගෙහි සමපනනා"

යනු අසේක වූ දස අංගයන්ගෙන් යුක්ත වූ යනුයි. "මහානාගා" යනු සිවුවිධ කාරණයන්ගෙන් මහා නාගයන් වූ යනුයි. "සමාහිතා" යනු උපචාර, අර්පණා ආදියෙන් යුක්ත වූ යනුයි. "**නණහා තෙසං තවිජජනී**" යනු "මහරජ! ලෝකයා සතුටුවීමෙන් හීනය. සතුටට සෑහීමකට පත් නොවන්නෝ ය. තණ්හාවෙහි දාසයෝ යැ'යි භාග්‍යවතුන් වහන්සේ වදාළ බැවින්". මෙසේ කියන ලද දාස කම්කරු ආදීන් මෙන් තණ්හාවක් ඔවුන්ට නැත. මෙසේ ක්ෂීණාශ්‍රව රහතුන්ගේ දාසත්වයෙන් මිදීම දක්වයි. "අසෙඛඤාණං" යනු අර්හත් ඵල ඤාණයයි. "**අනතිමොයං සමුසසයො**" යනු මේ ආත්මභාවය අවසාන ම එක වේ යනුයි. "**යොසාරෝ බ්‍රහම චරියසස**" යනු සාරය නම් ඵලයයි. රහත් බවයි. "**තසමිං අපර පචචයා**" යනු ඒ ආර්ය ඵලයෙහි තවත් පැමිණිය යුතු දෙයක් නැතැයි ප්‍රත්‍යක්ෂයෙන්ම දැන-අවබෝධ කරගෙන සිටි. "**විධාසු නවිකමපනති**" යනු තුනක් වූ මාන කොටස්වල නො සැලෙති. කම්පා නොවෙති යනුයි. "දනතභූමිං" යනු රහත් බවයි. "**විජතාවිනො**" යනු රාගාදිය දුරුකර සිටි යනුයි. "උදධං" යනාදියේ උඩ යනු සිරුරේ මුදුනෙහිම වූ කෙස් ය. "අපාචීනං" යටම වූ පා තලයයි. "**තිරියං**" යනු මැද ප්‍රදේශයයි. උඩට ම නොගිය. යටම වූ පා තලයට නොපැමිණි. "උදධං" යනු අතීතයයි. "අපාචිතං" යනු අනාගතයයි. "තිරියං යනු වර්තමානයයි. "උදධං" යනු දේව ලෝකාදියයි. "අපාචිනං" යනු අපායාදිලෝකයන්ය. "තිරියං" යනු මිනිස්ලොවයි. "**නනදිතෙසං න විජජනී**" මේ ස්ථානයන්හි සංක්ෂිප්ත වශයෙන් හෝ අතීත-අනාගත-ප්‍රත්‍යුත්පන්න වූ ස්කන්ධයන්හි ඔවුන්ට (රහතුන්ට) තණ්හාවක් නැත. මෙහි සසර පැවැත්මට මූලික වූ තණ්හාවෙහි නොපැවැත්ම - අභාවය දක්වන ලදී. "බුදධා" යනු චතුරාර්ය සත්‍යය පිරිසිඳ අවබෝධ කරගත් බැවින් "බුද්ධ" නම් වූ යනුයි. මෙහි වනාහී සිංහනාදයන්ගේ එක්කර දැක්වීමයි. "අප විමුත්ති සුවයෙන් සුවපත් වූවෝ ම ය. දුක් ජනනය නො කරන්නෝය. අපගේ තණ්හාව ප්‍රහීණය. පස්කඳ පිරිසිඳ දැනගත්හ. අපි දාසත්වයට පත්වන තණ්හාවෙන් මෙන්ම සසර පැවැත්මට මූලික වූ තණ්හාව ද ප්‍රහීන කර උතුම් ශ්‍රේෂ්ඨයෝ වූයෙමු. අසමානයෝ වෙමු. චතුරාර්ය සත්‍ය අවබෝධ කරගත් බැවින් "බුදධ" නම් වූයෙමු"යැයි භවාග්‍රයෙහි සිට අතීත නාදය නම් වූ සිංහනාදය රහතන් වහන්සේ විසින් පවත්වනු ලැබෙත්.

සිවුවන සූත්‍රයයි.

21. 3. 5.

පස්වන සූත්‍රයේ - ගාථාවන්ගෙන් තොරව, ඉතා පිරිසිදු කර අවබෝධ කරගත්තවුන්ගේ අදහස් පරිදි මෙම සූත්‍රය දේශනා කරන ලද සේක.

පස්වන සූත්‍රයයි.

21. 3. 6

සයවන සූත්‍රයේ "සීහො" යනු සිංහයෝ සතර දෙනෙකි. තිණ සිංහ, කාළසිංහ, පණ්ඩුසිංහ හා කේසරසිංහ වශයෙනි. ඔවුන් අතුරින් තිණ සිංහයා පරවේයන්ගේ පාට ඇති ගවදෙනක් හා සමානව තණ අනුභව කරන සිංහයායි. කාළ සිංහයා නම් කළු ගවදෙනක් හා සමාන වූ තණ අනුභව කරන්නෙකි. පණ්ඩුසිංහ නම් පලාවන් පැහැ ඇති ගවදෙනක් හා සමවූ මස් කන සත්ත්වයෙකි. කේසර සිංහ නම් ලාඡ්ඡා පැහැයෙන් වර්ණවත් කරන ලද්දකු මෙන් මුවින් ද වලිග අගින්ද සිවුපාදයෙන්ද යුක්ත වූවෙකි. ඔහුගේ මස්තකයේ සිට ලාකඩ තෙලිතුඩකින් පාටකලාක් වැනි වූ රේඛා තුනක් පිටමැදින් ගොස් දෙකලවා අතර දක්ෂිණාවර්ත වී සිටියි. ඔහුගේ කඳෙහි වනාහි ලක්ෂයක් අගනා කම්බිලියක් පෙරවූවාක් මෙන් කේසර සමූහයක් ඇත. ශරීරයේ සෙසු ස්ථාන පිරිසිදු වූ හාල්පිටි, හක්සුණු, පුලුන් මෙන් සුදුපාට වූයේ වෙයි. මේ සතර සිංහයන් අතුරින් මේ කේශර සිංහයාම මෙහිදී අදහස් කරන ලදී.

"**මිගරාජා**" යනු තිරිසන් සතුන්ගේ රජතුමාය. "ආසයා" යනු වසන ස්ථානයෙනි. රන් ගුහාවකින් හෝ රිදී, මැණික්, ස්ඵටික, රත්සිරියල් ආදී ගුහාවකින් හෝ නික්මුණේ යැයි කියන ලදී. නික්මීම ද සිවු කාරණයකින් සිදුවේ. අන්ධකාරයෙන් පෙළීම නිසා ආලෝකය සොයාගෙන නික්මීම, මලමූත්‍රාදියෙන් පෙළීම නිසා ඒවා බැහැර කිරීමට නික්මීම, බඩසයින් පෙළුණේ ගොදුරු-ආහාර පිණිස නික්මීම සහ ශුක්‍රධාතු කිපීම නිසා මෛථුන ධර්මයෙහි යෙදීම පිණිස නික්මීම යන සතරයි. මෙතැනදී ගොදුරු පිණිස නික්මුණේයැයි දතයුතුය.

"**විජමහති**" යනු රන් තලයක හෝ රිදී-මැණික්-ස්ඵටික-රත්සිරියල්

තලයක හෝ යන කිසියම් තලයක පසු පාදෙක සමව පිහිටුවාගෙන, පෙර පාදෙක ඉදිරියට දිගුකර, සිරුරේ පසුභාගය ඇඳ - පෙරභාගය ඉදිරියට ගෙනවුත්, පිට නමා-ගෙල ඔසවා හෙනහඬක් ගසන්නාක් මෙන් නාස්පුට ගසාදමා ශරීරයේ ඇලී ඇති දූවිලි කම්පා කරවමින් (ඉවත් කරමින්) ශරීරය ගසා දමයි යනයි. එසේ සිරුර ගසාදමන බිමෙහි ද තරුණ වසු පැටවකු මෙන් එහෙ මෙහෙ දුවයි. දුවනු යේ ද ඔහුගේ ශරීරය අඳුරෙහි කැරකෙන ගිනිපෙනෙල්ලක් මෙන් වැටහේ.

"අනුවිලොකෙති" කුමක් නිසා පරීක්ෂා කර බලන්නේ ද ? යනුයි. පරහට අනුග්‍රහ පිණිසයි. ඒ සිංහනාදය පවත්වන කල්හි ප්‍රපාත-ආවාටයන්හි විසමතැන්හි හැසිරෙන ඇත්-ගෝන-මිහරක් ආදී ප්‍රාණීහු එම ප්‍රපාතයේම ආවාටයේම වැටෙති. ඔවුන්ට අනුග්‍රහ පිණිස (එසේ නොවැටීම සඳහා) පරීක්ෂා කර බලයි. කිම මේ දඩයම් කරමින් සත්ව මාංසයෙන් යැපෙන මොහුට කරුණාවක් තිබේද? එසේය ඇත. "මෙසේ කලබලවීමෙන් බොහෝ දෙනෙකු මරණයට පත්කිරීමෙන් මාහට ඇති ප්‍රයෝජනය කුමක්ද?" තමාගේ ගොදුර සඳහා කුඩා සතෙකු නොගැනීමද සිංහයාගේ සිරිතකි. මෙසේ සෙසු සතුන් කෙරෙහි අනුකම්පා කරයි. මෙය කියන ලදී. "කුඩා වූ විෂම ස්ථානවලට පැමිණි ප්‍රාණීහු විනාශයට නොපැමිණේවා!"යි යනුවෙන්.

"සිංහනාදං නදති" යනු තෙවරක්ම සිංහනාද පවත්වයි යනුයි. මෙසේ වැජඹෙන භූමියක සිට නාද කරන්නහුගේ ශබ්දය හාත්පස තුන් යොදුනක් පමණ ප්‍රදේශය එකනින්නාද කරයි. ඔහුගේ ඒ ශබ්දය අසා තුන් යොදුනක් තුල සිටි දෙපාසිවුපා සමූහයා හුන්තැන සිටීමට අසමත් වෙති.

"ගොචරාය පක්කමති" යනු ආහාර සඳහා යයි යනුයි. කෙසේද? ඔහු වැජඹී භූමියේ සිට දකුණට හෝ වමට උඩපනිනුයේ වෘෂභයෙක් පමණ උසතැන් පනියි. ඉන් අනතුරුව උඩ පනිනවිට උසභ සතරක් හෝ අටක් වූ හෝ උස පනියි. සමතැන්හි සෘජුව පැන දුවනවිට දාසයක් හෝ විස්සක් වූ උසභ ප්‍රමාණයක දුර පැනදුවයි. ගොඩබිමක හෝ පර්වතයක සිට පැන දුවනවිට උසභ සැටක් හෝ උසභ අසූවක් පමණ තැන් පනියි. අතරමග ගසක් හෝ පර්වතයක් දක, එය වට වමට හෝ දකුණට කැරකෙමින් උසභයක් පමණ තැන් ඉක්මවයි. තෙවැනිවර සිංහනාද කර,

ඒ සමගම තුන්යොදුන් පමණ තැන් පෙනී යයි. එම යොදුන් තුන ගෙවා ගොස් නැවතී තමාගේම නාදයේ, අනුනාදය අසයි. මෙවැනි වේගවත් ජවයකින් ඔහු පැනදුවයි.

"යෙභුය්‍යෙන" යනු බොහෝසෙයින් යනුයි. "භයං සන්තාසං සංවෙගං" යන මේ සියල්ල සිතේ තැතිගැනීම පිණිස වූ නාමයන්ය. සිංහයාගේ ශබ්දය අසා බොහෝ සත්ත්වයෝ භයවෙති. අල්ප වූ දෙනෙක් බිය නොවෙති. ඔවුහු කවරහුද? ඊට සමාන වූ සිංහයා, අජානීය අශ්වයා, අජානීය හස්තියා, අජානීය පුරුෂයා, රහතන් වහන්සේ. මොවුහු කුමක් නිසා බිය නොවෙත්ද? සමාන වූ සිංහයා නම් ජාති, ගෝත්‍ර, කුල, ශූර භාවයන්ගෙන් සමාන වෙයැයි බිය නොවේ. අජානීය හස්ති ආදී සත්ත්වයෝ තමාගේ සක්කාය දෘෂ්ටිය බලවත් හෙයින් (තමාගේ යැයි දැඩිව ගැනීම) බිය නොවෙති. රහතන් වහන්සේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීන කළ බැවින් බියනොවන සේක.

"බිලාසයා" යනු බිලයෙහි නිදන - බිලයෙහි වෙසෙන්නෝය. සර්ප, මුගටි, තලගොයි ආදීහු. "දකාසයා" යනු ජලයෙහි වසන මත්ස්‍ය-කැසිබු ආදීහුය. "වනාසයා" යනු වනයේ වෙසෙන ඇත්, අස්, ගෝණ, මුවාදීහුය. "පවිසනති" යනු දැන් පැමිණ අප අල්ලා ගත්තේයැයි මගබලමින්ම පිවිසෙති යනුයි. "දළ්හෙහි" යනු ස්ථිර වූ දැඩි වූ යනුයි "වරතෙතහි" යනු හම් රැහැනින්ය. "මහිදධිකො" ආදියෙහි වැජඹී (කිලිපෙලූ) බිමෙහි සිට දකුණු ආදී දිශාවකට උසභයක් පමණද සෘජුව උසභ විස්සක් පමණ ද පැනීම් වශයෙන් මහත් වූ ඍද්ධි ඇති, සෙසු මෘගයන්ට අධිපති බව නිසා මහේශාක්‍ය බවද, හාත්පස තුන්යොදුන් පමණ ප්‍රදේශයේ සත්ත්වයෝ හඬ අසා පලායෑම් වශයෙන් මහානුභාව සම්පන්නතාවයද දතයුතුයි. "එවමෙව බො" යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ ඒ ඒ සූත්‍රයන්හි ඒ ඒ අයුරින් තමන්වහන්සේ දක්වන සේක. "මහණෙනි! සීහ යනු බුදුරජාණන් වහන්සේට යෙදෙන තවත් නාමයකි." මෙම සූත්‍රයේ දී ද සිංහයා හා තමන් වහන්සේ සමාන කරන සේක. "සුනක්ඛත්තය! වෛද්‍යවරයා, ශල්‍ය වෛද්‍යවරයා යනු තථාගතයි වහන්සේටම යෙදෙන තවත් නාමයකි." මෙහි බුදුහු වෛද්‍යවරයෙකුට සමාන වූහ. "මහණ! බ්‍රාහ්මණ යනුද තථාගතයන්ට යෙදෙන තවත් නාමයකි." මෙහිදී බ්‍රාහ්මණයකුට සමාන කෙරුණි. "තිස්සය! මාර්ගයෙහි දක්ෂ පුරුෂයා යනු තථාගතයන්ට ම යෙදෙන තවත් නාමයකි." මෙහිදී මාර්ගය දක්වන පුරුෂයකු හා සමාන වූහ. "සේලය! මම රජවෙමි" මෙහිදී රජකු හා සමවූහ. "මහණෙනි! සීහ

යනු තථාගතයන්ට ම යෙදෙන තවත් නාමයකි" යනුවෙන් මේ සූත්‍රයේදී තමන් වහන්සේ සිංහයකු හා සමාන කර දක්වන සේක් මෙසේ දැක්වූහ.

එහි මේ සමානකර දක්වීමයි. - සිංහයාගේ රන්ගුහාදියෙහි වසන අවස්ථාව මෙන් තථාගතයන් වහන්සේ දීපංකර පාදමූලයේ සිට කළ ප්‍රාර්ථනා ඇතිසේක්, අප්‍රමාණ වූ කාලයක් පාරමීපුරා - අවසන් ආත්ම භාවයෙහි ප්‍රතිසන්ධි ග්‍රහණයෙන් (පිළිසිඳ ගැනීමෙන්) මෙන් ම මවුකුසින් බිහිවීමෙන්ද දසදහසක් ලෝධාතුව කම්පා කරවමින්, අභිඥාද්ධියට පැමිණ දිවැ සැපත් හා සමාන වූ සම්පත් අනුභව කරන සේක් ත්‍රිවිධ ප්‍රාසාදයන්හි විසූ කාලය දතයුතුයි.

සිංහයාගේ රන්ගුහාවෙන් නික්මෙන අවස්ථාව මෙන් තථාගතයන් වහන්සේට විසිනව වන වසරේදී විවෘත වූ ද්වාරයෙන් කන්ථක අසුපිට නැගී ඡන්න නම් සහායකයා සමග නික්ම, ත්‍රිවිධ රාජ්‍යයන් ඉක්මවා අනෝමා නම් නදීතෙරදී මහාබ්‍රහ්මයා විසින් දුන් කසාවත් හැඳ පොරවා පැවිදි වූ සත්වැනි දින රජගහනුවර පිඬු පණිස හැසිර, පණ්ඩව පර්වත ප්‍රාන්තයේ කරන ලද බත් කිස ඇති සේක් - සම්මා සම්බුද්ධත්වයට පැමිණ පළමුවම මගධයට වැඩමකිරීම සඳහා රජුට පොරොන්දු වූ අවස්ථාව දක්වා වූ සිදුවීම් දතයුතුයි.

සිංහයා කිළිපොලා සිරුර ගසා දැමූ අවස්ථාව මෙන් තථාගතයන් වහන්සේ දෙන ලද ප්‍රතිඥා ඇතිව, ආළාරකාලාම වෙත පැමිණීමේ සිට සුජාතාවගේ කිරිපිඬු දානය හා එය පිඬු හතලිස් නවයකට වැළඳීම දක්වා වූ කාලය දතයුතුයි.

සිංහයාගේ කේශර කම්පාකිරීම මෙන් සවස් යාමෙහි සොතීය විසින් දුන් කුසතණ මිටි අට රැගෙන, දසදහසක් සක්වල දේවතාවන් විසින් තුති ගී ගයමින් ගඳමල් ආදියෙන් පුදනු ලබනසේක්, තෙවරක් බෝමැඩ පැදකුණු කර - බෝධි මණ්ඩපයට පැන නැගී රියන් දාහතරක් උස තැනෙක්හි තණ ඇතිරිය අතුරා චතුරංග සමන්නාගත වූ වීර්යය අධිෂ්ඨාන කොට සිටිසේක් එකෙණෙහිම මාරබලය විද්වංසනය කර - ත්‍රිවිධ යාමයෙහි ත්‍රිවිද්‍යාවන් පිරිසිදු කර - අනුලෝම, ප්‍රතිලෝම වශයෙන් ප්‍රතීතය සමුත්පාදය නැමති මහා සාගරය, උභය ඥාන නම් දණ්ඩෙන් මථනය කරන්නාහු සර්වඥ ඥානය අවබෝධ කරගත් සේක් - එහි ආනුභාවයෙන් දසදහසක් ලෝකධාතුව කම්පාකිරීම දතයුතුයි.

සිංහයාගේ සිවුදිසාව බැලීම මෙන් අවබෝධ කරගත් සර්වඥ ඥානයෙන් යුක්තව සත් සති බෝමැඩ සම්පයෙහි ගතකොට, වැළඳූ මීපිඬු ආහාරය ඇතිව - අජපල් නුගරුක් මුලදී මහබඹුගේ ධර්මදේශනාව සඳහා වූ ඇරයුම පිළිගෙන වැඩවසන සේක් එකොළොස්වන දිනයේ හෙට ඇසළ පුන්පෝදින වන්නේයැයි දැන ඉතා අළුයම් වේලෙහි "මම පළමුව දම්දෙසනුයේ කාටද?"යි බලන සේක් - ආළාරකාලාම හා උද්දකරාමපුත්‍රාදීන්ගේ කළුරිය කළ බව දැන දම්දෙසුම සඳහා පස්වග තවුසන් තෝරාගැනීම දතයුතුයි.

සිංහයා ගොදුරු පිණිස තුන්යොදුන් මග ගමන් කළාක් මෙන් තමන් වහන්සේගේ පාසිවුරු ගෙන "පස්වග තවුසන්ට දම්සක් පවත්වන්නෙමි"යි පසුබත් කල, අජපල් නුගරුක මුලින් නැගිට අටළොස් යොදුන් මගගෙවා වැඩමකිරීම දතයුතුයි. සිංහනාද පැවැත්වූ අවස්ථාව මෙන් තථාගතයන් වහන්සේ අටළොස් යොදුන් මගගෙවා ගොස් පස්වග තවුසන්ට දන්වා නොසෙල්වෙන ආසනයෙන් වැඩහිඳ දසදහසක් සක්වලින් රැස්වූ දිව්‍ය සමූහයා පිරිවරාගෙන "මහණෙනි! මේ අන්ත දෙක පැවිද්දකු විසින් සේවනය නොකල යුතුයි....." ආදී වශයෙන් ධර්ම චක්කප්පවත්තන සූත්‍ර දේශනාව පැවැත්වීම දතයුතුයි.

මේ පදය දෙසනු ලබන කල්හි තථාගත නම් සිංහරාජයාගේ ධර්මඝෝෂාව යටින් අවීචිය දක්වාත් උඩින් භවාග්‍රය දක්වාත් පැතිර දස දහසක් ලෝකධාතුව වසාගත්තේය.

සිංහ නාදයෙන් කුඩා සතුන්ට බියජනක සන්ත්‍රාසයක් පැමිණි අවස්ථාව මෙන් තථාගතයන් වහන්සේ ත්‍රිවිධ ලක්ෂණ දක්වා - චතුරාර්ය සත්‍යයන් දහසය ආකාරයකින් සැටදහසක් න්‍යාය වශයෙන් බෙදා දක්වා ධර්මය දේශනා කරනු ලබන කල්හි දීර්ඝායුෂ ඇති දෙවියන්ගේ ඤාණ සන්ත්‍රාසයේ පහළවීම් අවස්ථාව දතයුතුයි.

"**යදා**" යනු යම්කලෙකයි. "**තථාගතො**" යනු අට කරුණකින් භාග්‍යවතුන් වහන්සේ තථාගත නම් වනසේක යනුයි. "එසේ ආවේය" යන අරුතින් තථාගත වේ. 'එසේ ගියේය' යන අරුතින් තථාගත නම් වේ. තථ ලක්ෂණය පැමිණියේ නුයි තථාගත නම් වේ. තථ ධර්මයෙහි සත්‍යාකාරයෙන්ම සියල්ල අවබෝධ කරන ලදයි තථාගත නම් වේ. තථ

ලක්ෂණය දක්වන ලද බැවින් තථාගත නම් වේ. එසේ කියන ලද බැවින් තථාගත නම් වේ. එසේ කරන ලද බැවින් තථාගත නම් වේ. සෙසු පුද්ගලයන් අභිභවනය කරන ලද අර්ථයෙන් තථාගත නම් වේ. මෙය විස්තර වශයෙන් බ්‍රහ්මජාල සූත්‍ර වර්ණනාවේද මූලපරියාය සූත්‍ර වර්ණනාවේද දක්වන ලද්දේමය. "ලොකෙ" යනු සත්ත්ව ලෝකයයි. "උපපජ්ජති" යනු ප්‍රාර්ථනා කිරීමේ පටන් බෝමැඩ මුලදී අර්හත් මාර්ගඥානය උපදියි නම් වේ. "අරහං සම්මා සම්බුද්ධා" යනාදිය විසුද්ධිමාර්ගයේ බුද්ධානුස්සති නිර්දේශයේ විස්තර කරන ලදී.

"ඉතිරූපං" යනු මෙය රූපයයි. රූපය මෙපමණයි. මෙයින් වැඩි රූපයක් නැත යනුයි. මෙපමණකින් ස්වභාව වශයෙනුත්, සරස් වශයෙන්, හාත්පසින්, වෙන්කර දැක්වීම් වශයෙන් - පෙරලීම් වශයෙන් - සතරමහා භූතයන්ද සිවුමහා භූත උපාදාන කරගත්තා වූද රූපය යන ඒ සියල්ල දක්වන ලදී. "ඉති රූපස්ස සමුදයො" යනු මෙය රූපයේ ඇතිවීම යනුයි. මෙපමණකින් ආහාර ඇතිවීමෙන් රූපය ඇතිවේ ආදී සියල්ල දක්වන ලදී. "ඉති රූපස්ස අත්ථගමො" යනු මෙය රූපයේ අස්තංගමයයි. නැතිවීමයි. මෙහිදීද ආහාර නැතිවීමෙන් රූපය නැතිවන ආකාරය දක්වන ලදී. "ඉති වෙදනා" ආදියෙහිද මේ ක්‍රමයම දතයුතුයි. "වණ්ණවනෙතා" යනු ශරීර වර්ණයෙන් වර්ණවත් වූ යනුයි. "ධම්මදෙසනං සුත්වා" යනු මේ පංචස්කන්ධයෙහි පසලොස් ලක්ෂණයන් ගෙන් අලංකාර වූ තථාගතයන් වහන්සේගේ ධර්මදේශනාව අසා යනුයි. "යෙභුය්‍යෙන" යනු මේ ලෝකය අත්හැර ආර්ය ශ්‍රාවක වූ දෙවිවරු යනුයි. ඔවුන්ට වනාහී ආශ්‍රවයන් සිඳලූ බැවින් සිතේ තැති ගැනීමක් පවා නූපදියි. කළකිරුණු තැනැත්තාට ද නුවණින් පැමිණිය යුතු ඉහළම තැනට පැමිණි බැවින් ඤාණ සංවේගයන් නොපවතියි. සෙසු දෙවිවරුන්ට "මේ භික්ෂුව බියවිය" යැයි අනිත්‍යතාව මෙනෙහි කරන්නන්ට සිතේ තැති ගැනීමක්, භයක් ද බලවත් විදර්ශනාව පවතින කාලයෙහි ඤාණභයක් ද නූපදියි. "භො" යනු ධර්මයට ඇමතීමක් පමණි. "සකකාය පරියාපන්නා" යනු පංචස්කන්ධයේ ඇතුලත් අන්තර්ගත යනුයි. මෙසේ ඔවුන්ගේ සසර පැවැතුම් දෝෂ දක්වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ ත්‍රිලක්ෂණයන් ගෙනහැර දක්වා - ධර්මදේශනා කරන කල්හි ඤාණභයට බැසගනිත්.

"අභිඤ්ඤාය" යනු දැනගෙන යනුයි. "ධම්මචක්කං" යනු ප්‍රතිවේධ ඤාණ වශයෙන් හා දේශනා ඥාන වශයෙනි. ප්‍රතිවේධ ඤාණය නම් -

යම් ඤාණයකින් බෝධි පල්ලංකයෙහි හුන්සේක් චතුරාර්ය සත්‍යයන් සොළොස් ආකාරයකින් හා සැටදහසක් න්‍යායාකාරයෙන් අවබෝධ කරගත් සේක් ද එයයි. දේශනා ඤාණය නම් - යම් ඥානයකින් තිපරිවට්ට ද්වාදසාකාරයෙන් ධර්මචක්‍රය පැවැත්වූ සේක්ද එම ඤාණයයි. මෙම ඤාණ දෙකම දසබලයන් වහන්සේගේ හදවතෙහි ම හටගත් උතුම් ඤාණයන්මය. එම දෙකින් මෙහිදී දේශනා ඤාණය ම ගතයුතුයි. එය වනාහි අටළොස් කෙළක් මහා බ්‍රහ්මයන් සමග අඤ්ඤා කොණ්ඩඤ්ඤ තෙරුන් සෝවාන් ඵලයෙහි පිහිටීම දක්වා මේ දේශනාව පවත්වයි"නම් වේ. සෝවාන් ඵලයට පත්වූ විටම මේ දේශනාව "පැවැත්වූයේය" නම් වේ. **"අපපටිපුගගලො"** යනු සමාන වූ පුද්ගලයෙක් නැති යනුයි. "යසසිනො" යනු පිරිවරාගත් - පිරිවරින් යුක්ත යනුයි. "තාදිනො" යනු ලාභයේදීත් අලාභයේදීත් එකසමාන වූ පැවැත්මයි.

සයවන සූත්‍රයයි.

21. 3. 7.

සත්වන සූත්‍රයේ - "පුබෙබනිවාසං" යන මෙය අභිඥා වශයෙන් සිහිකිරීම සඳහා නොකියන ලදී. විදර්ශනා වශයෙන් පූර්වෙනිවාසය (පෙරවිසූ කඳපිළිවෙල) සිහිකර ශ්‍රමණ-බ්‍රාහ්මණයන් සඳහා ම කියන ලදී. එනිසා මෙසේ කීහ. **"සබෙබ තෙ පඤ්චුපාදානකඛන්ධෙ අනුසසරනති එතෙසං වා අඤ්ඤතරං"** යනුවෙනි. (ඒ සියලුම පඤ්චස්කන්ධයන් සිහිපත් කරයි. ඒ අතරින් වෙන එකක් හෝ සිහිපත් කරයි.) අභිඥා වශයෙන් සිහිකරන්නහුට ස්කන්ධයන් ද උපාදානස්කන්ධයන්ද ස්කන්ධ හා බැඳුණු ප්‍රඥප්තීන් ද අරමුණු වෙත්මය. **"රූපක්ඛන්ධව අනුසසරති"**යි සිහිකරනුයේ **අනික් කිසියම්** හෝ පුද්ගලයෙක් සිහිපත් නොකරයි. අතීතයේ නිරුද්ධව ගිය රූපස්කන්ධයම සිහිපත් කරයි. වේදනාදියෙහි ද මෙම ක්‍රමය ම දතයුතුයි.

ශූන්‍ය පර්වය නිමියේය.

දැන් ශූන්‍යතාවයේ ලක්ෂණ දක්වීමට **"කිඤ්චි භික්ඛවෙ රූපං වදෙය්‍යාථ"** යනාදිය දෙසූහ. යම්සේ නැතිවූ ගොනෙකු සොයන මිනිසා, ගව සමූහයා අතර හැසිරෙන රතු වූ හෝ කළු වූ හෝ ගොනෙකු දැක මෙපමණකින් ම **"මේ මගේ ගොනා"**යැයි නිශ්චයට පැමිණේ. මේ අයුරින්ම ශූන්‍යතාව දේශනා කිරීමේදී ශූන්‍ය ලක්ෂණ නොපැවසුයේ ද ඒ තාක්

ශූන්‍ය කථාව නොදෙසන ලද්දේමය. ශූන්‍ය ලක්‍ෂණ ද පෙන්වූ විට ශූන්‍ය දේශනාව පවසන ලද්දේම වේ. ශූන්‍යතාව ගොනා මෙනි. ගොනා හඳුනා ගන්නා ලක්‍ෂණ ශූන්‍යතාව හඳුනාගන්නා ලක්‍ෂණ මෙනි. යම් සේ ගොනාගේ ලක්‍ෂණ නොසලකා හැරිවිට ගොනා මැනවින් හඳුනා ගැනීමට නොහැකි වන්නේද එසේම ගොනුගේ ලක්‍ෂණ සිහිපත් කර බැලීමෙන් ඌ හඳුනාගත්තේ වේ. මේ අයුරින්ම ශූන්‍යතා ලක්‍ෂණ නොපැවසූ විට ශූන්‍යතාව නොකියන ලද්දේමය. එය දේශනා කල කල්හි ශූන්‍යතාව දේශනා කළේ වේ. ශූන්‍යතා ලක්‍ෂණ දැක්වීමට **"කිඤ්චි භික්ඛවෙ රූපං වදෙථ"** යනාදිය දෙසූහ.

එහි **"කිඤ්චි"** යනුවෙන් හේතුව විමසයි. කුමන කරුණකින් රූපය යැයි කියවුද? කුමන කරුණක් නිසා මෙයට "රූපය" යන නම යෙදේද? "රූපපනීති බො" යන මෙහි **"ඉති"** යනුවෙන් කරුණ දැක්වීමයි. යමකින් විකාරයකට පැමිණේද එය "රූපය" යැයි කියන ලදී යන අර්ථයි. "රූපපනී" යනු කිපේ. ගැටේ. පෙළේ. බිඳේ යන අර්ථයි. **"සීතෙනපි රූපපති"** ආදියෙහි සීතලෙන් වෙනසට - විකාරයට පත්වීම ලෝකන්තරික නිරයෙහි ප්‍රකටය.

සක්වල තුනක් තුනක් අතර එක් එක් ලෝකාන්තරික නිරය බැගින් ඇත. එය අටදහසක් යොදුන් ප්‍රමාණයක් පුරා පැතිර පවතී. එහි යට පොළවක් නැත. මත්තෙහි සඳහිරු, පහන්, මැණික් ආදී කිසිදු ආලෝකයක් නැත. නිත්‍ය වූ අඳුර පවතී. එහි උපන් සතුන්ට තුන්ගවුවක් පමණ වූ විශාල සිරුරක් ලැබේ. ඔවුහු වවුලන් මෙන් පර්වත පාදයෙහි දිග-මහත නියවලින් එල්ලී සිටිති. යම්කලෙක ඔවුහු දඟලන්නාහු ඔවුනොවුන්ගේ ශරීර ලංවෙති. එවිට "අපට අනුභව කිරීමට කෑමක් ලැබුණි"යැයි සිතමින් එහි යෙදී සිටීමෙන් ඔවුනොවුන් පෙරලී ලෝකය දරාසිටින ජලයෙහි වැටෙති. සුලඟින් ගසාගෙන ගොස්ද ඇතැම්හු මීඅඹ මෙන් ගිලිහී දියෙහි වැටෙති. වැටුණු මොහොතේම අතිශයින් කැකෑරුණු දියෙහි - රත්කල කබලක වැටුණු පිටිපිඩක් මෙන් - පට පටා ගාමින් විනාශ වෙති. මෙසේ සීතලෙන් වෙනස්වීම ලෝකාන්ත නරකයෙහි අතිශයින් ප්‍රකටය.

මහිස ආදී රටවල හිම වැටෙන ශීතල ප්‍රදේශවල මෙය ඉතා ප්‍රකටම වේ. එහි සත්ත්වයෝ ශීතලෙන් බිඳුණු ශරීර ඇතිව ජීවිතක්‍ෂයට පැමිණෙති.

උණුසුමින් වන විපර්යාසය අවීචි මහනිරයේ ඉතා ප්‍රකටය. බඩසයින් වන පීඩාව ප්‍රේත ලෝකයෙහිද මනුලොව දුර්භික්ෂ කාලවලද ප්‍රකට වේ. පිපාසාවෙන් වෙනස්වීම කාලකඤ්ජක නම් අසුර ලෝකාදියෙහි ප්‍රකටය. එක් කාලකඤ්ජක අසුරයෙක් පිපාසය ඉවසා ගැනීමට නොහැකිව යොදුනක් ගැඹුරු හා පලල් වූ මහ ගඟකට බැස්සේය. එහි ගිය ගිය තැන දිය සිඳී යයි. දුම උඩට නගියි. රත්වූ පිටිගලක සක්මන් කරන්නාක් මෙන් විය. එහි ජල ශබ්දය අසා ඔබ්-නොබ හැසිරෙනුයේ රැය ගෙවී ගියේය. එවිට ඔහු උදැසන පිඬු පිණිස හැසිරෙන තිහක් පමණ වූ භික්ෂූන් වහන්සේ ඔහු දැක "සත්පුරුෂය! නුඹ කවරෙක්ද?"යි ඇසූහ. එවිට ඔහු "ස්වාමීනි! මම ප්‍රේතයෙක් වෙමි"යි කීය. "කුමක් සොයන්නේද?"යි ඇසූවිට ඔහු "ස්වාමීනි! පැන්යැ"යි කීය. "මේ ගංගාව පිරී ඇත. කිම නුඹට නොපෙනේද?"යි භික්ෂූහු ඇසූවිට; ඔහු "ස්වාමීනි! මට ඊට ලංවිය නොහැක"යි කීය. එවිට කරුණාවන්ත වූ තෙරවරු "එසේනම් නුඹ ගඟ ඉවුරේ දිගාවෙන්න. නුඹගේ මුවෙහි දිය ඉසින්නෙමු"යි කියා ඔහු වැලි තලාවේ උඩුකුරුව හොවා-තිස් දෙනා වහන්සේම ප්‍රාතාවලින් දිය ගෙනවුත් ඔහුගේ මුවෙහි දැමූහ. උන්වහන්සේලා එසේ කරද්දීම කල්වේලා පැමිණියේය. එවිට "සත්පුරුෂය! අපට පිඬු පිණිස කල් පැමිණියේය. නුඹට වතුර බීමෙන් ආශ්වාදයක් පමණවත් ලැබුණේද?"යි ඇසූහ. එවිට ප්‍රේතයා "ස්වාමීනි! ඉදින් ආර්යයන් වහන්සේලා පාත්‍රා තිහකින් දිය ගෙනවුත් මුවෙහි ඉසිනු ලැබුවත් අල්ලකින් අඩක්වත් උගුර වෙත නොගියේය. ප්‍රේතභාවයෙන් මිදීමක් මට නැතැ"යි පැවසීය. මෙසේ පිපාසාවෙන් වෙනස්වීම ප්‍රේත ලෝකයෙහි අතිශය ප්‍රකටය.

ඩං සාදීන්ගේ වෙනස්වීම ඩැහැ ලේඛොන මැසි-මදුරු ආදීන් පිළිබඳ බහුල වූ සෙසු පදයන්හි ප්‍රකටය. මෙහිද "ඩංස" යනු දුඹුරුපාට ඇටමැස්සෝය. "මකසා" යනු මදුරුවෝය. "වාත" යනු කුසෙහි වාතය, පිටෙහි වාතය ආදී ලෙස දතයුතුය. ශරීරයේ වාතරෝගය ඉපිද අත්,පා, පිට ආදිය බිඳී යයි. කණ කරයි. කූදු කරයි. අත්පා කොර වූවන් (පිළන්) කරයි.

"ආතපෝ" යනු සූර්ය රශ්මියයි. ඉන් වන වෙනස්වීම වැලි කාන්තාරාදියේ ප්‍රකටය. එක් ස්ත්‍රියක් වැලි කතරක රාත්‍රියේ තවලමකින් තනිවූවා (මඟහැරී) දාවල සූර්යයා මුදුන් වූ විට රත් වූ වැලිවල පා තැබීමට නොහැකි වන්නී හිසින් පැසගෙන බිම දමා පාගා ගත්තීය. ක්‍රමයෙන් පැසද උණු වී සිටීමට නොහැකි වූවා ඇගේ උතුරු සලුව තබා

පාගා ගත්තිය. එය ද රත්වූ විට තමාගේ ඇකයෙන් ගෙනසිටි දරුවා උඩුකුරු කොට හොවා හඬද්දීම ඔහුද පාගාගත්තිය. දරුවා ද රත්වූ විට ඒ සමගම දෙදෙනම උණුසුම් වූවාහු කළුරිය කළෝය.

"සිරිංසප" යනු යම්කිසි දීර්ඝ ජාතික වූ බඩගා යන සත්තුය. ඔවුන්ගේ ස්පර්ශයෙන් වන වෙනස්වීම - විෂපිරි සර්පාදීන්ගේ දෂ්ටකිරීම් වශයෙන් දතයුතුයි.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ යම් මේ සමාන වූ සහ වෙන් වෙන් වූ ධර්මයන්ගේ ලක්ෂණ දෙකින් ඒ රූප ස්කන්ධයෙහි වෙන් වෙන් වූ ලක්ෂණ දක්වන ලදී. මෙය රූපස්කන්ධයෙහි පමණි. වේදනාදීන්ගේ නොවේ. එනිසා පුද්ගලයන්ට වෙන් වෙන් වශයෙන් අයත් ලක්ෂණයැයි කියයි. අනිත්‍ය-දුක්ඛ-අනාත්ම ලක්ෂණ වනාහී වේදනාදියෙහි ද වේ. එනිසා එය සමාන වූ ලක්ෂණයන් යැයි කියයි.

"කිඤ්චි භික්ඛවෙ වෙදනං වදෙථ" ආදියෙහි පෙරදී කියන ලද පරිදිම දතයුතුයි. යමක් මුලදී කියූ දෙයට අසමාන වේද එහි මේ ප්‍රකට කිරීමයි. "සුඛම්පි වෙදියති" යනු සැප අරමුණ විඳියි. අනුභව කරයි යනුයි. සෙසු පද දෙකෙහිද මේ ක්‍රමයමයි. මේ අරමුණ කෙසේනම් සැපය, දුකය, දුකසැප දෙකම ඇති මැදහත්බවය යන නම් උපදිද? සැප ආදී ප්‍රත්‍ය වශයෙනි. එහි මේ අර්ථයයි. "මාතලිය! යම්හෙයකින් රූපය සුවයක් වේද, සැපය අනුව වැටේද, සුව ගෙනදෙයිද" යනුවෙන් මහාලී සූත්‍රයෙහි මෙය සඳහන් වූයේමය. "වෙදියති" යන මෙහි වේදනාවම විඳියි. අනික් සතෙක් හෝ පුද්ගලයෙක් හෝ වේදනාවෙන් විඳීම් ලක්ෂණයක් නැත. එනිසා වස්තු ආරම්මණයක් නිසා වේදනාවම විඳගනීයැයි මෙසේ මෙතැන්හි භාග්‍යවතුන් වහන්සේ වේදනාව ද වෙන් වෙන් වූ ලක්ෂණ වශයෙන් බෙදා දැක්වූ සේක.

"නීලම්පි සඤ්ජානාති" යනු නිල් මල් හෝ වස්ත්‍ර හෝ පරිකර්ම කර - උපචාරයකට හෝ අර්පණාවකට හෝ පැමිණෙමින් එය හඳුනාගනියි යනුයි. මෙය සංඥා නම් වේ. පරිකර්ම සංඥාවද උපචාර සංඥාවද අර්පණා සංඥාව ද මෙහි සුදුසුමය. පීත (කහ) වර්ණ සංඥාදියේද මේ ක්‍රමයමය. මෙහිද භාග්‍යවතුන් වහන්සේ හැඳිනගැනීමේ ලක්ෂණ සහිත සංඥාවෙන් වෙන් වෙන් වූ ලක්ෂණ බෙදා දැක්වූ සේක. "**රූපං රූපත්තාය සංඛත මභි සංඛරොති**" යනු යම්සේ කැඳම, කැඳ සඳහා කැවුම්ම, කැඳ

සඳහා පිසයි නම් වේ. මෙසේ ප්‍රත්‍යයන් සමග පැමිණ කළ බැවින් (හේතු ප්‍රත්‍ය එක්වී සෑදුණු බැවින්) 'සංඛත' යන ලබන ලද නම් ඇති රූපයමය. රූපය සඳහා යම් සේ අභිසංස්කරණය කරන ලද්දේ රූපය නම් වේ. එසේම ඒ සඳහා, රූපබව පිණිස රූප රැස්කරයි. උත්සාහ කරයි. සම්පිණ්ඩනය කරයි. නිෂ්පාදනය කරයි. වේදනාදියේ ද මේ ක්‍රමයමයි. මේ පැවසුයේ සංක්ෂිප්ත වශයෙනි. තමා සමග උපදින රූපය හා එක්ව යෙදුණු වේදනාදිය ධර්ම අභිසංස්කරණය කරයි. උපදවයි. මෙහිද භාග්‍යවතුන් වහන්සේ විදීම් ලක්ෂණ සහිත සංස්කාරයන්ගේ වෙන් වෙන්වූ ලක්ෂණ ම බෙදා දැක්වූ සේක.

"**අමබිලමපි විජානාති**" යනු අඹ, ඇඹරුල්ල, නාරන් ආදී ඇඹුල් දේ ඇඹුල් ලෙස දැනගනියි යනුයි. සෙසු පදයන්හිද මෙම ක්‍රමයමයි. තවද මෙහි "**තිත්තකං**" යනු කොහොඹ, පතෝලාදී නානාප්‍රකාර දේය. "මධුරකං" යනු ගිතෙල්, පැණි ආදී නානාප්‍රකාර දෙයයි. "ඛාරිකං" යනු වම්බටු, බෙරු, කරඹ, පුහුල්, වේවැල් ආදී නානාප්‍රකාර දේය. "අඛාරිකං" යනු යම් ඒ ගෙඩි හටගන්නා කරකොළ ආදී මිශ්‍ර වූ කොළය. "ලොණිකං" යනු ලුණු කැඳ-ලුණු මාළු - ලුණු බත් ආදී නානාවිධ දේය. "**තසමා විඤ්ඤාණනති වුච්චති**" යනු යම්හෙයකින් මේ ඇඹුල් ආදී භේදයන් ඔවුනොවුන්ට විශිෂ්ට වූ ඇඹුල් ආදී කරුණුවලින් දැනගනියිද එහෙයින් 'විඤ්ඤාණය' යැයි කියයි. මෙසේ මෙහිද භාග්‍යවතුන් වහන්සේ දැනගැනීම් ලක්ෂණ වූ විඥානයේ වෙන් වෙන් වූ ලක්ෂණම බෙදා දැක්වූ සේක.

යම් අරමුණක ආකාරය - පෙනීම - ගැනීම වශයෙන් සංඥාව ප්‍රකට වේ. එහෙයින් ඒ චක්ඛුද්වාරය බෙදන ලදී. යම්හෙයකින් ආකාර-පෙනීම ආදී අරමුණුවල පවතින භේද ගැනීම් වශයෙන් විඥානය ප්‍රකට වේ. එනිසා එය ජවිභාද්වාරයේ බෙදා දක්වන ලදී. මේ සංඥා, විඥාන හා ප්‍රඥා වශයෙන් මුළා නොවීම් වශයේ ස්වභාවය, ලක්ෂණ සහිතව දැනගනියි. අවබෝධ කරගනියි. විශේෂයෙන් දැනගනියි. මෙහි විශේෂය දතයුතුයි. මෙහි විශේෂය නම් උපසර්ගය පමණකි. "ජානාති" (දැනගනියි) යන පදයෙහි විශේෂයක් නැත. එහි දැනගැනීම් අර්ථයෙන් විශේෂත්වය දතයුතුයි. නීලාදී අරමුණ හඳුනාගැනීම් පමණකි. අනිත්‍යය, දුකය, අනාත්මයැයි ලක්ෂණ අවබෝධ කරගැනීමට නොහැකි වේ. විඥානය නීලාදී වශයෙන් අරමුණ ම දැනගනියි. අනිත්‍යාදි වශයෙන් ලක්ෂණ අවබෝධ කරගැනීමටද පැමිණෙයි. උත්සාහ කර, මාර්ගය පහළ කරගැනීමටද නොහැකි වේ.

ප්‍රඥාව නීලාදී වශයෙන් අරමුණ ද දැනගනියි. අනිත්‍යාදී වශයෙන් ලක්ෂණ ප්‍රතිවේධයටද පැමිණේ. උත්සාහ කර, ආර්ය මාර්ගාවබෝධයට ද පැමිණේ.

යම්සේ රන් පුවරුවක කහවනු රැසක් කළ කල්හි නූපන් බුද්ධි ඇති දරුවා, ගැමි පුරුෂයා, මහා රන්කරුවා යන තිදෙන එය බලා සිටි විට බුද්ධි නැති දරුවා කහවණුවල විසිතුරු බව චතුරස්‍ර හා රවුම් ආදී ආකාරයම බලා දැනගනියි. මෙය මිනිසුන්ගේ උපභෝග-පරිභෝග රත්න සම්මතයකියි නොදනියි. ගැමි පුරුෂයා විසිතුරු බව ද දකියි. එමෙන් ම මිනිසුන්ගේ සැපසම්පත් ගෙනදෙන සම්මත වූ රත්නයකැයි දත් නමුත් "මේ බොරු කහවණුවකි", "මේ ඡේකයකි", "මේ කරටකයකි", "මේ සණ්හයකි"යි ඒ කහවණුවේ වර්ගය නොදනියි. මිල පමණක් (අගය) දනියි. මහා රන්කරුවා විසිතුරු ආදී ලක්ෂණ ද රත්න සම්මත අගය ද කුටාදී භාවයන් ද දැනගනියි. දැනගැනීමත් රූපය දැක, ශබ්දය අසා, සුවඳ ආඝ්‍රාණය කර, රස විඳ, අතින් තද-මෘදුබව සලකා අසුවල් ගමේ කරන ලදී ආදි වශයෙන් ද දැනගනියි. අසුවල් නියම්ගමෙහි, අසුවල් නගරයේ, අසුවල් පර්වත ඡායාවෙහි, අසුවල් නදී තීරයේ සිටින අසුවල් ආචාර්යයා විසින් කරන ලදැයි ද දැනගනියි. මේ අයුරින්ම සංඥාව බුද්ධිය නැති දරුවා කහවණුව බැලීම මෙන් නිල් ආදී ලෙස අරමුණ පමණක්ම දැනගනියි. විඤ්ඤාණය ගැමි පුරුෂයාගේ කහවණුව දැකීම මෙන් නිල් ආදී ලෙස අරමුණද දැනගනියි. අනිත්‍යාදී වශයෙන් ලක්ෂණයන්ගේ අවබෝධය ද ලබයි. ප්‍රඥාව මහා රන්කරුවා කහවනුව දකින්නාක් මෙනි. නිල් ආදී ලෙස අරමුණ හැඳිනගනියි. අනිත්‍යාදී ලක්ෂණයන්ට එය පත්වන බවද දැනගනියි. උත්සාහ කර මාර්ග ඵලයන්ට ද පැමිණේ.

එය වනාහී ඔවුන්ගේ විශේෂය අවබෝධ කරගැනීම අපහසුය. එනිසා නාගසේන හිමියෝ මෙසේ වදාළහ. "මහරජ! භාග්‍යවතුන් වහන්සේ විසින් කරන ලද්දේ දුෂ්කර කටයුත්තකි." මිළිඳු රජු "ස්වාමීනි! නාගසේනයන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේ කවර දුෂ්කර කටයුත්තක් කරන ලද්දේද?" "මහරජ! භාග්‍යවතුන් වහන්සේ කරන ලද්ද ඉතා දුෂ්කරය. යම් බඳු අරූපී චිත්ත චෛතසික ධර්මයන්ගේ එක අරමුණේ පවතින වෙන්කර දැක්වීම් "මේ ස්පර්ශයයි. මේ වේදනාවයි. මේ සංඥාවයි. මේ චේතනාවයි. මේ සිතයි." යනුවෙන් දේශනා කරන ලදසේක් ද, එය තලතෙල්, අබතෙල්, මීතෙල්, එරඬුතෙල්, වසාතෙල් යන මේ පස් තෙල් එක පාත්‍රයක දමා, දවසක් ම කළවම් කර, ඉන්පසු මෙය තලතෙලයි. මේ අබතෙලයි. ආදී

වශයෙන් එක් එක් තෙල වෙන වෙනම ගෙන දැක්වීම මෙන් දුෂ්කර ක්‍රියාවකි. භාග්‍යවත් වූ ධර්මයට ඊශ්වර වූ ධර්මරාජන් වූ බුදුපියාණන් වහන්සේ සර්වඥ ඥානයාගේ මනා අවබෝධයෙන් මේ අරූපී ධර්මයන් එක් අරමුණක පවතින බවට ව්‍යවස්ථාපනය කරන ලදහ. පංච මහා නදීහු මුහුදට පිවිසෙන කල්හි මේ ගංගානම් ගඟේ ජලයයි. මේ යමුනා ගඟේ ජලයයි යනුවෙන් වෙන් වෙන්ව ජලය වෙන්කර දැක්වීම මෙන් මෙහි අර්ථ දතයුතුයි. මෙසේ ප්‍රථම කොටසින් ශූන්‍යතාවද දෙවන කොටසින් ශූන්‍යතා ලක්ෂණද යනුවෙන් මේ දෙකොටසින්ම අනිත්‍ය ලක්ෂණය දේශනා කළ බුදුපියාණෝ දැන් දුක්ඛ ලක්ෂණය දැක්වීමට "තත්‍ර භික්ඛවෙ" යනාදිය දෙසූහ.

එහි "බජ්ජාමි" යනු රූපය බල්ලෙකු මෙන් මස් උදුර-උදුරා නොකයි. යම්සේ කිලිටි වස්ත්‍ර හැඳ ඒ හේතුවෙන් පීඩාව සඳහා කයි. වස්ත්‍ර නොකයි. මෙසේ පීඩාව ඉපිදවීම "කයි" නම් වේයැයි දතයුතුයි. "පටිපනෙනා හොනි" යනු සීලය මුල්කරගෙන අර්හත් මාර්ගය දක්වාම පිළිපන්නේ වේ යනුයි. යමෙක් මෙහි බලවත් ප්‍රඥා ඇතිව, තියුණු ප්‍රඥා ඇතිව, බුද්ධි ඤාණයන්ගෙන් උතුම් වූ යෝගාවචරයෙක්ව ප්‍රධන් භූමියෙහි වෑයම් කරනුයේ හුල්, කටු ආදියකින් විදීමෙන් හෝ ආයුධයකින් ගැසීමෙන් හෝ ව්‍යාඝ්‍රාදීන් රැගෙන ගොස් කෑමෙන් හෝ ඇතිවන ඒ වේදනාව අමතක කරදමා මුල් කමටහනම සිහිකරනුයේ රහත්ඵලයම අවබෝධ කරගනියි. මෙය වේදනාවෙන් කලකිරීමට-නිරෝධයට පිළිපන්නාහු නම් වේ. පිතිමල්ල තෙරුන් මෙන්, කුටුම්බිය පුත්‍ර මහා තෙරුන් මෙන්, කැලෑ මාර්ගයෙහි තිසස් පමණ භික්ෂූහු අතරින් එක්තරා ව්‍යාඝ්‍ර මුවෙහි හොත්තා වූ භික්ෂුව මෙන්, කටුවෙන් විදිනු ලැබූ තෙරුන් මෙන්. (වේදනාවම උපකාර කරගෙන රහත් විය යුතු.)

දොළොසක් භික්ෂූහු ගෙඩිය ගසා කැළයෙහි භාවනා කරන්නාහු එක් තෙරනමක් ඉර බැසයද්දීම ගෙඩිය ගසා, සක්මනට බැස සක්මන් කරන සේක්, හරහට තණ ගොමුවක් මඩිනු ලැබූයේ සැඟවුණු කටුවක් ඇමිණුනේය. කටුව යටිපතුලින් නික්මී එය පැලී විනිවිද ගියාක් මෙන් වේදනාව පවතියි. තෙරුන් වහන්සේ මෙසේ සිතූ සේක. "කිම මේ කටුව ගලවා දමමිද? නැතිනම් ස්වභාවයෙන්ම විද සිටි කටුවක්ද?" උන්වහන්සේට මෙසේ සිතුණු සේක. මේ කටුවෙන් විදින ලද බැවින් නිරයාදියෙහි වාසයක් නම් නැත. ස්වභාවයෙන්ම විදගෙන සිටි කටුවක්මය"යි

උන්වහන්සේ ඒ වේදනාව දුරුකර මුළුරැම සක්මන් කර රෑ පහවූ කල්හි වෙනත් භික්ෂුවකට සංඥාවක් දුන් සේක. ඔහු අවුත් "ස්වාමීනි! කිම්ද?"යි ඇසීය. "ඇවැත්නි! මගේ කකුල කටුවකින් විදින ලදී." "කුමන වේලාවකදී විදින ලද්දේද?" "ඇවැත්නි! සවස් යාමයෙහිය." "ස්වාමීනි! කුමක් නිසා අපට කථා නොකළෙහිද? කටුව උදුරා එහි තෙල් ඉසින්නෙමු"යි පැවසූ විට "ඇවැත්නි! ස්වභාවයෙන් විද සිටි කටුව ම උදුරා දැමීමට වෑයම් කළෙමි"යි තෙරහු පැවසූහ. "ස්වාමීනි! උදුරා දැමීමට හැකිවීද?" "ඇවැත්නි! එක් කොටසක් පමණක් උදුරා දමන ලදී" යැයි තෙරහු පැවසූහ. සෙසු කථාවස්තු දිස, මජ්ඣිම අටුවාවන්හි එන සතිපට්ඨාන සූත්‍ර නිර්දේශයේ විස්තර කරන ලද්දේමය.

"**තං කිං මඤ්ඤථ භික්ඛවෙ**" යන්න කුමක් නිසා ඇරඹූ සේක්ද? මේ කොටසෙහි දුක්ඛ ලක්ෂණයම කියන ලදී. අනිත්‍ය ලක්ෂණය දැක්වීමට නොවේ. එය දැක්වීමට මෙසේ මෙය අරඹන ලදී. ත්‍රිවිධ ලක්ෂණ එක්කර දැක්වීමට අරඹන ලද්දේමය. "**අපචිණාති, නො ආචිණාති**" යනු සංසාරික පැවැත්ම විනාශ කරයි. රැස් නොකරත්මය යනුයි. "**පජහති නො උපාදියති**" යනු එයම දුරුකර විසුරුවයි. නොගනියි යනුයි.

"**විසිනෙති නො උසසිනෙති**" යනු විසුරුවයි. බිඳහෙළයි. එක්රැස් නොකරයි යනුයි. (සම්පිණ්ඩනය නොකරයි) "**විධූපෙති නො සන්ධූපෙති**" යනු නිවාදමයි. නොදල්වයි යනුයි. "**එවං පසසං භික්ඛවෙ**" යන්න කුමක් නිසා ඇරඹියේද? සසර පැවැත්ම විනාශකර සිටි රහතන් වහන්සේ දක්වන්නෙමි'යි අරඹන ලදී. මෙපමණ වූ තැන්හි විදර්ශනාව කියන ලදී. දැන් විදර්ශනාව සහිත සිවුමාර්ගය දැක්වීමට මෙසේ අරඹන ලදී. නැතිනම් මෙපමණ වේලාවක් පළමු මාර්ගය විස්තර කරන ලදී. දැන් විදර්ශනාව සමග ත්‍රිවිධ මාර්ගයන් දැක්වීමට මෙය අරඹන ලදී. මේ ස්ථානය දක්වා ත්‍රිවිධ මාර්ගයන් විස්තර කරන ලදී. දැන් විදර්ශනාව සමග අර්හත් මාර්ගය දැක්වීමට මෙය අරඹන ලද්දේමය.

"**සපජාපතිකා**" යනු ප්‍රජාපති දෙවිරජ සමග "**ආරකාව නමසසනති**" යනු දුරදීම නමස්කාර කරති යනුයි. දුරද සිට නමස්කාර කරත්මය. ආයුෂ්මත් නීල තෙරුන්ට මෙනි.

ඒ තෙරුන් වහන්සේ කසල ඉවත්කරන කුලයේ ඉපිද, ඉන් නික්ම පැවිදි වූහ. කෙස් බාද්දීම රහත් වී මෙසේ සිතූහ. "මම අදම පැවිදි

වීමි. අදම මගේ පැවිදි කිස මස්තක ප්‍රාප්ත විය. සිවුපසයෙන්ම සතුටුවෙමින් භාවනාදියෙන් අලංකාර වූ මහා ආර්යවංශික ප්‍රතිපදාව පුරන්නෙමි"යි සිතූ උන්වහන්සේ සැවැත්නුවරට පාංශුකූල වස්ත්‍රයක් සොයමින් වැඩියහ. එවිට එක් මහාබ්‍රහ්මයෙක් සමවතින් නැගිට, මිනිස් ලොව දෙස බලනුයේ තෙරුන් දැක "මොහු අදම පැවිදිවිය. අදම හිසකේ කපද්දීම රහත්බවට පත්ව මහා ආර්යවංශ ප්‍රතිපදාව පිරීමට රෙදිකඩක් සොයන්නේය"යි ඇඳිලිබැඳ වැඳගෙන සිටියේය. ඒ දුටු වෙනත් මහා බ්‍රහ්මයකුද "කාහට වඳින්නෙහිද?"යි ඇසීය. "නීල තෙරුන් වහන්සේට නමස්කාර කරමි." "කුමන කරුණක් නිසා වඳින්නේද?" "එතුමා අදම පැවිදිව අදම කෙස් කපද්දී රහත්ව, මහා අරියවංස ප්‍රතිපදාව පිරීමට රෙදිකඩක් සොයන්නේය." පැවසූවිට ඒ මහාබ්‍රහ්මයාද නමස්කාර කරමින් සිටියේය. තවත් කෙනෙක්, තවත් කෙනෙක් වශයෙන් මෙසේම සත්සීයක් මහා බ්‍රහ්මයෝ ඒ තෙරුන්ට නමස්කාර කරමින් සිටියහ. එනිසා කියන ලදී.

තා දෙවතා සතතසතා උළාරා
බ්‍රහමා විමානා අභිනිකඛමිත්‍වා
ඛීණාසවො ගණහති පංසුකූලං

තා දෙවතා සතත සතා උළාරා
බ්‍රහමා විමා නා අභිනිකඛ මිත්‍වා
නීලං නමසසනති පසනනචිතතා
ඛීණාසවා කයිරති පංසුකූලං

"සත්සියයක් වූ ඒ දෙවියෝ මහත්වූ බ්‍රහ්ම විමානයෙන් නික්ම අවුත් පැහැදුණු සිත් ඇතිව රහතන් වහන්සේ 'පාංශුකූලයක් ගනියි' කියා නීල තෙරුන්ට වඳිති."

"සත්සියයක් වූ ඒ දෙවියෝ මහත්වූ බ්‍රහ්ම විමානයෙන් නික්ම අවුත් පැහැදුණු සිත් ඇතිව 'ක්ෂීණාස්‍රවයන් වහන්සේ පාංශුකූල සිවුරක් කරයි' යනුවෙන් නීල තෙරුන්ට වඳිමින් සිටිති." පංසුකූලය සෝදයි. එහි පඬු පොවයි. එය පොරවයි යනාදී වශයෙන් පවසමින් වඳිමින් සිටිති.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍ර දේශනාව ත්‍රිවිධ භවයන්ගෙන් දුරුකර රහත්බවෙහිම මස්තකය (මුඛ්‍යාර්ථය) ගන්නා ලදී. දේශනාව අවසානයේ පනසීයක් භික්ෂූහු රහත්බැව්හි පිහිටි සේක.

සත්වන සූත්‍රයයි.

21. 3. 8.

අටවන සූත්‍රයේ **"කිසමිඤ්චි දෙව පකරණෙ"** යනු කිසියම් කරුණකින්ය. **"පණාමෙසිා"** යනු බැහැරකර යනුයි. කවර කරුණකින් භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂූහු බැහැර කළ සේක්ද? එක් ඇතුල් වසක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර වස් වැස, පවාරණය කළ සේක් මහත්වූ භික්ෂු සමූහයක් පිරිවරාගෙන සැවතෙත් නික්ම ජනපද චාරිකාවෙහි හැසිරෙමින් කපිලවස්තුවට පැමිණ නිග්‍රෝධාරාමයට වැඩම කළ සේක. ශාක්‍ය රජවරු බුදුරදුන් වැඩම කළබව අසා පසුබත් කළ, කැපවූ තෙල්, මීපැණි, උක්පැණි මෙන්ම නොයෙක් සියගණන් පානවර්ග පිරි කත් ද ගෙන්වාගෙන විහාරයට ගොස් සංඝයාට පවරා දී, බුදුරදුන්ට වැඳ - පිළිසඳර කථා කරමින් එකත්පසෙක සිටියහ. ශාස්තෘන් වහන්සේ ඔවුන්ට මිහිරි ධර්මකථාවක් කරමින් වැඩහුන්හ. එකෙණෙහි ඇතැම් භික්ෂූහු සෙනසුන් පනවති. ඇතැම්හු ඇඳ-පුටු පණවති. සාමණේරවරු බැහැර කරවීම් ආදිය කරති. බඳුන් තබන තැන් පැමිණි භික්ෂූන්ද ඇත. නොපැමිණි භික්ෂූන්ද ඇත. පැමිණි භික්ෂූහු, නොපැමිණි භික්ෂූන්ට ලැබෙන දේද ගනිමින් "අපට දෙන්න" "අපගේ ආචාර්යවරයාට දෙන්න" "අපගේ උපාධ්‍යාය-වරයාට දෙන්න" යනුවෙන් පවසමින් මහාශබ්ද පැවැත්වූහ.

ශාස්තෘන් වහන්සේ මේ ශබ්දය අසා තෙරුන් වහන්සේගෙන් විචාළ සේක. "ආනන්දය! මෙසේ මාළු විකුණන තැනක කෙවුලෝ මෙන් මහාශබ්ද-උස් ශබ්ද කරන්නෝ කවරහුද?" යනුවෙනි. තෙරුන්වහන්සේ මේ බව දනුම් දුන්හ. ශාස්තෘන් වහන්සේ ඒ අසා "ආනන්දය! ආමිස හේතුවෙන් භික්ෂූහු මහා ශබ්ද කරති"යි වදාළහ. "එසේය ස්වාමීනි!" "ආනන්දය මෙය සුදුසු දෙයක් නොවේ. ප්‍රතිරූප වූ දෙයක් නොවේ. මවිසින් කල්ප ලක්ෂයකට අධික වූ සතර අසංඛෙය්‍ය කාලයක් පාරමී සම්පූර්ණ කරන ලද්දේ සිවුරු ආදී ප්‍රත්‍ය පිණිස නොවේ. මෙම භික්ෂූහුද සිවුරු ආදී ප්‍රත්‍ය ලැබීමටම ගිහිගෙයින් නික්ම පැවිදි වූවාහුද නොවෙති. රහත්බව පිණිස පැවිදි වූවාහු අනර්ථය අර්ථය හා සමාන කරති. අසාර වූ දෙය සාරවූවක් හා සමාන කරති. "ආනන්දය! යන්න. ඒ භික්ෂූහු නෙරපන්න."

"පුබ්බණ්හසමයං" යනු දෙවැනි දිනයේ පෙරවරු සමයෙහිය. **"බෙලුවලටඨිකාය මූලෙ"** යනු තරුණ(ලා) බෙලිගස්මුලයි. **"පබාළෙහා"** යනු බැහැරකරන ලදී යනුයි. **"පවාළෙහා"** යන පාඨය ද සුදුසුය. එළවා දැමූ යන අර්ථයි. පදදෙකින්ම බැහැරකරන ලද බව කියැවේ. **"සියා අඤ්ඤථත්තං"** යනු ප්‍රසාදයෙන් අන්‍ය ස්වභාවයකට යෑම හෝ අදහස්වලින්

අන්‍ය තත්වයකට යෑම හෝ වන්නේය යනුයි. කෙසේද? සම්මා සම්බුදු රජාණන් වහන්සේ විසින් අපි සැහැල්ලු කරුණක් නිසා එළවා දමන ලදයි ප්‍රසාදය-ශ්‍රද්ධාව අඩුකර ගැනම, ප්‍රසාදයෙන් අන්‍ය භාවයකට පත්වීම නම් වේ. තම පැවිදි පිරිකර සහිතවම වෙනත් අන්‍යාගමික ආයතනයකට යෑම භාවයෙන් (අදහස් වලින්) අන්‍ය භාවයකට යෑමකි. **"සියා විපරිණාමො"** යනු මෙහිදී - "අපි ශාස්තෘන් වහන්සේගේ අදහස් උකහා ගැනීමට සමත් වන්නෙමු"යි සිතා පැවිදි වූයෙමු. එසේ ගැනීමට අපි අසමත් වෙමු. (බුදුරදුන් හා අනුව පැවතීමට අපට නොහැක.) කුමක් නිසා අපි පැවිදිව සිටිමුද?"යි ශික්ෂා ප්‍රතික්ෂේප කර - ගිහි බවට පත්වීම විපරිණාමයකියි දතයුතුයි.

"වචජසස" යනු කිරිබොන වසුපැටවාටයි. **"අඤ්ඤථත්තං"** යනු මැලවීමෙන් අන්‍ය තත්වයකට පත්වූ යනුයි. කිරිබොන වස්සා මව නොදැකීමෙන්-කිරි නොලැබ මැලවේ. කම්පා වේ. වෙවුලයි. **"විපරිණාමො"** යනු මරණයයි. වසුපැටවා කිරි නොලබා, කිරි පිපාසාවෙන් වියලී වැටී මැරේ. **"බීජානං තරුණානං"** යනු ජලයෙන් අනුග්‍රහ කළයුතු වැපිරූ බීජයන්ටය. **"අඤ්ඤථත්තං"** යනු මැලවෙන ස්වභාවයකට මය. ඒවා ජලය නොලැබ - වියලී වැනසී යයි. පිදුරු බවට පත්වේ. **"අගගනුහිතො"** යනු ආමිෂ අනුග්‍රහයෙන් මෙන්ම ධර්මානුග්‍රහයෙන්ද අනුග්‍රහ කරන ලද්දේ යනුයි. **"අනුගගණ්හෙය්‍ය"** යනු මේ දෙයාකාර වූම අනුග්‍රහයන්ගෙන් අනුග්‍රහ කරන ලද්දේ යනුයි. **"අචිර පබබජිතා"** යනු සාමණේරවරු හා ළදරු භික්ෂූහුය. සිවුරු ආදී ප්‍රත්‍ය විකලත්වය (අඩුපාඩු) ඇතිවිට හෝ ගිලන් වූ විට හෝ ශාස්තෘන් වහන්සේ හෝ ආචාර්ය-උපාධ්‍යායවරු ආමිෂ අනුග්‍රහයෙන් අනුග්‍රහ නොකරන ලද විට ක්ලාන්ත වූවාහු සජ්ඣායනා කිරීමට හෝ මෙනෙහි කිරීමට අසමත් වෙති. ධර්මානුග්‍රහයෙන් අනුග්‍රහ නොලැබුවාහු උදෙසීමෙන් මෙන්ම අවවාද-අනුශාසනාවන්ගෙන් ද පිරිහුනාහු අකුසල් දුරලා කුසල් වැඩීමට අසමත් වෙති. මේ දෙවිධ අනුග්‍රහයන්ගෙන් අනුග්‍රහ ලැබූ සාමණේරවරු ක්ලාන්ත නොවී සජ්ඣායනා කළ දේ සිතෙහි තබාගෙන තත්වූ පරිදි පිළිපදිනු ලබන්නාහු, මෑත කාලයෙහි එම අනුග්‍රහයන් නැතුව ගියත් - මුලදී ලබන ලද ශක්ති ඇති බැවින් සසුනේ නොපිරිහී පිහිටා සිටිති. එනිසා භාග්‍යවතුන් වහන්සේට මෙබඳු සිතුවිල්ලක් පහළවිය.

"භගවතො පුරතො පාතුරහොසි" යනු ශාස්තෘන් වහන්සේගේ සිත දැන මේ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ විසින් බැහැර කරන ලදී. දැන් ඔවුන්ට අනුග්‍රහ කරනු කැමතිව මෙසේ සිතූ සේක. භාග්‍යවතුන් වහන්සේ

මෙකරුණ සිතූ සේක. "මම මේ සඳහා උත්සාහ උපදවමි"යි මහා බ්‍රහ්මයා උන්වහන්සේ ඉදිරියෙහි පහළවිය. "**සනෙතසට භිකඛූ**"යනු මේ ඒ මහා බ්‍රහ්මයා යම්සේ ව්‍යක්ත-දක්ෂ අරක්කැමියා ඇඹුල් ආදී රස රජුට රුචිවේ යැයි එය මනාව පිළියෙල කර, දෙවැනි දිනයෙහි රජුට පිරිනමන්නේද මේ අයුරින්ම තමාගේ දක්ෂතාවයෙන් භාග්‍යවතුන් වහන්සේට උපමාවක් දක්වන ලදී. "**එවමෙතං භගවා**" යන වචනවලින් පිළිතුර පිළියෙල කර - භාග්‍යවතුන් වහන්සේට යාඥා කරනුයේ භික්ෂු සංඝයාට අනුග්‍රහ කරන ලෙස පවසයි. එහි "**අභිනන්දතු**" යනු මගේ සමීපයට භික්ෂු සංඝයා පැමිණේවා!යි මෙසේ උන්වහන්සේලාගේ පැමිණීම ප්‍රියකරනු ලබන්නේ සතුටු වේවා!" යනුයි. "අභිවදතු" යනු පැමිණියා වූ භික්ෂූන්ට අවවාද අනුශාසනා දේශනා කරත්වා යනුයි.

"**පටිසල්ලානා**" යනු එකඟභාවයෙනි. "**ඉදධාභිසංඛාරං අභිසංඛාසි**" යනු ඍද්ධියක් කළ සේක යනුයි. "**එකදවීහිකායා**" තනි තනි වී, දෙදෙනා බැගින් වී යනුයි. "**සාරජජමානරූපා**" පවට බියවන ස්වභාව ඇතිව භයවෙමින් යනුයි.

කුමක් නිසා භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට මෙසේ පැමිණීමට ඍද්ධියක් පහළ කල සේක්ද? යහපත ප්‍රාර්ථනා කරමිනි. "ඉදින් ඔවුහු සමූහ-සමූහව පැමිණියේ නම් භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා හැරදමා කැළයට ගොස්, එහි එක දවසක්වත් විසීමට නොහැකිව වහා මෙහි පැමිණියේ යැයි කෙළිකවටකම් කරන්නෝය. ඔවුන්ට බුද්ධ ගෞරවයක් නම් ඇති නොවන්නාහුමය. ධර්මදේශනාව පිළිගැනීමට සමර්ථ නොවන්නාහුමය. භය සහිතව සැක සහිතව තනිව හෝ දෙදෙනා බැගින් පැමිණෙන්නවුන්ගේ බුද්ධ ගෞරවයද එළඹ සිටියේ වන්නේය. ධර්මදේශනාවද පිළිගැනීමට හැකිවන්නෝයැ"යි සිතා ඔවුන්ගේම යහපත පිණිස මෙබඳු ප්‍රාතිහාර්යයක් කළ සේක.

"**නිසීදිංසූ**" යනු ඔවුන් අතර සැකබිය සහිතව පැමිණෙන්නා වූ එක් භික්ෂුවක් බුදුහු "මා දෙසම බලා සිටිති. මා ගැනම සිතමින් නිග්‍රහ කරනු කැමතිව සිටියැ"යි ඉක්මණින් නොගොස් වැඳ එකත්පසෙක වැඩසිටියේය. අනතුරු සෙසු පන්සියයක් භික්ෂූහු ද එසේම සිතමින් අවුත් නිශ්ශබ්දවම වැඩසිටියහ. මෙසේ හුන්නා වූ භික්ෂු සංඝයා සීදන්තරයෙහි හුන්නා වූ මහා සමුද්‍රය මෙන්ද සුලං නැති තැන ඇති පහනක් මෙන්ද නිශ්චලව සිටිනු දැක ශාස්තෘන් වහන්සේ මෙසේ සිතූ සේක. "මේ භික්ෂූන්ට කවරාකාර ධර්මදේශනාවක් සුදුසුද?" එවිට උන්වහන්සේට මෙසේ සිත්විය. "මොවුහු

ආහාර හේතුවෙන් එළවා දමූ නිසා පිණ්ඩපාතය පිළිබඳ ධර්ම දේශනාවක්ම මොවුන්ට ගැලපේ. එය දක්වා පසුව දේශනාව අවසන්හි තිපරිවට්ට දේශනාව දක්වන්නෙමි. දෙසුම අවසන්හි සියල්ලෝම රහත් බවට පත්වන්නෝය."යි යනුවෙනි. ඉක්බිති එම භික්ෂූන්ට ධර්මදේශනා කරන සේක් "අනතමිදං භික්ඛවෙ" (මහණෙනි! මේ ජීවිකා අතුරින්....) යනුවෙන් දේශනා කළහ.

එහි "අනතං" යනු අන්තිම, ලාමක වූ යනුයි. "යදිදං පිණ්ඩාලාඃං" යනු මෙසේ පිඬු සෙවීමෙන් ජීවිකාව ගෙනයන්නාගේ ජීවිතයයි. මෙය වනාහී මේ පදයේ අර්ථයයි. පිඬු පිණිස හැසිරේ යනු "පිණ්ඩෝල" නම් වේ. පිණ්ඩෝල කර්මය-ක්‍රියාව නම් "පිණ්ඩාලාඃං" පිඬු සෙවීමෙන් පෝෂණය වන ජීවිතය යන අර්ථයයි. **"අභිසපො"** යනු ආක්‍රෝශයයි. අක්‍රෝශ පරිභව කරනු කැමති මිනිස්සු "තමාගේ විරුද්ධකාරයෝ සිවුරක් පොරවාගෙන කබලක් අතින් ගෙන පිඬු සොයමින් හැසිරෙන්නේ"යැයි ආක්‍රෝශ කරති. නැතිනම් "නුඹලාට කිම නොකටයුත්තක් ඇද්ද? නුඹලා මෙසේ බල-වීර්ය සහිතව හිඳගෙනත් ලැජ්ජා බිය අත්හැර දිළින්දන් මෙන් අතින් පාත්‍රයක් ගෙන පිඬු පිණිස හැසිරෙන්නහුද?"යි ආක්‍රෝශ කරත්මය. **"නක්ඛව බොා එතං"** යනු මෙසේ ඒ ශාප කිරීමට සමාන වූ "පිණ්ඩපාතයේ හැසිරීම"යි. **"කුලපුතතා උපෙනති අත්ථවසිකා"** යනු මගේ සසුනේ ජාති කුලපුත්‍රයෝ ද ආචාර කුලපුත්‍රයෝ ද අර්ථය-ප්‍රයෝජනය සොයන්නෝ ම වී හේතු නිසාම පිඬු පිණිස හැසිරීමට පැමිණෙති යනුයි. **"රාජාභිනීතා"** යනාදියෙහි, යමෙක් රජුගේ සමීපයේ කා, රජු බන්ධනාගාරයෙහි දමූවිට ඉන් පලාගොස් පැවිදි වන්නෝද ඔවුහු "රාජාභිනීත" නම් වෙති. ඔවුහු රජු විසින් බන්ධනයෙන් ඉදිරියට පමුණුවන ලද බැවින් "රාජාභිතිතා" නම් වෙති. යම් සොර කැලක් කැලයට ගොස් එක එකා මරන කල්හි ඇතැම්හු "ස්වාමීනි! අපි නුඹලාට අපගේ ගෙවල් දොරවල් පවරා දී පැවිදි වන්නෙමු. එසේ සිටිමින් අපි මල් ආදිය පූජා කරමින් නුඹලාට පින් අනුමෝදන් කරන්නෙමු"යි සොරු විසින් අත්හරින ලදුව පැවිදිවෙති. ඔවුහු "චොරාභිනීතා" නම් වේ. ඒ සොරුන් විසින් මැරිය යුතු බවට පමුණුවන ලද්දාහු චොරාභිනීත නම් වේ. යමෙක් ණය ගෙන එය නැවත ගෙවීමට අසමත්ව පලාගොස් පැවිදිවෙති. ඔවුහු **"ඉණටො"** නම් වෙති. 'ණයෙන් පෙළුණු' යන අර්ථයි. "ඉණටයා" යන පාඨයද සුදුසුය. 'ණයෙහි සිටි' යන තේරුමයි. ඇතමෙක් රජ-සොර-දුර්භික්ෂ-රෝග-ණය ආදී භයකින් පෙලුණු ලැබුවාහු පැවිදි වෙති. ඔවුහු **"භයටො"** නම් වෙති. "භයෙන් පෙළුණු" යන යන අර්ථයයි. "භයටයා"

යන පාඨයද යෙදේ. භයෙහි සිටි යන අර්ථයයි. "**ආජීවිකා පකතා**" යනු දිවිපැවැත්මෙන් උපදව කරන ලද්දාහු, ඉන් පෙළුණාහු, අඹුදරුවන් පෝෂණය කිරීමට නොහැකිවන්නාහු යන අර්ථයි. "**ඔතිණණමහා**" යනු ඇතුලට පිවිසියාහු යනුයි. "**සොච හොති අභිජඣාලූ**" යනු මෙය ඒ කුලපුත්‍රයා දුක් කෙළවර කරන්නෙමි"යි ආදී වශයෙන් සිත් උපදවා පැවිදි වූවාහු, මෑත කාලයේ දී ඒ පැවිද්ද ඒ කියූ ආකාරයෙන් ඉටුකිරීමට අසමත් වෙති. එය දැක්වීමට මෙය දෙසූහ. එහි "අභිජඣාලූ" යනු අනුන්ගේ සම්පත් කෙරෙහි තණ්හා බහුල වීමයි. "**තිබබසාරාගො**" යනු බහුල රාග ඇති බවයි. "**බ්‍යාපනන චිතතො**" යනු කුණු වූ බැවින් විපතට පත් සිත් ඇති යනුයි. "**පදුටඨමනසංකපෙපා**" යනු තියුණු අං ඇති ගොනෙකු මෙන් දුෂ්ට සිත් ඇත්තාහු යනුයි. "මුටඨසසති" බත් දමනු ලැබූ කපුටකු මෙන් නැසෙන්නේය. මෙහි කෙසේ නම් නැසේද? "**අසමපජානො**" යනු ප්‍රඥාවක් නොමැතිකමිනි. ස්කන්ධාදී වෙන් වෙන් කිරීම් රහිතවයි. "අසමාහිතො" යනු සැඩ දියපහරක බඳින ලද නැව මෙන් උපචාර-අර්පණා භාවයෙන් නොපිහිටි. ස්ථිර නොවූ යනුයි. "**විබහනත චිතතො**" යනු බැමිමෙන් බැඳුණු මෘගයෙක් මෙන් භ්‍රාන්ත වූ සිත් ඇතිවය. "**පාක තින්ද්‍රියො**" යනු යම්සේ ගිහියන්ට දූපුතුන් බැලීමේදී ඇතිවන සංවර නොවූ ඉඳුරන් ඇති බව මෙන් අසංවර වූ ඉඳුරන් ඇත්තේ යනුයි. "ඡවාලාතං" යනු මළමිනී දවපු ස්ථානයේ ඇති ගිනිපෙනෙල්ලකි. "උභතො පදිතතං මජෙඣ ගූථගතං" යනු ඇඟිල්ලක් පමණ මුලින් හා අගින් දැවුණු, මැද අශුචි ගැවසුණු යනුයි. "නෙවගාමෙ" ඉදින් ඒ වියදඬු-නඟුල්-ගොණුසි-පඤ්ච පස ඇට ආදිය සෑදීම සඳහා භාවිතයට ගතහැකියි. "කටඨතථං එරෙය්‍ය" ඉදින් කෙත් කුටියක (කුඹුරේ පාලක) මැසි-ඇඳ ආදිය සාදාගැනීම සඳහා භාවිතයට ගතහැකිය. "අරඤ්ඤෙ" කැළයෙහි දර-මැසි සඳහා ගත්තේය. යම්හෙයකින් මේ දෙතැනදීම (ගමේ-කැළයේ) මෙසේ භාවිතයට නොගත හැකිය යන අර්ථයයි. "**ගිහිභොගා ච පරිහීනො**" යනු යමෙක් ගිහිගේ වසමින් ගිහියන්ගේ පරිත්‍යාගාදියට බඳුන් වී දායාද බෙදනවිට භාගයක් භාගයක් ලැබිය යුතු වන්නේ ද ඉන් ද පිරිහුණේ යනුයි. "**සාමඤ්ඤඤ්ච**" යනු ආචාර්ය උපාධ්‍යායවරුන්ගේ අවවාදයේ සිට පර්යාප්ති-ප්‍රතිවේද වශයෙන් පැමිණිය යුතු ශ්‍රමණ බවේ ඵලයකුත් නොලබයි. මේ උපමාව බුදුපියාණන් වහන්සේ දුශ්ශීලයාගේ වශයෙන් නොදැක්වූහ. පිරිසිදු සිල් ඇති අලසයාගේ දැඩිලෝභාදී දෝෂයන්ගෙන් පලුදු වූ පුද්ගලයාට ම මේ උපමාව ගෙනහැර දැක්වූහ.

"**තයො මෙ භිකඛවෙ**" යන්න කුමක් නිසා ඇරඹූසේක් ද? මේ

පුද්ගලයාගේ සොහොන් දරකඩක් හා සමානබව - ඔහුගේ මවුපියන් විසින් නොකළ දෙයකි. ආචාර්ය-උපාධ්‍යායවරු විසින් නොකළ දෙයකි. ඔහුගේ ම පාපී විතර්ක සිතුවිලිවලින් ම කරන ලද්දකැයි දක්වීමට මෙය ආරම්භ කරන ලදහ. "අනිමිත්ත චා සමාධිං" යනු විදර්ශනා සමාධියයි. එය නිතර නිමිති ආදිය වනසා දමන හෙයින් 'අනිමිත්ත' යැයි කියයි. මෙහිද සතර සතිපට්ඨානයෝ මිශ්‍රවී අනිමිත්ත සමාධිය පූර්වභාග වේ. අනිමිත්ත සමාධිය හෝ මිශ්‍ර වූ සතිපට්ඨානය හෝ පූර්වභාග වේයැයි දතයුතුයි.

"දෙව මා භික්ඛවෙ" මෙය හුදෙක් අනිමිත්ත සමාධි භාවනාවයි. මේ ත්‍රිවිධ මහාවිතර්කයන් ම ප්‍රහාණය කිරීම පිණිස මෙය පවතියි. ශාශ්වත හා උච්ඡේද දෘෂ්ටිද සහමුලින් නසාදමන්නේ යැයි දක්වීමට කියන ලදී. "න වජ්ජවා අසසං" යනු නිර්දෝෂයෙක් වන්නේය යනුයි. ඉතිරි පද අර්ථ ප්‍රකටම ය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍ර දේශනාව ත්‍රිවිධ භවයන්හි පෙරලා දමා "රහත්බව"ම ප්‍රධානත්වයට පත්කළ සේක. දේශනාව අවසානයේ පන්සියයක් භික්ෂූහු සිවුපිළිසිඹියා පත් රහත් තත්ත්වයට පත්වූහ.

අටවන සූත්‍රය

21. 3. 9.

නවවන සූත්‍රයේ "චාරිකං පකකාමි" යනු කෝසම්බිය නුවර භික්ෂූන්ගේ කලහ කාලයේ දී එක්දිනක් බුදුරජාණන් වහන්සේ දීඝිති කෝසල රජුගේ කථාවස්තුව ගෙනහැර දක්වා - "**නහි වෙරෙන වෙරානි සම්මන්තීධ කුදාචනංa**" යන ගාථාවෙන් අවවාද දුන් සේක. එදින රාත්‍රිය ගෙවුණු කල්හි දෙවන දවසෙහිද එම කලහකාරීන්ටම බුදුපියාණෝ එම කථාවම ගෙනහැර දක්වූහ. එදවසද ඔවුන්ට කලහ කිරීමෙන්ම රාත්‍රිය ගතවිය. තෙවැනි දිනයේදී බුදුහු මේ කථාවම දේශනා කළහ. එවිට එක්තරා භික්ෂුවක් මෙසේ කීවේය. "ස්වාමීනි! භාග්‍යවතුන් වහන්සේ අල්ප උත්සාහ ඇතිවන සේක්වා. දිට්ඨධම්මසුඛ විහාරයේ යෙදී වැඩවාසය කරන සේක්වා. අපි

a. යමක වග්ග

මෙසේ කලහ කිරීමෙන්, කෝලාහල කිරීමෙන්. විග්‍රහ කිරීමෙන්, විවාද කිරීමෙන් ප්‍රකට වන්නෙමු"යි යනුවෙනි. ශාස්තෘන් වහන්සේ "හාත්පසින් රූප චිත්තයෙන් මඬනා ලද මේ හිස් පුරුෂයෝ, සන්සිඳවීමට, සමාදාන කිරීමට නොහැක. මා දැන් කුමක් කරමිද? හුදකලාව වාසය කරමි"යි සිතා උදෑසනම සිරුර පිළිදගුම්කොට, කොසඹෑවෙහි පිඬුපිණිස හැසිර, කිසිවෙකුට නොදන්වා තනිව හුදකලාවම චාරිකාවෙහි පිටත්වූ සේක.

"යසමිං ආවුසො සමයෙ" යනු මේ තෙරුන්වහන්සේට යම්හෙයකින් අද භාග්‍යවතුන් වහන්සේ එක් භික්ෂුවක් සමග වඩිනසේක. අද දෙදෙනෙකු සමග, අද සියයක් සමග, අද දහසක් සමග, හුදකලාවම වඩින සේකැ"යි සියලුම භාග්‍යවතුන් වහන්සේගේ හැසිරීම් දන්නා ලදී. ඉතා ප්‍රකටය. ඉතා ප්‍රත්‍යක්ෂය. එනිසා මෙසේ වදාළහ.

"අනුපුබෙබන" යනු ගම් නියම්ගම් පිළිවෙලින් පිඬු පිණිස වඩින සේක් හුදකලාවම වසන භික්ෂුවක් දකිනු කැමති වී බාලකලෝණකාර ග්‍රාමයට වැඩි සේක. එහි භගු තෙරුන් වහන්සේගේ සියලු පසුබත් කාලයේද තුන්යම් රාත්‍රියේද හුදකලා වාසයේ අනුසස් දේශනා කළසේක්, දෙවැනි දිනයේ ඔහු පසුපස කොටගෙන පිඬු පිණිස හැසිර, උන්වහන්සේ එහිම නවත්වා, 'සමගිව වෙසෙන කුලපුතුන් තිදෙනා දකින්නෙමි"යි ප්‍රාචීන වංස මිගදායට වැඩිසේක. ඔවුන්ට ද මුළු පසුබත් කාලයේත් තුන්යම් රාත්‍රිය මුළුල්ලේත් හුදකලා වාසයේ අනුසස් දේශනා කළසේක. ඔවුහු එහිම නැවැත්වූ උන්වහන්සේ තනිවම පාරිලෙය්‍ය නගරයට අභිමුඛව වැඩ අනුපිළිවෙලින් පාරිලෙය්‍ය නුවරට පැමිණි සේක. එනිසා කියන ලදී. - "**අනුපුබෙබන චාරිකං චරමානො යෙන පාරිලෙය්‍යනගරං තදවසරි**"යැයි කියන ලදී.

"**භද්දසාලමූලෙ**" යනු පාරිලෙය්‍ය වැසියෝ භාග්‍යවතුන් වහන්සේට දන් දුන්හ. පාරිලෙය්‍ය නුවරට නුදුරෙහි 'රක්ෂිත' නම් වන ලැහැබක් ඇත. එහි භාග්‍යවතුන් වහන්සේට පන්සලක් කරවා දී, 'එහි වසනු මැනව'යි ප්‍රතිඥා දී වාසය කරවූහ. එහි භද්‍රසාල යන නම ඇති ප්‍රියජනක-සිත්කලු සල්රුකක් ඇත. භාග්‍යවතුන් වහන්සේ ඒ නගර ඇසුරු කරගෙන ඒ වන ලැහැබෙහි පන්සල සමීපයේ එම රුක්මුලෙහි වැඩවාසය කරන සේක. එනිසා 'භද්දසාලෙ මූලෙ' යනුවෙන් කියන ලදී.

මෙසේ තථාගතයන් වහන්සේ වැඩවෙසෙන කල්හි එක්තරා ඇත්නායකයෙක්, ඇතින්නියන්-ඇත් පැටවුන් විසින් ගොදුරු බිමේදී, නානතොටේදී කරදරයට පැමිණියේ; රැළ කෙරෙහි කළකිරී "මට මේ ඇතුන්ගෙන් කවර වැඩක්ද?"යි රැළ අත්හැර මිනිස් පථයට යනුයේ පාරිලෙය්‍ය වනලැහැබෙහි වැඩහුන් බුදුපියාණන් වහන්සේ දැක කළඳකින් නිවන ලද සන්තාපයක් (තැවීමක්) මෙන් නිවුණු සිතැතිව තථාගතයන් සමීපයේ සිටියේය. ඒ ඇතා එතැන් පටන් ශාස්තෘන් වහන්සේට වත්පිළිවෙත් කරමින් මුවදෝනා පැන් සපයයි. නෑමට දිය ගෙනවුත් දෙයි. දත්මදින උපකරණ ගෙනවිත් දෙයි. පිරිවෙණ අමදියි. කැළයෙන් මිහිරි ඵලවැල ගෙනවුත් උන්වහන්සේට දෙයි. බුදුහු ඒවා පරිභෝග කරති.

එක් දිනක් බුදුපියාණන් වහන්සේ මුලු රෑම සක්මන් කර, ගල්තලාවෙහි වැඩහුන්හ. ඇතා ද නුදුරු තැනක සිටියේය. ශාස්තෘන් වහන්සේ පසුපස බලා කිසිවකු නුදුටු සේක. එසේම ඉදිරියෙහිද කිසිවකු නුදුටු සේක. දෙපැත්තෙහිද කිසිවකු නුදුටු සේක. එවිට උන්වහන්සේට "මම ඒකාන්තයෙන් සුවසේ වෙසෙමි. මෙහි කලහ කරන්නෝ නොමැත. එබැවින් සුවසේ වෙසෙමි"යි සිතක් පහළවූ සේක. ඇතාටද "මිනිසින් නැමූ අත්ත අනිකකු නොකයි" ආදි වශයෙන් "මම ද හුදකලාව සැපසේ වසමි. ශාස්තෘන් වහන්සේට වත්පිළිවෙත් කිරීමට ඉඩ ලද්දෙමි"යි යන සිත පහළවිය. බුදුහු තමන්වහන්සේ සිත බලා "මට මෙබඳු සිතක් පහළවිය. ඇතුට කවර සිතක් වේද?"යි විමසා දැන ඔහුගේ සිතද එබඳුම බව දැන "අප දෙදෙන සම සිත් ඇත්තෝය"යි මේ ප්‍රීති වාක්‍යය පහළ කල සේක.

"මේ නගුලිස වැනි දික් දත් ඇති හස්ති නාගයා සමග හුදකලාව වනයේ ඇලී වෙසෙන බුද්ධනාගයන් වහන්සේගේ සිතින් සිත සමාන වේ."

"අථ ඛො සමබහුලා භික්ඛූ" යනු ඉක්බිති මෙසේ තථාගතයන් වහන්සේ එහි වැඩවසන කල්හි පිටිසර වස් විසූ පන්සීයක් භික්ෂූහු "යෙනායස්මා ආනන්දො" ශාස්තෘන් වහන්සේ භික්ෂු සංඝයා බැහැර කර, කැළයට පිවිසි බැවින් තමාගේ ස්වභාවයෙන් බුදුරදුන් සමීපයට යෑමට අසමත් වූ තෙරවරු ආනන්ද තෙරුන් වහන්සේ වැඩසිටින තැනට පැමිණියහ.

"අනනතරා ආසවානං ඛයො" යනු මාර්ගයන්ගෙන් අනතුරුව ලබන අර්හත් ඵලයයි. "විචයසො" යනු පරීක්ෂාවෙන්ය. ඒ ඒ ධර්මයන්ගේ ස්වභාවය විමසීමට සමත් වූ ඤාණයෙන් පිරිසිඳ දැන යන අර්ථයයි. "ධම්මො" යනු ශාසන ධර්මයයි. "චතතාරො සතිපටඨානා" මුලින් යම් යම් දහම් කොටස් වෙන් වෙන් කොට ධර්මය දෙසන ලද ද එය ප්‍රකාශ කිරීම සඳහා කියන ලදී.

"සමනුපසසනා" යනු දෘෂ්ටි සමනුපස්සනාවයි. "සංඛාරොසො" යනු ඒ දෘෂ්ටි සංස්කාරයයි. "තනොජො සො සංඛාරො" යනු ඒ තණ්හාවෙන් ඒ සංස්කාරය ඉපදුණි යනුයි. තණ්හාව මනාව යෙදුණු සිත්වලින් ද ඒ සිවු සිත්වල එය උපදියි. "සාපිතණ්හා" යනු ඒ දෘෂ්ටි සංස්කාරයට ප්‍රත්‍යය වූ තෘෂ්ණාවයි. "සාපිවෙදනා" යන ඒ තණ්හාවට ප්‍රත්‍ය වූ වේදනාව. "සොපි එසෙසා" යනු ඒ වේදනාවෙන් ප්‍රත්‍ය වූ අවිද්‍යා ස්පර්ශයයි. "සාපි අවිජජා" ඒ ස්පර්ශය හා මනාව යෙදුණු අවිද්‍යාවයි.

"නො චසසං නො ච මෙ සියා" යන ඉදින් මම නොවන්නේ නම් මගේ පරිෂ්කාරාදිය ද නොවන්නේය යනුයි. "**න භවිසසාමි න මෙ භවිසසති**" යනු ඉදින් මම අනාගතයේද නොවන්නෙම් නම් එලෙසින්ම මගේ පිරිකරද අනාගතයේ නොවන්නේ ය යනුයි. මෙපමණ තැන්හිදී භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂූන් විසින් ගත් ගත් දෘෂ්ටි පුද්ගල අදහස් වශයෙන් ද දේශනා විලාශයෙන් ද විහිදුවමින් විසඳමින් පැමිණි සේක.

"තනොජො සො සංඛාරො" යනු තණ්හාව සම්ප්‍රයුක්ත වූ සිතෙහි සැකය ම නැත. කෙසේ නම් විචිකිච්ඡා සංස්කාරය තණ්හාවෙන් උපදී ද? ප්‍රහීන නොවන බැවිනි. තණ්හාවෙන් ප්‍රහීන නොවන බැවින් එය උපදියි. ඒ සඳහා කියන ලදී. දෘෂ්ටියෙහි ද මේ ක්‍රමය ම ලැබෙන්නේ ය. සතර චිත්තුප්පාදයන්හි සම්ප්‍රයුක්ත දෘෂ්ටියක් නම් නැත. යම්හෙයකින් තණ්හාවෙන් ප්‍රහීන නොවූ බැවින් එය උපදියි. එහෙයින් ඒ සඳහා මෙහිද මේ අර්ථය යෙදේ. මෙසේ මේ සූත්‍රයෙහි විසිතුන් තැනක රහත් බවට පැමිණ විදර්ශනාව කියන ලදී.

නවවන සූත්‍රය

21. 3. 10.

දසවන සූත්‍රයේ "තදහුපොසථෙ" යන්න මුල් පවාරණ සූත්‍රයෙහි විස්තර කරන ලද්දේම ය. "තදහුපොසථෙ" යන්න මුල් පවාරණ සූත්‍රයෙහි විස්තර කරන ලද්දේම ය. "**කිඤ්චිදෙව දෙසං**" කිසියම් කරුණක්ය. "**සකෙ ආසනෙ නිසීදිත්වා පුචඡ යදාකංඛසී**" කුමක් නිසා මෙසේ කිසේක්ද? ඒ භික්ෂූවට පන්සීයක් භික්ෂූහු පිරිවර වෙති. ගුරුවරයා සිටගෙන විචාරන කල්හි ඉදින් ඒ භික්ෂූහු වාඩිවී සිටිත් නම් ශාස්තෘන් වහන්සේට ගෞරව කළෝ වෙත්. ගුරුවරයාට, අගෞරව කළෝ වෙත්. ඉදින් සෙසු භික්ෂූහු නැගී සිටියේ නම් ගුරුවරයාට ගෞරව කළෝ වෙත්. ශාස්තෘන් වහන්සේට අගෞරව කළහු වෙත්. මෙසේ වීනම් ඒ භික්ෂූන්ගේ සිත නොයෙක් අතට යන්නේය. දේශනාව පිළිගැනීමට නොහැකි වන්නෝය. එහි හිඳ ප්‍රශ්නය විචාළ විට ඔවුන්ගේ සිත් එකඟ වේ. දේශනාව මැනවින් පිළිගැනීමට හැකිවන්නේ යැයි දැන බුදුහු මෙසේ වදාළහ. "**ඉමෙ නු ඛො භනෙත**" මේ තෙරුන් වහන්සේ පන්සීයක් භික්ෂූන්ගේ ගුරුවරයා ලෙස සිටිමින් පංචස්කන්ධය පමණවත් නොදන්නේ යැයි නොකිව යුතුයි. ප්‍රශ්න විචාරන්නහු විසින් මේ පංච උපාදානා ස්කන්ධයෝ 'අනිකක් නොවේ'යැයි මෙසේ දැනගෙනම විචාරීමට සුදුසු නොවේ. එනිසා නොදන්නකු මෙන් විචාරයි. උන්වහන්සේගේ අන්තේවාසිකයෝ - "අපගේ ගුරුවරයා 'මම දන්නෙමි'යි නොපවසයි. සර්වඥ ඥානය සමග ගලපමින්ම ප්‍රශ්න විචාරන්නේ"යැයි ඇසිය යුතු-ඇදහිය යුතු දෙයක් කර සිතන්නාහුයැ"යි නොදන්නකු මෙන් විචාරයි.

"**ඡන්දමූලතා**" යනු තණ්හා-ඡන්ද මූලික වූ යනුයි. "**න ඛො භික්ඛු! තඤ්ඤෙව උපාදානං තෙ පඤ්චුපාදානක්ඛන්ධා**" යනු යම් හෙයකින් ඡන්දරාගය පමණ වූ පංචස්කන්ධය නොවේ. එනිසා මෙය කියන ලදී. යම් හෙයකින් සහජාත ප්‍රත්‍යයෙන් හෝ ආරම්මණයෙන් හෝ ස්කන්ධයන්ගෙන් මිදී උපාදානයක් නැත. "**තසමා නපි අඤ්ඤත්‍ර පඤ්චහි උපාදානක්ඛන්ධෙහි උපාදානං**" යනුවෙන් කියන ලදී. තණ්හා සම්ප්‍රයුක්ත වූ සිත පවතින කල්හි ඒ සිත හටගන්නා රූපය, රූපස්කන්ධයයි. තණ්හාව අත්හැර සෙසු අරූප ධර්ම සතර ස්කන්ධ යැයි සහජාත වුවත් ස්කන්ධයන් හැර උපාදානයක් නම් නැත. උපාදානයේ වනාහී රූපාදියෙහි එක්තරා අරමුණක් කොට උපදින්නා වූ අරමුණින් ද පංචස්කන්ධය අත්හැර උපාදානයක් නම් නැත. "**ඡන්දරාග වෙමතතතා**" යනු ඡන්දරාගයේ නානා ස්වභාවයයි. "**එවං**

ඛො භික්ඛූ" යනු මෙසේ රූපාරම්මණ වූත් ඡන්දරාගයේ වේදනාදී අන්‍ය වූ අරමුණක් නොකිරීමෙන් ඡන්දරාගයේ විවිධත්වය වන්නේය යනුයි. "ඛන්ධා ධිවචනං" යනු මේ ස්කන්ධයන්ගේ ප්‍රඥප්තියයි. (පැනවීමයි) මේ අනුසන්ධිය නොගැටේ. නොගැටුනත් ප්‍රශ්නය අනුසන්ධි සහිතමය. විසඳුමද අනුසන්ධි හෙවත් ගැලපීම් සහිතමය. මේ තෙරුන් වහන්සේ වනාහී ඒ ඒ භික්ෂූන්ගේ අදහස් අනුව විමසයි. ශාස්තෘන් වහන්සේද ඔවුන්ගේ අදහස් අනුවම එම ප්‍රශ්න විසඳන සේක. සෙසු පද විස්තර සැමතැන්හි ප්‍රකටමය.

දසවන සූත්‍රයයි.

මේ වර්ගයේ එක් එක් සූත්‍රාවසානයේදී පන්සීය බැගින් භික්ෂූහු රහත් බවට පත්වූහ.

තෙවැනි බජ්ජනීය වර්ගයයි.

21. 4. 1.

ථෙර වර්ගයේ පළමු සූත්‍රයේ "මනතාණි පුතෙතා" යනු මන්තාණි නම් බැමිණියගේ පුත්‍රයාය. "උපාදාය" යනු පැමිණ, අරබයා, සඳහා, නිසා යනුයි. "අසමීති හොති" යනු "මම වෙමි"යි මෙසේ පවතින තණ්හා-මාන-දෘෂ්ටි ප්‍රපංචත්‍රය වේ. "දහරො" යනු තරුණ වූ යනුයි. "යුවා" යනු යෞවන බවින් යුක්ත වූ යනුයි. "මණ්ඩනක ජාතියො" යනු සැරසෙන ස්වභාවයයි. සැරසීම් ස්වභාවයයි. "මුඛ නිමිත්තං" මුවෙහි පිළිබිඹුවයි. එය වනාහී පිරිසිදු වූ කැටපත් මණ්ඩලයක් මෙන් ප්‍රකට වේ. කිම එය බලන කල්හි සිය මුහුණ පෙනේද? නැතිනම් වෙනත් අයෙකුගේ මුහුණක් පෙනේද? ඉදින් සිය මුහුණ නම් ඉවතට හැරවී පෙනෙන්නේය. ඉක්බිති අනිකකුගේ වේනම් වර්ණාදියෙන් අසමාන වී පෙනෙන්නේය. එනිසා කැඩපතින් පෙනෙන රූව තමාගේද නොවේ. අනුන්ගේද නොවේ. කැඩපත නිසා සමාන වූම රූපයක් පෙනෙන්නේයැයි කියති. ඉක්බිති යමක් දියෙහි පෙනෙනුයේද ඒ කිනම් කරුණක් නිසාද? මහාභූතයන්ගේ ඉතා පිරිසිදු බව නිසයි. "ධම්මො මෙ අභිසමෙතා" මවිසින් ඤාණයෙන් චතුරාර්ය සත්‍ය ධර්මයන් අවබෝධ කරගෙන "සෝවාන් වූයෙමි"යි කියයි.

පළමු සූත්‍රයයි.

21. 4. 2.

දෙවැනි සූත්‍රයේ - "**මධුරකජාතො විය**" යනු හටගත් ගරුභාව ඇත්තාක් මෙන් අකර්මණ්‍ය වූයේ යනුයි. "**දිසාපි මෙ**" යනු මේ පෙරදිගයි. මේ දකුණු දිගයි. මෙසේ දිශාවන්ද මට නොවැටහේ යනුයි. ප්‍රකට නොවේයැයි කියයි. "**ධම්මාපි මං නපපටිභනන්ති**" යනු 'පර්‍යාප්ති ධර්මය ද මට නොවැටහේ යනුයි. උත්ග්‍රහණය කළ දේද සජ්ඣායනා කළ දේද නොපෙනේ"යැයි කියයි. "**විචිකිච්ඡා**" යනු අපට මහා සැකයක් ඇත යනුයි. මේ ශාසනය සසරින් නික්මීම ගෙනදෙන්නක්ද? නැද්ද?යි සැක උපදියි. මෙසේ ඔහුට "මහණදම් කිරීමට හැකිද?" යන සැකය ඇතිවේ. නැතිනම් පාසිවුරු දැරීම පමණක්ම කරන්නෙමියි සිතයි. "**කාමානමෙතං අධිවචනං**" යනු යම් සේ නිම්නයක්, මඩවලක් බලන්නාට දැකීමට තරම් සිත්කලු දෙයක් නොමැති ද යමෙක් ඊට බසිත් ද ඔහු චණ්ඩ මාලු සමූහයා විසින් ඇද අනේක වූ ව්‍යසනයන්ට පමුණුවයි. මේ අයුරින් ම පඤ්චකාම ගුණයන්හි චක්ඛුද්වාරාදියේ අරමුණු ගැනීමෙහි සිත් අලවන බවක් පමණකුදු නැත. යමෙක් රූපයේ ගිජු බවට පැමිණේද ඔහු නිරයාදියට ඇදගෙන ගොස්ම දමති. "කාමයේ අල්ප වූ ආශ්වාදයක් ඇත. බොහෝ දුක් - බොහෝ කරදර ඇති කාමයෙහි ආදීනව අධිකය." මේ අර්ථ වශයෙන් දකිමින් කාමයන්ට මේ තවත් වචනයකැයි කියන ලදී. "**අභබ්බාමිසධම්මානුගගහෙන**" යනු මම ධර්ම-ආමිෂ අනුග්‍රහයන්ගෙන් අනුග්‍රහ කරමි යනුයි. "**අභිනඳති**" යනු පිළිගත්තේය යනුයි. හුදෙක් සතුටුවීම පමණක් නොවේ. මොහු ශාස්තෘන් වහන්සේ සමීපයේ දී අස්වැසිල්ලක් ලැබ උත්සාහ කරනුයේ වෑයම් කරනුයේ කිසිප දිනකින්ම රහත්බවෙහි පිහිටියේය.

දෙවන සූත්‍රයයි.

21. 4. 3.

තෙවන සූත්‍රයේ - "**දිට්ඨිගතං**" යනු ඉදින් ඔහුට "මෙසේ සංස්කාරයෝ උපදිති. එමෙන්ම නිරුද්ධ වෙති. සංස්කාර පැවතීම ද නොපැවතීම ද වේ" යන හැඟීම වේනම් එය දෘෂ්ටිගතයක් නම් නොවන්නේය. ධර්මයෙහි ඤාණයක් වන්නේ නම් "යම් හෙයකින් මේ සත්ත්වයා වැනසෙන්නේය. විනාශවන්නේය." යන අදහස වේනම් එය දෘෂ්ටිගතයක් වන්නේය යනුයි. "**ථාමසාපරාමාසස**" යනු දෘෂ්ටි වීර්යයෙන්ය. මෙන් ම දෘෂ්ටිය අල්ලා

ගැනීමෙන්. "යෙනායසමා සාරිපුත්තෙතා" යම්සේ ප්‍රත්‍යන්ත ජනපදයක කෝලහලයක් ඇතිවූ විට - එය සන්සිඳවීමට නොහැකි වූ විට රාජපුරුෂයෝ යුධ සේනාපති හෝ රජතුමා හමුවට යන්නේ ද මෙසේම දෘෂ්ටි ගැනීමෙන් මේ තෙරුන් වහන්සේ කෝපවූ කල්හි එය සන්සිඳවීමට නොහැකි වූ ඒ භික්ෂූහු යම්තැනක ධර්මරාජයන් වහන්සේගේ ධර්මසේනාපති වූ ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ සිටිත් ද එතැනට පැමිණියහ.

"එවං ව්‍යාඛෝ" යනු ඒ භික්ෂූන්ගේ සමීපයේ මෙන් සැරියුත් තෙරණුවන් ඉදිරියේ එය පැවසීමට අසමත්වූයේ සෙලවෙන හදවතින් "මෙසේ පවසමි"යි කීවේය. "**තං කිං මඤ්ඤසි ආවුසෝ**" සැරියුත් තෙරණුවෝ ඔහුගේ වදන් අසා "මොහු තමාගේ පිළිගැනීමෙහි (ලබ්ධියෙහි) දොසක් නොදකියි. ධර්මදේශනාවෙන් මොහුට එය වටහා දෙන්නෙමි"යි සිතා තිපරිවර්ත දේශනාව පැවැත්වීමට ඇරඹූ සේක. "**තං කිං මඤ්ඤසි ආවුසෝ යමක! රූපං තථාගතෝ**" යනු මෙය කුමක් නිසා ඇරඹුවේද? යෙදීමට සුදුසු වත් පිළිවෙත් දීම පිණිසයි. තිපරිවර්ත දේශනාව අවසන්හි යමක තෙර සෝවාන් විය. ඉක්බිති ඔහුට යෙදිය යුතු වත් පිළිවෙත දීමට "නුඹ කුමක් සිතනුද?" යනාදිය දෙසූහ.

"තථාගතෝ" යනු සත්ත්වයායි. රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යන මේ පංචස්කන්ධයේ සම්පිණ්ඩනයෙන් සත්ත්වයා යන සම්මුතිය දකින්නේද?යි අසයි. "**එතථව තෙ ආවුසෝ**" යන මෙය තෙරුන්ගේ පිළිපැදීමෙහි පිහිටීමයි. මෙය කියන ලද්දේ වේ. නුඹට මෙහිදී මෙපමණ තැනෙක්හිදී මෙලොවදීම සත්‍ය වශයෙන්, ස්ථිර වශයෙන් සත්ත්වයකු නොලැබෙන කල්හි. "**සචෙ තං ආවුසෝ**" යනු මෙය මෙයින් අන්‍ය වූවක් විවරණය කරනු කැමතිව විමසයි. "**යං දුක්ඛං තං නිරුද්ධං**" යනු යමක් දුක්සහගත නම් එයම නිරුද්ධ වේ. අනික් සත්ත්වයෙක්, නිරුද්ධ නොවන්නෙක් නම් නැත. මෙසේ විවරණය කරන්නේය යන අර්ථයි. "**එතසෙසව අත්ථසස**" මේ පළමු මාර්ගයේ. "**හියෝසොමතතාය**" අතිරේක ප්‍රමාණ වූ ඤාණයේ යහපත පිණිසයි. විදර්ශනා සහිත වූවන්ගේ මතු ත්‍රිවිධ මාර්ගයන් මනාව ප්‍රකට කිරීම සඳහා යන අර්ථය. "**ආරකඛ සමපනෙනා**" යනු ඇතුලත ආරක්ෂාවෙන් මෙන්ම පිටත ආරක්ෂාවෙන්ද යුක්ත වූ යනුයි. "අයොගකෙඛමකාමොා" යනු සතර යෝගයන්හි ක්ෂේම භාවය නොකැමති වන්නා වූ යනුයි. "පසයහ" යනු මැඩපවත්වයි. යටපත් කර යනුයි. "අනුපබඛජ" යනු ඇතුලට පිවිසී යනුයි. "පුබබුටයාසී" ආදියෙහි

දුරදීම එනු දැක අසුනින් පළමුව නැගිටියි. "පුබ්බුට්ඨායී" නම් වේ. ඔහුට අසුන දී ඔහු හුන්කල්හි පසුව වැඩහිඳියි. වාඩිවෙයි යනු "පච්ඡානිපාතී" නම් වේ. උදෑසනම නැගිට මෙපමණ දෙන සීසෑමට යවු. මෙපමණ දෙන වැපිරීමට යවු ආදී ලෙස සැමට පළමුව නැගිටියි යනු "පුබ්බුට්ඨායී" නම් වේ. හවස සියල්ලෝම තම තමා වසන තැනට ගියකල්හි ගේ හාත්පස ආරක්ෂා සංවිධාන ඇතිකර, දොරවල් වසා සියල්ලන්ටම පසුව නිදයි යනු "පච්ඡානිපාතී" වේ. කුමක් කරමිදැයි ස්වාමියාගේ මුහුණ බලමින් කිම? කිම? යනුවෙන් නිතර අස්වයි ද එය "**කිංකාරපටිසඤ්ඤී**" නම් වේ. මනාප වූ පරිදි හැසිරෙයි යනු "මනාපචාරී" නම් වේ. ප්‍රිය වූ දෙයක් පවසයි. "**පියවාදී**" "මිත්තතොපි නං සද්දහෙය්‍ය" යනු මොහු මගේ මිතුරෙක් යැයි අදහන්නේ ය යනුයි. "විසඤ්ඤං ආපජ්ජෙය්‍ය" යනු හුදකලාව කැම්බිම් ආදිය කරමින් විශ්වාසයට පැමිණියෙක් වන්නේය යනුයි. "සංවිසසතෙඨා" යනු මනාව විශ්වාසී වූයේ.

"එවමෙව ඛො" යනු මෙහි මේ උපමා සැසඳීමයි. සංසාරික පැවැත්මට යොමු වූ අශ්‍රැතවත් පුහුදුන් පුද්ගලයා මෙහි මෝඩ ගහපති යුතු මෙනි. අබල දුබල වූ පංචස්කන්ධය වධකයා වූ සතුරා මෙනි. වධක පසමිතුරා, මෝඩ ගහපති පුතුට "උපස්ථාන කරන්නෙමි"යි පැමිණි අවස්ථාව - ප්‍රතිසන්ධි ක්ෂණයෙහි පැමිණෙන්නා වූ පංචස්කන්ධය මෙනි. ඔහු විසින් "මේ සහායකයා මගේ වධකයා වන සතුරෙකි"යි නොදත් අවස්ථාව මෙන් සසර පැවැත්ම ආශ්‍රිත පුහුදුන් පුද්ගලයාගේ පංචස්කන්ධය "මෙය මගේ නොවේ"යැයි පිළිනොගෙන "රූපය මගේය, වේදනාව මගේය, සංඥාව මගේය, සංස්කාරයෝ මගේය, විඤ්ඤාණය මගේයැ"යි ගත් අවස්ථාව දතයුතුයි. වධක පසමිතුරාට "මේ මගේ මිතුරෙකි"යි පිළිගෙන සත්කාර කිරීම මෙන් "මේවා මගේය"යි ගෙන පස් ස්කන්ධයන්ට කෑම-බීම් ආදියෙන් සත්කාර කරන අවස්ථාව දතයුතුයි. "මොහු මාගේ දැඩි විශ්වාසියෙකි"යි දැක සත්කාර කරද්දීම බාල ගහපති පුත්‍රයාගේ විශ්වාසී පුරුෂයා තියුණු වූ කඩුවෙන් හිස සින්දාක් මෙන් බිඳෙන්නා වූ ස්කන්ධයන් විසින් ජීවිතය වනසා දැමීම දතයුතුයි.

"**උපෙති**" යනු සමීපයට යයි යනුයි. "**උපාදියති**" යනු ගනියි යනුයි. දැඩිව අල්ලා ගනියි. "**අධිට්ඨානි**" යනු දැඩිව සිටියි යනුයි. "අතනාමෙ" යනු මගේ ආත්මය යැයි පවසමින්ය. "**සුතවා ච ඛො ආවුසො අරියසාවකො**" යනු යම්සේ නුවණැති ගහපති පුත්‍රයා මෙසේ ලඟට පැමිණි සේවක සතුරා "මොහු මගේ සතුරෙකි"යි දැන අප්‍රමාදීව ඒ ඒ කර්මාන්ත කරවා

අනර්ථය දුරුකරයි. අර්ථයට-යහපතට පැමිණෙයි. මෙසේ ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා ද "රූපය තමාගේ වශයෙන් නො සලකයි" ආදී වශයෙන් පංචස්කන්ධය ම "මම-මාගේය" යනුවෙන් නොගෙන "මේ පංචස්කන්ධය මගේ සතුරෙකි"යි දැන රූප සප්තකය, අරූප සප්තකය ආදී වශයෙන් විදර්ශනාව යොදා ඉන් මරණය හා සමාන දුක් නැතිකර-දුරුකර, අග්‍රඵලය වූ රහත්බවට පත්වෙයි. සෙසු විස්තර ඉතා ප්‍රකටමය.

තෙවැනි සූත්‍රයයි.

21. 4. 4.

සිවුවන සූත්‍රයේ - "අරඤ්ඤකුටිකායං" යනු ඒ විහාරයේම ඈත කෙළවරක පනසලක්ය. "තං තථාගතො" යනු ඒ තථාගත සත්ත්වයෙක් වේද උන්වහන්සේ නුඹගේ ශාස්තෘ වූ තථාගතයෝය. "අඤ්ඤත්‍රිමෙහි" යනු උන්වහන්සේට මෙසේ සිත්විය. "මොවුහු බුදුසසුනට ප්‍රතිපාක්ෂිකයෝය. විරුද්ධකාරයෝය. මොවුහු පවසන අයුරින් ශාස්තෘන් වහන්සේ ප්‍රකට නොවන්නේය. අනු අයුරකින් ප්‍රකට කරන්නෙමි"යි මෙසේ වදාළහ. "එවං වුත්තෙ තෙ අඤ්ඤතිත්ථියා" මෙසේ තෙරුන් විසින් තමාගේද අනුන්ගේද ආගමික ඉගැන්වීම් නොදැන පිළිතුරු දුන් කල්හි, එක් පැත්තකින් පමණක් බුදුසමය දන්නා වූ තෙරුන්ගේ වාදයෙහි දොස් දක්වනු කැමති ඒ අන්‍ය තීර්ථක පිරිවැජියෝ ආයුෂ්මත් අනුරාධ තෙරුන්ට මෙසේ පැවසූහ. "තං කිං මඤ්ඤසි අනුරාධ" යනුවෙන් ශාස්තෘන් වහන්සේ උන්වහන්සේගේ කථාව අසා මෙසේ සිතූ සේක. "මේ භික්ෂුව තමා පිළිගත් ලබ්ධියෙහි දොස් නොදනියි. මොහු කාරකයෙක් සිටියැයි ගත් අදහස් ඇත්තෙකි. ධර්ම දේශනාවෙන් ම මොහුට මෙය අවබෝධ කරවමියි තිපරිවර්ත දේශනාව පවත්වනු කැමති සේක් "තං කිං මඤ්ඤසි අනුරාධ" යනාදිය දෙසූහ. ඉක්බිති උන්වහන්සේට, මෙම දේශනාවෙන් රහත්බවට පත්වීමට අවශ්‍ය වත්පිළිවෙත් මාර්ගය පෙන්වා ඊට යොමුකරන සේක් - "තං කිං මඤ්ඤසි අනුරාධ! රූපං තථාගතො" යනාදිය දෙසූහ. "දුක්ඛඤ්චෙව පඤ්ඤාපෙමි දුක්ඛසස්ච නිරොධං" යනු සසර පවත්නා දුක මෙන්ම සසර පවත්නා දුකෙහි නිරෝධය වූ නිර්වාණය ද පණවමි. දේශනාකරමි. "දුක්ඛං" යන වචනයෙන් දුක්ඛ සත්‍යය ගන්නා ලදී. අදහස් කරන ලදී. එසේ ගත්කල්හි එම වචනයෙන් ම සමුදය සත්‍යය ද අදහස් කළා වේ. එහි මූලය වූ "නිරොධං" යන වචනයෙන් නිරෝධ සත්‍යය අදහස් කරන

ලදී. එය ගත් කල්හි මාර්ග සත්‍යය ද අදහස් කළේ වේ. මේ ක්‍රමයෙන් මෙහිදී පෙර "අනුරාධය! මම දැන් චතුරාර්ය සත්‍යයම දේශනා කරමි"යි දක්වූ සේක. මෙසේ මෙම සූත්‍රයෙහි සංසාරික පැවැත්ම හා නැවැත්වම දේශනා කරන ලදී.

සිවුවන සූත්‍රයයි.

21. 4. 5.

පස්වන සූත්‍රයේ "**කුම්භකාර නිවෙසනෙ**" යනු කුම්භකාර ශාලාවෙහි තෙරුන් වහන්සේ වස් වැස නිමවී පවාරණය කොට, භාග්‍යවතුන් වහන්සේ දැකීමට පැමිණේ. ඒ නුවර මැද දී උන්වහන්සේට මහා ආබාධයක් උපන්නේය. පාදයෝ ගමන් කිරීමට නොහැකි වෙති. එවිට සෙසු ජනයා උන්වහන්සේ ඇඳක හොවා කුම්භකාර ශාලාවේ තැබූහ. ඒ ශාලාව ද කර්මාන්ත ශාලාවක් හෝ වාසය කරන ශාලාවක් නොවේ. ඒ සඳහා කියන ලදී. 'කුම්භකාර ශාලාවේ වාසය කරයි' යනුවෙන්. "**බාළහගිලානො**" යනු දැඩිසේ රෝගාතුරවය. "**සමධොසි**" යනු හාත්පසින් යට වූ. සෙලවෙන ආකාරයෙන් ගෞරව දැක්වීම් දැක්විය. මෙය ඉතා සුදුසුමය. දැඩිසේ ගිලන් වුවත් තමාට වඩා වැඩිමහල්ලෙකු දැක නැගිටින ආකාරයෙන් ගෞරව දක්විය යුතුමය. ඔහු විසින් "නොසෙලවෙන්න. නොසෙලවෙන්න"යි කිව යුතුයි. "**සනති මානි ආසනානි**" යනු බුද්ධකාලයේ එක හිඤුවක් වසන තැන වුවත් ඉදින් ශාස්තෘන් වහන්සේ වැඩම කරන්නේ නම් "මෙහි හිඳින සේක්වා!"යි අසුනක් පැනවූයේම වේ. යටත් පිරිසෙන් එලකයක් මත හෝ තණපත් ඇතිරියක් මත හෝ මේ අසුන පනවනු ලැබේ. "**ඛමනීයං යාපනීයං**" "කිම දුක් වේදනා ඉවසිය හැකිද?" "ඉරියව් පැවැත්විය හැකිද?"යි විමසූ සේක යනුයි. "**පටිකකමනති**" යනු නැවතේ ද? අඩුවේද? යනුයි. "**අභිකකමනත**" යනු වැඩිවේද? ඉහල යයිද? යනුයි. "**පටිකකමොසානං**" යනු මේවායේ ඉවත්වීම පසෙකට වීමයි. "**සීලතො න උපදවති**" යනු සීලය අරබයා ශීල භාවයෙන් උපවාද නොකරයි යනුයි. "**චිරපටිකාහං**" යනු "මම බොහෝ කාලයක පටන්"ය. "මීට පෙර බොහෝ කාලය සිට" යන අර්ථයි. "**පූනිකායෙන**" තමාගේ රන්වන් වූ කය පිළිබඳව මෙසේ නිති වැගිරෙන අර්ථයෙන් භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ. "**යෙ බො වකකලී ධම්මං**" යනු මෙහි භාග්‍යවතුන් වහන්සේ "මහරජ! ධර්මකාය නම් තථාගතයෝයැ"යි දෙසූ බැවින්

ධර්මකාය බව දක්වයි. ලෝකෝත්තර ධර්මයෙහි තථාගතයන් වහන්සේගේ "කය" නව වැදෑරුම් වේ. දැන් තෙරුන් වහන්සේට **තිපරිවර්ත** ධර්ම දේශනාව පැවැත්වීමට අරඹන සේක් **"තං කිං මඤ්ඤසි"** යනාදියව දේශනා කළ සේක.

"කාළසිලා" යනු කාළසිලා නම් විහාරයයි. **"විමොකඛාය"** යනු මාර්ග විමෝක්ෂය (මිදීම) සඳහාය. **"සුවිමුත්තෙතා විමුචචිසසති"** අර්හත් ඵල විමුක්තියෙන් මිදුනෙක් වී මිදෙන්නේ ය. ඒ දේවතාව වනාහී යම් ආකාරයකින් මේ විදර්ශනාව අරඹා අතරක් නැතිවම රහත්බවට පැමිණෙන්නේ යැයි දැන මෙසේ කියන ලදී. **"අපාපකං"** යනු ළාමක නොවූ යනුයි. **"සතථා ආහාරෙසි"** යනු තෙරුන් වහන්සේ වනාහී අධිමාන ඇත්තෙකි.a ඔහු සමාධි විදර්ශනාවන්ගෙන් යටපත් කල කෙලෙස් ඇති බැවින්, කෙලෙසුන්ගේ හැසිරීමක් නොදක්නේ "මම රහතන් වහන්සේ කෙනෙකි යන සංඥාවෙන් (හැඟීමෙන්) "මට මේ දුක් සහගත වූ ජීවිතයෙන් කවර වැඩක්ද? ආයුධයක් ගෙන කපාගෙන මැරෙන්නෙමි"යි සිතා තියුණු වූ සැතකින් ගලනාලය කැපුවේය. එවිට ඔහුට බලවත් දුක්වේදනා ඇතිවිය. එවිට ඔහු එකෙනෙහිම තම පුහුදුන් බව දැන මුදානොහළ කමටහන් ඇති නිසා වහා මුල් කමටහන ගෙන සිහිපත් කරනුයේ රහත්බවට පත්වීම පිරිනිවන පෑ සේක.

උන්වහන්සේ ප්‍රත්‍යවේක්ෂණාව කෙසේවීද? රහතන් වහන්සේට දහනවයක් ප්‍රත්‍යවේක්ෂණා ඇත. ඒකාන්තයෙන් ලැබිය යුතුයි. තියුණු කඩුවකින් හිස සිඳින කල්හි ඥාන එකක් හෝ දෙකක් ඒකාන්තයෙන්ම උපදියි. **"විවත්තකඛන්ධං"** යනු පෙරළුණු කඳ **"සෙමානං"** යනු නිදාසිටින. තෙරුන් වහන්සේ වනාහි උඩුකුරුව හොත්තේ සැතින් කපාගත්තේය. ඔහුගේ සිරුර සිටි පරිදිම තිබුණි. හිස දකුණු පැත්තට පෙරලී සිටියේය. ආර්ය ශ්‍රාවකයෝ බොහෝවිට දකුණුලයට හැරී පිරිනිවෙති. එහෙයින් ඔහුගේ සිරුර සිටි පරිදිම තිබුණේය. හිස පමණක් දකුණුලයට හැරී සිටියේය. ඒ සඳහා 'පෙරළුණු කඳ ඇතිව' යන්න යෙදුණි. **"ධූමායිතත්තං"** යනු දම්දමන බවකි. **"තිමිරායිතත්තං"**යනු අඳුරු වීගෙන යන බවයි. දුම් වලාවක් මෙන් අඳුරු වලාවක් මෙන් යන අර්ථයි.

පස්වන සූත්‍රයයි.

---

a. රහත් නොවී මම රහත්යැයි සිතාගෙන සිටින්නෙකි.

21. 4. 6.

සයවන සූත්‍රයේ - "**කසසපකාරාමෙ**" යනු කස්සප සිටු විසින් කරවූ ආරාමයේය. "**කාය සංඛාරෙ**" යනු ආශ්වාස-ප්‍රශ්වාසයන්ය. ඔහු වනාහි චතුර්ත්‍ථ ධ්‍යානයට සමවැදී වැඩහුන්හ. "**එවං හොති**" යනු දැන් එම සමාධිය නොලබන හෙයින් මෙසේ විය යුතුයි. "**නොචකඛාහං පරිහායාමි**" "මම කෙසේ නම් සසුනින් නොපිරිහෙමිද?" උන්වහන්සේ ආබාධ දෝෂයෙන්-දුක් වේදනාව ඇතුලට පිවිසි හෙයින් සමවතින් පිරිහුණු සේක. එනිසා මෙසේ සිතූහ. "සමාධි සාරකා සමාධි සාමඤඤා" යනු සමාධියම සාරය ලෙසද ශ්‍රවණ බව ලෙසද සිතයි යනුයි. මගේ සසුනෙහි මෙය සාර වශයෙන් නොගනියි. විදර්ශනා මාර්ග ඵලයන්ම සාර වශයෙන් ගනියි. එනිසා නුඹ සමාධියෙන් පිරිහෙන කල්හි "සසුනින්ද පිරිහේ"යැයි කුමක් නිසා සිතුවේද? මෙසේ තෙරුන් වහන්සේ අස්වසා, දැන් උන්වහන්සේට තිපර්වර්ත ධර්මදේශනාව අරඹන සේක් "තං කිං මඤඤසි" යනාදිය වදාළහ.

එවිට උන්වහන්සේට තිපරිවර්ත ධර්මදේශනාව අවසන්හි රහත් බවට පත්වූ විට නිතර විහරණය කළයුතු අයුරු දක්වන සේක් "**සො සුඛඤ්ඤෙව වෙදනං වෙදියති**" යනාදිය වදාළහ. එහි "**අනභිනඳිතානි පජානාති**" යනුවෙන් සැප වේදනාව නිසා පළමුව සතුටුවීම වෙත්වා. දුක් වේදනාවෙන් කෙසේ සැප ඇතිවේද? දුකට පත්වූ තැනැත්තා සැප ප්‍රාර්ථනා කරයි. යම්තැනක පටන් දුකට පත්වීද එතැන් පටන් සැප ප්‍රාර්ථනා කරන්නේමය. "සැප විපරිණාමයට පත්වීමෙන් දුක පැමිණෙන්නේ ම වේ." මෙසේ දුක්දී සතුටුවීම දතයුතුයි. සෙසු පදාර්ථ හා විස්තර ඉතා ප්‍රකට ය.

සයවන සූත්‍රයයි.

21. 4. 7.

සත්වන සූත්‍රයේ - "**අතතනියං**" යනු තමාගේ පිරිකර කෙරෙහි හටගත් යනුයි. "**අසමිති අධිගතං**" යනු මම වෙමියි මෙසේ පැවති තණ්හා මානයන්ට පැමිණ යනුයි. "**සන්ධා වනිකාය**" යනු නැවත නැවත ගමනාගමනයෙන්ය. "**උපසංකමි**" යනු බදරිකාරාමයෙන් ගවුවක් පමණ

දුරින් පිහිටි සෝෂිතාරාමයට පැමිණි සේක යනුයි. දාසක තෙරුන් වනාහී සතර වරක් එම මාවතෙහි ගමනාගමන කිරීමෙන් එදින යොදුන් දෙකක් පමණ දුර ඇවිද්දේය. කුමක් නිසා ඒ තෙරවරු පණිවුඩ යැවුවාහු ද? ප්‍රසිද්ධ ධර්මකථිකයකුගේ සමීපයෙන් ධර්මය අසමු"යි යනුවෙන් සිතා පණිවුඩ යැවූහ. තමා කුමක් හෙයින් නොගියාහුද? තෙරුන්ගේ වසන තැන වූ ආරණ්‍යය කරදර සහිතය. එහි සැටක් පමණ භික්ෂූහු සිටීමට හෝ හිඳීමට අවසර නොලබයි. එබැවින් ඔවුහු නොගියහ. මෙහි පැමිණ අපට ධර්මය දෙසත්වායි කුමක් හෙයින් දන්වා නොයැවුවාහු ද? තෙරුන්ගේ ආබාධ සහිත බව නිසයි. ඉක්බිති පසුව පුන පුනා පණිවුඩ යැවුවේ කවර හෙයින්ද? "තමන් වහන්සේම දැන අපට ධර්මදේශනා කිරීමට පැමිණෙන්නාහ"යි සිතූ හෙයිනි. තෙරුන් වහන්සේ ද ඔවුන්ගේ අදහස දැනගෙනම එහි වැඩියහ.

"නබාහං ආවුසො රූපං" යනු යමෙක් රූපයම "මම වෙමි"යි කියයි. මෙයින් ඉතිරි සතර ස්කන්ධය ම ප්‍රතික්ෂේප කරන ලදී. යමෙක් රූපය අත්හැර කියයි ද එයින් රූපය ප්‍රතික්ෂේප කරන ලද්දේ වේ. වේදනාදියෙහි ද මේ ක්‍රමයම දතයුතුයි. තෙරුන් වහන්සේ වනාහී සමූහ වශයෙන්ම පංචස්කන්ධයෙහි "මම වෙමි"යි අවබෝධ කරගෙන සිටින බැවින් මෙසේ වදාළහ. "හොතෙවා" යනු සිදුවේමය යනුයි. "අණුසහගතො" යනු සූක්ෂම වූ සියුම් වූ යනුයි. "ඌසෙ" යනු අළුගදයි. "බාරෙ" යනු කරගදයි. "සම්මදදිතවා" යනු තෙමා, සෝදා පිරිසිදු කර යනුයි. "එවමෙව ඛො" යනු මෙහි මේ උපමා සැසඳීමයි. කිලිටි වස්ත්‍රයක් මෙන් පුහුදුන් පුද්ගලයාගේ හිස් හැසිරීම දතයුතුයි. ත්‍රිවිධ ජලවර්ග මෙන් ත්‍රිවිධ අනුපස්සනාවන්ද ත්‍රිවිධ ජලයෙන් සේදූ වස්ත්‍රය මෙන් දේශනාවෙන් මැඩපවත්වාගෙන සිටි අනාගාමී චිත්ත චාරයද සියුම්ව පවතින අළු ආදී ගඳ මෙන් අර්හත් මාර්ගය වර්ජනය කරන ක්ලේෂයෝද සුවඳ කරඬු මෙන් අර්හත් මාර්ග ඤාණය ද දතයුතුයි. සුවඳ කරඬු ආදියේ දැමීමෙන් සියුම්ව පවතින අළුගඳ ආදිය සම්පූර්ණයෙන් නැසෙන්නාක් මෙන් අර්හත් මාර්ගයෙන් සියලු කෙලෙස් ක්ෂය වී ගඳ දුරුවූ පිරිසිදු වස්ත්‍රය හැඳ පොරවාගෙන උත්සව දිනයෙහි ඇතුලු විථියේ සුවඳ හමමින් හැසිරීම මෙන් රහතන් වහන්සේගේ සිල්සුවඳ දසදිසාවෙහි කැමති පරිදි හමා යන්නේය.

"ආචිකඛිතුං" යනු කීමට-පැවසීමටය. "දෙසෙතුං" යනු ප්‍රකාශ කිරීමටය. "පඤ්ඤපෙතුං" දන්වන්නටය. "පටඨපෙතුං" පිහිටුවන්නටය.

"**විචරිතුං**" විවර කිරීමටය. "**විභජිතුං**" මැනවින් බෙදා දක්වීමටය. "**උත්තානීකාතුං**" ප්‍රකට වූවක් කිරීමටය. "**සටඨීමත්තානං ථෙරානං**" යනු ඔවුහු වනාහී තෙරුන් විසින් කියූ කියූ තැන්හි විදසුන්හි පිහිටා මතු මතු සිත් විමසා බලන්නාහු දේශනාව අවසානයේ රහත් බවට පත්වූහ. තෙරුන් වහන්සේ ද අනික් ආකාරයකින් කරුණු නොදක්වා විදර්ශනා සහගත වූ සිතින්ම දේශනාව පැවැත්වූ සේක. එනිසා උන්වහන්සේද රහත් බවට පත්වූහ. එනිසා "**සටඨීමත්තානං ථෙරානං භික්ඛූනං අනුපාදාය ආසවෙහි චිත්තානි විමුච්චිංසු ආයසමතෝ ච බෙමකසසාති**"යි කියන ලදී.

සත්වන සූත්‍රයයි.

21. 4. 8.

අටවන සූත්‍රයේ "**ආයසමා ඡනෙනා**" යනු තථාගතයන් වහන්සේ සමග එක්ම දින උපන්, මහභිනික්මන් කරන දවස්හි එක්ව රජගෙයින් නික්මුණු, නැවත මෑත පසුකාලයේදී උන්වහන්සේ ලඟ පැවිදි වී "බුදුරජ මගේය", "ධර්මය මගේය" යනුවෙන් සිතන පතන, මෙසේ ගුණමකු වූ එමෙන්ම අනුන්ගේ දොස් කියන්නෙකු වූ, සබ්‍රහ්මචාරීන්ට පරුෂ වදනින් ගැටුම් ඇතිකරන්නා වූ තෙරුන් වහන්සේය. "**අවාපුරණං ආදාය**" යනු යතුර ගෙන යනුයි. "**විහාරෙන විහාරං උපසංකමිත්වා**" යනු එක් විහාරයකට පිවිස ඉන් තව විහාරයකට, ඉන් තව විහාරයකට ආදී වශයෙන් ඒ ඒ විහාරයෙන් ඒ ඒ විහාරයට පැමිණ "**එතදවොච-ඔවදනතුමං**" කුමක් නිසා මෙසේ මහත් වූ උත්සාහයෙන් ඒ ඒ තැනට ගොස් මෙසේ කීවේද? උපන් සංවේග ඇති බැවිනි. ඔහුට ශාස්තෘන් වහන්සේ පිරිනිවි කල්හි, ධර්ම සංග්‍රාහක තෙරුන් විසින් යැවූ ආයුෂ්මත් ආනන්ද හිමියෝ කොසඹෑවට ගොස් බ්‍රහ්මදණ්ඩනය පැනවූහ. ඔහු බ්‍රහ්මදණ්ඩනය පැනවූ කල්හි හටගත් පිරිතැවීම් ඇතිවී සිහිවිසංඥව වැටී, නැවත සිහිලැබ-නැගිට එක් භික්ෂුවක් සමීපයට ගියේය. එම භික්ෂුව ඔහුත් සමග කිසිවක් කථා නොකළේය. වෙනත් භික්ෂුවක් ලඟට ගිය විට ද ඡන්න සමග උන්වහන්සේද කථා නොකළ සේක. තවත් භික්ෂුවක් ලඟට ගියේය. ඔහුද කථා නොකළේය. මෙසේ මුලු විහාරය පුරාම සිටි භික්ෂූන් ලඟට ගියත්, පිළිතුරක් නොලැබ-කළකිරුණේ පාත්‍රසිවුරු ගෙන බරණැසට අවුත් උපන් සංවේග ඇතිව ඒ ඒ තැන යමින් මෙසේ පැවසහ.

"සබ්බ සංඛාරා අනිච්චා" යන සියලු තේ‍රභූමික සංස්කාරයෝ අනිත්‍යයහ. "සබ්බ ධම්මා අනත්තා" යනු සියලු සිවුභූමික ධර්මයෝ අනාත්මය හ. මෙසේ ඒ සියලු ම භික්ෂූනු තෙරුන්ට අවවාද දෙමින් අනිත්‍ය හා අනාත්ම ලක්ෂණ දෙක පමණක්ම පැවසූහ. දුක්ඛ ලක්ෂණය පිළිබඳව කිසිවක් නො පැවසූහ. කුමක් නිසාද? උන්වහන්සේලාට මෙසේ සිතුණු බැවිනි. "මේ භික්ෂුව නිතර වාද කරන්නෙකි. දුක්ඛ ලක්ෂණය පෙන්වාදෙන කල්හි රූපය දුකයි -පෙ- විඤ්ඤාණය දුකයි, මාර්ගය දුකයි, ඵලය දුකයි යනුවෙන් ගන්නා නුඹලා දුකට පත් භික්ෂූනු යැයි අවබෝධ කරගන්නේය. මොහුට එසේ වැරදි අවබෝධයක් ගත නොහැකි සේ නිර්දෝෂ වූම පිළිතුරක් මොහුට දෙන්නෙමු"යි ලක්ෂණ දෙක පමණක්ම දෙසූහ. "පරිතසසනා උපාදානං උපපජ්ජති" යනු තැනි ගැනීමත් දඩිව අල්ලා ගැනීමත් උපදියි. ඇතිවේ යනුයි. "පච්චුදාවත්තති මානසං අථකෝ චරහි මෙ අතතා" යනු ඉදින් රූපාදියෙහි තනිව ගත්තත් ආත්මයක් නැත. ඉක්බිති "මේ මගේ ආත්මයද?"යි මගේ සිත පෙරලෙයි යනුයි. මේ තෙරුන් වහන්සේ වනාහී ප්‍රත්‍ය පරිග්‍රහණය නොකොට විදර්ශනාවෙහි සිත පිහිටුවිය. ඒ මේ දුර්වල විදර්ශනාව ආත්මග්‍රාහීව සිටීමට නොහැකි වෙති. සංස්කාරයන් ශූන්‍ය වශයෙන් වැටහෙන කල්හි "නැසෙන්නෙමි. වැනසෙන්නෙමි"යි උච්ඡේද දෘෂ්ටිය මෙන්ම පිරිතැවීම ද ප්‍රත්‍ය හේතු වේ. ඔහු ද තමා ප්‍රපාතයේ වැටෙන්නෙකු මෙන් දක "පිරිතැවීමෙන් උපාදානය උපදියි. මාගේ කුමක් වූ මාගේ ආත්මය හැසිරේ දැයි සිත පෙරළෙයි" යනුවෙන් පැවසීය.

"නබ්‍රා පනෙවං ධම්මං පසසතො හොති" යනු චතුරාර්ය සත්‍ය ධර්මය දකින්නහුට මෙසේ නොවේ. "තාවතිකා විසසටඨී" යනු එපමණ විශ්වාසයක් ඇත යනුයි. "සම්මුඛාමෙතං" තෙරුන් වහන්සේ ඔහුගේ වචනය අසා "කෙසේ මොහුට සුදුසු වූ ධර්ම දේශනාවක් පවත්වම්ද?"යි සිතමින් ත්‍රිපිටක බුදුවදන විමසා බලා "කච්චාන සූත්‍රය" තෝරාගත්හ. මෙය මූලසිටම දෘෂ්ටීන් ලිහා පැහැදිලි කරමින් මැදදී බුදුබලය ප්‍රකට කර ඉතා සියුම් ප්‍රතීත්‍ය සමුත්පාදය ප්‍රකාශවන ගමනක් (දේශනාව) මොහුට දෙසන්නෙමියි දක්වනුයේ "සම්මුඛාමෙතං" යනාදිය පැවසූහ.

අටවන සූත්‍රයයි.

21. 4. 9-10.

නවවන හා දසවන සූත්‍ර රාහුල සංයුත්තයේ පැවසූ පරිදිම

දතයුතුයි. හුදෙක් මෙම සූත්‍ර "ථෙර වර්ගය" යැයි නම් වූ බැවින් මෙහි ඇතුලත් කරන ලදි.

සතරවන ථෙර වර්ගයයි.

21. 5. 1.

පුප්ඵ වර්ගයේ පළමු සූත්‍රයේ - "පබ්බතෙය්‍ය" යනු පර්වතයේ පවතින යනුයි. "ඔහාරිණී" යනු නදී ප්‍රවාහයට වැටුණු වැටුණු තණපත්, කුටුකබල් ආදිය පහළට ගෙනයන යනුයි. "දූරංගමා" යනු වැටුණු තැන් සිට යොදුන් සතරක් පහක් ගහගෙන යන යනුයි. "සීඝසොතා" යනු සැඩ දියපහරකි. "කාසා" ආදී සියල්ල තෘණ ජාතිහුය. තණ වර්ගයි. "රුකඛා" යනු එරඬු ආදී දුර්වල ගස් වර්ගයන්ය. "තෙ නං අජ්ඣොගාහ ලමෙබය්‍යුං" යනු එම ගස් ගංගා තීරයේ වැවී අග නැමෙමින් දියෙහි ස්පර්ශ වන පරිදි දැඩි සේ එල්බගෙන ඇත. මත්තෙහි එල්ලී සිටී යන අර්ථයි. "පලුජෙය්‍යුං" යනු මුලත් සමගම හිසේ වැටෙන්ත්නය යනුයි. එම ගස් පඳුරු වසා පැතිරගත් වැලි-මඩ ආදිය එම පුරුෂයාගේ මුවෙහි පිවිස, මහත් විනාසයක් ඇතිකරන්නේය. "එවමෙව ඛො" මෙහි නදී පහරට වැටුණු පුරුෂයා මෙන් සසර පැවතීමට වැටුණු (එය ආශ්‍රය කරගත්) පුද්ගලයා දතයුතුයි. ගංතීර දෙකෙහි කසට ගස් මෙන් දුර්වල වූ පංචස්කන්ධය දතයුතුයි. මේවා අල්ලා ගත්තත් පිහිටක් නොවේ යැයි ඒ පුරුෂයා නොදැන එම දුර්වල ගස් අතු අල්ලා ගන්නාක් මෙන් මේ ස්කන්ධයෝ මට උපකාර නොවේයැයි නොදන්නා බාල පුහුදුන් පුද්ගලයාට සිවු වැදෑරුම් ග්‍රහණයන්ගෙන් අල්ලා ගනියි. ගත් ගත් දුබල ගස් බිඳීයෑම නිසා පුද්ගලයාට අධික ව්‍යසන-කරදර පැමිණෙන්නාක් මෙන්, සතර ග්‍රහණයන්ගෙන් දැඩිව අල්ලාගත් ස්කන්ධයන්ගේ වෙනස්වීමෙන් බාල පුහුදුන් පුද්ගලයෝ ශෝක-ව්‍යසනාදී නොයෙක් දුක් විඳින්නේ යැයි දතයුතුයි.

පළමු සූත්‍රයයි.

21. 5. 2.

දෙවන සූත්‍රයේ "විවදති" යනු අනිත්‍යය, දුකය, අනාත්මය, අසුභ යැයි තත් වූ පරිද්දෙන් ලෝකස්වභාවය දේශනා කරන්නා සමග නිත්‍යය,

සැපය, ආත්මය, සුභයැයි පවසන්නෝ වාද කරති. "**ලොකධම්මා**" යනු පංචස්කන්ධයයි. එහි පවතින කැඩෙන-බිඳෙන ස්වභාවය නිසා ලෝකධර්මය යැයි කියයි. "**කිනතකරොමි**" කෙසේ කරම්ද යනුයි. මට වනාහි ප්‍රතිපත්ති කථාවම භාරය. ප්‍රතිපත්ති (පිළිවෙත්) පුරන කුලපුතුන්ගේ කාර්යභාරය යැයි දක්වයි. මේ සූත්‍රයේ දී තුන් ලෝකය ම පවසන ලදී. "නාහං භිකඛවෙ ලොකෙනා" (මහණෙනි! මම ලෝකය සමග විවාද නොකරමි) යන මෙතැනදී සත්ත්ව ලෝකය අදහස් කරන ලදී. "**අත්ථිලොකෙ ලොක ධම්මා**" (ලෝකයේ මේ ලෝක ධර්මය ඇත) යන තැන්හිදී සංස්කාර ලෝකය අදහස් කරන ලදී. "**තථාගතො ලොකෙ ජාතො ලොකෙ සංවදෙධා**" (තථාගතයන් වහන්සේ ලොව ඉපිද, ලොව වැඩී) යන මෙතැන්හිදී අවකාශ ලෝකය අදහස් කරන ලදී.

දෙවන සූත්‍රයයි.

21. 5. 3.

තෙවැනි සූත්‍රයේ - "**ගංගාය නදියා තීරෙ**" අයෝධ්‍යා පුරවැසියෝ අප්‍රමාණ වූ භික්ෂූන් පිරිවර කරගත් චාරිකාවේ හැසිරෙන තථාගතයන් වහන්සේ, තමාගේ නගරයට වැඩම කළ බව දැක; එක් ගංගාව නැවතී සිටින තැනක වූ, මහා කැළයෙන් සැරසුණු ප්‍රදේශයක බුදුපියාණන් වහන්සේට විහාරයක් කරවා දුන්හ. භාග්‍යවතුන් වහන්සේ එහි වාසය කරයි. ඒ නිසා "ගංගානම් ගං ඉවුරෙහි" යනුවෙන් පවසන ලදී. "**තත්‍ර බො භගවා භික්ඛු ආමන්තෙසි**" යනු ඒ විහාරයේ වැඩවෙසෙන භාග්‍යවතුන් වහන්සේ සවස් වේලෙහි ගඳකිළියෙන් නික්ම, ගංතෙර පැනවූ උතුම් බුදු අසුනෙහි හුන්සේක්, ගංගානම් ගඟෙහි පැමිණි මහත් වූ එක් පෙණපිඬක් දුටු සේක් - "මගේ සසුනෙහි පැවිදි වූවන්ට පස්කඳ ආශ්‍රිත වූ එක් ධර්මයක් දේශනා කරන්නෙමි"යි සිතා, පිරිවරාගෙන සිටින භික්ෂූන් වහන්සේලා ඇමතූ සේක.

"මහන්තං පෙණපිණ්ඩං" යනු පැහැනැගි තැනේදී ඩෙබර ඇටයක් හා සමාන වී පසුව අනුශ්‍රෝත ගමනයෙන් අනුපිළිවෙලින් වර්ධනය වී පර්වත කූටයක් පමණ වූ. යම්තැනක ජල සර්පාදී නොයෙක් ප්‍රාණීහු වාසය කරත්ද එබඳු වූ මහත් පෙනපිඬක් "**ආවහෙය්‍ය**" යනු ගෙනෙන්නේය යනුයි. ඒ මේ පෙනපිඬද නැඟි නැඟි තැන්හි බිඳෙයි. මද දුරක් ගොස් බිඳෙයි. නැතිනම් යොදුනක් දෙකක් හෝ ගොස් බිඳෙයි. ඇතැම් පෙනපිඬු

අතරතුරදී නොබිඳීම මහමුහුද වෙත ගොස්, එහි දී අනිවාර්යයෙන්ම බිඳේ. "**නිජඣායෛය්‍ය**" යනු බලන්නේය. සිතන්නේය යනුයි. "**යොනිසෝ උපපරික්ඛෛය්‍ය**" යනු කරුණු හේතු සහිතව පරීක්ෂා කර බලන්නේය යනුයි. "**කිං හි භික්ඛවෙ ඵෙණපිණ්ඩෙ සාරො**" යනු මහණෙනි, පෙණපිඬ හරයක් වන්නේ කෙසේද යනුයි. එය වියලී විනාශ වන්නේම ය. "**එවමෙව ඛො**" යම්සේ පෙනපිඬ නිස්සාර වූවක් වේද එසේම රූපය ද නිත්‍ය-සාර-ස්ථිර ආත්මසාර වශයෙන් ගත නොහැකි නිසරු වූවක් ම ය. යම්සේ ඔහුට මේ පෙනපිඬ, පාත්‍රයක් හෝ තලියක් හෝ සාදාගන්නෙමියි ගත නොහැක. ගත්ත ද එම ප්‍රයෝජනය ඉටුකර ගත නොහැක. පෙනපිඬ බිඳෙන්නේමය. එසේම රූපය ද නිත්‍යය. ස්ථිරය. මම්ය, මාගේය වශයෙන් ගත නොහැක. එසේ එය නොසිටියි. රූපය අනිත්‍යය. දුක්සහගතය. අනාත්මය. අසුභයක්ම වේ. මෙසේ රූපය ඵෙණපිඬක් හා සමාන ම වේ. යම්සේ පෙරණපිඬ කුඩා මහත් සිදුරුවලින් යුතුව - නොයෙක් සන්ධිවලින් ගටනා ලදුව, බොහෝ ජලජ ජීවීන්ට වාසස්ථානයක්ව පවතී ද එසේම රූපයත් කුඩාමහත් සිදුරු සහිතව, නොයෙක් සන්ධිවලින් ගටනා ලදුයේ වේ. කුල වශයෙන් පමණක් මෙහි අසූවක් පණු වර්ග වාසය කරති. එසේම ඔවුන්ගේ වදන ගෙයද, වැසිකිළිය ද, රෝහලද, සුසානයද වනුයේ මේ ශරීරයමයි. රූපයමයි. ඔවුහු අන් තැනක ගොස් ගැබින් බිහිවීම් ආදිය සිදු නොකරති. මෙසේ පෙණපිඬක් හා සමානය. යම්සේ පෙනපිඬ ආරම්භයේදී ඩෙබර ඇටයක් වී පසුව අනුපිළිවෙලින් පර්වත කුටයක් පමණ වනුයේද මෙසේ රූපයත් මුලදී කලලයක් පමණ වී, පසුව අනුපිළිවෙලින් ආහාර ලැබ, බඹයක් පමණ ද ගව-මීහරක්-ඇත් ආදීන්ගේ වශයෙන් පර්වත කුටයක් පමණ ද වේ. මත්ස්‍ය-කැසුබු ආදීන්ගේ ශරීරයෙන් නොයෙක් යොදුන් සිය ගණනක් විශාල වේ. මෙසේ ද පෙනපිඬ හා සමානය. යම්සේ පෙනපිඬ හටගත් කෙණෙහි හෝ බිඳෙයි. ටිකදුරක් ගොස් හෝ බිඳෙයි. ඉතා දුර ගොස් හෝ මුහුදට පැමිණ අනිවාර්යයෙන්ම බිඳෙයි. මේ අයුරින් රූපය ද කලල අවස්ථාවේ බිඳී වැනසෙයි. අබ්බුද ආදී අවස්ථාවකදී හෝ නැතිනම් පරමායුෂ වූ වර්ෂ සීයක් ගතකර හෝ අනිවාර්යයෙන්ම බිඳී-වැනසී යයි. මරණයේදී සුණුවිසුණුව යයි. මෙසේද පෙනපිඬක් හා සමානය.

"**කිංහි සියා භික්ඛවෙ වෙදනාය සාරො**" යනාදියෙහි වේදනාදියේද දියබුබුල හා මෙසේ සමානත්වය දතයුතුයි. යම්සේ දියබුබුල අසාරවේද එලෙසින්ම වේදනාව ද සාරවත් දෙයක් නොවේ. යම්සේ එය දුර්වලද ගත නොහැකි ද එය රැගෙන එලකයක් හෝ අසුනක් හෝ කිරීමට

නොහැකිද එය ගත් කෙනෙහි ම බිඳෙන්නේද වේ. මෙසේ වේදනාවද අබලය. බලයක් නැත. පැමිණ ගත නොහැක. නිත්‍ය-ස්ථිර වූවක් ලෙස ගත නොහැක. ගත්ත ද එසේ නොසිටියි. මෙසේ ප්‍රයෝජනයට ගත නොහැකි බැවින් වේදනාව ද දියබුබුලක් හා සමානය. යම්සේ ඒ ඒ දියබිඳුවෙහි දිය බුබුලක් උපදින්නේද බිඳෙන්නේ ද වේ. එය බොහෝ වේලා නොපවතියි. මෙසේ ම වේදනාව ද උපදින්නේ ද නිරුද්ධ වන්නේද බොහෝවේලා නොපවතින්නේ ද වේ. එක් ඇඟුරු සැණෙක කෙළ ලක්ෂ ගණනක් වේදනාවෝ ඉපිද නිරුද්ධ වෙති. යම්සේ දියබුබුල, දියතලය, දියබිඳුවක්, ජල තට්ටුවක් ඇදගෙන හා බැඳගෙන වාතය අල්ලාගැනීමෙන් යන සතර කරුණින් උපදියි. මෙසේ වේදනාව ද වස්තුව, අරමුණ, කෙලෙස් තට්ටුව හා ස්පර්ශ-එකට ගැටීම් යන සතර කරුණින් උපදියි. මෙසේද වේදනාව දියබුබුලක් හා සමාන ය.

සංඥාව ද අසාර වූ අරුතින් මිරිඟුවක් හා සමානය. එසේම ප්‍රයෝජනයකට ගත නොහැකි අර්ථයෙන් ද මිරිඟුවකි. මිරිඟුවෙන් දියගෙන බීමට හෝ නෑමට භාජන පුරවා ගැනීමට නොහැක. තවද මිරිඟුව ද කම්පා වේ. දඟලයි. හටගත් රළ වේගයක් මෙන් වැටහේ. මෙසේ නිල් සංඥා ආදී භේද ඇති සංඥාව ද සිල් ආදිය අනුභව කිරීම් වශයෙන් සැලේ. කම්පා වේ. යම්සේ මිරිඟුව මහජනයාට විලාප කියවයි ද පිරුණු වැවක් මෙන් ද පිරුණු නදියක් මෙන් ද දක්නට ලැබේ යැයි කියත්. මෙසේ සංඥාව ද විපුලම්භයකි. මෙය නීල් වූවකි. සුභ වූ සුබසහගත වූ නිත්‍ය වූවකැයි පවසයි. පීත (කහ) ආදී සංඥා කසිණයන්හිද මේ ක්‍රමයයි. මෙසේ විපුලම්භනයෙන් සංඥාව මිරිඟුවක් හා සමානය.

"අකකුසජානං" යනු ඇතුලත නොහටගත් ගණ දණ්ඩක් සංස්කාර ද අසාර වූ අරුතින් කෙහෙල්කඳක් හා සමානය. එසේම ප්‍රයෝජනයට ගත නොහැක. යම්සේ ගොණුස් ආදී දෙයක් සෑදීම සඳහා කෙසෙල්කඳේ කිසිවක් ගත නොහැක. එසේ ගත්තත් එය නොපවතියි. මෙසේ සංස්කාරයන් ද නිත්‍ය වශයෙන් ගැනීමට නොහැක. ගත්තද එසේම නොපවතියි. යම්සේ කෙසෙල්කඳ බොහෝ පත්‍ර-පතුරු ආදිය එකතුවී සෑදුනකි. මෙසේ සංස්කාර ස්කන්ධය ද බොහෝ ධර්මයන්ගේ එකතුවකි. යම්සේ කෙසෙල්කඳ නොයෙක් නොයෙක් ලක්ෂණ සහිත වූයේ ම පිටතින් පත්‍ර-පතුරු ආදියෙන් වර්ණවත්ය. එය අභ්‍යන්තර වශයෙන් හිස්ය. මෙසේම සංස්කාර ස්කන්ධය ද ස්පර්ශයේ ලක්ෂණ වශයෙන් අනිකක්මය.

චේතනාදීන්ගේ වශයෙන් අනිකකි. එකතුකර සංස්කාර ස්කන්ධ යැයි කියනු ලැබේ. මෙසේ සංස්කාර ස්කන්ධය කෙසෙල්කඳක් හා සමානය.

"චකඛුමාපුරිසො" යනු මස්+ඇසින් මෙන්ම ප්‍රඥාව නම් ඇසින් ද (පණසින්) යන දෙඇසම ඇති පුද්ගලයාය. ඔහුගේ මසැස වනාහි දුරු වූ පටල බිබිලි-ගඩු ඇති පිරිසිදු වූවකි. (ප්‍රඥා) පැණැසද අසාරත්ථය දැකීමට සමත් වූවකි.

විඤ්ඤාණය ද අසාර වූ අර්ථයෙන් හා ප්‍රයෝජනයට ගත නොහැකි අර්ථයෙන් එසේම මායාවක් බඳුය. යම්සේ මායාව; ස්වල්ප වූ කෙටි වැටහීමක්-ආකාරයක් දක්වයිද විඤ්ඤාණයද එසේය. විඤ්ඤාණය ඊටද වඩා ස්වල්ප වූද සරලම එළඹ සිටීමක්ද වේ. එකම සිතින්ම පුරුෂයා පැමිණියාක් මෙන් ගියාක් මෙන් සිටියාක් මෙන් හුන්නාක් මෙන් වැටහේ. නමුත් සත්‍ය වශයෙන් පැමිණෙන කාලයේ සිත අනිකකි. ගිය කාලයේ සිත වෙනත් එකකි. සිටීමේදීත් හිඳීමේදීත් වෙන් වෙන් වූ සිත් පවතියි. මෙසේද විඤ්ඤාණය මායාව හා සමානය. මායාවද මහජනයා රවටයි. යම් කිසිවක් මෙය රන්ය, රිදීය, මුතුයැයි ජනයා රැවටී ගනියිද ගන්වයිද එසේම විඤ්ඤාණයද මහජනයා රවටයි. එකම සිතින් පැමිණීමත්, යෑමත්, සිටීමත් හා හිඳීමත් කළ බව අවබෝධ කරවයි. නමුත් සත්‍ය වශයෙන් පැමිණීමේදී සිත අනිකකි. යෑමේදී හා සෙසු ඉරියව්වලදී සිත අනිකක්මය. මෙසේ විඤ්ඤාණය ද මායාවක් හා සමානය.

"භූරිපඤ්ඤන" යන තියුණු ප්‍රඥා ඇති, එමෙන්ම මහත් පැතිරුණු ප්‍රඥාවෙන් වූවහු විසින්ය. යුක්ත "ආයු" යනු ජීවිතින්ද්‍රියයි. (ජීවත්වීමේ ශක්තියයි.) "උසමා" යනු කර්මජ තේජෝ ධාතුවයි. "පරහතතං" යනු නානාවිධ වූ පණු වර්ගයන්ට ආහාර වී යනුයි. "එතාදිසායං සතතානො" යනු මොහුගේ ප්‍රවේණිය (පැවැත්මේ ක්‍රියාවලිය) මෙබඳුය. මළ තැනැත්තා සොහොන දක්වා ගෙනයනු ලැබේ. "මායායං බාලලාපිනී" යනු මේ විඤාන ස්කන්ධය යහපත් දෙයකැයි බාලයන් ලවා කියවන මායාවක් නම් වේ. "වධකො" යනු කරුණු-හේතු දෙකකිනි. මේ ස්කන්ධ සංඛ්‍යාත වූ වධකයා ඔවුනොවුන් නසාලන බැවින්ද ස්කන්ධ ඇති කල්හි වධයක් මෙන් ප්‍රකටවන බැවින්ද එනම් වේ. එකම පඨවි ධාතුව බිඳෙන කල්හි සෙසු ධාතු ද රැගෙනම එය බිඳේ. ආපෝ ආදී ධාතු ද මෙසේමය. රූපස්කන්ධය බිඳෙනවිට අරූප ස්කන්ධය ද රැගෙන බිඳෙයි. එසේම අරූප

ස්කන්ධාදියෙහි වේදනාදිය ද සංඥා ආදියේ මේ සතර ද "වස්තුව", "රූපය" යැයි මෙසේ ඔවුනොවුන්ට පීඩාවීමෙන් මෙහි වධක බව දතයුතුයි.

ස්කන්ධාදිය ඇතිකල්හි වධබන්ධන-සිදීම් ආදිය හටගනියි. මෙසේ මේ ස්කන්ධ පවත්නා කල්හි වධ ස්වභාවය ද වධකත්වය ද දතයුතුයි. "සබ්බ සංයොගං" යනු සියලු දසවැදෑරුම් වූ සංයෝජනයන්ය. "අච්චුතංපදං" යන නිර්වාණයයි.

තෙවන සූත්‍රයයි.

21. 5. 4.

සිවුවන සූත්‍රයේ - "සසසතිසමං" යනු මහාමේරුව, මහපොළව, සඳ-හිරු ආදී සැමදා පවතින්නා වූ ශාස්වත වස්තු සමවූ යනුයි. "පරිත්තං ගොමය පිණ්ඩං" යනු අල්පමාත්‍ර වූ මීමලක් පමණ වූ ගොමපිඩක්ය. කොතැනින් මේ ගොමපිඩ ලැබුණේද? ගොමමැටි ගෑම පිණිස එළවූ ගොම ගොඩකින් ගන්නා ලදයි ඇතැම්හු පවසති. මේ දේශනාවේ අර්ථ මනාව අවබෝධ කරවීමට ඍද්ධියෙන් මවා අතට පත්වූවක් කරන ලදයි දතයුතුයි. "අත්තභාව පටිලාභෝ" යනු ලබන ලද ආත්මභාවයයි. "නයිදං බ්‍රහ්මචරියවාසෝ පඤ්ඤායෙථ" යනු මේ මාර්ග බ්‍රහ්මචරිය වාසය නම් නොපනවන්නේය යනුයි.

මාර්ගය වනාහී තෙභූමික සංස්කාරයන්ගේ සසර පැවැත්ම නැවැත්වීමෙන් ඇතිවේ. "ඉදින් මෙපමණ වූ හෝ ආත්මභාවය නිත්‍ය වන්නේ නම් මාර්ගය ඇතිවුවත් සංස්කාර ධර්මය නැවැත්වීමට නොහැකි වන්නේයැ"යි බ්‍රහ්මචරිය වාසය නොපනවන්නේය. දැන් කිසි සංස්කාරයක් නිත්‍ය වන්නේ නම්, මවිසින් මහා සුදස්සන රජ දවස අනුභව කළ සම්පත් ද නිත්‍යවිය යුතුය. නමුත් එය අනිත්‍ය වූයේ යැයි එම පුවත දක්වීමට "භූත පුබ්බාහං භික්ඛූ රාජා අහොසිං" යනාදිය වදාළහ. එහි "කුසාවතී රාජධානිපපමුඛානී" යනු කුසාවතී රාජධානිය ඒ නගරයන්ගෙන් ප්‍රමුඛ විය. සියල්ලට ම ශ්‍රේෂ්ඨ විය යන අර්ථයි. "සාරමයානී" යනු රත්සඳුන් හරමය වූ යනුයි. හිස තබන කොට්ට සියල්ලම නූල්වලින්ම කරන ලදී. "ගොණකත්ථතානී" යනු සතරහලකට අධික වූ ගනකම ඇති කළු පලසින් අතුරන ලද මහා පිටක් වේද එය "කෝජව" යැයි කියත්.

"**පටිකජ්ජතානි**" යනු දෙපසින් ඉතා සියුම් ලෝමයෙන් කරන ලද සුදු කම්බිලි අතුරන ලද යනුයි. "**කාදලිමිගපවරපච්චත්ථරණානි**" යනු කෙසෙල්මුව සමින් කරන ලද උතුම් පලස්-ඇතිරිලි අතුරන ලද යනුයි. ඒ අතුරන ලද සුදු ඇතිරිලි මත කෙසෙල් මුවසම් අතුරා මසා කරන ලද පලස් "**ස උභතොවට්ටිදානී**" යනු ඇඳියන් සහිතව මත්තෙහි බඳින ලද රතුවියන් සහිත යන අර්ථයි. "**උභතො ලොහිතකූපධානානි**" හිස්කබන හා පාතබන රතුපාට කොට්ට දෙපස තැබූ කව්විචි ඇති යනුයි. "වෙජයන්ත රථපපමුඛානි" යනු මෙහි වෛජයන්ත නම් ඒ රජුගේ රියයි. යමක රෝදවල ඉඳුනීල මැණිකෙන් කල නාභිය වේද, සප්ත රත්නයෙන් කළ රෝද දැති වේද, පබලුමය නිම්වලල්ල වේද, රිදීමය අක්ෂය වේද, ඉඳුනිල මාණික්‍යමය උප අක්ෂයන් වේද, රිදීමය බොන් ලීය වේද, ඒ රථය ඒ සියලු රථ අතර ප්‍රමුඛ-අග්‍ර වේ. "**දුකූල සඤ්ඡානි**" දුහුල් අතුරන ලද යනුයි. "**කංසූපධාරණානි**" යනු රිදීමය දොවන බඳුන්ය. "**වත්ථ කොටි සහසසානි**" යනු කැමති පරිදි අනුභව කරන්නේ යැයි දිය නා සිටි කාලයේ එළවන ලද වස්ත්‍ර සඳහා ම මෙය කියන ලදී. "**හත්ථාභිහාරෝ**" ඉදිරියට එළවිය යුතු බත්ය. "**යමහං තෙන සමයෙන අජ්ඣාවසාමි**" යන යම්තැනක වසන්නෙමිද එය එකම නගරය වේ යනුයි. ඉතිරි නගරයන්හි දූපුතුන් මෙන් දැසි කම්කරුවෝ ද වාසය කළහ. ප්‍රාසාද-කුළු ගෙවල් ආදියෙහිද මෙසේමය. කව්විචි ආදියේ ද එකක් ම රජු පරිහරණය කරයි. ඉතිරිය පුත්‍රාදීන්ගේ පරිහරණයට පවතියි. ස්ත්‍රීන් අතුරින් ද එක් තැනැත්තියක් ම ලඟට පැමිණෙන්නීය. සෙසු ස්ත්‍රීහු පිරිවරාගෙන සිටිනු පමණි. "**වෙලාමිකා**" යනු බමුණකුට දාව ක්ෂත්‍රිය කාන්තාවකගේ හෝ ක්ෂත්‍රියයෙකුට දාව බැමිණියකගේ කුසින් උපන් යනුයි. "**පරිදහාමි**" යනු එකම වස්ත්‍ර යුගලයක් පොරවමි. සෙසු වස්ත්‍ර පිරිවරාගෙන හැසිරෙන පුරුෂයන් සොළොස් ලක්ෂ අසූදාහකට වන්නේයැයි දක්වයි. "**භුඤ්ජාමි**" යනු උතුම් ප්‍රමාණයෙන් බත නැලියක් පමණ අනුභව කරමි යනුයි. සෙසු බත් පිරිවරාගෙන හැසිරෙන අටලක්ෂ හතලිස් දාහක් පුරුෂයන්ට වේයැයි දක්වයි. එක් පිසූ නැලියක බත් පුරුෂයන් දස දෙනෙකුට ප්‍රමාණවත් වේ.

මෙසේ මේ මහාසුදස්සන රජදවස තිබූ සම්පත්ති දක්වා දැන් එහි අනිත්‍යභාවය දක්වන සේක් - "**ඉති ඛො භික්ඛු**" යනාදිය වදාළහ. එහි "**විපරිණතා**" යනු ප්‍රකෘති දහනයෙන් නිවුණු පහනක් මෙන් නොපැණුවූ බවට ගිය යනුයි. "**එවං අනිච්චා ඛො භික්ඛු සංඛාරා**" යනු මෙසේ වී නොවීම් අර්ථයෙන් අනිත්‍යය යනුයි.

මෙපමණකින් භාග්‍යවතුන් වහන්සේ, යම්සේ පුරුෂයෙක් රියන් හතක් උස සපු ගසට හිණිමගක් බැඳ, නැග සපුමල් ගෙන හිණිමග අත්හරිමින් බසින්නේ ද එලෙසින්ම හිණිමඟක් බඳින්නාක් මෙන් නොයෙක් වර්ෂ කෙළ ලක්ෂ ගණනකට ඉහතින් වූ මාහසුදස්සන රජුගේ සම්පත්තියට නැග, එම බස්නා සේක්. "එවං අනසසාසිකා" යනු මෙසේ සිහිනෙන් බිවූ පානයක් මෙන් ද සිහිනෙන් ගෑ සඳුනක් මෙන් ද ආශ්වාද රහිතව යනුයි. මෙසේ මෙම සූත්‍රයේ අනිත්‍ය ලක්ෂණය කියන ලදී.

සිවුවන සූත්‍රයයි.

21. 5. 5.

පස්වන සූත්‍රයේ එන පදයන්ගේ අර්ථ මුලදී පැවසූ පරිදිමය.

පස්වන සූත්‍රයයි.

21. 5. 6.

සවැනි සූත්‍රය ද එසේමය. අවබෝධ කරන්නාගේ අදහස අනුව දෙසන ලදී.

සවැනි සූත්‍රයයි.

21. 5. 7.

සත්වන සූත්‍රයේ - "යං මහා සමුදෙදා" යනු යම් සමයක සූර්යයන් පස්දෙනෙකු පහළවූ කල්හි (නැගීසිටිවිට) මහමුහුද වියලේ යනුයි. "දුකඛසස අනතකිරියං" යනු චතුරාර්ය සත්‍යය අවබෝධ නොකර, අවිද්‍යාවෙන් වසාගන්නා ලද්දේම සසර පවතින දුකෙහි අවසන් කිරීම, ක්ෂය කිරීම නොදෙසමි. "සාගදදූලබදෙධා" යනු දම්වැලින් බැඳි සුනඛයා යනුයි. "ඛීලෙ" යනු පොළවෙහි තලා මට්ටම් කළ මහා හුලකය. "ථමෙහ" යනු හාරා තබන ලද, සිටවූ ටැඹෙහිය. "එවමෙව ඛො" යන මෙහි සුනඛයා මෙන් සසර පවතින සංසාරික වූ බාල පුහුදුන් පුද්ගලයාත් දම්වැල මෙන් දෘෂ්ටියත් (වැරදි පිළිගැනීම්) ටැඹ කණුව මෙන් සත්කාය

දෘෂ්ටියත් (සිය කය සාර වශයෙන් ගැනීමත් දතයුතුයි. දම්වැලින් ටැඹෙහි බඳින ලද සුනඛයාගේ ටැඹ වටා දිවීම පමණක් වීම මෙන් දෘෂ්ටි තණ්හාවෙන් කය සාර වශයෙන් ගෙන බැඳුණු පුහුදුන් පුද්ගලයාගේ සිය ශරීරය වටා දිවීම දතයුතුයි.

සත්වන සූත්‍රයයි.

21. 5. 8.

අටවන සූත්‍රයේ "**තසමා**" යනු යම්හෙයකින් දෘෂ්ටි නම් දම්වැල නිසා තණ්හාව නම් රැහැනින් තම ශරීරය සාර වශයෙන් ගැනීම නම් ටැඹෙහි බඳිනා ලදුයේ, සසර පවත්නා බාල පුහුදුන් පුද්ගලයා සෑම ඉරියව්වකම ස්කන්ධ පංචකය නිසඝ පවතියි. යම් හෙයකින් බොහෝ කාලයක පටන් මේ සිත රාගයෙන්, ද්වේෂයෙන්, මෝහයෙන් කිලිටු වූයේද එහෙයිනි. "**චිත්ත සංකි ලෙසා**" යනු මනාසේ නාගත් සත්ත්වයෝ සිත කිලිටි වීමෙන්ම කිලුටට පත්වෙති යනුයි. අශුචි සහිත ශරීරයක් ඇති පුද්ගලයාගේ සිත පිරිසිදු නම් ඔහු පිරිසිදු සත්ත්වයෙකි. එනිසා පැරැන්නෝ මෙසේ කීහ.

"මහර්ෂීන් වහන්සේ බුදුපියාණන් වහන්සේ ශරීරය කිලුටුකල්හි මානවයෝ කිලුටුවෙන බවත් ශරීරය පිරිසිදු කළ කල්හි පිරිසිදු වන බවත් නොදෙසූහ."

"මහර්ෂීන් වහන්සේ මානවයෝ සිත කිලුටු වනවිට, කිලුටට පත්වන බවත් සිත පිරිසිදු වනවිට සත්ත්වයෝද පිරිසිදු බවට පත්වන බවත් වදාළහ."

"**මරණ නාම චිත්තං**" යනු බ්‍රාහ්මණ, පාසාණ්ඩාදීගේ සිත විවරණ චිත්ත" (සසර හැසිරෙන සිත) නම් වේ. ඔවුහු වස්ත්‍ර කොටුවක් සාදාගෙන, එහි නානාප්‍රකාර වූ සුගති දුගති වශයෙන් සැපසම්පත් හා විපත් පිළිබඳව ලියවා - "මේ කර්මය කොට මෙහි උපදියි." "මේ ක්‍රියාව කොට මෙහි උපදියි" ආදී වශයෙන් දක්වමින් ඒ සිත ගෙන හැසිරෙති. "**චිතෙතනෙව චිතතිතං**" යනු විසිතුරු ආකාරයෙන් සිතා කරන ලද බැවින් සිතින්ම විසිතුරු කරන ලද යනුයි. "**චිතතඤ්ඤව චිතතතරං**" යනු ඒ සිතේ

උපාය පර්යේෂණ සිත ඊටද වඩා විසිතුරුය යනුයි. **"තිරචඡානගතා පාණා චිත්තෙනෙව චින්තිතා"** යනු කර්ම චිත්තයෙන්ම විසිතුරු කරන ලද යනුයි. ඒ කර්ම චිත්තය වනාහී මේ වටු-තිත්වටු ආදීන්ගේ "මෙසේ සිත් වන්නෙමු"යි උත්සාහ කිරීමක් නම් නැත. කර්මය විසින් සත්ත්වයා නියමිත යෝනියට පමුණුවයි. ඔවුන් චිත්තභාවයන් ඉන්පසු එම යෝනිය මුල් කරගෙන පවතී. යෝනියට සපැමිණි ඒ සත්ත්වයෝ ඒ ඒ යෝනියටම ගැලපෙන සිත් ඇත්තෝ වෙති. මෙසේ යෝනියෙන් සිදුකරන චිත්ත ස්වභාවය දතයුතුයි. කර්මයෙන් යෝනිය තීරණය කරන ලදැයි දතයුතුයි. තවද මේ සිත නම් සහජාත වූවකි. එක්ම උපන් ධර්ම චිත්තතාවයෙනුත්, භූමි චිත්තතාවයෙනුත්, වස්තු චිත්තතාවයෙනුත්, ද්වාර චිත්තතාවයෙනුත්, ආරම්මණ චිත්තතාවයෙනුත් කර්මය නානාවිධ වේ. කර්මයේ නානාවිධ භාවයෙන් කර්මය නානාකාර බව මුල් වූ ලිංග නානාවිධ බව, සංඥා නානාවිධ බව, ව්‍යවහාර නානාවිධ බව ආදී වශයෙන් අනේකවිධ වූ චිත්තයෝ නිෂ්පාදනය කිරීම් වශයෙන් තිරිසන් ගතවූවන්ගේ ද සිතින් සිත විසිතුරුම වේ යැයි දතයුතුයි. **"රජකො"** යනු වස්ත්‍රයන්හි සායම් පොවා රූප අඳින්නෙක්ය. ඔහු අදක්ෂයෙක් නම් අප්‍රිය රූප අඳියි. දක්ෂයෙක් නම් ප්‍රිය වූ දර්ශනීය වූ රූප අඳියි. මේ අයුරින්ම පුහුදුන් පුද්ගලයා අකුසල් සිතින් හෝ ඤාණය රහිත වූ කුසල් සිතින් හෝ චක්ෂු ආදී ඉන්ද්‍රිය සම්පත්වලින් හීන වූ විපරීත වූ විකෘති රූපයක් උපදවයි. ඤාණ සම්ප්‍රයුක්ත (මනාව යෙදුණු) කුසල් සිතින් චක්ෂු ආදී ඉන්ද්‍රිය සම්පත් සහිත වූ ඉතා ලස්සන රූපයක් උපදවයි.

අටවන සූත්‍රයයි.

21. 5. 9.

නවවන සූත්‍රයේ - **"සෙය්‍යථාපි භිකඛවෙ කුකකුටියා අණ්ඩානී"** මෙහිදී කලු පක්ෂය හා සුදු පක්ෂය වශයෙන් උපමා දෙකක් පවසන ලදී. ඒවා අතුරින් කළු පක්ෂයේ උපමාව අර්ථයෙන් හීනය. අනික අර්ථයෙන් පිරිපුන්ය. සුදු පක්ෂයේ (යහපත් පැත්තේ) උපමාවේ අර්ථ මෙසේ දතයුතුයි. "සෙය්‍යථා" යනු උපමා අර්ථයේ නිපාතයකි. **"අපි"** යන්න මෙහි ගෞරවාර්ථයේ යෙදුණි. පද දෙකම එක්වී **"සෙය්‍යථාපි නාම භිකඛවෙ!"** (මහණෙනි! යම්සේ) යනුවෙන් දක්වයි. **"කුකකුටියා අණ්ඩානි අටඨවා දසවා දවාදවා"** යනු මෙහි කිකිළියට, කියන ලද ආකාරයෙන් ම නොව, ඊට වඩා අඩුවැඩි වශයෙන් බිත්තර දමයි. වාග් මධුරත්වය සඳහා මෙසේ

කියන ලදී. (වචනයන්ගේ මටසිලුටු බව) මෙසේ ලොව මටසිලුටු වදන් සෑම බසකම ඇත. **"නානසස"** යනු **"නානි අසසු"** ඒවායෙහි යන අර්ථයි. **"කුකකුටියා සමමා අධිසයිතානි"** යනු ඒ බිජු ඉපිදවූ කිකිළිය පියාපත් දිගහැර ඒ බිජු මත්තෙහි නිදන්නී මැනවින් රක්නා ලද්දිය යනුයි. **"සමමා පරිසෙදිතානි"** යනු කලින් කලට ඍතු ගන්වමින් මනාව හත්පස මැනවින් තෙත්කළ, මැනවින් උණුසුම් කළ යනුයි. **"සමමා පරිභාවිතානි"** කලින් කලට මනාව හාත්පස වඩන ලද යනුයි. කුකුළු ගඳ මනාව ගන්වන ලද යන අර්ථයයි. **"කිඤචාපි තසසා කුකකුටියා"** යනු ඒ කිකිළිය මේ කටයුතු තුන සිදු කිරීමෙන් අප්‍රමාදීව ක්‍රියා කිරීමෙන් මෙසේ ආශාවක් පහළ නොවූවත් යනුයි. **"අථඛො භබබාව තෙ"** යනු ඉක්බිති ඒ කුකුළු පැටවු කී ලෙසින් ම සුවසේ නික්මීමට හැකියාව ලබත්මය යනුයි. මේ කිකිළියන් දෙදෙනාගෙන් මෙසේ තමා දැමූ බිජු තුන් අයුරින්ම මනාව පරිපාලනය කරන කිකිළියගේ බිත්තර කුණු නොවේ. ඒවා මැනවින් තෙත් වූයේ මුහුකුරා යයි. කටුව සිහින් වේ. පයේ නියපොතු ද මුවතුඩ ද රළු වේ. තමාම මුහුකුරා යෑමට පත් වේ. කටුව සිහින් වූ බැවින් ඒ අතරින් පිටත ලෝකයේ ඇති ආලෝකය පෙනේ. එනිසා බොහෝකලක් අත්පා හකුළුවාගෙන, සම්බාධ සහිතව නිදන අපට මේ පිටත ආලෝකය පෙනේ. එය දැන් අපට සැපවිහරණයක් වන්නේ යැයි නික්මෙනු කැමතිව කටුවට පයින් ගසති. ගෙල දිගු කරති. එවිට ඒ කටුව දෙකට බිඳේ. එවිට පියාපත් සොළවමින් ඒ ක්ෂණයට අනුරූපව තදකරමින් නික්මෙන්නේමය. නික්මී ගම-ගෙකත බබුළුවමින් හැසිරෙති.

"එවමෙව ඛො" යනු මේ උපමා සැසඳීමයි. එය මෙසේ අර්ථයෙන් සසඳා අර්ථ දතයුතුයි. ඒ කිකිළිය බිත්තර කෙරෙහි තුන් කටයුතු සිදුකිරීම මෙන් මේ සසුනේ භික්ෂුව භාවනාවෙහි යෙදුණු කාලය දතයුතුයි. කිකිළිය බිජුවලට කළයුතු ක්‍රියා තුන නොකිරීමෙන් ඒවා කුණුවන්නාක් මෙන් භාවනා කිරීමෙහි යෙදුණු භික්ෂුවගේ ත්‍රිවිධ අනුපස්සනා සම්පාදනය කිරීමෙන් විදර්ශනා ඥානය නොපිරිහේ. කිකිළිය ත්‍රිවිධක්‍රියා කිරීමෙන් තෙත් වූ සාරය සම්පූර්ණයෙන් ගෙන වැඩෙන බිත්තර මෙන් ඒ භික්ෂුව ත්‍රිවිධ අනුපස්සනා සම්පාදනය කිරීමෙන් භවතෘයට අනුගත වූ තෘෂ්ණා සාරය සම්පූර්ණයෙන් නැතිකිරීම දතයුතුයි. බිත්තර පාලනය කරන කටුවේ තුනී වීම මෙන් ඒ භික්ෂුවගේ අවිද්‍යා අණ්ඩකෝෂයේ තුනීවීම දතයුතුයි. කුකුළු පැටවුන්ගේ පා නිය මුවතුඩ ආදියේ තදවීම-රළුවීම මෙන් භික්ෂුවගේ විදර්ශනා ඤාණයේ තියුණු ප්‍රකට ශූරභාවයෙන් දතයුතුයි. කුකුළු පැටවුන්ගේ පරිණාමයට (මුහුකුරා යන) කාලය මෙන් භික්ෂුවගේ විදර්ශනා ඤාණයේ

පරිණාමී කාලය, වැඩෙන කාලය හා ගර්භග්‍රහණ කාලය දතයුතුයි. කුකුළු පැටවුන්ගේ පා-නියවලින් හෝ මුවතුඩින් හෝ බිත්තර කටුව බිඳ, පියාපත් ගසා දමා සුවසේ බිජුවට මෙන් නික්මෙන අවස්ථාව මෙන් භික්ෂුවගේ විදර්ශනා ඤාණය ගැබ්ගන්වා හැසිරෙන්නහුට ඊට සුදුසු වූ සුදුසු වූ ඍතු හෝ සුදුසු වූ භෝජන හෝ සුදුසු වූ පුද්ගලයන් හෝ සුදුසු වූ ධර්ම ශ්‍රවණයන් හෝ ලැබ, එක් අසුනකම හුන්නේ - විදසුන් වඩා අනුපිළිවෙලින් අවබෝධ කරගත් අර්හත් මාර්ගයෙන් අවිද්‍යාව නම් බිත්තර කටුව දෙකඩ කර, අභිඥාවන් නමැති පියාපත් විහිදුවා සුවසේ රහත්බවට පත්වූ අවස්ථාව දතයුතුයි. යම්සේ කුකුළු පැටවුන්ගේ මුහුකුරා යන ස්වභාවය දැන මව ද බිත්තර කටුව බිඳින්නීය. එලෙසින්ම එබඳු භික්ෂුවගේ ඥානයේ මුහුකුරා ගිය බව දත් බුදුපියාණන් වහන්සේ ද,

"ප්‍රාණීන්ට තමාගේ සෙනෙහස, බැඳීම සිඳ දැමීමට සරත් කාලයේ කුමුදු මලක් මෙන් සුගතයන් වහන්සේ විසින් දෙසූ ශාන්ති මාර්ගයට යොමු කරවන නිවණම වදාරණු මැනවි."

ආදී වශයෙන් ආලෝකය පතුරුවමින් දෙසනු ලබන ගාථාවකින් අවිද්‍යාව නම් බිත්තර කටුවට පහර දෙන සේක. උන්වහන්සේ ගාථාව අවසානයේ අවිද්‍යාව නම් බිත්තර කටුව බිඳ, රහත් බවට පත්වන සේක. එතැන් පටන් ඒ කුකුළු පැටවුන් ගම්-කෙත් ශෝභමාන කරමින් සැරිසරන්නාක් මෙන් මේ ක්ෂීණාස්‍රවයන් වහන්සේලා ද නිවණ අරමුණු කරගත් ඵලසමවතට පැමිණිසේක් සංසාරාමාදිය ශෝභමාන කරමින් හැසිරෙති.

"පලගණ්ඩසස" යනු වඩුවෙකුගේය. ඔහු වනාහී එල්බෙන සංඛ්‍යාත වූ නැතිනම් ලඹ කැටය නම් වූ උපකරණය මත තීරණය කර දව හෝ ගඩොල් තබනුයේ 'පලගණ්ඩ' (මෙසන් වැඩ කරන්නා) නම් වේ. "වාසිජටෙ" වෑ දඬුව (වෑය) අල්ලා ගන්නා තැනය. (මිට) "**එතකං වත** මෙ අජ්ජ ආසවානං ඛීණං" යනු පැවිදි වූවහුට වනාහී පැවිදි වී සසර කෙටිකර ගැනීමෙන් දෙසීමෙන්, විමසීමෙන්, නුවණින් මෙනෙහි කිරීමෙන් වත් පිළිවෙත් පිරීමෙන් ද නිතරම ආශ්‍රව ක්ෂය වේ. මෙසේ ක්ෂය වනවිට එම "ආශ්‍රවයන්ගේ මෙපමණ ප්‍රමාණයක් අද ක්ෂය විය, ඊයේ මෙපමණ ක්ෂය විය" යනුවෙන් උන්වහන්සේලාට ඇතිවන ඥානය නොමැත යන අර්ථයයි. මේ උපමාවෙන් විදර්ශනාවේ ආනිසංස දක්වන ලදී. "**හෙමන්තිකෙන**" යනු ශීත කාලයේ යනුයි. "**පටිපපසසමභනති**" යනු ස්ථිර භාවයෙන් පිරිහී යති.

"එවමෙව බො" යනු උපමා සැසඳීමයි. මෙහි මහමුහුද මෙන් බුදුසසුන දකිය යුතුයි. යෝගාවචර භික්ෂු නැව මෙනි. නැව මහමුහුදේ සම්පූර්ණයෙන්ම පවත්නාක් බඳු මෙන් මේ භික්ෂුව වස් පහකට අඩු කාලයේ ආචාර්ය-උපාධ්‍යාය යටතේ පුහුණුවීම දතයුතුයි. නැව මහා සමුදුයේ තිබීමෙන් බන්ධනයන් තුනීවන්නාක් මෙන් භික්ෂුවගේ පැවිදි වීමෙන් උදෙසීම්-විමසීම් ආදියෙන් ම සංයෝජනයෝ තුනී වෙති. නැව ගොඩබිමට ගෙනා (නැගූ) කාලය මෙන් භික්ෂුවගේ නිසගැනීමෙන් මිදී කමටහන් ගෙන කැලයේ භාවනා කරන කාලය දතයුතුයි. දාවල අවු සුලඟින් පීඩාවීම්, ස්පර්ශ වීම් මෙන් විදර්ශනා ඥානයෙන් තණ්හා බැඳීම්වලට පීඩා වේ. ස්පර්ශ වේ. රාත්‍රියේ හිම දියෙන් තෙම්ම මෙන් කමටහන් නිසා උපදින ප්‍රීති ප්‍රමෝදයෙන් සිත තෙමී යයි. රෑ-දාවල් අවුවැසි මගින් මෙන්ම හිමදියෙන් ද වියලීමෙන්, පිරිතැවීමෙන් බැඳුම් දුර්වල වන්නාක් මෙන් එක්දිනක් යෝග්‍යවූ ඍතු ආදිය ලැබූ විදර්ශනා ඤාණයෙන් හටගත් ප්‍රීතිප්‍රමෝදයෙන් සංයෝජනයන් බොහෝසෙයින් දුර්වල වේ. වැසිකල වූ මෙසය මෙන් අර්හත් මාර්ග ඥානය දතයුතුයි. වැස්සෙන් වැටුණු ජලයෙන් නැවේ බැඳුම් කුණුවන්නාක් මෙන් ඇරඹූ විදර්ශනාවේ අරුත්තහුගේ රූප සප්තකය ආදී වශයෙන් විදර්ශනාව වඩන්නේ එහි ඇතුල්වෙමින් එහි ඇතුල්වෙමින්-පිටවෙමින් විදර්ශනා කමටහන් වඩා එක්දිනක් යෝග්‍යවූ ඍතු ආදිය ලැබ, එක් ආසනයකම හුන්නේ අර්හත් ඵලාධිගමය සිදුවේ. කුණුවූ බැඳීම් ඇති නැව ස්වල්ප කාලයක් තිබෙන්නාක් මෙන් සංයෝජන ක්ෂය කළ රහතන් වහන්සේ මහජනයාට අනුග්‍රහ පිණිස ආයු ඇතිතෙක් මෙලොව වැඩවසති. බැඳුම් කුණු වූ නැව අනුපිළිවෙලින් බිඳී නොපවතින ස්වභාවයට පත්වන්නාක් මෙන් රහතන් වහන්සේගේ තමාගේ යැයි ගත් ස්කන්ධ බිඳියෑමෙන් අනුපාදිසේස නිර්වාණ ධාතුවෙන් පිරිනිවෙන සේක් නොපවතින ස්වභාවයට පැමිණේ. මේ උපමාව යෙදීමෙන් සංයෝගයන්ගේ දුබලතාව ප්‍රකට කරන ලදී.

නවවන සූත්‍රයයි.

21. 5. 10

දසවන සූත්‍රයේ - **"අනිච්චසඤ්ඤා"** යනු අනිත්‍යයි. අනිත්‍යයි යනුවෙන් වඩන්නහුට උපන් සංඥාව. **"පරියාදියති"** යනු ක්ෂය වේ. ගෙවේ යනුයි. **"සබබං අසම්මානං"** යනු නව වැදෑරුම් වූ අස්මි මානයයි.

"මූලසනනානකානි" යනු පැතිරසිටි සියලු මුල්මහනගුලක් මෙන් අනිත්‍ය සංඥාව දතයුතුයි. කුඩා අනුකුඩා වූ පැතිරගිය මුල් සමූහය මෙන් ක්ලේෂයෝ දතයුතුයි. ගොවියා සීසානවිට නඟුලෙන් එම මුල් සිඳ දමන්නාක් මෙන් යෝගාවචර භික්ෂුව ද අනිත්‍ය සංඥාව වඩනුයේ, අනිත්‍ය සංඥා ඥානයෙන් ක්ලේෂයන් වනසා දමනුයේ යැයි මෙහිදී උපමා සැසඳීමද දතයුතුයි. "මධුනානි" යනු යටට හළයි. සොලවයි යනුයි. "නිදුධුනානි" යනු පොළයි යනුයි. "නිවෙඡදෙති" පොළා ඉවත දමයි යනුයි. මෙහිද ක්ලේෂයෝ බබුස්තණ මෙනි. (සවැන්න මුල්) කැපීම සිඳීම මෙන් අනිත්‍ය සංඥා ඤාණය දතයුතුයි. මේ අර්ථයෙන් උපමාව සැසඳිය යුතුයි. "වණටචඡිනනා" යනු තියුණු ඊතලයකින් තටුව සිඳිනලද යනුයි. "තදහටයානි භවනති" යනු ඒ අඹවල්ල අනුව යයි. ඒ වැටෙන්නා වූ අඹ බිමට වැටේ. මෙහි අඹවල්ල මෙන් ක්ලේෂයෝ දතයුතුයි. අනිත්‍ය සංඥාව තියුණු ඊතලයක් මෙනි. යම්සේ නටුවෙන් සිඳුණු අඹවල්ල ම, අඹවල්ලේ සියලුම අඹ බිමට වැටේ ද එලෙසින්ම අනිත්‍ය සංඥාවෙන් කෙලෙසුන්ට මූලික වූ අවිද්‍යාව නැසූකල්හි සියලුම කෙලෙස් වැනසීමට පැමිණේ. මේ උපමා සන්සන්දනය යි. "කුටං ගමා" යනු කැණිමඩලට ගියාහුය. "කුට නින්නා" යනු පිවිසීම් ස්වභාවයෙන් කැණිමඩලෙහි නැමී පවතියි යනුයි. "කුට සමොසරණා" යනු කැණිමඩල අනුව පැතිර සිටී යනුය. මෙහිද අනිත්‍ය සංඥාව කැණිමඩල මෙනි. සිවුභූමික කුසලධර්මයෝ ගොණුසි මෙනි. සිවුභූමික කසලධර්මයෝ ගොණුසි මෙනි. යම්සේ සියලු ගොණුසි අග් කැණිමඩලෙහි පිහිටියේ ද එසේම සියලු කුසල ධර්මයෝ අනිත්‍ය සංඥාව ප්‍රධානකොට ඇත. අනිත්‍ය සංඥාව ලෞකික හා ඒ ලෞකික කුසලයන්ට අග්‍ර ප්‍රධාන වූයේ ද ලෝකෝත්තර සිත්වල දී කෙසේම් අග්‍ර වේද? ඒවායෙහි ද ලැබීම් කරන අර්ථයෙන් අග්‍රවූයේ යැයි දතයුතුයි. මේ ක්‍රමයෙන් සියලු උපමා සැසඳීම අවබෝධ කටයුතුයි. මෙහි මුල් උපමා තුනෙහිදී අනිත්‍ය සංඥාවේ කෘත්‍යය ද පසු උපමාවන්හි දී අනිත්‍ය සංඥාවේ ඵලයද දැක්වේ.

පස්වන පුපඵ වර්ගයයි.

මජ්ඣිම පණ්ණාසකය සමාප්තයි.

21. 1. 1.

අන්ත වර්ගයේ පළමු සූත්‍රයෙහි "අනත්තා" යනු කොට්ඨාශයෝ ය. මේ සූත්‍රයේ චතුරාර්ය සත්‍ය වශයෙන් පංචස්කන්ධයෙහි යොදා " අන්ත" යන වචනයෙන් අවබෝධ කරගන්නවුන්ගේ අදහස් අනුව දේශනා කරන ලදහ.

පළමු සූත්‍රයයි.

21. 1. 2

දෙවැනි සූත්‍රයේ - පංචස්කන්ධයේ චතුරාර්ය සත්‍ය වශයෙන් යොදා "දුක්ඛං" යනුවෙන් අවබෝධ කරගන්නවුන්ගේ අදහස් වශයෙන් දේශනා කරන ලදහ.

දෙවන සූත්‍රයයි.

21. 1. 3.

තෙවැනි සූත්‍රයේ - එසේම "සකකායෝ" යනු අවබෝධ කරගන්නවුන්ගේ අදහස් වශයෙන් දෙසන ලදී.

තෙවන සූත්‍රයයි.

21. 1. 4.

සිවුවැනි සූත්‍රයේ - "**පරිඤ්ඤෙය්‍යෝ**" යනු විශේෂයෙන් දැනගත යුතු යනුයි. මනාව ඉක්මවිය යුතු. "**පරිඤ්ඤෙය්‍යෝ**" යනු ඉක්මවූ. මනාව දැනගත් යනුයි. "**පරිඤ්ඤාතාවිං**" යනු ඒ පරිඥාවෙන් මනාව පිරිසිඳ දැන ඉක්මවා සිටි යනුයි. "රාගකඛයෝ" යනාදියෙන් නිවන දක්වන ලදී.

සිවුවන සූත්‍රයයි.

21. 1.4-10

පස්වන සූත්‍රයේ සිට ඇති සූත්‍ර සතරෙහි (5, 6, 7, 8) චතුරාර්ය සත්‍යය පැවසේ. නවවන හා දසවන සූත්‍ර දෙකෙහි ක්ලේෂ ප්‍රහාණය කියැවේ.

පළමු අන්ත වර්ගයයි.

21. 2. 1-4

ධර්මකථික වර්ගයේ පළමු සූත්‍රයේ - **"එතනාවතාව අවිජ්ජාගතො** හොති" යනු යම්තාක් කල් මේ චතුරාර්ය සත්‍යයන් නොදැන සිටිද්ද, අවිද්‍යාවෙන් යුක්තව සිටිද්ද ඒ තාක් කාලය "අවිද්‍යාගත" වේයැයි යන අර්ථයයි.

දෙවැනි සූත්‍රයේ ද මේ ක්‍රමයමයි. තෙවැනි සූත්‍රයේ - පළමුව ධර්ම කථිකයා ද, දෙවැනිව සේඛ භූමිය ද, තෙවැනිව අසේඛ භූමියදැයි මෙසේ ධර්මකථික භික්ෂුවකගේ ප්‍රශ්නයක් නිසා විශේෂ කර දක්වා දෙවැදෑරුම් භූමියෝ කියන ලදී.

සිවුවැනි සූත්‍රයේ - ත්‍රිවිධ ප්‍රශ්නයන්ගේ ත්‍රිවිධ පිළිතුරු දෙසන ලදී.

පළමු-දෙවන-තෙවන හා සිවුවන සූත්‍රයන් ය.

21. 2. 5.

පස්වන සූත්‍රයේ **"අතීරදසසී"** යන්නෙහි තීරය යනු සංසාරයයි. සසර පැවැත්ම නොදක්නේ යනුයි. **"අපාරදසසී"** පරතෙර යනු නිර්වාණයයි. ඒ නිවණ නම් පරතෙර නොදකියි. **"බදෙධා"** යනු කෙලෙස් බැඳුමෙන් බැඳුණු යනුයි. එසේ බැඳී උපදියි. දිරායයි. මියයයි. මෙලොවින් පරලොවට යයි. මේ සූත්‍රයේ සංසාරික පැවතීම් දුක දේශනා කරන ලදී. සයවැනි සූත්‍රයේ සිට අර්ථ ඉතා ප්‍රකටය.

පස්වන සූත්‍රයයි.

21. 2. 10-13

දසවන සූත්‍රයේ "අනිච්චතො" ආදියෙහි පැවති නොපවතින ස්වභාවය "අනිච්චතො" නම් වේ. පෙළීම-පීඩාවීම් අර්ථයෙන් "දුක්ඛතො" නම් වේ. ආබාධ ඇතිවීම් අර්ථයෙන් "රෝගතො" නම් වේ. ඇතුලත දොස් කිපීම් අර්ථයෙන් "ගණ්ඩතො" නම් වේ. ඒ ඒ ගඩුවල ප්‍රත්‍යභාවයෙන් හෝ කැණීම් අර්ථයෙන් හෝ "සල්ලතො" නම් වේ. දුක යන අර්ථයෙන් "අඝතො" නම් වේ. විෂම වූ මහා භූතයන්ගේ නැගීසිටීම්-ආබාධ ප්‍රත්‍ය වශයෙන් "ආබාධතො" නම් වේ. අනුන්ගේ අර්ථයෙන් "පරතො" නම්. පලුදුවීම්-කැඩීම් අර්ථයෙන් "පලොකතො" නම්. සත්වැදෑරුම් ශූන්‍ය අර්ථයෙන් "සුඤ්ඤතො" නම්. ආත්මයක් නොවීම් අර්ථයෙන් "අනත්තතො" නම්. මෙසේ මෙතැනදී අනිත්‍ය වශයෙන්, පලුදුවීම් වශයෙන් යැයි දෙපදයකින් අනිත්‍යය මෙනෙහි කරයි. ශූන්‍යයය, අනාත්මයැයි දෙපදයෙන් අනාත්මය මෙනෙහි කරයි. සෙසු පදයන්ගෙන් දුක මෙනෙහි කිරීම පවසන ලදැයි දතයුතුයි. සෙසු පදයන්හි විස්තර ප්‍රකටමය.

එකොළොස්වන සූත්‍රයේද එසේමය. දසවන සූත්‍රයේ "සීලවතා" යනුවෙන් චතුපාරිශුද්ධි ශීලය කියන ලදී. මෙම එකොළොස්වන සූත්‍රයේ "සුතවතා" යනු කමටහන් අසන ලද යනුයි. මෙම සූත්‍ර දෙකෙහි ඇති වෙනස මෙපමණි.

දොළොස්වන හා දහතුන්වන සූත්‍ර දෙක රාහුලෝවාද සූත්‍රය හා සමානම වේ.

දෙවැනි ධර්මකථික වර්ගයයි.

21. 3. 1-10

අවිද්‍යා වර්ගයේ අර්ථ ඉතා ප්‍රකටම ය. මේ වර්ගයේ සියලුම සූත්‍රයන්හි චතුරාර්ය සත්‍යයම දේශනා කරන ලදී.

තෙවැනි අවිද්‍යා වර්ගයයි.

21. 4. 1-10

කුක්කුළ වර්ගයේ පළමු සූත්‍රයේ - "**කුකකුළං**" යනු ඉතා රත්වූ යනුයි. ඇවිලගත් අළු රැසක් මෙන් මහත් වූ පිරිතැවීමක්. මෙම සූත්‍රයෙහි දුක්ඛ ලක්ෂණයම පැවසේ. සෙසු සූත්‍රයන්හි අනිත්‍ය ලක්ෂණය කියැවේ. මේ සූත්‍ර සියල්ලම වෙන් වෙන් වූ පුද්ගලයන්ගේ අදහස් අනුව දේශනා කරන ලදී.

සිවුවන කුක්කුළ වර්ගයයි.

21. 5. 1-10

දිට්ඨි වර්ගයේ පළමු සූත්‍රයේ - "**කිං උපාදාය**" යනු කුමක් නිසා යනුයි හේතුකරගෙන. දෙවැනි සූත්‍රයේ "**කිං අභිනිවිසය**" යනු කුමක් ආශ්‍රය කොට, කුමක් ප්‍රත්‍යකොට යන අර්ථයි. තෙවැනි ආදී සූත්‍රවල "දිට්ඨි" යනාදිය පුද්ගල අදහස් අනුව දේශනා කරන ලදී.

ආනන්ද සූත්‍රයේ - "**උපසංකමී**" යනු අනිකුත් භික්ෂූහු පංචස්කන්ධය පිළිබඳ කමටහන් ලබාගෙන් ගොස්, එහි යෙදී, ඒහා ගැටී රහත්බවට පත්වී ශාස්තෘන් වහන්සේ ඉදිරියේ 'රහත්බව' ප්‍රකාශ කරනු දක "මම ද පංචස්කන්ධ කමටහනක් දේශනා කරවාගෙන, එහි යෙදී-ගැටී රහත් බවට පත්වී රහත් බව ප්‍රකාශ කරන්නෙමි"යි සිතා බුදුපියාණන් වහන්සේ වෙත එළඹියේය. ශාස්තෘන් වහන්සේ තමන්වහන්සේ ජීවත්ව සිටියදී ආනන්ද තෙරුන්ගේ මතු මාර්ගත්‍රය අවබෝධවීමක් හෝ කෙලෙස් ප්‍රහාණයක් නොදක්නා සේක්, එනමුදු "මොහුගේ සිත සතුටු කරන්නෙමි"යි මේ සූත්‍රය දේශනා කළ සේක. ආනන්ද හිමියෝද මේ කමටහන එක්වරක් දෙවරක් සිහිපත් කොට, දැන් බුද්ධ උපස්ථාන වේලාව යැයි යායුතු වේ. මෙසේ උන්වහන්සේගේ සිත සතුටු කරවමින් විමුක්තිය මුහුකුරා යන ධර්මයක්ම උන්වහන්සේට කමටහන් ලෙස ලැබුණේයැයි දතයුතුයි.

පස්වන දිට්ඨි වර්ගයයි.

චූළපණ්ණාසකය සමාප්ත විය.

ඛන්ධ සංයුත්තය නිමියේය.

22. 1. 1.

රාධ සංයුත්තයේ පළමු සූත්‍රයේ - "**මාරෝ වා අසස**" යනු මරණයක් හෝ වන්නේය යනුයි. "**මාරෙතා වා**" යනු මැරිය යුත්තෙක් හෝ වන්නේය යනුයි. "**යො වා පන මියති**" යනු යමෙක් මරයි ද යනුයි. "**නිබ්බිදඤාං**" යනු නිබ්බිදා ඤාණය සඳහාය. "**නිබ්බාණඤ්ඡා**" යනු ඵල විමුක්තිය නම්වන මෙය උපාදාන රහිත නිර්වාණයයැයි දතයුතුයි. "**අචවසරා**" යනු ඉක්මවූයෙහි යනුයි. "**නිබ්බාණොගධං**" යනු නිවණෙහි පිහිටි යනුයි. මෙය මාර්ග බ්‍රහ්මචරිය නම් වේ. නිවණට බැසගෙන වෙසේ. නිවණ නොඉක්මවා යන අර්ථයි. "**නිබ්බාණපරියොසානං**" යනු මොහුගේ අවසානය නිවණයි. සසර ගමන අවසන් වූ නිෂ්පත්තිය නිවණයි. පරම නිෂ්ඨාවයි යන අර්ථයි.

පළමු සූත්‍රයයි.

22. 1. 2.

දෙවැනි සූත්‍රයේ - "**සතෙතා සතෙතා**" යනු ඇලුණු ප්‍රශ්නයයි. "**තනුසතෙතා තනු විසතෙතා**" යනු එහි ඇලුණු යනුයි. එහි දඩිව ඇලුණේය යනුයි. "**පංසවාගාරතො**" යනු පස් වැලි ගෙවල්වල යනුයි. "**කෙළායනති**" යනු ක්‍රීඩා කරති. "ධනායනති" යනු ධනය මෙන් සිතත් යනුයි. "මමායනති" යනු "මෙය මගේ", "මෙය මගේ" යනුවෙන් මමත්වය කරති. අනිකකුට ස්පර්ශ කිරීමට ද නොදෙති යනුයි. "**විකිළනිකං කරොනති**" යනු "ක්‍රීඩාව නිමාවීයැ'යි ඔවුහු එම වැලිගෙවල් බිඳ දමමින් ක්‍රීඩාව අවසන් කරති යනුයි.

දෙවැනි සූත්‍රයයි.

22. 1. 3.

තෙවන සූත්‍රයේ - "**භවනෙතති**" යනු භවයට බැඳතබන රැහැනයි.

තෙවැනි සූත්‍රයයි.

22. 1. 4-10

සිවුවන සූත්‍රයේ අර්ථ ප්‍රකටය. පස්වන සූත්‍රයේ සිට ඇති සිවු සූත්‍රයේ චතුරාර්ය සත්‍යය ප්‍රකාශ වේ. අවසන් සූත්‍ර දෙකෙහි ක්ලේෂ ප්‍රහාණය කියැවේ.

පළමු වර්ගයයි.

22. 2. 1.

දෙවැනි වර්ගයේ, පළමු සූත්‍රයේ - "මාරෝ මාරෝ" යනුවෙන් මරණය පිළිබඳව විමසයි. යම් හෙයකින් රූපාදියෙන් මිදුණු මරණයක් නම් නැත. එනිසා උන්වහන්සේට භාග්‍යවතුන් වහන්සේ "රූපං ඛෝ රාධ මාරෝ" යනාදිය දෙසූහ.

පළමු සූත්‍රයයි.

22. 2. 2-10

දෙවැනි සූත්‍රයේ - "මාර ධම්මෝ" යනු මරණ ධර්මයයි. මේ ක්‍රමයෙන් සෑම සූත්‍රයක්ම අර්ථ දතයුතුයි.

දෙවැනි වර්ගයයි.

ඉන් අනතුරුව එන සූත්‍රයන්හි අර්ථ පහසුය. මැනවින් වැටහේ. මේ රාධ තෙරුන් වහන්සේ ප්‍රතිභාණී නම් තෙරනමකි. තථාගතයන් වහන්සේට මේ තෙරුන් දැක සූක්ෂම වූ කරුණු වැටහේ. එනිසා භාග්‍යවතුන් වහන්සේ, උන්වහන්සේට නානාවිධ ක්‍රමවලින් ධර්මය දේශනා කරන සේක. මෙසේ මේ රාධ සංයුත්තයේ මුල පටන් ඇති වර්ග දෙකෙහිම ප්‍රශ්නෝත්තර වශයෙන් ධර්මය දේශනා කර ඇත. තෙවැනි වර්ගය ආයාචනා-ඉල්ලීම් අනුව දේශිතය. සිවුවන වර්ගය සමීපයේ හිඳගැනීම් වශයෙන් කරන ලද සුභද කථා වශයෙන් දේශිත සූත්‍රයන්ගෙන් යුක්තය. මේ රාධ සංයුත්තයේ එන සෑම සූත්‍රයකින්ම තෙරුන්ගේ විමුක්තිය මුහුකුරා යන ධර්ම වශයෙන්ම දේශනා කරන ලදයි දතයුතුයි.

රාධ සංයුත්තය නිමියේය.

23. 1. 1.

දිට්ඨි සංයුත්තයේ - "**න වාතා වායනති**" යනාදියේ මෙසේ ඔවුන්ගේ දෘෂ්ටියක් වේ. යම් ඒ ගස් අතු ආදිය කඩාබිඳ දමමින් සුළඟ හමත් ද එය වාතය නොවේ. ඒ සුලං ස්වල්පයක් (වාතලේෂයක්) පමණි. වාතය වනාහී තුවර දොරටුව මැද කණුව මෙන් (ඉඳුබීලය) පර්වත කූටයක් මෙන් ස්ථිරව සිටියේය. එසේම තණපත් ආදිය ගෙනයමින් නදීහු ගලාබසිති. මෙහි ජලය ගලා නොබසියි. ජල ස්වල්පයක් පමණක් මෙහි ඇත. ජලය වනාහී ඉඳුබීලය මෙන් මහා පර්වත කූටයක් මෙන් ස්ථිරව පවතින්නකි. යම් ඒ "ගැබිණියෝ වදයි, දරුවන් බිහිකරයි" යැයි කියත් ද එනමුත් මැලවුණු උදර දරති. ගර්භය වනාහී ඉඳුබීලය මෙන් ද පර්වත කූටයක් මෙන් ද සිටියේය. යමෙක් මේ "ඉර උදාවේ". "සඳ උදාවේ". "ඉර-හඳ බැස යයි" ආදී වශයෙන් කියත්ද සඳහිරු දෙදෙන උදා නොවේ. බැස නොයයි. මේ සඳහිරු දෙදෙනාගේ ස්වල්පයකි. (පෙනීම් මාත්‍රයකි.) සඳහිරු දෙදෙන ඉඳුබීලයක් මෙන් ද පර්වත කූටයක් මෙන් ද ස්ථිරව සිටියේය යනුයි. දෘෂ්ටි යනාදියෙහි "**දිටඨං**" යනු රූපායතනයයි. "**සුතං**" යනු ශබ්දායතනයයි. "**මුතං**" යනු ගන්ධායතනය ද රසායතනය ද ස්පර්ශායතනය ද වේ. මේවාට පැමිණීම අරමුණ ගතයුතු බැවින් "මුතං" (දැනගත්) යනුවෙන් කියන ලදී. අවශේෂ වූ සප්ත ආයතන "**විඤ්ඤාතං**" නම් වේ. "**පතතං**" යනු සොයා හෝ නොසොයා පැමිණි යනුයි. "**පරියෙසිතං**" යනු පැමිණි හෝ නොපැමිණි සෙවීමයි. "**අනුවිචරිතං මනසා**" සිතින් අනුව හැසිරෙන ලද්දේ යනුයි. ලෝකයෙහි සොයා බලා පැමිණීමකුත් ඇත. සොයාබලා නොපැමිණීමකුත් ඇත. සොයා නොබලා පැමිණීමකු, සොයා නොබලා නොපැමිණීමකුත් ඇත. එහි සොයා බලා පැමිණීම "**පතතං**" නම් වේ. සොයාබලා නොපැමිණීම "**පරියෙසිතං**" නම් වේ. සොයා නොබලා පැමිණීමත් සොයා නොබලා නොපැමිණීමත් "**මනසානුවිචරිතං**" නම් වේ. නැතහොත් සොයාබලා පැමිණීමත්, සොයා නොබලා පැමිණීමත්, පැමිණීම අර්ථයෙන් "පතතං" (පැමිණීම) නම් වේ. සොයා බලා නොපැමිණීම "**පරියෙසිතං**" (සෙවීම) නම් වේ. සොයා නොබලා නොපැමිණීම "**මනසානුවිචරිතං**" (සිතින් හැසිරීම) නම් වේ. **මේ සියල්ලෙහිම සිතින් හැසිරුණේමය.**

23. 1. 5.

"නත්ථි දිනතං" යනාදියේ "නත්ථි දිනනං" යනු දුන් දෙයෙහි විපාකයක් නැත යන්න සඳහා කියත්. "සිටයං" යනු මහායාග යයි. "හුතං" යනු යැවිය යුතු ත්‍යාගමය සත්කාරය අදහස් වේ. මේ දෙකෙහිම ප්‍රතිඵලයක්-විපාකයක් නැතැයි ප්‍රතික්ෂේප කරන ලදී. "සුකටදුකකටානං" යනු හොඳ-නරක ක්‍රියාවන්ය. කුශලාකුශල යන අර්ථයයි. "ඵලං විපාකො" යනු යමක් ඵලයක් හෝ විපාකයක් හෝ වේ යැයි කියත්ද එය නැතැයි කියති යනුයි. "නත්ථි අයං ලොකො" යනු පරලොව සිටියවුන්ට පරලොවක් නැත. සියල්ලෝම ඒ ඒ ලෝකයෙහිදීම විනාශ වෙති-නැසී යති." යන්න දක්වති. "නත්ථි මාතා නත්ථි පිතා" යනු මාපියන් කෙරෙහි යහපත් හැසිරීම්-වැරදි හැසිරීම්වල ප්‍රතිඵලයක් විපාකයක් නැති බව කියති. "නත්ථි සතතා ඔපපාතිකා" යනු චුතවී උපදින සත්ත්වයෝ නම් නැතැයි කියති. "නත්ථි ලොකෙ සමණ බ්‍රාහ්මණා" යනු ලෝකයේ යහපත් පිළිවෙත් සහිත ශ්‍රමණ බ්‍රාහ්මණයෝ නම් නැතැයි කියති. "චතුම්මහා භූතිකො" යනු චාතුර්මහා භූතමය වූ-සිවුමහා භූතයන්ගෙන් නිර්මිත යනුයි. "පඨවී පඨවිකායං" යනු අධ්‍යාත්මික පඨවිධාතුව හා බාහිර පඨවිධාතුවයි. "අනුපෙති" යනු අනුව යයි. "අනුපගච්ඡති" යනු ඊටම සමාන වදනකි. කරායයි. පැමිණෙයි යන අර්ථයි. මේ දෙපදයෙන්ම සමීපයට යයි. ළඟට යයි යන්න දක්වයි. පැමිණියේය යන්නෙහිද මේ ක්‍රමයයි. "ඉන්ද්‍රියානි" යනු මනස සයවැනි වූ ඉන්ද්‍රියයෝ. "සංකමනති" යනු අහසේ පැනදුවයි යනුයි. "අසන්දි පඤ්චමා" යනු හොත්තා වූ ඇඳ පස්වැනි කොට ඇති යනුයි. ඇඳේ මැරුණු පුද්ගලයා හා ඇඳ ඔසවාගෙන යන පුරුෂයන් සිවුදෙනා යන පස්දෙන. "යාව ආළාහනා" සොහොන දක්වා යනුයි. "පදානි" යනු මොහු මෙසේ සිල්වත් විය. මෙසේ දුසිල්විය ආදී වශයෙන් පැවති ගුණාගුණ පදයන්. ශරීරයම මෙහිදී පදයැයි කියන ලදී. "කාපොතකානි" පරවිපාට වූ, පරවියන්ගේ පියාපත් පාට වූ යන අර්ථයි. "හසසනතා" අළු වූ "හසමනතා" යන්නද සුදුසුය. "ආහුතියො" යනු යම් යැවිය යුතු සත්කාර ආදී ප්‍රභේද ඇති දෙන ලද දානාදිය ඇතුළු සියල්ල අළුවීමෙන් අවසන් වේ. ඉන්පසුව විපාක දෙන්නක් වී නොයන්නේය යන අර්ථයි. "දතතු පඤ්ඤතනං" යනු ආඥානයන්, බාල මිනිසුන් (මෝඩයන්) පැනවූවකි. "බාල අඥානයන්ගේ පැනවීමක් වන දානය පණ්ඩිතයන් පිළිගන්නා දෙයක් නොවේ" යන්න මෙහිදී කියන ලදී. "බාලයෝ-මෝඩයෝ දෙති. පණ්ඩිතයෝ-නුවණැත්තෝ ගනිති" යන්න දක්වති.

23. 1. 6.

"**කරතො**" යනු සියතින් කරන්නාටය. "**කාරයතො**" යනු අණකිරීමෙන් කරවන්නාට යනුයි. "**ජිනතො**" යනු අනුන්ගේ අත් ආදිය සිඳින්නාටය. "**ඡෙදාපයතො**" යනු අනුන් ලවා සිඳවන්නාටය. "**පචයතො**" අනුන් දඬුමුගුරු ආදියෙන් පෙළන්නහුටය. "**පචාපයතො**" යනු අනුන් ලවා පෙළවන්නහුටය. "**සොචතො සොචාපයතො**" අනුන්ගේ බඩු පැහැරගැනීම් ආදියෙන් ශෝක ඇතිකිරීම තමාම කිරීම ද අනුන් ලවා කරවීමද යනුයි. "**කිලමතො කිලමාපයතො**" යනු ආහාර, සිඳීම්, බන්ධනාගාරගත කිරීම් ආදියෙන් අනුන් වෙහෙසන්නහුටද අනුන් ලවා එසේ අන්‍යයන් වෙහෙස කරවන්නහුටද වේ. "**එජතො එජාපයතො**" යනු අනුන් බන්ධනවලින් කම්පා කරවයි යනුයි. "**පාණමතිපාතයතො**" යනු ප්‍රාණය නසන්නාටද අනුන් ලවා නස්වන්නාටද වේ. මෙසේ මේ සෑමදෙය කරන කරවන වශයෙන් අර්ථය අවබෝධ කරගත යුතුයි. "**සන්ධිං**" යනු ගෙවල් සිඳීමයි. "**නිලෙලාපං**" යනු කොල්ලකෑමයි. "**එකාගාරිකං**" යනු එකම ගෙයක් පිරිවරාගෙන කොල්ලකෑමයි. "**පරිපන්ථෙ තිට්ඨතො**" යනු යන එනවුන්ගේ ඇඳිවත පවා බලෙන් පැහැරගැනීමට මගරැක සිටින්නහුගේ යනුයි. "**කරොතො න කරීයති පාපං**" යනු යම්කිසි පවක් කරමියි යන සංඥාවෙන් යමක් කළත් එය පවක් නොවේ නම් ඔහුට පාපයක් සිදුනොවේ. සත්ත්වයෝ "පවු කරමු" යනුවෙන් මෙබඳු පිළිගැනීම් ඇතිව වෙසේ යැයි දක්වයි. "**බුරපරියනෙතන**" යනු දැලිපිහිය මෙන් කැපෙන නිම්වළලු ඇති. දැලිපිහිය වැනි දාරයක් වටේට පිහිටි යනුයි. "**එකමංසබලං**" යු එකම මස් ගොඩකි. "**පුඤ්ඤං**" යනු ඊටම සමාන වදනකි. "**තතො නිදානං**" යනු එක්මස් ගොඩක් කිරීමේ හේතුවෙන් යනුයි. "දකබිණං" යනු දකුණු ගංතීරයේ මිනිස්සු කර්කශය. දරුණුය ඔවුන් සඳහා "**ගනනෙතා**" යනාදිය කියන ලදී. "**උතතරං**" උතුරුගං ඉවුරේ ශ්‍රද්ධාවන්ත, ප්‍රසන්න වූ සිතැති, බුද්ධමාමක වූ, ධර්මමාමක වූ, සංඝමාමක වූ (තෙරුවනට මමත්වය ඇති) ජනයා සඳහා "**දදනෙතා**" යනාදිය කියන ලදී. එහි "**යජනෙතා**" යනු මහායාගයක් කරන්නා වූ යනුයි. "**දමෙන**" යනු ඉන්ද්‍රිය දමනයෙන්. පොහොය කිරීමෙන්. "**සංයමෙන**" යනු සීල සංයමයෙන් - සංවරයෙන් යුතු. "**සච්චවජ්ජෙන**" යනු සත්‍ය වචනයෙන්. "**ආගමො**" යනු "පැමිණි වේ. පවතියි" යන අර්ථයයි. සියලුම ආකාරයෙන් පාප හා පුණ්‍යක්‍රියා ප්‍රතික්ෂේප කරන ලදී.

සයවන සූත්‍රයයි.

23. 1. 7

සත්වන සූත්‍රයේ "**නත්ථීහේතු නත්ථී පච්චයෝ**" යනු මෙහි ප්‍රත්‍යය, හේතුව යනු සමාන වදන්ය. මේ පද දෙකින්ම විද්‍යමාන වන්නක්ම කියැවේ. කායදුශ්චරිතාදියෙන් කිලිටි වන හේතුවත්, කාය සුචරිතාදියෙන් පිරිසිදුවන හේතුවත් ප්‍රතික්ෂේප කරන ලදී. "**නත්ථීබලං**" යනු යම්බඳු තමාගේ බලයෙහි-වීර්යයෙහි පිහිටි මේ සත්ත්වයෝ දේවත්වයට, මාරත්වයට, බ්‍රහ්මත්වයට, ශ්‍රාවක බෝධියට, පසේ බුද්ධත්වයට, සර්වඥත්වයට පැමිණෙත්ද ඒ බලය-වීර්යය ප්‍රතික්ෂේප කරන ලදී. "**නත්ථී විරියං**" ආදී පද සියල්ල අන්‍යොන්‍ය වශයෙන් සමාන වූ වචන වේ. මෙය අපගේ වීර්යයෙන්, මෙය පුරුෂ වීර්යයෙන්, මෙය පුරුෂ පරාක්‍රමයෙන් පැමිණි දෙයකැයි මෙසේ පවතින වචනයත්-ව්‍යවහාරයත් ප්‍රතික්ෂේප කිරීම් වශයෙන් මේ පද වෙන වෙනම යොදන ලදී. "**සබෙබ සත්තා**" යනුවෙන් ඔටු, ගොත්, කොටළු ආදී සියලු සත්ත්වයෝ ඉතිරි නොකොට සම්පූර්ණයෙන්ම අදහස් කරයි. "**සබෙබපාණා**" යනු ඒකේන්ද්‍රිය ප්‍රාණීහු - ද්විතීන්ද්‍රිය ප්‍රාණීහු ආදී වශයෙන් පවසති. "**සබෙබජීවා**" යනු හැල්, යව, තිරිඟු ආදිය සඳහා කියන ලදී. ඒවායෙහි වර්ධනය වීම් අර්ථයෙන් "**ජීවී**" සංඥාව ඇති ජීවිහුය. "**අවසා අබලා අවිරියා**" යනු ඔවුන්ට තමාගේ වශයෙන් හෝ බලයක් හෝ වීර්යයක් හෝ නැත යනුයි. "**නියති සංගති භාවපරිණතා**" යන මෙහි "**නියති**" යනු නියත වශයෙනි. "**සංගති**" යනු සවැදෑරුම් නැවත ඉපදීම් ඇත්තවුන්ගේ (අභිජාතීන්ගේ) ඒ ඒ තැන යෑමයි. "භාවො" යනු ස්වභාවයමයි. මෙසේ නියත වශයෙන්ද සංක්‍රමණ වශයෙන්ද ස්වභාව වශයෙන්ද නන්වැදෑරුම් බවට, පරිණතියට පැමිණි. යමකින් යම්සේ විය යුතුනම් එය එසේම වෙයි. යමක් නොවිය යුතුනම් එය නොවෙයි" යනුවෙන් දක්වති. "**ඡසෙවාභිජාතීසු**" යනු සවැදෑරුම් වූම අභිජාතීන්හි සිට සැප ද දුක ද විඳිනු ලැබෙති. අනික් සුව-දුක් භූමියක් නැතැයි දක්වති.

"අකටා" යනු නොකරන ලද යනුයි. "අකටවිධා" යනු නොකළ විධාන ඇති. "මෙසේ කරව"යි, "කිසිවකු විසින් කරවන්නෙකු නැත" යන අර්ථයි. "අනිවච්තා" යනු ඍද්ධියෙන් නොමවන ලදී යනුයි. "අනිම්මාතා" යනු අන් අයුරකින්ද නිර්මාණය නොවූ යනුයි. "අනිම්මිතබබා" යන පාඨයද සුදුසුය. නොමවන ලද යන අර්ථයි. "වඤඣා" යනු වඳ තිරිසන් - වඳ කල් ආදිය මෙන් ඵල නැති කිසිවක් නූපදවන යනුයි. පර්වත කූටයක් මෙන් සිටි බැවින් "**කූටට්ඨා**" නම් වේ. ඉසුබිලයක් මෙන්

නොසෙල්වී සිටින "**එසිකටයායිටයිතා**". යම්සේ මනාව පිහිටවූ ඉඳුබිලය නිශ්චලව සිටියිද එසේ නොසෙල්වී සිටි යන අර්ථයි. "**න ඉඤ්ජනති**" යනු ඉඳුබිල ස්තම්භය මෙන් සිටී බැවින් නොසෙල්වෙති යනුයි. "**න විපරිණමනති**" යනු ප්‍රකෘති ස්වභාවය අත්නොහරිති යනුයි. "**න අඤ්ඤමඤ්ඤං ව්‍යාබාධෙනති**" යනු ඔවුනොවුන්ට බාධා නොවෙති යනුයි. "**නාලං**" යනු අසමත් වූ යනුයි. "**පඨවී කායො**" යනාදියේ පඨවී ධාතුවම, පඨවිකාය හෝ පඨවී සමූහය වේ. "**සතතනනං තෙවිකායානං**" යනු යම්සේ මුංඇට ගොඩකට ගැසූ සැක ඒ මුංඇට සමූහය අතුරින්ම පිවිසේද එලෙසින්ම සත්වැදෑරුම් කය අතරින් සිදුරකින්, විවරයකින් සැත පිවිසෙයි. එහි "මම මේ දිවිය තොර කරන්නෙමි"යි හුදෙක් එසේ හැඟීම් මාත්‍රයම වේයැයි දක්වති. "**යොනි පමුඛසතසහසසානි**" යනු උතුම් යෝනි, ප්‍රමුඛ යෝනි තුදුස් ලක්ෂයකි. "අන්‍ය වූ යෝනි සයදාහක් ද හයසීයක් ද වේ. කර්ම පන්සීයකි."යි හුදෙක් තර්ක මාත්‍ර වූ නිරර්ථක දෘෂ්ටිය දක්වයි. "**පඤ්ච කම්මානි තීණිච කම්මානි**" යනාදියෙහි ද මේ ක්‍රමයම වේ. ඇතැම්හු (අභයගිරිකාදී) මෙසේ කියති. පඤ්ච ඉන්ද්‍රිය වශයෙන් පඤ්ච කර්මයන් ද කර්මාදිය වශයෙන් ත්‍රිවිධ කාය කර්ම ද ගනිති. "**කමෙම ච අඩඩකමෙම ච**" යන මෙහි කාය-වාග් කර්මයෝ පූර්ණ කර්ම යැයි ද මනෝ කර්මය අර්ධ කර්මයකැයිද යන පිළිගැනීම (ලබ්ධිය). "**දවටඨිපටිපදා**" යනු දෙසැටක් ප්‍රතිපදාවෝ යැයි කියති. "**දවටඨනතරකපපා**" යනු එක් කල්පයක අතුරුකල්ප සැටසතරක් වෙති. මෙය වනාහි අනික් දෙක නොදක්නා බැවින් කියන ලද්දකි.

"**ඡළාභිජාතියො**" යනු කණ්හාභිජාතිය, නීලාභිජාතිය, ලොහිතාභිජාතිය, හළිද්දාභිජාතිය, සුක්කාභිජාතිය හා පරමසුක්කාභිජාතිය (කළු-නිල්-රතු-කහ-සුදු හා පරම සුදුසු උසස් ජාතීහු) යන මේ සයක් වූ උසස් ඉපදීම් යැයි කියති.

එහි බැටළුවන් මරන්නෝ, ඌරන් මරන්නෝ, කුරුල්ලන් මරන්නෝ, මුව වැද්දෝ, වැද්දෝ, මාළු මරන්නෝ, සොරු, චෝර ඝාතකයෝ, බන්ධනාගාරිකයෝ ආදී යම්කිසි දරුණු ක්‍රියා කරන සැමදෙන කණ්හාභිජාති නම් වෙති. භික්ෂූහු නීලාභිජාති වේ යැයි කියති. ඔවුහු වනාහි සිවුපසය කවුවක දමා කති, භික්ෂූන්ද කණ්ටක පැවැතුම් ඇතැයි පාළියේ කියැවේ. නැතිනම් කණ්ටක පැවතුම් ඇත්තෝම පැවිද්දෝ යැයි කියති. ඒකසාටික නිගණ්ඨයෝ ලෝහිතාභිජාතීහු නම් වෙති. මේ මුලින් කී දෙපිරිසට වඩා සුදුම සුදු වූ, ගිහි සුදුවත් හැඳගත් අචේලක ශ්‍රාවකයෝ හළිද්දාභිජාතීහු

නම් වෙති. මෙසේ තමාට ප්‍රත්‍යදායක වූ නිගණ්ඨයන්ට ද වඩා ජ්‍යෙෂ්ඨ වූවෝත් කරති. ආජීවකයෝ හා ආජීවිකාවෝ මේ සුක්කාභිජාතීහු යැයි කියති. ඔවුහු වනාහි මුලින් පැවසූ සිවු පිරිසට වඩා සුදුම සුදු වේ. නඤ, වච්ඡ, කිස, සංකිච්ච හා මක්ඛලී ගෝසාල යන සැමදෙන පරම සුක්කාභිජාතීහු වෙත් යැයි කියති. මොවුහු වනාහි සියල්ලන්ට ම වඩා සුදු වූවෝය.

"අටඨපුරිස භූමියෝ" යනු මන්දභූමි, විඩ්ඩා භූමි, වීමංසක භූමි, උජුගත භූමි, සෙඛ භූමි, ශ්‍රමණභූමි, ජානන භූමි හා පන්න භූමි යන මේ අටවැදෑරුම් වූ පුරුෂ භූමියෝ යැයි කියති.

එහි උපන්දිනයේ පටන් සත්දිනක් තුල සම්බාධ-කරදර සහිත තැනින් නික්ම යන සත්ත්වයෝ 'මන්ද' නම් වෙති. මේ මුළාවූවෝ "මන්ද භූමි" යැයි කියති. යමෙක් දුගතියෙන් පැමිණියෝ වෙත්ද ඔවුහු නිතර හඬති. එමෙන්ම කෑගසති. සුගතියෙන් පැමිණියෝ එය සිහිකර සිනාසෙති. මේ "විඩ්ඩා භූමි" නම් වේ. මවුපියන්ගේ අත හෝ පය හෝ ඇඳ හෝ පුටු හෝ ගෙන බිම පා තැබීම "වීමංසක භූමි" නම් වේ. පියවර තබා යෑමට සමත් වූ අවස්ථාව උජුගත භූමි නම් වේ. ශිල්ප උගන්නා කාලය සේඛභූමි නම් වේ. ගෙදරින් නික්ම පැවිදිවන අවස්ථාව සමණ භූමි නම් වේ. ගුරුවරු සොයමින් කරුණු දැනගන්නා අවස්ථාව ජානන භූමි නම් වේ. භික්ෂුවද පහතට වැටුනේ, දිරාගියේ කිසිවක් නොලබයි. මෙසේ නොලබන ශ්‍රමණයා පන්නභූමි නම් වේ.

"එකූනපඤ්ඤාස ආජීවසතෙ" යනු ආජීව වෘත්ති හාරදහස් නවසීයකි. "**පරිබ්බාජක සතෙ**" යනු පරිබ්‍රාජක පැවිද්දෝ හාරදහස් නවසීයකි. "**නාගාවසසතෙ**" යනු නාගමණ්ඩල ද එබඳු සංඛ්‍යාවකි. "**වීසෙ ඉන්‍රියසතෙ**" යනු ඉන්‍රිය එකසිය විස්සකි. "**තිංසෙ නිරය සතෙ**" යනු නිරය එකසිය තිහකි. "**රජොධාතුයො**" යනු දූවිලි වැගිරෙන ස්ථාන. අත් පිට, පා පිට ආදිය සඳහා කියන ලදී. "**සත්ත සඤ්ඤී ගබභා**" යනු ඔටු-ගොන්-කොටළු-එළු-ගව-මුව-මී ආදීන් සඳහා කියන ලදී. "**සත්ත අසඤ්ඤී ගබභා**" යනු හැල්, යව, තිරිඟු, මුං, තණහාල්, වරක, කුරක්කන් සඳහා කියන ලදී. "**සත්ත නිගණ්ඨී ගබභා**" යනු පුරුකෙහි හටගත් ගැබ් ඇති-උණ, උක්, බට ආදිය සඳහා කිය ලදී. "**සත්ත දිබබා**" යනු බොහෝ දෙවියෝ. "දේව ගර්භ සතකි"යි කියයි. "**සත්ත පෙසාව**" (පිසාවා) "මහත්

මහත් වූ පිසාච ගර්භ සතකි"යි කියයි. "**සරා**" යනු මහවිල්ය. කණ්ණ, මුණ්ඩ, රථකාර, අනෝතත්ත, සීහප්පපාත, ඡද්දන්ත, මුචලින්ද, කුණාලාදී වැව්-මහවිල් සඳහා කියන ලදී. "**පවුධ**" යනු මහගැටය. "**පපාතා**" යනු මහා ප්‍රපාතයෝය. "**පපාත සතානි**" කුඩා ප්‍රපාත සීයකි. "**සුපිතා**" මහසිහින්ය. "**සුපිනසතානි**" යනු කුඩා සිහින සීයකි. "**මහාකපුඤ්ඤා**" යනු මහාකල්පයන්ය. මෙහි එක් මහවිලකින් වසර සීයක් පාසා, කුසතණ අගකින් එක් දියබිඳුවක් බැහැර කර, සත්වරක් ඒ මහා විල්වල දිය සිඳුවයිද එම කාලය එක් මහා කල්පයකි. මෙබඳු මහා කල්ප අසූහතර ලක්ෂයක් ගෙවීමෙන් බාලයෝ ද පඬිවරුද දුක් කෙළවර කරති. මෙය ඔහුගේ පිළිගැනීමයි. පඬිවරුද වුවත් මේ කල්ප ගෙවීමට පෙර, අතරමඟදී පිරිසිදු වීමට නොහැකි වෙති. මෝඩයෝ වුවත් මේ කල්ප ඉක්මවා නූපදිති. "**සීලෙන වා**" යනු අචේලකයාගේ සීලයෙන් හෝ අනික් කිසිවකින් හෝ ය. "**වතෙන වා**" යනු එබඳුම ව්‍රතයකිනය. "**තපෙන**" යනු තපසින්ය. "**අපරිපක්කං පරිපාචෙති**" යනු 'යමෙක් මම පණ්ඩිතයෙකි'යි අතරතුරදී පිරිසිදු වේ. (මුහුකුරා නොගිය කර්ම මුහුකුරා යවයි. "**පරිපක්කං වුසස වුසස බ්‍යනතී කරොති**" යනු (මුහුකුරා ගිය කර්මය විඳ විඳ කෙළවර කරන්නෙමි.) යමෙක් "මම බාලයෙකැ"යි කියූ ප්‍රමාණාත්මක කාලය ඉක්මවා යයි. "**හෙවං නත්ථි**" යනු එසේ එබඳු දෙයක් නැත යනුයි. මේ දෙකම කිරීමට නොහැකැයි දක්වයි. "**දොණමිතෙ**" යනු ද්‍රෝණයෙන් මැන්නාක් මෙන් යනුයි. "**සුඛදුකෙඛ**" යනු සැප හා දුකයි. "**පරියනතකතෙ**" යනු කියන ලද ප්‍රමාණාත්මක කාලය අවසන් කල කල්හිය. "**නත්ථි හායන වඩඪනෙ**" යනු සසර පිරිහීමක්, වැඩීමක් නැත. සංසාරය පඬිවරයාට පිරිහේ. ගෙවියයි. මෝඩයාට වැඩේ. වර්ධනය වේ යන මෙකරුණු සිදු නොවේ යන අර්ථයයි. "**උකකුං සාවකංසෙ**" යනු සසර නැගීමක්-බැසීමක් නැත යනුයි. පිරිහීම්-වැඩීම් දෙකටම මෙය සමාන වදන් වේ.

දන් මේ අර්ථය උපමාවකින් දක්වනුයේ "**සෙය්‍යාථාපි නාම**" යනාදිය දෙසන ලදී. එහි "**සුතතගුළෙ**" යනු වෙළා කරන ලද නූල් බෝලයක්ය. "**නිඛෙඛයියමානමෙව පලෙති**" යනු පර්වතයේ හෝ ගසක අග හෝ සිට දමන ලදුයේ නූලේ ප්‍රමාණය දක්වාම ගොස් නැවතී ඒවාම යයි. නූල නිමවූ විට එතැනම නූල නැවතීමට යයි. ඉදිරියට නොයයි. මෙලෙසින්ම බාලයන්ද පණ්ඩිතයන්ද කාල වශයෙන් ගෙනයනු ලබනුයේ සුවදුක් විඳිති. කියන ලද කාල ප්‍රමාණය නො ඉක්මවයි යනුවෙන් දක්වයි.

"අනතවා ලොකො" යනු ඇතැමුන් වඩන ලද නිමිත්තකි. ලෝකය යැයි ගැනීමෙන් හෝ තර්කයෙන් උපන් දෘෂ්ටියකි. "අනන්තවා" යනු සෑම අතින්ම වඩන ලද අප්‍රමාණ වූ නිමිත්තකි. "ලෝකය" යැයි ගැනීමෙන් හෝ තර්කයෙන් හෝ උපන් දෘෂ්ටියයි. "තං ජීවං තං සරීරං" යනු ජීවයද ශරීරයද එකක්මයැයි උපන් දෘෂ්ටියයි. සෙසු පදාර්ථ ප්‍රකටමය. මේ දක්වා සෝතාපත්ති මාර්ග වශයෙන් අටළොස් ව්‍යාකරණයන්ගේ එක් ගමනකි. දෙවැනි ගමන දුක් වශයෙන් කියන ලදී. එයද අටළොස් ව්‍යාකරණයකි. ඉන් අන්‍ය වූ "රූපී අතතා හොති" යනාදී අට ව්‍යාකරණයෝ ඒවා සමඟ ඒ දෙවැනි පෙය්‍යාලය යැයි කියන ලදී.

එහි "රූපී" යනු අරමුණම ආත්මයයැයි ගන්නා ලද දෘෂ්ටියයි. "අරූපී" යනු ධ්‍යානය ආත්මය යැයි ගත් දෘෂ්ටියයි. "රූපී ච අරූපී ච" යනු අරමුණද ධ්‍යානය ද ආත්මය යැයි ගත් දෘෂ්ටියයි. "නෙව රූපී නාරූපී" යනු තර්ක මාත්‍රයෙන් ගත් දෘෂ්ටියයි. "එකනත සුඛී" යනු ධ්‍යානලාභීන්ට, තාර්කිකයන්ට හා ජාති සිහිකිරීමේ නුවණ ලැබූවන්ට උපන් දෘෂ්ටියකි. ධ්‍යානලාභීහුද අතීතයේ ඒකාන්තයෙන්ම සැප ඇති අත්බවක් (ආත්ම භාවයක්) සිහිපත් කර මෙවැනි දෘෂ්ටියක් උපදවා ගනිති. තාර්කිකයන්ද දැන් මම ඒකාන්තයෙන් සුවපත් වූවාක් මෙන් පරලොවදීද මෙසේම වන්නේයැයි දෘෂ්ටියක් උපදියි. ජාති සිහිකරන්නවුන්ටද සැප සහිත සත්-අට භවයක් දැක මෙබඳු දෘෂ්ටියක් උපදියි. "එකනත දුකඛී" ආදියෙහි මේ ක්‍රමයමයි.

තෙවැනි පෙය්‍යාල වර්ගයේ ද අනිත්‍ය-දුක්ඛ වශයෙන් එයම විසිහයක් සූත්‍රවලින් විස්තර කරන ලදී. සතරවන පෙය්‍යාලය තිපරිවර්ත වශයෙන් දේශිතය.

දිට්ඨී සංයුත්තය නිමියේ ය.

24.

ඔක්කන්තික සංයුත්තයේ - "අධිමුචචති" යනු ශ්‍රද්ධාවෙන් විමෝක්ෂය ලබයි යනුයි. "ඔකකනෙතා සමතතනියාමං" යනු ආර්ය මාර්ගයට පිවිසි යනුයි. "අභබෙබා ච තාව කාලං කාතුං" යනු මෙය උපන් මාර්ගයේ ඵලයට අනතුරුව දක්වයි. උපන්නා වූ මාර්ගයෙහි ඵලයට අනතුරක්

කිරීමක් නම් නැත. එලෙසින්ම - "මේ පුද්ගලයා සෝවාන්ඵල සාක්ෂාත් කිරීමට පිළිපන්නාහු. මේ කල්පයේ දවෙන වේලාවෙහිදී. යම්තාක් මේ පුද්ගලයා සෝවාන්ඵලය සාක්ෂාත් නොකරයිද ඒතාක් කල්පය නොදවේමැයි. මෙය පුද්ගල ස්ථිතකල්පී යැයි කියනු ලැබේ. a"මතතසෝ නිජඣානං චමනති" යනු ප්‍රමාණ වශයෙන් බැලීම ඉවසයි යනුයි. සෙසු පද අර්ථ ප්‍රකටය.

ඔක්කන්ති සංයුත්තය නිමියේය.

25.

උප්පාද සංයුත්තයේ සියලු පදයන්ගේ අර්ථ-විස්තර ප්‍රකට වේ.

උප්පාද සංයුත්තය නිමියේය.

26.

කිලෙස සංයුත්තයේ - "චිතතසෙසසෝ උපකකිලෙසෝ" යනු කවර සිතක ද? චතු (සිවු)භූමික චිත්තයාගේයි. තෙභූමික සිත්වල හැර ලෝකෝත්තර සිතේ කෙසේනම් ක්ලේෂ පහළවීමක් සිදුවේද? උපත වැළැක්වීම් වශයෙනි. එයද ඊට ඉපදීමට නොදීම් වශයෙන් කෙලෙසීමක් වේයැයි දතයුතුයි. "නෙකඛමමනිනනං" යනු නව ලෝකෝත්තර දහමට නැමුණු යනුයි. "චිතතං" යනු සමථ විදර්ශනා සිතයි. "අභිඤඤා සචඡිකරණීයෙසු ධමෙමසු" යනු ප්‍රත්‍යවේක්ෂණ ඥානයෙන් මනාව දැන සාක්ෂාත් කළයුතු ෂඩ් අභිඤ්ඤා ධර්මයන්හි එක ධර්මයක් හෝ ගැනීමෙන් නික්මීම යැයි ගතයුතුයි. සෙසු පදයන්ගේ සියලු අර්ථ ඉතා ප්‍රකටය.

කිලෙස සංයුත්තය නිමියේය.

27. 1-9.

සාරිපුත්ත සංයුත්තයේ පළමු සූත්‍රයේ - "න එවං හොති" යනු මමය මාගේය යන හැඟීම් ප්‍රහීණ කළ බැවින් මෙබඳු සිතක් නොවේ යනුයි. දෙවැනි සූත්‍රාදියේ ද මේ ක්‍රමයමයි.

27. 1. 10.

දසවන සූත්‍රයේ - "**සුවීමුබී**" යනු මෙනම් ඇති තැනැත්තියයි. "**උපසංකමි**" යනු අභිරූප වූ දර්ශනීය වූ රන්වන් වූ දුටුවන් පහදවමින් වැඩම කරන තෙරුන් වහන්සේ දැක, "මොහු සමග කවටකමක් කරන්නෙමි"යි ළඟට ගියාය. එවිට තෙරුන්වහන්සේ විසින් ඇගේ වචනය ප්‍රතික්ෂේප කළ කල්හි, "දැන් මොහුට වාදයක් නංවන්නෙමි"යි සිතන්නී "**තෙනහි සමණ උදඤ්මුබො භුඤ්ජසි**" යනාදිය ඇසුවාය. "**දිසාමුබො**" යනු සිවුදිග අභිමුබවයි. "සතර දිසාවන් බලමින්" යන අර්ථයි. "**විදිසා මුබො**" යනු සතර අනුදිසා බැලීමෙන්ය. "**වත්ථුවිජ්ජා තිරච්ඡානවිජ්ජාය**" යනු වාස්තුවිද්‍යා සංඛ්‍යාත වූ තිරිසන් විද්‍යාවන්ගෙන්ය. "වාස්තු විද්‍යාව" නම් ලාප්‍රවස්තු, කුම්භණ්ඩ වස්තු, මූලක වස්තු ආදී වස්තූන්ගේ විපාක-සම්පත් කරුණු වශයෙන් කල් දැනගන්නා උපායයි. "**මිච්ඡාජීවෙන ජීවිකං කපෙපනති**" යනු මුලින් කියූ ඒ වාස්තු විද්‍යා-තිරිසන් විද්‍යා සංඛ්‍යාත වූ මිත්‍යා (වැරදි) ජීවයන්ගෙන් දිවි ගෙවති යනුයි. "එම වස්තු-ශිල්ප ඥානය සම්පාදනය කරදීමෙන් පැහැදුණු මිනිස්සු දෙන ලද සිවුපසය පරිභෝග කරමින් ජීවත්වෙති" යන අර්ථයයි. "අධො මුඛො" යනු බිම බලාගෙන වැළඳීම් වශයෙන් අධොමුඛව (යටිකුරු මුව ඇතිව) වැළඳීම නම් වේ. මෙසේ සෑම පදයකම අර්ථය යෙදිය යුතුයි. තවද මෙහි "**නකබත්ත විජ්ජා**" යනු අද මේ නැකතයි. මේ නැකතින් යායුතුයි. මේ නැකතින් මේ මේ දෙය කළයුතුයි. මෙසේ දැනගන්නා විද්‍යාවයි. "**දූතෙය්‍යං**" යනු දූත කර්මයයි. ඒ ඒ තැනට නියමිත පණිවුඩ ගෙන ඒ ඒ තැන්වලට යෑමයි. "**පහිණගමණං**" යනු එකම ගමකම එක් පවුලකින් දුන් පණිවුඩය වෙනත් පවුලකට පැවසීමට යෑමයි. ඔවුන් වෙත එළඹීමයි. "**අංගවිජ්ජා**" යනු ස්ත්‍රී ලක්ෂණ-පුරුෂ ලක්ෂණ වශයෙන් අංගසම්පත් දැක, ඇය හෝ ඔහු මේ අංග ලක්ෂණ නිසා මෙනම් දේ ලබන්නේ යැයි මෙසේ දැනගන්නා විද්‍යාවයි. "විදිසා මුඛා" යනු අංගවිද්‍යාවෙන් ඒ ඒ ශරීර කොටස් අරබයා පවතින බැවින් විදිසා (අනුදිශාවන්හි) පැවතීම නම් වේ. එනිසා ඒ විද්‍යාවෙන් දිවිගෙවන්නාහු, වළඳන්නාහු, "විදිසාමුඛයෙන් වළඳයි" නම් වෙති. "**එවමාරොචෙසි**" යනු "**ධම්මිකං සමණා**" යනාදී වශයෙන් පවසමින් පණිවිඩ ගෙනයෑමේ ගුණකථනය කරයි. ඒ පර්යාය කථාව (දේශනාව) අසා පන්සියයක් පමණ කුලයේ සසුනෙහි බැසගත්හ. ධර්මාවබෝධය ලැබූහ.

සාරිපුත්ත සංයුත්තය නිමියේ ය.

28 - 1. 1.

නාග සංයුත්තයේ - "අණ්ඩජා" යනු බිජුවටින් උපන්නෝය. "ජලාබුජා" යනු ගර්භාෂයේ උපන්නෝය. "සංසෙදජා" යනු තෙතමනයෙහි උපන්නෝය. "ඔපපාතිකා" යනු එක්වරම පහළ වීමෙන් උපන්නෝය. මේ සූත්‍රය අර්ථෝත්පත්ති වශයෙන් දේශිතය. භික්ෂූන් වහන්සේ අතර "නාග යෝනි කියක්ද?"යි යන කථාව ඇතිවිය. එවිට භාග්‍යවතුන් වහන්සේ පුද්ගලයන්ගේ නාගයෝනියට ඇති ඇල්ම දුරුකර කලකිරවීම සඳහාත් නාගයෝනි පිළිබඳ දැනුම ප්‍රකට කිරීම සඳහාත් මේ සූත්‍රය දේශනා කළ සේක.

28. 1. 2.

දෙවැනි සූත්‍රාදියේ - "වොසසටඨකායා" යනු අභිඥාණ්ඨිකයන්ගේ පරීක්ෂාව යටතේ සිටි නාගයේ නොගෙන, අත්හැර දැමූ කය ඇති යනුයි. "දවයකාරිනො" යනු දෙවැදෑරුම් ක්‍රියා කරනුයේ. කුසල් හා අකුසල් කරනුයේ. "සවජජ මයං" යනු ඉදින් අද අපි යනුයි. "සභව්‍යතං උපපජ්ජති" යනු එක්ව විසීමට පැමිණේ යනුයි. එහි ඔහුට අකුසල් ඉපදීමට ප්‍රත්‍ය වේ. කුසල ඉපදීමෙන් සම්පත්ති ඇතිවේ. "අනනං" යනු කෑයුතු-බුදිය යුතු දේය. "පාණං" යනු යම්කිසි ප්‍රාණීහුය. "වත්ථං" යනු හැඳපොරවන වස්ත්‍ර යනුයි. "යානං" යනු කුඩ-පාවහන් ආදී කොට ඇති යම්කිසි ගමන ප්‍රත්‍යයක්, ගමන් උපකරණයක්. "මාලං" යනු යම්කිසි දෑසමන් ආදී මල්වර්ගයන්ය. "ගන්ධං" යනු යම්කිසි සඳුන් ආදී සුවඳ ආලේපනයන්ය. "විලෙපනං" යනු යම්කිසි සම්පාට කරණ ද්‍රව්‍යය. "සෙය්‍යාවසථපදීපෙය්‍යං" යනු ඇඳ-පුටු ආදී හිඳගන්නා සෙනසුන්, එක්බිමක් ආදී වෙහෙසන් තැන්, වැටි-තෙල් ආදී පහන් දල්වන උපකරණද දෙයි යන අර්ථයයි. ඔවුන් විසින් දීර්ඝායුෂ්ක හා වර්ණවත් බවද සැප බහුලකොට ඇති බැවින්ද ප්‍රාර්ථනා කොට, දසවිධ දානවස්තු දී, ඒ සැපසම්පත් අනුභව කිරීමට එහි උපදියි. සෙසු සියලු අර්ථ මෙහිදී ප්‍රකටමය.

නාග සංයුත්තය නිමියේ ය.

29.

සුපණ්ණ සංයුත්තයේ - පියාපත් වර්ණවත් වූ ගුරුළා "සුපණ්ණ" යැයි කියයි. මෙහිද පළමු සූත්‍රය මුලින් පැවසූ පරිදිම අර්ථෝත්පත්ති වශයෙන් දේශනා කරන ලදී. "හරනති" යු පැහැරගනිත්. පැහැර ගනුයේද තමාට හීන වූ සහ සම වූ නාගයෝම පැහැර ගැනීමට හැකිවෙති. තමාට වඩා උසස් වූ නාගයෝ පැහැරගත නොහැකිමය.

පැහැරගත නොහැකි (අනුද්ධරණීය) නාගයෝ සත්වැදෑරුම් වේ. ඔවුහු නම්, පණීතතර නාගයෝ, කම්බලස්ථර නාගයෝ, ධ්‍රතරාෂ්ට්‍ර නාගයෝ, සප්තසීදන්තර වැසි නාගයෝ, පොළවේ වසන නාගයෝ, පර්වතවාසී නාගයෝ සහ විමානවැසි නාගයෝ යන සත් කොටසයි.

මෙහි පණීතතර නාගයෝ නම් යෝනියෙන් උසස් වූ නාගයෝයි. ඒ එසේමැයි. අණ්ඩජාදීන්ට (බිජුවටින් උපන්නන්ට) ජලාබුජයෝ උසස් කුලිකයෝ වෙති. අණ්ඩජගුරුළන්ට ජලාබුජ නාගයෝ පැහැරගත නොහැක. කම්බලස්ථර නාගයෝ නම් නාග සේනාපතිහුය. ඔවුන්ගෙන් යම්කිසිවකු දුටු කිසිම ගුරුලෙකු ඔවුන් පැහැර ගැනීමට අසමත් වෙති. ධතරට්ඨ නම් නාග රජවරුයි. ඔවුනුද කිසිවකුට පැහැරගත නොහැක. සප්ත සිදන්තර නාගයෝ නම් මහමුහුදේ වෙසෙති. ඔවුහු එහි රැළි-රළ සෙළවීමට නොහැකි වන බැවින් කිසිවකුට පැහැරගැනීමට නොහැකි වෙති. පොළවේ වසන නාගයන්ටද සැඟවී සිටීමේ අවසරය ඇති බැවින් ඔවුහු පැහැර ගැනීමට නොහැකි වෙති. යම් නාගයෙක් මහමුහුදෙහි රැළි මතුපිට වසත්ද ඔවුහුද සුපර්ණයන්ට සමවූවෝද හීනවූවෝද පැහැරගැනීමට හැකි වෙති. සෙසු පදයන්ගේ අර්ථ විස්තර නාග සංයුත්තයේ පැවසූ පරිදි දතයුතුයි.

සුපණ්ණ සංයුත්තය නිමියේය.

30.

ගන්ධබ්බ සංයුත්තයේ - "මූලගන්ධා අධිවත්තා" යනු යම් ගසක මුල ගන්ධයක් ඇත් ද ඒ ඇසුරුකොට උපදින බැවින්, ඒ මුලු ගසම ඔවුන්ට යෝග්‍ය වේ. - මුල්ගඳෙහි අරක්ගත් දෙවියෝය. සෙසු පදයන්හිද මේ ක්‍රමයෙන් අර්ථ දතයුතුයි. "ගන්ධගන්ධා" යනු මුල් ආදියේ සුවඳින්

සුවඳවත් වූ යනුයි. යම් ගසක සියලුම මුල්වල ගන්ධයක් තිබේනම් මෙහිදී ඒ සියල්ලම "ගන්ධ" නම් වේ. ඒ ගන්ධයෙන් යුක්ත වූ "ගන්ධෙ" නම් වේ. එහි අධිගෘහිත වූයේ - මෙහි සියලු මුල් ආදිය ඒවායේම සමීපයට එති. "**සො දාතා හොති මූලගන්ධානං**" යනු ඔහු කළුවැල් ආදී සුවඳ මල් පූජාකරන ලද්දේ වේ යනුයි. මෙසේ සෑම පදයකම අර්ථ දතයුතුයි. මෙසේ සමාන වූ දේ දිත් අසමාන වූ දේ දිත් ප්‍රාර්ථනා කරති. එය දැක්වීමට "**සො අනනං දෙති**" ආදී දශවිධ දාන වස්තූහු දේශනා කරන ලදහ. මෙහි සෙසු පද විස්තර ඉතා ප්‍රකටය.

ගන්ධබ්බ සංයුත්තය නිමියේ ය.

වලාහක සංයුත්තයේ - "වලාහකකායිකා" යනු වලාහක නම් දේව කොට්ඨාසයේ උපන් ආකාශචාරී දෙවියෝය. "සීතවලාහකා" යනු ශීතල ඇතිකරන වලාහකයෝය. සෙසු පදයන්හි ද මෙම ක්‍රමයම යෙදේ. "**වෙතො පණිධිමන්වාය**" යනු සිත එක අරමුණක තැබීමට සමාධිගත කිරීමට පැමිණ යනුයි. "**සීතං හොති**" යනු යමක් වස්සානයේ හෝ හේමන්තයේ හෝ ශීතල ඇතිවේද ඒ ඍතුව එළඹ සිටියේය. යම් ශීත කාලයක අධික ශීතලත්, ග්‍රීෂ්මයක උපදින ශීතලත් දෙවියන්ගේ ආනුභාවයෙන් මැවූ "**සීතල**" නම් වේ. "**උණ්හං හොති**" යනු ගිම්හාන ඍතුවේ හටගන්නා ස්වාභාවික උණුසුමයි. යම්විටෙක උෂ්ණ කාලයේ ඇතිවන අධික උණුසුමද සීත කාලයේ උපදින උණුසුමද දෙවියන් විසින් ඉපිදවූ උණුසුමක් ලෙස හැඳින්වේ. "**අබ්භං හොති**" යනු වළාකුළු මණ්ඩලයක් වේ. මෙයද වස්සානයේ හා සිසිර ඍතුවල යම් වලාකුලක් උපදී ද ඒ ඍතුවලින් හටගත් වළාකුළු ප්‍රකෘතියෙන්ම ඇතිවූයේය. යම් වලාකුළු ඇතිවීමකදී දැඩි වලාවන් හටගනියිද සත්දිනක්ම සඳහිරු පවා වසාගෙන දැඩි අඳුර පවතියිද යම් ඒ බක්-වෙසක් මාසයන්හි වලාකුළු ඇතිවේද මේ සියල්ල දෙවියන්ගේ ආනුභාවයෙන් උපන් වලාකුළු නම් වේ. "**වාතො හොති**" යනු ඒ ඒ ඍතුවෙහි උතුරු-දකුණු ප්‍රදේශවල යම් ස්වාභාවික සුළඟක් ඇතිවේනම් එය ඍතුවෙන් හටගත්තකි. යම් ඒ සුළඟක් රුක් කඳ ආදිය පලාදමන දැඩි සුළඟක් වේද නොකල්හි හටගත් සුළඟක් වේද ඒ සියල්ල දේවතානුභාවයෙන් නිපදවුණු සුලංනම් වේ. "**දෙවො වස්සති**" යු යම් වැසි සාරමාසෙහි වසින වැස්ස ස්වාභාවික වූවකි. ස්වාභාවිකව හටගත්තකි. යම් වැස්සක්, වර්ෂා සමයේම අධිකව පවතියිද බක්-වෙසක් මාසයන්හි පවතින වැස්ස දෙවියන් විසින් ඉපිදවූවක් නම් වේ.

මෙහිදී මේ කථාවස්තුවයි. - එක් වැස්ස වලාහක දිව්‍ය පුත්‍රයෙක් හිමාල පර්වත වැසි එක් රහතන් වහන්සේ නමකගේ සමීපයට ගොස් වැඳ එකත්පසෙක සිටියේය. තෙරුන් වහන්සේ "නුඹ කවරෙක්ද?"යි විමසූහ. "ස්වාමීනි! මම වැස්ස වලාහක දිව්‍ය පුත්‍රයෙක්මි." "නුඹගේ සිතින් මෙහෙයවීමෙන් වැසි වසින්නෙහිද?" "ස්වාමීනි! එසේය." "අපි එය දකිනු කැමැත්තෙමු."යි තෙරුන් වහන්සේ වදාළවිට "ස්වාමීනි! ඔබවහන්සේ තෙමෙන්නේයැ"යි දෙව්පුතු කීය. එවිට තෙරණුවෝ "වැහි වලාකුලක් හෝ මේඝ ගර්ජනාවක් හෝ නොපෙනේ. කෙසේ තෙමෙන්නේද?"යි ඇසූහ. "ස්වාමීනි! මගේ සිතින් වැස්ස වසී. ඔබවහන්සේ පන්සලට වඩින්න"යි දෙව්පුතු කීය. "යහපති, දෙව්පුතුනි"යි පැවසූ තෙරණුවෝ පා සෝදාගෙන පන්සලට වැඩියහ. දෙව්පුතු උන්වහන්සේ පන්සලට වැඩි මොහොතේම එක් ගීයක් ගයා අත එසවීය. හාත්පස යොදුන් තුනක් පමණ ප්‍රදේශයේ එකම මේඝයක් (වැස්සක්) විය. තෙරුන් වහන්සේ අඩක් තෙත්වුණු පන්සලට පිවිසියහ.

තවද දෙවියෝ නම් අට කරුණකින් වැසි වස්වති. නාගානුභාවයෙන්, සුපර්ණයන්ගේ ආනුභාවයෙන්, දේවතානුභාවයෙන්, සත්‍ය ක්‍රියාවෙන්, ඍතු හටගැනීමෙන්, මාරාවර්තනයෙන්, ඍද්ධි බලයෙන්, වැහිවලාකුළු විනාශ කිරීමෙන් යන ක්‍රම අටෙනි.

වලාහක සංයුත්තය නිමියේ ය.

32.

වච්ඡගොත්ත සංයුත්තයේ - "අඤ්ඤාණා" යනු නොදැනීමෙන්. මෙසේ සියලුම පදයන්හි කිරීම් වශයෙන්ම අර්ථය දතයුතුයි. මේ සෑම පදයක්ම අන්‍යොන්‍ය වශයෙන් සමාන වදන් වේ. මේ සංයුත්තයෙහි සූත්‍ර එකොළොසකි. ව්‍යාකරණ හෙවත් පැණ විසඳුම් පනස්පහක් බව දතයුතුයි.

වච්ඡගොත්ත සංයුත්තය නිමියේය.

33. 1. 1.

ඣාන සංයුත්තයේ - පළමු සූත්‍රයෙහි - "**සමාධිකුසලො**" යනු පළමු ධ්‍යානයේ අංග පහකි. දෙවන ධ්‍යානයේ අංග තුනකි. මෙසේ අංග (ධ්‍යානාංග) ව්‍යවස්ථාපනයෙහි දක්ෂ වූ යනුයි. "**න සමාධිසම්ං සමාපත්ති කුසලො**" යනු සිත සතුටුකරවා, යෝග්‍ය ලෙස ධ්‍යානයට සමවැදීමට නොහැකි වේ යනුයි. මේ ක්‍රමයෙන් සෙසු පදයන්ගේ අරුත් දතයුතුයි.

33. 1. 2.

දෙවැනි සූත්‍රාදියේ - "**න සමාධිසම්ං ඨිතිකුසලො**" යනු ධ්‍යානයෙහි සිටීමට නොහැකි යනුයි. ඇසුරු ක්ෂණ හත අටක් ධ්‍යානයෙහි සිත තබාගැනීමට නොහැකි වේ. "**න සමාධිසම්ං වුටඨාන කුසලො**" යනු ධ්‍යානයෙන් නැගිටීමට නොහැකි වූ යනුයි. ධ්‍යානාංගයන් වෙන් කිරීමෙහි - වෙන් කරමින් අවබෝධ කරගැනීමෙහි නොහැකි වේ. අදක්ෂ වේ. "**න සමාධිසම්ං කලලිත කුසලො**" යනු සිත සතුටු කරවා, සමාධියෙහි යෝග්‍ය කිරීමට අදක්ෂවේ යනුයි. "**න සමාධිසම්ං ආරම්මණ කුසලො**" යනු කමටහන් ගෝචරයෙහි හා පිණ්ඩපාත ගෝචරයෙහි අදක්ෂ වේ යනුයි. "**න සමාධිසම්ං සකකචචකාරී**" යනු ධ්‍යානයට සමවැදීමට, සකස්කොට කරන සුලුවූයේ නොවේ. "**න සමාධිසම්ං සාකචචකාරී**" යනු ධ්‍යාන ප්‍රභාණයට නිතර කරනසුලු නොවේ. ඇතැම්විටෙක, කිසිදිනෙක පමණක් කරයි. "**න සමාධිසම්ං සපපායකාරී**" යනු සමාධියෙහි යෝග්‍ය වූ උපකාරක ධර්ම පිරවීමට - සම්පූර්ණ කිරීමට නොහැකි වේ. ඉන් අනතුරුව සමාපත්ති ආදී පදයන්හි යොදා සූත්‍ර සතරක් කියන ලදී. ඒවායේ අර්ථ ඉහතින් පැවසූ පරිදිම දතයුතුයි. මෙහි සියලු ඣාන සංයුත්තයේ සූත්‍ර ලෞකික ධ්‍යානම අරමුණු කරගෙන දේශනා කරන ලදී.

ඣාන සංයුත්තය නිමියේය.

මෙතෙකින් සාරත්ථප්පකාසිනී සංයුත්ත නිකාය අටුවාවේ බන්ධක වර්ගයේ අර්ථ වර්ණනාව නිමාවිය.



THE BO-TREE AT ANARAJAPOORA.

ටෙනන්ට් 1859

භදන්ත බුද්ධඝොෂාචාර්‍යපාදයන් අනුරාධපුර
ශ්‍රී මහා බෝධිය අසල ප්‍රදේශයෙහි වැඩවසමින්
සිහළට්ඨකථා පාලියට පරිවර්තනය කළ බව
බොහෝදෙනාගේ විශ්වාසයයි

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.
දුරකථන: 2734256, 2728468, 2726234
ෆැක්ස්: 2736737
විද්‍යුත් තැපෑල: bcc456@sltnet.lk
www.buddhistcc.com

ISBN 978-955-1604-33-2